බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 26

## සූත්‍රාන්ත පිටකයෙහි

16 වන ග්‍රන්ථය

# අඞ්ගුත්තරනිකාය

පඤ්චම භාගය

## අට්ඨක - නවක නිපාත

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්
ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක සභාවෙහි
අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලය
විසින් කරන ලද
සිංහල පරිවර්තනයෙන් යුක්තයි.

බු: ව: 2557

ක්‍රි: ව: 2013

Buddha Jayanti Tripitaka Series, Volume 26

The Sixteenth Book in the

**Suttanta-Pitaka**

**16**

# ANGUTTARANIKĀYA (V)

With the Sinhala translation by

**The Anguttaranikāya Editorial Board**
**of**
**The Tripitaka Translation Committee**

**Published by**
**Dharma Chakkra Child Foundation**
Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka
Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /
**Co-published, printed and donated by**
**The Corporate Body of the Buddha Educational Foundation**
11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.
Tel: +886 2 23951198, Fax: +886 2 23913415
Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**
**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්ධකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගිනී, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපිතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍ය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

2557 / 2013

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි
තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි
## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.

- ❆ පූජ්‍ය අත්තුඩාවේ සද්ධාණානන්ද නාහිමි
- ❆ පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ❆ ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ❆ ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- ❆ දර්ශනපති පූජ්‍ය කරගහළල්පත සුගතනන්ද හිමි
- ❆ ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ❆ ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- ❆ පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- ❆ පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- ❆ මිලිනා සුමතිපාල මැතිණිය
- ❆ ජගත් සුමතිපාල මැතිතුමා
- ❆ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- ❆ දොස්තර අරුණ රබෙල් මහත්මා
- ❆ සුජිත් මොහොට්ටි මහත්මා
- ❆ රංජිත් අමරසිංහ මහත්මා
- ❆ ගාමිණී කාරියවසම් මහත්මා
- ❆ අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ❆ ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- ❆ මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- ❆ සිරිසේන හේරත් මැතිතුමා
- ❆ විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහළවේවායි ප්‍රාර්ථනා කරමු.*

# සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

## පඤ්චමො භාගො

# සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරනිකාය

## පස්වන භාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන

# CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | xi |
| ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලය ... ... ... | xv |
| පාළි හෝඩිය ... ... ... | xvii |
| සංකේත නිරූපණය ... ... ... | xix |
| විෂය සූචි ... ... ... | xxi |
| පෙළ හා පරිවර්තනය ... ... ... | 2-573 |
| ගාථාදිපාදනුක්කමණිකා ... ... ... | 575-576 |
| සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... | 577-579 |
| විසෙසපදනුක්කමණිකා ... ... ... | 580-590 |

## සංස්කාරක නිවේදනය

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි **අඞ්ගුත්තර මහානිකාය කාණ්ඩ** සයකින් පරිමිත ව මුද්‍රණය සඳහා පිළියෙළ කරනලද්දේ විය. එහි ප්‍රථම භාගය 1960 දී පළවිය. ඊට පසු සතරවැනි කාණ්ඩය තෙක් වරින් වර පළවී ඇත. **අට්ඨක - නවක** නිපාත දෙකින් සමන්විත වූ මෙම **පඤ්චම-භාගය** බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි දෙවිසිවන ග්‍රන්ථය වශයෙන් සම්මත ව ඇත.

අඞ්ගුත්තරනිකාය පඤ්චමභාගයේ සිංහල පරිවර්තනය භාරව සිටි ස්ථවිරයන් වහන්සේ විසින් යථෝචිත ව ස්වකීය පරිවර්තනය සංස්කාරක මණ්ඩලය වෙත ඉදිරිපත් නො කළ හෙයින් ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක සභාවේ අනුමණ්ඩලයකින් මෙම පඤ්චමභාගයේ සිංහල පරිවර්තනය නිමහම් කරන ලද්දේය. එහිදු යම් යම් ඛලිතස්ථාන ඇති බව පෙනීගිය හෙයින් වර්තමාන සම්පාදකමණ්ඩලයේ සම්මතය පරිදි එය මුද්‍රණයට උචිත වනසේ පිළියෙළ කිරීම සඳහා කොහුවල 'විජයවර්ධනාරාමා'ධිපති සද්ධර්ම කීර්ති ශ්‍රී වාගීශ්වරාචාර්ය්‍ය මකුළුදූවේ ශ්‍රී පියරතනාභිධාන නායකස්ථවිරයන් වහන්සේ වෙත පවරනලද විය. උන්වහන්සේ මහත් පරිශ්‍රමයකින් ස්වකාර්ය්‍යය සිදුකළ බව කෘතඥතා පූර්වක වැ පවසම්හ. මුද්‍රණ අවස්ථාවට පැමිණි වර්තමාන ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයේ ශාස්ත්‍රාගමධර මහතෙරවරුන් ධර්මගෞරවය හා අර්ථාවබෝධය ද ඇතිවන සේ සිංහල භාෂාවේ සාධුත්වය ද ආරක්ෂාවන පරිදි මෙම පරිවර්තන නිමහම් කිරීමට හැම ප්‍රයත්නයක් ම දරනලදබව ද කිව යුතු ව ඇත.

තවද පාඨශෝධනයට පැමිණි මාතුල ජනපදයෙහි වූ ආලෝක විහාරස්ථානයෙහි වැඩහිඳ ලේඛනසඞ්ගායනාව කළ මහරහතුන් ලියාතැබූ දිබ්බචක්ඛුලාභීන් කෙරෙහි අගතන් පත් අනුරුද්ධ මහරහතුන් වහන්සේගේ අතවැසි පරපුරෙන් රක්ෂිත වූ අඞ්ගුත්තරභාණකයන්ගේ වාචනාමාර්ගයෙහි පැවැති අඞ්ගුත්තරනිකායපාළිය යථාස්ථානයෙහි තබාලීමට අපගේ වැයම විය. මෙහි ලා විමංසක සුධීන් හමුයෙහි තැබියැයුතු තැනුදු ඇත; අට්ඨකනිපාත - පඨමපණ්ණාසක සතරවැනි වර්ගයේ දෙවැනි සූත්‍රය (150 පිට) ''සද්ධා හිරියං කුසලඤ්ච දානං'' යනාදි එක් මැ ගාථායෙන් යුක්ත යැ, අට්ඨකධර්ම සංග්‍රහ ලත් නිපාතය වනුයෙන් මේ සූත්‍රයෙහි ද කරුණු අටක් තුබුව මනා යැ, එහෙත් 'සද්ධා හිරි කුසල' යන තුන්පදය විනා වෙනත් කරුණෙක් දක්නට නැත, එහෙයින් මෙහි කිසි පද කෙනෙක් ගිලිහීගොස් ඇද්ද නැත හොත් අන් තැනෙක සංග්‍රහ වියයුතු සූත්‍රයෙක් දැයි එක් වරට මැ සිතෙයි. මෙහි අටුවා බලත් මැ එය දනවර්ගයෙහි දෙවැනි සූත්‍රය වශයෙන්

ගෙන ඒ ගාථායෙහි පද මතුයෙක් ම වර්ණනා කොට ඇත. ටීකායෙහි මේ සූත්‍රඅටුවාව උත්තානාර්ථ යයි පවසා කිසිවක් සඳහන් කොට නැත. එහෙයින් අටුවා ටීකා ඇදුරනට ද අප ඉදිරියෙහි ඇති අඞ්ගුත්තර පෙළ මැ හමුවූබව නිසැක යැ.

'කාරණ්ඩව' සූත්‍රයෙහි (36 පිට) සංදෙස-විදෙස සියලු සංස්කරණයන්හි "තමෙනං සාමිකා සම්මජ්ජනිං ගහෙත්වා" යනු එයි. ඇතැම් කෙනෙක් "සම්මජ්ජනිං ගහෙත්වා-මුස්න ගෙන" යි අරුත් පවසති. ධාන්‍යශොධන-ස්ථානයක් ගෙන වදළ තැන් හෙයින් 'සම්මජ්ජනි – මුස්න' යනු ප්‍රාස්ථ්වික නො වනුයෙන් "අපසම්මජ්ජනිසඞ්ඛාතෙන වාතගාහිනා සුප්පෙන" යන අටුවා බලා අප විසින් ශුද්ධපාඨය "අපසම්මජ්ජනිං" යි ද 'සුළංකුල්ල' යන අරුත ද යොදන ලද්දේය.

ව්‍යග්ඝපජ්ජ – උජ්ජය සූත්‍ර දෙක්හි මැ (238, 246 පිටු) සමජීවිකාව වදරන තැන "උදුම්බරඛාදිකං වා'යං කුලපුත්තො භොගෙ ඛාදති" යී ද, "අජද්ධුමාරිකං වා'යං කුලපුත්තො මරිස්සති"යී ද වදරනලද්දේය. බුරුමරට ඡට්ඨසඞ්ගීතිකාරකයන්ගේ ශෝධනයෙහි 'උදුම්බරඛාදිකං' යනු 'උදුම්බර-ඛාදී' යි ද, 'අජද්ධුමාරිකං' යනු 'අජෙළමරණං' යී ද ශුද්ධ කොට පෙළ හෙළා ඇත. එහෙත් මේ දෙකරුණ බුදුරදුන් 'න සස භවන්ති වත්තාරො' (ඔහුට කියන්නෝ වෙති)යි එකල දඹදිවැ මිනිසුන්ගේ කථාව්‍යවහාරය ගෙන වදළබව පෙනේ.එයින් මෙහි ලා බුරුම ශොධනය අපට අනභිමත යැ. තවද 'අජද්ධු' යනු 'අජග්ධවා' යන්නෙහි මාගධප්‍රාකෘතරූපය වියැහෙයි.

'නන්දක' සූත්‍රයෙහි(384 පිට) "අද්ධා අයමායස්මා පත්තො වා පවජති වා" යන තැන්හි 'පවජති' යනු ඡට්ඨසංගීති ශොධනයෙහි 'පජ්ජති' යී ද, තායාක්ෂර මුද්‍රණයෙහි 'ගවජති' යී ද එයි, එහෙත් ගමනාර්ථ අනාගත ආඛ්‍යාතරූපය තුබුව මනා වනුයෙන් 'හෙවජති, පෙවජති' යනාදි රූපයන් මෙන් සාධුත්වය සලකා 'පවජති' යන රූපය පෙළෙහි යොදනුම්හ.

නවකනිපාතයේ ප්‍රථමවග්ගයේ සත්වැනි 'සුතවාපරිබ්බාජක' සූත්‍රයේ (396–98 පිටු) හා අටවැනි 'සජ්ඣපරිබ්බාජක' සූත්‍රයෙහි(400 පිට) ද රහතුන් වහන්සේ පිළිබඳ කොට දක්වන අභව්‍යස්ථාන නවයෙක් වෙයි. දෙසූතෙහි මැ මුලින් දක්වන කරුණු පස සාධාරණවන අතර පසුව එන කරුණු සතර වෙනස්ව ඇත. මේ වෙනස දක්වන බුද්ධඝොෂාචාරීහු: "බුද්ධං පච්චක්ඛාතුන්ති: න බුද්ධො අයන්ති එවං පටික්ඛිපිතුං, ධම්මාදිසුපි එසෙව නයො. එවං තාව අට්ඨකථාය ආගතං, පාළියං පන ඉමස්මිං සුත්තෙ අගතිගමනානි කථිතානි. අට්ඨමෙ බුද්ධාදීනං පච්චක්ඛානං කථිතං." යී. 'බුද්ධං පච්චක්ඛාතුං' යනාදි පදයනට අර්ථ දක්වා අර්ථකථායෙහි මෙසේ ආයේ යැ, එතෙකුදුවත් පාළියෙහි මේ (සත්වැනි සුතවා) සූත්‍රයෙහි

අගතිගමන කියනලදදැයි ද, අටවැනි (සජඣ)සූත්‍රයෙහි බුද්ධාදි ප්‍රත්‍යාඛ්‍යානය කියනලද යි ද දක්වූහ. මෙහි දී හෙළිවන වැදගත් කරුණෙක් ඇත: බුදුගොස් ඇදුරන් පවසන අට්ඨකථාව නම්: ලක්දිව මිහිඳු පරපුරෙහි සිංහල මහතෙරවරුන් ලියාතැබූ මහාවිහාරීය හෙළටුවාව යැ, පාළිය නම්: දඹදිව දී සිය ඇදුරුපාණන් වෙත උගත් තෙවළා බුදුවදන යැ. හෙළටුවා ලියන ලදුයේ මහමිහිඳු තෙරණුවන් ගෙනඑනලද වාචනාමාර්ගයෙහි වූ පාළියට බව ද පිළිගතයුතු ය. මෙය සසඳා බලත් මැ බුදුගොස් ඇදුරන් අටුවායෙහි ඇතැයි කී නය මැ මහාවිහාරීය අඞ්ගුත්තරනිකායපාළියෙහි ද එසේ මැ දක්නට ඇත. එහෙත් බුරුමරට අඞ්ගුත්තරනිකායපාළිය බුදුගොස් හිමියන් කී පාළිය හා සැසැඳෙනබව දක්නට ලැබේ.

තවද අට්ඨකනිපාත - ලෝකවිජය සූත්‍රයෙහි (210 – 12 – 14 පිටු) ''අයං'සා ලොකො, පර'සසා ලොකො''යන පාඨ ඇතැම් සංස්කරණයෙක ''අයං ලොකො, අයං ස ලොකො, පරලොකො'' යනු විසින් එයි. එහෙත් 'අයංඅසසා, පරොඅසසා' යන රූපයන්ගේ සංහිතා හෙයින් 'අයං'සා, පරසසා' යනු අප විසින් ආදෘත විය. අඞ්ගුත්තරාගම්වරය පිළිබඳ කොට වෙනත් කියයුතු දැය අවසානභාගයෙහි ලා පවසම්හ.

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථයන් යුහු වැ පළකරවාලීම සඳහා ක්‍රියාකාරී ප්‍රයත්නයෙක යෙදෙන ගරු සංස්කෘතික ඇමතිතුමාණන් ප්‍රමුඛ එම අමාත්‍යාංශයෙහි හා සංස්කෘතික අධිකාරියෙහි සියලු පිනැතියනට ද, දෙහිවල 'තිසර' මුද්‍රණාලයාධිකාරිතුමන් ඇතුළු එම කාර්‍යමණ්ඩලයට ද, මෙ සත්ක්‍රියායෙහි උපස්තම්භ වන හැම සජ්ජනයනට ද අපගේ කෘතඥතා පූර්වක ආශංසනය වන්නේය. හැම ලෝවැසියෝ දුකින් මිදෙත්වා.

මෙවගට—ශාසනොදයකාරී

**ලබුගම ලඞ්කානන්ද ස්ථවිර**
ත්‍රිපිටක මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

$\frac{2521}{1977}$—අප්‍රියෙල් මස 30 වැනි දින
'ප්‍රවචනොදය' පිරිවෙන
මොල්ලිගොඩ
වාද්දුව.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

මහරගම වටයවත්තපාර-ශ්‍රී චන්ද්‍රශෙඛරාරාමාධිපති අග්‍රමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂු විශ්වවිද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය්‍ය, රාජකීය පණ්ඩිත කෝදගොඩ ශ්‍රී ඥානාලොක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ, ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය්‍ය, ත්‍රිපිටක වාගීශ්වර, විමලකීර්ති ශ්‍රී රාජකීය පණ්ඩිත, ලබුගම ලඞ්කානන්ද ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

කිරුළපන පූර්වාරාම, නාරාහේන්පිට අභයාරාම යන විහාරද්වයාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ සිරි පඤ්ඤාලොක ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල, සුදර්ශනාරාමාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ සිරි අනොමදස්සී බටහිර දිශායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ - මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති රාජකීය පණ්ඩිත කරදන පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

කොළඹ, බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල - කොළඹ පළාතේ ප්‍රධානසඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

පාළි හෝඩිය

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ e | ඔ o |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | ං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUNCT - CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ñja | ද්ව, ද්ව dva | ම්භ mbha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර grâ | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ñkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ñga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු u | ූ ū | ෙ e | ො o |

# සංකේත නිරූපණය

සී - සීහළක්ඛරතාලපණ්ණ පොත්ථක.

සීමු - සීහළක්ඛරමුද්දිත පොත්ථක.

මජසං - මරම්ම ඡට්ඨසඞ්ගීති-සොධිත පොත්ථක.

සයා - සයාම-තායක්ඛරමුද්දිත පොත්ථක.

චූ - චූළවග්ගපාළි.

PTS—Pali Text Society, Anguttaranikaya.

# අඞ්ගුත්තරනිකායෙ පඤ්චමො භාගො

## අට්ඨකනිපාත - විසයසූචි


| | |
|---|---|
| අට්ඨකනිපාතො | 2 - 365 |
| පඨමො පණ්ණාසකො | 2 - 219 |

### 1. මෙත්තාවග්ගො 2 - 39

| විසයානි | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 1. | මෙත්තානිසංස | සුත්තං | ... | ... | 2— 5 |
| 2. | ආදිබ්‍රහ්මචරියපඤ්ඤා | ,, | ... | ... | 4—13 |
| 3. | පඨම පිය | ,, | ... | ... | 12—13 |
| 4. | දුතිය පිය | ,, | ... | ... | 14—15 |
| 5. | පඨම ලොකධම්ම | ,, | ... | ... | 14—17 |
| 6. | දුතිය ලොකධම්ම | ,, | ... | ... | 16—21 |
| 7. | දෙවදත්තවිපත්ති | ,, | ... | ... | 20—25 |
| 8. | උත්තර | ,, | ... | ... | 24—31 |
| 9. | නන්ද | ,, | ... | ... | 32—35 |
| 10. | කාරණ්ඩව | ,, | ... | ... | 34—39 |

### 2. මහාවග්ගො 40 - 99

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | වෙරඤ්ජ | සුත්තං | ... | ... | 40—51 |
| 2. | සීහසෙනාපති | ,, | ... | ... | 50—67 |
| 3. | ආජඤ්ඤ | ,, | ... | ... | 66—69 |
| 4. | ඛලුඞ්ක | ,, | ... | ... | 70—77 |
| 5. | මල | ,, | ... | ... | 76—79 |
| 6. | දූතෙය්‍ය | ,, | ... | ... | 78—79 |
| 7. | පුරිසබන්ධන | ,, | ... | ... | 80—81 |
| 8. | ඉත්ථිබන්ධන | ,, | ... | ... | 80—81 |
| 9. | පහාරාද | ,, | ... | ... | 82—93 |
| 10. | උපොසථ | ,, | ... | ... | 92—99 |

## අට්ඨකනිපාත විසයසූචි

### 3. ගහපතිවග්ගො 100 - 149


| විසයානි | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 1. වෙසාලිකඋග්ග | සුත්තං | ... | ... | 100—107 |
| 2. හත්ථිගාමක උග්ග | ,, | ... | ... | 106—113 |
| 3. හත්ථකාළවක | ,, | ... | ... | 114—117 |
| 4. හත්ථකාළවක සඞ්ගහවත්ථු සුත්තං | | ... | ... | 116—119 |
| 5. මහානාම | සුත්තං | ... | ... | 120—123 |
| 6. ජීවක | ,, | ... | ... | 122—125 |
| 7. බල | ,, | ... | ... | 124—125 |
| 8. ඛීණාසවබල | ,, | ... | ... | 126—129 |
| 9. අක්ඛණ | ,, | ... | ... | 128—135 |
| 10. අනුරුද්ධ | ,, | ... | ... | 134—149 |


### 4. දානවග්ගො 150 - 173


| | | | | |
|---|---|---|---|---|
| 1. පඨමදාන | සුත්තං | ... | ... | 150—151 |
| 2. දුතියදාන | ,, | ... | ... | 150—151 |
| 3. දානවත්ථු | ,, | ... | ... | 150—151 |
| 4. ඛෙත්තූපම | ,, | ... | ... | 152—155 |
| 5. දානූපපත්ති | ,, | ... | ... | 156—159 |
| 6. පුඤ්ඤකිරියවත්ථු | ,, | ... | ... | 158—163 |
| 7. සප්පුරිසදාන | ,, | ... | ... | 164—165 |
| 8. සප්පුරිස | ,, | ... | ... | 164—167 |
| 9. පුඤ්ඤාභිසන්ද | ,, | ... | ... | 166—171 |
| 10. අපායසංවත්තනික | ,, | ... | ... | 170—173 |


### 5. උපොසථවග්ගො 174 - 219


| | | | | |
|---|---|---|---|---|
| 1. සංඛිත්තඅට්ඨඞ්ගුපොසථ සුත්තං | | ... | ... | 174—179 |
| 2. විත්ථතඅට්ඨඞ්ගුපොසථ | ,, | ... | ... | 178—185 |
| 3. විසාඛූපොසථ | ,, | ... | ... | 186—191 |
| 4. වාසෙට්ඨූපොසථ | ,, | ... | ... | 190—193 |
| 5. බොජ්ඣූපොසථ | ,, | ... | ... | 192—199 |
| 6. අනුරුද්ධමනාපකායික | ,, | ... | ... | 198—205 |
| 7. විසාඛාමනාපකායික | ,, | ... | ... | 206—207 |
| 8. නකුලමාතුමනාපකායික | ,, | ... | ... | 208—211 |
| 9. පඨමලොකවිජය | ,, | ... | ... | 210—215 |
| 10. දුතියලොකවිජය | ,, | ... | ... | 214—219 |

## අට්ඨකනිපාත විසයසූචි

## දුතියො පණ්ණාසකො 220 – 361

### 6. ගොතමීවග්ගො 220 – 257


| විසයානි | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 1. | ගොතමී | සුත්තං | ... | ... | 220—231 |
| 2. | භික්ඛුනොවාදක | ,, | ... | ... | 230—233 |
| 3. | සඞ්ඛිත්තගොතමියොවාද | ,, | ... | ... | 232—235 |
| 4. | ව්‍යග්ඝපජ්ජ | ,, | ... | ... | 231—243 |
| 5. | උජ්ජය | ,, | ... | ... | 242—251 |
| 6. | කාමාධිවචන | ,, | ... | ... | 250—253 |
| 7. | පඨමආහුනෙය්‍යභික්ඛු | ,, | ... | ... | 252—253 |
| 8. | දුතියආහුනෙය්‍යභික්ඛු | ,, | ... | ... | 254—255 |
| 9. | පඨමඅග්ගපුග්ගල | ,, | ... | ... | 254—255 |
| 10. | දුතියඅග්ගපුග්ගල | ,, | ... | ... | 256—257 |


### 7. චාපාලවග්ගො 258 – 297


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ලාභිච්ඡා | සුත්තං | ... | ... | 258—263 |
| 2. | අලං | ,, | ... | ... | 262—269 |
| 3. | සඞ්ඛිත්තදෙසිත | ,, | ... | ... | 268—275 |
| 4. | අධිදෙවඤාණදස්සන | ,, | ... | ... | 274—279 |
| 5. | අභිභායතන | ,, | ... | ... | 278—281 |
| 6. | විමොක්ඛ | ,, | ... | ... | 280—283 |
| 7. | අනරියවොහාර | ,, | ... | ... | 282—285 |
| 8. | අරියවොහාර | ,, | ... | ... | 284—285 |
| 9. | පරිස | ,, | ... | ... | 234—285 |
| 10. | භූමිචාල | ,, | ... | ... | 286—297 |


### 8. යමකවග්ගො 298 – 339


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පඨමසමන්තපාසාදික | සුත්තං | ... | ... | 298—301 |
| 2. | දුතියසමන්තපාසාදික | ,, | ... | ... | 300—303 |
| 3. | පඨමමරණස්සති | ,, | ... | ... | 302—309 |
| 4. | දුතියමරණස්සති | ,, | ... | ... | 310—315 |
| 5. | පඨමසම්පද | ,, | ... | ... | 314—315 |
| 6. | දුතියසම්පද | ,, | ... | ... | 316—321 |
| 7. | ඉච්ඡා | ,, | ... | ... | 320—325 |
| 8. | අලං | ,, | ... | ... | 326—331 |
| 9. | සෙඛපරිහානිය | ,, | ... | ... | 330—331 |
| 10. | කුසීතාරම්භවත්ථු | ,, | ... | ... | 332—339 |

# අට්ඨකනිපාත විසයසූචි

## 9. සතිවග්ගො 340 - 359


| විසයානි | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 1. සතිසම්පජඤ්ඤ | සුත්තං | ... | ... | 340—343 |
| 2. පුණ්ණිය | ,, | ... | ... | 342—343 |
| 3. කිංමූලක | ,, | ... | ... | 544—345 |
| 4. මහාචොරඞ්ග | ,, | ... | ... | 346—347 |
| 5. තථාගතාධිවචන | ,, | ... | ... | 346—349 |
| 6. නාගිත | ,, | ... | ... | 348—355 |
| 7. පත්තනික්කුජ්ජන | ,, | ... | ... | 354—357 |
| 8. අප්පසාද | ,, | ... | ... | 356—357 |
| 9. පටිසාරණීයකම්ම | ,, | ... | ... | 358—359 |
| 10. තස්සපාපියසිකාසම්මාවත්තන සුත්තං | | | ... | 358—359 |


## 10. සාමඤ්ඤවග්ගො 360 - 361


1—27. 'බොජ්ඣා' උපාසිකාදීනං නාමෙන සත්තවීසති සුත්තානි, 360—361


## 11. රාගාදිපෙය්‍යාලං 362—365


| | | | | |
|---|---|---|---|---|
| 1. අට්ඨමග්ගඞ්ග | සුත්තං | ... | ... | 362—363 |
| 2. අට්ඨ අභිභායතන | ,, | ... | ... | 362—363 |
| 3. අට්ඨවිමොක්ඛ | ,, | ... | ... | 364—365 |
| 4.—510. සෙසසුත්තානි | | ... | ... | 364—365 |

## නවකනිපාතො 366 – 573

### 1. සම්බොධිවග්ගො 366—401


| විසයානි | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 1. සම්බොධිපක්ඛික | සුත්තං | ... | ... | 366—371 |
| 2. නිස්සයසම්පන්න | ,, | ... | ... | 370—373 |
| 3. මෙඝිය | ,, | ... | ... | 372—379 |
| 4. නන්දක | ,, | ... | ... | 378—385 |
| 5. බලසඞ්ගහවත්ථු | ,, | ... | ... | 386—389 |
| 6. සෙවිතබ්බාසෙවිතබ්බ | ,, | ... | ... | 390—395 |
| 7. සුතවාපරිබ්බාජක | ,, | ... | ... | 396—399 |
| 8. සජ්ඣපරිබ්බාජක | ,, | ... | ... | 398—401 |
| 9. පුග්ගල | ,, | ... | ... | 400—401 |
| 10. ආහුනෙය්‍ය පුග්ගල | ,, | ... | ... | 400—401 |


### 2. සීහනාදවග්ගො 402—439.


| | | | | |
|---|---|---|---|---|
| 1. සාරිපුත්ත සීහනාද | සුත්තං | ... | ... | 402—439 |
| 2. සොපාදිසෙස | ,, | ... | ... | 410—415 |
| 3. මහාකොට්ඨිත | ,, | ... | ... | 416—421 |
| 4. සමිද්ධි | ,, | ... | ... | 422—425 |
| 5. ගණ්ඩොපම | ,, | ... | ... | 424—427 |
| 6. සඤ්ඤා | ,, | ... | ... | 426—427 |
| 7. කුලොපගමන | ,, | ... | ... | 426—429 |
| 8. නවඞ්ගුපොසථ | ,, | ... | ... | 428—431 |
| 9. දෙවතා | ,, | ... | ... | 432—435 |
| 10. වෙලාම | ,, | ... | ... | 434—439 |


### 3. සත්තාවාසවග්ගො 440—465


| | | | | |
|---|---|---|---|---|
| 1. ඨාන | සුත්තං | ... | ... | 440—441 |
| 2. ඛළුඞ්ක | ,, | ... | ... | 440—447 |
| 3. තණ්හාමූලක | ,, | ... | ... | 448—449 |
| 4. සත්තාවාස | ,, | ... | ... | 448—451 |
| 5. පඤ්ඤාපරිචිත | ,, | ... | ... | 450—453 |
| 6. සිලායූපොපම | ,, | ... | ... | 452—457 |
| 7. පඨම වෙරභය | ,, | ... | ... | 456—461 |
| 8. දුතිය වෙරභය | ,, | ... | ... | 460—463 |
| 9. ආඝාතවත්ථු | ,, | ... | ... | 462—463 |
| 10. ආඝාතපටිවිනය | ,, | ... | ... | 462—463 |
| 11. අනුපුබ්බනිරොධ | ,, | ... | ... | 464—465 |

## 4. මහාවග්ගො 466—531


| විසයානි | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| 1. | අනුපුබ්බ විහාර | සුත්තං | 466—467 |
| 2. | අනුපුබ්බවිහාරසමාපත්ති | ,, | 468—475 |
| 3. | නිබ්බානසුඛ | ,, | 476—481 |
| 4. | ගාවී උපමා | ,, | 480—487 |
| 5. | ඣානනිස්සය | ,, | 488—493 |
| 6. | ආනන්ද | ,, | 494—497 |
| 7. | ලොකායතිකබ්‍රාහ්මණ | ,, | 496—503 |
| 8. | දෙවාසුරසඞ්ගාම | ,, | 502—507 |
| 9. | ආරඤ්ඤකනාගොපම | ,, | 506—511 |
| 10. | තපුස්සගහපති | ,, | 512—531 |


## 5. සාමඤ්ඤවග්ගො 532-545


| | | | |
|---|---|---|---|
| 1. | සම්බාධ | සුත්තං | 532—537 |
| 2. | කායසක්ඛී | ,, | 536—539 |
| 3. | පඤ්ඤාවිමුත්ත | ,, | 538—541 |
| 4. | උභතොභාගවිමුත්ත | ,, | 540—543 |
| 5. | සන්දිට්ඨිකධම්ම | ,, | 542—543 |
| 6. | සන්දිට්ඨිකනිබ්බාන | ,, | 542—543 |
| 7. | නිබ්බාන | ,, | 544—545 |
| 8. | පරිනිබ්බාන | ,, | ,, ,, |
| 9. | තදඞ්ගනිබ්බාන | ,, | ,, ,, |
| 10. | දිට්ඨධම්මනිබ්බාන | ,, | ,, ,, |


# දුතියො පණ්ණාසකො 546-573

## 1. ඛෙමවග්ගො 546-551


| | | | |
|---|---|---|---|
| 1. | ඛෙම | සුත්තං | 546—547 |
| 2. | ඛෙමප්පත්ත | ,, | ,, ,, |
| 3. | අමත | ,, | ,, ,, |
| 4. | අමතප්පත්ත | ,, | ,, ,, |
| 5. | අභය | ,, | 548—549 |
| 6. | අභයප්පත්ත | ,, | ,, ,, |
| 7. | පස්සද්ධි | ,, | ,, ,, |
| 8. | අනුපුබ්බපස්සද්ධි | ,, | ,, ,, |
| 9. | නිරොධ | ,, | ,, ,, |
| 10. | අනුපුබ්බනිරොධ | ,, | 548—551 |
| 11. | අරහත්තභබ්බාභබ්බධම්ම | ,, | 550—551 |

## නවකනිපාත විසයසූචි

### 2. සතිපට්ඨානවග්ගො 552-561


| විසයානි | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 1. සික්ඛාදුබ්බල්‍යසතිපට්ඨාන සුත්තං | | ... | ... | 552—553 |
| 2. නීවරණසතිපට්ඨාන | ,, | ... | ... | ,, ,, |
| 3. කාමගුණ සතිපට්ඨාන | ,, | ... | ... | 554—555 |
| 4. උපාදානක්ඛන්ධසතිපට්ඨාන | ,, | ... | ... | ,, ,, |
| 5. ඔරම්භාගියසතිපට්ඨාන | ,, | ... | ... | ,, ,, |
| 6. ගතිසතිපට්ඨාන | ,, | ... | ... | 556—557 |
| 7. මච්ඡරිය සතිපට්ඨාන | ,, | ... | ... | ,, ,, |
| 8. උද්ධම්භාගියසතිපට්ඨාන | ,, | ... | ... | ,, ,, |
| 9. චෙතොඛිලසතිපට්ඨාන | ,, | ... | ... | 558—559 |
| 10. විනිබන්ධසතිපට්ඨාන | ,, | ... | ... | 560—561 |


### 3. සම්මප්පධානවග්ගො 562-565


| | | | | |
|---|---|---|---|---|
| 1. සික්ඛාදුබ්බල්‍යසම්මප්පධාන සුත්තං | | ... | ... | 562—563 |
| 2-9 නීවරණාදි සුත්තානි | | ... | ... | ,, ,, |
| 10. විනිබන්ධ සම්මප්පධාන සුත්තං | | ... | ... | 564—565 |


### 4. ඉද්ධිපාදවග්ගො 566-569


| | | | | |
|---|---|---|---|---|
| 1. සික්ඛාදුබ්බල්‍ය ඉද්ධිපාද සුත්තං | | ... | ... | 566—567 |
| 2-9 ඉද්ධිපාදාදි සුත්තානි සුත්තං | | ... | ... | ,, ,, |
| 10. විනිබන්ධ ඉද්ධිපාද | ,, | ... | ... | 568—569 |


### 5. රාගාදිපෙය්‍යාලං 570-573


| | | | | |
|---|---|---|---|---|
| 1. නවසඤ්ඤා | සුත්තං | ... | ... | 570—571 |
| 2. ඣානසමාපත්ති | ,, | ... | ... | ,, ,, |
| 3-340. රාගාදිපෙය්‍යාල සුත්තානි | | ... | ... | 570—573 |
| ගාථාදිපාදානුක්කමණිකා | | ... | ... | 575—576 |
| සඤ්ඤානාමානුක්කමණිකා | | ... | ... | 577—579 |
| විසෙසපදානුක්කමණිකා | | ... | ... | 580—590 |

සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

පඤ්චමො භාගො

# සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

## පඤ්චමො භාගො

# අට්ඨකනිපාතො

## පඨමො පණ්ණාසකො

# 1. මෙත්තාවග්ගො

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

### 8. 1. 1. 1

### මෙත්තානිසංස සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය[1] වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය අට්ඨානිසංසා පාටිකඞ්ඛා. කතමෙ අට්ඨ:

සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති.

මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය[1] වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය ඉමෙ අට්ඨානිසංසා පාටිකඞ්ඛාති.

---

1. යානිකථාය–මජසං

# සූත්‍රාන්ත පිටකයෙහි
# අඞ්ගුත්තර සඟිය

### පසුවම භාගය

## අට්ඨක නිපාතය

### ප්‍රථම පණ්ණාසකය

## 1. මෙත්තාවග්ගය

භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට
නමස්කාර වේවා.

### 8. 1. 1. 1
### මෙත්තානිසංස සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර සමීපයෙහි ජේතවන** නම් අනේපිඩු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, අදරින් සෙවුනා ලද, වඩනා ලද, බහුල වශයෙන් (නැවත නැවත) කරන ලද යානාවක් බඳු කරන ලද, ප්‍රතිෂ්ඨානාර්ථයෙන් වස්තුවක් මෙන් කරනලද, එළඹ සිටි පුරුදු කරන ලද, මොනොවට පටන් ගන්නා ලද මෛත්‍රීචිත්තවිමුක්තියෙහි අට අනුසස් කෙනෙක් කැමැති විය යුත්තාහ. කවර අට දෙනෙක යත්:

සුවසේ නිඳයි, සුවසේ පිබිදෙයි, ලමු සිහින නො දක්නේ ය, මිනිස්නට ප්‍රිය වෙයි, අමනුෂ්‍යයනට ප්‍රිය වෙයි, දෙවියෝ රක්නාහ, ඔහට ගිනි වේවයි විෂ වේවයි අවි වේවයි නො වදනේ ය, මතුයෙහි මහපල නො පිළිවිදුනේ බඹලොව යන්නේ වෙයි.

මහණෙනි, අදරින් සෙවුනා ලද, වඩනා ලද, බහුලවශයෙන් කරන ලද යානාවක් වැනි කරන ලද, වස්තුවක් මෙන් කරන ලද, එළඹ සිටි, පුරුදු කරන ලද, මොනොවට පටන් ගන්නා ලද මෛත්‍රීචිත්තවිමුක්තියෙහි මේ අට අනුසස් කැමැති විය යුතු ය යි.

1. යො ච මෙත්තං භාවයති, අප්පමාණං පතිස්සතො[1]
තනූ[2] සංයොජනා හොන්ති, පස්සතො උපධික්ඛයං.

2. එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො, මෙත්තායති කුසලී තෙන හොති,
සබ්බෙව[3] පාණෙ මනසානුකම්පී, පහූතමරියො පකරොති පුඤ්ඤං.

3. යෙ සත්තසණ්ඩං පථවිං ජිනිත්වා,[4] රාජිසයො[5] යජමානානුපරියගා[6],
සස්සමෙධං[7] පුරිසමෙධං, සම්මාපාසං වාචපෙය්‍යං[8] නිරග්ගළං.

4. මෙත්තස්ස චිත්තස්ස සුභාවිතස්ස,
කලම්පි තෙ නානුභවන්ති සොළසිං,
චන්දප්පභා තාරගණාව සබ්බෙ,
යථා න අග්ඝන්ති කලම්පි සොළසිං.

5. යො න හන්ති න ඝාතෙති, න ජිනාති න ජාපයෙ,
මෙත්තං සො සබ්බභූතානං, වෙරං තස්ස න කෙනචීති.

## 8. 1. 1. 2

## ආදිබ්‍රහ්මචරියපඤ්ඤා සුත්තං

**[සාවත්ථිනිදානං]**

අට්ඨිමෙ භික්ඛවෙ, හෙතූ අට්ඨ පච්චයා ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය, පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තන්ති. කතමෙ අට්ඨ:

1. ඉධ භික්ඛවෙ, භික්ඛු සත්ථාරං උපනිස්සාය විහරති, අඤ්ඤතරං වා ගරුට්ඨානියං සබ්‍රහ්මචාරිං යත්ථස්ස තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති පෙමඤ්ච ගාරවො ච, අයං භික්ඛවෙ, පඨමො හෙතු පඨමො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

---

1. පටිස්සතො–මජසං.
2. තනු – සිමු.
3. සබ්බෙ ච – මජසං.
4. විජෙත්වා – මජසං
5. රාජීසයො–මජසං.
6. යජමානා අනුපරියගා – මජසං.
7. අස්සමෙධං – සිමු.
8. වාජපෙය්‍යං – සයා, සිමු.

1. එළඹ සිටි සිහි ඇති යමෙක් (පැතිරීම් වශයෙන්) අප්‍රමාණ වූ මෙත්සිත වඩනේ නම්, ක්ලේශෝපධීන්ගේ ක්ෂය දක්නා ඕහුගේ සංයෝජනයෝ තුනී වෙත්.

2. ඉදින් එක ද සත්ත්වයකු කෙරෙහි දුෂ්ට නොවූ සිතැතියේ මෙත් වඩා නම්, ඒ හේතුයෙන් කුසල් ඇත්තෙක් (කුසල් කරන්නෙක්) වෙයි. සව්සතුන් කෙරෙහි සිතින් අනුකම්පා කරන ආර්‍ය්‍ය තෙමේ බොහෝ පින් කෙරෙයි.

3. යම් රාජර්ෂි කෙනෙක් (සෘෂිසදෘශ දැහැමි රජකෙනෙක්) සත්කැලන්ගෙන් ගැවසී පොළොතල දිනා (ගෙදර නිරගුළු කළ හෙයින්) නිරග්ගල නම් වූ සස්සමේධ ය පුරිසමේධ ය සම්මාපාස ය වාචපෙය්‍ය ය යන සිවුසහරාවතින් යාග කරමින් (දන් දෙමින්) හැසුරුනාහු වෙත් ද,

4. ඒ යාගයෝ සුභාවිත මෛත්‍රීසහගතචිත්තයාගේ (විපාකමහත්ත්වයෙන්) සොළොස්වන කලාව ද පවා නො අගිත්. සඳපහන හැම තුරුකැල මඩනාක් මෙනි.

5. යමෙක් නො නසා ද, නො නස්වා ද, හානි නො කෙරේ ද, හානි නො කරවා ද, හැම සතුන් කෙරෙහි මෛත්‍රීභාග ව සිටුනේ වේ ද, කිසිවකුදු හා ඕහුගේ වෛරයෙක් නැත්තේ යි.

## 8. 1. 1. 2

## ආදිබ්‍රහ්මචරියපඤ්ඤා සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, නො ලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනා ප්‍රඥව ලබනු පිණිස ලත් ප්‍රඥව පිළිබඳ භූයස්ත්වය පිණිස වෛපුල්‍යය පිණිස වඩනු පිණිස පරිපූරභාවය පිණිස හේතුහු අට දෙනෙක් ප්‍රත්‍යයයෝ අට දෙනෙක් පවත්නාහ. කවර අට දෙනෙක යත්:

1. මහණෙනි, මෙ සස්නෙහි මහණ ශාස්තෘන් වහන්සේ ඇසිරැ කොට වෙසේ, යමකු කෙරෙහි ඕහුගේ බහල හිරිඔතප් එළැඹ සිටියේ වේද, සෙනෙහස හා ගෞරවත් එළැඹ සිටියේ වේද, එබඳු ගුරුස්ථානයට නිසි අන්‍යතර සබ්‍රහ්මචරකු හෝ ඇසිරි කොට වෙසෙයි. මහණෙනි, මේ පළමු හේතුව පළමු ප්‍රත්‍යයය නොලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනාප්‍රඥව ලබනු පිණිස ලත් ප්‍රඥව පිළිබඳ භූයස්ත්වය පිණිස වෛපුල්‍යය පිණිස වඩනු පිණිස පරිපූරභාවය පිණිස පවත්නේ ය.

2. සො තං සත්ථාරං උපනිස්සාය විහරති[1] අඤ්ඤතරං වා ගරුට්ඨානියං සබ්‍රහ්මචාරිං, යත්ථස්ස තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති. පෙමඤ්ච ගාරවො ච, තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති, පරිපඤ්හති: ඉදං භන්තෙ, කථං? ඉමස්ස ක්වත්ථොති[2] ? තස්ස තෙ ආයස්මන්තො අවිවටං චෙව විවරන්ති. අනුත්තානීකතං ච උත්තානීකරොන්ති. අනෙක විහිතෙසු[3] කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති. අයං භික්ඛවෙ, දුතියො හෙතු දුතියො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

3. සො තං ධම්මං සුත්වා ද්වයෙන වූපකාසෙන සම්පාදෙති, කාය-වූපකාසෙන ච චිත්තවූපකාසෙන ච. . අයං භික්ඛවෙ, තතියො හෙතු තතියො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

4. සීලවා ච හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචර සම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. අයං භික්ඛවෙ, චතුත්ථො හෙතු චතුත්ථො පච්චයො ආදි-බ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යො-භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

5. බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදි-කල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපස්ස ධම්මා බහුස්සුතා හොන්ති. ධතා[4] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. අයං භික්ඛවෙ, පඤ්චමො හෙතු පඤ්චමො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

6. ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. අයං භික්ඛවෙ, ඡට්ඨො හෙතු ඡට්ඨො පච්චයො ආදිබ්‍රහ්ම-චරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

---

1. විහරන්තො – මජසං
2. කො අත්ථොති – මජසං.
3. අනෙකවිහිතෙසු ච – මජසං
4. ධාතා – මජසං

2. හෙතෙමේ ඒ ශාස්තෲන් වහන්සේ ඇසිරු කොට වෙසේ. යමකු කෙරෙහි ඔහුගේ බහල වූ හිරිඔතප් එළැඹ සිටියේ වේ ද, සෙනෙහස හා ගෞරවත් එළැඹ සිටියේ වේ ද, එබඳු ගුරුස්ථානයට නිසි අන්‍යතරසබ්‍රම්සරකු හෝ ඇසිරි කොට වෙසේ. කලින් කල ඔවුන් වෙත එළැඹ වහන්ස, මේ කෙසේ ද? මේ පෙළදහම්හුගේ අර්ථ කවරේ දැයි පරිපුච්ඡා කෙරෙයි. ප්‍රශ්න කෙරෙයි. ඔහුට ඒ ආයුෂ්මත්හු අවිවෘත දැයත් විවරණ කෙරෙති, අප්‍රකට දැයත් ප්‍රකට කෙරෙති, නන් වැදෑරුම් සැක කරනට නිසි දහම්හි සැක දුරු කෙරෙත්. මහණෙනි, මේ දෙවන හේතුව දෙවන ප්‍රත්‍යය නො ලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනා ප්‍රඥව ලබනු පිණිස ලත් ප්‍රඥව පිළිබඳ භූයස්ත්වය පිණිස වෛදූල්‍යය පිණිස වඩනු පිණිස පරිදූරභාවය පිණිස පවත්නේ ය.

3. හේ ඒ දහම් අසා කායවිවේකයෙන් ද චිත්තවිවේකයෙන් දැයි දෙවැදෑරුම් විවේකයෙන් සපයයි. මහණෙනි, මේ තෙවන හේතුව තෙවන ප්‍රත්‍යය නොලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනාප්‍රඥව ලබනු පිණිස ලත් ප්‍රඥව පිළිබඳ භූයස්ත්වය පිණිය වෛපුල්‍යය පිණිස වඩනු පිණිස පරිපූරභාවය පිණිස පවත්නේ ය.

4. සිල්වත් ද වෙයි. ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘතව වෙසෙයි. ආචාරගොචරසම්පන්න වූයේ අණුමාත්‍ර වූ වරදෙහිත් බිය දක්නා සුලු වූයේ සමාදන කොට සිකපදයෙහිදු හික්මෙයි. මහණෙනි, නො ලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනාප්‍රඥව ලබනු පිණිස ලත් ප්‍රඥව පිළිබඳ භූයස්ත්වය පිණිස වෛපුල්‍යය පිණිස භාවනාව පිණිස පරිපූරභාවය පිණිස මේ සිවුවන හේතුව සිවුවන ප්‍රත්‍යය පවත්නේ ය.

5. බහුශ්‍රැත වූයේ ශ්‍රැතධර වූයේ මුළු කොට ගත් හදළ පෙළ-අරුත් ඇතියේ වෙයි. ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ යම් දහම්හු සාර්ථ-සව්‍යඤ්ජන කොට කේවලපරිපූර්ණ-පරිසුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පවසත් ද, එබඳු දහම්හු ඔහු විසින් බෙහෙවින් අසන ලද්දහු වෙත්. ධරන ලද්දහු වචනයෙන් පුරුදු කරන ලද්දහු සිතින් දූන පූනා බලන ලද්දහු දෘෂ්ටියෙන් පිළිවිදුනා ලද්දහු වෙත්. මහණෙනි, නො ලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනාප්‍රඥව ලබනු පිණිස ලත් ප්‍රඥව පිළිබඳ භූයස්ත්වය පිණිස වෛපුල්‍යය පිණිස භාවනාව පිණිස පරිපූරභාවය පිණිස මේ පස්වන හේතුව පස්වන ප්‍රත්‍යය පවත්නේ ය.

6. අකුශලධර්මයන් ප්‍රහාණ කරනු පිණිස කුශලධර්මයන් වඩනු පිණිස ඇරඹූ වැර ඇතියේ බල ඇතියේ දළ පැරකුම් ඇතියේ කුසල් දහම්හි නො හළ වෙර ඇතියේ වෙසෙයි. මහණෙනි, නො ලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනාප්‍රඥව ලබනු පිණිස ලත් ප්‍රඥව පිළිබඳ භූයස්ත්වය පිණිස වෛපුල්‍යය පිණිස භාවනාව පිණිස පරිපූරභාවය පිණිස මේ සවන හේතුව සවන ප්‍රත්‍යය පවත්නේ ය.

7. සඞ්ඝගතො ඛො පන අනානාකථිකො හොති, අතිරච්ඡානකථිකො හොති, සාමං වා ධම්මං භාසති, පරං වා අජ්ඣෙසති, අරියං වා තුණ්හීභාවං නාතිමඤ්ඤති. අයං භික්ඛවෙ, සත්තමො හෙතු සත්තමො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

8. පඤ්චසු ඛො පන උපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති "ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො[1], ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථඞ්ගමො[1]; ඉති සඤ්ඤා –පෙ– ඉතිසංඛාරා –පෙ– ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමො"ති. අයං භික්ඛවෙ, අට්ඨමො හෙතු අට්ඨමො පච්චයො ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති.

තමෙනං සබ්‍රහ්මචාරී එවං සම්භාවයන්ති[2]: "අයං ඛො ආයස්මා සත්ථාරං උපනිස්සාය විහරති, අඤ්ඤතරං වා ගරුට්ඨානියං සබ්‍රහ්මචාරිං, යත්ථස්ස තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති පෙමඤ්ච ගාරවො ච. අද්ධා අයමායස්මා ජානං ජානාති පස්සං පස්සතී"ති. අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

"තං ඛො පනායමායස්මා සත්ථාරං උපනිස්සාය විහරන්තො අඤ්ඤතරං වා ගරුට්ඨානියං සබ්‍රහ්මචාරිං යත්ථස්ස තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති පෙමඤ්ච ගාරවො ච, තෙ[3] කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති පරිපඤ්හති: ඉදං භන්තෙ කථං? ඉමස්ස කො අත්ථො'ති[4]?"

තස්ස තෙ ආයස්මන්තො අවිවටං චෙව විවරන්ති, අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති. අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති අද්ධා අයමායස්මා ජානං ජානාති පස්සං පස්සතීති. අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

---

1. අත්ථඞ්ගමො – මජ්ඣං.
2. සම්භාවෙන්ති – මජ්ඣං.
3. සො – සිමු.
4. කො අත්ථො-මජ්ඣං.

7. සභාමැදට ගියේ නානා කියුම් නැතියේ වෙයි, තිරිසන් කථායෙහි නො යෙදුනේ වෙයි, තෙමේ හෝ දහම් දෙසයි, මෙරමා හෝ අධ්‍යෙෂණා කෙරෙයි, ආර්‍ය්‍යතුෂ්ණිම්භාවය හෝ ඉක්ම නො සිතයි. මහණෙනි, නො ලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනාප්‍රඥාව ලබනු පිණිස ලත් ප්‍රඥාව පිළිබඳ භූයස්භාවය පිණිස වෛපුල්‍යය පිණිස භාවනාව පිණිස පරිපූරභාවය පිණිස මේ සත්වන හේතුව සත්වන ප්‍රත්‍යය පවත්නේය.

8. පඤ්ච උපාදනස්කන්ධයෙහි රූපය මෙසේ ය. රූපසමුදය මෙසේ ය. රූපයාගේ අස්තඞ්ගමය මෙසේ ය. වේදනා මෙසේ ය. වේදනාසමුදය මෙසේ ය. වේදනාවගේ අස්තඞ්ගමය මෙසේ ය. සංඥා මෙසේ ය. ... සංස්කාර මෙසේ ය. ... විඥාන මෙසේ ය ... විඥානසමුදය මෙසේ ය. විඥානයාගේ අස්තඞ්ගමය මෙසේ යයි උද – වය දක්නා සුලු වැ වෙසෙයි. මහණෙනි, නො ලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විදර්ශනාප්‍රඥාව ලබනු පිණිස ලත් ප්‍රඥාව පිළිබඳ භූයස්භාවය පිණිස වෛපුල්‍යය පිණිස භාවනාව පිණිස පරිපූරභාවය පිණිස මේ අටවැනි හේතුව අටවැනි ප්‍රත්‍යය පවත්නේය.

සබ්‍රම්සරහු තෙල මහණහු මෙසේ සම්භාවනා කෙරෙත්: "මේ ආයුෂ්මත් වනාහි ශාස්තෘන්වහන්සේ ඇසුරු කොට වෙසෙයි, ගුරුස්ථානයට නිසි යමකු කෙරෙහි තීව්‍ර හිරිඔතප් එළඹැ සිටුනේ වේ ද, සෙනෙහස හා ගෞරව එළඹැ සිටුනේ වේ ද, එබඳු අන්‍යතර සබ්‍රම්සරකු හෝ ඇසුරු කොට වෙසෙයි; වැලිත් මේ ආයුෂ්මත් දතයුත්ත දන්නේය, දක්ක යුත්ත දක්නේ ය"යි. මේ ධර්මය ද ප්‍රිය භාවය පිණිස ගරුභාවය පිණිස භාවනාව හෝ සම්භාවනාව පිණිස ශ්‍රමණධර්මය පිණිස නෛරන්‍තර්‍ය්‍යය පිණිස පවත්නේ ය.

මේ ආයුෂ්මත් ඒ ශාස්තෘහු ඇසුරු කොට වසන්නේ වෙයි. යමකු කෙරෙහි තීව්‍ර හිරිඔතප් එළඹ සිටුනේ වේ ද, සෙනෙහස හා ගෞරවය එළඹ සිටුනේ වේ ද, එබඳු ගුරුස්ථානයට නිසි එක්තරා සබ්‍රම්සරකු හෝ ඇසුරු කොට වෙසෙන්නේ වෙයි. කලින් කල ඔවුන් වෙතැ එළඹ සිට 'වහන්ස, මේ දහම් කෙසේ ද? මේ දහම්හුගේ අර්ථ කවරේ දැ?යි (අර්ථ-පාලි-අනුසන්ධි–පූර්වාපර විසින්) පරිපෘච්ඡා කෙරෙයි, පරිප්‍රශ්න නඟයි

"මේ ආයුෂ්මත් එකැතින් දතයුත්ත දන්නේය, දක්ක යුත්ත දක්නේ යයි." ඔහුට ඒ ආයුෂ්මත්හු අවිවෘත දැය විවරණ කෙරෙති, නො පැළ දැය ද පාළ කෙරෙති, සැක කටයුතු නන්වැදෑරුම් දහමෙහි සැක හැර පියත්, මේ දහම ද ප්‍රියභාවය පිණිස, ගුරුභාවය පිණිස, භාවනාව හෝ සම්භාවනාව පිණිස ශ්‍රමණ ධර්මය පිණිස නෛරන්තර්‍ය්‍යය පිණිස පවත්නේ ය.

"තං ඛො පනායමායස්මා ධම්මං සුත්වා ද්වයෙන වූපකාසෙන සම්පාදෙති, කායවූපකාසෙන ච චිත්තවූපකාසෙන ච: අද්ධා අයමායස්මා ජානං ජානාති පස්සං පස්සතී''ති. අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

"සීලවා ඛො පන අයමායස්මා පාතිමොක්ඛසංවරසංවුතො විහරති. ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු. අද්ධා අයමායස්මා ජානං ජානාති පස්සං පස්සතී''ති. අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

"බහුස්සුතො ඛො පන අයමායස්මා සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති. ධතා[1] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, අද්ධා අයමායස්මා ජානං ජානාති, පස්සං පස්සතී''ති. අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

"ආරද්ධවිරියො ඛො පන අයමායස්මා විහරති. අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු, අද්ධා අයමායස්මා ජානං ජානාති පස්සං පස්සතී''ති. අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

"සඞ්ඝගතො ඛො පන අයමායස්මා අනානාකථිකො හොති අතිරච්ඡානකථිකො, සාමං වා ධම්මං භාසති, පරං වා අජ්ඣෙසති, අරියං වා තුණ්හීභාවං නාතිමඤ්ඤති. අද්ධා අයමායස්මා ජානං ජානාති පස්සං පස්සතී''ති. අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

1. ධාතා – මජසං

මේ ආයුෂ්මත් ඒ දහම් අසා කායවිවේකයෙන් හා චිත්තවිවේකයෙන් ද යි යම් විවේකයෙකින් සපයා ද, වැලිත් මේ ආයුෂ්මත් දතයුත්ත දන්නේ ය, දක්කයුත්ත දක්නේ යයි. මේ ධර්මය ද ප්‍රියභාවය පිණිස ගුරුභාවය පිණිස, ගුණසම්භාවනාව පිණිස ශ්‍රමණධර්මය පිණිස, නෛරන්තර්‍යය පිණිස පවත්නෝ ය.

මේ ආයුෂ්මත් සිල්වත් වූයේ ප්‍රාතිමොක්ෂ ශීලසංවරයෙන් සංවෘත වූයේ ආචාර ගොචර සම්පන්න වූයේ අණුමාත්‍ර වරදෙහි බිය දක්නා සුලු වැ වෙසෙයි, සමාදන කොට සිකපෙදෙහි හික්මෙයි, එකැතින් මේ ආයුෂ්මත් දතයුත්ත දන්නේ ය; දක්කයුත්ත දක්නේ ය යි. මේ ධර්මය ද ප්‍රියභාවය පිණිස ගුරුභාවය පිණිස භාවනාව හෝ සම්භාවනාව පිණිස ශ්‍රමණධර්මය පිණිස, නෛරන්තර්‍යය පිණිස පවත්නේ ය.

මේ ආයුෂ්මත් වනාහි බහුශ්‍රැත වූයේ ශ්‍රැතධර වූයේ මුළු කොටගත් ඇසූ දෑ ඇතියේ වෙයි, ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ යම් දහම්හු සාර්ථ සව්‍යඤ්ජන කොට කෙවල පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍ය පවසත් ද, එබඳු දහම්හු තුලුන් විසින් බෙහෙවින් අසන ලද වෙත්. ධරණ ලද වෙත්. වචනයෙන් හසළ වෙත්. සිතින් විමසා බලන ලද වෙත්. නුවණින් පිළිවිදින ලද වෙත්. වැලි මේ ආයුෂ්මත් දතයුත්ත දන්නේය. දක්කයුත්ත දක්නේය යි. මේ දහම ද ප්‍රියභාවය පිණිස ගුරු භාවය පිණිස ගුණ භාවනාව හෝ සම්භාවනාව පිණිස ශ්‍රමණධර්මය පිණිස නෛරන්තර්‍යය පිණිස පවත්නේ ය

මේ ආයුෂ්මත් වනාහි අකුශලධර්ම ප්‍රහාණය පිණිස කුශලධර්ම වඩනු පිණිස ඇරඹූ වැර ඇතියේ වෙසෙයි. බල ඇතියේ දළ පැරකුම් ඇතියේ කුසල්දහම්හි නොහළ ධුර ඇතියේ වෙයි. එකතින් මේ ආයුෂ්මත් දතයුත්ත දන්නේ ය, දක්කයුත්ත දක්නේ ය යි. මේ ධර්මය ද ප්‍රියභාවය පිණිස ගරුභාවය පිණිස භාවනාව හෝ සම්භාවනාව පිණිස ශ්‍රමණධර්මය පිණිස නෛරන්තර්‍යය පිණිස පවත්නේ ය.

මේ ආයුෂ්මත් වනාහි සඟ මැදට ගියේ නන්වැදෑරුම් හිස් කියුම් නැතියේ තිරශ්චීන කථා නැතියේ තෙමේ හෝ දහම් දෙසයි, මෙරමා හෝ අධ්‍යෂණා කෙරෙයි, ආර්‍ය තුෂ්ණිම්භාවය හෝ නො පැහැ සිතයි. එකතින් මේ ආයුෂ්මත් දතයුත්ත දන්නේ ය. දක්කයුත්ත දක්නේ යයි. මේ ධර්මය ද ප්‍රියභාවය පිණිස ගුරුභාවය පිණිස භාවනාව හෝ සම්භාවනාව පිණිස ශ්‍රමණධර්මය පිණිස නෛරන්තර්‍යය පිණිස පවත්නේ ය.

"පඤ්චසු ඛො පන අයමායස්මා උපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති: ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො, ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සඞ්ඛාරා -පෙ- ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමොති, අද්ධා අයමායස්මා ජානං ජානාති, පස්සං පස්සතී"ති. අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තතීති.

ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ හෙතූ අට්ඨ පච්චයා ආදිබ්‍රහ්මචරියිකාය පඤ්ඤාය අප්පටිලද්ධාය පටිලාභාය පටිලද්ධාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තන්තීති.

## 8. 1. 1. 3
## පඨමපිය සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති, අමනාපො ච අගරු ච අභාවනීයො ච. කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු අප්පියපසංසී ච හොති. පියගරහී ච ලාභකාමො ච සක්කාරකාමො ච අහිරිකො ච අනොත්තප්පී ච පාපිච්ඡො ච මිච්ඡාදිට්ඨි ච. ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච.

අට්ඨහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ භික්ඛු න අප්පියපසංසී ච හොති න පියගරහී ච න ලාභකාමො ච න සක්කාරකාමො ච, හිරිමා ච හොති ඔත්තප්පී ච අප්පිච්ඡො ච සම්මාදිට්ඨි ච. ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති, මනාපො ච ගරු ච භාවනීයො චාති.

මේ ආයුෂ්මත් වනාහි රූපය මෙසේ ය, රූපසමුදය මෙසේ ය, රූපයාගේ අස්තඞ්ගමය මෙසේ ය, වෙදනා මෙසේ ය ... සංඥා මෙසේ ය ... සංස්කාර මෙසේ ය ... විඥානය මෙසේ ය, විඥාන සමුදය මෙසේ ය, විඥානයාගේ අස්තඞ්ගමය මෙසේ ය යි පඤ්ච උපාදානස්කන්ධයෙහි උදා-විය දක්නේ වෙසෙයි, එකතින් මේ ආයුෂ්මත් දත යුත්ත දන්නේ ය, දක්ක යුත්ත දක්නේ ය යි. මෙ ධර්මය ද ප්‍රියභාවය පිණිස ගුරුභාවය පිණිස භාවනාව හෝ සම්භාවනාව පිණිස ශ්‍රමණධර්මය පිණිස නෛරන්තර්‍ය්‍යය පිණිස පවත්නේ යයි.

මහණෙනි, නොලැබූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදිභූත විවසුත් නුවණ ලබනු පිණිස ලත් නුවණ පිළිබඳ භූයස්ත්‍වය පිණිස වෛපුල්‍යය පිණිස භාවනාව පිණිස පරිපූර්ණභාවය පිණිස මේ අෂ්ට හෙතූහු අෂ්ට ප්‍රත්‍යයයෝ පවතිත් යයි.

## 8. 1. 1. 3

## පළමුවැනි පියසූත්‍රය

**[සැවැත්නිදාන යි]**

මහණෙනි, කරුණු අටෙකින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට අප්‍රිය ද වෙයි, අමනාප ද වෙයි, අගරු ද අභාවනීය ද වෙයි. කවර අටෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අප්‍රියයන් පසස්නා සුලු ද වෙයි, ප්‍රියයන් ගරහන සුලු ද වෙයි, ලාභ කැමැතියේ ද වෙයි, සත්කාර කැමැතියේ ද වෙයි, ලජ්ජා නැතියේ ද වෙයි, ඔතප් නැතියේ ද වෙයි, ලමු ඉච්ඡා ඇතියේ ද වෙයි, මිසදිටු ඇතියේ ද වෙයි. මහණෙනි, මෙ අට කරුණින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට අප්‍රිය ද වෙයි, අමනාප ද වෙයි, ගරුතත් නැතියේ ද වෙයි, ගුණසම්භාවනා නැතියේ ද වෙයි.

මහණෙනි, අට කරුණෙකින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට ප්‍රිය ද වෙයි, මනාප ද වෙයි, ගරුතැන් ඇතියේ ද වෙයි, ගුණසම්භාවනාවට නිසි ද වෙයි. කවර අට කරුණෙකින යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ අප්‍රියයන් නො පසස්නා සුලු ද වෙයි, ප්‍රියයන් නොගරහන සුලු ද වෙයි, ලාභ කැමතියේ ද නො වෙයි, සත්කාර කැමැතියේ ද නො වෙයි, ලජ්ජා ඇතියේ ද වෙයි, පවට බාන සුලු ද වෙයි. අල්පෙච්ඡ ද වෙයි, සම්දිටු ඇතියේ ද වෙයි, මහණෙනි, මේ අට කරුණින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට ප්‍රිය ද වෙයි, මනාප ද වෙයි, ගරුතැන් ඇතියේ ද වෙයි, සම්භාවනීය ද වෙ යයි.

## 8. 1. 1. 4

## දුතියපිය සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච, කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු ලාභකාමො ච හොති. සක්කාරකාමො ච අනවඤ්ඤත්තිකාමො ච අකාලඤ්ඤු ච අමත්තඤ්ඤු ච අසුචි ච බහුභාණී ච අක්කොසකපරිභාසකො ච සබ්‍රහ්මචාරීනං

ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං අප්පියො ච හොති අමනාපො ච අගරු ච අභාවනීයො ච.

අට්ඨහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච. කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු න ලාභකාමො ච හොති. න සක්කාරකාමො ච න අනවඤ්ඤත්තිකාමො ච කාලඤ්ඤු ච මත්තඤ්ඤු ච සුචි ච න බහු භාණී ච න අක්කොසකපරිභාසකො ච සබ්‍රහ්මචාරීනං.

ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො ච හොති. මනාපො ච ගරු ච භාවනීයො චාති.

## 8. 1. 1. 5

## පඨමලොකධම්ම සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ, ලොක ධම්මා ලොකං අනුපරිවත්තන්ති, ලොකො ච අට්ඨලොකධම්මෙ අනුපරිවත්තති. කතමෙ අට්ඨ:

ලාභො ච අලාභො ච අයසො ච යසො ච නින්දා ච පසංසා ච සුඛං ච දුක්ඛං ච, ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨලොකධම්මෙ ලොකං අනුපරිවත්තන්ති, ලොකො ච ඉමෙ අට්ඨලොකධම්මෙ අනුපරිවත්තතීති.

## 8. 1. 1. 4
## දෙවැනි පියසූත්‍රය

[සැවත්නිදාන යි]

මහණෙනි, කරුණු අටෙකින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට අප්‍රිය ද වෙයි, අමනාප ද වෙයි, අගරු ද වෙයි, අභාවනීය ද වේ. කවර අට කරුණින යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ ලාභ කැමැතියේ ද වෙයි, සත්කාර කැමැතියේ ද වෙයි, අවඥ නො කැමැතියේ ද වෙයි, අකාලඥ වෙයි, අමාත්‍රඥ ද වෙයි, අපවිත්‍ර කායකර්මාදිය ඇතියේ ද වෙයි, බහුභාණී ද වෙයි, සබ්‍රම්සරුනට ආක්‍රොශ පරිභව කරනුයේ ද වේ.

මහණෙනි, මේ අට කරුණින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට අප්‍රිය ද වෙයි, අමනාප ද වෙයි, අගරු ද වෙයි, අභාවනීය ද වේ.

මහණෙනි, අට කරුණෙකින් සමන්වාගත වූ මහණ සබ්‍රම්සරුනට ප්‍රිය ද වෙයි, මනාප ද වෙයි, ගරු ද වෙයි, භාවනීය ද වේ. කවර අට කරුණින් යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ ලාභ කැමැතියේ ද නො වෙයි, සත්කාර කැමැතියේ ද නො වෙයි, අවඥත බව කැමැතියේ ද නො වෙයි, කාලඥ වෙයි, මාත්‍රඥ ද වෙයි, පවිත්‍රකායකර්මාදිය ඇතියේ ද වෙයි, බහුභාණී ද නො වෙයි. සබ්‍රම්සරුනට ආක්‍රොශපරිභව නො කරනුයේ ද වෙයි.

මහණෙනි, මේ අට කරුණින් සමන්වාගත මහණ සබ්‍රම්සරුනට ප්‍රිය ද වෙයි, මනාප ද වෙයි, ගරු ද වෙයි, භාවනීය ද වේ යයි.

## 8. 1. 1. 5
## පළමුවැනි ලෝකධම්ම සූත්‍රය

[සැවත්නිදාන යි]

මහණෙනි, මේ අෂ්ට ලෝකධර්මයෝ ලොව අනුව පෙරළෙත් ලෝකය ද අෂ්ට ලෝකධර්මයන් අනුව පෙරළෙයි. කවර අටදෙනෙක යත්:

ලාභය ද අලාභය ද අයස ද යස ද නින්දාව ද ප්‍රශංසාව ද සුඛය ද දුඃඛය ද යන මේ යි. මහණෙනි, මේ අටලෝ දහම්හු ලොව අනුව පෙරළෙති, ලොව ද මේ අටලෝ දහම් අනුව පෙරළේ යයි.

1. ලාභො අලාභො *අයසො යසො ච
නින්දා පසංසා ච සුඛං ච දුක්ඛං,
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා
අසස්සතා විපරිණාමධම්මා.

2. එතෙ ච ඤත්වා සතිමා සුමෙධො
අවෙක්ඛති විපරිණාමධම්මෙ,
ඉට්ඨස්ස ධම්මා න මථෙන්ති චිත්තං
අනිට්ඨතො නො පටිඝාතමෙති.

3. තස්සානුරොධා අථවා විරොධා
විධූපිතා අත්ථංගතා න සන්ති,
පදඤ්ච ඤත්වා විරජං අසොකං
සම්මප්පජානාති භවස්ස පාරගූති.

## 8. 1. 1. 6

## දුතියලොකධම්ම සුත්තං

**[සාවත්ථිනිදානං]**

අට්ඨිමෙ භික්ඛවෙ, ලොකධම්මා ලොකං අනුපරිවත්තන්ති, ලොකො ච අට්ඨ ලොකධම්මෙ අනුපරිවත්තති. කතමෙ අට්ඨ:

ලාභො ච අලාභො ච යසො ච අයසො ච නින්දා ච පසංසා ච සුඛං ච දුක්ඛං ච, ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨලොකධම්මා ලොකං අනුපරිවත්තන්ති. ලොකො ච ඉමෙ අට්ඨලොකධම්මෙ අනුපරිවත්තති.

අස්සුතවතො භික්ඛවෙ, පුථුජ්ජනස්ස උප්පජ්ජති ලාභොපි අලාභොපි යසොපි අයසොපි නින්දාපි පසංසාපි සුඛම්පි දුක්ඛම්පි.

සුතවතොපි ඛො භික්ඛවෙ, අරියසාවකස්ස උප්පජ්ජති ලාභොපි අලාභොපි, යසොපි අයසොපි නින්දාපි පසංසාපි සුඛම්පි දුක්ඛම්පි.

තත්‍ර භික්ඛවෙ, කො විසෙසො කො අධිප්පයාසො[1] කිං නානාකරණං[2] සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙනාති:

භගවම්මූලකා නො භන්තෙ ධම්මා, භගවන්නෙත්තිකා, භගවම්පටිසරණා. සාධු වත භන්තෙ, භගවන්තංයෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

---

1. අධිප්පායො – P.T.S. , සිමු. මජ්ඣං
අධිප්පායසො – ස්‍යා.

2. නානා කාරණං – සිමු.

* යසායසොච – මජ්ඣං

1. ලාභ ය, අලාභ ය, අයසය, යස ය, නින්‍දය, පසංසා ය සුඛ ය දුක්ඛ ය යන අනිත්‍ය වූ අශාස්වත වූ මේ ධර්මයෝ මනුෂ්‍යයන් කෙරෙහි පෙරළෙන ස්වභාව ඇතියහ.

2. සමෘතිමත් වූ පණ්ඩිත තෙමේ තෙල විපරිණාමධර්මයන් දැන (නුවණින්) බලයි. ඉෂ්ට වූ (ලාභාදී) ධර්මයෝ ඔහුගේ සිත නො මඩනාහ. අනිටු දහමින් (නොහොත් අනිටු දහම් විසයෙහි) හෙ ප්‍රතිඝාතයට නො පැමිණෙයි.

3. ඔහුගේ අනුරොධයෝ නොහොත් විරොධයෝ විනසන ලද්දහු අස්තයට ගියාහු නො ම ඇතියහ. රජස් නැති ශොක නැති නිර්වාණපදය ද දැන භවයාගේ පරතෙරට ගියේ (එබව) මොනවට දන්නේ යි.

## 8. 1. 1. 6

## දෙවැනි ලෝකධම්ම සූත්‍රය

**[සැවත්නිදන යි]**

1. මහණෙනි, මේ ලෝකධර්මයෝ අටදෙනෙක් ලෝකය අනුව පෙරළෙත්. ලෝකය ද අෂ්ටලෝකධර්මයන් අනුව පෙරළෙයි. කවර අටදෙනෙක යත්: ලාභ යැ අලාභ යැ අයස යැ යස යැ නින්‍ද යැ පසංසා යැ සුඛ යැ දුක්ඛ යැ යන අට යි. මහණෙනි, මේ අට ලෝදහම්හු ලොකය අනුව පෙරළෙත්. ලොකය ද මේ අටලෝදහම් අනුව පෙරළෙයි.

මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනයාහට ලාභයත් උපදියි. අලාභයත් උපදියි, අයසත් උපදියි, යසත් උපදියි, නින්‍දත් උපදියි, පසංසාත් උපදියි. සුඛත් උපදියි, දුක්ඛත් උපදී.

මහණෙනි, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාහට ද ලාභත් උපදනේ ය, අලාභත් උපදනේ යි. යසත් උපදනේ ය, අයසත් උපදනේ ය, නින්‍දත් උපදනේ ය, ප්‍රශංසාත් උපදනේ ය, සුඛත් උපදනේ ය, දුඃඛත් උපදනේ යි.

2. මහණෙනි, එහිලා අශ්‍රැතවත් පෘථග්ජනයාට වඩා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවකයාගේ වෙසෙස කවර, අධික ප්‍රයොගය කවර, නානාකරණය කවරැ?

වහන්ස, ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ ප්‍රභව කොට පවත්නාහ, භාග්‍යවතුන් වහන්සේ නේතෘ කොට ගෙන පවත්නාහ, භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ගෙන පවත්නාහ. වහන්ස, එකැතින් තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේ නම් මැනවි. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් අසා දරන්නාහ යි.

තෙන හි භික්ඛවෙ, සුණාථ සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

3. අස්සුතවතො භික්ඛවෙ, පුථුජ්ජනස්ස උප්පජ්ජති ලාභො, සො න ඉති පටිසඤ්චික්ඛති: උප්පන්නො ඛො මෙ අයං ලාභො, සො ච ඛො අනිච්චො දුක්ඛො විපරිනාමධම්මොති, යථාභූතං නප්පජානාති. උප්පජ්ජති අලාභො -පෙ- උප්පජ්ජති යසො -පෙ- උප්පජ්ජති අයසො -පෙ- උප්පජ්ජති නින්දා -පෙ- උප්පජ්ජති පසංසා -පෙ- උප්පජ්ජති සුඛං -පෙ- උප්පජ්ජති දුක්ඛං, සො න ඉති පටිසඤ්චික්ඛති උප්පන්නං ඛො මෙ ඉදං දුක්ඛං තං ච ඛො අනිච්චං දුක්ඛං විපරිනාමධම්මන්ති. යථාභූතං නප්පජානාති.

තස්ස ලාභොපි චිත්තං පරියාදාය තිට්ඨති, අලාභොපි චිත්තං පරියාදාය තිට්ඨති, යසොපි චිත්තං පරියාදාය තිට්ඨති, අයසොපි චිත්තං පරියාදාය තිට්ඨති, නින්දාපි චිත්තං පරියාදාය තිට්ඨති, පසංසාපි චිත්තං පරියාදාය තිට්ඨති, සුඛම්පි චිත්තං පරියාදාය තිට්ඨති, දුක්ඛම්පි චිත්තං පරියාදාය තිට්ඨති. සො උප්පන්නං ලාභං අනුරුජ්ඣති, අලාභෙ පටිවිරුජ්ඣති. උප්පන්නං යසං අනුරුජ්ඣති, අයසෙ පටිවිරුජ්ඣති. උප්පන්නං පසංසං අනුරුජ්ඣති, නින්දාය පටිවිරුජ්ඣති. උප්පන්නං සුඛං අනුරුජ්ඣති, දුක්ඛෙ පටිවිරුජ්ඣති. සො එවං අනුරොධවිරොධසමාපන්නො න පරිමුච්චති, ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

4. සුතවතො ච ඛො භික්ඛවෙ, අරියසාවකස්ස උප්පජ්ජති ලාභො. සො ඉති පටිසඤ්චික්ඛති: උප්පන්නො ඛො මෙ අයං ලාභො, සො ච ඛො අනිච්චො දුක්ඛො විපරිනාමධම්මොති යථාභූතං පජානාති. උප්පජ්ජති අලාභො -පෙ- උප්පජ්ජති යසො -පෙ- උප්පජ්ජති අයසො -පෙ- උප්පජ්ජති නින්දා -පෙ- උප්පජ්ජති පසංසා -පෙ- උප්පජ්ජති සුඛං -පෙ- උප්පජ්ජති දුක්ඛං. සො ඉති පටිසඤ්චික්ඛති:

මහණෙනි, එසේනම් අසව මොනොවට මෙනෙහිකරව, කියන්නෙමි යි.

'වහන්ස, එසේය'යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

3. මහණෙනි, අශ්‍රැතවත් පුහුදුන්හට ලාභයෙක් උපදනේ ය. හේ මෙසේ නුවණින් නොදක්නේය: "මට මේ ලාභයෙක් උපන, හෙ ද වනාහි අනිස යැ, දුක යැ පෙරළෙනසැහැවි යැ''යි මෙසේ ඇතිසැටියෙන් නොදන්නේ ය. අලාභයෙක් උපදනේ ය -පෙ- යශසෙක් උපදනේ ය ... අයශසෙක් උපදනේ ය ... නින්‍දයෙක් උපදනේ ය ... ප්‍රශංසායෙක් උපදනේ ය ... සුඛයෙක් උපදනේ ය ... දුකෙක් උපදනේ ය මෙසේ හේ නුවණින් නො දක්නේය: "මට මේ දුකෙක් උපන, හෙ ද වනාහි අනිස යැ, දුක යැ, පෙරළෙන සැහැවියැ'යි ඇති සැටි නො දන්නේ ය. ලාභයත් ඔහු සිත මැඩගෙන සිටුනේ ය, අලාභයත් සිත මැඩගෙන සිටුනේ ය, යශසත් සිත මැඩගෙන සිටුනේ ය, අයශසත් සිත මැඩගෙන සිටුනේ ය, නින්‍දවත් සිත මැඩගෙන සිටුනේ ය, ප්‍රශංසාවත් සිත මැඩගෙන සිටුනේ ය, සුඛයත් සිත මැඩගෙන සිටුනේය, දුකත් සිත මැඩගෙන සිටුනේ යි.

හේ උපන් ලාභය නිමිති කොට ඇලෙයි, අලාභය නිමිති කොට විරොධ කෙරෙයි. උපන් යශස් නිමිති කොට ඇලෙයි, අයශස් නිමිති කොට විරොධ කෙරෙයි. උපන් ප්‍රශංසාව නිමිති කොට ඇලෙයි, නින්‍දව නිමිති කොට විරොධ කෙරෙයි. උපන් සුව නිමිති කොට ඇලෙයි. දුක් නිමිති කොට විරොධ කෙරෙයි. හේ මෙසේ අනුරොධ විරොධයට වැදුනේ ජාතියෙනුදු ජරායෙනුදු මරණිනුදු ශොකයෙනුදු පරිදෙවයෙනුදු දුකිනුදු දොම්නසිනුදු උපායාසයෙනුදු නො මිදෙයි. වර්තදුඃඛයෙන් නො මිදෙන්-නේ යි කියමි.

4. මහණෙනි, ශ්‍රැතවත් අරිසවුහට ද ලාභයෙක් උපදියි. හේ මෙසේ සලකයි: මට මේ ලාභයෙක් උපන, එ ද වනාහි අනිත්‍ය ය, දුඃඛ ය, පෙරළෙන සැහැවි ඇතැ යි යථාභූතව දන්නේ ය. අලාභයෙක් උපදනේ ය ... යශසෙක් උපදනේ ය ... අයශසෙක් උපදනේ ය ... ප්‍රසංශායෙක් උපදනේ ය ... නින්දයෙක් උපදනේ ය ... සුඛයෙක් උපදනේ ය ... දුඃඛයෙක් උපදනේ ය. හේ මෙසේ සලකයි:

උප්පන්නං ඛො මෙ ඉදං දුක්ඛං, තඤ්ච ඛො අනිච්චං දුක්ඛං විපරිනාමධම්මන්ති යථාභූතං පජානාති. තස්ස ලාභොපි චිත්තං න පරියාදාය තිට්ඨති. අලාභොපි චිත්තං න පරියාදාය තිට්ඨති, යසො'පි චිත්තං න පරියාදාය තිට්ඨති, අයසොපි චිත්තං න පරියාදාය තිට්ඨති, නින්දාපි චිත්තං න පරියාදාය තිට්ඨති, පසංසාපි චිත්තං න පරියාදාය තිට්ඨති, සුඛම්පි චිත්තං න පරියාදාය තිට්ඨති, දුක්ඛම්පි චිත්තං න පරියාදාය තිට්ඨති. සො උප්පන්නං ලාභං නානුරුජ්ඣති, අලාභෙ නප්පටිවිරුජ්ඣති. උප්පන්නං යසං නානුරුජ්ඣති. අයසෙ නප්පටිවිරුජ්ඣති. උප්පන්නං පසංසං නානුරුජ්ඣති, නින්දාය නප්පටිවිරුජ්ඣති. උප්පන්නං සුඛං නානුරුජ්ඣති. දුක්ඛෙ නප්පටිවිරුජ්ඣති. සො එවං අනුරොධවිරොධවිප්පහීනො පරිමුච්චති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දෙමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

අයං ඛො භික්ඛවෙ, විසෙසො අයං අධිප්පයාසො[1] ඉදං නානාකරණං[2] සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙනාති.

1. "ලාභො අලාභො අයසො යසො ච
නින්දා පසංසා ච සුඛඤ්ච[3] දුක්ඛං,
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා
අසස්සතා විපරිනාමධම්මා.

2. එතෙ ච ඤත්වා සතිමා සුමෙධො
අවෙක්ඛති විපරිනාමධම්මෙ
ඉට්ඨස්ස ධම්මා න මථෙන්ති චිත්තං
අනිට්ඨතො නො පටිඝාතමෙති.

3. තස්සානුරොධා අථවා විරොධා
විධූපිතා අත්ථගතා න සන්ති,
පදඤ්ච ඤත්වා විරජං අසොකං
සම්මප්පජානාති භවස්සපාරගූති.

## 8. 1. 1. 7

## දෙවදත්තවිපත්ති සුත්තං

එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ අචිරපක්කන්තෙ දෙවදත්තෙ. තත්‍ර ඛො භගවා දෙවදත්තං ආරබ්භ භික්ඛූ ආමන්තෙසි:

1. අධිප්පායසො - සයා.
2. නානාකාරණං - සීමු.
3. සුඛං දුඛං ච - මජසං.

5. මට මේ දුකෙක් උපන, එ ද වනාහි අනිත්‍ය ය, දුඃඛ ය, පෙරළෙන සැහැවි ඇතැ යි යථාභූත කොට දන්නේය. ලාභය ද ඔහු සිත මැඩගෙන නො සිටියි. අලාභය ද සිත මැඩගෙන නො සිටියි. යශස් ද සිත මැඩගෙන නො සිටියි. අයශස් ද සිත මැඩගෙන නො සිටියි. නින්දව ද සිත මැඩගෙන නො සිටියි, ප්‍රශංසාව ද සිත මැඩගෙන නො සිටියි, සුඛය ද සිත මැඩගෙන නො සිටියි. දුඃඛය ද සිත මැඩගෙන නො සිටියි. හේ උපන් ලාභය නිමිති කොට නො ඇලෙයි, අලාභය නිමිති කොට විරොධ නො කෙරෙයි. උපන් යශස් නිමිති කොට නො ඇලෙයි, අයශස් නිමිති කොට විරොධ.නො කෙරෙයි, උපන් ප්‍රශංසා නිමිති කොට නො ඇලෙයි. නින්දව නිමිති කොට විරොධ නො කෙරෙයි, උපන් සුඛය නිමිති කොට නො ඇලෙයි. දුඃඛය නිමිති කොට විරොධ නොකෙරෙයි. හේ මෙසේ අනුරොධ විරොධ නැතියේ ජාතියෙනුදු ජරායෙනුදු මරණිනුදු සොකයෙනුදු පරිදෙවයෙනුදු දුකෙනුදු දෙම්නසිනුදු උපායාසයෙනුදු මිදෙයි. වර්තදුඃඛයෙන් මිදෙන්නේ යයි කියමි·

මහණෙනි, ශ්‍රුතවත් ආර්ය ශ්‍රාවකයාගේ අශ්‍රුතවත් පෘථග්ජනයා හා මේ විශේෂය යි, මේ අධිකප්‍රයොගය යි, මේ වෙනස යි.

1. ලාභය හා අලාභය ද අයශස් හා යශස් ද නින්ද හා ප්‍රශංසා ද සුඛය හා දුඃඛය දැයි මිනිසුන් කෙරෙහි වැටෙන තෙල දහම්හු අනිත්‍යයහ, අශාශ්වතයහ, පෙරළෙන සැහැවි ඇතියහ.

2. සමෘතිමත් වූයේ සුනුවර ප්‍රඥ ඇතියේ තෙල පෙරළෙන සැහැවි දහමුන් දන ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය. ඉටු දහම්හු ඔහු සිත නො මඩනාහ. අනිටු දහමින් (සිත) ගැටීමට නො එයි.

3. අනුරොධ වෙත්වයි වැලිත් විරොධ වෙත්වයි නසන ලද අස්තඞ්ගත දහම්හු ඔහුට නො වෙත්. භවයාගේ පාරයට ගියේ රාගාදි රජස් නැති නිශ්ශොක වූ නිර්වාණපදය දන (පාරඞ්ගතභාවය) මොනොවට දන්නේ යි.

## 8. 1. 1. 7

## දෙවදත්තවිපත්ති සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූට පව්වෙහි වැඩ වසන සේක. දෙවදත් තෙරුන් (සඟුන් බිඳ නික්ම) ගිය නොබෝ කල්හි භාග්‍යවතුන් වහන්සේ දෙවදතුන් අරභයා මහණුන් ඇමතූ සේක:

සාධු භික්ඛවෙ, භික්ඛු කාලෙන කාලං අත්තවිපත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධු භික්ඛවෙ, භික්ඛු කාලෙන කාලං පරවිපත්තිං පච්චවෙක්ඛිතා හොති; සාධු භික්ඛවෙ, භික්ඛු කාලෙන කාලං අත්තසම්පත්තිං පච්ච-වෙක්ඛිතා හොති, සාධු භික්ඛවෙ, භික්ඛු කාලෙන කාලං පරසම්පත්තිං පච්චවෙක්ඛිතා හොති, අට්ඨහි භික්ඛවෙ, අසද්ධම්මෙහි අභිභූතො පරියා-දින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි අට්ඨහි:

ලාභෙන භික්ඛවෙ, අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. අලාභෙන භික්ඛවෙ -පෙ- යසෙන භික්ඛවෙ -පෙ- අයසෙන භික්ඛවෙ -පෙ- සක්කාරෙන භික්ඛවෙ -පෙ- අසක්කාරෙන භික්ඛවෙ -පෙ- පාපිච්ඡතාය භික්ඛවෙ -පෙ- පාපමිත්තතාය භික්ඛවෙ' අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්න-චිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො, අතෙකිච්ඡො.

සාධු භික්ඛවෙ භික්ඛු උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය.

කිඤ්ච භික්ඛවෙ, භික්ඛු අත්ථවසං පටිච්ච උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය, යං හිස්ස භික්ඛවෙ උප්පන්නං ලාභං අනභිභුය්‍ය විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. උප්පන්නං ලාභං අභිභුය්‍ය විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති.

යං හිස්ස භික්ඛවෙ, උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අනභිභුය්‍ය විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති,

මහණෙනි, මහණ කලින් කල ආත්මවිපත් සලකන්නේ නම් මැනැව; මහණෙනි, මහණ කලින් කල පරවිපත් සලකන්නේ නම් මැනැව; මහණෙනි, මහණ කලින් කල ආත්මසම්පත් සලකන්නේ නම් මැනැව; මහණෙනි, මහණ කලින් කල පරසම්පත් සලකන්නේ නම් මැනැව; මහණෙනි, අෂ්ටඅසද්ධර්මයෙකින් මැඩ සිටි වටාගත් සිත් ඇති දෙව්දත් අපායට නිසි වූයේ නිරයට නිසි වූයේ කල්පස්ථායී වූයේ පිළියම් නැතියේ වෙයි. කවර අටෙකින යත්:

මහණෙනි, ලාභයෙන් මඩනා ලද හාත්පසින් ගන්නා ලද සිත් ඇති දෙව්දත් අපායට නිසි වූයේ නිරයට නිසි වූයේ කල්පස්ථායී වූයේ පිළියම් නැතියේ වෙයි. මහණෙනි, අලාභයෙන් ... මහණෙනි, යශසින් ... මහණෙනි, අයශසින් ... මහණෙනි, සත්කාරයෙන් ... මහණෙනි, අසත්කාරයෙන් ... මහණෙනි, පාපෙච්ඡතායෙන් ... මහණෙනි, පාපමිත්‍රතායෙන් මඩනා ලද වතුරුවා ගත් සිත් ඇති දෙව්දත් අපායට නිසි වූයේ, නිරයට නිසි වූයේ කල්පස්ථායී වූයේ පිළියම් නැතියේ වෙයි.

මහණෙනි, මේ අෂ්ට අසද්ධර්මයෙන් මඩනා ලද වතුරුවාගත් සිත් ඇති දෙව්දත් අපායට නිසි වූයේ නිරයට නිසි වූයේ කල්පස්ථායී වූයේ පිළියම් නැතියේ වෙයි.

මහණෙනි, මහණ උපන් ලාභය පුන පුනා මැඩ ගෙන වසන්නේ නම් මැනැව. උපන් අලාභය ... උපන් යශස් ... උපන් අයශස් ... උපන් සත්කාර ... උපන් අසත්කාර ... උපන් පාපෙච්ඡතා ... උපන් පාපමිත්‍රතා පුන පුනා මැඩ ගෙන වසන්නේ නම් මැනැව.

මහණෙනි, මහණ කිනම් අර්ථයක් පිණිස උපන් ලාභ පුන පුනා මැඩ ගෙන වසන්නේ වේද මහණෙනි, උපන් ලාභ නො මැඩ ගෙන වසන ඔහුට යම් හෙයෙකින් විඝාතපරිදාහකරවූ ආශ්‍රවයෝ උපදනාහු ද, උපන් ලාභ මැඩ ගෙන වසන ඔහුට විඝාතපරිදාහකරවූ ඒ ආස්‍රවයෝ මෙසේ නොවෙති.

මහණෙනි, යම්හෙයකින් උපන් අලාභ ... උපන් යශස් ... උපන් අයශස් ... උපන් සත්කාර ... උපන් අසත්කාර ... උපන් පාපෙච්ඡතා ... උපන් පාපමිත්‍රතා නො මැඩ ගෙන වසන්නහුට විඝාතපරිදාහ කරන ආස්‍රවයෝ උපදනාහු ද, උපන් පාපමිත්‍රතාව මැඩ ගෙන වසන ඔහුට විඝාතපරිදාහ කරන ඒ ආස්‍රවයෝ මෙසේ නො වෙත්.

ඉදං ඛො භික්ඛවෙ, භික්ඛු අත්ථවසං පටිච්ච උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය, උප්පන්නං අලාභං -පෙ- උප්පන්නංයසං -පෙ- උප්පන්නං අයසං-පෙ-උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය, තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං; උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරිස්සාම උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරිස්සාමාති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

## 8. 1. 1. 8

## උත්තර සුත්තං

එකං සමයං ආයස්මා උත්තරො මහිසවත්ථුස්මිං විහරති සඞ්ඛෙය්‍ය-කෙ පබ්බතෙ ධවජාලිකායං[1] තත්‍ර ඛො ආයස්මා උත්තරො භික්ඛූ ආමන්තෙසි -පෙ-

සාධාවුසො භික්ඛු කාලෙන කාලං අත්තවිපත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධාවුසො භික්ඛු කාලෙන කාලං පරවිපත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධාවුසො භික්ඛු කාලෙන කාලං අත්තසම්පත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධාවුසො භික්ඛු කාලෙන කාලං පරසම්පත්තිං පච්චවෙක්ඛිතා හොතීති.

තෙන ඛො පන සමයෙන වෙස්සවණො මහාරාජා උත්තරාය දිසාය දක්ඛිණං දිසං ගච්ඡති කෙනචිදෙව කරණීයෙන. අස්සොසි ඛො වෙස්සවණො මහාරාජා ආයස්මතො උත්තරස්ස මහිසවත්ථුස්මිං සඞ්ඛෙය්‍යකෙ පබ්බතෙ ධවජාලිකායං භික්ඛූනං එවං ධම්මං දෙසෙන්තස්ස, 'සාධාවුසො භික්ඛු කාලෙන කාලං අත්තවිපත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධාවුසො භික්ඛු කාලෙන කාලං පරවිපත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධාවුසො භික්ඛු කාලෙන කාලං අත්තසම්පත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධාවුසො භික්ඛු කාලෙන කාලං පරසම්පත්තිං පච්චවෙක්ඛිතා හොතී'ති.

අථ ඛො වෙස්සවණො මහාරාජා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[2] වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව මහිසවත්ථුස්මිං සඞ්ඛෙය්‍යකෙ පබ්බතෙ ධවජාලිකායං[1] අන්තර-හිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි.

---

1. වටජාලිකාය - ස්‍යා. චඞ්ජාලිකායං - මජ්ඣං. 2. සමිඤ්ජිතං - මජ්ඣං.

මහණෙනි, මහණ මෙ කරුණ පිණිස උපන් ලාභය පුන පුනා මැඩ ගෙන වෙසෙන්නේ ය. උපන් අලාභය ... උපන් යසස ... උපන් අයස ... උපන් සත්කාරය ... උපන් අසත්කාරය ... උපන් පාපෙච්ඡතාව ... උපන් පාපමිත්‍රතාව පුනපුනා මැඩ ගෙන වෙසෙන්නේ ය. මහණෙනි, එහෙයින් මෙ කරුණෙහි ලා මෙසේ හික්මිය යුතුයි: උපන් ලාභය පුන පුනා මැඩ ගෙන වෙසෙන්නෙමු කියායි. උපන් අලාභය ... උපන් යශස... උපන් අයශස .. උපන් සත්කාරය ... උපන් අසත්කාරය ... උපන් පාපෙච්ඡතාව...උපන් පාපමිත්‍රතාව පුන පුනා මැඩ ගෙන වෙසෙන්නෙමු යි කියායි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතුයි.

## 8. 1. 1. 8

## උත්තර සූත්‍රය

එක් සමයෙක්හි ආයුෂ්මත් උත්තර තෙරහු මහිසවත්‍ථු සම්පයෙහි සඞ්ඛෙය්‍යක පර්වතයෙහි වූ ධවජාලිකා නම් වෙහෙරෙහි වෙසෙති. එකල්හි ආයුෂ්මත් උත්තර තෙරහු භික්ෂූන් ඇමතූහ. ...

ඇවැත්නි, මහණ කලින් කල ආත්මවිපත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ වේ නම් මැනැවැ. ඇවැත්නි. මහණ කලින්කල පරවිපත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ වේ නම් මැනැවැ. ඇවැත්නි, මහණ, කලින්කල ආත්මසම්පත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ වේ නම් මැනැවැ. ඇවැත්නි, මහණ කලින් කල පරසම්පත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ වේ නම් මැනැවැයි.

එ සමයෙහි වනාහි වෙසවුණු මහරජ යම් මැ කටයුත්තෙකින් උතුරු-දිගින් දකුණුදිගට යන්නේ ය. වෙසවුණු මහරජ මහිසවත්‍ථු සම්පයෙහි සඞ්ඛෙය්‍යක පර්වතයෙහි වූ ධවජාලිකාවෙහෙරෙහි ආයුෂ්මත් උත්තර තෙරුන් සභනට මෙසේ දහම් දෙසනු ඇසී: ඇවැත්නි, මහණ කලින්කල ආත්ම විපත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම් මැනැවැ.. ඇවැත්නි, මහණ කලින්කල පරවිපත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම් මැනැවැ. ඇවැත්නි, මහණ කලින් කල ආත්මසම්පත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම මැනැවැ. ඇවැත්නි, මහණ කලින් කල පරසම්පත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම් මැනැවැ කියා යි.

ඉක්බිති වෙසවුණු මහරජ බලවත් පුරුෂයෙක් වක්කළ අතක් යම් සේ දික් කරන්නේ හෝ වේ ද, දික් කළ අතක් යම් සේ වක් කරන්නේ හෝ වේ ද, එසෙයින් මහිසවත්‍ථුයෙහි සඞ්ඛෙය්‍යක පර්වතයෙහි වූ ධවජාලිකා වෙහෙරෙහි අතුරුදහන් වූයේ තව්තිසා දෙවියන් අතරෙහි පහළවිය.

අථ ඛො වෙස්සවණො මහාරාජා යෙන සක්කො දෙවානමින්දො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා සක්කං දෙවානමින්දං එතදවොච, 'යග්ඝෙ මාරිස, ජානෙය්‍යාසි, එසො ආයස්මා උත්තරො මහිසවත්ථුස්මිං සඞ්ඛෙය්‍යකෙ පබ්බතෙ ධවජාලිකායං භික්ඛූනං එවං ධම්මං දෙසෙති: 'සාධාවුසො භික්ඛු කාලෙන කාලං අත්තවිපත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධාවුසො භික්ඛු කාලෙන කාලං පරවිපත්තිං –පෙ– අත්තසම්පත්තිං –පෙ– පරසම්පත්තිං පච්චවෙක්ඛිතා හොතී'ති.

අථ ඛො සක්කො දෙවානමින්දො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව දෙවෙසු තාවතිංසෙසු අන්තරහිතො මහිසවත්ථුස්මිං සඞ්ඛෙය්‍යකෙ පබ්බතෙ ධවජාලිකායං ආයස්මතො උත්තරස්ස පමුඛෙ[1] පාතුරහොසි: අථ ඛො සක්කො දෙවානමින්දො යෙනායස්මා උත්තරො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උත්තරං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සක්කො දෙවානමින්දො ආයස්මන්තං උත්තරං එතදවොච:

සච්චං කිර භන්තෙ, ආයස්මා උත්තරො භික්ඛූනං එවං ධම්මං දෙසෙසි: සාධාවුසො භික්ඛු කාලෙන කාලං අත්තවිපත්තිං පච්චවෙක්ඛිතා හොති. සාධාවුසො භික්ඛු කාලෙන කාලං පරවිපත්තිං –පෙ– අත්තසම්පත්තිං –පෙ– පරසම්පත්තිං පච්චවෙක්ඛිතා හොතී'ති?

එවං දෙවානමින්දාති.

කිං පනිදං[2] භන්තෙ, ආයස්මතො උත්තරස්ස සකං පටිභානං, උදාහු තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්සාති?

තෙන හි දෙවානමින්ද, උපමං තෙ කරිස්සාමි, උපමායපි ඉධෙකච්චෙ[3] විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි දෙවානමින්ද, ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ මහාධඤ්ඤරාසි, තතො මහාජනකායො ධඤ්ඤං ආහරෙය්‍ය කාජෙහිපි පිටකෙහිපි උච්ඡඞ්ගෙහිපි අඤ්ජලීහිපි. සො නු ඛො දෙවානමින්ද තං මහාජනකායං උපසඞ්කමිත්වා එවං පුච්ඡෙය්‍ය: කුතො ඉමං ධඤ්ඤං ආහරථාති? කථං තං ව්‍යාකරමානො[4] නු ඛො දෙවානමින්ද, සො මහාජනකායො සම්මා ව්‍යාකරමානො ව්‍යාකරෙය්‍යාති?

1. සම්මුඛෙ – මජසං.
2. කිං පන – ස්‍යා.
3. උපමාය මිධෙකච්චෙ – මජසං.
4. කථං ව්‍යාකරමානො – මජසං.

ඉක්බිති වෙසවුණු මහරජ සක්දෙවිඳු වෙත එළඹියේ ය. එළඹ සක්දෙවිඳු හට තෙල සැලකළේ ය: නිදුකාණෙනි, දන්නෙහි: "තෙල ආයුෂ්මත් උත්තර තෙරහු මහිසවත්‍ථු සමීපයෙහි සඞ්ඛෙය්‍යක පර්වතයෙහි වූ ධවජාලිකා වෙහෙරෙහි සඟනට මෙසේ දම් දෙසති: "ඇවැත්නි, මහණ කලින්කල ආත්මවිපත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම් මැනැවැ, ඇවැත්නි, මහණ කලින් කල පරවිපත් ... ආත්මසම්පත් ... පරසම්පත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම් මැනැවැ''යි.

ඉක්බිති සක්දෙවිඳු යම්සේ බලවත් පුරුෂයෙක් වක්කළ අතක් දික් කරන්නේ හෝ වේ ද, දික්කළ අතක් වක් කරන්නේ හෝ වේද, එසෙයින් ම තව්තිසා දෙවියන් කෙරෙහි අතුරුදන් වූයේ මහිසවත්‍ථු සමීපයෙහි වූ සඞ්ඛෙය්‍යක පර්වතයෙහි ධවජාලිකා වෙහෙරෙහි ආයුෂ්මත් උත්තර තෙරුන් හමුයෙහි පහළ වී ය. ඉක්බිති සක්දෙවිඳු ආයුෂ්මත් උත්තර තෙරුන් වෙත එළඹියේය. එළඹ ආයුෂ්මත් උත්තර තෙරුන් වැඳ එකත්පස් වැ සිටියේය. එකත්පසෙක සිටි සක්දෙවිඳු ආයුෂ්මත් උත්තරතෙරුන්ට තෙල සැලකළේය:

වහන්ස, ආයුෂ්මත් උත්තර තෙරණුවෝ "ඇවැත්නි, මහණ කලින් කල ආත්ම විපත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ වේ නම් මැනැවැ. ඇවැත්නි, මහණ කලින් කල පරවිපත්...ආත්මසම්පත්... පරසම්පත් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ වේ නම් මැනවැ''යි මෙසේ සඟනට දහම් දෙසූවාහු සැබවෙක් දැයි?

එසේ යැ දෙවෙන්ද්‍රය,

කිම වහන්ස, මෙ ආයුෂ්මත් උත්තරයන්ගේ සවයං ප්‍රතිභානයෙක් වේ ද? නොහොත් ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ බසෙක් වේ දැ? යි.

එසේ වී නම් දේවේන්ද්‍රය, තොපට උපමාවක් කරමි. මෙ ලොව්හි ඇතැම් විඥ පුරුෂයෝ උපමායෙනුදු භාෂිතයාගේ අර්ථය දැනගන්නාහයි. යම්සේ දේවේන්ද්‍රය, ගමකට වෙවයි නියම් ගමකට වෙවයි නුදුරෙහි මහාධාන්‍යරාශියෙක් වේ නම් එයින් මහාජනසමූහයා කයිනුදු පේළායෙනුදු ඇකයෙනුදු ඇඳිලියෙනුදු ධාන්‍ය ගෙන එන්නේ ය. දෙවෙන්ද්‍රය, යමෙක් ඒ මහාජනසමූහයා වෙත එළඹ කොයින් මේ ධාන්‍ය ගෙනෙවුදැ යි මෙසේ පුළුවුස්නේ නම් දේවේන්ද්‍රය, එය විවරණ කරනුයේ ඒ මහාජනකාය කෙසේ නම් මොනොවට විවරණ කරන්නේ වේ ද?

අමුම්හා ධඤ්ඤරාසිම්හා ආහරාමාති බො භන්තෙ, සො මහාජනකායො සම්මා ව්‍යාකරමානො ව්‍යාකරෙය්‍යාති.

එවමෙව බො දෙවානමින්ද, යං කිඤ්චි සුභාසිතං සබ්බං තං තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස, තතො උපාදායුපාදාය මයඤ්චඤ්ඤෙ ච භණාමාති,

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාව සුභාසිතමිදං[1] භන්තෙ, ආයස්මතා උත්තරෙන යං කිඤ්චි සුභාසිතං සබ්බං තං තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස, තතො උපාදායුපාදාය මයඤ්චඤ්ඤෙ ච භණාමාති,

එකමිදං භන්තෙ, උත්තර, සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ අචිරපක්කන්තෙ දෙවදත්තෙ. තත්‍ර බො භගවා දෙවදත්තං ආරබ්භ භික්ඛූ ආමන්තෙසි:

සාධු භික්ඛවෙ, භික්ඛු කාලෙන කාලං අත්තවිපත්තිං පච්චවෙක්ඛිතා හොති, සාධු භික්ඛවෙ, භික්ඛු කාලෙන කාලං පරවිපත්තිං පච්චවෙක්ඛිතා හොති -පෙ- අත්තසම්පත්තිං -පෙ- පරසම්පත්තිං පච්චවෙක්ඛිතා හොතීති.

අට්ඨහි භික්ඛවෙ, අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො අපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි අට්ඨහි:

ලාභෙන[2] භික්ඛවෙ අභිභූතො -පෙ- අලාභෙන භික්ඛවෙ -පෙ- යසෙන භික්ඛවෙ -පෙ- අයසෙන භික්ඛවෙ -පෙ- සක්කාරෙන භික්ඛවෙ -පෙ- අසක්කාරෙන භික්ඛවෙ -පෙ- පාපිච්ඡතාය භික්ඛවෙ -පෙ- පාපමිත්තතාය භික්ඛවෙ අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො අපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. ඉමෙහි බො භික්ඛවෙ, අට්ඨහි අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො අපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

සාධු භික්ඛවෙ, භික්ඛු උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය, උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය.

1. යාව සුභසිතං විදං - මජ්ඣං
2. ලාභෙන හි - මජ්ඣං

වහන්ස, අසෝ මහාධාන්‍යරාශියෙන් ගෙන එන්නෙමුයි මොනොවට විවරණ කරන ඒ මහාජනසමූහයා කියන්නේ ය යි.

දේවේන්ද්‍රය, එසෙයින් ම යම් සුභාෂිතයෙක් වේ නම් එ හැම බස ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේගේ ය. එයින් පුනපුනා ගෙන අපිදු අනුනට බණම්හ''යි.

වහන්ස, ආශ්චර්‍ය්‍ය ය. වහන්ස, අද්භූත ය. වහන්ස, 'යම්කිසි සුභාෂිතයෙක් වේ නම් එ හැම අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේගේ වචනය. එයින් පුන පුනා ගෙන අපිදු අනුනට බණම්හ යන මේ ආයුෂ්මත් උත්තර තෙරණුවන් විසින් අත්‍යන්තයෙන් සුභාෂිතයි.

වහන්ස, උත්තර තෙරණුවනි, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ දෙව්දතුන් (සඟුන් බිඳ නික්ම) ගිය නොබෝ කල්හි, රජගහනුවර සමීපයෙහි වූ ගිජ්ඣකූළපව්වෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දෙව්දතුන් අරභයා මහණුන් ඇමතූ සේක:

මහණෙනි, මහණ කලින් කල ආත්මවිපත් සලකන්නේ වේ නම් මැනැවැ. මහණෙනි, මහණ කලින් කල පරවිපත් ... ආත්මසම්පත් ... පරසම්පත් සලකන්නේ වේ නම් මැනැවි.

මහණෙනි, අෂ්ටඅසද්ධර්මයෙකින් අභිභූත වූ දැඩිකොට ගත් සිතැති දෙව්දත් අපායට නිසි වූයේ නිරයට නිසි වූයේ කල්පස්ථායී වූයේ පිළියම් නැතියේ වෙයි. කවර අටෙකින යත්:

මහණෙනි, ලාභයෙන් අභිභූත වූ ... මහණෙනි, අලාභයෙන් ... මහණෙනි, යසසින් ... මහණෙනි, අයසසින් මහණෙනි, සත්කාරයෙන් ... මහණෙනි, අසත්කාරයෙන් ... මහණෙනි, පාපෙච්ඡතායෙන් ... මහණෙනි, පාපමිත්‍රතායෙන් අභිභූත වූ නිමහම් කොට ගත් සිතැති දෙව්දත් අපායට නිසි වූයේ නිරයට නිසි වූයේ කල්පස්ථායී වූයේ පිළියම් නැතියේ වෙයි. මහණෙනි, මේ අටඅසත්දහමින් මැඩුණු නිමහම් කොට ගත් සිතැති දෙව්දත් අපායට නිසි වූයේ නිරයට නිසි වූයේ කල්පස්ථායී වූයේ පිළියම් නැතියේ වෙයි.

මහණෙනි, මහණ උපන් ලාභය පුන පුනා මැඩ ගෙන වසන්නේ නම් මැනැවැ. උපන් අලාභය ... උපන් යසස් ... උපන් අයසස් ... උපන් සත්කාර ... උපන් අසත්කාර ... උපන් පාපෙච්ඡතා ... උපන් පාපමිත්‍රතා පුනපුනා මැඩ ගෙන වසන්නේ නම් මැනැවි.

කිඤ්ච භික්ඛවෙ, භික්ඛු අත්ථවසං පටිච්ච උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය, උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය.

යං හිස්ස භික්ඛවෙ, උප්පන්නං ලාභං අනභිභුය්‍ය විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා, උප්පන්නං ලාභං අභිභුය්‍ය විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. යං හිස්ස භික්ඛවෙ, උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අනභිභුය්‍ය විහරතො උප්පජ්ජෙය්‍යුං ආසවා විඝාතපරිළාහා. උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය විහරතො එවංස තෙ ආසවා විඝාතපරිළාහා න හොන්ති. ඉදං ඛො භික්ඛවෙ, භික්ඛු අත්ථවසං පටිච්ච උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය. උප්පන්නං අලාභං -පෙ- උප්පන්නං යසං -පෙ- උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය.

තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං උප්පන්නං ලාභං අභිභුය්‍ය අභිභුය්‍ය විහරිස්සාම, උප්පන්නං අලාභං-පෙ-උප්පන්නං යසං-පෙ-උප්පන්නං අයසං -පෙ- උප්පන්නං සක්කාරං -පෙ- උප්පන්නං අසක්කාරං -පෙ- උප්පන්නං පාපිච්ඡතං -පෙ- උප්පන්නං පාපමිත්තතං අභිභුය්‍ය අභිභුය්‍ය විහරිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

එත්තාවතා භන්තෙ උත්තර, මනුස්සෙසු චතස්සො පරිසා භික්ඛු භික්ඛුනියො උපාසකා උපාසිකායො. නායං ධම්මපරියායො කිස්මිඤ්චි පතිට්ඨිතො.[1] උග්ගණ්හාතු භන්තෙ, ආයස්මා උත්තරො ඉමං ධම්ම පරියායං, පරියාපුණාතු භන්තෙ, ආයස්මා උත්තරො ඉමං ධම්මපරියායං ධාරෙතු භන්තෙ, ආයස්මා උත්තරො ඉමං ධම්මපරියායං, අත්ථසංහිතො අයං භන්තෙ, ධම්මපරියායො ආදිබ්‍රහ්මචරියකොති.

1. උපට්ඨිතො - මජසං

මහණෙනි, මහණ කිනම් කරුණක් පිණිස උපන් ලාභ පුන පුනා මැඩගෙන වසන්නේ වේ ද, උපන් අලාභ ... උපන් යශස් ... උපන් අයශස් ... උපන් සත්කාර ... උපන් අසත්කාර ... උපන් පාපෙච්ඡතා ... උපන් පාපමිත්‍රතා පුන පුනා මැඩ ගෙන වසන්නේ වේද,

මහණෙනි, යම් හෙයෙකින් උපන් ලාභ නොමැඩ ගෙන වසන ඔහුට විඝාත පරිදහ ඇති කරන ආශ්‍රවයෝ උපදනාහු නම් උපන් ලාභ මැඩ ගෙන වසන ඔහුට මෙසේ විඝාත පරිදහ ඇති කරන ඒ ආශ්‍රවයෝ නො වෙත්. මහණෙනි, යම් හෙයෙකින් උපන් අලාභ... උපන් යශස්... උපන් අයශස්... උපන් සත්කාර...උපන් අසත්කාර...උපන් පාපෙච්ඡතා... උපන් පාපමිත්‍රතා නොමැඩ ගෙන වසන ඔහුට මෙසේ විඝාත පරිදහ ඇති කරන ඒ ආශ්‍රවයෝ උපදනාහු නම් උපන් පාපමිත්‍රතාව මැඩ ගෙන වසන ඔහුට මෙසේ විඝාත පරිදහ ඇති කරන ඒ ආශ්‍රවයෝ නො වෙත්. මහණෙනි, මහණ මෙ කරුණ පිණිස උපන් ලාභ පුනපුනා මැඩ ගෙන වසන්නේ නම් උපන් අලාභ ... උපන් යශස් ... උපන් අයශස් ... උපන් සත්කාර ... උපන් අසත්කාර ... උපන් පාපෙච්ඡතා ... උපන් පාපමිත්‍රතා පුන පුනා මැඩ ගෙන වසන්නේ ය.

මහණෙනි, එහෙයින් මෙහි ලා මෙසේ හික්මිය යුතු ය: උපන් ලාභ පුන පුනා මැඩ වසන්නම්හයි උපන් අලාභ ... උපන් යශස් ... උපන් අයශස් ... උපන් සත්කාර ... උපන් අසත්කාර ... උපන් පාපමිත්‍රතා ... පුන පුනා මැඩ ගෙන වසන්නම් හ යි. මහණෙනි, මෙසේ ම තොප විසින් හික්මිය යුතුයි.

වහන්ස, උත්තර තෙරණුවනි, මනුෂ්‍යයන් කෙරෙහි මහණ ය මෙහෙණ ය උවසු ය උවැසි ය යන සිවුපිරිස් මෙතෙක් ම ය. ඔවුන් කිසිවකු කෙරෙහිදු මේ ධම්පය්‍යාය නො පිහිටියේ ය. වහන්ස, ආයුෂ්මත් උත්තර තෙරහු මේ ධර්මපය්‍යාය උගනිත්වා ! වහන්ස, ආයුෂ්මත් උත්තර තෙරහු මේ ධම්පය්‍යාය පුරුදු කෙරෙත්වා! වහන්ස, ආයුෂ්මත් උත්තර තෙරහු මේ ධර්මපය්‍යාය ධරත්වා! වහන්ස, මේ ධර්මපය්‍යාය අර්ථසංහිත වෙයි. ශාසන බ්‍රහ්මචය්‍යියට ආදිභූත වූයේ වේ යයි.

## 8. 1. 1. 9

## නන්ද සුත්තං

[සාවත්ථිනිදානං]

කුලපුත්තො'ති භික්ඛවෙ, නන්දං සම්මාවදමානො වදෙය්‍ය; බලවාති භික්ඛවෙ, නන්දං සම්මා වදමානො වදෙය්‍ය; පාසාදිකොති භික්ඛවෙ, නන්දං සම්මා වදමානො වදෙය්‍ය; තිබ්බරාගොති භික්ඛවෙ, නන්දං සම්මාවදමානො වදෙය්‍ය.

කිමඤ්ඤත්‍ර භික්ඛවෙ, නන්දො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙසු මත්තඤ්ඤූ ජාගරියං අනුයුත්තො සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො. යෙහි නන්දො සක්කොති පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතුං:

තත්‍රිදං භික්ඛවෙ, නන්දස්ස ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය හොති: සචෙ භික්ඛවෙ, නන්දස්ස පුරත්ථිමා දිසා ආලොකෙතබ්බා හොති, සබ්බං චෙතසා සමන්නාහරිත්වා නන්දො පුරත්ථිමං දිසං ආලොකෙති, 'එවං මෙ පුරත්ථිමං දිසං ආලොකයතො න අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවිස්සන්තී'ති, ඉතිහ තත්ථ සම්පජානො හොති. සචෙ භික්ඛවෙ, නන්දස්ස පච්ඡිමා දිසා ආලොකෙතබ්බා හොති -පෙ- උත්තරා දිසා ආලොකෙතබ්බා හොති -පෙ- දක්ඛිණා දිසා ආලොකෙතබ්බාහොති: -පෙ- උද්ධං උල්ලොකෙතබ්බා හොති -පෙ- අධො ඔලොකෙතබ්බා හොති. -පෙ- අනුදිසා අනුවිලොකෙතබ්බා හොති, සබ්බං චෙතසා සමන්නාහරිත්වා නන්දො අනුදිසං අනුවිලොකෙති. 'එවමෙම අනුදිසං අනුවිලොකයතො නාභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවිස්සන්තීති. ඉතිහ තත්ථ සම්පජානො, ඉදං ඛො භික්ඛවෙ, නන්දස්ස ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය හොති.

තත්‍රිදං භික්ඛවෙ, නන්දස්ස භොජනෙ මත්තඤ්ඤුතාය හොති: ඉධ භික්ඛවෙ නන්දො පටිසඞ්ඛායොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය න මදය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. ඉදං ඛො භික්ඛවෙ, නන්දස්ස භොජනෙ මත්තඤ්ඤුතාය හොති.

# 8. 1. 1. 9

## නන්ද සූත්‍රය

[සැවත්නිදන යි]

මහණෙනි, මොනොවට කියනුයෙක් නන්දයන් ගෙන ජාතිකුලපුත්‍රය හ යි කියන්නේ ය. මහණෙනි, මොනොවට කියන්නෙක් නන්දයන් බලවත්හ යි බණන්නේ ය. මහණෙනි, මනාකොට බණන්නෙක් නන්දයන් ප්‍රසාදජනකයහ යි බණන්නේ ය. මහණෙනි, මනාකොට බණන්නෙක් නන්දයන් තිව්‍රරාග ඇතියහ යි බණන්නේ ය.

මහණෙනි, අන් කරුණින් කිම? නන්ද පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යය පුරන්නට යමෙකින් හැකි වේද එබඳු වූ ඉන්ද්‍රිය විෂයෙහි ගොපනය කළ දෙර ඇතියේ ය. භොජනයෙහි මාත්‍රඥ ය. නිදිවැරීමෙහි ඵයදුනේ ය. ස්මෘති සම්ප්‍රජන්‍යයෙන් සමන්වාගත යි.

මහණෙනි, එහි ලා නන්දයන්ගේ ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා මේ වෙයි: මහණෙනි, ඉදින් නන්දයන් විසින් පෙරදිග බැලියයුතු වේ නම් නන්දයෝ හැම සිතින් සමනා පෙරදිග බලති. 'මෙසේ පෙරදිග බලන මට අභිධ්‍යා දෞර්මනස්‍ය සංඛ්‍යාත අකුශලධර්මයෝ ලුහු නො බඳනාහු ය' කියායි. එහි නුවණින් යුතුවූයේ වෙයි. මහණෙනි, ඉදින් නන්දයන් විසින් පශ්චිම දිශාව බැලියයුතු වේ නම් ... උත්තර දිශාව බැලිය යුතු වේ නම් ... දක්ෂිණදිශාව බැලිය යුතු වේ නම් ... උඩ බැලිය යුතු වේ නම් ... යට බැලිය යුතු වේ නම් ... අනුදිශා බැලියයුතු වේ නම් නන්දයෝ හැම සිතින් සමනා අනුදිසා බලති. 'මෙසේ අනුදික් බලන මට අභිධ්‍යාදෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ රැස් නො වන්නාහුය' කියා යි. මෙසේ එහි නුවණින් යුක්ත වූයේ වෙයි. මහණෙනි, මේ වනාහි නන්දයන්ගේ ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා වෙයි.

මහණෙනි, එහිලා නන්දයන්ගේ භොජනයෙහි මාත්‍රඥතා මේ වෙයි: මහණෙනි, නන්දයෝ නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ආහාර වළඳති: දව පිණිස නො වෙයි, මද පිණිස නො වෙයි, මණ්ඩන පිණිස නො වෙයි, භූෂණ පිණිස නො වෙයි, මේ ආහාරය මේ ශරීරයාගේ ස්ථිතිය පිණිස ම යැපීම පිණිස ම විහිංසා නස්නා පිණිස ම බ්‍රහ්මචර්‍ය්‍යයට අනුග්‍රහ පිණිස ම වෙයි. මෙසේ නො වැළඳීමෙන් වූ පුරාණ වෙදනා ද නසන්නෙමි, අභිනව වෙදනා ද නූපදවන්නෙමි, මාගේ ජීවිත යාත්‍රා ද වෙයි, අනවද්‍යතාව හා ඵාසුවිහරණය ද වේ ය කියායි. මහණෙනි, මේ නන්ද තෙරහුගේ භෝජනයෙහි මාත්‍රඥතාව වෙයි.

තත්‍රිදං භික්ඛවෙ, නන්දස්ස ජාගරියානුයොගස්මිං හොති. ඉධ භික්ඛවෙ, නන්දො දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති. පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා. රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. ඉදං ඛො භික්ඛවෙ, නන්දස්ස ජාගරියානුයොගස්මිං හොති.

තත්‍රිදං භික්ඛවෙ, නන්දස්ස සතිසම්පජඤ්ඤස්මිං හොති: ඉධ භික්ඛවෙ, නන්දස්ස විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති,-පෙ-විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. ඉදං ඛො භික්ඛවෙ, නන්දස්ස සතිසම්පජඤ්ඤස්මිං හොති.

කිමඤ්ඤත්‍ර භික්ඛවෙ, නන්දො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ ජාගරියං අනුයුත්තො සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො යෙහි නන්දො සක්කොති පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතුන්ති.

## 8. 1. 1. 10

## කාරණ්ඩව සුත්තං

එකං සමයං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො අඤ්ඤෙනාඤ්ඤං[1] පටිචරති, බහිද්ධා කථං අපනාමෙති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. නිද්ධමථෙතං භික්ඛවෙ පුග්ගලං, නිද්ධමථෙතං භික්ඛවෙ, පුග්ගලං, අපනෙය්‍යසො භික්ඛවෙ පුග්ගලො, කිං වො පරපුත්තො විහෙඨීයති.[2]

ඉධ භික්ඛවෙ, එකච්චස්ස පුග්ගලස්ස තාදිසං යෙව හොති. අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සංඝාටිපත්තචීවරධාරණං. සෙය්‍යථාපි අඤ්ඤෙසං භද්දකානං භික්ඛූනං යාවස්ස භික්ඛූ ආපත්තිං න පස්සන්ති, යතො ච ඛ්වාස්ස භික්ඛූ ආපත්තිං පස්සන්ති තමෙනං එවං ජානන්ති. සමණදූසීවායං සමණපලාපො සමණකාරණ්ඩවොති. තමෙනං ඉති විදිත්වා බහිද්ධා නාසෙන්ති. තං කිස්ස හෙතු: මා අඤ්ඤෙ භද්දකෙ භික්ඛූ දූසෙසීති.

1. අඤ්ඤෙනඤ්ඤං - සයා.
2. කිං වො තෙන පරපුත්තෙන විසොධිතෙන - මජසං,
   කිං වො පරපුත්තො විහෙඨෙති - PTS.

මහණෙනි, එහිලා මේ නන්‍දයන්ගේ නිදිවැරීමෙහි යෙදීම වෙයි: මහණෙනි, නන්‍දයෝ දවල සක්මනින්‍ද හිඳීමෙන්‍ද ආවරණය කරන ධර්මයෙන් සිත පිරිසිදු කෙරෙති. රෑ පළමුයම සක්මනින්‍ද හිඳීමෙන්‍ද ආවරණය කරන ධර්මයෙන් සිත පිරිසිදු කෙරෙති, රෑ මැදුම්යම පා මත පා හයා තබා සිහි නුවණින් යුතු වැ උත්ථානසංඥව මෙනෙහිකොට දකුණැලයෙන් සිංහශය්‍යා කෙරෙති. රෑ පැසුළුයම නැඟී සිට සක්මනින්‍ද හිඳීමෙන්‍ද ආවරණය කරන ධර්මයෙන් සිත පිරිසිදු කෙරෙත්. මහණෙනි, මේ නන්‍දයන්ගේ නිදිවැරීමෙහි යෙදීම වෙයි.

මහණෙනි, එහි මේ නන්‍දයන්ගේ ස්මෘතිසම්ප්‍රජන්‍යය වේ: මහණෙනි, නන්‍දයන් දන්නා ලද වූ ම වේදනාවෝ උපදිත්. දන්නා ලද වූ ම වේදනාවෝ වටහත්. දන්නා ලදවූ ම වේදනාවෝ අස්තයට යෙත්. දන්නා ලද වූ ම සංඥවෝ උපදිත්.... දන්නා ලද වූ ම විතර්කයෝ උපදිත්. දන්නා ලද වූ ම විතර්කයෝ වටහත්. දන්නා ලද වූ ම විතර්කයෝ අස්තයට යෙත්. මහණෙනි, මේ නන්‍දයන්ගේ ස්මෘතිසම්ප්‍රජන්‍යය වෙයි.

මහණෙනි, අන් කරුණෙකින් කිම? යමෙකින් නන්‍දයෝ පරිපූර්ණ පරිසුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පුරන්නට හැකිවෙත් ද, එබඳුවූ ඉන්‍ද්‍රියෙහි ගුප්තද්වාරතා ඇතියන, භෝජනයෙහි පමණ දන්නාහ, නිදි වැරීමෙහි යෙදුනාහ. ස්මෘතිසම්ප්‍රජන්‍යයෙන් සමන්වාගතයහ යි.

## 8. 1. 1. 10

## කාරණ්ඩව සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ චම්පා නුවර සමීපයෙහි ගග්ගරා පොකුණු තෙර වැඩ වසන සේක. එ සමයෙහි මහණහු මහණක් හට ඇවතින් චෝදනා කෙරෙත්. ඒ මහණ මහණුන් විසින් ඇවතින් චෝදනා කරනු ලබනුයේ අන් වචනයෙකින් අන්වචනය වසයි. බැහැරින් අන් අමුතු කථාවක් බහයි, කෝපය හා ද්වේෂය හා නො සතුට හා පහළ කෙරෙයි. එසඳ භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඇමතූ සේක: මහණෙනි, ඒ පුහුලා නෙරව. මහණෙනි, එ පුහුලා නෙරව. මහණෙනි, ඒ පුහුලා නෙරියයුත්තෙක. තොප විසින් පරපුත්‍රයෙක් කුමට පෙළනු ලැබේ ද?

මහණෙනි, මහණහු යම්තාක් ඔහුගේ ඇවැත් නො දක්නාහුද, ඒ තාක් අන්‍ය භද්‍ර වූ මහණුන්ගේ ඉදිරි බලා යාම හා පෙරළා ඊම හා ඉදිරි බැලීම හා ඔබ මොබ බැලීම හා අත් පා හැකිළීම් විහිදීම් හා සඟළප සිවුරුදැරීම් යම්සේ වේද, එසෙයින් ඇතැම් පුද්ගලයක්හුගේ එබඳු ම ඉරියවු වෙයි. යම් කලෙක මහණහු ඔහුගේ ඇවැත් දක්නාහු ද එකල ඔහු මෙසේ දනිති: මේ ශ්‍රමණදූෂකයෙක, ශ්‍රමණප්‍රලාපයෙක, මහණ කසළෙකැයි. මෙසේ ඔහු හඳුනා බැහැර නෙරත්. ඒ කවර හෙයින: අන්‍යභද්‍ර භික්ෂූන් නහමක් දූෂණය කෙරේවා කියා යි.

සෙය්‍යථාපි භික්ඛවෙ, සම්පන්නෙ යවකරණෙ යවදූසී ජායෙථ, යවපලාපො යවකාරණ්ඩවො. තස්ස තාදිසංයෙව මූලං හොති සෙය්‍යථාපි අඤ්ඤෙසං භද්දකානං යවානං, තාදිසංයෙව නාලං හොති සෙය්‍යථාපි අඤ්ඤෙසං භද්දකානං යවානං, තාදිසංයෙව පත්තං හොති සෙය්‍යථාපි අඤ්ඤෙසං භද්දකානං යවානං, යාවස්ස සීසං න නිබ්බත්තති, යතො ච ඛ්වාස්ස[1] සීසං නිබ්බත්තති. තමෙනං එවං ජානන්ති: යවදූසී වායං යවපලාපො යවකාරණ්ඩවොති. තමෙනං ඉති විදිත්වා සමූලං උප්පාටෙත්වා බහිද්ධා යවකරණස්ස ඡඩ්ඩෙන්ති. තං කිස්ස හෙතු: මා අඤ්ඤෙ භද්දකෙ යවෙ දූසෙසීති.

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චස්ස පුග්ගලස්ස තාදිසංයෙව හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සෙය්‍යථාපි අඤ්ඤෙසං භද්දකානං භික්ඛූනං යාවස්ස භික්ඛූ ආපත්තිං න පස්සන්ති. යතො ච ඛ්වාස්ස භික්ඛූ ආපත්තිං පස්සන්ති. තමෙනං එවං ජානන්ති: සමණදූසී වායං සමණපලාපො සමණකාරණ්ඩවොති. තමෙනං ඉති විදිත්වා බහිද්ධා නාසෙන්ති. තං කිස්ස හෙතු: මා අඤ්ඤෙ භද්දකෙ භික්ඛූ දූසෙසීති.

සෙය්‍යථාපි භික්ඛවෙ, මහතො ධඤ්ඤරාසිස්ස පූයමානස්ස[2] තත්‍ථ යානි ධඤ්ඤානි දළ්හානි සාරවන්තානි තානි එකමන්තං පුඤ්ජං හොති, යානි පන තානි ධඤ්ඤානි දුබ්බලානි පලාපානි තානි වාතො එකමන්තං අපකස්සති. තමෙනං සාමිකා [අප]සම්මජ්ජනිං ගහෙත්වා භිය්‍යොසො මත්තාය අපසම්මජ්ජන්ති. තං කිස්ස හෙතු: මා අඤ්ඤෙ භද්දකෙ ධඤ්ඤෙ දූසෙසීති.

එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චස්ස පුග්ගලස්ස තාදිසංයෙව හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සෙය්‍යථාපි නාම අඤ්ඤෙසං භද්දකානං භික්ඛූනං යතො ච ඛ්වාස්ස භික්ඛූ ආපත්තිං පස්සන්ති, තමෙනං එවං ජානන්ති: සමණදූසී වායං සමණපලාපො සමණකාරණ්ඩවොති. තමෙනං ඉති විදිත්වා බහිද්ධා නාසෙන්ති. තං කිස්ස හෙතු: මා අඤ්ඤෙ භද්දකෙ භික්ඛූ දූසෙසීති.

1. යාවස්ස - සීමු.
2. වුය්හමානස්ස - සීමු. ධූපයමානස්ස - මජසං. ධූප්පයමානස්ස - ස්‍යා.

මහණෙනි, යම් සේ සමෘද්ධ වූ යවක්ෂේත්‍රයෙක යවදූෂණ යවප්‍රලාප යවකසළ උපදනේ වේද, අන්‍යභද්‍ර යවයන්ගේ මුල් යම් සේ වේ නම් ඒ යව කසළහුගේ එබඳු වූ ම මුල් වෙයි. අන්‍ය භද්‍ර යවයන්ගේ නළ යම්සේ වේ නම් එබඳු වූ ම නළ වෙයි. අන්‍ය භද්‍ර යවයන්ගේ පත් යම්සේ වේ නම් එබඳු වූ ම පත්වැටි වෙයි. යම් තාක් ඒ යවකසළයාගේ ශස්‍යශීර්ෂය නො උපදනේ ද ඒතාක් ම ය. යම් කලෙක ඒ යවකසළයාගේ ශස්‍යශීර්ෂය උපදනේ ද, එකල ඒ යවය මෙසේ හඳුනත්: මේ යවදූෂණ ය, යවප්‍රලාප ය, යවකසළ ය කියා යි. ඒ යවකසළය මෙසේ හඳුනා සහමුලින් උපුටා යවක්ෂේත්‍රයෙන් බැහැර ලත්. ඒ කවර හෙයින: අන්‍ය භද්‍රයවයන් නහමක් දූෂණය කෙරේවා කියා යි.

මහණෙනි, එ පරිදි ම මේ සස්නෙහි කිසි පුඟුලක්හට අන්‍ය භද්‍ර භික්ෂූන් හට යම්සේ වේ නම් එබඳු වූ ම ඉදිරිගමන් හා පෙරළා ගමන් හා ඉදිරිබැලීම් හා ඔබමොබ බැලීම් හා අත් පා හැකිළීම් විහිදීම් හා සඟළපාසිවුරුදැරීම් හා වෙයි. මහණහු යම්තාක් ඔහුගේ ඇවැත් නො දක්නාහු ද, ඒ තාක් ම ය. යම් දවසෙක මහණහු ඔහුගේ ඇවැත් දක්නාහු ද, එ දවස් ඔහු මෙසේ හඳුනත්: මේ ශ්‍රමණ දූෂකයෙක, මේ ශ්‍රමණප්‍රලාපයෙක, මේ මහණකසළෙක කියා යි. මෙසේ ඔහු හඳුනා බැහැර නෙරත්. ඒ කවර හෙයින: අන්‍ය භද්‍ර භික්ෂූන් නහමක් දූෂණය කෙරේවා කියා යි.

මහණෙනි, යම්පරිදි පොළනු ලබන මහත් ධාන්‍ය රාශියක්හුගේ සාරවත් දෘඪධාන්‍යයෝ ඇද්ද, ඒ ධාන්‍ය එක්පසෙක ගොඩ වෙයි. බොල් වූ දුබල වූ යම් ඒ ධාන්‍යයෝ ඇද්ද, වාතය ඒ ධාන්‍ය එක්පසෙක ඇද දමයි. කෙත් හිමියෝ සුළංකුල්ල ගෙන ඒ බොල් ධාන්‍ය බෙහෙවින් ම බැහැර කරත්. ඒ කවර හෙයින; අන්‍ය භද්‍රධාන්‍ය නහමක් දූෂණය කෙරේවා කියා යි.

මහණෙනි, එ පරිදි ම මෙ සස්නෙහි ඇතැම් පුඟුලක්හට අන්‍යභද්‍ර භික්ෂූන්හට යම් බඳු වේ ද, එබඳු වූ ඉදිරි යාම් හා පෙරළා ඒම් හා ඉදිරි බැලීම් හා ඔබමොබ බැලීම් හා අත් පා හැකිළීම් විහිදීම් හා සඟළපාසිවුරු-ධැරීම් හා වෙයි. යම් කලෙක මහණහු ඔහුගේ ඇවැත් දක්නාහු ද, ඒ නෙක් මය. එකල ඔහු මෙසේ හඳුනා ගනී: මේ ශ්‍රමණදූෂකයෙක. ශ්‍රමණප්‍රලාපයෙක, මහණ කසළෙක කියා යි. මෙසේ ඔහු හඳුනා බැහැර නෙරත්. ඒ කවර හෙයින: අන්‍ය භද්‍ර භික්ෂූන් නහමක් දූෂණය කෙරේවා කියායි.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො උදපානපණාළියා අත්ථිකො තිණ්හං කුඨාරිං ආදාය වනං පවිසෙය්‍ය, සො තං තදෙව[1] රුක්ඛං කුඨාරිපාසෙන ආකොටෙති. තත්‍ථ යානි තානි රුක්ඛානි දළ්හානි සාරවන්තානි කුඨාරිපාසෙන ආකොටිතානි ඛක්ඛලං පටිනදන්ති, යානි තානි රුක්ඛානි අන්තොපූතීනි අවස්සුතානි කසම්බුජාතානි තානි කුඨාරිපාසෙන ආකොටිතානි දද්දරං පටිනදන්ති. තමෙනං මූලෙ ඡින්දති, මූලෙ ඡෙත්වා අග්ගෙ ඡින්දති, අග්ගෙ ඡෙත්වා අන්තො සුවිසොධිතං විසොධෙති, අන්තො සුවිසොධිතං විසොධෙත්වා උදපානපණාලිං යොජෙති.

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චස්ස පුග්ගලස්ස තාදිසංයෙව හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සමිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං, සෙය්‍යථාපි නාම අඤ්ඤෙසං භද්දකානං භික්ඛූනං. යාවස්ස භික්ඛූ ආපත්තිං න පස්සන්ති. යතො ච ඛ්වාස්ස භික්ඛූ ආපත්තිං පස්සන්ති, තමෙනං එවං ජානන්ති: සමණදූසී වායං සමණපලාපො සමණකාරණ්ඩවොති. තමෙනං ඉති විදිත්වා බහිද්ධා නාසෙන්ති. තං කිස්ස හෙතු: මා අඤ්ඤෙ භද්දකෙ භික්ඛූ දූසෙසීති.

1. සංවාසා'යං[2] විජානාථ, පාපිච්ඡො කොධනො ඉති,
මක්ඛී ථම්භී පළාසී ච, ඉස්සුකී මච්ඡරී සඨො.

2. සන්තවාචො ජනවති, සමණො විය භාසති,
රහො කරොති කරණං[3] පාපදිට්ඨි අනාදරො.

3. සංසප්පී ච මුසාවාදී, තං විදිත්වා යථාතථං,
සබ්බෙ සමග්ගා හුත්වාන, අභිනිබ්බජ්ජයාථ,[4] නං.

4. කාරණ්ඩවං නිද්ධමථ, කසම්බුඤ්චාපකස්සථ[5]
තතො පලාපෙ වාහෙථ, අස්සමණෙ සමණමානිනෙ.

5. නිද්ධමිත්වාන පාපිච්ඡෙ, පාපකාචාරගොචරෙ,
සුද්ධාසුද්ධෙහි සංවාසං, කප්පයව්හො පතිස්සතා
තතො සමග්ගා නිපකා, දුක්ඛස්සන්තං කරිස්සථාති.

**මෙත්තාවග්ගො පඨමො.**

**තස්සුද්දානං:—**

මෙත්තං පඤ්ඤා ච ද්වෙ පියා, ද්වෙ ලොකා ද්වෙ විපත්තියො,
දෙවදත්තො ච උත්තරො, නන්දො කාරණ්ඩවෙන චාති.

1. යංයදෙව - මජසං.
2. සංවාසාය - සිමු.
3. කරණං - මජසං.
4. අභිනිබ්බජ්ජෙයාථ - කම්බො.
5. කසම්බුඤ්චාපකස්සථ - කම්බො.

මහණෙනි, යම් සේ පුරුෂයෙක් ළිං පිහිල්ලෙකින් අර්ථී වූයේ තියුණු පොරොවක් ගෙන වනයට වදනේ වේද, හේ ඒ ඒ රුකක් ම පොරෝ හිසින් කොටන්නේ වේ ද, එහි සාරවත් වූ දැඩි වූ යම් වෘක්ෂයෝ කෙටෙරි පස්වටුයෙන් කෙටුණාහු කැකුළු කොට නද දෙත් ද, ඇතුළත කුණු වූ තෙත් වූ හටගත් කසළ ඇති යම් වෘක්ෂයෝ ඇද්ද, ඒ වෘක්ෂයෝ කෙටෙරි පස්වටුයෙන් කෙටුණාහු දදුරු හඬ නගත් ද, ඒ ගස මුලෙහි ලා සිඳුනේ ය. මුල සිඳ අගෙහි ලා සිඳුනේ ය. අග සිඳ ඇතුළත මොනොවට ශුද්ධ කොට ළිං පිහිල්ලෙහි යොදනේ ය.

මහණෙනි, එ පරිදි ම මෙ සස්නෙහි ඇතැම් දුශීලක් හට අන්‍ය භද්‍ර භික්ෂූන් හට යම් සේ වේ ද එබඳු වූ ම ඉදිරි යාම හා පෙරළා ඊම හා ඉදිරි බැලීම හා ඔබමොබ බැලීම හා අත් පා හැකිළීම විහිදීම හා සඟළපාසිවුරු-ධැරීම හා වෙයි. මහණහු යම්තාක් ඔහුගේ ඇවැත් නො දක්නාහු ද, එතෙක් ම ය. යම් කලෙක මහණහු ඔහුගේ ඇවැත් දක්නාහු ද, එකල මෙසේ ඔහු හඳුනා ගනිත්: මේ ශ්‍රමණ දූෂකයෙක. මේ ශ්‍රමණ ප්‍රලාපයෙක. මේ මහණකසළෙක කියා යි. මෙසේ ඔහු හඳුනා නෙරපියති. ඒ කවර හෙයින: අන්‍ය භද්‍ර භික්ෂූන් නාහමක් දූෂණය කෙරේවා කියා යි.

1. මෙ තෙම ලමු ඉච්ඡා ඇතියේය, කිපෙන සුලු ය, ගුණමකු ය, දැඩි සිතැතියේ ය, යුගග්‍රාහලක්ෂණ පලාස ඇතියේ ය, ඊෂ්‍යා කරන සුලු ය, මසුරු ය, කෛරාටික ය යනු සංවාසයෙන් දත ගනුව.

2. පාපදෘෂ්ටි ඇතියේ ශික්ෂායෙහි අදර නැතියේ ජනයා මධ්‍යයෙහි මොළොක්බස් ඇතියේ මහණකු සෙයින් බෙණේ. රහසෙහි පව් කරයි.

3. සැලෙනුයේ ද මුසවා බණනුයේ ද වෙයි. නතු සේ ඔහු හැඳින හැම සමඟ ව ඔහු නෙරව.

4. ශ්‍රමණ කාරණ්ඩවයා නෙරව, මහණ කසළහු දුරලව, අශ්‍රමණ වූ ශ්‍රමණමානී වූ ශ්‍රමණ ප්‍රලාපයන් බැහැර ලවු.

5. පාප ආචාර ගෝචර ඇති පාපේච්ඡයන් නෙරපියා එළඹ සිටි සිහි ඇත්තාහු ශුද්ධ වූවාහු පිරිසුදු සඟුන් හා සමඟ වාස කරව. ඉක්බිති සමඟ වූවාහු නිරණප්‍රඥ ඇතියාහු දුක් කෙළවර කරන්නාහු ය.

පළමුවැනි මෙත්තාවග්ග යි.

එහි උද්දානය:

මෙත්තා සූත්‍ර ය, පඤ්ඤා සූත්‍ර ය, පිය සූත්‍ර දෙක ය, ලොකවිපත්ති (ධම්ම) සූත්‍ර දෙක ය, දෙවදත්ත සූත්‍ර ය, උත්තර සූත්‍ර ය, නන්ද සූත්‍ර ය, කාරණ්ඩව සූත්‍රය හා දශ සූත්‍ර යි.

# 2. මහාවග්ගො

## 8. 1. 2. 1

### වෙරඤ්ජ සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා **වෙරඤ්ජායං** විහරති නලෙරුපුචිමන්ද මූලෙ අථ ඛො **වෙරඤ්ජො** බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

සුතං මෙතං භො ගොතම, න සමණො ගොතමො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුඩ්ඪෙ මහල්ලකෙ අද්ධගතෙ වයොඅනුප්පත්තෙ අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙතීති තයිදං භො ගොතම, තථෙව, නහි භවං ගොතමො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුඩ්ඪෙ මහල්ලකෙ අද්ධගතෙ වයොඅනුප්පත්තෙ අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙති, තයිදං භො ගොතම න සම්පන්නමෙවාති.

නාහං තං බ්‍රාහ්මණ, පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යමහං අභිවාදෙය්‍යං වා පච්චුට්ඨෙය්‍යං වා ආසනෙන වා නිමන්තෙය්‍යං. යං හි බ්‍රාහ්මණ, තථාගතො අභිවාදෙය්‍ය වා පච්චුට්ඨෙය්‍ය වා ආසනෙන වා නිමන්තෙය්‍ය මුද්ධාපි තස්ස විපතෙය්‍යාති.

1. අරසරූපො භවං ගොතමොති.

අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'අරසරූපො සමණො ගොතමො'ති. යෙ තෙ බ්‍රාහ්මණ, රූපරසා සද්දරසා ගන්ධරසා රසරසා ඵොට්ඨබ්බරසා තෙ තථාගතස්ස පහීනා, උච්ඡින්නමූලා තාලාවත්ථු කතා[1] අනභාවකතා[2] ආයතිං අනුප්පාදධම්මා, අයං ඛො බ්‍රාහ්මණ පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අරසරූපො සමණො ගොතමොති, නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි.

---

1. තාලවත්ථුකතා – [illegible]
2. අනභාවංකතා – මජසං

# 2. මහාවග්ගය

## 8. 1. 2. 1
## වෙරඤ්ජ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **වේරඤ්ජා** නම් නගරයෙහි **නලේරු** නම් (යකකු අරක්ගත් හෙයින් එනම් වූ) කොසඹ රුක් මුල්හි වැඩ වසන සේක. එකල්හි **වේරඤ්ජ** නම් බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සම්මොදනයට නිසි වූ සිහිකටයුතු කථාව කොට නිමවා එකත් පසෙක හින. එකත් පසෙක හුන් **වේරඤ්ජ** බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය:

භවත් ගෞතමයෙනි, 'මහණ ගොයුම්හු ජරාජීර්ණ වූ වයොවෘද්ධ වූ ජාතිමහල්ලක වූ තුන් වයස් ඉක්ම වූ තුන්වන වියට පත් බමුණන් නො වඳනාහ යි ද දැක හුනස්නෙන් නො නැඟී සිටිනාහ යි ද අස්නෙන් හෝ නිමන්ත්‍රණ නො කරන්නා හ යි ද' යන තෙල කරුණ මා විසින් අසන ලද. භවත් ගෞතමයනි, මෙ කරුණ එසේ ම ය. භවත් ගෞතමයෝ ජරාජීර්ණ වූ වෘද්ධ වූ මහලු වූ තුන්වයස් ඉක්ම ගිය අවසන් වියට පත් බමුණන් නො වඳනාහ. දැක ද හුනස්නෙන් නැඟී නො සිටිනාහ. අස්නෙන් හෝ නො ද පවරන්නාහ. භවත් ගෞතමයෙනි, මෙ කරුණ නො නිසි මැ යි.

බ්‍රාහ්මණය, මම යමකු වඳනෙම් හෝ දැක හුනස්නෙන් නැඟී සිටුනෙම් හෝ අස්නෙන් පවරන්නෙම් නම් හෝ එබන්දකු මරුන් සහිත, බඹුන් සහිත, සදෙව් ලොව්හි මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත සත්‍වාවාස ප්‍රජායෙහිලා නො දක්මි. බ්‍රාහ්මණය, තථාගත තෙම යම් ම පුඟුලකු වඳියි නම් හෝ දැක හුනස්නෙන් නැඟී සිටී නම් හෝ අස්නෙන් පවරයි නම් හෝ ඔහු මුදුන ද ගිලිහෙන්නේ ය.

1. භවත් ගෞතමයෝ අරසරූප (සමහරස සැහැවි නැති) යහ යි.

බ්‍රාහ්මණය, මොනොවට කියනුයෙක් යම් කරුණෙකින් 'ශ්‍රමණ භවත් අරසරූපයෙකැ'යි මට කියා නම්, මේ එ කරුණ යි බ්‍රාහ්මණය, යම් (කාම සුඛාසවාද සඞ්ඛ්‍යාත) රූප රස කෙනෙක්, ශබ්ද රස කෙනෙක්, ගන්ධරස කෙනෙක්, රස රස කෙනෙක්, ස්ප්‍රෂ්ටව්‍ය රස කෙනෙක් වෙත් නම්, තථාගතයනට ඔහු ප්‍රහීණයහ, උදුන් මුල් ඇතියහ, තාලාවස්තු කෘතයහ, අනභාව කරන ලදහ, මත්තෙහි නූපදනා සැහැවි ඇතියහ. බ්‍රාහ්මණය, යම් කරුණෙකින් මොනවට කියනුයෙක් 'ශ්‍රමණ භවත් ගෞතම අරසරූපයෙකැ'යි මා ගෙන කියා නම් මේ ඒ පර්‍යාය වෙයි. යම් කරුණක් සඳහා තෝ කියහි නම් එය නො වේ මැයි.

2. නිබ්භොගො භවං ගොතමොති.

අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය- නිබ්භොගො සමණො ගොතමො'ති. යෙ තෙ බ්‍රාහ්මණ, රූපභොගා සද්දභොගා ගන්ධභොගා රසභොගා ඵොට්ඨබ්බභොගා තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[1] අනභාවකතා[2] ආයතිං අනුප්පාදධම්මා, අයං ඛො බ්‍රාහ්මණ පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය නිබ්භොගො සමණො ගොතමොති, නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි.

3. අකිරියවාදෙ භවං ගොතමොති.

අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය, අකිරියවාදෙ සමණො ගොතමො'ති. අහං හි බ්‍රාහ්මණ, අකිරියං වදමි කායදුච්චරිතස්ස වචීදුච්චරිතස්ස මනොදුච්චරිතස්ස, අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං අකිරියං වදමි. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අකිරියවාදෙ සමණො ගොතමොති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි.

4. උච්ඡෙදවාදෙ භවං ගොතමොති.

අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය-උච්ඡෙදවාදෙ සමණො ගොතමො'ති. අහං හි බ්‍රාහ්මණ, උච්ඡෙදං වදමි රාගස්ස දොසස්ස මොහස්ස, අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං උච්ඡෙදං වදමි. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය උච්ඡෙදවාදෙ සමණො ගොතමො'ති, නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි.

1. තාලවත්ථුකතා – සබ්බත්ථ.
2. අනභාවංකතා – මජසං.

2. භවත් ගෞතමයෝ නිර්භෝගයහ. (සාමග්‍රීපරිභොග නැත්තාහ)

බ්‍රාහ්මණය, යම් පර්‍යායයෙකින් මොනොවට කියනුයෙක් 'ශ්‍රමණ භවත් ගෞතමයෝ නිර්භෝගයහ' යි මා ගෙන කියන්නේ නම් තෙල කරුණ ඇත් මැයි. බ්‍රාහ්මණය, යම් (ඡන්දරාගපරිභොග සඞ්ඛ්‍යාත) රූපභෝග කෙනෙක්, ශබ්ද භෝග කෙනෙක්, ගන්ධභෝග කෙනෙක්, රසභෝග කෙනෙක්, ස්ප්‍රෂ්ටව්‍යභෝග කෙනෙක් වන්නාහු නම් ඔහු තථාගතයනට ප්‍රහීණයහ, උපුන් මුල් ඇතියහ, තාලාවස්තු කෘතයහ, අනභාවකෘතයහ, මතුයෙහි නූපදනා සැහැවි ඇතියහ. බ්‍රාහ්මණය, යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් 'ශ්‍රමණ භවත් ගෞතමයෝ නිර්භෝගයහ'යි මා ගෙන කියන්නේ නම් මේ ඒ කරුණයි. යම් කරුණක් සඳහා නෝ කියහි නම් එ නො වෙ.

3. භවත් ගෞතමයෝ අක්‍රිය වාදයහ. (කුලසමුදචාර කම් නො කරන්නෙක)

බ්‍රාහ්මණය, යම් කරුණෙකින් මොනොවට බණනුයෙක් 'ශ්‍රමණ භවත් ගෞතමයෝ අක්‍රියවාද ඇතියහ'යි මා ගෙන කියන්නේ නම් තෙල පර්‍යාය ද ඇත. බ්‍රාහ්මණය, මම් වනාහි කායදුශ්චරිතය වාක් දුශ්චරිතය මනෝ දුශ්චරිතය නො කටයුතු යයි කියම්. නොයෙක් අයුරින් කරනු ලබන ලමු අකුසල දහම් නොකටයුතු යයි කියම්. බ්‍රාහ්මණය, යම් කරුණෙකින් මොනවට බණනුයෙක් 'ශ්‍රමණ භවත් ගෞතමයෝ අක්‍රියවාදයහ'යි මා ගෙන කියන්නේ නම් මේ ඒ පර්‍යාය යි. නෝ යමක් සඳහා කියනෙහි නම් එය නොවේ.

4. භවත් ගෞතමයෝ උච්ඡේදවාද (ලොකප්‍රවේණිය මුලුසුන් කරන වාද) ඇතියහ.

බ්‍රාහ්මණය, මොනොවට කියනුයෙක් යම් කරුණෙකින් ශ්‍රමණ භවත් ගෞතම උච්ඡේදවාද ඇත්තෙකැයි මා ගෙන කියා නම්, තෙල කරුණ ඇත් මැයි. බ්‍රාහ්මණය, මම් වනාහි රාගයාගේ දොෂයාගේ මෝහයාගේ උච්ඡේදය කියම් නන්වැදෑරුම් වූ ලමු අකුසල් දහමුන්ගේ උච්ඡේදය කියම්. බ්‍රාහ්මණය, යම් කරුණෙකින් මොනවට කියනුයෙක් 'ශ්‍රමණ භවත් ගෞතමයෝ උච්ඡේදවාද ඇතියහ'යි මා ගෙන කියා නම්, මේ ඒ පර්‍යාය වෙයි. යම් කරුණක් සඳහා නෝ කියහි නම් එය නො වේ මැයි.

5. ජෙගුච්ඡී භවං ගොතමොති,

අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'ජෙගුච්ඡී සමණො ගොතමො'ති. අහං හි බ්‍රාහ්මණ, ජිගුච්ඡාමි කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන, අනෙකවිහි-තානං පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා ජිගුච්ඡාමි, අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය, 'ජෙගුච්ඡී සමණො ගොතමො'ති, නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි,

6. වෙනයිකො භවං ගොතමොති,

අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'වෙනයිකො සමණො ගොතමො'ති. අහං හි බ්‍රාහ්මණ විනයාය ධම්මං දෙසෙමි රාගස්ස දොසස්ස මොහස්ස, අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං විනයාය ධම්මං දෙසෙමි. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'වෙනයිකො සමණො ගොතමො'ති, නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි.

7. තපස්සී භවං ගොතමොති.

අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'තපස්සී සමණො ගොතමො'ති, තපනීයාහං බ්‍රාහ්මණ, පාපකෙ අකුසලෙ ධම්මෙ වදමි කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, යස්ස ඛො බ්‍රාහ්මණ, තපනීයා පාපකා අකුසලා ධම්මා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තමහං තපස්සීති වදමි, තථාගතස්ස ඛො බ්‍රාහ්මණ, තපනීයා පාපකා අකුසලා ධම්මා පහීනා උච්ඡින්නමූලා තාලවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'තපස්සී සමණො ගොතමො'ති, නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි.

5. භවත් ගෞතමයෝ ජුගුප්සා (කුලසමුදාචාරකම් පිළිබඳ පිළිකුල) ඇතියහ.

බ්‍රාහ්මණය, මොනොවට කියනුයෙක් යම් කරුණකින් 'ශ්‍රමණ භවත් ගෞතමයෝ ජුගුප්සා ඇතියහ'යි කියා නම්, තෙල කරුණ ඇත් මැයි. බ්‍රාහ්මණය, මම් වනාහි කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනොදුශ්චරිතය පිළිකුල් කරමි. නන් වැදෑරුම් ලමු අකුසල දහම් සමවැදුම පිළිකුල් කරමි. බ්‍රාහ්මණය, මොනොවට බණන්නෙක් යම් කරුණෙකින් මා ගෙන 'ශ්‍රමණ ගෞතමයෝ ජුගුප්සා ඇතියහ'යි කියනේ නම් මේ එ කරුණයි. යමක් සඳහා තෝ කියහි නම් එය නොවේ.

6. භවත් ගෞතමයෝ වෙනයිකයහ. (විනයනය කටයුත්තෙක)

බ්‍රාහ්මණය, මොනොවට කියනුයෙක් මා ගෙන යම් කරුණෙකින් 'ශ්‍රමණ භවත් ගෞතමයෝ වෙනයිකයහ'යි කියා නම්, තෙල කරුණ විද්‍යමාන වේ මැයි. බ්‍රාහ්මණය, මම් වනාහි රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ විනය පිණිස දහම් දෙසමි. නන් වැදෑරුම් ලමු දහමුන්ගේ විනය පිණිස දහම් දෙසමි, බ්‍රාහ්මණය, මොනොවට බණනුයෙක් යම් කරුණකින් මා ගෙන 'ශ්‍රමණ භවත් ගෞතමයෝ වෙනයිකයහ'යි බණනේ නම් මේ ඒ කරුණය, තෝ යම් කරුණක් සඳහා කියහි නම් එය නො වේ.

7. භවත් ගෞතමයෝ තපස්විහ. (සත්පුරුෂ චාරවිරහිත දිළින්දෙක)

බ්‍රාහ්මණය, මොනොවට කියනුයෙක් මාගෙන 'ශ්‍රමණ භවත් ගෞතමයෝ තපස්විහ'යි කියා නම් තෙල කරුණ ඇත්මැයි. බ්‍රාහ්මණය, මම කාය දුශ්චරිත වාග්දුශ්චරිත මනෝදුශ්චරිත යන ලමු අකුසල් දහම් තපනීය (තැවිය යුතුය'යි) යි කියමි. බ්‍රාහ්මණය, යමක්හු හට තපනීය වූ ලමු අකුසල දහම්හු ප්‍රහීණ වෙත් නම් උදුරුත් මුල් ඇත්තාහු වෙත් නම්, තාලාවස්තු කෘත වෙත් නම්, අනභාවකෘත වෙත් නම්, මතුයෙහි නූපදනා සැහැවි ඇතියහු කරන ලද්දහු වෙත් නම්, ඔහු මම තපස්වී යයි කියමි. බ්‍රාහ්මණය, තථාගතයන්ගේ තපනීය ලාමක අකුශල ධර්මයෝ ප්‍රහීණ වෙත්, උච්ඡින්න මුල වෙත්, තාලාවස්තු කෘත වෙත්. අනභාවකෘත වෙත්, මතුයෙහි නූපදනා සැහැවි ඇතියහ. බ්‍රාහ්මණය, යම් පයාියෙකින් මොනොවට කියන්නෙක් මා ගෙන 'ශ්‍රමණ ගෞතමයෝ තපස්විහ'යි කියන්නේ නම් මේ ඒ කරුණ යි. තෝ යම් කරුණක් සඳහා කියනෙහි නම් එය නො වේ.

8. අපගබ්භො භවං ගොතමොති.

අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අපගබ්භො සමණො ගොතමො'ති. යස්ස ඛො බ්‍රාහ්මණ, ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති. පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තමහං අපගබ්භොති වදාමි. තථාගතස්ස ඛො බ්‍රාහ්මණ, ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, අයං ඛො බ්‍රාහ්මණ පරියායො යෙන මං පරියායෙන, සම්මා වදමානො වදෙය්‍ය 'අපගබ්භො සමණො ගොතමො'ති නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ, කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා, තානස්සු කුක්කුටියා සම්මා අධිසයිතානි සම්මා පරිසෙදිතානි සම්මා පරිභාවිතානි, යො නු ඛො තෙසං කුක්කුටච්ඡාපකානං පඨමතරං පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජෙය්‍ය, කින්ති ස්වාස්ස වචනීයො ජෙට්ඨො වා කණිට්ඨො වාති?

ජෙට්ඨොතිස්ස භො ගොතම, වචනීයො, සො හි තෙසං ජෙට්ඨො හොතීති.

එවමෙව ඛො අහං බ්‍රාහ්මණ, අවිජ්ජාගතාය පජාය අණ්ඩභූතාය, පරියොනද්ධාය අවිජ්ජණ්ඩකොසං පදාලෙත්වා එකොව ලොකෙ අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො, අහං හි බ්‍රාහ්මණ ජෙට්ඨො සෙට්ඨො ලොකස්ස.

ආරද්ධං ඛො පන මෙ බ්‍රාහ්මණ, විරියං[1] අහොසි අසල්ලීනං උපට්ඨිතා සති අසම්මුට්ඨා.[2] පස්සද්ධො කායො අසාරද්ධො; සමාහිතං චිත්තං එකග්ගං. සො ඛො අහං බ්‍රාහ්මණ, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි,

විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරාමි,

1. විරියං – මජසං
2. අප්පමුට්ඨා – මජසං. සිමු.

8. භවත් ගෞතමයෝ අපගර්භයහ (හීනගර්භ ඇතියහ)

බ්‍රාහ්මණය, යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මා ගෙන 'ශ්‍රමණ ගෞතමයෝ අපගර්භයහ'යි කියා නම් තෙල කරුණ විද්‍යමාන වෙයි. බ්‍රාහ්මණය, යමකුගේ මතුයෙහි ගර්භශය්‍යාව පුනර්භවයෙහි අභිනිර්වෘතිය ප්‍රහීණ ද, උච්ඡින්නමූල ද, තාලාවස්තුකෘත ද, අනභාවකෘත ද, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ ද, ඔහු මම අපගර්භයයි කියමි. බ්‍රාහ්මණය, තථාගතයන්ගේ අනාගතයෙහි මාතෘගර්භ ශය්‍යාව පුනර් භවයෙහි අභිනිර්වෘතිය ප්‍රහීණ ය, උසුන් මුල් ඇතියේ ය, තාලාවස්තු කෘත ය, අනභාවකෘතය. මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ ය. බ්‍රාහ්මණය, යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මා ගෙන 'ශ්‍රමණ ගෞතමයෝ අපගර්භයහ'යි කියා නම් මේ ඒ කරුණයි. යම් කරුණක් සඳහා තෝ කිය'හි නම්, එය නො වේ.

බ්‍රාහ්මණය, යම් පරිදි කිකිළියගේ බිජුවට අටෙක් හෝ දසයෙක් හෝ දොළසෙක් හෝ ඇත් ද, ඒ බිජුවටහු කිකිළිය විසින් මොනොවට අධිශයිත වූවාහු මොනොවට උණුසුම් ගන්වන ලද්දහු මොනොවට පරිභාවිත වෙති. ඒ කුකුළු පැටවුන් අතුරෙන් යමෙක් ම පළමු ම පානිය සිළින් හෝ මුවතුඩින් හෝ අණ්ඩ කෝෂය පළාගෙන සුවසේ නික්මෙනුයේ නම්, හේ දෙටයි හෝ කනිටු යයි හෝ කිමැයි කිවයුතු වන්නේ ද?

භවත් ගෞතමයෙනි, හේ දෙටුයයි කියයුතු වන්නේ ය, හේ ම ඔවුනතුරෙහි දෙටු වෙයි.

බ්‍රාහ්මණය, එපරිද්දෙන් මම අවිද්‍යාගත වූ (අවිද්‍යා) බිජුවටෙහි උපන් අවිද්‍යායෙන් වැළඳුණු සත්ත්වාඩ්‍ය ප්‍රජායෙහි අවිද්‍ය බිජුවට පළාගෙන ලෙව්හි අද්විතීය වූයෙම් අනුත්තර සම්‍යක් සම්බොධිය පිළිවිදියෙම් වෙමි. බ්‍රාහ්මණය, මම ම ලොවට ජ්‍යෙෂ්ඨයෙමි, ශ්‍රෙෂ්ඨයෙමි.

බ්‍රාහ්මණය, මා විසින් අරඹන ලද (සිවුරඟ) වැර අසල්ලීන විය, (අරමුණට අභි මුඛව) එළඹ සිටි සිහිය මුළාවට පත් නො විය. කය (කායචිත්තපස්සද්ධි වසයෙන්) සන්හුනුයේ ම පහවූ දරථ ඇතියේ විය. සමාධිගත වූ සිත අචල විය. බ්‍රාහ්මණය, මම කාමයන්ගෙන් වෙන් ව ම ලමු දහමුන් ගෙන් වෙන් ව ම සවිතර්ක වූ සවිචාර වූ විවේකයෙන් උපන් ප්‍රීති හා සුඛ ඇති ප්‍රථම ධ්‍යානයට එළඹ වෙසෙමි.

විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් අධ්‍යාත්මයෙහි ප්‍රසාදය ඇති චිත්තයාගේ එකෝදිභාවය ඇති විතර්කරහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුවය ඇති ද්විතීය ධ්‍යානයට එළඹ වෙසෙමි.

පීතියා ච විරාගා උපෙක්ඛකො[1] ච විහරාමි. සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙමි, යං තං අරියා ආචික්ඛන්ති. 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි.

සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙසිං.

සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. අයං ඛො මෙ බ්‍රාහ්මණ රත්තියා පඨමෙ යාමෙ පඨමා විජ්ජා අධිගතා අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා තමො විහතො ආලොකො උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. අයං ඛො මෙ බ්‍රාහ්මණ, පඨමා අභිනිබ්භිදා අහොසි කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හා,

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි -පෙ- අයං ඛො මෙ බ්‍රාහ්මණ, රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා තමො විහතො ආලොකො උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො, අයං ඛො මෙ බ්‍රාහ්මණ, දුතියා අභිනිබ්භිදා අහොසි. කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හා.

1. උපෙක්ඛකො - කත්ථචි

ප්‍රීතියගේ ද විරාගයෙන් උපේක්ෂා ඇතියෙම වෙසෙමි, යම් දහැනක් සඳහා 'උපේක්ෂා ඇතියේ ස්මෘතිමත් වූයේ සුඛවිහාරී'යයි ආර්‍යයෝ කියත් නම්, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වෙසෙමි.

සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පළමු ම සොමනස් දොම්නසුන් ගේ අස්තගමයෙන් නිදුක් වූ නො සුව වූ උපේක්ෂා හා ස්මෘති-යෙන් පිරිසිදු වූ චතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසෙමි.

ඒ මම මෙසෙයින් සිත සමාධිගත වූ කල්හි පිරිසිදු වූ කල්හි පර්‍යවදාත වූ කල්හි අඞ්ගණ රහිත වූ කල්හි පහවූ කෙලෙස් ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය කල්හි ස්ථිත කල්හි ස්ථිරභාවයට ගිය කල්හි පූර්වේ නිවාසානු-ස්මෘතිඥනය පිණිස සිත වෙසෙසින් නැමීමි.

ඒ මම අනේකවිධ වූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකරමි. කෙසේ ය යත්: එක් ජාතියකුදු ජාතිදෙකකුදු ... මෙසේ සාකාර වූ උද්දේශ සහිත වූ අනේකවිධ වූ පූර්වනිවාසය සිහිකරනෙම් වෙමි. බ්‍රාහ්මණය, රෑ පළමු යමහි මා විසින් මේ ප්‍රථම විද්‍යා තොමෝ ලබන ලද්, අවිදු නසන ලදු, විද්‍යාව උපන, මොහාන්ධකාරය පහව ගියේ ය. ප්‍රඥලෝකය උපන, (ස්මෘතිහුගේ අවිප්‍රවාසයෙන්) අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති (කාය ජීවිතදෙක්හි නිරපෙක්ෂක ව) නිවන් කෙරේ මෙහෙයූ සිත් ඇතියකුහට යම් සේ වේ නම් එසේ ය. බ්‍රාහ්මණය, බිජුවටින් කුකුළු පැටවකුගේ (උපත) බඳු මාගේ මේ පළමු (ආර්‍යජාති සඞ්ඛ්‍යාත) අභිනිර්වෘතිය විය.

ඒ මම මෙසේ සිත සමාධිගත කල්හි පිරිසිදු වූ කල්හි පර්‍යවදාත කල්හි කෙලෙස් රහිත වූ කල්හි පහ වූ උපක්ලේශ ඇති කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වූ කල්හි සිටි කල්හි ස්ථිර වූ කල්හි සත්ත්වයන්ගේ චුතූපපාතඥනය පිණිස සිත නැමූයෙමි. ඒ මම වෙසෙසින් පිරිසිදු වූ මිනිසැස ඉක්ම ගිය දිවැසින් චුතවන්නා වූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද මනාගති ඇත්තා වූ ද දුර්ගති ඇත්තා වූ ද සත්ත්වයන් දක්මි, කම් වූ පරිදි යන සත්ත්වයන් දන්මි ... බ්‍රාහ්මණය, රෑ මැදුම් යමහි මේ දෙවන විද්‍යාව මා විසින් ලබන ලදු, අවිදු නසන ලදු, විද්‍යාව උපන; මෝහාන්ධකාරය නසන ලදී. ප්‍රඥලෝකය උපන, අප්‍රමත්තව කෙලෙස් තවනවැර ඇතිව නිවන් කෙරෙහි මෙහෙයූ සිත් ඇතිව වාස කරන්නහුට යම් සේ නම් එසේයි. බ්‍රාහ්මණය, කුකුළු පැටවකුගේ බිජුවටින් (නික්මීම) සෙයින් මාගේ මේ දෙවන අභිනිර්වෘතිය විය. ලෝ

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙසිං, සො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං දුක්ඛනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං අයං. දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං.

ඉමෙ ආසවාති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං ආසවසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං. අයං ආසවනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං.

තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චිත්ථ, භවාසවාපි චිත්තං විමුච්චිත්ථ, දිට්ඨාසවාපි චිත්තං විමුච්චිත්ථ, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසිං. අයං ඛො මෙ බ්‍රාහ්මණ, රත්තියා පච්ඡිමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. අයං ඛො මෙ බ්‍රාහ්මණ, තතියා අභිනිබ්භිදා අහොසි කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හාති.

එවං වුත්තෙ වෙරඤ්ජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: ජෙට්ඨො භවං ගොතමො, සෙට්ඨො භවං ගොතමො, අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 2. 2
## සීහසෙනාපති සුත්තං

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති. ධම්මස්ස වණ්ණං භාසන්ති. සඞ්ඝස්ස වණ්ණං භාසන්ති.

ඒ මම මෙසේ සිත සමාහිත වූ කල්හි පිරිසිදු වූ කල්හි පයර්‍යවදාත කල්හි කෙලෙස් රහිත වූ කල්හි උපක්ලෙශයන් ගෙන් පහ වූ කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වූ කල්හි ස්ථිති ප්‍රාප්ත කල්හි නිශ්චල භාවයට පත් කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත නතු කෙළෙමි. ඒ මම 'මේ (පස්කඳ) දුකැ'යි ඇතිසැටි මැනැවින් දැනගතිමි. මේ (තෘෂ්ණාව) දුඃඛ සමුදය යි මැනැවින් ඇතිසැටි දැන ගතිමි. මේ (නිර්වාණය) දුඃඛ නිරොධය යි ඇතිසැටි මැනැවින් දැන ගතිමි. මේ (අරි අටඟි මඟ) දුඃඛ නිරොධගාමිනී ප්‍රතිපදා ය යි ඇතිසැටි මැනැවින් දත්මි.

මොහු ආස්‍රවයහයි යථාභූතය මැනැවින් දත්මි, මේ ආස්‍රව සමුදය යි යථාභූතය මැනැවින් දත්මි, මේ ආස්‍රව නිරොධය යි යථාභූතය මැනැවින් දත්මි, මේ ආස්‍රව නිරොධගාමිනී ප්‍රතිපදය යි යථාභූතය මැනැවින් දත්මි.

මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ ඒ මාගේ සිත කාමාස්‍රවයෙනුදු මිදුනේ ය, භවාස්‍රවයෙනුදු සිත මිදුනේ ය, දෘෂ්ටාස්‍රවයෙනුදු සිත මිදුනේ ය, අවිද්‍යාස්‍රවයෙනුදු සිත මිදුනේ ය. විමුක්ත වූ කල්හි මිදුනේ ය යි (ප්‍රත්‍යවෙක්ෂා) ඥානය විය, ජාතිය ක්ෂීණ විය, මගබඹසර වැස නිමවන ලදී, සිවුමඟ කටයුතු කොට නිමවන ලදී, මේ අර්හත්ත්වය පිණිස අන්කරණී නැතැයි දත්මි. බ්‍රාහ්මණය, ඊ පැසුළු යම්හි මා විසින් මේ තෙවන (අර්හත්මාර්ගඥාන සංඛ්‍යාත) විද්‍යාව ලබන ලදූ, (සිවුසස් මුවහ කරන) අවිද්‍යාව නසන ලදූ, විද්‍යාව උපන, (මොහ සංඛ්‍යාත) තමස නසන ලද, ආලොකය උපන. අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති ව නිවන් කෙරේ මෙහෙයූ සිත් ඇති ව වසන්නහුට යම් සේ වේ නම් එසේ යි. බ්‍රාහ්මණය, බිජුවටින් (නික්මෙන) කුකුළු පැටවකුගේ මෙන් මාගේ මේ තෙවන අභිනිර්වෘතිය වී.

මෙසේ වදාළ කල්හි වෙරඤ්ජ බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''භවත් ගෞතමයෝ ජ්‍යෙෂ්ඨයහ, භවත් ගෞතමයෝ ශ්‍රෙෂ්ඨයහ. භවත් ගෞතමයෙනි, ඉතා කාන්තවෙයි, භවත් ගෞතමයෙනි, ඉතා කාන්ත වෙයි... භවත් ගෞතමයෝ අද පටන් මා දිවි හිමි කොට සරණ ගිය උවසුවකු කොට ධරත්ව''යි.

## 8. 1. 2. 2
## සීහසෙනාපති සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල්පුර මහවෙනෙහි කූටාගාර ශාලාවෙහි වසන සේක. එ සමයෙහි ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බොහෝ ලිච්ඡවීහු සන්ථාගාර ශාලාවෙහි රැස්ව හුන්නාහු නන් අයුරින් බුදුන්ගේ ගුණ වනති, ධර්මයාගේ ගුණ වනති, සඞ්ඝයාගේ ගුණ වනත්.

තෙන ඛො පන සමයෙන සීහො සෙනාපති නිගණ්ඨසාවකො තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො සීහස්ස සෙනාපතිස්ස එතදහොසි; නිස්සංසයං ඛො සො භගවා අරහං සම්මාසම්බුද්ධො භවිස්සති. තථා හි මෙ සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති. ධම්මස්ස වණ්ණං භාසන්ති, සඞ්ඝස්ස වණ්ණං භාසන්ති. යන්නූනාහං තං භගවන්තං දස්සනාය උපසඞ්කමෙය්‍යං අරහන්තං සම්මාසම්බුද්ධන්ති.

අථ ඛො සීහො සෙනාපති යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං එතදවොච: ඉච්ඡාමහං භන්තෙ, සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුන්ති.

කිං පන ත්වං සීහ, කිරියවාදො සමානො අකිරියවාදං සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සසි. සමණො හි සීහ, ගොතමො අකිරියවාදො අකිරියාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

අථ ඛො සීහස්ස සෙනාපතිස්ස යො අහොසි ගමියාභිසඞ්ඛාරො.[1] භගවන්තං දස්සනාය, සො පටිප්පස්සම්භි.

දුතියම්පි ඛො සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති, ධම්මස්ස වණ්ණං භාසන්ති, සඞ්ඝස්ස වණ්ණං භාසන්ති.

දුතියම්පි ඛො සීහස්ස සෙනාපතිස්ස එතදහොසි: නිස්සංසයං ඛො සො භගවා අරහං සම්මාසම්බුද්ධො භවිස්සති. තථා හි'මෙ සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති, ධම්මස්ස වණ්ණං භාසන්ති, සඞ්ඝස්ස වණ්ණං භාසන්ති. යන්නූනාහං තං භගවන්තං දස්සනාය උපසඞ්කමෙය්‍යං අරහන්තං සම්මාසම්බුද්ධන්ති.

අථ ඛො සීහො සෙනාපති යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං එතදවොච: ඉච්ඡාමහං භන්තෙ, සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුන්ති.

කිං පන ත්වං සීහ, කිරියවාදො සමානො අකිරියවාදං සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සසි, සමණො හි සීහ, ගොතමො අකිරියවාදො අකිරියාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

1. ගමිකාභිසඞ්ඛාරො, සීමු.

එ සමයෙහි නුවට සවු සිංහ සේනාපති එ පිරිස්හි හුන්නෝ වෙයි. එ කල්හි සිංහ සේනාපතිහට තෙල සිත විය: "නිසැකින් ම ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධ වන්නාහ. එහෙයින් ම මේ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ වූ ලිච්ඡවීහු සන්ථාගාරයෙහි රැස්ව හුන්නාහු නන් අයුරින් බුදුන්ගේ ගුණ වනත්, ධර්මයාගේ ගුණ වනත්, සඞ්ඝයාගේ ගුණ වනත්. මම ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුඩයන් දක්නා පිණිස එළඹෙම් නම් මනා මැනු"යි.

ඉක්බිති සිංහසේනාපති නුවට නාතපුත් වෙත එළඹියේ ය. එළඹ නිගණ්ඨනාත පුත්තහට මෙය කීය: "වහන්ස, මම මහණ ගොයුම්හු දක්නා පිණිස එළඹෙනු කැමැත්තෙමි" යි.

සීහය, තෝ ක්‍රියවාද ඇත්තෙහි ම කවර හෙයෙකින් අක්‍රියවාද ඇති මහණ ගොයුම්හු දක්නා පිණිස එළඹෙනුයෙහි ද? සීහය, අක්‍රියවාද ඇත්තේ ම මහණ ගොයුම් අක්‍රියාව පිණිස දම් දෙසන්නේ ය. එයින් සව්වන් හික්ම වන්නේ ද වෙයි.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ දැක්ම පිණිස සිංහ සේනාපතිහුගේ යම් ගමන සඳහා කරන පියෝ වී නම්, එය සන්හින.

දෙවන වට දු බොහෝ ප්‍රසිද්ධ ප්‍රසිද්ධවූ ලිච්ඡවීහු සන්ථාගාරයෙහි රැස් ව හුන්නාහු නන් අයුරින් බුදුන්ගේ ගුණ වනත්: ධර්මයාගේ ගුණ වනත්, සඞ්ඝයාගේ ගුණ වනත්.

දෙවන වට දු සිංහ සේනාපති හට තෙල සිත විය: නිසැකින් ම භාග්‍යවතුන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධ වන්නාහ. එහෙයින් ම මේ බොහෝ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවීහු සන්ථාගාරයෙහි රැස්ව හුන්නාහු නන් අයුරින් බුදුන්ගේ ගුණ වනත්, ධර්මයාගේ ගුණ වනත්, සඞ්ඝයාගේ ගුණ වනත්. මම ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් දක්නා පිණිස එළඹෙම් නම් මනා මැ නුයි.

ඉක්බිති සිංහසෙනාපති තෙම නුවට නාතපුත්ත වෙත එළඹියේ ය. එළඹ නුවට නාතපුත්තහට තෙල සැල කෙළේය: "වහන්ස, මම මහණ ගොයුම්හු දක්නා පිණිස එළඹෙනු කැමැත්තෙමි"යි.

සීහය, තෝ කිරියවාද ඇතියෙහි ම අකිරියවාද ඇති මහණ ගොයුම් දක්නට කවර හෙයින් එළඹෙන්නෙහි ද? සීහය, මහණ ගොයුම් වනාහි අකිරියවාද ඇත්තේ ම අක්‍රිය පිණිස දහම් දෙසන්නේ ය, එයින් සව්වන් හික්ම වන්නේ ද වෙයි.

දුතියම්පි ඛො සීහස්ස සෙනාපතිස්ස යො අහොසි ගමියාභිසඞ්ඛාරො භගවන්තං දස්සනාය, සො පටිප්පස්සම්භි.

තතියම්පි ඛො සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති, ධම්මස්ස වණ්ණං භාසන්ති, සඞ්ඝස්ස වණ්ණං භාසන්ති.

තතියම්පි ඛො සීහස්ස සෙනාපතිස්ස එතදහොසි: නිස්සංසයං ඛො සො භගවා අරහං සම්මාසම්බුද්ධො භවිස්සති. තථා හිමෙ සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති, ධම්මස්ස වණ්ණං භාසන්ති, සඞ්ඝස්ස වණ්ණං භාසන්ති. කිං හිමෙ කරිස්සන්ති නිගණ්ඨා අපලොකිතා වා අනපලොකිතා වා, යන්නූනාහං අනපලොකිත්වාව නිගණ්ඨෙ තං භගවන්තං දස්සනාය උපසඞ්කමෙය්‍යං අරහන්තං සම්මා-සම්බුද්ධන්ති.

අථ ඛො සීහො සෙනාපති පඤ්චමත්තෙහි රථසතෙහි දිවාදිවස්ස වෙසාලියා නිය්‍යාසි භගවන්තං දස්සනාය. යාවතිකා යානස්ස භූමි, යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව ආරාමං පාවිසි. අථ ඛො සීහො සෙනාපති යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සීහො සෙනාපති භගවන්තං එතදවොච:

සුතං මෙ'තං භන්තෙ, අකිරියවාදො සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති. යෙ තෙ භන්තෙ, එවමාහංසු: අකිරියවාදො සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති. කච්චි තෙ භන්තෙ, වුත්තවාදිනො? න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛන්ති,? ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොන්ති, න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡති? අනබ්භක්ඛාතු-කාමාහි මයං භන්තෙ, භගවන්තන්ති.

1. අත්ථි සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අකිරියවාදො සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

2. අත්ථි සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය, කිරියවාදො සමණො ගොතමො කිරියාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

දෙවනවට ද සිංහසෙනාපතිහුගේ භාග්‍යවත්හු දැකීම පිණිස යම බඳු ගමන සඳහා කරන පියොවෙක් වී නම් එය සන්හින.

තෙවනවටත් අතිප්‍රසිද්ධ ලිච්ඡවීහු සන්ථාගාරයෙහි රැස්ව හුන්නාහු නන් අයුරින් බුදුන්ගේ ගුණ බණත්, දහමිහුගේ ගුණ බණත්, සඟුන් ගුණ බණත්, තෙවනවටත් සිංහසේනාපතිහට තෙල සිත විය.

නිසැකින් ම ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධ වන්නාහ. එ හෙයින් ම මේ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවීහු සන්ථාගාරයෙහි රැස්ව හුන්නාහු නන් අයුරින් බුදුන්ගේ ගුණ බණත්, දහම් ගුණ බණත්, සඟුන් ගුණ බණත්. කළ ආපුච්ඡා ඇතියාහු වෙත්වයි, කළ ආපුච්ඡා නැතියාහු වෙත්වයි මේ නුවටහු මට කුමක් නම් කරත් ද? මම නුවටුන් ආපුච්ඡා නො කොට ම ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් දක්නා පිණිස එළඹෙන්නෙම් නම් මනා මැනු යි.

එ කල්හි සිංහසෙනාපති තෙම පන්සියක් පමණැති රියෙන් දෙවෙන් දවල් භාග්‍යවතුන් දක්නට විසල්පුරින් නික්ම ගියේ ය. යානයට බිම යම්තාක් ද එතෙක් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනෙහි යෙදුනේ ම ආරාමයට පිවිසියේ ය. ඉක්බිති සිංහසේනාපති භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් සිංහසේනාපති භාග්‍යවතුන් වහන්සේට තෙල කීය:

වහන්ස, 'අක්‍රියවාද ඇති මහණ ගොයුම් අක්‍රියාවට දහම් දෙසන්නේ ය, එයින් ම සවුවන් හික්මවන්නේ ය, යන තෙල කරුණ මා විසින් අසන ලද. වහන්ස, යම් බඳු ඕහු අක්‍රියවාද ඇති මහණ ගොයුම් අක්‍රියාවට දහම් දෙසන්නේ ය: එයින් ම සවුවන් හික්මවන්නේ යයි මෙසේ කියත් නම් වහන්ස, කිම ඕහු භගවත්හට කියූවා කියනු වෙත් ද? භගවත්හට අභූතයෙන් අභ්‍යාඛ්‍යාන නො කෙරෙත් ද? (භාග්‍යවතුන් වහන්සේගේ) ධර්මයට අනුකාරණයක් කියත් ද? කිසි සහධාර්මික වූ වාදනුවාදයෙකුත් ගැරහිය යුතු කරුණට නො ඒ ද? වහන්ස, අපි වනාහි භාග්‍යවතුන් වහන්සේට අභ්‍යාඛ්‍යාන (අභූතයෙන් කියනු කැමැත්තමෝ නොවම්හ) නො කරනු කැමැත්තම්හ'යි.

1. සීහය, 'මහණ ගොයුම් අක්‍රියවාද ඇතියේ අක්‍රියාවට දහම් දෙසන්නේ ය, එයින් ම සවුවන් හික්මවන්නේ යි යම් අයුරෙකින් මොනොවට කියනුයෙක් මා ගෙන කියන්නේ නම් ඒ කරුණ ඇත.

2. සීහය, 'මහණ ගොයුම් ක්‍රියවාද ඇත්තේ ක්‍රියාවට දහම් දෙසන්නේ ය: එයින් සවුවන් ද හික්ම වන්නේ ය'යි යම් අයුරෙකින් මොනොවට කියන්නෙක් මට කියන්නේ නම් එ කරුණ ඇත.

3. අත්ථි සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය උච්ඡෙදවාදො සමණො ගොතමො, උච්ඡෙදාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

4. අත්ථි සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය ජෙගුච්ඡී සමණො ගොතමො ජෙගුච්ඡිතාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

5. අත්ථි සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය, වෙනයිකො සමණො ගොතමො විනයාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතීති.

6. අත්ථි සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය තපස්සී සමණො ගොතමො තපස්සිතාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

7. අත්ථි සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය, අපගබ්භො සමණො ගොතමො අපගබ්භතාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

8. අත්ථි සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අස්සාසකො[1] සමණො ගොතමො අස්සාසාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

1. කතමො ච සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අකිරියවාදො සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති: අහං හි සීහ, අකිරියං වදාමි කායදුච්චරිතස්ස වචීදුච්චරිතස්ස මනොදුච්චරිතස්ස, අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං අකිරියං වදාමි. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අකිරියවාදො සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

2. කතමො ච සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය කිරියවාදො සමණො ගොතමො කිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතීති: අහං හි සීහ, කිරියං වදාමි. කායසුචරිතස්ස වචීසුචරිතස්ස මනොසුචරිතස්ස, අනෙකවිහිතානං කුසලානං ධම්මානං කිරියං වදාමි. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය කිරියවාදො සමණො ගොතමො කිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතීති.

---

1. අස්සාසතො – සිමු.

3. සීහය, 'ශ්‍රමණ ගෞතම උච්ඡේදවාද ඇත්තේ උච්ඡේදය පිණිස දහම් දෙසන්නේ ය, එයින් ශ්‍රාවකයන්ද හික්මවන්නේ යයි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියන්නේ නම් එ කරුණ ඇත.

4. සීහය, 'ශ්‍රමණ ගෞතම ජුගුප්සා කරන සුලු වූයේ ජුගුප්සාවට දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේය'යි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියන්නේ නම් එ කරුණ ඇත.

5. සීහය, 'ශ්‍රමණ ගෞතම වෙනයික වූයේ විනය පිණිස දම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියන්නේ නම් එ කරුණ ඇත.

6. සීහය, 'ශ්‍රමණ ගෞතම තපස්වී වූයේ තපස්විතාවට දම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ යයි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියන්නේ නම් එ කරුණ ඇත.

7. සීහය, 'ශ්‍රමණ ගෞතම අපගබ්භ වූයේ අපගබ්භතාවට දම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්ම වන්නේය'යි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියන්නේ නම් එ කරුණ ඇත.

8. සීහය, 'ශ්‍රමණ ගෞතම ආශ්වාසක වූයේ ආශ්වාසය පිණිස දම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියන්නේ නම් එ කරුණ ඇත.

1. සීහය, 'ශ්‍රමණ ගෞතම අක්‍රියවාද ඇත්තේ අක්‍රියාවට දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්ම වන්නේ යයි මොනොවට කියන්නෙක් යම් කරුණෙකින් මට කියන්නේ නම් ඒ කරුණ කවර යත්: සීහය, මම වනාහි කායදුශ්චරිතයාගේ වාග්දුශ්චරිතයාගේ මනෝදුශ්චරිතයාගේ අක්‍රියාව කියන්නෙමි, නන් වැදෑරුම් වූ ලාමක අකුශල ධර්මයන්ගේ අක්‍රියාව කියන්නෙමි. සීහය, 'ශ්‍රමණ ගෞතම අක්‍රියවාද ඇත්තේ අක්‍රියාවට දහම් දෙසන්නේ ය; එයින් සව්වනුදු හික්මවන්නේය'යි මොනොවට කියන්නෙක් යම් කරුණෙකින් මට කියන්නේ නම් මේ එ කරුණ යි.

2. සීහය, 'ශ්‍රමණ ගෞතම තෙම ක්‍රියාවාද ඇත්තේ ක්‍රියාවට දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ යයි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියන්නේ නම් ඒ කරුණ කවර යත්: සීහය, මම වනාහි කාය සුචරිතයාගේ වාක් සුචරිතයාගේ මනස්සුචරිතයාගේ ක්‍රියාව කියමි, නන් වැදෑරුම් කුසල්දහමුන්ගේ ක්‍රියාව කියමි. සීහය, 'ශ්‍රමණ ගෞතම ක්‍රියාවාද ඇත්තේ ක්‍රියාවට දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියා නම් මේ එ කරුණ යි.

3. කතමො ච සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය උච්ඡෙදවාදෙ සමණො ගොතමො, උච්ඡෙදය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති. අහං හි සීහ, උච්ඡෙදං වදාමි රාගස්ස දොසස්ස මොහස්ස, අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං උච්ඡෙදං වදාමි. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය උච්ඡෙදවාදෙ සමණො ගොතමො උච්ඡෙදය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

4. කතමො ච සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය ජෙගුච්ඡී සමණො ගොතමො, ජෙගුච්ඡිතාය ධම්මං දෙසෙති තෙන ච සාවකෙ විනෙතීති. අහං හි සීහ, ජිගුච්ඡාමි. කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන, අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා ජිගුච්ඡාමි. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය ජෙගුච්ඡී සමණො ගොතමො ජෙගුච්ඡිතාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

5. කතමො ච සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: වෙනයිකො සමණො ගොතමො. විනයාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති. අහං හි සීහ, විනයාය ධම්මං දෙසෙමි රාගස්ස දොසස්ස මොහස්ස, අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං විනයාය ධම්මං දෙසෙමි. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය වෙනයිකො සමණො ගොතමො, විනයාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

6. කතමො ච සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: තපස්සී සමණො ගොතමො තපස්සිතාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති. තපනීයාහං සීහ, පාපකෙ අකුසලෙ ධම්මෙ වදාමි කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, යස්ස ඛො සීහ, තපනීයා පාපකා අකුසලා ධම්මා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තමහං තපස්සීති වදාමි. තථාගතස්ස ඛො සීහ, තපනීයා පාපකා අකුසලා ධම්මා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය තපස්සී සමණො. ගොතමො තපස්සිතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතීති.

3. සීහය, 'ශ්‍රමණ ගෞතම උච්ඡේද වාද ඇත්තේ උච්ඡේදයට දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියා නම් ඒ කරුණ කවර යත්: සීහය මම වනාහි රාගයාගේ ද්වෙෂයාගේ මෝහයාගේ උච්ඡේදය කියන්නෙමි, අනේක විහිත වූ ලාමක අකුශල ධර්‍මයන්ගේ උච්ඡේදය කියන්නෙමි. සීහය, "ශ්‍රමණ ගෞතම තෙම උච්ඡේද වාද ඇතියේ උච්ඡේදය පිණිස දම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියනුයේ මට කියන්නේ නම් මේ එ කරුණ යි.

4. සීහය, 'ශ්‍රමණ ගෞතම තෙම ජුගුප්සා කරන සුලු වූයේ ජුගුප්සා කරන සුලු බවට ධර්‍මය දෙසන්නේය, එයින් සව්වනුදු හික්මවන්නේය''යි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියා නම් ඒ කරුණ කවර යත්: සීහය, මම වනාහි කාය දුශ්චරිතයට වාග් දුශ්චරිතයට ම නො දුශ්චරිත-යට ජුගුප්සා කරමි, අනේක විහිත වූ ලාමක අකුශල ධර්‍මයනට සමවැදුමට ජුගුප්සා කරමි. සීහය, ''ශ්‍රමණ ගෞතම තෙමේ ජුගුප්සා කරන සුලු වූයේ ජුගුප්සා කරන සුලු බවට දහම් දෙසන්නේය, එයින් සව්වනුදු හික්ම-වන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියා නම් මේ එ කරුණ වෙයි.

5. සීහය, 'ශ්‍රමණ ගෞතම තෙමේ වෙනයික වූයේ විනය පිණිස දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියා නම් එ කරුණ කවර යත්: සීහය, මම වනාහි රාගයාගේ ද්වෙෂයාගේ මෝහයාගේ විනය පිණිස දහම් දෙසමි, අනේකවිධ වූ ලාමක අකුශල ධර්‍මයන්ගේ විනය පිණිස දහම් දෙසමි. සීහය, 'ශ්‍රමණ ගෞතම තෙමේ වෙනයික වූයේ විනය පිණිස දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියා නම් මේ එ කරුණ වෙයි.

6. සීහය, ''ශ්‍රමණ ගෞතම තපස්වී වූයේ තපස්වී භාවයට ධර්‍මය දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්ම වන්නේ ය යි යම් කරුණෙකින් මට කියන්නේ නම් ඒ කරුණ කවර යත්: සීහය, මම් කායදුශ්චරිතය, වාග් දුශ්චරිතය මනෝදුශ්චරිතය යන ලාමක අකුශල ධර්‍ම තපනීය යි කියමි. සීහය, යමකුගේ තපනීය ලාමක අකුශල ධර්‍මයෝ ප්‍රහීණ වූවාහු උසුන් මුල් ඇත්තාහු තාලාවස්තුකෘත වූවාහු අනභාවකෘත වූවාහු මතුයෙහි නූපදනා සැහැවි ඇත්තාහු වෙත් නම්, මම ඔහු තපස්වී යයි කියමි. සීහය; තථා-ගතයන්හට වනාහි තපනීය වූ ලාමක අකුශල ධර්‍මයෝ ප්‍රහීණයහ, උච්ඡින්න මූලයහ, තාලාවස්තුකෘතයහ, අනභාවකෘතයහ, මතුයෙහි නූපදනා සැහැවි ඇතියහ. සීහය, 'ශ්‍රමණ ගෞතම තෙමේ තපස්වී වූයේ තපස්වී භාවයට දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්ම වන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියා නම්, මේ එ කරුණ වෙයි.

7. කතමො ච සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අපගබ්භො සමණො ගොතමො අපගබ්භතාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති. යස්ස ඛො සීහ, ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති පහීනා, උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තමහං අපගබ්භොති වදාමි. තථාගතස්ස ඛො සීහ, ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අපගබ්භො සමණො ගොතමො අපගබ්භතාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

8. කතමො ච සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අස්සාසකො සමණො ගොතමො අස්සාසාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති. අහං හි සීහ, අස්සාසකො පරමෙන අස්සාසෙන, අස්සාසාය ච ධම්මං දෙසෙමි, තෙන ච සාවකෙ විනෙමි. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය අස්සාසකො සමණො ගොතමො අස්සාසාය ධම්මං දෙසෙති, තෙන ච සාවකෙ විනෙතීති.

එවං වුත්තෙ සීහො සෙනාපති භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, -පෙ- උපාසකං මං භන්තෙ, භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති,

අනුවිච්චකාරං ඛො සීහ, කරොහි, අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතීති.

ඉමිනා පහං භන්තෙ භගවතො භිය්‍යොසොමත්තාය අත්තමනො අභිරද්ධො, යං මං භගවා එවමාහ: අනුවිච්චකාරං ඛො සීහ, කරොහි, අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතීති,

7. සීහය, "ශ්‍රමණ ගෞතම අපගබ්භ වූයේ අපගබ්භතාව පිණිස දම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය"යි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියා නම් ඒ කරුණ කවර යත්: සීහය, යමක්හුගේ මතුයෙහි මාතෘගර්භශය්‍යාව පුනර්භවාභිනිර්වෘත්තිය ප්‍රහීණ ද, උච්ඡින්නමූල ද, තාලාවස්තුකෘත ද, අනභාවකෘත ද, මතුයෙහි නූපදනා සැහැවි ඇත්තී ද, මම ඔහු අපගර්භය යි කියමි. සීහය, තථාගතයන්ගේ මතුයෙහි ගර්භශය්‍යාව පුනර්භවාභිනිර්වෘත්තිය ප්‍රහීණ ය, උච්ඡින්නමූල ය, තාලාවස්තුකෘත ය, අනභාවකෘත ය, මතුයෙහි නූපදනා සුළු ය, සීහය, ශ්‍රමණ ගෞතම තෙමේ අපගබ්භ වූයේ අපගබ්භතාව පිණිස දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියා නම් මේ එ කරුණ යි.

8. සීහය, 'ශ්‍රමණ ගෞතම ආශ්වාසකවූයේ ආශ්වාසය සඳහා දහම් දෙසන්නේ ය, එයින් සව්වනුදු හික්මවන්නේ ය'යි යම් කරුණෙකින් මොනොවට කියන්නෙක් මට කියා නම් ඒ කරුණ කවරයත්: සීහය, මම වනාහි (චතුර්මාර්ග – ඵල සඞ්ඛ්‍යාත) උත්තම ආශ්වාසයෙන් ආශ්වාසක වූයෙම් ආශ්වාසය පිණිස දහම් දෙසමි, එයින් සව්වනුදු හික්මවමි. සීහය, 'ශ්‍රමණ ගෞතම ආශ්වාසක වූයේ ආශ්වාසය පිණිස දහම් දෙසන්නේය, එයින් සව්වනුදු හික්මවන්නේ ය යි යම් කරුණෙකින් මොනොවට කියනුයෙක් මට කියා නම් මේ එ කරුණ යි.

මෙසේ වදාළ කල්හි සිංහසෙනාපති භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේ ය: 'වහන්ස, ඉතා කාන්ත ය, වහන්ස, ඉතා කාන්ත ය... වහන්ස, අද පටන් දිවි හිමි කොට සරණ ගිය උවසකු කොට භාග්‍යවතුන් වහන්සේ මා දරන සේක්වා'යි.

සීහය, අනුවිත්තනය කොට (සිතා පිරික්සා) කටයුතු කරව, තා බඳු ප්‍රසිද්ධ මනුෂ්‍යයනට අනුවිත්තන ක්‍රියාව ම මනා වෙයි.

වහන්ස, මේ කරුණෙනුත් මම භාග්‍යවතුන් වහන්සේට බෙහෙවින් සතුටු සිතැත්තෙමි ඇලුනෙම වෙමි. යම් කරුණෙකින් භාග්‍යවතුන් වහන්සේ 'සීහය, අනුවිත්තන ක්‍රියා කරව, අනුවිත්තන ක්‍රියාව ම තොප බඳු ප්‍රසිද්ධ මනුෂ්‍යයනට මනා වේ යයි මට මෙසේ වදළසේක් නම් එහෙයිනි.

මමං හි භන්තෙ, අඤ්ඤතිත්ථියා සාවකං ලභිත්වා කෙවලකප්පං වෙසාලිං පටාකං පරිහරෙය්‍යුං: සීහො අම්හාකං සෙනාපති සාවකත්තං උපගතොති. අථ ච පන මං භගවා එවමාහ: අනුවිච්චකාරං ඛො සීහ, කරොහි. අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතීති. එසාහං භන්තෙ, දුතියම්පි භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භන්තෙ, භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

දීඝරත්තං ඛො තෙ සීහ, නිගණ්ඨානං ඔපානභූතං කුලං යෙන තෙසං උපගතානං පිණ්ඩකං දාතබ්බං මඤ්ඤෙය්‍යාසීති.

ඉමිනාපහං භන්තෙ, භගවතො භිය්‍යොසොමත්තාය අත්තමනො අභිරද්ධො යං මං භගවා එවමාහ: දීඝරත්තං ඛො තෙ සීහ, නිගණ්ඨානං ඔපානභූතං කුලං යෙන තෙසං උපගතානං පිණ්ඩකං දාතබ්බං මඤ්ඤෙය්‍යාසීති.

සුතං මෙ තං භන්තෙ, සමණො ගොතමො එවමාහ: මය්හමෙව දානං දාතබ්බං න අඤ්ඤෙසං දානං දාතබ්බං, මය්හමෙව සාවකානං දානං දාතබ්බං න අඤ්ඤෙසං සාවකානං දානං දාතබ්බං, මය්හමෙව දින්නං මහප්ඵලං, න අඤ්ඤෙසං දින්නං මහප්ඵලං, මය්හමෙව සාවකානං දින්නං මහප්ඵලං නාඤ්ඤෙසං සාවකානං දින්නං මහප්ඵලන්ති. අථ ච පන මං භගවා නිගණ්ඨෙසුපි දානෙ සමාදපෙති. අපි ච භන්තෙ, මයමෙත්ථ කාලං ජානිස්සාම. එසාහං භන්තෙ තතියම්පි භගවන්තං සරණං ගච්ඡාමි. ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භන්තෙ, භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

අථ ඛො භගවා සීහස්ස සෙනාපතිස්ස ආනුපුබ්බිකථං[1] කථෙසි. සෙය්‍යථීදං:- දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි.

---

1. අනුපුබ්බිංකථං - මජ්ඣං - අනුපුබ්බිකථං--ස්‍යා

වහන්ස, මා බඳු සව්වකු ලැබ අන්තොටුවෝ හැම විසල්පුර "සිංහ සේනාපති අපගේ සවු බවට පැමිණියේ ය"යි කෙහෙළි නගන්නාහ. වැලිත් භාග්‍යවතුන් වහන්සේ "සීහය, අනුචින්තන ක්‍රියා කරව, තොප බඳු ප්‍රසිද්ධ මනුෂ්‍යයනට අනුචින්තන ක්‍රියාව ම මනා වන්නේ ය"යි මට මෙසේ වදරන සේක. වහන්ස, තෙල මම දෙවනවට ද භාග්‍යවතුන් වහන්සේත් ධර්මයත් භික්සඟුනුත් සරණ යෙමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් මා දිවිහිම් කොට සරණ ගිය උවසු කොට දරන සේක්ව යී.

සීහය, යම් හෙයෙකින් තාගේ නිවෙස බොහෝ කල් පටන් නුවටුනට (පිළියෙළකළ) උදපානයක් (ළිඳක්) බඳු වී ද (එහෙයින්) එළඹුණු ඔවුනට පිඩු දිය යුතු කොට හඟුවයි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම්බඳු මට "සීහය, යම් හෙයෙකින් දිගු කලෙක පටන් තාගේ නිවෙස අන්තොටුවනට පිළියෙළ කළ ළිඳක් බඳු වී ද, එහෙයින් වෙත පැමිණි උනට පිඩුවා දිය යුතු කොට හඟුව"යි මෙසේ වදරන සේක් නම්, මෙ කරුණින් ද මම් භාග්‍යවතුන් වහන්සේට බෙහෙවින් සතුටු සිතැතියෙම් ඇලුතෙම් වෙමි.

වහන්ස, 'මහණ ගොයුම් මෙසේ කියති'යි යන තෙල කරුණ මා විසින් අසන ලදී. 'මාහට ම දන් දියයුතු වෙයි, අන්හට දන් දිය යුතු නො වෙයි, මාගේ සවුවනට ම දන් දිය යුතු වෙයි: අන්සව්වනට දන් දිය යුතු නොවේ, මාහට දෙන ලද්ද ම මහත් එල වෙයි, අන්හට දෙන ලද්ද මහත්එල නො වෙයි: මාගේ සව්වනට ම දුන් දෑ මහත් එල වෙයි, අන් සව්වනට දුන් දෑ මහත් එල නො වෙයි" කියායි. වැලිදු භාග්‍යවතුන් වහන්සේ මා නුවටුන් කෙරෙහිදු දීමෙහි සමාදන් කරවන්නාහ. වැලිදු වහන්ස, මෙ කරුණෙහි ලා අපි කල් දන්නමු. වහන්ස, තෙල මම තෙවනවටත් භාග්‍යවතුන් වහන්සේත් දහමත් බික්සඟනත් සරණ කොට යෙමි. වහන්ස, අද පටන් භාග්‍යවතුන් වහන්සේ මා දිවිහිමියෙන් සරණ ගිය උවසු කොට ධරන සේක්වයි.

ඉක්බිති සිංහ සේනාපතිහට භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙළ කථාව වදළ සේක. එනම්: දනකථාය සීලකථාය සග්ගකථාය කාමයන්ගේ අයුණු ගා ලමු බව හා සකිලිටිය හා පැවිද්දෙහි අනුසස් ද පැවසූ සේක.

යදා භගවා අඤ්ඤාසි සීහං සෙනාපතිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං, සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පතිගණ්හෙය්‍ය, එවමෙව සීහස්ස සෙනාපතිස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.

අථ ඛො සීහො සෙනාපති දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච:

අධිවාසෙතු මෙ භන්තෙ, භගවා ස්වාතනාය භත්තං. සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො සීහො සෙනාපති භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො සීහො සෙනාපති අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: ගච්ඡ ත්වං අම්භො පුරිස, පවත්තමංසං ජානාහීති. අථ ඛො සීහො සෙනාපති තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි. කාලො භන්තෙ, නිට්ඨිතං භත්තන්ති.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන සීහස්ස සෙනාපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

තෙන ඛො පන සමයෙන සම්බහුලා නිගණ්ඨා වෙසාලියං රථිකාය රථිකං[1] සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං බාහා පග්ගය්හ කන්දන්ති. අජ්ජ සීහෙන සෙනාපතිනා ථූලං පසුං වධිත්වා සමණස්ස ගොතමස්ස භත්තං කතං. තං සමණො ගොතමො ජානං උද්දිස්සකතං මංසං පරිභුඤ්ජති පටිච්චකම්මන්ති.

1. රථියාය රථියං - සිමු.

යම් විටෙක භාග්‍යවතුන් වහන්සේ සිංහ සේනාපති අරෝග සිත් ඇතියහු, මෘදු චිත්ත වූවහු නීවරණින් තොර සිත් ඇතියහු ඔදපත් සිතැතියහු පහන් සිතැතියහු දත් සේක් ද, එවිට දුඃඛ සමුදය නිරෝධ මාර්ග යන බුද්ධවරුන්ගේ යම් සාමුක්කංසික ධම්මදේසනාවෙක් (තමා විසින් ම දත් අන්‍යයනට අසාධාරණ (හම් දෙසුමෙක්) වේ නම් එය පාළ කළ සේක. යම් පරිදි ඉවත්කළ කළුලප ඇති සුදු චිතක් මොනොවට රදන් පිළිගන්නේ ද, එපරිදිම සිංහ සේනාපතිහට එම අස්නෙහි ඝහවූ රාගාදි රජස් ඇති පහවූ රාගාදි මල ඇති යම්කිසි සමුදය සවභාවයෙක් ඇත්නම්, එ හැම නිරුද්ධවන සුලුයයි (සොතාපත්ති මාර්ග සඞඛ්‍යාත) ධර්ම චක්ෂුස උපන.

ඉක්බිති සිංහ සේනාපති දුටු (අරිසත්) දම් ඇතියේ (සොවන් මහ පල නමැති) පත්දම් ඇතියේ පසක් කළ (නිවන්) දම් ඇතියේ බැසගත් දහම් ඇතියේ තරණය කළ විචිකිත්සා ඇතියේ පහවූ කථඞකථා ඇතියේ වෙසරද බවට පැමිණියේ (ශාස්තෘ ශාසනයෙහි) පරප්‍රත්‍යය රහිත වූයේ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැළ කෙළේය:

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟුන් සමඟ සෙට දවස් පිණිස මාගේ බත ඉවසා වදරන සේක්වයි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් ඉවසූ සේක.

ඉක්බිති සිංහ සේනාපති භාග්‍යවත්හුගේ අධිවාසනය දැන හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

ඉක්බිති සිංහ සේනාපති 'එම්බා පුරුෂය, යව, ප්‍රවෘත්ත මාංශයක් දනුව'යි අන්‍යතර පුරුෂයකු ඇමතී ය. ඉන්පසු සිංහසෙනාපති එ රෑ ඇවෑමෙන් සිය නිවෙස්හි ප්‍රණීත වූ කෑ යුතු බුදිය යුතු දෑ පිළියෙළ කරවා භාග්‍යවතුන් වහන්සේට 'වහන්ස, බතට කල් වෙයි. බත් (සපයා) නිමැවිණැයි කල් දැන්වී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙන සිංහ සේනාපතිහුගේ නිවෙසට වැඩිසේක, වැඩ බික්සඟුන් සමඟ පැනවූ අස්නෙහි වැඩ හුන්හ.

එකල්හි බොහෝ නුවටෝ විසල්පුර වීථියෙන් වීථියෙහි සිවුමංසලින් සිවුමංසල දෙයත් බැඳ ''අද සිංහ සේනාපතිහු විසින් මහසිරුරැති සිවුපාවකු මරා මහණ ගොයුම්හට බතක් කරන ලදී. මහණ ගොයුම් උදෙසා කළ ප්‍රතීත්‍යකම් (කර්මප්පරිශය ඇති නොහොත් තමා පිණිස කළ නොහොත් නිමිත්තකම්) වූ එ මස දන්නේ ම වළඳ කෙරේය යි හඬගා කියත්.

අථ ඛො අඤ්ඤතරො පුරිසො යෙන සීහො සෙනාපති තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා සීහස්ස සෙනාපතිස්ස උපකණ්ණකෙ ආරොචෙසි. යග්ඝෙ භන්තෙ, ජානෙය්‍යාසි: එතෙ සම්බහුලා නිගණ්ඨා වෙසාලියං රථිකාය රථිකං[1] සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං බාහා පග්ගය්හ කන්දන්ති. අජ්ජ සීහෙන සෙනාපතිනා ථූලං පසුං වධිත්වා සමණස්ස ගොතමස්ස භත්තං කතං, තං සමණො ගොතමො ජානං උද්දිස්සකටං මංසං පරිභුඤ්ජති පටිච්චකම්මන්ති.

අලං අය්‍යා දීඝරත්තම්පි තෙ ආයස්මන්තො අවණ්ණකාමා බුද්ධස්ස, අවණ්ණකාමා ධම්මස්ස, අවණ්ණකාමා සඞ්ඝස්ස න ච පනෙතෙ ආයස්මන්තො ජීරන්ති තං භගවන්තං අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛන්තා, න ච මයං ජීවිතහෙතුපි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍යාමාති.

අථ ඛො සීහො සෙනාපති බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි. සම්පවාරෙසි. අථ ඛො සීහො සෙනාපති භගවන්තං භුත්තාවිං ඔනීතපත්ත-පාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සීහං සෙනාපතිං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමීති.

## 8. 1. 2. 3

## ආජඤ්ඤ සුත්තං

[සාවත්ථි නිදානං]

අට්ඨහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති, කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ, රඤ්ඤො භද්‍රො අස්සාජානියො උභතො සුජාතො හොති. මාතිතො ච පිතිතො ච' යස්සං දිසායං අඤ්ඤෙපි භද්‍රා අස්සාජානීයා ජායන්ති තස්සං දිසායං ජාතො හොති, යං ඛො පනස්ස භොජනං දෙන්ති අල්ලං වා සුක්ඛං වා, තං සක්කච්චං යෙව පරිභුඤ්ජති අවිකිරන්තො, ජෙගුච්ඡී හොති උච්චාරං වා පස්සාවං වා අභිනිසීදිතුං වා අභිනිපජ්ජිතුං වා, සොරතො හොති සුඛසංවාසො, න අඤ්ඤෙ අස්සෙ උබ්බෙජෙතා, යානි ඛො පනස්ස හොන්ති සාඨෙය්‍යානි කූටෙය්‍යානි ජිම්හෙය්‍යානි වඞ්කෙය්‍යානි තානි යථාභූතං සාරථිස්ස ආවිකත්තා හොති.

1. රථියා–රථියං සිමු.

එකල්හි අන්‍යතර පුරුෂයෙක් සිංහ සේනාපතිහු යම් තැනෙක ද, එහි එළැඹියේය, වෙත අවුත් කන්මුල්හි කොඳුරා සැල කෙළේ: 'වහන්ස, තෙල කරුණ දන්නහු ද? තෙල බොහෝ නුවටහු විසල් පුර වීථියෙන් වීථියෙහි සිවුමංසලින් සිවුමංසලෙහි දෙයත් බැඳ අද සිංහ සේනාපතිහු විසින් තර සිවුපාවකු මරා මහණ ගොයුම්හට බතක් කරනලදී, මහණ ගොයුම් දන්නේ ම උදෙසාකළ ප්‍රතීත්‍යකර්ම වූ එ මස වළඳ කරනේය යි හඬ නගා කියති''යි.

''ආයර්‍ය්‍යය, (ඉන්) කම් නැත, බොහෝ කලක් ම ඒ ආයුෂ්මත්හු බුදුන්ට අයුණු කැමැත්තාහුය, දහමට අයුණු කැමැතියහ. සඟනට අයුණු කැමැතියහ. තෙල ආයුෂ්මත්හු ඒ භාග්‍යවතුන් අසත්‍ය වූ තුච්ඡ වූ මුසා වූ අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කරන්නාහු (අයුණු කියුම්හි) නිමාවට ද නො යන්නාහ, අපිදු ජීවිත හේතුයෙනුත් දැනදැන සතකු දිවි තොරනො කරම්හ''යි.

ඉක්බිති සීහසේනාපති බුදුපාමොක් බික්සඟුන් පිණී වූ කැ යුතුයෙන් හා බුදිය යුතුයෙන් සියතින් සතපාලී ය, පවරාලී ය. ඉක්බිති සීහ සේනාපති වැළඳූ පාත්‍රයෙන් ඉවතගත් අත් ඇති, භාග්‍යවතුන් වහන්සේගේ එකත් පසෙක හින. එකත්පසෙක හුන් සිංහ සේනාපතිහු භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථායෙන් කරුණු දක්වා සමාදන් කරවා තෙද ගන්වා පහන් කරවා හුනස්නෙන් නැඟී වැඩි සේකි.

## 8. 1. 2. 3

## ආජඤ්ඤ සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, රජහුගේ භද්‍ර වූ අශ්වාජානෙයයා අංග අටෙකින් සමන්වාගත වූයේ රාජාර්හ වෙයි. රාජභොග්‍ය වෙයි. රාජාඞ්ගයෙකැයි ම සඞ්ඛ්‍යාවට යෙයි. කවර අටෙකින යත්:

මහණෙනි, මෙ ලොවිහි රජුගේ භද්‍ර වූ ආජානෙය අශ්ව තෙමේ මවගෙන් හා පියාගෙන් හා දෙපසින් සුජාත වෙයි. යම් දිගෙක අන්‍ය භද්‍ර වූ ආජානෙය අශ්වයෝ උපදිත් නම් එ දික්හි උපනේ වෙයි. ඔහට අමු වේවයි වියැළි වේවයි යම් ම භෝජනයක් දෙත් නම් එය නො විසුරුවමින් සකසා ම බුදියි. මලෙහි හෝ මූයෙහි හෝ හිඳිනට හෝ හෝනට හෝ පිළිකුල් කරන සුලු වෙයි. සුඛසංවාස ඇතියේ සොරත වෙයි. අන් අසුන් නො තැකි ගන්වන්නේ වෙයි. ඔහුගේ යම් ශඨබැව්හු කුළුබැව්හු ඇදබැව්හු වක්බැව්හු වෙත් නම් එ හැම අස්සැරිහට ඇති සැටියෙන් පළ කරන්නේ වෙයි.

තෙසමස්ස සාරථී අභිනිම්මදනාය වායමති, වාහී ඛො පන හොති කාමඤ්ඤෙ අස්සා වහන්තු වා මා වා අහමෙත්ථ වහිස්සාමීති චිත්තං උප්පාදෙති, ගච්ඡන්තො ඛො පන උජුමග්ගෙනෙව ගච්ඡති, ථාමවා හොති යාව ජීවිතමරණපරියාදනා ථාමං උපදංසෙතා, ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි අඞ්ගෙහි සමන්නාගතො රඤ්ඤො භද්‍රො අස්සාජානීයො රාජාරහො හොති රාජභොග්ගො, රඤ්ඤො අඞ්ගන්තෙව සඞ්ඛං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති. -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස, කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු සීලවා හොති. පාතිමොක්ඛසංවරසංවුතො විහරති. ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, යං ඛො පනස්ස භොජනං දෙන්ති ලූඛං වා පණීතං වා තං සක්කච්චංයෙව පරිභුඤ්ජති අවිහඤ්ඤමානො, ජෙගුච්ඡී හොති කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන ජෙගුච්ඡී හොති අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, සොරතො හොති සුඛසංවාසො, න අඤ්ඤෙ භික්ඛු උබ්බෙජෙතා. යානි ඛො පනස්ස හොන්ති සාඨෙය්‍යානි කූටෙය්‍යානි ජිම්හෙය්‍යානි වඞ්කෙය්‍යානි තානි යථාභූතං ආවිකත්තා හොති සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරිසු, තෙසමස්ස සත්ථා වා විඤ්ඤූ වා සබ්‍රහ්මචාරී අභිනිම්මදනාය වායමති. සික්ඛිතා ඛො පන හොති. කාමඤ්ඤෙ භික්ඛු සික්ඛන්තු වා මා වා අහමෙත්ථ සික්ඛිස්සාමීති චිත්තං උප්පාදෙති. ගච්ඡන්තො ඛො පන උජුමග්ගෙනෙව ගච්ඡති. තත්‍රායං උජුමග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි, ආරද්ධවිරියො විහරති කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යන්තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති. ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

ඔහුගේ එ හැම මඩනට අස්සැරි වැයම් කෙරෙයි. වහන සැහැවි (බර උසුලන බව, දුන් ඔවා පිළිපදින බව) ඇතියේ වෙයි. එකැතින් අන් අස්හු උසුලත්වයි නො උසුලත්වයි මෙහිලා මම් උසුලන්නෙමැයි සිත් දනවයි. යන්නේ ද ඉදූ මඟින් ම යන්නේ වෙයි. ස්ථාමවත් වෙයි. ජීවිතයාගේ මරණයෙන් කෙළවර තෙක් ස්ථාමය (ශක්තිය) පවත්වනුයේ ද වෙයි. මහණෙනි, රජුගේ භද්‍ර වූ ආජානේය අශ්වයා මේ අටඟින් යුක්ත වූයේ රාජාර්හ වෙයි. රාජභොග්‍ය වෙයි. රජහුගේ අංගයෙකැයි ම සඞ්ඛ්‍යාවට යෙයි.

මහණෙනි, එ පරිද්දෙන් ම ගුණදම් අටෙකින් සමන්වාගත වූ මහණ ආහුනාර්හ වෙයි... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වේ. කවර අටෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. ප්‍රාතිමොක්ෂ සංවර-යෙන් සංවෘතව වාස කෙරෙයි. ආචාර ගොචර සම්පන්න වූයේ අණුමාත්‍ර වරදෙහිදු බිය දක්නා සුලු වූයේ සිකපද සමාදන් කොට ගෙන හික්මෙයි. ඔහට රළු වේවයි පිණි වේවයි යම් ම බොජුනක් දෙත් නම් (තෘෂ්ණාමාන දිට්ඨි විසින්) නො ගැටෙමින් සකසා (අමාවක් මෙන් සලකා) වළඳ කෙරෙයි. කාය දුශ්චරිතය වාග් දුශ්චරිතය මනො දුශ්චරිතය පිළිකුල් කරන සුලුවෙයි. අනේකවිධ වූ ලාමක වූ අකුශලධර්මයන්ගේ සමාපත්තියට පිළිකුල් කරන සුළු වෙයි. සුඛසංවාස ඇතියේ සුරත ගුණ ඇතියේ වෙයි. අන් මහණුන් නො තැති ගන්වනුයේ වෙයි. ඔහුගේ යම් ශඨ බැව්හු කුළුබැව්හු ඇද බැව්හු වක් බැව්හු වෙත් නම් එ හැම ශාස්තෘන් වහන්සේ කෙරෙහි හෝ නුවණැති සබ්‍රම්සරුන් කෙරෙහි හෝ ඇති සැටියෙන් පළ කරන්නේ වෙයි. ශාස්තෘන් වහන්සේ වේවයි නුවණැති සබ්‍රම්සරහු වේවයි ඔහුගේ එ හැම මැඩුම් සඳහා වෑයම් කෙරෙයි. හික්මෙනුයේ ම වෙයි. එතැතින් අන් මහණහු හික්මෙත්වා හෝ නොහික්-මෙත්වා හෝ යි මම මෙහිලා හික්මෙන්නෙමැයි සිත උපදවයි. යන්නේ ද ඉදූ මඟින් ම යෙයි. එහිලා මේ ඍජු මාර්ගය වේ: එනම්, සම්‍යක් දෘෂ්ටිය ... සම්‍යක්සමාධිය යි. ඇරඹූ වැර ඇතියේ වෙයි, නියතින් සිරුරෙහි සම ද නහර ද ඇට ද ශෙෂ වේවා, මස් ලෙහෙ වියැළේවා. පුරුෂ ස්ථාමයෙන් (පුරුෂඥාන බලයෙන්) පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් පැමිණිය යුතු යමෙක් වේ නම් එයට (නිවනට) නොපැමිණ වීර්‍ය්‍යයාගේ පසුබැස්මෙක් නො වන්නේ ය කියා යි. මහණෙනි, මේ අටදහමින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි... ලොවට අනුතුරු පින්කෙත් වෙයයි.

## 8. 1. 2. 4

## ඛලුඞ්ක සුත්තං

[සාවත්ථි නිදානං]

අට්ඨ ච භික්ඛවෙ අස්සඛලුඞ්කෙ දෙසිස්සාමි අට්ඨ ච අස්සදොසෙ, අට්ඨ ච දූරිසඛලුඞ්කෙ අට්ඨ ච පුරිසදොසෙ, තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

1. කතමෙ ච භික්ඛවෙ, අට්ඨ අස්සඛලුඞ්කා අට්ඨ ච අස්සදොසා: ඉධ භික්ඛවෙ, එකච්චො අස්සඛලුඞ්කො 'පෙහී'ති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා පච්ඡතො පටිසක්කති[1] පිට්ඨිතො රථං පවිවත්තෙති[2] එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො අස්සඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ, පඨමො අස්සදොසො.

2. පුනචපරං භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො 'පෙහී'ති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා පච්ඡා ලංඝති[3] කුබ්බරං හන්ති. තිදණ්ඩං භඤ්ජති. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ දුතියො අස්සදොසො.

3. පුනචපරං භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො 'පෙහී'ති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා රථීසාය සත්ථිං උස්සජ්ජිත්වා[4] රථීසංයෙව අජ්ඣොමද්දති, එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ තතියො අස්සදොසො.

4. පුනචපරං භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො 'පෙහී'ති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා උම්මග්ගං ගණ්හාති, උබ්බටුමං රථං කරොති. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ චතුත්ථො අස්සදොසො.

5. පුනචපරං භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො 'පෙහී'ති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා ලඞ්ඝති පුරිමං කායං, පග්ගණ්හාති පුරිමෙ පාදෙ. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො අස්සඛලුඞ්කො හොති අයං භික්ඛවෙ, පඤ්චමො අස්සදොසො.

---

1. පටික්කමති - මජසං
2. පවත්තෙති සබ්බත්ථ
3. පච්ඡාලඞ්ඝිපති - සයා
4. උස්සජ්ජිත්වා - සිමු.

# 8. 1. 2. 4

## බලුඞක සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, අශ්වපෝතකයන් අට දෙනෙකුන් ද අශ්වදොෂ අටක් ද පුරුෂබලුඞකයන් (හෙවත් අස්කුණ්ඩයන් බඳු පුරුෂයන්) අට දෙනකුන් ද පුරිස්දොස් අටක් ද දෙසන්නෙමි. ඒ අසවු. මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමැ යි. එසේ ය වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල කරුණ වදාළ සේක.

1. මහණෙනි, අශ්වබලුඞකයන් අට දෙන ද අස්දොස් අට ද කවරහ යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැම් අශ්වබලුඞකයෙක් රියසැරිහු විසින් යවයි කියන ලද්දුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ පිටුපසට ඇදෙයි. පිටින් රිය පෙරළයි (කඳවින් විය උලා පසුපයින් රිය පෙරළමින් පසු බසී යු සේ යි) මහණෙනි, මෙලොව්හි මෙ බඳු වූත් ඇතැම් අශ්වපෝතකයෙක් වෙයි. මහණෙනි, මේ පළමු අශ්වදොෂ යි.

2. මහණෙනි, තවද මෙ ලොව්හි අශ්වපෝතකයෙක් සාරථීහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ පසු දෙපා ඔසවා පහර දෙයි. (රියහි) කිඹුල්මුව (පිටුපා ඔසවා පහරදී) බිඳියි. (රිය ඉදිරිපස වූ) දඬුඳන බිඳියි. මහණෙනි, මෙලොව්හි මෙ බඳුවූත් ඇතැම් අස්කුණ්ඩයෙක් වෙයි. මහණෙනි, මේ දෙවන අශ්ව දොෂ යි.

3. තවද මහණෙනි, මෙලොව්හි ඇතැම් බලුඞකාශ්වයෙක් රිය සැරිහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ රියහිසෙහි කලවා සටා රියහිස ම මඩිමින් සිටියි. (හිස නමා විය බිම හෙළා කලවයෙන් රියහිසට පහර දී පෙර දෙපයින් රියහිස මඩිමින් සිටියි යු සේ යි) මහණෙනි, මෙ ලොව්හි මෙ බඳුවූත් ඇතැම් අස් පොව්වෙක් වෙයි. මහණෙනි, මේ තෙවන අශ්වදොෂ යි.

4. මහණෙනි, තවද, මෙලොව්හි ඇතැම් අශ්වබලුඞකයෙක් රියසැරිහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ නො මඟ ගනියි (ගොඩට හෝ කවුළැහැබකට හෝ නංවා) රිය නො මඟ ගන්නා ලද්දක් කරයි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳුවූත් ඇතැම් අස්කුණ්ඩයෙක් වෙයි. මහණෙනි, මෙ සිවුවන අශ්වදොෂ යි.

5. මහණෙනි, තවද මෙ ලොව්හි ඇතැම් අස්පොව්වෙක් සාරථීහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ පෙරකය නඟයි. පෙර පා තර කොට ගනියි. මහණෙනි, මෙ ලොව්හි මෙ බඳු වූත් ඇතැම් අශ්වබලුඞකයෙක් වෙයි. මහණෙනි, මේ පස් වන අශ්වදොෂ යි.

6. පුනචපරං භික්ඛවෙ ඉධෙකච්චො අස්සඛලුඞ්කො 'පෙහී'ති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා අනාදියිත්වා සාරථිං අනාදියිත්වා පතොදං[1] දන්තෙහි[2] මුඛාධානං විදංසිත්වා[3] යෙන කාමං පක්කමති, එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ, ඡට්ඨො අස්සදොසො.

7. පුනචපරං භික්ඛවෙ ඉධෙකච්චො අස්සඛලුඞ්කො 'පෙහී'ති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා, නෙව අභික්කමති, නො පටික්කමති, තත්ථෙව ඛීලට්ඨායී ඨිතො හොති. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ, සත්තමො, අස්සදොසො.

8. පුනචපරං භික්ඛවෙ ඉධෙකච්චො අස්සඛලුඞ්කො 'පෙහී'ති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා පුරිමෙ ච පාදෙ සංහරිත්වා පච්ඡිමෙ ච පාදෙ සංහරිත්වා තත්ථෙව චත්තාරො පාදෙ අභිනිසීදති. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො අස්සඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ, අට්ඨමො අස්සදොසො. ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ අස්සඛලුඞ්කා අට්ඨ ච අස්සදොසා.

1. කතමෙ ච භික්ඛවෙ අට්ඨ ච පුරිසඛලුඞ්කා, අට්ඨ ච පුරිසදොසා: ඉධ භික්ඛවෙ භික්ඛු භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො න සරාමීති අසතියා ච නිබ්බෙඨෙති. සෙය්‍යථාපි සො භික්ඛවෙ, අස්සඛලුඞ්කො පෙහීති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා පච්ඡතො පටිසක්කති පිට්ඨිතො රථං පටිවත්තෙති. තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුරිසඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ, පඨමො පුරිසදොසො.

2. පුනචපරං භික්ඛවෙ භික්ඛු භික්ඛුං ආපත්තියා චොදෙන්ති සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො චොදකං යෙව පටිප්ඵරති. කිං නු ඛො තුය්හං බාලස්ස අබ්‍යත්තස්ස භණිතෙන ත්වම්පි නාම භණිතබ්බං මඤ්ඤසීති. සෙය්‍යථාපි සො භික්ඛවෙ අස්සඛලුඞ්කො පෙහීති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා පච්චාලංසති, කුබ්බරං හනති, තිදණ්ඩං භඤ්ජති. තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුරිසඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ දුතියො පුරිසදොසො.

---

1. පතොදලට්ඨිං – මජසං
2. පතොදදන්තෙහි – සිමු.
3. විද්ධංසිත්වා – සිමු.

6. තවද මහණෙනි මෙ ලොවහි ඇතැම් අශ්වබලුඞකයෙක් සාරථිහු විසින් යව යි කියන ලද්දුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ සාරථිහු නො මෙනෙහි කොට කැවිට ද නො මෙනෙහි කොට දතින් මුව වළලු (කටකලියාව) ඩැහැගෙන කැමැතියේ යම් තෙනකට යයි. මහණෙනි, මෙ ලොවහි මෙ බඳු වූත් ඇතැම් අස්පොව්ශවක් වෙයි. මහණෙනි, මේ සවන අශ්වදෝෂ යි.

7. තවද මහණෙනි, මෙ ලොවහි ඇතැම් අශ්වබලුඞකයෙක් සාරථිහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ ඉදිරියට නො ම යෙයි. පසුපසට ද ගමන් නො කෙරෙයි. එ තන්හි ම කීලස්ථායී ව (සතරපා ටැම්සේ පිහිටුවා ගෙන නිශ්චල ව) සිටියේ වෙයි. මහණෙනි, මෙ ලොවහි මෙ බඳු වූත් ඇතැම් අස්කුණ්ඩයෙක් වෙයි. මහණෙනි, මේ සත් වන අශ්වදෝෂ යි.

8. මහණෙනි, තවද, මෙ ලොවහි ඇතැම් අශ්වපොතකයෙක් රියසැරිහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ පෙර පා හකුළුවා පසු පාත් හකුළුවා එහි ම සතර පා මැඩ ගෙන හිඳියි. මහණෙනි, මෙ ලොව හි මෙ බඳු වූත් ඇතැම් බලුඞකාශ්වයෙක් වෙයි. මහණෙනි, මේ අටවැනි අශ්වදෝෂ යි. මහණෙනි, මේ අශ්ව බලුඞකයෝ අට දෙන ද අශ්වදෝෂයෝ අට ද වෙත්.

1. මහණෙනි, පුරුෂ බලුඞකයෝ අට දෙනත් පුරුසදෙස් අටත් කවරහු ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහු මහණක්හු ඇවතින් චෝදනා කෙරෙත්, ඒ මහණ මහණුන් විසින් ඇවතින් චෝදනා කරනු ලබන්නේ නො සිහියෙන් ම නො සම්රම්යි නිවේයන කරයි (ලිහයි.) මහණෙනි, යම් පරිදි ඒ අශ්වබලුඞක තෙමේ රියසැරිහු විසින් යවයි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ පසු පසට ඇදේද, පිටින් රිය පෙරළා ද, මහණෙනි, මම් එබදු උපමා ඇත්තකු කොට මේ පුහුලා කියමි. මහණෙනි, මෙයස්නෙහි මෙ බඳු වූත් ඇතැම් බලුඞකාශ්ව බඳු පුරුසයෙක් වෙයි. මහණෙනි, මෙ පළමු පුරුෂ දෙෂ යි.

2. තවද මහණෙනි, මහණහු මහණක්හු ඇවතින් චෝදනා කෙරෙත්. එ මහණ මහණුන් විසින් ඇවතින් චෝදනා කරනු ලබන්නේ බාල වූ අව්‍යක්ත වූ තාගේ බිණුමෙන් කවර නම් ප්‍රයෝජනයෙක් ද? තෝත් බිණිය යුක්තකු කොට හඟනෙහි දැයි චෝදකයාට ම ප්‍රතිවිරුද්ධ ව සිටියි. මහණෙනි, ඒ බලුඞකාශ්ව සාරථිහු විසින් යවයි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ යම්සේ පසු දෙපා ඔසවා පහර දේද, (රියෙහි) කිඹුල්මුව බිඳී ද, තෙදඬු බිඳී ද මහණෙනි, මම මේ පුහුලා එබඳු උපමා ඇත්තකු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු වූත් ඇතැම් පුරුෂ බලුඞකයෙක් වෙයි. මහණෙනි, මෙ දෙවන පුරුෂ දෙෂ යි.

3. පුනචපරං භික්ඛවෙ, භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො චොදකස්සෙව පච්චාරොපෙති ත්වම්පි ඛොසි ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො ත්වං තාව පඨමං පටිකරොහීති. සෙය්‍යථාපි සො භික්ඛවෙ, අස්සඛළුඞ්කො පෙහීති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා රථීසාය සත්ථිං උස්සජ්ජිත්වා රථීසංයෙව අජ්ඣොමද්දති. තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුරිසඛළුඞ්කො හොති. අයං භික්ඛවෙ, තතියො පුරිසදොසො.

4. පුනචපරං භික්ඛවෙ, භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති, බහිද්ධා කථං අපනාමෙති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. සෙය්‍යථාපි සො භික්ඛවෙ, අස්සඛළුඞ්කො පෙහීති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා උම්මග්ගං ගණ්හාති, උබ්බටුමං රථං කරොති. තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුරිසඛළුඞ්කො හොති. අයං භික්ඛවෙ, චතුත්ථො පුරිසදොසො.

5. පුනචපරං භික්ඛවෙ, භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො සඞ්ඝමජ්ඣෙ බාහා වික්ඛෙපං භණති. සෙය්‍යථාපි සො භික්ඛවෙ අස්සඛළුඞ්කො පෙහීති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා ලඞ්ඝති පුරිමං කායං, පග්ගණ්හාති පුරිමෙ පාදෙ, තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො පුරිසඛළුඞ්කො හොති. අයං භික්ඛවෙ, පඤ්චමො පුරිසදොසො.

6. පුනචපරං භික්ඛවෙ, භික්ඛූ භික්ඛුං ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො අනාදියිත්වා සඞ්ඝං අනාදියිත්වා චොදකං සාපත්තිකොව යෙන කාමං පක්කමති. සෙය්‍යථාපි සො භික්ඛවෙ, අස්සඛළුඞ්කො පෙහීති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා අනාදියිත්වා සාරථිං අනාදියිත්වා පතොදං දන්තෙහි මුඛාධානං විධංසිත්වා[1] යෙන කාමං පක්කමති. තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුරිසඛළුඞ්කො හොති. අයං භික්ඛවෙ, ඡට්ඨො පුරිසදොසො.

1. විද්ධංසිත්වා - සී. මු.

3. මහණෙනි, තවද මහණහු මහණක්හු ඇවැතින් චෝදනා කෙරෙත්. එ මහණ මහණුන් විසින් ඇවතින් චෝදනා කරනු ලබන්නේ තො ද මෙ නම් ඇවැතට පැමිණියේ වෙහි, තෝ පළමු කොට පිළියම් කරව යි චෝදකයාට ම පෙරළා චෝදනා නඟයි. මහණෙනි, යම් පරිදි ඒ අශ්ව බලුඞ්කයා රිය සැරිහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ රියහිසෙහි කලවා සටා රියහිස ම මඩිමින් සිටී ද මහණෙනි, මම් මේ පුහුලා එබඳු උපමා ඇත්තකු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු වූත් ඇතැම් පුරුෂ බලුඞ්කයෙක් වෙයි. මහණෙනි, මෙ තෙවන පුරුෂ දෙෂ යි.

4. තවද මහණෙනි, මහණහු මහණක්හු ආපත්තියෙන් චෝදනා කෙරෙත්, එ මහණ මහණුන් විසින් ඇවතින් චොදනා කරනු ලබන්නේ අනෙකෙකින් අනෙකක් (හෙවත් අන් කරුණෙකින් අන් කරුණක් හෝ අන් වචනයෙකින් අන් වචනයක් හෝ) වසයි, කථාව පිටතට හෙළයි, කෝපයද ද්වේෂය ද නො සතුට ද පහළ කෙරෙයි. මහණෙනි, යම් පරිදි එ අශ්ව බලුඞ්ක තෙමේ රියසැරිහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ නො මඟ ගනී ද, රිය නො මඟ ගන්නා ලද්දක් කෙරේ ද, මහණෙනි, මම් මේ පුහුලා එබඳු උපමා ඇත්තකු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙබඳු වූත් ඇතැම් පුරුෂ බලුඞ්කයෙක් වෙයි. මහණෙනි, මේ සිවුවන පුරුෂදෙෂ යි.

5. මහණෙනි, තවද මහණහු මහණක්හු ඇවතින් චෝදනා කෙරෙත්. එ මහණ මහණුන් විසින් ඇවතින් චෝදනා කරනු ලබන්නේ සඟමැද බාහුවික්ෂෙපය (අත් සැලීම්) කරමින් බෙණෙයි. මහණෙනි, ඒ බලුඞ්කාශ්ව යම් සේ රියසැරිහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ පෙරකය නඟා ද, පෙරපා තරකොට ගනී ද, මහණෙනි, මම මේ පුහුලා එබඳු උපමා ඇත්තකු කොට කියමි. මහණෙනි, මෙ සස්නෙහි මෙ බඳු වූත් ඇතැම් පුරුෂ බලුඞ්කයෙක් වෙයි. මහණෙනි, මෙ පස්වන පුරුෂදෙෂය යි.

6. මහණෙනි, තවද මහණහු මහණක්හු ඇවතින් චෝදනා කෙරෙත්. එ මහණ මහණුන් විසින් ඇවතින් චෝදනා කරනු ලබන්නේ සඞ්ඝයා නො මෙනෙහි කොට චෝදකයා නො මෙනෙහි කොට ඇවැත් සහිත වූයේ ම කැමැති සේ යම් තෙනකට යෙයි. මහණෙනි, එ අශ්වබලුඞ්කයා සාරථිහු විසින් යව යි කියන ලදුයේ (කැවිටෙන්) විදුනා ලදුයේම මෙහෙයන ලදුයේ යම්සේ සාරථිහු නො මෙනෙහි කොට කැවිට නො මෙනෙහි කොට දතින් මුවවළලු ඩැහැගෙන කැමැති සේ යම් තෙනකට යේද, මහණෙනි, මම් මේ පුහුල් එබඳු උපමා ඇත්තකු කොට කියමි. මහණෙනි, මෙසස්නෙහි මෙ බඳු වූත් ඇතැම් පුරුෂ බලුඞ්කයෙක් වෙයි. මහණෙනි, මෙ සවන පුරුෂදෙෂ යි.

7. පුනචපරං භික්ඛවෙ භික්ඛු භික්ඛූ ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො නෙවාහං ආපන්නොම්හි න පනාහං ආපන්නොම්හීති තුණ්හීභාවෙන සඞ්ඝං විහෙසෙති. සෙය්‍යථාපි සො භික්ඛවෙ, අස්සඛලුඞ්කො පෙහීති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා නෙව අභික්කමති, නො පටික්කමති, තත්ථෙව ඛීලට්ඨායී ඨිතො හොති. තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ, ඉධෙකච්චො පුරිසඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ, සත්තමො පුරිසදොසො.

පුනචපරං භික්ඛවෙ භික්ඛු භික්ඛූ ආපත්තියා චොදෙන්ති. සො භික්ඛු භික්ඛූහි ආපත්තියා චොදියමානො එවමාහ; කිං නු ඛො තුම්හෙ ආයස්මන්තො අතිබාළ්හං මයි බ්‍යාවටා, ඉදානාහං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමීති, සො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා එවමාහ: ඉදානි ඛො තුම්හෙ ආයස්මන්තො අත්තමනා හොථා'ති, සෙය්‍යථාපි සො භික්ඛවෙ අස්සඛලුඞ්කො පෙහීති වුත්තො විද්ධො සමානො චොදිතො සාරථිනා පුරිමෙ ච පාදෙ සංහරිත්වා පච්ඡිමෙ ච පාදෙ සංහරිත්වා තත්ථෙව චත්තාරො පාදෙ අභිනිසීදති. තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි. එවරූපොපි භික්ඛවෙ ඉධෙකච්චො පුරිසඛලුඞ්කො හොති. අයං භික්ඛවෙ අට්ඨමො පුරිසදොසො. ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨ පුරිසඛලුඞ්කා අට්ඨ ච පුරිසදොසාති.

## 8. 1. 2. 5
## මල සුත්තං

[සාවත්ථි නිදානං]

අට්ඨිමානි භික්ඛවෙ මලානි කතමානි අට්ඨ.

අසජ්ඣාය මලා භික්ඛවෙ මන්තා, අනුට්ඨානමලා භික්ඛවෙ ඝරා, මලං භික්ඛවෙ වණ්ණස්ස කොසජ්ජං, පමාදො භික්ඛවෙ රක්ඛතො මලං. මලං භික්ඛවෙ ඉත්ථියා දුච්චරිතං. මච්ඡෙරං භික්ඛවෙ දදතො මලං. මලා භික්ඛවෙ පාපකා අකුසලා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච. තතො භික්ඛවෙ මලා මලතරං අවිජ්ජා පරමං මලං. ඉමානි ඛො භික්ඛවෙ අට්ඨ මලානීති.

7. තවද මහණෙනි, මහණහු මහණක්හු ඇවතින් චෝදනා කෙරෙත්. ඒ මහණ මහණුන් විසින් ඇවතින් චෝදනා කරනු ලබන්නේ මම (ඇවත් අවන්නෙම් නො වෙම් ම ය, ඒකාන්තයෙන් මම අවන්නෙම් නො වෙමැයි තුෂ්ණිම්භාවයෙන් සඞ්ඝයා වෙහෙසයි. මහණෙනි, යම් සේ ඒ අශ්ව බලුඬක තෙමෙ සාරථිහු විසින් යව යි කියන ලදුයේ (කෑව්ටෙන්) විදුනා ලදුයේ ම මෙහෙයන ලදුයේ පෙරපසට නො ම යයි ද, පසුපසටත් නො ම යෙයි ද, එතන්හි ම කීලස්ථායී ව සිටියේ වේ ද, මහණෙනි, මම් මේ පුහුලා එබඳු උපමා ඇත්තකු කොට කියමි. මහණෙනි, මෙ සසුන්හි මෙ බඳු වූන් ඇතැම් පුරුෂබලුඬකයෙක් වෙයි. මහණෙනි, මෙ සත්වන පුරුෂ දෙෂ යි.

8. මහණෙනි, තවද මහණහු මහණක්හු ඇවතින් චෝදනා කෙරෙත්. මහණුන් විසින් ඇවැතින් චෝදනා කරනු ලබන එ මහණ මෙසේ කියයි. "ආයුෂ්මත්නි, තෙපි කුමක් හෙයින් දැඩි කොට මා කෙරෙහි ව්‍යාවෘත වවු ද? දැන් මම ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහි බවට පෙරළෙන්නෙමැ"යි. හේ සික බැහැරලා ගිහිබවට පෙරළී මෙසේ කියයි: "ආයුෂ්මත්නි, තෙපි දැන් සතුටු වවු"යි. මහණෙනි, ඒ අශ්වබලුඬක තෙමෙ රියසැරිහු විසින් යවයි කියන ලදුයේ (කැව්ටෙන්) විදුනාලදුයේ ම මෙහෙයන ලදුයේ පෙර පා හකුළුවා පසුපාත් හකුළුවා එහි ම සතර පා මැඩගෙන හිඳියි ද, මහණෙනි, මම් මේ පුහුලා එබඳු උපමා ඇතියකු කොට කියමි. මහණෙනි, මෙ සසුන්හි මෙ බඳු වූත් ඇතැම් පුරුෂබලුඬකයෙක් (බලුඬක අශ්ව බඳු පුරුෂයෙක්) වෙයි. මහණෙනි, මෙ අටවැනි පුරුෂ දෙෂ යයි. මහණෙනි, මොහු වනාහි අෂ්ටපුරුෂබලුඬකයෝ ද අෂ්ටපුරුෂදෙෂයෝ ද වෙතැයි.

## 8. 1. 2. 5
## මල සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ මල අටෙකි. කවර අටෙක යත්:

මහණෙනි, මන්ත්‍ර (ශාස්ත්‍ර) යෝ නො හැදෑරීම මල කොට ඇත්තාහ. මහණෙනි, ගෘහයෝ උත්ථානවීර්‍ය්‍යයාගේ අභාවය මල කොට ඇතියහ. මහණෙනි, සිරුරු පැහැයට කුසීතභාවය මලෙකි. මහණෙනි, (යම්-අයන් දයක්) රක්නහුට ප්‍රමාදය මලෙකි. මාගම්හට දුසිරිත් මලෙකි. මහණෙනි, දයකයාහට මසුරු බව මලෙකි. මහණෙනි, ලමු දහම් හු මෙලෝ පරලෝ දෙක්හි ම මල වෙත්. මහණෙනි, ඒ මලයනට වැඩි මල තරය නම් (අට තන්හි නො දැනීම වූ) අවිද්‍යා නමැති පරම මල යි. මහණෙනි, මොහු මල අට වෙත්.

1. අසජ්ඣාය මලා මන්තා අනුට්ඨානමලා඼ඝරා,
මලං වණ්ණස්ස කොසජ්ජං පමාදො රක්ඛතො මලං.

2. මලිත්ථියා දුච්චරිතං මච්ඡෙරං දදතො මලං,
මලා වෙ පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච
තතො මලා මලතරං අවිජ්ජා පරමං මලන්ති.

## 8. 1. 2. 6
## දූතෙය්‍ය සුත්තං

**[සාවත්ථි නිදානං]**

අට්ඨහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දූතෙය්‍යං ගන්තු-මරහති. කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සොතා ච හොති සාවෙතා ච, උග්ගහෙතා ච ධාරෙතා ච, විඤ්ඤාතා ච විඤ්ඤාපෙතා ච, කුසලො ච සහිතාසහිතස්ස, නො ච කලහකාරකො. ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දූතෙය්‍යං ගන්තුමරහති.

අට්ඨහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සාරිපුත්තො දූතෙය්‍යං ගන්තුමරහති. කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ සාරිපුත්තො සොතා ච හොති සාවෙතා ච, උග්ගාහෙතා ච, ධාරෙතා ච, විඤ්ඤාතා ච, විඤ්ඤාපෙතා ච, කුසලො ච සහිතාසහිතස්ස, නො ච කලහකාරකො. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි ධම්මෙහි සමන්නාගතො සාරිපුත්තො දූතෙය්‍යං ගන්තුමරහතීති.

1. යො වෙ නවෙධති[1] පත්වා පරිසං උග්ගවාදිනිං[2],
න ච හාපෙති වචනං න ච ඡාදෙති සාසනං,

2. අසන්දිද්ධඤ්ච භණති පුච්ඡිතො න ච කුප්පති,
ස වෙ තාදිසකො භික්ඛු දූතෙය්‍යං ගන්තුමරහතීති.

1. බ්‍යථති - මජසං, ස්‍යා.
2. උග්ගවාදිනං - සීමු.

1. මන්ත්‍රයෝ නො පිරිවැහීම මල කොට ඇතියහ. ගෘහයෝ අනුෂ්ඨානය මල කොට ඇතියහ, ශරීර වර්ණයට කුසීත භාවය මල වේ. වස්තු රක්නහුට ප්‍රමාදය මල වේ.

2. මාගමීහට දුසිරිත මල යි. දෙනුවහට මසුරු බව මල යි. මෙලොවහිත් පරලොවහිත් ලමු දහම්හු එකැතියෙන් මල වෙත්. ඒ මලයනට වැඩි මලතර වූයේ අවිද්‍යා නමැති මහාමල වෙයි.

## 8: 1. 2. 6

## දූතෙය්‍ය සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, කරුණු අටෙකින් සමන්වාගත මහණ දූතකර්මයට යාමට සුදුසු වේ. කවර අට කරුණින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අසනුයේත් අස්වනුයේත් වෙයි, උගන්නේත් ධරන්නේත් වෙයි. විඥවූයේත් (අභ්‍යන්තරයෙහි අරුත් දන්නේත්) විඥපනය කරනුයේත් වෙයි. සහිත අසහිත දෙක්හි කුශල වූයේත් වෙයි. කලහ කරනුයේ ද නො වේ. මහණෙනි, මේ අට කරුණින් සමන්වාගත වූ මහණ දූතකර්මයට යාමට සුදුසු වෙයි.

මහණෙනි, කරුණු අටෙකින් සමන්වාගත ශාරිපුත්‍ර දූතකර්මයට යාමට යොග්‍ය වෙයි. කවර අට කරුණින යත්:

මහණෙනි, මෙ සස්නෙහි සැරියුත් අසනුයේත් අස්වනුයේත් වෙයි, උගනුයේත් දරනුයේත් වෙයි, විජානන කරනුයේත් විඥපන කරනුයේත් වෙයි, සහිත අසහිතයෙහි කුශලවූයේත් වෙයි. කලහකාරක ද නො වේ. මහණෙනි, මේ අට කරුණින් සමන්වාගත වූ ශාරිපුත්‍ර දූතමෙහෙවරට යාමට යොග්‍ය වේ.

1. යමෙක් උග්‍රවාදී වූ පිරිසට පැමිණ නො සැලේ ද, වදන් නො නසනුයේ ද, ශාසනයත් නො සඟවයි ද,

2. නිසැක කොට කියා ද, පුළුවුස්නා ලදුයේ නො කිපේ ද, එබඳු එ මහණ ඒකාන්තයෙන් දූත මෙහෙවරට යාමට සුදුසු වේ.

## 8. 1. 2. 7
## පුරිසබන්ධන සුත්තං

**[සාවත්ථි නිදානං]**

අට්ඨහි භික්ඛවෙ ආකාරෙහි ඉත්ථී පුරිසං බන්ධති, කතමෙහි අට්ඨහි: රූපෙන භික්ඛවෙ, ඉත්ථී පුරිසං බන්ධති, හසිතෙන භික්ඛවෙ ඉත්ථී පුරිසං බන්ධති. භණිතෙන භික්ඛවෙ ඉත්ථී පුරිසං බන්ධති. ගීතෙන භික්ඛවෙ ඉත්ථී පුරිසං බන්ධති. රුණ්ණෙන[1] භික්ඛවෙ ඉත්ථී පුරිසං බන්ධති, ආකප්පෙන භික්ඛවෙ ඉත්ථී පුරිසං බන්ධති. වනභඞ්ගෙන භික්ඛවෙ, ඉත්ථී පුරිසං බන්ධති. ඵස්සෙන භික්ඛවෙ ඉත්ථී පුරිසං බන්ධති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි ආකාරෙහි ඉත්ථී පුරිසං බන්ධති. තෙ භික්ඛවෙ සත්තා සුබද්ධා යෙ[2] ඵස්සෙන බද්ධා'ති.[3*]

## 8. 1. 2. 8
## ඉත්ථිබන්ධන සුත්තං

**[සාවත්ථි නිදානං]**

අට්ඨහි භික්ඛවෙ ආකාරෙහි පුරිසො ඉත්ථිං බන්ධති, කතමෙහි අට්ඨහි:

රූපෙන භික්ඛවෙ පුරිසො ඉත්ථිං බන්ධති, හසිතෙන භික්ඛවෙ පුරිසො ඉත්ථිං බන්ධති. භණිතෙන භික්ඛවෙ පුරිසො ඉත්ථිං බන්ධති. ගීතෙන භික්ඛවෙ පුරිසො ඉත්ථිං බන්ධති. රුණ්ණෙන[1] භික්ඛවෙ පුරිසො ඉත්ථිං, බන්ධති. ආකප්පෙන භික්ඛවෙ පුරිසො ඉත්ථිං බන්ධති. වනභඞ්ගෙන භික්ඛවෙ, පුරිසො ඉත්ථිං බන්ධති. ඵස්සෙන භික්ඛවෙ පුරිසො ඉත්ථිං බන්ධති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි ආකාරෙහි පුරිසො ඉත්ථිං බන්ධති, තෙ භික්ඛවෙ සත්තා සුබද්ධා යෙ[2] ඵස්සෙන බද්ධා'ති[3*],

---

1. රොණ්ණෙන - සිමු.
2. සුබන්ධා - සිමු, ස්‍යා
3. බන්ධා - සිමු - ස්‍යා,

* මජසං, පොත්ථකෙ ඉමානි ද්වෙ සුත්තානි අඤ්ඤථා දිස්සන්ති,

## 8. 1. 2. 7
## පුරිසබන්ධන සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, අට අයුරෙකින් මාගම පුරුෂයා බඳියි. කවර අටෙකින යත්:

මහණෙනි, රූපයෙන් මාගම පුරුෂයා බඳියි. මහණෙනි, හසිතයෙන් (සිනායෙන්) මාගම පුරුෂයා බඳියි. මහණෙනි, බිණුමෙන් මාගම පුරුෂයා බඳියි. මහණෙනි, ගීතයෙන් මාගම පුරුෂයා බඳියි. මහණෙනි, මාගම රොදනයෙන් (හැඬුමෙන්) පුරුෂයා බඳියි. මහණෙනි, මාගම ආකල්පයෙන් (හැඳුම් පෙරවුම් ඈ විධියෙන්) පුරුෂයා බඳියි. මහණෙනි, මාගම වනභඞ්ගයෙන් (වනයෙන් ගෙනා මල්පල ඈ තුටු පඬුරින්) පුරුෂයා බඳියි. මහණෙනි, පහසින් මාගම පුරුෂයා බඳියි. මහණෙනි, මේ අට අයුරින් මාගම පුරුෂයා බඳී. මහණෙනි, යම් සත්ත්ව කෙනෙක් පහසින් බැඳුණාහු වෙත් නම් ඔහු මොනොවට (තරව) බැඳුණාහු වෙති යි.

## 8. 1. 2. 8
## ඉත්ථිබන්ධන සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, අට අයුරකින් පුරුෂයා මාගම බඳියි. කවර අටකින යත්:

මහණෙනි, රූපයෙන් පුරුෂයා මාගම බඳියි. මහණෙනි, හසිත-යෙන් පුරුෂයා මාගම බඳියි. මහණෙනි, භණිතයෙන් පුරුෂයා මාගම බඳියි. මහණෙනි, ගීතයෙන් පුරුෂයා මාගම බඳියි, මහණෙනි, රොදනයෙන් පුරුෂයා මාගම බඳියි. මහණෙනි, ආකල්පයෙන් පුරුෂයා මාගම බඳියි, මහණෙනි, වනභඞ්ගයෙන් පුරුෂයා මාගම බඳියි. මහණෙනි, ස්පර්ශයෙන් පුරුෂයා මාගම බඳී. මහණෙනි, මේ අට අයුරින් පුරුෂයා මාගම බඳියි. මහණෙනි, යම් සත්ත්ව කෙනෙක් පහසින් බඳනා ලද්දහු ද ඔහු මොනොවට බැඳුණාහු වෙති යි.

## 8. 1. 2. 9

### පහාරාද සුත්තං

එකං සමයං භගවා වෙරඤ්ජායං විහරති නළෙරුපුචිමන්දමූලෙ. අථ ඛො පහාරාදො අසුරින්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො පහාරාදං අසුරින්දං භගවා එතදවොච: අපි පන පහාරාද, අසුරා මහාසමුද්දෙ අභිරමන්තීති.

අභිරමන්ති භන්තෙ, අසුරා මහාසමුද්දෙති:

කති පන පහාරාද, මහාසමුද්දෙ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්තීති.

අට්ඨ භන්තෙ, මහාසමුද්දෙ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති කතමෙ අට්ඨ?:

1. මහාසමුද්දො භන්තෙ, අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො. යම්පි භන්තෙ, මහාසමුද්දො අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො, අයං භන්තෙ, මහාසමුද්දෙ පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

2. පුනචපරං භන්තෙ, මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති. යම්පි භන්තෙ, මහා සමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති, අයං භන්තෙ, මහාසමුද්දෙ දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

3. පුනචපරං භන්තෙ, මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති, යං හොති මහාසමුද්දෙ මතං කුණපං තං ඛිප්පංයෙව[1] තීරං වාහෙති, ථලං උස්සාදෙති[2], යම්පි භන්තෙ, මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති. යං හොති මහාසමුද්දෙ මතං කුණපං තං ඛිප්පං යෙව තීරං වාහෙති, ථලං උස්සාදෙති[2]. අයං භන්තෙ, මහාසමුද්දෙ තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

---

1. ඛිප්පමෙව – මජසං.
2. උස්සාරෙති – මජසං.

## 8. 1. 2. 9

## පහාරාද සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෙරඤ්ජා නගරයෙහි නළේරු නම් (යක්ෂාධිගෘහීත) කොහොඹ රුක් මුල්හි වැඩ වසන සේක. එකල්හි පහාරාද නම් අසුරෙන්ද්‍රයා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය, එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි පහාරාද අසුරෙන්ද්‍රයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. පහාරාදය, අසුරයෝ මුහුදෙහි සිත් අලවා වෙසෙත් දැයි?

වහන්ස, අසුරයෝ මහසයුරෙහි සිත් අලවා වෙසෙත් යි.

පහාරාද, යම් ආශ්චර්‍ය්‍ය කෙනකුන් දක්මින් අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් අලවා වෙසෙත් නම් ඒ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ කෙතෙක් දැයි?

වහන්ස, යම් ආශ්චර්‍ය්‍ය කෙනකුන් පුනපුනා දක අසුරයෝ මහා-සමුද්‍රයෙහි සිත් අලවා වෙසෙත් නම් එබඳු ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මයෝ අටදෙනෙක් වෙත්. කවර අටදෙනෙක යත්:

1. වහන්ස, මහසයුර අනුපූර්ව නිම්න යි, (පිළිවෙළින් ගැඹුරු වූයේ වෙයි), අනුපූර්වප්‍රවණ යි (පිළිවෙළින් නැමුනේ වෙයි), අනුපූර්ව ප්‍රාග්භාර යි (පිළිවෙළින් ඉදිරියට බරවූයේ වෙයි), ආදියෙහි ම ගැඹුරු නො වෙයි. වහන්ස, යම්හෙයෙකින් මහසයුර අනුපූර්වනිම්න වේ ද, අනුපූර්වප්‍රවණ වේ ද, අනුපූර්වප්‍රාග්භාර වේ ද, ආදියෙහි ම නො ගැඹුරු වේ ද, වහන්ස, යම් හෙයෙකින් යමක් පුනපුනා දක්මින් මහසයුරෙහි සිත් අලවා වෙසෙත් නම් මෙ මහසයුරෙහි ප්‍රථම ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මය වෙයි.

2. තවද වහන්ස, පිහිටි සැහැවි ඇති මහසයුර වෙරළ නො ඉක්මවයි. වහන්ස, යම්හෙයෙකින් පිහිටි සැහැවි ඇති මහසයුර වෙරළ නො ඉක්මවා නම් වහන්ස, යමක් පුනපුනා දක්මින් අසුරයෝ මහසයුරෙහි සිත් අලවා වෙසෙත් ද, මේ මහසයුරෙහි දෙවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

3. තවද වහන්ස, මහසයුර මළකුණු හා නො වෙසෙයි. මහසයුරෙහි යම් බඳු මළකුණපයක් වේ නම් එය වහා ම තෙරට පමුණුවයි. (රළ පහරින්) ගොඩ නංවයි. වහන්ස, යම් හෙයෙකින් මහසයුර මළකුණපයන් හා නො වෙසේ ද, මහසයුරෙහි යම්බඳු මළකුණපයෙක් වේ නම් ඒ වහා ම තෙරට පමුණුවා ද, ගොඩ නංවා ද, වහන්ස, අසුරයෝ මහමුහුදෙහි යමක් පුනපුනා දක සිත් අලවා වෙසෙත් නම් මේ මහසයුරෙහි තෙවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

4. පුනචපරං භන්තෙ, යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී, තා මහා සමුද්දං පත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. යම්පි භන්තෙ, යා කාචි මහා නදියො, සෙය්‍යථීදං ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී තා මහාසමුද්දං පත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. අයං භන්තෙ මහාසමුද්දෙ චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො, යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

5. පුනචපරං භන්තෙ, යා ච[1] ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති, යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති, න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති, යම්පි භන්තෙ, යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති, යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති, න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති, අයං භන්තෙ, මහාසමුද්දෙ පඤ්චමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහා සමුද්දෙ අභිරමන්ති.

6. පුනචපරං භන්තෙ, මහාසමුද්දො එකරසො ලොණරසො, යම්පි භන්තෙ, මහාසමුද්දො එකරසො ලොණරසො, අයං භන්තෙ, මහා සමුද්දෙ ඡට්ඨො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

7. පුනචපරං භන්තෙ, මහාසමුද්දො බහුරතනො අනෙකරතනො[2]. තත්‍රිමානි රතනානි, සෙය්‍යථීදං: මුත්තා. මණි, වෙළුරියො, සඞ්ඛො, සිලා, පවාළං, රජතං, ජාතරූපං, ලොහිතඞ්කො, මසාරගල්ලං, යම්පි භන්තෙ, මහා සමුද්දො බහුරතනො අනෙකරතනො. තත්‍රිමානි රතනානි, සෙය්‍යථීදං: මුත්තා, මණි, වෙළුරියො, සඞ්ඛො, සිලා, පවාළං, රජතං, ජාතරූපං, ලොහිතඞ්කො, මසාරගල්ලං, අයං භන්තෙ, මහාසමුද්දෙ සත්තමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

8. පුනචපරං භන්තෙ, මහාසමුද්දො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: තිමී තිමිඞ්ගලා තිමිරපිඞ්ගලා[3], අසුරා, නාගා, ගන්ධබ්බා. සන්ති මහා සමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා, ද්වියොජනසතිකාපි අත්තභාවා, තියොජනසතිකාපි අත්තභාවා, චතුයොජනසතිකාපි අත්තභාවා, පඤ්චයොජනසතිකාපි අත්තභාවා.

1. යා කාචි PTS
2. බහුතරතනො – මජසං
3. තිමිඞ්ගලො – තිමිරපිඞ්ගලො – මජසං

4. තවද වහන්ස, යම් කිසි මහානදීහු වෙත්ද, එනම්: ගඞ්ගා ය, යමුනා ය, අචිරවතී ය, සරභූ ය, මහී ය කියායි. ඔහු මහසයුරට පැමිණ පළමු නම් ගොත් හැරලත්. මහාසමුද්‍රය යි ම සඞ්ඛ්‍යාවට යෙති. වහන්ස, යම් හෙයෙකින් ගඞ්ගා ය, යමුනා ය, අචිරවතී ය, සරභූ ය, මහී ය යන යම්බඳු මහානදීහු වෙත් නම් ඔහු මහසයුරට පැමිණ පළමු නම් ගොත් හැරලත් ද, මහාසමුද්‍රයයි ම සඞ්ඛ්‍යාවට යෙත් ද, වහන්ස, යම් හෙයෙකින් අසුරයෝ යමක් පුනපුනා දක්මින් මහාසමුද්‍රයෙහි අභිරමණය කෙරෙත් නම් මේ සිවුවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

5. තවද වහන්ස, ලොවිහි යම්බඳු(කුදුමහත්)නදීහු මහමුහුදට වැද ගනිත්ද, අහසින් යම්බඳු වෘෂ්ටිධාරාවෝ වැටෙත්ද, ඉන් මහසයුරෙහි උනුබවෙක් වේවයි පිරුණුබවෙක් වේවයි නො පැනේ. වහන්ස, යම් හෙයෙකින් ලොවිහි යම්බඳු කුදුමහත් නදීහු මහමුහුදට වැදගනිත් නම් අහසින් යම්බඳු වෘෂ්ටිධාරාවෝ හෙත් නම් ඉන් මහසයුරුහුගේ උනුබවෙක් වේවයි පිරුණු බවෙක් වේවයි නො පැනේ ද, වහන්ස, යමක් පුනපුනා දක අසුරයෝ මහමුහුදෙහි අභිරමණය කෙරෙත් නම් මහසයුරෙහි මේ පස්වන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

6. තවද වහන්ස, මහසයුර එක ම රය ඇතියේ ලුණුරස ඇතියේ වෙයි. වහන්ස, යම් හෙයෙකින් ඒකරස වූ මහසයුර ලුණුරස ඇතියේ වේ ද, වහන්ස, අසුරයෝ යමක් පුනපුනා දක මහසයුරෙහි අභිරමණය කෙරෙත් නම් මහසයුරෙහි මෙ සවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

7. තවද වහන්ස, මහාසමුද්‍රය බොහෝ රුවන් ඇතියේ නන් රුවන් ඇතියේ වෙයි. එහිලා මේ රත්නයෝ යි. එනම්: මුතු ය, මිණි ය, වෙරළුමිණි ය, සක් ය, ශිලා ය, පබළු ය, රිදී ය, රන් ය, පියුම්රා ය, මැසිරිගල් ය යන මොහු යි. වහන්ස, යම් හෙයෙකින් මහා සමුද්‍රය බහුරත්න වූයේ අනෙකවිධ රත්න ඇති වේ ද, එහිලා මේ රත්නයෝයි. එනම්: මුතු ය, මිණි ය, වෙරළු ය, සක් ය, ශිලා ය, පබළු ය, රිදී ය, රුවන් ය, පියුම්රා ය, මැසිරිගල් ය යන මොහුයි. වහන්ස, යමක් පුනපුනා දක අසුරයෝ මහමුහුදෙහි අභිරමණය කෙරෙත් නම් මෙ සත්වන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

8. තවද වහන්ස, මහමුහුද මහසත්නට ආවාස වෙයි. එහි මෙ සත්හුය; තිමිය, තිමිඞ්ගල ය, තිමිරපිඞ්ගල ය, අසුරයෝ ය, නාගයෝ ය, ගන්ධර්වයෝ ය යන මොහු යි. මහමුහුදෙහි සියක් යොදුන් ඇති ආත්මභාවයෝ ද දෙසිය යොදුන් ආත්මභාවයෝ ද තෙසිය යොදුන් ආත්මභාවයෝ ද සිවුසිය-යොදුන් ආත්මභාවයෝ ද පන්සියයොදුන් ආත්මභාවයෝ ද වෙති.

යම්පි භන්තෙ, මහාසමුද්දො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා: තිමි, තිමිඞ්ගලා තිමිරපිඞ්ගලා, අසුරා, නාගා ගන්ධබ්බා. සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා, ද්වියොජන-පෙ-තියොජන-පෙ-චතුයොජන-පෙ-පඤ්චයොජන සතිකාපි අත්තභාවා,අයං භන්තෙ, මහාසමුද්දෙ අට්ඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

ඉමෙ ඛො භන්තෙ, මහාසමුද්දෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්තීති.

අපි පන භන්තෙ, භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්තීති ?

අභිරමන්ති පහාරාද, භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙති.

කති පන භන්තෙ, ඉමස්මිං ධම්මවිනයෙ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්තීති,?

අට්ඨ පහාරාද ඉමස්මිං ධම්මවිනයෙ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති. කතමෙ අට්ඨ:

1. සෙය්‍යථාපි පහාරාද මහාසමුද්දො අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො. එවමෙව ඛො පහාරාද ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා.

න ආයතකෙනෙව අඤ්ඤාපටිවෙධො. යම්පි පහාරාද, ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බ සික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපද න ආයතකෙනෙව අඤ්ඤාපටිවෙධො. අයං පහාරාද, ඉමස්මිං ධම්මවිනයෙ පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

2. සෙය්‍යථාපි පහාරාද, මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති, එවමෙව ඛො පහාරාද, යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති. යම්පි පහාරාද, මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති. අයං පහාරාද, ඉමස්මිං ධම්මවිනයෙ දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා, භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

වහන්ස, යම්හෙයකින් මහමුහුද මහත් වූ සත්නට ආවාස වේ නම් - එහි ලා තිමි ය තිමිඞගල ය තිමිරපිඞගල ය අසුර ය නාග ය ගන්ධර්ව ය යන මේ සත්හු වෙති. මහමුහුදෙහි සියක් යොදුන් ආත්මභාවයෝ ද දෙසිය යොදුන් ... තෙසිය යොදුන් ... සිවුසිය යොදුන් ... පන්සිය යොදුන් ආත්මභාවයෝ ද වෙත්. වහන්ස, අසුරයෝ යමක් දුන පුනා දක මහමුහුදෙහි අභිරමණය කෙරෙත් නම් මහමුහුදෙහි මෙ අටවැනි ආශ්චර්ය අද්භූත ධර්මය යි.

වහන්ස, අසුරයෝ මහමුහුදෙහි යම් කිසිවකුත් දුන පුනා දක අභිරමණය කෙරෙත් නම් මහසමුදුරෙහි මේ අෂ්ට ආශ්චර්ය අද්භූත ධර්මයෝ වෙති.

වහන්ස, භික්ෂූහු මේ ධර්මවිනයෙහි සිත් අලවා වෙසෙත්දැයි ?

පහාරාදය, භික්ෂූහු මෙ ධර්මවිනයෙහි සිත් අලවා වෙසෙතියි.

වහන්ස, යම් ආශ්චර්ය කෙනකුත් පුන පුනා දක භික්ෂූහු මේ ධර්මවිනයෙහි අභිරමණය කෙරෙත් නම් ඒ ආශ්චර්ය අද්භූත ධර්මයෝ කෙතෙක් දැ යි ?

පහාරාදය, යම් ආශ්චර්ය කෙනකුත් පුන පුනා දක මේ ධර්මවිනයෙහි භික්ෂූහු අභිරමණය කෙරෙත් නම් එබඳු අෂ්ට ආශ්චර්ය අද්භූතධර්ම කෙනෙක් මේ ධර්මවිනයෙහි වෙති. කවර අටෙක යත්:

1. පහාරාදය, යම්සේ මහසයුර අනුපූර්වනිම්න ද, අනුපූර්වප්‍රවණ ද, අනුපූර්වප්‍රාග්භාර ද, ආදියෙහි ම නො ගැඹුරු වේ ද, පහාරාදය, එසෙයින් ම මේ ධර්මවිනයෙහි අනුපූර්වශික්ෂා වෙයි. අනුපූර්වක්‍රියා වෙයි. අනුපූර්ව ප්‍රතිපත් වෙයි. ආදියෙහි ම අර්හත්ත්ව ප්‍රතිවෙධය නො වේ. පහාරාදය, යම් හෙයෙකින් මේ ධර්මවිනයෙහි අනුපූර්වශික්ෂා වේ ද, අනුපූර්වක්‍රියා වේ ද, අනුපූර්ව ප්‍රතිපත් වේ ද, ආදියෙහි ම අර්හත්ත්ව ප්‍රතිවෙධ නො වේ ද, පහාරාදය, මේ ධර්මවිනයෙහි භික්ෂූහු යමක් දුන පුනා දක අභිරමණය කෙරෙත් නම් මේ ධර්මවිනයෙහි මෙ පළමු වන ආශ්චර්ය අද්භූත ධර්මය යි.

2. පහාරාදය, යම්පරිදි මහාසමුද්‍රය ස්ථිත ධර්ම වූයේ වෙලාතික්‍රම නො කෙරේ ද, පහාරාදය, එපරිදි ම ම විසින් සව්වනට යම් සිකපදයෙක් පනවන ලද නම් එය මාගේ සව්වෝ දිවි හෙයිනුදු නො ඉක්මවත්. පහාරාදය, යම් හෙයෙකින් මා විසින් පනවන ලද ඒ සිකපදය මාගේ සව්වෝ දිවි හෙයිනුදු නො ඉක්මවත් නම් පහාරාදය, යම් ආශ්චර්යයක් පුන පුනා දක භික්ෂූහු මේ ධර්මවිනයෙහි අභිරමණය කෙරෙත් ද, මෙ ධර්මවිනයෙහි මෙ දෙවන ආශ්චර්ය අද්භූත ධර්මය යි.

3. සෙය්‍යථාපි පහාරාද මහාසමුද්දො න මතෙන කුණපෙන සංවසති. යං හොති මහාසමුද්දෙ මතං කුණපං තං ඛිප්පඤ්ඤෙව[1] තීරං වාහෙති, ථලං උස්සාදෙති.[2] එවමෙව ඛො පහාරාද, යො සො පුග්ගලො දුස්සීලො පාපධම්මො අසුචිසඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො. අන්තොපූති අවස්සුතො කසම්බුජාතො. න තෙන සඞ්ඝො සංවසති. අථ ඛො නං ඛිප්පඤ්ඤෙව[3] සන්නිපතිත්වා උක්ඛිපති. කිඤ්චාපි සො හොති මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නො.[4] අථ ඛො සො ආරකාව සඞ්ඝම්හා සඞ්ඝො ච තෙන. යම්පි පහාරාද යොසො පුග්ගලො දුස්සීලො පාපධම්මො අසුචි සඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො, න තෙන සඞ්ඝො සංවසති. අථ ඛො නං ඛිප්පඤ්ඤෙව සන්නිපතිත්වා උක්ඛිපති. කිඤ්චාපි සො හොති මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නො[4] අථ ඛො සො ආරකාව සඞ්ඝම්හා සඞ්ඝො ච තෙන. අයං පහාරාද ඉමස්මිං ධම්මවිනයෙ තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

4. සෙය්‍යථාපි පහාරාද, යා කාචි මහා නදියො, සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී, තා මහාසමුද්දං පත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, මහාසමුද්දොත්වෙව සඞ්ඛං ගච්ඡන්ති එවමෙව ඛො පහාරාද, චත්තාරොමෙ වණ්ණා, ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා, තෙ තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, 'සමණා සක්‍යපුත්තියා' ත්වෙව සඞ්ඛං ගච්ඡන්ති, යම්පි පහාරාද චත්තාරොමෙ වණ්ණා ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා. තෙ තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, 'සමණා සක්‍යපුත්තියා ත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. අයං පහාරාද, ඉමස්මිං ධම්මවිනයෙ චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

1. ඛිප්පමෙව – මජ්සං
2. උස්සාරෙති – මජ්සං
3. ඛිප්පමෙව නං – මජ්සං
4. සන්නිසින්නො – මජ්සං

3. පහාරාදය, යම්පරිදි මහමුහුද මළකුණු හා නො වෙසේ ද, මහමුහුදෙහි යම් මළකුණපයෙක් වේ නම් එය වහා ම තෙරට පමුණුවා ද, ගොඩ නංවා ද, එපරිදි ම පහාරාදය, යම් මේ පුහුලෙක් දුශ්ශීල වූයේ ලමු දහම් ඇතියේ අපවිත්‍ර කායකර්මාදියෙන් යුක්ත වූයේ සැකකටයුතු හැසිරීම් ඇතියේ පිළිසන් කම් ඇතියේ අශ්‍රමණ වූයේ ශ්‍රමණයෙක්මි යන පිළිණ ඇතියේ අබ්‍රම්සර ඇතියේ බ්‍රහ්මචාරීයෙක් මැයි ප්‍රතිඥ ඇතියේ ඇතුළත කුණු වූයේ කෙලෙසුන් විසින් තෙත් වූයේ හටගත් කෙලෙස් මඩ ඇතියේ වේ නම් ඔහු හා සඞ්ඝ තෙමේ සංවාස නො කරයි. වැලිත් වහා ම ඔහු රැස් ව උත්ක්ෂෙප (ඔසවාදැමීම) කෙරෙයි. හේ බික්සඟුන් මැද හුන්නේ නමුදු වැලිත් හේ සඟුන්ගෙන් දුරු වූයේ ම වෙයි. සඞ්ඝ තෙමේ ද ඕහු කෙරෙන් දුරු වූයේ වෙයි. පහාරාදය, යම් හෙයෙකින් යම් ඒ දුහුලෙක් දුස්සීල වූයේ ලමු දහම් ඇතියේ අශෞචයෙන් යුතු වූයේ සැක කටයුතු හැසිරීම් ඇතියේ පිළිසන් කම් ඇතියේ අශ්‍රමණ වූයේ ශ්‍රමණයෙක්මි යන ප්‍රතිඥ ඇතියේ අබ්‍රම්සැරි වූයේ බඹසැරිමි යන පිළිණ ඇතියේ ඇතුළත කුණු වූයේ කෙලෙසුන්ගෙන් තෙත් වූයේ හටගත් කෙලෙස් මඩ ඇතියේ වේ ද, සඞ්ඝ තෙමේ ඔහු හා සංවාස නො කෙරෙයි. වැලිත් වහා රැස්ව ඔහු උත්ක්ෂේප කෙරෙයි. හේ බික්සඟුන් මැද හුන්නේ නමුදු වැලිත් හේ සඟුන් කෙරෙන් දුරු වූයේ ම වෙයි. සඞ්ඝ තෙමේ ද ඔහුගෙන් දුරු වූයේ වේ. පහාරාදය යම් ආශ්වය‍ර්යක් පුනපුනා දක භික්ෂූහු මේ ධර්මවිනයෙහි අභිරමණය කෙරෙත් නම් මේ ධර්මවිනයෙහි මෙ තෙවන ආශ්වය‍ර් අද්භූත ධර්මය යි.

4. පහාරාදය, යම් පරිදි යම් කිසි මහානදීහු වෙද්ද, එනම්: ගඞ්ගා ය, යමුනා ය, අචිරවතී ය, සරභූ ය, මහී ය යන මොහු යි. ඔහු මහමුහුදට පැමිණ පළමු නම් ගොත් හරිත් ද, මහමුහුදැයි කියා ම සඞ්ඛ්‍යාවට යෙත් ද, පහාරාදය, එපරිදි ම ක්ෂත්‍රියයහ, බ්‍රාහ්මණයහ, වෛශ්‍යයහ, ශුද්‍රයහයි මේ චතුර්වර්ණයෝ වෙත් නම් ඕහු තථාගත ප්‍රවිදිත වූ ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරියබවට පැමිණ පළමු නම් ගොත් හැරලත්. ශ්‍රමණශාක්‍යපුත්‍රියහ යන සඞ්ඛ්‍යාවට ම යෙත්. පහාරාදය, යම් හෙයෙකින් ක්ෂත්‍රියහ, බ්‍රාහ්මණයහ, වෛශ්‍යයහ, ශුද්‍රයහ යි මේ චතුර්වර්ණයෝ වෙත් නම් ඔහු තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරියභාවයට පැමිණ පළමු නම් ගොත් හැරලත් ද ශ්‍රමණ ශාක්‍යපුත්‍රියහ යි කියා ම සඞ්ඛ්‍යාවට යෙත් ද, පහාරාදය, භික්ෂූහු යම් ආශ්වය‍ර්යක් පුනපුනා දක මේ ධර්මවිනයෙහි අභිරමණය කෙරෙත් නම් මේ ධර්මවිනයෙහි මෙ සිවුවන ආශ්වය‍ර් අද්භූත ධර්මය යි.

5. සෙය්‍යථාපි පහාරාද, යා ච ලොකෙ සවන්තියො මහාසමුද්දං අප්පෙන්ති යා ච අන්තලික්ඛා ධාරා පපතන්ති. න තෙන මහාසමුද්දස්ස ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති එවමෙව ඛො පහාරාද, බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති. න තෙන නිබ්බානධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. යම්පි පහාරාද, බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති, න තෙන නිබ්බානධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. අයං පහාරාද, ඉමස්මිං ධම්මවිනයෙ පඤ්චමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

6. සෙය්‍යථාපි පහාරාද, මහාසමුද්දො එකරසො ලොණරසො, එවමෙව ඛො පහාරාද, අයං ධම්මවිනයො එකරසො විමුත්තිරසො, යම්පි පහාරාද, අයං ධම්මවිනයො එකරසො විමුත්තිරසො, අයං පහාරාද ඉමස්මිං ධම්මවිනයෙ ඡට්ඨො අච්ඡරියො අබ්භුතො ධම්මො, යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

7. සෙය්‍යථාපි පහාරාද, මහාසමුද්දො බහුරතනො අනෙකරතනො, තත්‍රිමානි රතනානි, සෙය්‍යථීදං, මුත්තා මණි වෙළුරියො සඞ්ඛො සිලා පවාළං රජතං ජාතරූපං ලොහිතඞ්කො මසාරගල්ලං. එවමෙව ඛො පහාරාද, අයං ධම්මවිනයො බහුරතනො අනෙක රතනො, තත්‍රිමානි රතනානි: සෙය්‍යථීදං; චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාද පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. යම්පි පහාරාද, අයං ධම්මවිනයො බහුරතනො අනෙකරතනො, තත්‍රිමානි රතනානි සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාද පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. අයං පහාරාද, ඉමස්මිං ධම්මවිනයෙ සත්තමො අච්ඡරියො අබ්භුතො ධම්මො, යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

8. සෙය්‍යථාපි පහාරාද මහාසමුද්දො මහතං භූතානං ආවාසො, තත්‍රිමෙ භූතා: තිමි තිමිඞ්ගලා තිමිරපිඞ්ගලා අසුරා නාගා ගන්ධබ්බා, සන්ති මහා සමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා, ද්වියොජනසතිකාපි අත්තභාවා, තියොජනසතිකාපි අත්තභාවා, චතුයොජනසතිකාපි අත්තභාවා, පඤ්චයොජනසතිකාපි අත්තභාවා.

5. පහාරාදය, යම් පරිදි ලොවෙහි යම් නදී කෙනෙක් මහසයුරට වැදගනිත් ද, යම් වෘෂ්ටිධාරාකෙනෙක් අහසින් ඇද හැලෙත් ද, එයින් මහසයුරුහුගේ උනුබවෙක් වේවයි පිරුණුබවෙක් වේවයි නො පැනේ ද. පහාරාදය, එපරිදි ම බොහෝ භික්ෂූහු අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙත් නමුදු එයින් නිර්වාණධාතුහුගේ උනුබවෙක් වේවයි පිරුණුබවෙක් වේවයි නො පැනේ. පහාරාදය, යම් කරුණකින් බොහෝ වූත් භික්ෂූහු අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙත් නමුදු එයින් නිර්වාණ ධාතුහුගේ උනුබවෙක් වේවයි පිරුණුබවෙක් වේවයි නො පැනේ ද, පහාරාදය, මේ ධර්මවිනයෙහි භික්ෂූහු යම් ආශ්චර්‍ය්‍යයක් පුනපුනා දක අභිරමණය කෙරෙත් නම් මේ ධර්මවිනයෙහි මෙ පස් වන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

6. පහාරාදය, යම් පරිදි ඒකරස වූ මහාසමුද්‍රය ලුණු රස ඇතියේ ද එපරිදි ම පහාරාදය, ඒකරස වූ මේ ධර්මවිනය විමුක්තිරස ඇතියේ වෙයි. පහාරාදය, යම් හෙයෙකින් ඒකරස වූ මේ ධර්මවිනය විමුක්තිරස ඇතියේ වේ ද, පහාරාදය, මේ ධර්මවිනයෙහි භික්ෂූහු යම් ආශ්චර්‍ය්‍යයක් පුනපුනා දක අභිරමණය කෙරෙත් නම් මේ ධර්මවිනයෙහි මෙ සවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

7. පහාරාදය, යම් පරිදි මහමුහුද බහුරත්න වූයේ නන් රුවන් ඇතියේ වේ ද, එහි මේ රත්නයෝ වෙති. එනම්: මුතු ය, මිණි ය, වෙරළුමිණි ය, සක් ය, ශිලා ය, පබළු ය, රිදී ය, රන් ය, පියුම්රා මිණි ය, මැසිරිගල් ය, යන මොහු යි. පහාරාදය, එපරිදි ම මේ ධර්මවිනය බහුරත්න වූයේ නන් රුවන් ඇතියේ ය. එහි මෙ රත්නයෝ වෙති; එනම්: සතර සතිපට්ඨාන ය, සතර සම්‍යක්ප්‍රධාන ය, සතර ඍද්ධිපාද ය, පඤ්චෙන්ද්‍රිය ය, පඤ්ච බල ය, සප්ත බොධ්‍යඞ්ග ය, අරිඅටඟිමග යි. පහාරාදය, යම් හෙයෙකින් මේ ධර්මවිනය බහුරත්න වූයේ නන් රුවන් ඇතියේ වේ නම් එහි මෙ රත්නයෝ වෙති: එනම්: සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධානය, සතර ඍද්ධිපාදය, පඤ්චෙන්ද්‍රියහ, පඤ්ච බලය. සප්ත බොධ්‍යඞ්ගය, අරිඅටඟිමග යි. පහාරාදය, මේ ධර්මවිනයෙහි යම් ආශ්චර්‍ය්‍යයක් පුනපුනා දක භික්ෂූහු අභිරමණය කෙරෙත් නම් මේ ධර්මවිනයෙහි මෙ සත්වන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

8. පහාරාදය, යම් පරිදි මහමුහුද මහත් වූ සත්නට ආවාස වේ ද, එහි තිමි ය, තිමිඞ්ගල ය, තිමිර ඞ්ගල ය, අසුර ය, නාග ය, ගන්ධර්ව ය යන මේ මහසත්හු වෙති. මහසමුදුරෙහි සියක් යොදුන් ආත්මභාවයෝ ද දෙසියක් යොදුන් ආත්මභාවයෝ ද තෙසියක් යොදුන් ආත්මභාවයෝ ද, සිවුසියක් යොදුන් ආත්මභාවයෝ ද පන්සියක් යොදුන් ආත්මභාවයෝ ද වෙත්.

එවමෙව ඛො පහාරාද, අයං ධම්මවිනයො මහතං භූතානං ආවාසො තත්‍රිමෙ භූතා: සොතාපන්නා, සොතාපත්ති ඵලසච්ඡිකිරියාය පටිපන්නා, සකදාගාමී, සකදාගාමි ඵලසච්ඡිකිරියාය පටිපන්නා, අනාගාමී, අනාගාමි ඵලසච්ඡිකිරියාය පටිපන්නා, අරහා, අරහත්තාය පටිපන්නා. යම්පි පහාරාද, අයං ධම්මවිනයො මහතං භූතානං ආවාසො, තත්‍රිමෙ භූතා, සොතාපන්නා, සොතාපත්ති ඵලසච්ඡිකිරියාය පටිපන්නා, සකදාගාමී, සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නා, අනාගාමී, අනාගාමි ඵලසච්ඡිකිරියාය පටිපන්නා, අරහා, අරහත්තාය පටිපන්නා, අයං පහාරාද ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා භික්ඛු ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති.

ඉමෙ ඛො පහාරාද, ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා භික්ඛු ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්තීති.

## 8. 1. 2. 10

## උපොසථ සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ භික්ඛුසඞ්ඝ පරිවුතො නිසින්නො හොති. අථ ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පඨමෙ යාමෙ උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච:

අභික්කන්තා භන්තෙ රත්ති නික්ඛන්තො පඨමො යාමො චිරනිසින්නො භික්ඛුසඞ්ඝො, උද්දිසතු භන්තෙ භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි. දුතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ මජ්ඣිමෙ යාමෙ උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච:

පහාරාදය, එපරිදි ම මේ ධර්මවිනය මහත් වූ භූතයන්ගේ ආවාසයෙක. එහි මේ භූතයෝ වෙති: සෝවන් ය, සෝවන් ඵල පසක් කිරීමට පිළිපන්නේ ය. සකදගාමී ය, සකදගාමී ඵල පසක් කිරීමට පිළිපන්නේ ය. අනාගාමී ය, අනාගාමී ඵල පසක් කිරීමට පිළිපන්නේ ය. අර්හත් ය, අර්හත්ඵල පසක් කිරීමට පිළිපන්නේ ය කියායි. පහාරාදය, යම් හෙයෙකින් මේ ධර්මවිනය මහත් වූ භූතයනට ආවාස වේ නම් එහි සෝවන් ය. සෝවන් ඵල පසක් කිරීමට පිළිපන්නේ ය, සකදගාමී ය සකදගාමීඵල පසක් කිරීමට පිළිපන්නේ ය. අනාගාමී ය, අනාගාමීඵල පසක් කිරීමට පළිපන්නේ ය. අර්හත් ය, අර්හත්ඵල පසක් කිරීමට පිළිපන්නේ ය යි මේ භූතයෝ වෙති. පහාරාදය, මේ ධර්මවිනයෙහි යම් ආශ්චර්‍ය්‍යයක් පුනපුනා දක භික්ෂූහු අභිරමණය කෙරෙත් නම් මේ ධර්මවිනයෙහි මෙ අටවැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි.

පහාරාදය, භික්ෂූහු යම් ධර්ම කෙනකුන් දක දක මේ ශාසනයෙහි සිත් අලවා වෙසෙත් නම්, මේ ශාසනයෙහි මේ අටවැදෑරුම් ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ වෙත් යයි.

## 8. 1. 2. 10

## උපෝසථ සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවත්නුවර පූර්වාරාම නම් මිගාරමාතෘප්‍රාසාදයෙහි වැඩ වසන සේක. එ සමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ පොහෝ ලත් එ දවස භික්ෂූන් පිරිවරා වැඩ හුන්නාහු වෙති. එ කල ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ ඉකුත් බොහෝ කල් ඇති රාත්‍රියෙහි පළමු යම ඉකුත් කල්හි හුනස්නෙන් නැඟී උතුරුසඟ එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇදිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය:

වහන්ස, රෑ ඉක්ම ගිය බොහෝ කල් ඇත, පළමු යම නික්ම ගියේ ය, භික්ෂූහු හුන් බොහෝ කල් ඇත්තාහු වෙති. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මහණුන්ට පාමොක් උදෙසන සේක්ව යි. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූත වූ සේක. දෙවන වටත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ ඉක්ම ගිය බොහෝ කල් ඇති රාත්‍රියෙහි මැදුම් යම ඉකුත් කල්හි හුනස්නෙන් නැඟී උතුරුසඟ එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇදිලි බැඳ භගවතුන් හට මෙය සැළකෙළේ ය:

අභික්කන්තා භන්තෙ, රත්ති නික්ඛන්තො මජ්ඣිමො යාමො, චිරනිසින්නො භික්ඛුසඞ්ඝො, උද්දිසතු භන්තෙ, භගවා භික්ඛූනං 'පාතිමොක්ඛන්ති, දුතියම්පි ඛො භගවා තුණ්හී අහොසි, තතියම්පි ඛො ආයස්මා ආනන්දො අභික්කන්තාය රත්තියා නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ උද්ධස්තෙ අරුණෙ නන්දිමුඛියා රත්තියා උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: ''අභික්කන්තා භන්තෙ, රත්ති, නික්ඛන්තො පච්ඡිමො යාමො උද්ධස්තං අරුණං නන්දිමුඛී රත්ති, චිරනිසින්නො භික්ඛුසඞ්ඝො, උද්දිසතු භන්තෙ, භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති,

අපරිසුද්ධා ආනන්ද පරිසාති. අථ ඛො ආයස්මතො මොග්ගල්ලානස්ස එතදහොසි: කං නු ඛො භගවා පුග්ගලං සන්ධාය එවමාහ: 'අපරිසුද්ධා ආනන්ද පරිසා'ති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සබ්බාවන්තං භික්ඛුසඞ්ඝං චෙතසා චෙතො පරිච්ච මනසාකාසි.

අද්දසා ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං දුස්සීලං පාපධම්මං අසුචිං සඞ්කස්සරසමාචාරං පටිච්ඡන්නකම්මන්තං අස්සමණං සමණපටිඤ්ඤං අබ්‍රහ්මචාරිං බ්‍රහ්මචාරිපටිඤ්ඤං අන්තොපූතිං අවස්සුතං කසම්බුජාතං මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස නිසින්නං, දිස්වාන උට්ඨායාසනා යෙන සො පුග්ගලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං පුග්ගලං එතදවොච: උට්ඨෙහි ආවුසො[1] දිට්ඨොසි භගවතා, නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසොති.

එවං වුත්තෙ සො පුග්ගලො තුණ්හී අහොසි. දුතියම්පි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං එතදවොච: උට්ඨෙහි ආවුසො,[1] දිට්ඨොසි භගවතා, නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසොති. දුතියම්පි ඛො සො පුග්ගලො තුණ්හී අහොසි. තතියම්පි ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං එතදවොච: උට්ඨෙහි ආවුසො, දිට්ඨොසි භගවතා, නත්ථි තෙ භික්ඛූහි සද්ධිං සංවාසොති, තතියම්පි ඛො සො පුග්ගලො තුණ්හී අහොසි.

අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො තං පුග්ගලං බාහායං ගහෙත්වා බහිද්වාරකොට්ඨකා නික්ඛාමෙත්වා සූචිඝටිකං දත්වා යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච:

1. උට්ඨෙහාවුසො – මජ්සං.

වහන්ස, රෑ ඉකුත් බොහෝ කල් ඇත, මැදුම් යම නික්ම ගියේ ය, බික්සඟහු හුන් බොහෝ කල් ඇත්තාහු වෙති, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මහණුන්ට පාමොක් උදෙසන සේක්වා යි, භාග්‍යවතුන් වහන්සේ දෙවන වටත් තුෂ්ණීම්භූත වූ සේක. තෙවන වට ද ඇවත් ආනන්ද තෙර ඉකුත් බොහෝ කල් ඇති රැයෙහි පැසුළු යම ඉක්ම ගිය කල්හි අරුණ නැඟි කල්හි රැය පහන්වූ කල්හි හුනස්නෙන් නැඟී උතුරුසඟ එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ වහන්ස, රාත්‍රි තොමෝ ඉකුත් බොහෝ කල් ඇත්තී ය. පැසුළු යම ඉක්ම ගියේ ය. අරුණ නැංගේ ය. රාත්‍රි තොමෝ නන්දිමුඛී වෙයි, බික්සඟහු හුන් බොහෝ කල් ඇත්තා හ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මහණුන්ට පාමොක් උදෙසන සේක්ව යි, මෙය සැලකෙළේ ය,

ආනන්දය, පිරිස අපිරිසුදු ය යි (වදාළහ.) එ කල්හි ආයුෂ්මත් මහ මුගලන් තෙරුනට මේ සිත විය: කවර නම් පුහුලකු සඳහා භාග්‍යවතුන් වහන්සේ ආනන්දය, පිරිස 'අපිරිසිදු ය යි මෙසේ වදාළ සේක් දැයි. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ සිය සිතින් හැම බික්සඟුන් සිතින් සිත පිරිසිඳ බලා මෙනෙහි කළහ.

ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ දුසිල් වූ ලමු දහම් ඇති අපවිත්‍ර කම් ඇති සැකයෙන් සිහි කටයුතු හැසිරීම් ඇති පිළිසන්කම් ඇති අශ්‍රමණ වූ ශ්‍රමණයෙමියි කරන ප්‍රතිඥා ඇති අබ්‍රම්සැරි වූ බඹසැරිමි සන පිළිණ ඇති ඇතුළත කුණු වූ කෙලෙසින් තෙත් වූ උපන් කෙලෙස් මඩ ඇති බික්සඟුන් මැද හුන් ඒ පුහුලා දුටහ. දැක හුනස්නෙන් නැඟී ඒ පුහුල් වෙත එළඹියහ. එළඹ ඒ පුහුල්හට මෙය කීහ; "ඇවැත්නි, නැඟී සිටුව, භාග්‍යවතුන් විසින් දක්නා ලද්දෙහි, තට මහණුන් හා සංවාසයෙක් නැතැ''යි.

මෙසේ කී කල්හි ඒ පුද්ගල තුෂ්ණීම්භූත විය, දෙවන වටත් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ එ පුහුල්හට මෙය කීහ. "ඇවැත්නි, නැඟී සිටුව, භාග්‍යවතුන් විසින් දක්නා ලද්දෙහි, තට මහණුන් හා සංවාසයෙක් නැතැ''යි දෙවන වටත් එ පුහුල් තුෂ්ණීම්භූත, විය. තෙවන වටත් ආයුෂ්මත් මහ මුගලන් තෙරණුවෝ එ පුහුල් හට මෙය කීහ: "ඇවැත්නි, නැගී සිටුව, භාග්‍යවතුන් විසින් දක්නා ලද්දෙහි''. තට මහණුන් හා සංවාසයෙක් නැතැයි. තෙවන වටත් එ පුහුල් තුෂ්ණීම්භූත විය.

එකල ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ එ පුහුල්හු බාහුයෙහි ගෙන බිහිදොර කොටුවෙන් නෙරා දෙරගුළු දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹිය හ, එළඹ භාග්‍යවතුනට මෙය සැළකළහ:

නික්ඛාමිතො සො භන්තෙ පුග්ගලො මයා, පරිසුද්ධා පරිසා, උද්දිසතු භන්තෙ භගවා භික්ඛූනං පාතිමොක්ඛන්ති.

අච්ඡරියං මොග්ගල්ලාන, අබ්භුතං මොග්ගල්ලාන, යාව බාහා ගහණාපි නාම සො මොඝපුරිසො ආගමෙස්සතීති[1] අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි තුම්හෙවදානි භික්ඛවෙ, උපොසථං,[2] කරෙය්‍යාථ. පාතිමොක්ඛං උද්දිසෙය්‍යාථ. නදානාහං භික්ඛවෙ, අජ්ජතග්ගෙ උපොසථං කරිස්සාමි. පාතිමොක්ඛං උද්දිසිස්සාමි. අට්ඨානමෙතං භික්ඛවෙ, අනවකාසො යං තථාගතො අපරිසුද්ධාය පරිසාය [3]උපොසථං කරෙය්‍ය පාතිමොක්ඛං උද්දිසෙය්‍ය.

අට්ඨිමෙ භික්ඛවෙ, මහාසමුද්දෙ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති. කතමෙ අට්ඨ:

මහාසමුද්දො භික්ඛවෙ, අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො. යම්පි භික්ඛවෙ, මහාසමුද්දො අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො. අයං භික්ඛවෙ, මහාසමුද්දෙ පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහාසමුද්දෙ අභිරමන්ති -පෙ-

පුන ච පරං භික්ඛවෙ, මහාසමුද්දො මහතං භූතානං ආවාසො තත්‍රිමෙ භූතා, තිමි තිමිඞ්ගලා තිමිරපිඞ්ගලා[4] අසුරා නාගා ගන්ධබ්බා, සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි, අත්තභාවා -පෙ- පඤ්චයොජනසතිකාපි අත්තභාවා, යම්පි භික්ඛවෙ, මහා සමුද්දො මහතං භූතානං ආවාසො. තත්‍රිමෙ භූතා, [4]තිමි තිමිඞ්ගලා තිමිරපිඞ්ගලා අසුරා නාගා ගන්ධබ්බා [5]සන්ති මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා -පෙ- පඤ්චයොජනසතිකාපි අත්තභාවා අයං භික්ඛවෙ මහාසමුද්දෙ අට්ඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා අසුරා මහා සමුද්දෙ අභිරමන්ති.

ඉමෙ ඛො භික්ඛවෙ, මහාසමුද්දෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා[6] අසුරා මහාසමුද්දෙ අභිරමන්ති.

---

1. ආගමිස්සතීති – සිමු
2. භික්ඛවෙ ඉතො පරං උපොසථං – වූ
3. උපොසථං කරෙය්‍ය – මජ්ඣං ඌනං
4. තිමි තිමිඞ්ගලො තිමිරපිඞ්ගලො – මජ්ඣං
5. වසන්ති මහාසමුද්දෙ – මජ්ඣං
6. , සං දිස්වා දිස්වා – මජ්ඣං

"වහන්ස, මා විසින් එ පුහුල් තෙම නෙරන ලදුයේ වෙයි. පිරිස් පිරිසිදු ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මහණුන්ට පාමොක් උදෙසන සේක්වා"යි.

"මුගලන, ආශ්චර්ය්‍ය ය. මුගලන, අද්භූත. බාහුයෙන් ගන්නාතාක් ම ඒ මෝසපුරුෂ හුන්නේ"යයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක: "මහණෙනි, දන් තෙපි ම පොහෝ කරවූ. පාමොක් උදෙසවූ, මහණෙනි, අද පටන් කොට මම පොහෝ නො කරන්නෙමි, පාමොක් නො උදසන්නෙමි. මහණෙනි, යම් කරුණෙකින් තථාගත-යෝ අපිරිසිදු පිරිස්හි පොහෝ කරන්නාහ. පාමොක් උදෙසන්නාහ, යන තෙල කරුණ අස්ථාන වෙයි. අවකාශ රහිත වෙ.

මහණෙනි, යම් ආශ්චර්ය්‍ය කෙනකුන් පුන පුනා දක අසුරයෝ අභි-රමණය කෙරෙත් නම් මහසමුදුරෙහි මේ අෂ්ට ආශ්චර්ය්‍ය අද්භූත ධර්ම කෙනෙක් වෙති. කවර අටදෙනෙකයත්:

මහණෙනි, මහසයුර අනුපූර්ව නිම්න යි, අනුපූර්වප්‍රවණ යි, අනුපූර්ව-ප්‍රාග්භාර යි. ආදියෙහි ම ගැඹුරු නො වේ. මහණෙනි, යම් හෙයෙකින් මහසයුර අනුපූර්වනිම්න වේ ද, අනුපූර්වප්‍රවණ වේ ද, අනුපූර්ව ප්‍රාග්භාර වේ ද, ආදියෙහි ම ගැඹුරු නො වේ ද, මහණෙනි, මහමුහුදෙහි යම් ආශ්චර්ය්‍යයක් පුනපුනා දක අසුරයෝ අභිරමණය කෙරෙත් නම් මහමුහු-දෙහි මේ පළමු වන ආශ්චර්ය්‍ය අද්භූත ධර්මය යි ...

තවද මහණෙනි, මහසයුර මහත් වූ සත්නට ආවාස වෙයි. එහි තිමි ය තිමිඞ්ගල ය, තිමිරපිඞ්ගලය, අසුරය, නාගය, ගන්ධර්ව ය යන මොහු මහසත්හු වෙති. මහමුහුදෙහි සියක් යොදුන් ආත්මභාවයෝ ද ... පන්සියක් යොදුන් ආත්මභාවයෝ ද වෙති. මහණෙනි යම්හෙයෙකින් මහ-මුහුද මහසත්නට ආවාස වේ ද, එහි තිමි ය තිමිඞ්ගලය තිමිරපිඞ්ගලය අසුර ය නාග ය ගන්ධර්ව ය යන මේ මහසත්හු වෙත් ද, මහමුහුදෙහි සියක් යොදුන් ආත්මභාවයෝත් ... පන්සියක් යොදුන් ආත්මභාවයෝත් වෙත් ද, මහණෙනි, මහමුහුදෙහි අසුරයෝ යම් ආශ්චර්ය්‍යයක් පුනපුනා දක අභිරමණය කෙරෙත් නම් මහමුහුදෙහි මෙ අට වැනි ආශ්චර්ය්‍ය අද්භූත ධර්මය යි.

මහණෙනි, මහමුහුදෙහි යම් බඳු ආශ්චර්ය්‍යයන් පුනපුනා දක අසුරයෝ අභිරමණය කෙරෙත් නම් මහමුහුදෙහි මේ අටදෙන ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයෝ වෙති.

එවමෙව ඛො භික්ඛවෙ, අට්ඨ ඉමස්මිං ධම්මවිනයෙ අච්ඡරියා අබ්භුතා ධම්මා, යෙ දිස්වා දිස්වා භික්ඛු ඉමස්මිං ධම්ම විනයෙ අභිරමන්ති.

කතමෙ අට්ඨ:

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයතකෙනෙව පපාතො. එවමෙව ඛො භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා න ආයතකෙනෙව අඤ්ඤාපටිවෙධො. යම්පි භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා න ආයතකෙනෙව අඤ්ඤාපටිවෙධො. අයං භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා දිස්වා භික්ඛු ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති -පෙ-

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාසමුද්දො මහතං භූතානං ආවාසො තත්‍රිමෙ භූතා, 'තිමි තිමිඞ්ගලා තිමිරපිඞ්ගලා[1] අසුරා නාගා ගන්ධබ්බා, සන්ති[2] මහාසමුද්දෙ යොජනසතිකාපි අත්තභාවා -පෙ- පඤ්චයොජනසතිකාපි අත්තභාවා. එව මෙව ඛො භික්ඛවෙ, අයං ධම්මවිනයො මහතං භූතානං ආවාසො, තත්‍රිමෙ භූතා, සොතාපන්නො, සොතාපත්ති ඵලසච්ඡිකිරියාය පටිපන්නො. -පෙ- අරහා, අරහත්තාය පටිපන්නො. යම්පි භික්ඛවෙ, අයං ධම්ම විනයො මහතං භූතානං ආවාසො, තත්‍රිමෙ භූතා, සොතාපන්නො සොතාපත්ති ඵලසච්ඡිකිරියාය පටිපන්නො -පෙ- අරහා අරහත්තාය පටිපන්නො. අයං භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො යං දිස්වා භික්ඛු ඉමස්මිං ධම්ම විනයෙ අභිරමන්ති. ඉමෙ ඛො භික්ඛවෙ, ඉමස්මිං ධම්මවිනයෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙ දිස්වා දිස්වා භික්ඛු ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්තීති.

මහාවග්ගො දුතියො.

තත්‍රුද්දානං

වෙරඤ්ජො සීහො ආජඤ්ඤො — ඛලුඞ්කෙන මලානි ච
දූතෙය්‍යං ද්වෙ ච බන්ධනා පහාරාදෙ උපොසථොති,

1. තිමි තිමිඞ්ගලො තිමිරපිඞ්ගලො - මජසං.
2. වසන්ති - මජසං.

මහණෙනි, එපරිදිම මේ ධම්මවිනයෙහි භික්ෂුහු යම් ආශ්චර්‍ය්‍ය කෙනකුන් පුන පුනා දැක අභිරමණය කෙරෙත් නම් මේ ධම්මවිනයෙහි අෂ්ට ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මකෙනෙක් වෙති.

කවර අටදෙනෙක යත්:

මහණෙනි, යම්පරිදි මහමුහුද අනුපූර්ව නිම්න වේ ද, අනුපූර්වප්‍රවණ වේ ද, අනුපූර්වප්‍රාග්භාරවේ ද, ආදියෙහි ම ගැඹුරු නො වේ ද, මහණෙනි, එපරිදිම මේ ධර්මවිනයෙහි අනුපූර්වශික්ෂා වෙයි, අනුපූර්ව ක්‍රියා වෙයි, අනුපූර්ව ප්‍රතිපත්ති වෙයි. ආදියෙහි ම අර්හත්ත්‍වප්‍රතිවේධය නො වේ. මහණෙනි, යම් හෙයෙකින් මේ ධර්මවිනයෙහි අනුපූර්වශික්ෂා වේ ද අනුපූර්වක්‍රියා වේ ද, අනුපූර්වප්‍රතිපත් වේ ද, ආදියෙහි ම අර්හත්ත්‍වප්‍රතිවේධය නො වේ ද, මහණෙනි, මෙ ධර්මවිනයෙහි යම් ආශ්චර්‍ය්‍යයක් පුනපුනා දැක භික්ෂුහු සිත් අලවා වෙසෙත් නම් මේ ධර්මවිනයෙහි මේ පළමුවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය වෙයි ...

මහණෙනි, යම්පරිදි මහමුහුද මහත් සත්නට ආවාස වේ ද, එහි තිමි ය තිමිඞ්ගලය තිමිර පිඞ්ගලය අසුර ය නාග ය ගන්ධර්වය යන මේ මහසත්හු වෙත්. මහමුහුදෙහි සියක් යොදුන් අත්බැව් ද ... පන්සියක් යොදුන් අත්බැව් ද වෙත්. මහණෙනි, එපරිදි ම මේ ධර්මවිනය මහසත්නට ආවාස වෙයි. සෝවන් ය, සොවන්ඵල පසක් කිරීමට පිළිපන්නෝ ය, ... අර්හත්ය, අර්හත්ඵල පසක් කිරීමට පිළිපන්නෝය යන මේ මහසත්හු වෙති. මහණෙනි, යම්හෙයෙකින් මේ ධර්මවිනය මහසත්නට ආවාස වේ ද, එහි සෝවන් ය, සෝවන්ඵල පසක් කිරීමට පිළිපන්නෝ ය ... රහත්ය, රහත් බවට පිළිපන්නෝය යන මේ මහසත්හු වෙත් ද, මහණෙනි, මේ ධර්මවිනයෙහි භික්ෂුහු යම් ආශ්චර්‍ය්‍යයක් පුනපුනා දැක අභිරමණය කෙරෙත් නම් මේ ධර්මවිනයෙහි මේ අටවැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය යි. මහණෙනි, මේ ධර්මවිනයෙහි භික්ෂුහු යම් ආශ්චර්‍ය්‍ය කෙනකුන් පුනපුනා දැක අභිරමණය කෙරෙත් නම් මොහු මේ ධර්මවිනයෙහි අෂ්ට ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ යි.

දෙවැනි මහාවර්ග යි.

එහි උද්දානය:

වෙරඤ්ජසූත්‍රය, සීහ (සෙනාපති) සූත්‍රය, ආජඤ්ඤ සූත්‍රය, ඛලුඞ්කසූත්‍රය, මල සූත්‍රය, දූතෙය්‍ය සූත්‍රය යන ඉත්ථිබන්ධන සූත්‍රය, පුරුසබන්ධන සූත්‍රය, පහාරාද සූත්‍රය, උපොසථසූත්‍රය ද යන දශය යි.

# 3. ගහපතිවග්ගො

## 8. 1. 3. 1

### වෙසාලිකඋග්ග සුත්තං

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

අට්ඨහි භික්ඛවෙ, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං උග්ගං ගහපතිං වෙසාලිකං ධාරෙථාති. ඉදමවොච භගවා, ඉදං වත්වාන සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි. අථ ඛො අඤ්ඤතරො භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන උග්ගස්ස ගහපතිනො වෙසාලිකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි.

උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො උග්ගො ගහපති වෙසාලිකො යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො උග්ගං ගහපතිං වෙසාලිකං සො භික්ඛු එතදවොච:

අට්ඨහි ඛො ත්වං ගහපති, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතො. කතමෙ තෙ ගහපති, අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙහි ත්වං සමන්නාගතො භගවතා ව්‍යාකරොති.

න ඛො අහං භන්තෙ, ජානාමි කතමෙහි අට්ඨහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතො. අපි ච භන්තෙ, යෙ මෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා සංවිජ්ජන්ති තෙ සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති.

එවං ගහපතීති ඛො සො භික්ඛු උග්ගස්ස ගහපතිනො වෙසාලිකස්ස පච්චස්සොසි. උග්ගො ගහපති වෙසාලිකො එතදවොච:

# 3. ගහපති වර්ගය

## 8. 1. 3. 1

## වෙසාලික උග්‍ග සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලානුවර සමීපයෙහි වූ මහවෙනෙහි කූටාගාරසාලායෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'වහන්සැ'යි භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, විසල්පුර වැසි උග්ගගහපති ආශ්චර්‍ය අද්භූත ධර්ම අටෙකින් සමන්වාගත කොට දරවූයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක, සුගතයන් වහන්සේ මෙය වදරා හුනස්නෙන් නැඟී විහාරයට පිවිසි සේක.

ඉක්බිති එක්තරා මහණෙක් පෙරවරුයෙහි හැද පෙරෙව පාසිවුරු ගෙන විසල්පුර වැසි උග්‍ග ගැහැවිහුගේ නිවෙසන යම් තෙනෙක්හි ද, එහි එළැඹියේ ය, එළඹ පැනවූ අස්නෙහි හින. එකල්හි විසල්පුරවැසි උග්‍රගෘහපති ඒ මහණහු වෙත එළැඹියේ ය. එළැඹ ඒ මහණහු වැද එකත්පසෙක හින. එකත්පසෙක හුන් විසල්පුර වැසි උග්‍රගෘහපති හට ඒ මහණ මෙය කී ය:

ගෘහපතිය, තෙපි ආශ්චර්‍ය අද්භූත ධර්ම අටෙකින් සමන්වාගත වවූ යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දහු, ගෘහපතිය, තෙපි යම් ධර්ම අටෙකින් සමන්වාගත වවූ යි භාග්‍යවතුන් වහන්සේ විසින් පවසන ලද්දහු ද, ඒ ආශ්චර්ය අද්භූත ධර්මයෝ අටදෙන කවරහු ද?

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් මම කවර අසිරි අබුතු දහම් අටෙකින් සමන්වාගතය යි ප්‍රකාශිතයෙම් දැයි නො දනිමි. එහෙත් වහන්ස, මාගේ යම් මේ අට අසිරි අබුතු දහම් කෙනෙක් ඇත් ද ඔවුන් අසව. මැනවින් මෙනෙහි කරව, පවසන්නෙමි යි.

ඒ මහණ තෙමේ 'එසේ ය ගෘහපතිය'යි විසල්පුරවැසි උග්‍රගෘහපති හට පිළිවදන් ඇස්වී ය. විසල් පුරවැසි උග්‍රගෘහපති තෙමේ මෙය කී ය:

1. යදාහං භන්තෙ, භගවන්තං පඨමං දූරතොව අද්දසං සහදස්සනෙනෙව මෙ භන්තෙ භගවතො චිත්තං පසීදි. අයං ඛො මෙ භන්තෙ පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

2. සො ඛො අහං භන්තෙ, පසන්නචිත්තො භගවන්තං පයිරුපාසිං. තස්ස මෙ භගවා ආනුපුබ්බිකථං කථෙසි, සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා මං භගවා අඤ්ඤාසි කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි, දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පතිගණ්හෙය්‍ය, එවමෙව ඛො මෙ තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

සො ඛො අහං භන්තෙ, දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ තත්ථෙව බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං අගමාසිං. බ්‍රහ්මචරියපඤ්චමානි සික්ඛාපදානි සමාදියිං. අයං ඛො මෙ භන්තෙ, දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

3. තස්ස මය්හං භන්තෙ, චතස්සො කොමාරියො පජාපතියො අහෙසුං. අථ ඛ්වාහං භන්තෙ, යෙන තා පජාපතියො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා තා පජාපතියො එතදවොචං: මයා ඛො භගිනියො බ්‍රහ්මචරියපඤ්චමානි සික්ඛාපදානි සමාදින්නානි. යා ඉච්ඡති සා ඉධෙව භොගෙ ච භුඤ්ජතු! පුඤ්ඤානි ච කරොතු! සකානි වා ඤාතිකුලානි ගච්ඡතු! හොති වා පන පුරිසාධිප්පායො, කස්ස වො දම්මීති. එවං වුත්තෙ සා භන්තෙ ජෙට්ඨා පජාපතී මං එතදවොච: ඉත්ථන්නාමස්ස මං අය්‍යපුත්ත පුරිසස්ස දෙහීති.

අථ ඛ්වාහං භන්තෙ, තං පුරිසං පක්කොසාපෙත්වා වාමෙන හත්ථෙන පජාපතිං ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන භිඞ්කාරං ගහෙත්වා තස්ස පුරිසස්ස ඔණොජෙසිං. කොමාරිං ඛො පනාහං භන්තෙ, දාරං පරිච්චජන්තො නාභිජානාමි චිත්තස්ස අඤ්ඤථත්තං. අයං ඛො මෙ භන්තෙ, තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

1. වහන්ස, මම යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ පළමු කොට දුරදීම දුටුයෙම් ද, වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ දර්ශනය හා සමග ම මාගේ සිත පහන් වී ය. වහන්ස, මාගේ මේ පළමු ආශ්වර්‍ය්‍ය අද්භූත ධර්මය ඇත්තේ ය.

2. වහන්ස, ඒ මම පහන් සිත් ඇතියෙම් භාග්‍යවතුන් වහන්සේ පර්යුපාසනය (වෙත එළැඹ ඇසුරු කිරීම) කෙළෙමි. එ මට භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙළ කථාව දෙසූසේක. එ නම්: දානකථා ද සීලකථා ද සග්ගකථා ද කාමයන්ගේ ආදීනව ලාමකබව කිලිටිබව ද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද විදළ සේක. භාග්‍යවතුන් වහන්සේ යම් කලෙක්හි අරෝගසිත් ඇති මොළොක් සිත් ඇති නීවරණ රහිත සිත් ඇති ඔදවැඩී සිත් ඇති පහන් සිත් ඇති මා දත් සේක් ද, එකල්හි බුදුවරයින්ගේ සාමුක්කංසික වූ (තමන් විසින් ම කිසිවකුගේ වහලක් නැති ව නගාගත්) යම් ධර්මදේශනාවක් වේ ද, දුඃඛ ය, සමුදය ය, නිරොධය ය, මාර්‍ගය ය යන ඒ (චතුසත්‍ය) ධර්මය ප්‍රකාශ කළ සේක. යම්සේ පහ වූ කළු ඇති ශුද්ධ වස්ත්‍රයක් මොනොවට රඳන් ගන්නේ වේ ද, එසෙයින් ම මට එ හුන් අස්නෙහි මැ, සමුදය, ස්වභාව ඇති යමක් ඇත් ද, ඒ හැම නිරොධ ස්වභාව ඇතැයි විරජ වූ වීතමල වූ ධම්වක්ඛුස පහළ වී.

වහන්ස, ඒ මම වනාහි දුටුදහම් ඇතියෙම් ප්‍රකට කොට දත් දහම් ඇතියෙම් බැසගත් දහම් ඇතියෙම් ඉක්මවූ විචිකිච්ඡා ඇතියෙම් පහ වූ කථංකථා (කෙසේ ද කෙසේදැයි කරන සැක) ඇතියෙම් වෙසරද බවට පැමිණියෙම් ශාස්තෘශාසනයෙහි (ධර්මාවබොධයට) අන් ප්‍රත්‍යයක් (පිහිටක්) නැත්තෙම් එහිදී ම ඒ බුදුන් ද දහම් ද සඟුන් ද සරණ කොට ගියෙමි. බඹසර පස් වනු කොට ඇති සික්පද (බ්‍රහ්මචරිය පඤ්චමකශීලය) සමාදන් වීමි. වහන්ස, මෙ මාගේ දෙවන ආශ්වර්‍ය්‍ය අද්භූත ධර්මය ඇත.

3. වහන්ස, ඒ මට තරුණ භාර්‍ය්‍යාවෝ සිවුදෙනෙක් වූහ. වහන්ස, ඉක්බිත්තෙන් මම ඒ භාර්‍ය්‍යාවෝ යම් තෙනෙක්හි වූ ද, එතන්හි එළැඹියෙමි. එළැඹ ඒ භාර්‍ය්‍යාවනට මෙල කීමි: සොහොවිරියනි, මා විසින් බඹසර පස් වනු කොට ඇති සිකපදයෝ සමාදන්ව ගන්නා ලදහු ය. යම් ස්ත්‍රියක් කැමැති වේ නම් ඕතොමෝ මෙහි මං (හිඳ) භොගයන් ද අනුභව කෙරේවා! සිය නෑකුලයන් කරා හෝ යේවා! පුරුෂයන් පිළිබඳ අදහස් ඇති හෝ වේ නම් කවරක් හට තොප දෙම් දැයි. වහන්ස, මෙසේ කී කල්හි දෙටු භාර්‍ය්‍යා තොමෝ මට මෙය කී: ආර්‍ය්‍යපුත්‍රය, මා මෙ නම් ඇති පුරුෂයාහට දෙව යි.

වහන්ස, එකල මම ඒ පුරුෂයා කැඳවා වමතින් භාර්‍ය්‍යාව අල්ලාගෙන දකුණතින් කෙණ්ඩිය ගෙන ඒ පුරුෂහට අත පැන් වඩා දිනිමි. වහන්ස, තරුණ භාර්‍ය්‍යාව හරනෙම් මම සිතෙහි වෙනස් බවක් නො දනිමි. වහන්ස, මාගේ මේ තෙවන අසිරි අබුතු දහම ඇත.

4. සංවිජ්ජන්ති ඛො පන මෙ භන්තෙ, කුලෙ භොගා. තෙ ච ඛො අප්පටිවිභත්තා සීලවන්තෙහි කල්‍යාණධම්මෙහි. අයං ඛො මෙ භන්තෙ, චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

5. යං ඛො පන අහං භන්තෙ, භික්ඛුං පයිරුපාසාමි, සක්කච්චංයෙව පයිරුපාසාමි නො අසක්කච්චං. අයං ඛො මෙ භන්තෙ, පඤ්චමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

6. සො චෙ[1] මෙ භන්තෙ, ආයස්මා ධම්මං දෙසෙති සක්කච්චං යෙව සුණාමි, නො අසක්කච්චං. නො චෙ මෙ සො ආයස්මා ධම්මං දෙසෙති අහමස්ස ධම්මං දෙසෙමි. අයං ඛො මෙ භන්තෙ, ඡට්ඨො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

7. අනච්ඡරියං ඛො පන මං භන්තෙ, දෙවතා උපසඞ්කමිත්වා ආරො-චෙන්ති: ස්වාක්ඛාතො ගහපති, භගවතා ධම්මොති. එවං වුත්තෙ අහං භන්තෙ, තා දෙවතා එවං වදාමි: වදෙය්‍යාථ වා එවං ඛො තුම්හෙ දෙවතා නො වා වදෙය්‍යාථ, අථ ඛො ස්වාක්ඛාතො භගවතා ධම්මොති, න ඛො පනාහං භන්තෙ, අභිජානාමි තතොනිදානං චිත්තස්ස උණ්ණතිං, මං වා දෙවතා උපසඞ්කමන්ති අහං වා දෙවතාහි සල්ලපාමීති. අයං ඛො මෙ භන්තෙ, සත්තමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

8. යානිමානි භන්තෙ, භගවතා දෙසිතානි පඤ්චොරම්භාගියානි සංයොජනානි, නාහං තෙසං කිඤ්චි අත්තනි අප්පහීනං සමනුපස්සාමීති. අයං ඛො මෙ භන්තෙ, අට්ඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

ඉමෙ ඛො භන්තෙ, අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා සංවිජ්ජන්ති. නො ච ඛො අහං ජානාමි. කතමෙහිපහං අට්ඨහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතොති.

අථ ඛො සො භික්ඛු උග්ගස්ස ගහපතිනො වෙසාලිකස්ස නිවෙසනෙ පිණ්ඩපාතං ගහෙත්වා උට්ඨායාසනා පක්කාමි.

1. ච- සිමු.

4. වහන්ස, මාගේ කුලයෙහි භොගයෝ ඇත්තාහ. ඒ භෝගයෝ ද කලණ දහම් ඇති සිල්වතුන් සමග (මෙතෙක් දෙමි මෙතෙක් නොදෙමි මෙය දෙමි මෙය නො දෙමි යි සිතක් නැතිව සාධාරණ බෙදුම් ඇති-යෙන්) අප්‍රතිවිභක්තයහ. වහන්ස, මාගේ මේ සිවුවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ඇත්තේ ය.

5. වහන්ස, මම යම් මහණක්හු පර්යුපාසන කෙරෙම් ද, සකසා ම පර්යුපාසන කරමි. නො සකසා පර්යුපාසන නො කරමි. වහන්ස, මාගේ මෙ පස් වන අසිරි අබුතු දහම ද ඇත්තේ ය.

6. වහන්ස, ඉදින් ඒ ආයුෂ්මත් මට දහම් දෙසා නම් සකසා ම අසමි, නො සකසා නො අසමි. ඒ ආයුෂ්මත් ඉදින් මට දහම් නො දෙසා නම් මම ඔබට දහම් දෙසමි. වහන්ස, මාගේ මෙ සවන ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ඇත.

7. වහන්ස, දෙවියෝ මා කරා එළැඹ 'ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙසන ලද්දේ ය'යි සැළ කෙරෙති. (එය) ආශ්චර්‍ය්‍යයෙක් නො වේ. එසේ කී කල්හි වහන්ස, මම ඒ දෙවියනට මෙසේ කියමි: දේවතාවෙනි, තෙපි මෙසේ කියහු දූ නො කියහු දූ ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට දෙසන ලද්දේ ම ය. වහන්ස, දෙවියෝ මා කරා එළැඹෙති යි හෝ මම දෙවියන් හා සමග සාකච්ඡා කෙරෙමි යි හෝ ඒ හේතු කොට ගෙන උන්නතියක් (සිතෙහි උසස් වීමක්) මම නො දනිම් ම ය. වහන්ස, මාගේ මෙ සත් වන අසිරි අබුතු දහම ද ඇත.

8. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ඔරම්භාගියහ යි යම් සංයොජන පසෙක් දෙසන ලදහු ද, ඉන් ප්‍රහීණ නො වූ කිසිවක් මම තමා කෙරෙහි නො දකිමි. වහන්ස, මාගේ මෙම අට වැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මය ද ඇත්තේ ය.

වහන්ස, මෙ අෂ්ට ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ ඇත්තාහ. කවර අසිරි අබුතු දහම් අටෙකින් මම සමන්වාගතය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ වෙම්දැ යි මම නො දනිමි.

ඉක්බිති ඒ මහණ විසල්පුරවැසි උග්‍රගෘහපතිහුගේ නිවසෙහි පිණ්ඩපාතය පිළිගෙන, හුනස්නෙන් නැඟී ගියේ ය.

අථ ඛො සො භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු යාවතකො අහොසි උග්ගෙන ගහපතිනා වෙසාලිකෙන සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි.

සාධු සාධු භික්ඛු, යථා තං උග්ගො ගහපති වෙසාලිකො සම්මා ව්‍යාකරමානො ව්‍යාකරෙය්‍ය ඉමෙහෙව භික්ඛු, අට්ඨහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො උග්ගො ගහපති වෙසාලිකො මයා බ්‍යාකතො.

ඉමෙහි ච පන භික්ඛු, අච්ඡරීයෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං උග්ගං ගහපතිං වෙසාලිකං ධාරෙථාති.

## 8. 1. 3. 2

## හත්ථිගාමක උග්ග සුත්තං

එකං සමයං භගවා වජ්ජීසු විහරති හත්ථිගාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -පෙ-

අට්ඨහි භික්ඛවෙ, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං උග්ගං ගහපතිං හත්ථිගාමකං ධාරෙථා'ති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො අඤ්ඤතරො භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන උග්ගස්ස ගහපතිනො හත්ථිගාමකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො උග්ගො ගහපති හත්ථිගාමකො යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො උග්ගං ගහපතිං හත්ථිගාමකං සො භික්ඛු එතදවොච:-

අට්ඨහි ඛො ත්වං ගහපති, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතො. කතමෙ තෙ ගහපති, අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා යෙහි ත්වං සමන්නාගතො භගවතා ව්‍යාකතොති?

ඉක්බිති ඒ මහණ පිණ්ඩපාතයෙන් වැළැකුණේ පසුබත භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැද එකත් පසෙක හින, එකත් පසෙක හුන් ඒ මහණ විසල්පුර වැසි ඒ උග්‍රගෘහපති හා සමග යම් පමණ වූ කථා සල්ලාපයෙක් වී නම් ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේ ය.

මහණ, මොනවට පවසන විසල් පුර වැසි උග්‍ර ගෘහපති තෙමේ තොපට යම්සේ පවසන්නේ ද, එ ඉගා මැනැව. මහණ, විසල් පුර වැසි උග්‍ර ගෘහ පති මේ අෂ්ට ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයන්ගෙන් ම සමන්විතය යි මා විසින් ද්‍රකාශ කරන ලද්දේ ය.

මහණ, විසල්පුර වැසි උග්‍ර ගෘහපති මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයන් ගෙන් සමන්විතැ යි දරව යි.

## 8. 1. 3. 2

## හත්ථිගාමක උග්ග සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැදැදනවමෙහි හස්ති ග්‍රාමයෙහි වැඩ වසනසේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක......

'මහණෙනි, ඇත්ගම් වැසි උග්‍ර ගෘහපති අෂ්ට ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයන් ගෙන් සමන්විත ය යි දරවු. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක, සුගතයන් වහන්සේ මෙය වදරා හුනස්නෙන් නැඟී විහාරයට පිවිසි සේක.

ඉක්බිති එක්තරා මහණෙක් පෙරවරුයෙහි හැද පෙරව පා සිවුරු ගෙන ඇත්ගම්වැසි උග්‍ර ගෘහපතිහු ගේ නිවසට එළැඹියේ ය. එළැඹ පැනවූ අස්නෙහි හුන්නේ ය. ඉක්බිති ඇත්ගම් වැසි උග්‍ර ගෘහපති තෙමේ එ මහණහු වෙත එළැඹියේ ය. එළැඹ එ මහණහු වැද එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන් ඇත්ගම් වැසි උග්‍ර ගෘහපතිහට එ මහණ මෙය කීය:

ගැහැවිය, තෙපි අෂ්ට ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයන්ගෙන් සමන්විත ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ ලද්දහු ය. ගෘහපතිය, යම් ධර්ම අටෙකින් තෙපි සමන්විත හ යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දහු ද, ඒ අෂ්ට ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ කවර හුද?

න ඛො අහං භන්තෙ, ජානාමි කතමෙහිපහං අට්ඨහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතො. අපිච භන්තෙ, යෙ මෙ අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා සංවිජ්ජන්ති තෙ සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති. එවං ගහපතීති සො භික්ඛු උග්ගස්ස ගහපතිනො හත්ථිගාමකස්ස පච්චස්සොසි. උග්ගො ගහපති හත්ථිගාමකො එතදවොච:

1. යදහං භන්තෙ, නාගවනෙ පරිචාරෙන්තො භගවන්තං පඨමං දූරතොව අද්දසං. සහදස්සනෙනෙව මෙ භන්තෙ, භගවතො චිත්තං පසීදි. සුරාමදො ච පහීයි. අයං ඛො මෙ භන්තෙ, පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

2. සො ඛො අහං භන්තෙ, පසන්නචිත්තො භගවන්තං පයිරුපාසිං තස්ස මෙ භගවා ආනුපුබ්බිකථං කථෙසි: සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා මං භගවා අඤ්ඤාසි කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි. දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය එවමෙව ඛො මෙ තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි, යංකිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

සො ඛො අහං භන්තෙ, දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ තත්ථෙව බුද්ධං ච ධම්මං ච සඞ්ඝං ච සරණං අගමාසිං. බ්‍රහ්මචරියපඤ්චමානි ච සික්ඛාපදානි සමාදියිං. අයං ඛො මෙ භන්තෙ, දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති

වහන්ස, මම කවර නම් අෂ්ට ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයන් ගෙන් සමන්විත ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දෙම් ද, එය මම නොදනිම් ම ය. වහන්ස එතකුදු වුවත් මාගේ යම් අෂ්ට ආශ්චර්ය්‍ය අද්භූත ධර්මකෙනෙක් වෙත් නම් ඔවුන් අසව, මනා කොට මෙනෙහි කරව, කියන්නෙමි යි. එසේ ය ගෘහපතිය යි ඒ මහණ ඇත්ගම්වැසි උග්‍ර ගෘහපති හට පිළිවදන් ඇද්වි ය. ඇත්ගම් වැසි උග්‍ර ගෘහපති මෙය කීය:

1. වහන්ස, යම් කලෙක මම නාගවන නම් උයනෙහි ඉදුරන් පිනවමින් හැසිරෙන්නෙම් පළමු කොට දුරදී ම භාග්‍යවතුන් වහන්සේ දිටිම් ද, භාග්‍යවතුන් වහන්සේගේ දැකීම හා සමග ම මාගේ සිත පහන් විය. සුරාමදය ද පහවි ය. වහන්ස, මාගේ මේ ප්‍රථම ආශ්චර්ය්‍ය අද්භූත ධර්මය ඇත්තේ ය.

2. වහන්ස, පහන්සිත් ඇති මම භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ ඇසිරි කෙළෙම්. ඒ මට භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙළ කථාව වදාළ සේක. එනම්: දානකථාව ද සීලකථාව ද සග්ගකථාව ද කාමයන් ගේ ආදීනව ය ලාමක බව කිළිටි බව ද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද ප්‍රකාශ කළ සේක. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ අරොග සිත් ඇති මොළොක් සිත් ඇති නීවරණ රහිත සිත් ඇති ඔද වැඩී සිත් ඇති පහන් සිත් ඇති මා දත් සේක් ද, එකල්හි බුදුවරුන්ගේ යම් සාමුක්කංසික ධර්ම-දේශනාවක් වේ ද, දුකඛ ය සමුදය ය නිරොධ ය මාර්ගය යන ඒ (චතුසසත්‍ය) ධර්මය වදාළසේක. යම්සේ පහ වූ කළු බව (කිලිටි) ඇති සුදු වතෙක් මොනවට රඳන් පිළිගන්නේ ද, එ පරිද්දෙන් ම ඒ අසුනෙහි ම සමුදය සවභාව ඇති යමක් ඇත් ද, එ හැම නිරොධ සවභාව ඇතැයි පහවූ (රාගාදි) රජස් ඇති පහ වූ (රාගාදි) කිලිටි ඇති දහම් ඇස (අනගැමි මහ) පහළ විය.

වහන්ස, ඒ මම දක්නා ලද (ආර්ය්‍යසත්‍ය) ධර්ම ඇත්තෙම් පැමිණි දහම් ඇත්තෙම් බැසගත් දහම් ඇත්තෙම් තරණය කළ විචිකිච්ඡා ඇත්තෙම් පහවූ කථංකථා (සැක) ඇත්තෙම් විශාරද බවට පැමිණියෙම් ශාස්තෘශාසන යෙහි (අනෙකක්හු හැඳහීමෙන් පැවැත්මක් නැතියෙන්) පරප්‍රත්‍යය රහිතයෙම් එහිදී ම බුදුන් ද දහම් ද සඟුන් ද සරණ කොට ගියෙමි. බඹසර පස්වනු කොට ඇති සිකපදයන් (බ්‍රහ්මචරිය පඤ්චමකශීලය) සමාදන් කොට ගතිමි. වහන්ස, මාගේ මෙ දෙවන ආශ්චර්ය්‍ය අද්භූත ධර්මය ද ඇත්තේ ය.

3. තස්ස මය්හං භන්තෙ, චතස්සො කොමාරියො පජාපතියො අහෙසුං, අථ ඛ්වාහං භන්තෙ, යෙන තා පජාපතියො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා තා පජාපතියො එතදවොචං: මයා ඛො භගිනියො, බ්‍රහ්මචරියපඤ්චමානි සික්ඛාපදානි සමාදින්නානි. යා ඉච්ඡති සා ඉධෙව භොගෙ ච භුඤ්ජතු! පුඤ්ඤානි ච කරොතු. සකානි වා ඤාතිකුලානි ගච්ඡතු! හොති වා පන පුරිසාධිප්පායො කස්ස වො දම්මීති. එවං වුත්තෙ සා භන්තෙ, ජෙට්ඨා පජාපති මං එතදවොච: ඉත්ථන්නාමස්ස මං අය්‍යපුත්ත, පුරිසස්ස දෙහීති. අථ ඛ්වාහං භන්තෙ, තං පුරිසං පක්කොසාපෙත්වා වාමෙන හත්ථෙන පජාපතිං ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන භිඞ්කාරං ගහෙත්වා තස්ස පුරිසස්ස ඔණොජෙසිං. කොමාරිං ඛො පනාහං භන්තෙ, දාරං පරිච්චජන්තො නාභිජානාමි චිත්තස්ස අඤ්ඤථත්තං. අයං ඛො මෙ භන්තෙ, තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

4. සංවිජ්ජන්ති ඛො පන මෙ භන්තෙ, කුලෙ භොගා තෙ ච ඛො අප්පටිවිභත්තා සීලවන්තෙහි කල්‍යාණධම්මෙහි. අයං ඛො මෙ භන්තෙ චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

5. යං ඛො පනාහං භන්තෙ, භික්ඛුං පයිරුපාසාමි සක්කච්චං යෙව පයිරුපාසාමි නො අසක්කච්චං, සො චෙ මෙ භන්තෙ, ආයස්මා ධම්මං දෙසෙති, සක්කච්චංයෙව සුණාමි, නො අසක්කච්චං. නො චෙ මෙ සො ආයස්මා ධම්මං දෙසෙති, අහමස්ස ධම්මං දෙසෙමි. අයං ඛො මෙ භන්තෙ, පඤ්චමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

6. අනච්ඡරියං ඛො පන මෙ භන්තෙ, සඞ්ඝෙ නිමන්තිතෙ දෙවතා උපසඞ්කමිත්වා ආරොචෙන්ති: අසුකො ගහපති, භික්ඛු උභතොභාගවිමුත්තො, අසුකො පඤ්ඤාවිමුත්තො, අසුකො කායසක්ඛී, අසුකො දිට්ඨිප්පත්තො අසුකො සද්ධාවිමුත්තො, අසුකො සද්ධානුසාරී, අසුකො ධම්මානුසාරී, අසුකො සීලවා කල්‍යාණධම්මො, අසුකො දුස්සීලො පාපධම්මොති. සඞ්ඝං ඛො පනාහං භන්තෙ, පරිවිසන්තො නාභිජානාමි. එවං චිත්තං උප්පාදෙන්තො: ඉමස්ස වා ථොකං දෙමි ඉමස්ස වා බහුකන්ති. අථඛ්වාහං භන්තෙ, සමචිත්තොව දෙමි. අයං ඛො මෙ භන්තෙ, ඡට්ඨො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

3. වහන්ස, ඒ මට තරුණ භාර්‍යාවෝ සතරදෙනෙක් වූහ. එකල වහන්ස, මම ඒ භාර්‍යාවන් වෙත එළඹියෙමි. එළඹ ඒ භාර්‍යාවන්ට මෙය කීමි: සොහොවිරියෙනි, "මවිසින් බඹසර පස්වැනි කොට ඇති සිකපද සමාදන්වන ලදි, යම් ස්ත්‍රියක් කැමති නම් ඕ මෙහි ම භෝගයන් ද වළඳාවා! පින් ද කෙරේ වා! සිය නෑකුලයන් වෙත හෝ යේ වා! පුරුෂයකු පිළිබඳ අදහස් ඇති හෝ වේ නම් කවරකුහට තොප දෙම් දැයි, මෙසේ කී කල්හි වහන්ස, ඒ දෙටු බිරිඳ මෙසේ කිවු: ආර්‍ය්‍යපුත්‍රය, මෙ නම් ඇති පුරුෂයා හට මා දෙව යි, ඉක්බිති වහන්ස, මම ඒ පුරුෂයා කැඳවා වමතින් බිරිඳ අල්වා ගෙන දකුණතින් කෙණ්ඩිය ගෙන ඒ පුරුෂයා හට අතපැන් වඩා පවරා දුනිමි. වහන්ස, මම තරුණ වූ බිරිඳ හරනෙම් සිතේ වෙනස් බවක් නොදනිමි. වහන්ස, මාගේ මේ තෙවෙනි ආශ්චර්‍ය අද්භූත ධර්මය ඇත්තේ ය.

4. වහන්ස, මාගේ කුලයෙහි භෝගයෝ ඇත්තාහු ම ය, ඒ භෝගයෝ කලණදහම් ඇති සිල්වතුන් හා (මෙතෙක් දිය යුතුය මෙතෙක් නො දිය යුතුය යනාදීන්) නො බෙදන ලද්දාහු ම ය. වහන්ස, මාගේ මේ සිවුවන ආශ්චර්‍ය අද්භූත ධර්මය ඇත්තේ ය.

5. වහන්ස, මම යම් මහණකු ඇසුරු කෙරෙම් ද සකසා ම එළැඹ ඇසුරු කරමි. නො සකසා එළැඹ ඇසුරු නො කරමි. වහන්ස, ඉදින් ඒ ආයුෂ්මත් මට දහම් දෙසා නම් සකසා ම අසමි. නො සකසා නො අසමි. ඉදින් ඒ ආයුෂ්මත් මට දහම් නො දෙසා නම් මම ඔබට දහම් දෙසමි. වහන්ස, මාගේ මේ පස්වන ආශ්චර්‍ය අද්භූත ධර්මය ඇත්තේ ය.

6. වහන්ස, සඞ්ඝයා බතින් පැවරූ කල්හි දෙවියෝ මා වෙත එළඹැ ගැහවිය, අසුවල් මහණ උභතොභාගවිමුක්ත ය. අසුවල් මහණ ප්‍රඥාවිමුක්ත ය. අසුවල් මහණ කායසාක්ෂී ය. අසුවල් මහණ දෘෂ්ටිප්‍රාප්ත ය. අසුවල් මහණ ශ්‍රද්ධාවිමුක්ත ය, අසුවල් මහණ ශ්‍රද්ධානුසාරී ය. අසුවල් මහණ ධර්මානුසාරී ය. අසුවල් මහණ කලණ දම් ඇති සිල්වතෙක, අසුවල් මහණ ලමුදම් ඇති දුශ්ශීලයෙකැ යි සැළ කෙරෙත්. එය ආශ්චර්‍යයක් නො වෙ යි. වහන්ස, මම සඞ්ඝයා වළඳවන්නෙම් මොහුට හෝ මදක් දෙමි. මොහුට හෝ බොහෝ කොට දෙමැයි යන මෙ බඳු සිතක් ඉපදවූ බව නො මැ දනිමි. වහන්ස, වැළිදු සම සිත් ඇත්තේ ම දෙමි වහන්ස, මාගේ මේ සවන ආශ්චර්‍ය අද්භූත ධර්මය ඇත්තේ ය.

7. අච්ඡරියං ඛො පන මෙ භන්තෙ, දෙවතා උපසඞ්කමිත්වා ආරොචෙන්ති: 'ස්වාක්ඛාතො ගහපති භගවතා ධම්මො'ති. එවං වුත්තෙ අහං භන්තෙ, තා දෙවතා එවං වදාමි. 'වදෙය්‍යාථ වා එවං ඛො තුම්හෙ දෙවතා නො වා වදෙය්‍යාථ, අථ ඛො ස්වාක්ඛාතො භගවතා ධම්මො'ති. න ඛො පනාහං භන්තෙ, අභිජානාමි තතො නිදානං චිත්තස්ස උණ්ණතිං. මං වා දෙවතා උපසඞ්කමන්ති. අහං වා දෙවතාහි සල්ලපාමීති. අයං ඛො මෙ භන්තෙ, සත්තමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

8. සචෙ ඛො පනාහං භන්තෙ, භගවතො පඨමතරං කාලඞ්කරෙය්‍යං අනච්ඡරියං ඛො පනෙතං යං මං භගවා එවං ව්‍යාකරෙය්‍ය; නත්ථි තං සංයොජනං යෙන සංයොජනෙන සංයුත්තො උග්ගො ගහපති හත්ථිගාමකො පුන ඉමං ලොකං ආගච්ඡෙය්‍යාති. අයං ඛො මෙ භන්තෙ, අට්ඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො සංවිජ්ජති.

ඉමෙ ඛො භන්තෙ, අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා සංවිජ්ජන්ති. නො ච ඛො අහං ජානාමි කතමෙහිපහං අට්ඨහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතොති.

අථ ඛො සො භික්ඛු උග්ගස්ස ගහපතිනො හත්ථිගාමකස්ස නිවෙසනෙ පිණ්ඩපාතං ගහෙත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො සො භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු යාවතකො අහොසි උග්ගෙන ගහපතිනා හත්ථිගාමකෙන සද්ධිං කථාසල්ලාපො තං සබ්බං භගවතො ආරොචෙසි.

සාධු සාධු භික්ඛු, යථා තං උග්ගො ගහපති හත්ථිගාමකො සම්මා ව්‍යාකරමානො ව්‍යාකරෙය්‍ය ඉමෙහෙව ඛො භික්ඛු අට්ඨහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො උග්ගො ගහපති හත්ථිගාමකො මයා ව්‍යාකතො. ඉමෙහි ච පන භික්ඛු අට්ඨහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං උග්ගං ගහපතිං හත්ථිගාමකං ධාරෙථාති.

7. වහන්ස දෙවියෝ එළැඹ ගැහැවිය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මැනවින් ප්‍රකාශකරන ලද්දේ ය යි සැළ කෙරෙත්. එය ආශ්චය්‍ය්‍ය-යෙක් නො වෙයි. වහන්ස, මෙසේ කී කල්හි ඒ දෙවියනට මම මෙසේ කියමි: 'දෙවතාවෙනි, තෙපි මෙසේ කියහු ද නො කියහු ද භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මැනවින් ප්‍රකාශ කරණ ලද්දේ ම' ය යි. වහන්ස, මම ඒ හේතු කොට ගෙන දෙවියෝ හෝ මා වෙත එළඹෙත්. මම හෝ දෙවියන් හා කථා කෙරෙමැයි සිතෙහි නැඟීමක් නො ම දනිමි. වහන්ස, මාගේ මෙ සත්වන ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්මය ඇත්තේ ය.

8. වහන්ස, ඉදින් මම භාග්‍යවතුන් වහන්සේට පෙරාතුව ම කලුරිය කරන්නෙම් නම්, ඇත්ගම්වැසි උග්‍රගෘහපති යම් සංයොජනයෙකින් බැඳුනේ යළි මෙ ලොවට එන්නේ නම් ඒ සංයොජනය (ඔහුට) නැතැ'යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ මා උදෙසා යමක් ප්‍රකාශකරණ සේක් ද, එය ආශ්-චය්‍ය්‍යයෙක් නො වේ. වහන්ස, මේ මාගේ අෂ්ටම ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්මය ඇත්තේ ය.

වහන්ස, මේ අෂ්ට ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්මයෝ ඇත්තාහ. මම කවර නම් අෂ්ට ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්මයන් ගෙන් සමන්විත ය යි භාග්‍ය වතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දෙම් දැයි මම නො දනිම් ම ය.

ඉක්බිති ඒ මහණ ඇත්ගම්වැසි උග්‍රගෘහපතිහුගේ පිණ්ඩපාතය ගෙන හුනස්නෙන් නැඟී ගියේ ය. ඉක්බිති ඒ මහණ පිණ්ඩපාතයෙන් වැළැකුණේ පසු බත භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් ඒ මහණ ඇත්ගම්වැසි උග්‍රගෘහපති හා සමඟ යම් පමණ වූ කථාසල්ලාපයෙක් වී ද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේ ය.

මහණ, ඉතා මැනැව, ඇත්ගම් වැසි උග්‍රගෘහපති යම්සේ තොපට මනා කොට පවසන්නේ කියා ද, මහණ මේ අෂ්ට ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්මයන් ගෙන් ම ඇත්ගම් වැසි උග්‍ර ගෘහපති සමන්විත ය යි මා විසින් ප්‍රකාශ කරන ලද්දේ ය. මහණ ඇත් ගම් වැසි උග්‍ර ගෘහපති මේ ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්ම යන් ගෙන් සමන්විත ය යි ධරව යි.

## 8. 1. 3. 3

### හත්ථකාළවක සුත්තං

එකං සමයං භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: -පෙ-

සත්තහි භික්ඛවෙ, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං හත්ථකං ආළවකං ධාරෙථ. කතමෙහි සත්තහි:

සද්ධො භික්ඛවෙ, හත්ථකො ආළවකො. සීලවා භික්ඛවෙ, හත්ථකො ආළවකො, හිරිමා භික්ඛවෙ, හත්ථකො ආළවකො, ඔත්තප්පී භික්ඛවෙ, හත්ථකො ආළවකො. බහුස්සුතො භික්ඛවෙ, හත්ථකො ආළවකො. චාගවා භික්ඛවෙ, හත්ථකො ආළවකො. පඤ්ඤවා භික්ඛවෙ, හත්ථකො ආළවකො. ඉමෙහි ඛො භික්ඛවෙ, සත්තහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං හත්ථකං ආළවකං ධාරෙථාති, ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො අඤ්ඤතරො භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදය යෙන හත්ථකස්ස ආළවකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො හත්ථකො ආළවකො යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො හත්ථකං ආළවකං සො භික්ඛු එතදවොච: සත්තහි ඛො ත්වං ආවුසො, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතො. කතමෙහි සත්තහි:

සද්ධො භික්ඛවෙ, හත්ථකො ආළවකො. සීලවා -පෙ- හිරිමා -පෙ- ඔත්තප්පී -පෙ- බහුස්සුතො -පෙ- චාගවා -පෙ- පඤ්ඤවා භික්ඛවෙ, හත්ථකො ආළවකොති. ඉමෙහි ඛො ත්වං ආවුසො, සත්තහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතොති.

කච්චිත්ථ භන්තෙ, න කොචි ගිහී අහොසි ඔදාතවසනොති?

න ඛොත්ථ[1] ආවුසො, කොචි ගිහී අහොසි ඔදාතවසනොති.

සාධු භන්තෙ, යදෙත්ථ න කොචි ගිහී අහොසි ඔදාතවසනොති.

1. තමෙත්ථ- මජසං

## 8. 1. 3. 3

## හත්ථකාළවක සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අළවුනුවර අග්ගාළව නම් චෛත්‍යස්ථානයෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක:

මහණෙනි, හත්ථකආලවක කුමර සප්ත ආශ්චර්‍ය අද්භූත ධර්මයන් ගෙන් යුක්ත වූවකු කොට දරවු. කවර සතෙකින යත්:

මහණෙනි, හත්ථකආළවක තෙමේ ශ්‍රද්ධාවත්ය, මහණෙනි, හත්ථක-ආළවක තෙමේ සිල්වත් ය, මහණෙනි, හත්ථක ආළවක තෙමේ ලජ්ජීය, මහණෙනි, හත්ථකආළවක තෙමේ ඔතප් ඇත්තේ ය. මහණෙනි, හත්ථක ආළවක තෙමේ බහුශ්‍රැතය, මහණෙනි, හත්ථකආළවක තෙමේ ත්‍යාගී ය. මහණෙනි හත්ථකආලවක තෙමේ ප්‍රඥාවත් ය යි, මහණෙනි හත්ථක ආළවක මේ ආශ්චර්‍ය අද්භූත ධර්ම සතින් යුක්තවූවකු කොට ධරවු යයි භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගතයන් වහන්සේ මෙය වදරා හුනස්නෙන් නැඟී විහාරයට පිවිසි සේක.

ඉක්බිති එක්තරා මහණෙක් පෙරවරුයෙහි හැද පෙරෙව පා සිවුරු ගෙණ හත්ථක ආළවක කුමරුගේ නිවෙස්නට එළඹියේ ය. එළැඹ පනවන ලද අස්නෙහි හින, ඉක්බිති හත්ථකආළවක ඒ මහණහු කරා එළැඹියේ ය, එළැඹ ඒ මහණහු සකසා වැඳ එකත්පසෙක හුන්නේ ය, ඒ මහණ එකත් පසක හුන් හත්ථක ආළවක හට මෙය කීය, ඇවත, තෙපි භාග්‍යවතුන් වහන්සේ විසින් ආශ්චර්‍ය අද්භූත ධර්ම සතෙකින් යුක්ත ය යි ප්‍රකාශ කරන ලද්දුව, කවර සතෙකින යත්:

මහණෙනි, හත්ථකආළවක තෙමේ සැදැහැවත් ය, සිල්වත්ය, ලජ්ජීය, ඔත්තප්පිය, බහුශ්‍රැතය, ත්‍යාගීය. මහණෙනි, හත්ථකආළවක ප්‍රඥාවත් ය, ඇවත, තෙපි මේ ආශ්චර්‍ය අද්භූත ධර්ම සතින් සමන්විත යයි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දුව.

වහන්ස, කිම කිසියම් සුදුවත් හැඳි ගිහියෙක් එහි නො වි දැයි? ඇවත, එතන්හි සුදුවත් හැඳි කිසිදු ගිහියෙක් නො වි ය.

වහන්ස, ඉදින් එහි සුදුවත් හැඳි කිසි ගිහියෙක් නො වී නම් මැනැවි.

අථ ඛො සො භික්ඛු හත්ථකස්ස ආළවකස්ස නිවෙසනෙ පිණ්ඩපාතං ගහෙත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො සො භික්ඛු පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ, පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන හත්ථකස්ස ආළවකස්ස නිවෙසනං තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිං. අථ ඛො භන්තෙ හත්ථකො ආළවකො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි: එකමන්තං නිසින්නං ඛො අහං භන්තෙ, හත්ථකං ආළවකං එතදවොචං.

සත්තහි ඛො ත්වං ආවුසො, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතො. කතමෙහි සත්තහි: සද්ධො භික්ඛවෙ, හත්ථකො ආළවකො, සීලවා -පෙ- හිරිමා -පෙ- ඔත්තප්පී -පෙ- බහුස්සුතො -පෙ- චාගවා -පෙ- පඤ්ඤවා භික්ඛවෙ, හත්ථකො ආළවකොති. ඉමෙහි ඛො ත්වං ආවුසො, සත්තහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතො භගවතා ව්‍යාකතොති.

එවං වුත්තෙ භන්තෙ, හත්ථකො ආළවකො මං එතදවොච: කච්චිත්ථ භන්තෙ, න කොචි ගිහී අහොසි ඔදාතවසනොති. න ඛොත්ථ ආවුසො, කොචි ගිහී අහොසි ඔදාත වසනොති. සාධු භන්තෙ, යදෙත්ථ න කොචි ගිහී අහොසි ඔදාතවසනොති.

සාධු සාධු භික්ඛු, අප්පිච්ඡො සො භික්ඛු කුලපුත්තො සන්තංයෙව අත්තනි කුසලෙ ධම්මෙ න ඉච්ඡති පරෙහි ඤායමානෙ, තෙන හි ත්වං භික්ඛු, ඉමිනාපි අට්ඨමෙන අච්ඡරියෙන අබ්භුතෙන ධම්මෙන සමන්නාගතං හත්ථකං ආළවකං ධාරෙහි යදිදං අප්පිච්ඡතායාති.

## 8. 1. 3. 4

## හත්ථකාළවක සඞ්ගහවත්ථු සුත්තං

එකං සමයං භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. අථ ඛො හත්ථකො ආළවකො පඤ්චමත්තෙහි උපාසකසතෙහි පරිවුතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො හත්ථකං ආළවකං භගවා එතදවොච:

ඉක්බිති ඒ මහණ හත්ථකආළවක කුමරහුගේ නිවෙස්නෙහි පිණ්ඩපාතය පිළිගෙන හුනස්නෙන් නැඟී ගියේ ය. ඉක්බිති ඒ මහණ පිණ්ඩපාතයෙන් වැළැකුණේ පස්වරුයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේ ය, එකත් පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකෙළේ ය: "වහන්ස, මෙහි මම පෙරවරුයෙහි හැඳ පෙරව පා සිවුරු ගෙන හත්ථකආළවක කුමරහුගේ නිවසට පැමිණියෙමි. එළැඹ පැනවූ අස්නෙහි හුන්නෙමි. වහන්ස, ඉක්බිති හත්ථක ආළවක තෙමේ මා වෙත එළඹියේ ය. එළැඹ මා වැඳ එකත් පසෙක හුන්නේ ය. වහන්ස, එකත් පසෙක හුන් හත්ථක ආළවක හට මම මෙය කීමි:

ඇවත, තෙපි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම සතෙකින් සමන්විත ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දව. කවර සතෙකින යත්: මහණෙනි, හත්ථකආළවක සැදැහැවත් ය, සිල්වත්ය, ලජ්ජිය, ඔත්තප්පී ය, බහුශ්‍රැත ය, ත්‍යාගීය, මහණෙනි, හත්ථක ආළවක පැනවත් ය. ඇවත, තෙපි මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්ම සතින් සමන්විත ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දව.

මෙසේ කී කල්හි වහන්ස, හත්ථක ආළවක මට මෙය කී ය: කිම වහන්ස, එහි සුදුවත් හැඳි කිසියම් ගිහියෙක් නො වී ද? ඇවත, එහි සුදුවත් හැඳි ගිහියෙක් නො වී ය. එහි සුදුවත් හැඳි කිසි ගිහියෙක් නො වී නම් මැනැවි.

මැනැව මැනැව මහණ. අල්පෙච්ඡ වූ ඒ කුල පුත්‍ර තෙමේ තමා තුළ කුශලධම් ඇති කල්හි මැ මෙරමා විසින් දනගනු ලැබීමෙහි නො කැමැති වෙයි. එහෙයින් මහණ තෙපි හත්ථක ආළවක යම් මේ අල්පේච්ඡතාය යන අටවැනි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙනු ද සමන්වාගතයහ යි ධරව.

## 8. 1. 3. 4

## හත්ථකාළවක සඞ්ගහවත්ථු සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අළව්නුවර අග්ගාළව චෛත්‍යස්ථානයෙහි වැඩ වසන සේක. ඉක්බිති හත්ථක ආළවක තෙමේ පන්සියයක් පමණ උවසුවන් විසින් පිරිවරන ලදුයේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන් හත්ථක ආළවක හට භාග්‍යවතුන් වහන්සේ මෙල වදළ සේක:

මහතී ඛො ත්‍යායං හත්ථක, පරිසා, කථං පන ත්වං හත්ථක, ඉමං මහතිං පරිසං සඞ්ගණ්හාසීති? යානිමානි භන්තෙ, භගවතා දෙසිතානි චත්තාරි සඞ්ගහවත්ථූනි තෙනාහං ඉමං පරිසං සඞ්ගණ්හාමි. අහං භන්තෙ, යං ජානාමි, 'අයං දානෙන සඞ්ගහෙතබ්බො'ති, තං දානෙන සඞ්ගණ්හාමි. යං ජානාමි 'අයං පෙය්‍යවජ්ජෙන සඞ්ගහෙතබ්බො'ති තං පෙය්‍යවජ්ජෙන සඞ්ගණ්හාමි, යං ජානාමි 'අයං අත්ථචරියාය සඞ්ගහෙතබ්බො'ති තං අත්ථචරියාය සඞ්ගණ්හාමි, යං ජානාමි 'අයං සමානත්තතාය සඞ්ගහෙතබ්බො'ති තං සමානත්තතාය සඞ්ගණ්හාමි, සංවිජ්ජන්ති ඛො පන මෙ භන්තෙ, කුලෙ භොගා. දළිද්දස්ස ඛො නො තථා සොතබ්බං මඤ්ඤන්තීති,

සාධු සාධු හත්ථක, යොනි ඛො ත්‍යායං හත්ථක, මහතිං පරිසං සඞ්ගහෙතුං, යෙ හි කෙචි හත්ථක, අතීතං අද්ධානං පරිසං සඞ්ගහෙසුං, සබ්බෙ තෙ ඉමෙහෙව චතූහි සඞ්ගහවත්ථූහි මහතිං පරිසං සඞ්ගහෙසුං. යෙපි හි කෙචි හත්ථක, අනාගතමද්ධානං මහතිං පරිසං සඞ්ගහෙස්සන්ති සබ්බෙ තෙ ඉමෙහෙව චතූහි සඞ්ගහවත්ථූහි මහතිං පරිසං සඞ්ගහිස්සන්ති.

යෙපි හි කෙචි හත්ථක, එතරහි මහතිං පරිසං සඞ්ගණ්හන්ති සබ්බෙ තෙ ඉමෙහෙව චතූහි සඞ්ගහවත්ථූහි මහතිං පරිසං සඞ්ගණ්හන්තීති. අථ ඛො හත්ථකො ආළවකො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො භගවා අචිරපක්කන්තෙ හත්ථකෙ ආළවකෙ භික්ඛූ ආමන්තෙසි: අට්ඨහි භික්ඛවෙ, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං හත්ථකං ආළවකං ධාරෙථ, කතමෙහි අට්ඨහි:

සද්ධො භික්ඛවෙ හත්ථකො ආළවකො. සීලවා භික්ඛවෙ, හත්ථකො ආළවකො. හිරිමා භික්ඛවෙ, හත්ථකො ආළවකො. ඔත්තප්පී භික්ඛවෙ, හත්ථකො ආළවකො. බහුස්සුතො භික්ඛවෙ, හත්ථකො ආළවකො. චාගවා භික්ඛවෙ, හත්ථකො ආළවකො. පඤ්ඤවා භික්ඛවෙ, හත්ථකො ආළවකො. අප්පිච්ඡො භික්ඛවෙ, හත්ථකො ආළවකො, ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං හත්ථකං ආළවකං ධාරෙථාති.

''හත්ථකය, තොප ගේ මේ පිරිස මහත් ය, හත්ථකය කෙසේ නම් තෙපි මේ මහ පිරිස සඞ්ග්‍රහ කරවූ දැයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද යම් මේ සතර සඞ්ග්‍රහ වස්තු කෙනෙක් වෙත් ද, එයින් මම මේ මහපිරිස සගන්මි. වහන්ස, මම යමකු 'මේ තෙමේ දනයෙන් සඞ්ග්‍රහ කටයුත්තෙකැයි දනිම් ද, දනයෙන් ඔහු සගන්මි. යමකු 'මෙ තෙමේ ප්‍රියවචනයෙන් සැහැබිය යුත්තෙකැ'යි දනිම් ද, ප්‍රිය වචනයෙන් ඔහු සහන්මි. යමකු 'මෙ තෙමේ අත්‍ථචය්‍ය්‍යායෙන් සැහැබිය යුත්තෙකැ'යි දනිම් ද, ඔහු අත්‍ථචය්‍ය්‍යායෙන් සහන්මි. යමකු 'මෙ තෙමේ සමානාත්ම තායෙන් සැහැබිය යුත්තෙකැ'යි දනිම් ද, ඔහු සමානාත්මතායෙන් සගන්මි. වහන්ස, මාගේ කුලයෙහි භොගයෝ ඇත. ඇසිය යුතු තෙපුල දිළින්දකු ගේ බඳු කොට නො හඟිත්. (දිළින්දකු නොවූ මාගේ ඔවා නො ඉක්මවිය යුතු කොට හඟිත්යි සේයි.)

හත්ථක, ඉතා මැනවි, හත්ථකය, මහපිරිස සැහැබීමට තොප ගේ මේ උපාය වේ. හත්ථකය, යම් කිසිවෙක් ඉකුත් කල මහ පිරිස් සැහැබූ නම් ඒ සියලු දෙන මේ සිව්සඟරාවතින් ම මහපිරිස් සහන්හ. හත්ථකය, යම් කෙනෙක් මතු කල්හි මහපිරිස් සහන්නාහු ද ඒ සියලු දෙන මේ සිව්සඟරාවතින් ම මහපිරිස් සහන්නාහ.

හත්ථකය, යම් කිසි කෙනෙක් දැන් මහපිරිස් සගන්නාහු නම් ඒ සියලු දෙන මේ සිවුසඟරා වතින් ම මහපිරිස් සගන්නාහ යි. ඉක්බිති හත්ථක ආළවක භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තෙද ගන්වන ලද්දේ සතුටු කරන ලද්දේ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හත්ථක ආළවකයන් නැඟී ගිය නොබෝ කල්හි භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, හත්ථක ආළවක අෂ්ට-ආශ්චය්‍ය්‍යාද්භූත ධර්මයන්ගෙන් සමන්විත කොට දරවූ. කවර අටෙකින යත්:

මහණෙනි, හත්ථක ආළවක සැදැහැත්තේ ය. මහණෙනි, හත්ථක ආළවක සිල් ඇත්තේ ය. මහණෙනි, හත්ථක ආළවක පවට ලජ්ජා ඇත්තේ ය. මහණෙනි, හත්ථක ආළවක පවට බිය ඇත්තේ ය. මහණෙනි, හත්ථක ආළවක බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ ය. මහණෙනි හත්ථක ආළවක ත්‍යාග ඇත්තේ ය. මහණෙනි, හත්ථක ආළවක පැනැත්තේ ය, මහණෙනි, හත්ථක ආළවක අපිස්ගුණ ඇත්තේ ය. මහණෙනි, හත්ථක ආළවක මේ අෂ්ට ආශ්චය්‍ය්‍ය අද්භූත ධර්මයන්ගෙන් සමන්විත කොට ධරව යි.

## 8. 1. 3. 5

# මහානාම සුත්තං

එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ, අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච:

කිත්තාවතා නු ඛො භන්තෙ, උපාසකො හොතීති:

යතො ඛො මහානාම, බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති, එත්තාවතා ඛො මහානාම, උපාසකො හොතීති.

කිත්තාවතා පන භන්තෙ, උපාසකො සීලවා හොතීති:

යතො ඛො මහානාම, උපාසකො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාද පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. එත්තාවතා ඛො මහානාම, උපාසකො සීලවා හොතීති.

කිත්තාවතා පන භන්තෙ, උපාසකො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතායාති:

යතො ඛො මහානාම උපාසකො අත්තනා සද්ධාසම්පන්නො හොති නො පරං සද්ධාසම්පදය සමාදපෙති අත්තනා සීලසම්පන්නො හොති නො පරං සීලසම්පදය සමාදපෙති. අත්තනා චාගසම්පන්නො හොති නො පරං චාගසම්පදය සමාදපෙති, අත්තනා භික්ඛූනං දස්සනකාමො හොති නො පරං භික්ඛූනං දස්සනෙ සමාදපෙති. අත්තනා සද්ධම්මං සොතුකාමො හොති නො පරං සද්ධම්මසවණෙ සමාදපෙති. අත්තනා සුතානං ධම්මානං ධාරණජාතිකො හොති නො පරං ධම්මධාරණාය සමාදපෙති. අත්තනා[1] ධතානං ධම්මානං අත්ථූපපරික්ඛී හොති නො පරං අත්ථූපපරික්ඛාය සමාදපෙති. අත්තනා අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති නො පරං ධම්මානුධම්මපටිපත්තියා සමාදපෙති. එත්තාවතා ඛො මහානාම උපාසකො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතායාති.

1. අත්තනාව- මජසං

## 8. 1. 3. 5

## මහානාම සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත් පුර න්‍යග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි මහානාම ශාක්‍ය භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් මහානාම ශාක්‍ය භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය:

වහන්ස, කො පමණකින් උපාසකයෙක් වේ දැයි:

මහානාම ය, යම් දිනෙක පටන් බුදුන් සරණ ගියේ වේ ද, දහම් සරණ ගියේ වේ ද, සඟුන් සරණ ගියේ වේ ද, මහානාමය, මෙ පමණකින් උපාසක වේ.

වහන්ස, කො පමණෙකින් උපාසක තෙමේ සිල් ඇත්තේ වේ ද:

මහානාමය, යම් දිනෙක පටන් උපාසක තෙමෙ පණිවාතයෙන් වැළකුණේ වේ ද, අයිනාදනින් වැළකුණේ වේ ද, කාමයන්හි මිසහසරින් වැළැකුණේ වේ ද, මුසවායෙන් වැළකුණේ වේ ද, මදයට හා ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් වැළකුණේ වේ ද, මහානාමය, මෙපමණෙකින් උපාසක තෙමේ සිල් ඇත්තේ වේ.

වහන්ස, කොපමණෙකින් උපාසක තමනට හිත පිණිස පිළිපන්නේ අනුනට හිත පිණිස නො පිළිපන්නේ වේ ද?

මහානාමය, යම් දිනෙක පටන් උපාසක තෙමේ, සැදැහැයෙන් යුතු වූයේ මෙරමා ශ්‍රද්ධාසම්පත්තියෙහි සමාදන් නො කරවා ද, තෙමේ සීලයෙන් යුතු වූයේ මෙරමා සීලසම්පත්තියෙහි සමාදන් නො කරවා ද, තෙමේ ත්‍යාගයෙන් යුතු වූයේ මෙරමා ත්‍යාගසම්පත්තියෙහි සමාදන් නො කරවා ද, තෙමේ මහණුන් දකිනු කැමැත්තේ මෙරමා මහණුන් දැක්මෙන් සමාදන් නො කරවා ද, තෙමේ සදහම් අසනු කැමැත්තේ මෙරමා සදහම් ඇසීමෙහි සමාදන් නො කරවා ද, තෙමේ ඇසූ දහම් දරණ සවභාවය ඇත්තේ මෙරමා දහම් දැරීමෙහි සමාදන් නො කරවා ද, තෙමේ දැරූ දහම් පිළිබඳ අරුත් පිරික්සන්නේ මෙරමා අරුත් පිරික්සීමෙහි සමාදන් නො කරවා ද, තෙමේ අරුත් දැන දහම් දැන ධර්මානුධර්මප්‍රතිපන්න වූයේ මෙරමා ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි සමාදන් නො කරවා ද, මහානාමය, මෙපමණෙකින් ම උපාසක තමනට හිත පිණිස පිළිපන්නේ අනුනට හිත පිණිස නො පිළිපන්නේ වේ.

කිත්තාවතා පන භන්තෙ, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති, පරහිතාය චාති:

යතො ඛො මහානාම, උපාසකො අත්තනා ච සද්ධාසම්පන්නො හොති, පරඤ්ච සද්ධාසම්පදාය සමාදපෙති. අත්තනා ච සීලසම්පන්නො හොති, පරඤ්ච සීලසම්පදාය සමාදපෙති. අත්තනා ච චාගසම්පන්නො හොති, පරඤ්ච චාගසම්පදාය සමාදපෙති. අත්තනා ච භික්ඛූනං දස්සනකාමො හොති, පරඤ්ච භික්ඛූනං දස්සනෙ සමාදපෙති. අත්තනා ච සද්ධම්මං සොතුකාමො හොති, පරඤ්ච සද්ධම්මසවණෙ සමාදපෙති. අත්තනා ච සුතානං ධම්මානං ධාරණජාතිකො හොති, පරඤ්ච ධම්මධාරණාය සමාදපෙති. අත්තනා ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛී හොති, පරඤ්ච අත්ථූපපරික්ඛාය සමාදපෙති. අත්තනා ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, පරඤ්ච ධම්මානුධම්මපටිපත්තියා සමාදපෙති. එත්තාවතා ඛො මහානාම, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය චාති.

## 8. 1. 3. 6

## ජීවක සුත්තං

එකං සමයං භගවා රාජගහෙ විහරති ජීවකම්බවනෙ. අථ ඛො ජීවකො කොමාරභච්චො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච:

කිත්තාවතා නු ඛො භන්තෙ උපාසකො හොතීති:

යතො ඛො ජීවක, බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති, එත්තාවතා ඛො ජීවක, උපාසකො හොතීති.

කිත්තාවතා පන භන්තෙ, උපාසකො සීලවා හොතීති:

යතො ඛො ජීවක, උපාසකො පාණාතිපාතා පටිවිරතො හොති, – පෙ – සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. එත්තාවතා ඛො ජීවක, උපාසකො සීලවා හොතීති.

වහන්ස, කොපමණෙකින් උපාසක තමනට හිත පිණිසත් අනුනට හිත පිණිසත් පිළිපන්නේ වේ දැයි?

මහානාමය, යම් දිනෙක පටන් උපාසක තෙමේත් සැදැහැයෙන් යුතු වූයේ මෙරමාත් ශ්‍රද්ධාසම්පදාවෙහි සමාදන් කරවා ද, තෙමේත් සීලයෙන් යුතුවූයේ මෙරමාත් සීලසම්පත්තියෙහි සමාදන් කරවා ද, තෙමේත් ත්‍යාගයෙන් යුතු වූයේ මෙරමාත් ත්‍යාගසම්පත්තියෙහි සමාදන් කරවා ද, තෙමේත් මහණුන් දකිනු කැමැත්තේ මෙරමාත් මහණුන් දැක්මෙහි සමාදන් කරවා ද තෙමේත් සදහම් අසනු කැමැත්තේ මෙරමාත් සදහම් ඇසීමෙහි සමාදන් කරවා ද, තෙමේත් ඇසූ දහම් දැරීම ස්වභාව කොට ඇත්තේ මෙරමාත් දහම් දැරීමෙහි සමාදන් කරවා ද තෙමේත් දැරූ දහම් පිළිබඳ අරුත් පිරික්සන්නේ මෙරමාත් අරුත් පිරික්සීමෙහි සමාදන් කරවා ද තෙමේත් අරුත් දැන දහම් දැන ධර්මානුධර්මප්‍රතිපන්න වූයේ මෙරමාත් ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි සමාදන් කරවා ද, මහානාමය, මෙ පමණෙකින් ම උපාසක තෙමේ තමනට හිත පිණිසත් අනුනට හිත පිණිසත් පිළිපන්නේ වේ ය යි.

## 8. 1. 3. 6

## ජීවක සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ජීවක වෙදහු ගේ අඹවනයෙහි වැඩ වසන සේක. එකල්හි කොමාරභච්ච ජීවක භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හින, එකත්පසෙක හුන් කොමාරභච්ච ජීවක භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේ ය:

වහන්ස, කො පමණෙකින් උපාසකයෙක් වේ ද?

ජීවකය, යම් දිනෙක පටන් බුදුරජුන් සරණ ගියේ වේ ද, දහම් සරණ ගියේ වේ ද, සඟුන් සරණ ගියේ වේ ද, ජීවක මෙ පමණකින් ම උපාසකයෙක් වේ යයි.

වහන්ස, කොපමණෙකින් උපාසක සිල් ඇත්තේ වේ ද:

ජීවකය, යම් දිනෙක පටන් උපාසක තෙමේ පණිවායෙන් වැළකුණේ වේ ද,... මදයට හා ප්‍රමාදයට කරුණු වූ රහමෙර පානයෙන් වැළකුණේ වේ ද, ජීවක, මෙ පමණකින් ම උපාසක සිල් ඇත්තේ වෙයි.

කිත්තාවතා පන භන්තෙ, උපාසකො අත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතායාති:

යතො ඛො ජීවක, උපාසකො අත්තනා සද්ධාසම්පන්නො හොති නො පරං සද්ධාසම්පදාය සමාදපෙති -පෙ- අත්තනා අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, නො පරං ධම්මානුධම්මපටිපත්තියා සමාදපෙති. එත්තාවතා ඛො ජීවක, උපාසකො අත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතායාති.

කිත්තාවතා පන භන්තෙ, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය චාති:

යතො ඛො ජීවක, උපාසකො අත්තනා ච සද්ධාසම්පන්නො හොති, පරඤ්ච සද්ධාසම්පදාය සමාදපෙති. අත්තනා ච සීලසම්පන්නො හොති, පරඤ්ච සීලසම්පදාය සමාදපෙති. අත්තනා ච චාගසම්පන්නො හොති, පරඤ්ච චාගසම්පදාය සමාදපෙති. අත්තනා ච භික්ඛූනං දස්සනකාමො හොති, පරඤ්ච භික්ඛූනං දස්සනෙ සමාදපෙති. අත්තනා ච සද්ධම්මං සොතුකාමො හොති, පරඤ්ච සද්ධම්මසවණෙ සමාදපෙති අත්තනා ච සුතානං ධම්මානං ධාරණජාතිකො හොති, පරඤ්ච ධම්මධාරණාය සමාදපෙති. අත්තනා ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛී හොති, පරඤ්ච අත්ථූපපරික්ඛාය සමාදපෙති. අත්තනා ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, පරඤ්ච ධම්මානුධම්මපටිපත්තියා සමාදපෙති එත්තාවතා ඛො ජීවක, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති, පරහිතාය චාති.

## 8. 1. 3. 7

## බල සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමානි භික්ඛවෙ, බලානි, කතමානි අට්ඨ: රුණ්ණබලා භික්ඛවෙ, දාරකා, කොධබලො මාතුගාමො, ආවුධබලා චොරා, ඉස්සරියබලා රාජානො, උජ්ඣත්තිබලා බාලා, නිජ්ඣත්තිබලා[1] පණ්ඩිතා, පටිසඞ්ඛානබලා බහුස්සුතා, ඛන්තිබලා සමණබ්‍රාහ්මණා, ඉමානි ඛො භික්ඛවෙ, අට්ඨබලානීති.

1. නිජ්ඣානත්තිබලා - සිමු.

වහන්ස, කොපමණෙකින් උපාසක තමහට හිත පිණිස පිළිපන්නේ අනුනට හිත පිණිස නො පිළිපන්නේ වේ ද?

ජීවකය, යම් දිනෙක පටන් උපාසක තෙමේ සැදැහැයෙන් යුතු වූයේ මෙරමා ශ්‍රද්ධාසම්පත්තියෙහි සමාදන් නො කරවා ද,... තෙමේ අරුත් දැන දහම් දැන ධර්මානුධර්මප්‍රතිපන්න වූයේ මෙරමා ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි සමාදන් නො කරවා ද, ජීවකය, මෙපමණෙකින්ම උපාසක තෙමේ තමනට හිත පිණිස පිළිපන්නේ අනුනට හිත පිණිස නො පිළිපන්නේ වෙයි.

වහන්ස, උපාසක තෙමේ කොපමණෙකින් තමනට හිත පිණිස පිළිපන්නේත් අනුනට හිත පිණිස පිළිපන්නේත් වේ ද?

ජීවකය, යම් දිනෙක පටන් උපාසක තෙමේත් සැදැහැයෙන් යුක්ත වූයේ මෙරමාත් ශ්‍රද්ධාසම්පත්තියෙහි සමාදන් කරවා ද, තෙමේත් ශීලයෙන් යුක්ත වූයේ මෙරමාත් ශීලසම්පත්තියෙහි සමාදන් කරවා ද, තෙමේත් ත්‍යාගයෙන් යුතු වූයේ මෙරමාත් ත්‍යාගසම්පත්තියෙහි සමාදන් කරවා ද තෙමේත් මහණුන් දකිනු කැමැත්තේ මෙරමාත් මහණුන් දකිනු කැමැත්තෙහි සමාදන් කරවා ද, තෙමේත් සදහම් අසනු කැමැත්තේ මෙරමාත් සදහම් ඇසීමෙහි සමාදන් කරවා ද, තෙමේත් ඇසූ දහම් දැරීම ස්වභාවය කොට ඇත්තේ මෙරමාත් දහම් දැරීමෙහි සමාදන් කරවා ද, තෙමේත් දැරූ දහම් පිළිබඳ අරුත් පිරික්සන්නේ මෙරමාත් අරුත් පිරික්සීමෙහි සමාදන් කරවා ද, තෙමේත් අරුත් දැන දහම් දැන ධර්මානුධර්ම ප්‍රතිපන්න වූයේ මෙරමාත් ධර්මානුධර්මප්‍රතිපත්තියෙහි සමාදන් කරවා ද ජීවක, මෙපමණෙකින් ම උපාසක තෙමේ තමනට හිත පිණිසත් අනුනට හිත පිණිසත් පිළිපන්නේ වෙයි.

## 8. 1. 3. 7
## බල සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ බල අටෙකි. කවර අටෙකැ යත්: මහණෙනි, ළදරුවෝ හැඬීම බල කොට ඇත්තෝ ය, මාගම ක්‍රෝධය බල කොට ඇත්තී ය. අඥානයෝ උදාසවීම (ක්‍රොධචිත්තය ම දැඩි ව ගැනීම) බල කොට ඇත්තෝ ය, පණ්ඩිතයෝ වැඩ අවැඩ නිශ්චය කොට අවබෝධ කර වීම බලකොට ඇත්තෝ ය. බහුශ්‍රැතයෝ පස්විකුම බලකොට ඇත්තෝ ය, මහණබමුණෝ ඉවසීම බල කොට ඇත්තෝ ය. මහණෙනි, මේ අට බලයෝ වෙති යි.

## 8. 1. 3. 8

## ඛීණාසවබල සුත්තං

[සාවත්ථිනිදානං]

අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච:

කති නුඛො සාරිපුත්ත, ඛීණාසවස්ස භික්ඛුනො බලානි, යෙහි බලෙහි සමන්නාගතො ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවාති?

අට්ඨ භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො බලානි යෙහි බලෙහි සමන්නාගතො ඛීණාසවො ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවාති. කතමානි අට්ඨ:

1. ඉධ භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, යම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, ඉදම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවාති.

2. පුනචපරං භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, යම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, ඉදම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවාති.

3. පුන ච පරං භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං වවකට්ඨං[1] නෙක්ඛම්මාභිරතං ව්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානීයෙහි ධම්මෙහි, යම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං වවකට්ඨං නෙක්ඛම්මාභිරතං ව්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානීයෙහි ධම්මෙහි, ඉදම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවාති.

---

1. විවෙකට්ඨං -මජසං

## 8. 1. 3. 8
## ඛීණාසවබල සූත්‍රය

[සැවැත්නිදාන යි]

එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

ශාරිපුත්‍රය, යම් බලයන්ගෙන් යුක්ත වූ රහත් මහණ මාගේ ආස්‍රවයෝ ගෙවී ගියහ යි ආස්‍රවයන්ගේ ක්ෂයවීම පිළිණ කෙරේ ද, රහත් මහණහුගේ (එබඳු) බල කෙතෙක් ද?

වහන්ස, යම් බලයන්ගෙන් යුතු රහත් මහණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ යි ආස්‍රවයන්ගේ ක්ෂයවීම පිළිණ කෙරේ ද, රහත් මහණ හුගේ (එබඳු) බල අටෙකි. කවර අටෙක යත්:

1. වහන්ස, මෙ සස්නෙහි රහත් මහණහු විසින් අනිත්‍ය වශයෙන් සියලු සංස්කාරයෝ තත්වූ පරිද්දෙන් මනානුවණින් මොනවට දක්නා ලද්දහු වෙත්. වහන්ස, රහත් මහණ තෙමේ යම් බලයකට පැමිණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ යි ආස්‍රවයන්ගේ ක්ෂයවීම පිළිණ කෙරේ ද, මෙ ද රහත් මහණහුගේ බලයෙක් වෙයි.

2. තවද, වහන්ස, රහත් මහණහු විසින් කාමයෝ අඟුරු වළක් උපමා කොට ඇතියහ යි තත් වූ පරිද්දෙන් මනානුවණින් මොනවට දක්නා ලද්දහු වෙත්. වහන්ස, රහත් මහණහු විසින් යම් හෙයෙකින් කාමයෝ අඟුරුවළක් උපමා කොට ඇතියහ යි තත්වූ පරිද්දෙන් මනා නුවණින් මොනවට දක්නා ලද්දහු වෙත් ද, යම් බලයකට පැමිණ රහත් මහණ තෙමේ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ යි (ගෙවී ගියහ යි) ආස්‍රවයන්ගේ ක්ෂය වීම පිළිණ කෙරේ ද, වහන්ස, මෙ ද රහත් මහණහුගේ බලයෙක් වෙයි.

3. තවද වහන්ස, රහත් මහණහුගේ සිත (පලසමවත් විසින්) විවේකයට. (නිවනට) නැඹුරු වූයේ විවේකයට (නිවනට) අවනත වූයේ විවේකයට (නිවනට) බර වූයේ කෙලෙසුන්ගෙන් දුරු වූයේ පැවිද්දෙහි මොනවට ඇලුණේ හැම අයුරින් ම ආස්‍රවයනට කරුණුවූ ධර්මයන් හා සමඟ ඇලුම් රහිත වූයේ හෙවත් සියලු ත්‍රෛභූමකධර්මයන්ගෙන් විගතාන්ත වූයේ වේ. වහන්ස, රහත් මහණ තෙමේ යම් බලයකට පැමිණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ යි ආස්‍රවයන්ගේ ක්ෂයවීම පිළිණ කෙරේ ද, මෙ ද රහත් මහණ හුගේ බලයෙක් වෙයි.

4. පුනචපරං භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා. යම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා, ඉදම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති, ඛීණා මෙ ආසවාති.

5-8 පුනචපරං භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො ඉද්ධිපාද භාවිතා හොන්ති සුභාවිතා -පෙ- පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි -පෙ- සත්තබොජ්ඣඞ්ගා භාවිතා හොන්ති සුභාවිතා -පෙ- අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො, යම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො, ඉදම්පි භන්තෙ, ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවාති.

ඉමානි ඛො භන්තෙ, අට්ඨ ඛීණාසවස්ස භික්ඛුනො බලානි, යෙහි බලෙහි සමන්නාගතො ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවාති.

## 8. 1. 3. 9

## අක්ඛණ සුත්තං

[සාවත්ථිනිදානං]

ඛණකිච්චො ලොකො ඛණකිච්චො ලොකොති භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො භාසති, නො ච ඛො සො ජානාති ඛණං වා අක්ඛණං වා. අට්ඨිමෙ භික්ඛවෙ, අක්ඛණා අසමයා බ්‍රහ්මචරියවාසාය. කතමෙ අට්ඨ:

1. ඉධ භික්ඛවෙ, තථාගතො ච ලොකෙ උප්පන්නො හොති අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. ධම්මො ච දෙසියති ඔපසමිකො පරිනිබ්බායිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො, අයං ච පුග්ගලො නිරයං උපපන්නො හොති. අයං භික්ඛවෙ, පඨමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

4. තවද, වහන්ස, රහත් මහණහු විසින් සතර සිව්වටන්හු වඩනා ලද්දහු මොනොවට වඩනා ලද්දහු වෙති. වහන්ස, යම් හෙයෙකින් රහත් මහණහු විසින් සතර සිවටන්හු වඩනා ලද්දහු මොනවට වඩනා ලද්දහු වෙත් ද, වහන්ස, රහත් මහණ තෙමේ යම් බලයකට පැමිණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ යි ආස්‍රවයන් ගේ ක්ෂයවීම පිළිණ කෙරේ ද, මෙ ද රහත් මහණහු ගේ බලයෙක් වෙයි.

5–8 තවද, වහන්ස, ක්ෂීණාස්‍රව මහණහු විසින් සතර ඍද්ධිපාදයෝ භාවිත වූවාහු සුභාවිත වූවාහු වෙත් ... පඤ්චඉන්ද්‍රියයෝ භාවිත වූවා හු සුභාවිත වූවාහු වෙත්... සප්තබොධ්‍යඞ්ගයෝ භාවිත වූවාහු සුභාවිත වූවාහු වෙත්.... අටහෙකින් යුතු ආර්‍ය වූ මාර්ගය භාවිත වූයේ සුභාවිත වූයේ වෙයි. වහන්ස, යම් හෙයෙකින් රහත් මහණහු විසින් ආර්‍ය වූ අෂ්ටාඞ්ගිකමාර්ගය වඩනලද්දේ මොනොවට වඩනලද්දේ වේ ද, යම් බලයකට පැමිණ රහත් මහණ තෙමේ මාගේ ආස්‍රවයෝ ක්ෂය වූහ යි ආස්‍රවයන්ගේ ක්ෂයවීම පිළිණ කෙරේ ද, මෙ ද රහත් මහණහුගේ බලයෙක් වෙ.

වහන්ස, යම් බලයන්ගෙන් සමන්වාගත රහත් මහණ තෙමේ මාගේ ආස්‍රවයෝ ක්ෂය වූහයි ආස්‍රවයන්ගේ ක්ෂය වීම පිළිණ කෙරේ ද, ක්ෂීණාස්‍රව මහණ හට මේ අට බලයෝ වෙති යි.

## 8. 1. 3. 9
## අක්ඛණ සූත්‍රය

[ධැවැත්නිදන යි]

මහණෙනි, ඇසූ පිරූ තැන් නැති පුහුදුන් තෙමේ ලෝකය ක්ෂණක්‍රාත්‍ය ඇත්තේ ය, (අවකාශ ලැබැ ම කරන කිස ඇත්තේ ය) ක්ෂණ ක්‍රාත්‍ය ඇත්තේ ය යි කියයි. ඉහතෙමේ ක්ෂණය (අවකාශය) හෝ අක්ෂණය (අනවකාශය) හෝ නො දනියි. මහණෙනි, බඹසර විසීමට අනවකාස අකාල මේ අටෙක් වෙයි. කවර අටෙක යත්:

2. මහණෙනි, අර්හත් වූ සම්මාසම්බුද්ධ වූ අෂ්ටවිද්‍යා පසළොස්වරණ ධර්මයන්ගෙන් යුක්ත වූ සුගත වූ ලෝකවිදු වූ අනුත්තර පුරුෂදම්‍යසාරථී වූ දෙව්මිනිස්නට ශාස්තෘ වූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් තථාගත තෙමේ ලොකයෙහි උපන්නේ වෙයි. කෙලෙස් සන්හිඳුවන්නා වූ කෙලෙස් පිරිනිවීම කරන්නා වූ (චතුර්මාර්ගඥාන සඞ්ඛ්‍යාත) සම්බොධිය කරා යන්නා වූ සුගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්ද වූ ධර්මය ද දෙසනු ලැබේ. (එකල) මේ පුහල් තෙමේ ද නිරයෙහි උපන්නේ වෙයි. මහණෙනි, බඹ සර විසීමට මේ පළමු වන අනවකාශය වේ අකාලය වේ.

2. පුනචපරං භික්ඛවෙ තථාගතො ච ලොකෙ උප්පන්නො හොති -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. ධම්මො ච දෙසියති -පෙ- සුගතප්පවෙදිතො, අයඤ්ච පුග්ගලො තිරච්ඡානයොනිං උපපන්නො හොති. අයං භික්ඛවෙ දුතියො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

3. පුනචපරං භික්ඛවෙ තථාගතො ච ලොකෙ උප්පන්නො හොති -පෙ- ධම්මො ච දෙසියති -පෙ- අයඤ්ච පුග්ගලො පෙත්තිවිසයං උපපන්නො හොති. අයං භික්ඛවෙ තතියො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

4. පුනචපරං භික්ඛවෙ තථාගතො ච ලොකෙ උප්පන්නො හොති -පෙ- ධම්මො ච දෙසියති -පෙ- අයඤ්ච පුග්ගලො අඤ්ඤතරං දීඝායුකං දෙවනිකායං උපපන්නො හොති. අයං භික්ඛවෙ චතුත්ථො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

5. පුනචපරං භික්ඛවෙ තථාගතො ච ලොකෙ උප්පන්නො හොති -පෙ- ධම්මො ච දෙසියති -පෙ- අයඤ්ච පුග්ගලො පච්චන්තිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති අවිඤ්ඤාතාරෙසු මිලක්ඛෙසු. යත්ථ නත්ථි ගති භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. අයං භික්ඛවෙ පඤ්චමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

6. පුනචපරං භික්ඛවෙ තථාගතො ච ලොකෙ උප්පන්නො හොති -පෙ- ධම්මො ච දෙසියති -පෙ- අයඤ්ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති මිච්ඡාදිට්ඨිකො විපරීතදස්සනො නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො නත්ථි පරො ලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඕපපාතිකා නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. අයං භික්ඛවෙ ඡට්ඨො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

2. තවද මහණෙනි,... දෙව්මිනිස්නට ශාස්තෲවූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් තථාගත තෙමේ ද ලෝකයෙහි උපන්නේ වේ ... සුගතයන් වහන්සේ විසින් වදරන ලද ධර්මය ද දෙසනු ලැබේ. මේ පුඟුල් තෙමේ ද තිරිසන් යොන්හි උපන්නේ වෙයි. මහණෙනි, බ්‍රහ්මචරියවාසයට මේ දෙවන අනවකාශය වේ. අකාලය වේ.

3. තවද මහණෙනි,... දෙව්මිනිස්නට ශාස්තෘවූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් තථාගත තෙමේ ද ලෝකයෙහි උපන්නේ වෙයි. ... සුගත ප්‍රවේදිත ධර්මය ද දෙසනු ලැබේ. මේ පුඟුල් තෙමේද ප්‍රෙත විෂයෙහි උපන්නේ වෙයි. මහණෙනි, බඹසර විසුමට මේ තෙවන අනවකාශය වේ. අකාලය වේ.

4. තවද මහණෙනි, ... දෙව්මිනිස්නට ශාස්තෘ වූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් තථාගත තෙමේ ද ලොකයෙහි උපන්නේ වෙයි. ... සුගතයන් වහන්සේ විසින් ප්‍රකාශිත ධර්මය ද දෙසනු ලැබේ. මේ පුඟුල් තෙමේ ද දීර්ඝායුෂ ඇති එක්තරා දේවනිකායයෙක්හි (අසංඥතලයෙහි) උපන්නේ වෙයි. මහණෙනි, බඹසර විසුමට මේ සිවුවන අනවකාශය වේ. අකාලය වේ.

5. තවද මහණෙනි,... දෙව්මිනිස්නට ශාස්තෘ වූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් තථාගත තෙමේ ද ලෝකයෙහි උපන්නේ වෙයි... සුගත ප්‍රවේදිත ධර්මය ද දෙසනු ලැබේ. මේ පුඟුල් තෙමේ ද මහණුන්ගේ මෙහෙණන් ගේ උවසුවන්ගේ උවැසියන්ගේ හසරෙක් යම් තැනෙක නැති ද, එබඳු වූ අතිශයඅඥ වූ මිලෙච්ඡ වූ ප්‍රත්‍යන්තජනපදයන්හි උපන්නේ වෙයි. මහණෙනි, බඹසර විසීමට මේ පස්වන අනවකාශය වේ. අකාලය වේ.

6. තවද මහණෙනි,... දෙව්මිනිස්නට ශාස්තෘ වූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් තථාගත තෙමේ ද ලෝකයෙහි උපන්නේ වෙයි.... සුගතයන් වහන්සේ විසින් පවසන ලද ධර්මය ද දෙසනු ලැබේ. මේ පුඟුල් තෙමේ ද මධ්‍යමජනපදයෙහි උපන්නේ දෙන ලද්දෙහි විපාක නැත, මහායාග යෙහි විපාක නැත, අමුත්තනට පිළියෙළ කළ සත්කාරයෙහි විපාක නැත, සුකෘතදුෂ්කෘත කර්මයන් ගේ (කුසලාකුසලයන්ගේ) පලයෙක් විපාක යෙක් නැත, (පරලොව සිටියහුට) මෙලොවක් නැත, (මෙලොව සිටිය-හුට) පරලොවක් නැත, මවු නැත, පියා නැත, (මවුපියනට කළ යහපත් අයහපත් පිළිවෙතින් පලවිපාක නැතැ යි සේ යි.) ඕපපාතික සත්ත්වයෝ නැත, යමෙක් මෙලොව ද පරලොව ද තුමූ අභිවිශිෂ්ටඥානයෙන් පසක් කොට කියත් නම් (එබඳු) මනා මඟෙහි ගිය සම්‍යක්ප්‍රතිපන්න මහණ-බමුණෝ ලොකයෙහි නැතැයි විපරීත දැකුම් ඇති මිසදිටුවෙක් වේ. මහණෙනි, බඹසර විසුමට මේ සවන අනවකාශය වේ. අකාලය වේ.

7. පුනචපරං භික්ඛවෙ තථාගතො ච ලොකෙ උප්පන්නො හොති -පෙ- ධම්මො ච දෙසියති -පෙ- අයඤ්ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති. සො ච හොති දුප්පඤ්ඤො ජළො එළමූගො. න පටිබලො සුභාසිත දුබ්භාසිතස්ස අත්ථමඤ්ඤාතුං. අයං භික්ඛවෙ සත්තමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය.

8. පුනචපරං භික්ඛවෙ, තථාගතො ච ලොකෙ අනුප්පන්නො හොති අරහං සම්මාසම්බුද්ධො -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. ධම්මො ච න දෙසියති ඔපසමිකො පරිනිබ්බායිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො, අයඤ්ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති. සො ච හොති පඤ්ඤවා අජළො අනෙළමූගො පටිබලො සුභාසිත දුබ්භාසිතස්ස අත්ථමඤ්ඤාතුං. අයං භික්ඛවෙ, අට්ඨමො අක්ඛණො අසමයො බ්‍රහ්මචරියවාසාය. ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ අක්ඛණා අසමයා බ්‍රහ්මචරියවාසාය.

එකොව භික්ඛවෙ, ඛණො ච සමයො ච බ්‍රහ්මචරියවාසාය. කතමො එකො: ඉධ භික්ඛවෙ, තථාගතො ච ලොකෙ උප්පන්නො හොති, අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. ධම්මො ච දෙසියති ඔපසමිකො පරිනිබ්බායිකො සම්බොධගාමී සුගතප්පවෙදිතො. අයඤ්ච පුග්ගලො මජ්ඣිමෙසු ජනපදෙසු පච්චාජාතො හොති, සො ච හොති පඤ්ඤවා අජළො අනෙළමූගො පටිබලො සුභාසිත දුබ්භාසිතස්ස අත්ථමඤ්ඤාතුං. අයං භික්ඛවෙ, එකොව ඛණො ච සමයො ච බ්‍රහ්මචරිය වාසායාති.

1. මනුස්සලාභං ලද්ධාන සද්ධම්මෙ සුප්පවෙදිතෙ,
යෙ ඛණං නාධිගච්ඡන්ති අතිනාමෙන්ති තෙ ඛණං.

2. බහූ හි අක්ඛණා වුත්තා මග්ගස්ස අන්තරායිකා,
කදාචි කරහචි ලොකෙ උප්පජ්ජන්ති තථාගතා.

3. තයිදං සම්මුඛීභූතං යං ලොකස්මිං සුදුල්ලභං,
මනුස්සපටිලාභො ච සද්ධම්මස්ස ච දෙසනා
අලං වායමිතුං තත්ථ අත්තකාමෙන ජන්තුනා.

7. තවද, මහණෙනි,... දෙවිමිනිසුන්ට ශාස්තෘවූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් තථාගත තෙමේ ද ලොව උපන්නේ වේ... සුගතප්‍රවේදිත ධර්මය ද දෙසනු ලැබෙයි. මේ පුඟුල් තෙමේ ද මධ්‍යමජනපදයෙහි උපන්නේ වෙයි. හෙතෙමේ ද මුළු වූ කෙළ තොලු වූ සුභාෂිත දුර්භාෂිතයන්හු ගේ අරුත් දන්නට අසමත් වූ දුෂ්ප්‍රාඥයෙක් වේ. මහණෙනි, මෙ බඹසර විසුමට සත්වන අනවකාශය යි, අකාලය යි.

8. තවද, මහණෙනි, අර්හත් වූ සම්මාසම්බුද්ධ වූ... දෙවිමිනිසුනට ශාස්තෘ වූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් වූ තථාගත තෙමේ ද ලෝකයෙහි නූපන්නේ වෙයි. කෙලෙස් සන්හිඳුවන්නා වූ කෙලෙස් පිරිනිවන්නා වූ සම්බොධියට යන සුලු වූ සුගතයන් වහන්සේ විසින් පවසන ලද ධර්මය ද නො දෙසනු ලැබේ. මේ පුද්ගල තෙමේ ද මධ්‍යම ජනපදයෙහි උපන්නේ වේ. හෙතෙමේ ද නුවණැත්තේ අජඩ වූයේ කෙලතොලු නො වූයේ සුභාෂිත දුර්භාෂිතයන්හුගේ අරුත් දනීමෙහි ප්‍රතිබල වූයේ වේ. මහණෙනි, බඹසර විසුමට මේ අටවැනි වූ අනවකාශය වේ. අකාලය වේ. මහණෙනි, බඹසර විසුමට මෙ අනවකාශයෝ අකාලයෝ අට දෙන වෙත්.

මහණෙනි, බඹසර විසුමට එකම අවකාශයෙක් ද කාලයෙක් ද වේ. කවර එකෙක යත්: මහණෙනි, අර්හත් වූ සම්මාසම්බුද්ධ වූ අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ සුගත් වූ ලොකවිදූ වූ අනුත්තර පුරිසදම්ම සාරථි වූ දෙවිමිනිසුනට ශාස්තෘ වූ සිවුසස් පිළිවිදි භාග්‍යවත් වූ තථාගත තෙමේ ද මේ ලෝකයෙහි උපන්නේ වේ. කෙලෙස් සන්හිඳුවන කෙලෙස් පිරිනිවන චතුර්මාර්ගඥානාවබොධයට පමුණුවන සුගතප්‍රවේදිත ධර්මය ද දෙසනු ලැබේ. මේ පුද්ගල තෙමේ ද මධ්‍යම ජනපදයෙහි උපන්නේ වේ. හෙතෙමේ ද නුවණැත්තේ අජඩ වූයේ කෙලතොලු නො වූයේ සුභාෂිත දුර්භාෂිතයන්හුගේ අරුත් දනුමෙහි ප්‍රතිබල වූයේ වේ. මහණෙනි, මේ බඹසර විසුමට එක ම අවකාශය ද කාලය ද වේ.

1. යම් කෙනෙක් මනුෂ්‍යාත්ම භාවය ලැබ මැනැවින් දෙසූ සදහම්හි අවකාශය නො ලබත් ද, ඔහු අවකාශය (ක්ෂණය) ඉක්මවා යෙත්.

2. මාර්ගයට අන්තරායකර වූ බොහෝ අනවකාශයෝ වදරන ලදහ, තථාගතයෝ කිසියම් කලෙක ලෙව්හි උපදිත්.

3. මිනිසත් බව ලැබීම ද සදහම් දෙසීම ද යන යමක් ලොව අතිශය දුර්ලභ වේ ද, මෙය ඔහුට හමු විය. එහි ලා හිත කැමති මිනිසා විසින් වැයම් කිරීමට සුදුසු ය.

4. කථං විජඤ්ඤු සද්ධම්මං ඛණො වෙ මා උපච්චගා,
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා.

5. ඉධ චෙව නං විරාධෙති සද්ධම්මස්ස නියාමතං,
වාණිජොව අතීතත්ථො චිරත්තං අනුතප්පෙස්සති.

6. අවිජ්ජානිවුතො පොසො සද්ධම්මං අපරාධිකො,
ජාතිමරණසංසාරං චිරං පච්චනුභොස්සති.

7. යෙ ච ලද්ධා මනුස්සත්තං සද්ධම්මෙ සුප්පවෙදිතෙ,
අකංසු සත්ථු වචනං කරිස්සන්ති කරොන්ති වා.

8. ඛණං පච්චවිදුං ලොකෙ බ්‍රහ්මචරියං අනුත්තරං,
යෙ මග්ගං පටිපජ්ජිංසු තථාගතප්පවෙදිතං.

9. යෙ සංවරා චක්ඛුමතා දෙසිතාදිච්චබන්ධුනා,
තෙසු ගුත්තො සදා සතො විහරෙ අනවස්සුතො.

10. සබ්බෙ අනුසයෙ ඡෙත්වා මාරධෙය්‍ය සරානුගෙ,
තෙ වෙ පාරගතා ලොකෙ යෙ පත්තා ආසවක්ඛයන්ති.

## 8. 1. 3. 10

### අනුරුද්ධ සුත්තං

එකං සමයං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා අනුරුද්ධො චෙතීසු විහරති පාචීනවංසදායෙ. අථ ඛො ආයස්මතො අනුරුද්ධස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි:

4. සදහම් දෙසුම දැන ගත්තේ ය. අවකාශය නහමක් ඉක්ම යේ වා ඉකුත් අවකාශ ඇත්තෝ නිරයෙහි උපන්නාහු ශොක කෙරෙත් මැයි.

5. මෙලොවෙහි ම (ඒ ක්ෂණය ලබා) සද්ධර්ම නියාම සඞ්ඛ්‍යාත වූ ඒ ආර්‍ය්‍ය මාර්ගය වරදවා ගනී (නම්) පිරිහුණු ධන ඇති වෙළෙඳකු මෙන් බොහෝ කලක් තැවෙන්නේ ය.

6. සද්ධර්මය වරදවා ගත් අවිද්‍යාවෙන් ඇවුරුණු පුරුෂ තෙමේ ජාතිමරණ සඞ්ඛ්‍යාත සංසාරදුක්ඛය බොහෝ කලක් විඳින්නේ ය.

7. යම් කෙනෙක් මනා කොට දෙසූ දහම් පවත්නා කල්හි මිනිසත් බව ලැබ ශාස්තෲශාසනය කළාහු ද කෙරෙත් ද කරන්නාහු ද

8. යම් කෙනෙක් ලෝකයෙහි අනුත්තර වූ බ්‍රහ්මචර්‍ය්‍ය සඞ්ඛ්‍යාත ක්ෂණය ප්‍රතිවේධ කළාහු ද ඔහු තථාගතයන් වහන්සේ විසින් දෙසන ලද මඟට පිළිපන්හ.

9. පසැස් ඇති ආදිත්‍යබන්ධු වූ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් සංවර කෙනෙක් දෙසන ලද්දාහු ද, එහි සංවෘත වූයේ හැම කල්හි සිහි ඇත්තේ කෙලෙසුන්ගෙන් තො තෙත් වූයේ වාස කරන්නේ ය.

10. යම් කෙනෙක් ලෝකයෙහි මාරධෙය්‍ය සඞ්ඛ්‍යාත සංසාරය අනුව යන සියලු අනුසයයන් සිඳ රහත් ඵලයට පැමිණියාහු ද ඔහු ඒකාන්තයෙන් නිවනට පත්වූවෝ වෙති යි.

## 8. 1. 3. 10

## අනුරුද්ධ සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භග්ග ජනපදයෙහි සුංසුමාර ගිර නගරය අසල භේසකලාවන නම් මුවවනෙහි වැඩ වෙසෙන සේක. එ සමයෙහි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ චෙතී දනව්වෙහි (බුදුරදුන් වැඩහුන් තැනින්) පෙරදිගෙහි වූ හුණ වෙනෙහි වෙසෙති. ඉක්බිති රහසිගත වූ එකලාව හුන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ගේ සිත්හි මෙ බඳු අදහසෙක් (මහා පුරුෂ විතර්කයෙක්) පහළ විය;

අප්පිච්ඡස්සායං ධම්මො නායං ධම්මො මහිච්ඡස්ස, සන්තුට්ඨස්සායං ධම්මො නායං ධම්මො අසන්තුට්ඨස්ස, පවිවිත්තස්සායං ධම්මො නායං ධම්මො සඞ්ගණිකාරාමස්ස. ආරද්ධ විරියස්සායං ධම්මො නායං ධම්මො කුසීතස්ස, උපට්ඨිතසතිස්සායං ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්ස, සමාහිතස්සායං ධම්මො නායං ධම්මො අසමාහිතස්ස, පඤ්ඤවතො අයං ධම්මො, නායං ධම්මො දුප්පඤ්ඤස්සාති.

අථ ඛො භගවා ආයස්මතො අනුරුද්ධස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව භග්ගෙසු සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ අන්තරහිතො චෙතීසු පාචීනවංසදායෙ ආයස්මතො අනුරුද්ධස්ස සම්මුඛෙ පාතුරහොසි.

නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ, ආයස්මාපි ඛො අනුරුද්ධො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං අනුරුද්ධං භගවා එතදවොච: සාධු සාධු අනුරුද්ධ, සාධු ඛො ත්වං අනුරුද්ධ, යං තං මහාපුරිසවිතක්කං විතක්කෙසි: අප්පිච්ඡස්සායං ධම්මො නායං ධම්මො මහිච්ඡස්ස, සන්තුට්ඨස්සායං ධම්මො නායං ධම්මො අසන්තුට්ඨස්ස, පවිවිත්තස්සායං ධම්මො නායං ධම්මො සඞ්ගණිකාරාමස්ස, ආරද්ධවිරියස්සායං ධම්මො නායං ධම්මො කුසීතස්ස, උපට්ඨිතසතිස්සායං ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්ස, සමාහිතස්සායං ධම්මො නායං ධම්මො අසමාහිතස්ස, පඤ්ඤවතො අයං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්සාති.

එනම්, මේ (නව ලොකොත්තර) ධර්මය (ලද ගුණ සැඟවීමෙන් ද පිළිගැනීමේ මාත්‍රඥතායෙන් ද) අල්පේච්ඡ යාහට ය. මේ ධර්මය මහේච්ඡයාට නොවේ. මේ ධර්මය (සිවුපසෙහි තෙවැදෑරුම් සන්තොසයෙන්) සතුටු වන්නහුට ය. මේ ධර්මය අසන්තුෂ්ටයාට නො වේ. මේ ධර්මය (කාය චිත්ත උපධිවිවේකයන්ගෙන්) ප්‍රවිවික්ත සිත් ඇතියහුට ය. මේ ධර්මය (ගණසඞ්ගණිකායෙහි හා ක්ලෙශසඞ්ගණිකායෙහි ඇලුණු) සඞ්ගණිකාරාමයාහට නො වේ. මේ ධර්මය (කායිකචෛතසික වසයෙන්) පටන්ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තහුට ය. මේ ධර්මය කුසීතයාහට නො වේ. මේ ධර්මය (සතර සතිපට්ඨාන වසයෙන්) එළැඹ සිටි සිහි ඇත්තහුට ය, මේ ධර්මය මුළා සිහි ඇත්තහුට නො වේ: මේ ධර්මය එකඟ සිත් ඇත්තහුට ය, මේ ධර්මය අසමාහිත සිත් ඇත්තහුට නොවේ. මේ ධර්මය (කර්මස්වක ප්‍රඥායෙන්) ප්‍රඥා ඇත්තහුට ය, මේ ධර්මය දුෂ්ප්‍රාඥයාට නො වේ යයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ගේ සිත්හි වූ පරිවිතර්කය තමන් වහන්සේගේ සිතින් දැන යම් සේ බලවත් පුරුෂයෙක් වක් කළ අතක් දිගු කරන්නේ ද, දික් කළ අතක් හකුළුවන්නේ ද, එසෙයින් භග්ගජනපදයෙහි සුංසුමාරගිර සමීපයෙහි භේසකලාවන නම් මුවවෙනෙහි අතුරුදන් වූසේක් චෙති ජනපදයෙහිවූ (දශබල වසනස්ථානයෙන්) පෙරදිගෙහි පිහිටි හුණවෙනෙහි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර යන් වහන්සේ හමුයෙහි පහළ වූ සේක.

භාග්‍යවතුන් වහන්සේ පැන වූ අස්නෙහි වැඩහුන් සේක. ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: 'අනුරුද්ධය, මැනව, මැනව, අනුරුද්ධය, මේ ධර්මය අල්පෙච්ඡයාට ය, මේ ධර්මය මහෙච්ඡයා ට නො වෙයි. මේ ධර්මය සන්තුෂ්ටයාට ය, මේ ධර්මය අසන්තුෂ්ටයාට නො වෙයි. මේ ධර්මය ප්‍රවිවික්තයාට ය, මේ ධර්මය සඞ්ගණිකාරාමයාට නො වෙයි. මේ ධර්මය ආරබ්ධ වීර්‍ය්‍ය ඇත්තහුට ය, මේ ධර්මය කුසීතයා ට නො වෙයි, මේ ධර්මය එළැඹ සිටි සිහි ඇත්තහුට ය, මේ ධර්මය මුළා සිහි ඇත්තහුට නො වෙයි. මේ ධර්මය සමාහිතයාට ය, මේ ධර්මය අසමාහිත යාට නොවෙයි. මේ ධර්මය ප්‍රඥාවත් හට ය. මේ ධර්මය දුෂ්ප්‍රාඥයාට නො වේ යයි තෙපි යම් මහාපුරුෂවිතර්කයක් විතර්කණය කරහු ද, එය මනා මැ යි.

නෙත හි ත්වං අනුරුද්ධ, ඉමම්පි අට්ඨමං මහාපුරිසවිතක්කං විතක්කෙහි: නිප්පපඤ්චාරාමස්සායං ධම්මො නිප්පපඤ්චරතිනො නායං ධම්මො පපඤ්චා-රාමස්ස පපඤ්චරතිනොති.

යතො ඛො ත්වං අනුරුද්ධ, ඉමෙ අට්ඨමහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි, තතො ත්වං අනුරුද්ධ, යාවදෙව ආකඞ්ඛිස්සසි විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරිස්සසි.

යතො ඛො ත්වං අනුරුද්ධ, ඉමෙ අට්ඨමහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි තතො ත්වං අනුරුද්ධ, යාවදෙව ආකඞ්ඛිස්සසි විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරිස්සසි.

යතො ඛො ත්වං අනුරුද්ධ, ඉමෙ අට්ඨමහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි තතො ත්වං අනුරුද්ධ, යාවදෙව ආකඞ්ඛිස්සසි, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරිස්සසි, සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදිස්සසි, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහරිස්සසි.

යතො ඛො ත්වං අනුරුද්ධ, ඉමෙ අට්ඨ මහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි, තතො ත්වං අනුරුද්ධ, යාවදෙව ආකඞ්ඛිස්සසි, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරිස්සසි.

යතො ඛො ත්වං අනුරුද්ධ, ඉමෙ ච අට්ඨමහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි, ඉමෙසඤ්ච චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨ-ධම්මසුඛවිහාරානං නිකාමලාභී භවිස්සසි, අකිච්ඡලාභී, අකසිරලාභී, තතො තුය්හං අනුරුද්ධ, සෙය්‍යථාපි නාම ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා නානාරත්තානං දුස්සානං දුස්සකරණ්ඩකො පූරො, එවමෙව තෙ පංසුකූලං චීවරානං ඛායිස්සති, සන්තුට්ඨස්ස විහරතො, රතියා අපරිතස්සාය, ඵාසුවිහාරය, ඔක්කමනාය නිබ්බානස්ස.

එසේ නම් අනුරුද්ධය, තෙපි මේ අටවැනි වූ මහා පුරුෂ විතර්කය ද විතර්කණය කරව:- මේ ධර්මය නිෂ්ප්‍රපඤ්චසඞ්ඛ්‍යාත නිවනෙහි ඇලුණහුට ය. මේ ධර්මය ප්‍රපඤ්චසඞ්ඛ්‍යාත තෘෂ්ණාමානදෘෂ්ටීන්හි ඇලුණහුට නො වේ ය කියායි.

අනුරුද්ධය, යම් කලෙක්හි වනාහි තෙපි මේ අෂ්ට මහාපුරුෂ විතර්කයන් විතර්කණය කරන්න හු ද, අනුරුද්ධය. එකල්හි තෙපි යම්තාක් කැමතිවන්නහු නම් (ඒතාක්) කාමයන්ගෙන් වෙන්ව ම අකුශලධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති ප්‍රථමධ්‍යානයට සම වැද වාසය කරන්නහු ය.

අනුරුද්ධය, යම් කලෙක්හි වනාහි තෙපි මේ අෂ්ට මහාපුරුෂවිතර්කයන් විතර්කණය කරන්නහු ද, අනුරුද්ධය, එකල්හි තෙපි යම්තාක් කැමැති වන්නහු නම් (ඒ තාක්) විතර්ක විචාරයන්ගේ ව්‍යුපසමයෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟබව ඇති විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීතිසුවය ඇති ද්විතියධ්‍යානයට සමවැද වාස කරන්නහුය.

අනුරුද්ධය, යම් කලෙක්හි වනාහි තෙපි මේ අෂ්ට මහාපුරුෂ විතර්කයන් විතර්කණය කරන්නහු ද, අනුරුද්ධය, එකල්හි තෙපි යම්තාක් කැමැති වන්නහු නම් (ඒතාක්) ප්‍රීතියගේ ද විරාගයෙන් උපේක්ෂා ඇත්තේ ම වාස කරන්නහු ය. සිහි ඇත්තේ ද සම්‍යක් ප්‍රඥා ඇත්තේ ද, සුවයත් කයින් පිළිවිඳින්නහු ය. ආර්‍ය්‍යයෝ යම් ධ්‍යානයක් හේතු කොට ඒ පුඟුලා උපේක්ෂා ඇත්තේ ය, සතියෙන් යුක්ත ය, සුවවිහරණ ඇත්තේය යි කියත් නම් (ඒ) තෘතීයධ්‍යානයට පැමිණ වාස කරන්නහු ය.

අනුරුද්ධ, තෙපි යම් කලෙක වනාහි මේ අෂ්ට මහා පුරුෂ විතර්කයන් විතර්කණය කරන්නහු ද, අනුරුද්ධය, එකල තෙපි යම්තාක් කැමැති වන්නහු නම් (ඒතාක්) සුවයාගේ ප්‍රහාණයෙන් ද දුඃඛයාගේ ප්‍රහාණයෙන් ද සොමනස් දොම්නස් දෙදෙනාගේ අස්තඞ්ගමයෙන් පෙරවුව ම දුක් නො වූ සුව නො වූ උපේක්ෂාස්මෘතීන්ගෙන් පිරිසිදු වූ චතුර්ථධ්‍යානයට සමවැද වාස කරන්නහු ය.

අනුරුද්ධය, තෙපි යම් කලෙක වනාහි මේ අෂ්ට මහාපුරුෂවිතර්කයන් විතර්කණය කරන්නහු නම් අධිචිත්තයට අයත් දිට්ඨධම්මයෙහි සුව විහරණය වූ මේ සතර ධ්‍යානයන් කැමතිසේ ලබන්නෙක් ද සැපසේ ලබන්නෙක් ද නිදුකින් ලබන්නෙක් ද වන්නහු නම් අනුරුද්ධය, එකල්හි තොපට ගැහැවියකුට හෝ ගැහැවිපුතකුට හෝ නොයෙක් පැහැයෙන් රඳනා ලද වතින් පිරුණු පිළීකරඩුයෙක් යම්සේ ද, එසේ ම යථාලාභසන්තෝෂයෙන් යුතුව වාස කරන්නා වූ තොපගේ ඇල්ම පිණිස (තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන්) නො පිරිනැවීම (අපරිත්‍රාසය–නො බිය වීම) පිණිස ඵාසුවිහරණය පිණිස නිවනට බැස ගැනීම පිණිස සිවුරු අවුරින් පවුල් සිවුර (මැනැවැයි) වැටහෙන්නේ ය.

යතො ඛො ත්වං අනුරුද්ධ, ඉමෙ ච අට්ඨමහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි, ඉමෙසඤ්ච චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨ-ධම්මසුඛවිහාරානං නිකාමලාභී භවිස්සසි, අකිච්ඡලාභී, අකසිරලාභී, තතො තුය්හං අනුරුද්ධ, සෙය්‍යථාපි නාම ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා සාලීනං ඔදනො විචිතකාළකො අනෙකසූපො අනෙකබ්‍යඤ්ජනො, එවමෙව තෙ පිණ්ඩියාලොපං භොජනානං ඛායිස්සති සන්තුට්ඨස්ස විහරතො රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය ඔක්කමනාය නිබ්බානස්ස.

යතො ඛො ත්වං අනුරුද්ධ ඉමෙ ච අට්ඨ මහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි, ඉමෙසඤ්ච චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්ම-සුඛවිහාරානං නිකාමලාභී භවිස්සසි අකිච්ඡලාභී අකසිරලාභී, තතො තුය්හං අනුරුද්ධ, සෙය්‍යථාපි නාම ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා කූටාගාරං උල්ලිත්තාවලිත්තං නිවාතං ඵුස්සිතග්ගළං[1] පිහිතවාතපානං, එවමෙව තෙ රුක්ඛමූලං සෙනාසනානං ඛායිස්සති සන්තුට්ඨස්ස විහරතො රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය ඔක්කමනාය නිබ්බානස්ස.

යතො ඛො ත්වං අනුරුද්ධ, ඉමෙ ච අට්ඨ මහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි, ඉමෙසඤ්ච චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්ම සුඛවිහාරානං නිකාමලාභී භවිස්සසි අකිච්ඡලාභී අකසිරලාභී, තතො තුය්හං අනුරුද්ධ, සෙය්‍යථාපි නාම ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා පල්ලඞ්කො ගොනකත්ථතො පටිකත්ථතො පටලිකත්ථතො කාදලිමිගපවරපච්චත්ථරණො සඋත්තරච්ඡදො උභතො ලොහිතකූපධානො, එවමෙව තෙ තිණසන්ථාරකො සයනාසනානං ඛායිස්සති සන්තුට්ඨස්ස විහරතො රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය ඔක්කමනාය නිබ්බානස්ස.

1. ඵුසිතග්ගලං - කත්ථචි.

අනුරුද්ධය, තෙපි යම් කලෙක්හි වනාහි මේ අෂ්ටමහාපුරුෂවිතර්කයන් ද විතර්කණය කරන්නහු නම් අධිචිත්තයට අයත් දිටුදැමියෙහි සුව විහරණය වූ මේ සතරධ්‍යානයන් කැමති සේ ලබන්නෙක් ද සැපසේ ලබන්නෙක් ද නිදුකින් ලබන්නෙක් ද වන්නහු නම් අනුරුද්ධය, එකල්හි තොපට ගැහැවියකුට හෝ ගැහැවිපුතකට හෝ නොයෙක් සූප ඇති නොයෙක් ව්‍යඤ්ජන ඇති බැහැර කළ කළුඇට ඇති හැල්බතක් යම්සේ ද, එසේ ම යථාලාභසන්තෝෂයෙන් යුතුව වාසය කරන්නා වූ තොපගේ ඇල්ම පිණිස (තෘෂ්ණාදෘෂ්ටීන්ගෙන්) නො පිරිතැවීම පිණිස සැප විහරණය පිණිස නිවනට බැසගැනීම පිණිස බොජුන් අතුරින් පිණ්ඩියාලෝපභෝජනය (මැනැවැයි) වැටහෙන්නේ ය.

අනුරුද්ධය, තෙපි යම් කලෙක පටන් මේ අෂ්ට මහාපුරුෂවිතර්කයන් ද විතර්කණය කරන්නහු නම් අධිචිත්තයට අයත් දිටුදැමියෙහි සුවවිහරණය වූ මේ සතර ධ්‍යානයන් ද කැමතිසේ ලබන්නෙක් ද සැපසේ ලබන්නෙක් ද නිදුකින් ලබන්නෙක් ද වන්නහු නම් අනුරුද්ධය, එතැන් පටන් තොපට, යම් සෙයෙකින් ගැහැවියකුට හෝ ගැහැවිපුතකුට හෝ ඇතුළත පිටත පිරියම් කරන ලද වළක්වන ලද වාතප්‍රවේශ ඇති පැහැසූ කවුළු ඇති පියන ලද දොර කවුළු ඇති කුළුගෙයක් මැනැවැයි වටහා ද, එසෙයින් යථාලාභසන්තෝෂයෙන් යුතුව වාසය කරන්නා වූ තොපගේ ඇල්ම පිණිස (තෘෂ්ණාදෘෂ්ටීන්ගෙන්) නො පිරිතැවීම පිණිස ඵාසුවිහරණය පිණිස නිවනට බැස ගැනීම පිණිස සෙනසුන් අතුරෙන් වෘක්ෂමූලය (මැනවැයි) වැටහෙන්නේ ය.

අනුරුද්ධය, තෙපි යම් කලෙක වනාහි මේ අෂ්ටමහාපුරුෂ විතර්කයන් ද විතර්කණය කරන්නහු නම් අධිචිත්තයට අයත් දිටුදැමියෙහි සුව විහරණ වූ මේ සතර ධ්‍යානයන් ද කැමැති සේ ලබන්නෙක් ද සැප සේ ලබන්නෙක් ද නිදුකින් ලබන්නෙක් ද වන්නහු නම් අනුරුද්ධය, එකල්හි තොපට ගැහැවියකුට හෝ ගැහැවිපුතකුට හෝ මහ කොදුපලස් අතුළ, සුදු එළුලොම් ඇතිරි අතුළ, ගනපුප් ඇතිරි අතුළ, කෙහෙල්මුව යම්න් කළ උතුම් ඇතිරි අතුළ, රතුඋඩුවියන් සහිත වූ දෙපස රතුකන්වයින් ඇති, පළඟෙක් යම්සේ වේ ද, එපරිද්දෙන් ම සන්තෝෂයෙන් වාස කරන තොපගේ ඇල්ම පිණිස නො පිරිතැවීම පිණිස ඵාසුවිහරණය පිණිස නිවනට බැස ගැනීම පිණිස සෙනසුන් අතුරෙන් තණ ඇතිරිය (මැනැවැ යි) වැටහෙන්නේ ය.

යතො ඛො ත්වං අනුරුද්ධ, ඉමෙ ච අට්ඨ මහාපුරිසවිතක්කෙ විතක්කෙස්සසි, ඉමෙසඤ්ච චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී භවිස්සසි අකිච්ඡලාභී අකසිරලාභී, තතො ත්වං අනුරුද්ධ, සෙය්‍යථාපි නාම ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා නානා භෙසජ්ජානි, සෙය්‍යථීදං: සප්පිනවනීතං තෙලං මධු ඵාණිතං. එවමෙව තෙ පූතිමුත්තභෙසජ්ජානං ඛාදිස්සති සන්තුට්ඨස්ස විහරතො රතියා අපරිතස්සාය ඵාසුවිහාරාය ඔක්කමනාය නිබ්බානස්ස.

තෙන හි ත්වං අනුරුද්ධ, ආයතිකම්පි වස්සාවාසං ඉධෙව චෙතීසු පාචීනවංසදායෙ විහරෙය්‍යාසීති. එවං භන්තෙති ඛො ආයස්මා අනුරුද්ධො භගවතො පච්චස්සොසි.

අථ ඛො භගවා ආයස්මන්තං අනුරුද්ධං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය, එවමෙව චෙතීසු පාචීනවංසදායෙ අන්තරහිතො භග්ගෙසු සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ පාතුරහොසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: අට්ඨ ඛො භික්ඛවෙ, මහාපුරිසවිතක්කෙ දෙසිස්සාමි, තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමෙ ච භික්ඛවෙ, අට්ඨ මහාපුරිසවිතක්කා:

අප්පිච්ඡස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො මහිච්ඡස්ස; සන්තුට්ඨස්සායං භික්ඛවෙ ධම්මො නායං ධම්මො අසන්තුට්ඨස්ස; පවිවිත්තස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො සඞ්ගණිකාරාමස්ස. ආරද්ධවිරියස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො කුසීතස්ස, උපට්ඨිතසතිස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්ස. සමාහිතස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො අසමාහිතස්ස. පඤ්ඤවතො අයං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස, නිප්පපඤ්චාරාමස්සායං භික්ඛවෙ, ධම්මො නිප්පපඤ්චරතිනො නායං ධම්මො පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො.

අනුරුද්ධය, තෙපි යම් කලෙක සිට මේ අෂ්ට මහාපුරුෂ විතර්කයන් ද, විතර්කාණය කරන්නහු නම් අධිචිත්තයට අයත් දිටුදැමියෙහි සුඛ විහරණ වූ මේ සතර ධ්‍යානයන් කැමති සේ ලබන්නහු නම් සැප සේ ලබන්නහු නම් නිදුකින් ලබන්නහු නම් අනුරුද්ධය, එතැන් සිට ගැහැවියකුට හෝ ගැහැවිපුතකුට හෝ ගිතෙල් වෙඩරු තෙල් මී උක් හකුරු යන නොයෙක් බෙහෙත් යම්සේ වේ ද, එපරිද්දෙන් ම සන්තෝෂයෙන් වාස කරන තොපට ඇල්ම පිණිස නො පිරිතැවීම පිණිස එාසුවිහරණය පිණිස නිවනට බැස ගැනීම පිණිස බෙහෙත් අතුරෙන් පූතිමුත්ත භේසජ්ජය (මැනවැ යි) වැටහෙන්නේ ය.

අනුරුද්ධය, එසේ නම් තෙපි චෙති දනව්වෙහි මෙහි ම පාචීනවංස මුවවෙනෙහි මත්තෙහි එන වස්විසුම ද කරන්නහු යි. වහන්ස, එසේ යි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අවවාදයෙන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්හට අවවාද දී බලවත් පුරුෂයෙක් යම්සේ වක්කළ හෝ අතක් දික් කරන්නේ ද, දික් කළ හෝ අතක් හකුළන්නේ ද, එසේ ම චෙති දනව්වෙහි පාචීනවංස වෙනෙහි අතුරුදන් වූ සේක් භග්ග දනව්වෙහි සුංසුමාරගිර සමීපයෙහි වූ භේසකලාවන නැමැති මුවවෙනෙහි පහළ වූ සේක. භාග්‍යවතුන් වහන්සේ පැන වූ අස්නෙහි වැඩ හුන් සේක. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඇමතූ සේක. මහණෙනි, අෂ්ට මහා පුරුෂ විතර්කයන් දෙශනා කරන්නෙමි. එය අසවු, මැනවින් මෙනෙහි කරවු, දෙසන්නෙමි වහන්ස, එසේ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

මහණෙනි, අෂ්ට මහාපුරුෂ විතර්කයෝ කවරහු ද යත්:

මහණෙනි, මේ ධර්මය තෙමේ අල්පේච්ඡයාට ය. මේ ධර්මය මහේච්ඡයාට නො වෙයි. මහණෙනි, මේ ධර්මය සන්තුෂ්ටයාට ය, මේ ධර්මය අසන්තුෂ්ටයාට නො වෙයි. මහණෙනි, මේ ධර්මය ප්‍රකර්ෂවිවේක ඇත්තාහට ය. මේ ධර්මය සඞ්ගණිකායෙහි ඇලුණහුට නො වෙයි. මහණෙනි, මේ ධර්මය පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තාහට ය. මේ ධර්මය කුසීතයාහට නො වෙයි. මහණෙනි, මේ ධර්මය එළඹ සිටි සිහි ඇත්තාහට ය, මේ ධර්මය මුළාසිහි ඇත්තාහට නො වෙයි. මහණෙනි, මේ ධර්මය සමාහිත සිත් ඇත්තාහට ය, මේ ධර්මය අසමාහිත සිත් ඇත්තාහට නොවෙයි. මහණෙනි, මේ ධර්මය ප්‍රඥ ඇත්තාහට ය, මේ ධර්මය ප්‍රඥා නැත්තාහට නො වෙයි. මහණෙනි, මේ ධර්මය ප්‍රපඤ්චයෙහි නො ඇලුණහුට ය, මේ ධර්මය ප්‍රපඤ්චයෙහි ඇලුණහුට නොවේ.

1. අප්පිච්ඡස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො මහිච්ඡස්සා'ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ භික්ඛු අප්පිච්ඡො සමානො අප්පිච්ඡොති මං ජානෙය්‍යුන්ති න ඉච්ඡති, සන්තුට්ඨො සමානො සන්තුට්ඨොති මං ජානෙය්‍යුන්ති න ඉච්ඡති, පවිවිත්තො සමානො පවිවිත්තොති මං ජානෙය්‍යුන්ති න ඉච්ඡති, ආරද්ධවිරියො සමානො ආරද්ධවිරියොති මං ජානෙය්‍යුන්ති න ඉච්ඡති, උපට්ඨිතසති සමානො උපට්ඨිතසතීති මං ජානෙය්‍යුන්ති න ඉච්ඡති, සමාහිතො සමානො සමාහිතොති මං ජානෙය්‍යුන්ති න ඉච්ඡති, පඤ්ඤවා සමානො පඤ්ඤවාති මං ජානෙය්‍යුන්ති න ඉච්ඡති, නිප්පපඤ්චාරාමො සමානො නිප්පපඤ්චාරාමොති මං ජානෙය්‍යුන්ති න ඉච්ඡති. 'අප්පිච්ඡස්සායං ධම්මො නායං ධම්මො මහිච්ඡස්සා'ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

2. 'සන්තුට්ඨස්සායං භික්ඛවෙ, ධම්මො, නායං ධම්මො අසන්තුට්ඨස්සා'ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චය භෙසජ්ජපරික්ඛාරෙන, 'සන්තුට්ඨස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො අසන්තුට්ඨස්සා'ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

3. 'පවිවිත්තස්සායං භික්ඛවෙ, ධම්මො, නායං ධම්මො සඞ්ගණිකාරාමස්සා'ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො භවන්ති උපසඞ්කමිතාරො භික්ඛූ භික්ඛුනියො, උපාසකා උපාසිකායො රාජානො රාජමහාමත්තා තිත්ථියා තිත්ථියසාවකා. තත්‍ර භික්ඛු විවෙකනින්නෙන චිත්තෙන විවෙකපොණෙන විවෙකපබ්භාරෙන වවකට්ඨෙන නෙක්ඛම්මාභිරතෙන අඤ්ඤදත්ථු උය්‍යොජනිකපටිසංයුත්තංයෙව කථං කත්තා හොති. 'පවිවිත්තස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො සඞ්ගණිකාරාමස්සා'ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

1. 'මහණෙනි, මේ ධර්මය අල්පේච්ඡයාට ය. මේ ධර්මය මහේච්ඡයාට නොවේ' යයි තෙල මෙසේ කියන ලද නම් මෙය කුමක් පිණිස කියනලදදැ යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ අල්පේච්ඡ වූයේ අල්පේච්ඡය යි මා දැනගන්නාහු නම් යෙහෙකැයි නො පතයි. සන්තුෂ්ට වූයේ ම සන්තුෂ්ටයෙකැ යි මා දැනගන්නාහු නම් යෙහෙකැයි නො පත යි. ප්‍රකර්ෂ විවේක යෙන් යුක්ත වූයේ ප්‍රකර්ෂ විවේකය ඇත්තෙකැ යි මා දැනගන්නාහු නම් යෙහෙකැයි නො පතයි. පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තේ ම පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තෙකැ යි මා දැනගන්නාහු නම් යෙහෙකැ යි නො පත යි. එළැඹ සිටි සිහිඇත්තේ ම එළැඹ සිටි සිහි ඇත්තෙකැ යි මා දැනගන්නාහු නම් යෙහෙකැ යි නො පතයි. එකඟ වූ සිත් ඇත්තේ ම එකඟ වූ සිත් ඇත්තෙකැයි මා දැනගන්නාහු නම් යෙහෙකැ යි නො පතයි. නුවණ ඇත්තේ ම නුවණැත්තෙකැ යි මා දැනගන්නාහු නම් මැනැවැ යි නො පතයි. ප්‍රපඤ්චයෙහි නො ඇලුණේ ම ප්‍රපඤ්චයෙහි නො ඇලුණෙකැ යි මා දැනගන්නාහු නම් යෙහෙකැ යි නො පතයි. 'මහණෙනි, මේ ධර්මය අල්පේච්ඡයාට ය, මේ ධර්මය මහේච්ඡයාහට නො වේ'යි මෙසේ ඒ යමක් කියන ලද නම් මෙය ඒ සඳහා කියන ලද්දේ ය.

2. 'මහණෙනි මේ ධර්මය සන්තුෂ්ටයාට ය, මේ ධර්මය අසන්තුෂ්ටයාහට නො වේ'යි මෙසේ තෙල කියන ලද වෙයි. මෙය කුමක් නිසා කියන ලද ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ යම්කිසි සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකරින් සතුටු වූයේ වේ. 'මහණෙනි මේ ධර්මය සන්තුෂ්ටයාට ය, මේ ධර්මය අසන්තුෂ්ටයාහට නො වේ'යි මෙසේ ඒ යමක් කියන ලද ද, එය මේ නිසා කියන ලද.

3. 'මහණෙනි, මේ ධර්මය ප්‍රකර්ෂවිවෙක ඇත්තහුට ය, මේ ධර්මය සඞ්ගණිකාවෙහි ඇලුණහුට නො වේ'යි මෙසේ තෙල කියන ලද වෙයි. මෙය කුමක් නිසා කියන ලද ද යත්: මහණෙනි, මෙ සස්නෙහි ප්‍රකර්ෂ විවේක ඇතිව වසන්නහු වෙත එළඹෙන මහණ – මෙහෙණ – උවසු – උවැසි – රජ – රජමහ ඇමති – අන්තෙවු – අන්පොවු සව්වෝ වෙති. ඔවුනතුරෙහි විවෙකයට නැමුණු විවෙකයට නැඹුරු වූ විවේකයට බරවූ විවෙකයෙහි පිහිටි නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණු සිතින් මහණ එකාන්තයෙන් පෙදැඹැ වීව පිළිබැඳි (ඔවුන්ගේ උපස්ථානගමනයට හෙතුවන) කථාවක්ම කරන්නෙක් වේ. 'මහණෙනි, මේ ධර්මය ප්‍රකර්ෂවිවෙක ඇත්තහුට ය, මේ ධර්මය සඞ්ගණිකායෙහි ඇලුණහුට නො වේ'යි මෙසේ එ යමක් කියන ලද නම් තෙල මෙ නිසා කියන ලද.

4. 'ආරද්ධවිරියස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො කුසීතස්සා'ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ, භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. 'ආරද්ධවිරියස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො කුසීතස්සා'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

5, 'උපට්ඨිතසතිස්සායං භික්ඛවෙ, ධම්මො, නායං ධම්මො මුට්ඨස්සතිස්සා'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. 'උපට්ඨිතසතිස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්සා'ති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

6. 'සමාහිතස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො අසමාහිතස්සා'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. 'සමාහිතස්සායං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො අසමාහිතස්සා'ති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

7. 'පඤ්ඤවතො අයං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්සා'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ, භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. 'පඤ්ඤවතො අයං භික්ඛවෙ, ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්සා'ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

8. 'නිප්පපඤ්චාරාමස්සායං භික්ඛවෙ, ධම්මො නිප්පපඤ්චරතිනො නායං ධම්මො පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො'ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ භික්ඛුනො පපඤ්චනිරොධෙ චිත්තං පක්ඛන්දති පසීදති, සන්තිට්ඨති, විමුච්චති, 'නිප්පපඤ්චාරාමස්සායං භික්ඛවෙ, ධම්මො නිප්පපඤ්චරතිනො නායං ධම්මො පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො'ති ඉති ඛො පනෙතං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

4. 'මහණෙනි, මේ ධර්මය දැඩි වැ ගත් වැර ඇත්තහුට ය, මේ ධර්මය කුසීතයාහට නො වේ'යි මෙසේ තෙල කියන ලද වෙයි. මෙය කුමක් නිසා කියන ලද ද යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ රැස් කිරීම පිණිස දැඩි වැ ගත් වීර්‍ය්‍යය ඇත්තේ ශක්ති ඇත්තේ දළපැරකුම් ඇත්තේ කුශලධර්මයන්හි නො බැහු වෙර ඇත්තේ වාස කෙරෙයි. 'මහණෙනි, මේ ධර්මය ආරබ්ධ වීර්‍ය්‍යය ඇත්තහුටය, මේ ධර්මය කුසීතයාහට නො වේ'යි, මෙසේ මා යමක් කියන ලද නම්, එය මේ නිසා කියන ලද.

5. 'මහණෙනි, මේ ධර්මය එළැඹ සිටි සිහි ඇත්තහුටය, මේ ධර්මය මුළාසිහි ඇත්තහුට නොවේ'යි මෙසේ තෙල කියන ලද වෙයි, මෙය කුමක් නිසා කියන ලද ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමේ උතුම් සිහිනුවණින් යුතු වූයේ සිහි ඇත්තේ වේ. පෙරකරනලද්ද පෙර කියන ලද්ද සිහි කරන්නෝ පුනපුනා සිහි කරන්නේ වේ. 'මහණෙනි, මේ ධර්මය එළැඹ සිටි සිහි ඇත්තහුට ය, මේ ධර්මය මුළාසිහි ඇත්තහුට නො වේ'යි මෙසේ ඒ යමක් කියන ලද නම් තෙල මේ නිසා කියන ලද.

6. 'මහණෙනි, මේ ධර්මය එකඟ වූ සිත් ඇත්තහුට ය, මේ ධර්මය එකඟ නොවූ සිත් ඇත්තහුට නො වේ'යි මෙසේ තෙල කියන ලද වෙයි. මෙය කුමක් නිසා කියන ලද ද යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්ව ම... චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. 'මහණෙනි, මේ ධර්මය එකඟ වූ සිත් ඇත්තහුට ය, මේ ධර්මය එකඟ නොවූ සිත් ඇත්තහුට නො වේ'යි මෙසේ ඒ යමක් කියන ලද නම් තෙල මේ නිසා කියන ලද.

7. 'මහණෙනි, මේ ධර්මය නුවණ ඇත්තහුට ය, මේ ධර්මය නුවණ නැත්තහුට නො වේ'යයි මෙසේ තෙල කියන ලද වෙයි. මෙය කුමක් නිසා කියන ලද ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ උදයවය පිළිවිදුමට සමත් වූ උතුම් වූ නිර්වේදයට හිත වූ මනා කොට දුක් ගෙවීමට යන සුලු ප්‍රඥාවෙන් සමන්විත වූයේ පැණවත් වෙයි. 'මහණෙනි, මේ ධර්මය නුවණැත්තහුට ය, මේ ධර්මය නුවණ නැත්තහුට නො වේ'යි මෙසේ ඒ යමක් කියන ලද නම් තෙල මේ නිසා කියන ලද.

8. 'මහණෙනි, මේ ධර්මය ප්‍රපඤ්චයෙහි නො ඇලුණහුට ය, මේ ධර්මය ප්‍රපඤ්චයෙහි ඇලුණහුට නො වේ'යි මෙසේ තෙල කියන ලද වෙයි. තෙල කුමක් නිසා කියන ලද ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ සිත නිර්වාණ පදයෙහි පිවිසෙයි, පහදියි, මැනවින් පිහිටයි, මිදේ. 'මහණෙනි, මේ ධර්මය ප්‍රපඤ්චයෙහි නො ඇලුණහුට ය, මේ ධර්මය ප්‍රපඤ්චයෙහි ඇලුණහුට නො වේ'යි මෙසේ තෙල යමක් කියන ලද නම්, තෙල මේ නිසා කියන ලද්දේයි.

අථ ඛො ආයස්මා අනුරුද්ධො ආයතිකම්පි වස්සාවාසං තත්ථෙව චෙතීසු පාචීනවංසදායෙ විහාසි. අථ ඛො ආයස්මා අනුරුද්ධො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි.

අඤ්ඤතරො ච පනායස්මා අනුරුද්ධො අරහතං අහොසි. අථ ඛො ආයස්මා අනුරුද්ධො අරහත්තප්පත්තො තායං වෙලායං ඉමා ගාථායො අභාසි.

1. මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
මනොමයෙන කායෙන ඉද්ධියා උපසඞ්කමි.

2. යථා මෙ අහු සඞ්කප්පො තතො උත්තරි දෙසයි,
නිප්පපඤ්චරතො බුද්ධො නිප්පපඤ්චං අදෙසයි.

3. තස්සාහං ධම්මමඤ්ඤාය විහාසිං සාසනෙ රතො,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

ගහපතිවග්ගො තතියො.

තස්සුද්දානං:

ද්වෙ උග්ගා ද්වෙ ච හත්ථකා මහානාමෙන ජීවකො,
ද්වෙ බලා අක්ඛණා වුත්තා අනුරුද්ධෙන තෙ දසාති.

ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ මත්තෙහි වූ වස්විසුම ද ඒ චේතී දනව්වෙහි ම පාචීනවංස වෙනෙහි කළහ. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ එකලා වැ ගණසඞ්ගණිකාවෙන් වෙන් වැ නොපමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති වැ වාස කරන්නාහු නොබෝ කලෙකින් ම යමක් පිණිස කුල-පුත්‍රයෝ මනාකොට ගිහිගෙන් නික්ම අනගාරිය සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණෙද්ද ඒ අනුත්තර වූ මහබඹසර කෙළවර වූ රහත්බව දිටුදමියෙහි ම තෙමේ විශිෂ්ටඥනයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ විසූ හ. ජාතිය ක්ෂය විය. මහබඹසර වසන ලද, සිවුමඟ කිස කොට නිමවන ලද. රහත්බව පිණිස කටයුතු අන් කිසෙක් නැතැයි දැනගත්හ.

ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ පැමිණි රහත්බැව් ඇති සේක් එවේලෙහි මේ ගාථාවන් වදළහ.

1. ලෝකයෙහි අනුත්තර වූ ශාස්තෘන් වහන්සේ මාගේ සඞ්කල්පය දැන ඍද්ධියෙන් මැවූ මනෝමය කයින් මා වෙත එළැඹි සේක.

2. මාගේ විතර්කය (සඞ්කල්පය) යම් පරිද්දෙකින් වී ද, එයට වැඩියක් දෙසූ සේක. නිෂ්ප්‍රපඤ්චයෙහි (නිර්වාණපදයෙහි) ඇලුණු බුදු-රජාණන් වහන්සේ නිෂ්ප්‍රපඤ්චය (නිර්වාණධර්මය) දෙසූ සේක.

3. මම උන් වහන්සේගේ ධර්මය දැන සස්නෙහි ඇලුණෙම් ත්‍රිවිද්‍යාවට පැමිණියෙම් විසීමි. බුදු සසුන කරන ලදයි.

**තෙවැනි ගෘහපතිවර්ග යි.**

**එහි උද්දානය:**

උග්ග සූත්‍ර දෙක ය, හත්ථක සූත්‍ර දෙක ය, මහානාම සූත්‍ර ය, ජීවක සූත්‍ර ය, බලසූත්‍ර දෙක ය, අක්ඛණ සූත්‍රය, අනුරුද්ධ සූත්‍රය යි සූත්‍ර දසයෙකි.

# 4. දානවග්ගො

## 8. 1. 4. 1

### දාන සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමානි භික්ඛවෙ දානානි. කතමානි අට්ඨ:

ආසජ්ජ දානං දෙති, භයා දානං දෙති, අදාසි මෙති දානං දෙති, දස්සති මෙති දානං දෙති, සාහු දානන්ති දානං දෙති, අහං පචාමි ඉමෙ න පචන්ති න අරහාමි පචන්තො අපචන්තානං දානං අදාතුන්ති දානං දෙති, ඉමං මෙ දානං දදතො කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡතීති දානං දෙති චිත්තාලඞ්කාරචිත්තපරික්ඛාරත්ථං දානං දෙති, ඉමානි ඛො භික්ඛවෙ අට්ඨ දානානීති.

## 8. 1. 4. 2

### දුතියදාන සුත්තං

[සාවත්ථිනිදානං]

සද්ධා හිරියං කුසලඤ්ච දානං
ධම්මා එතෙ සප්පුරිසානුයාතා,
එතං හි මග්ගං දිවියං වදන්ති
එතෙන හි ගච්ඡති දෙවලොකන්ති.

## 8. 1. 4. 3

### දානවත්ථු සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමානි භික්ඛවෙ, දානවත්ථූනි. කතමානි අට්ඨ:

ඡන්දා දානං දෙති, දොසා දානං දෙති, මොහා දානං දෙති, ගරහා දානං දෙති[1], දින්නපුබ්බං කතපුබ්බං පිතුපිතාමහෙහි නාරහාමි පොරාණං[2] කුලවංසං හාපෙතුන්ති දානං දෙති, ඉමාහං දානං දත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති දානං දෙති, ඉමං මෙ දානං දදතො චිත්තං පසීදති අත්තමනතා සොමනස්සං උපජායතීති දානං දෙති, චිත්තාලඞ්කාරචිත්තපරික්ඛාරත්ථං දානං දෙති. ඉමානි ඛො භික්ඛවෙ අට්ඨ දානවත්ථූනීති.

---

1. භයා දානං දෙති - සිමු.   2. පොරාණකං - සිමු කත්ථචි.

# 4. දානවර්ගය

## 8. 1. 4. 1

## දාන සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ දන් අටෙකි. කවර අටෙක් ද යත්:

වෙත පැමිණ දන් දෙයි. බියෙන් දන් දෙයි. මට දුන්නේයි දන් දෙයි. මට දෙන්නේ යි දන් දෙයි. දීම මැනැවැයි දන් දෙයි. මම පිසමි, මොහු නො පිසත්, පිසන්නෙම් නොපිසන්නවුන්හට දන් නොදෙන්නට නුසුදුස්සෙමි යි දන් දෙයි. මේ දානය දෙන මාගේ කලණකිත්හඬ උස්ව නැගේ යි දන් දෙයි. (ශමථවිදර්ශනා) චිත්තයාගේ අලඞ්කාර පිණිසත් පිරිවර පිණිසත් දන් දේ.

## 8. 1. 4. 2

## ද්විතීයදාන සූත්‍රය

[සැවැත්නිදාන යි]

ශ්‍රද්ධායෙන් දීම ය, ලජ්ජායෙන් දීම ය, නිර්දොෂ දීම ය යන මේ ධර්මයෝ සත්පුරුෂයන් විසින් අනුගමනය කරන ලදහ, තෙල දෙව්ලොවට මඟයයි කියත්, මේ ධර්මයන්ගෙන් දෙව්ලොවට පැමිණේ.

## 8. 1. 4. 3

## දානවත්‍ථු සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ දානවස්තූහු අටෙකි. කවර අටෙක් ද යත්:

ඡන්‍දයෙන් දන් දෙයි. ද්වෙෂයෙන් දන් දෙයි. මෝහයෙන් දන් දෙයි ගැරහීම් බියෙන් දන් දෙයි. පියමුතුන් විසින් දුන්විරූ ය කළවිරූ ය පැරණි කුලවංසය පිරිහෙළන්නට නො සුදුස්සෙමියි දන් දෙයි. මම මේ දන් දී කාබුත් මරණින් මතු මනාගති ඇති සවර්ගලෝකයෙහි උපදින්නෙමි යි දන් දෙයි. මේ දන්දෙන මාගේ සිත පහදී යි අත්තමනතා සඞ්ඛ්‍යාත සොමනස උපදී යයි දන් දෙයි. සිතෙහි අලඞ්කාරය හා චිත්තපරිෂ්-කාරය පිණිස දන් දෙයි. මහණෙනි, මේ වනාහි දානවස්තු අට යි.

## 8. 1. 4. 4
## ඛෙත්තූපම සුත්තං

**[සාවත්ථිනිදානං]**

අට්ඨඞ්ගසමන්නාගතෙ භික්ඛවෙ, ඛෙත්තෙ බීජං වුත්තං න මහප්ඵලං හොති. න මහස්සාදං න ඵාතිසෙය්‍යාති. කථං අට්ඨඞ්ගසමන්නාගතෙ:

ඉධ භික්ඛවෙ, ඛෙත්තං උන්නාමනින්නාමි ච හොති පාසාණසක්ඛරිලඤ්ච හොති. ඌසරඤ්ච හොති. න ච ගම්භීරසීතං හොති. න ආයසම්පන්නං හොති, න අපායසම්පන්නං හොති, න මාතිකාසම්පන්නං හොති, න මරියාදසම්පන්නං හොති. එවං අට්ඨඞ්ගසමන්නාගතෙ භික්ඛවෙ ඛෙත්තෙ බීජං වුත්තං න මහප්ඵලං හොති. න මහස්සාදං. න ඵාතිසෙය්‍යාති.

එවමෙව ඛො භික්ඛවෙ අට්ඨඞ්ගසමන්නාගතෙසු සමණබ්‍රාහ්මණෙසු දානං දින්නං න මහප්ඵලං හොති, න මහානිසංසං න මහාජුතිකං න මහාවිප්ඵාරං. කථං අට්ඨඞ්ගසමන්නාගතෙසු:

ඉධ භික්ඛවෙ, සමණබ්‍රාහ්මණා මිච්ඡාදිට්ඨිකා හොන්ති මිච්ඡාසඞ්කප්පා මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තා මිච්ඡාආජීවා මිච්ඡාවායාමා මිච්ඡාසතිනො මිච්ඡාසමාධිනො. එවං අට්ඨඞ්ගසමන්නාගතෙසු භික්ඛවෙ සමණබ්‍රාහ්මණෙසු දානං දින්නං න මහප්ඵලං හොති. න මහානිසංසං න මහාජුතිකං න මහාවිප්ඵාරං.

අට්ඨඞ්ගසමන්නාගතෙ භික්ඛවෙ, ඛෙත්තෙ බීජං වුත්තං මහප්ඵලං හොති මහස්සාදං ඵාතිසෙය්‍යාති. කථං අට්ඨඞ්ගසමන්නාගතෙ :

ඉධ භික්ඛවෙ, ඛෙත්තං අනුන්නාමනින්නාමි ච හොති, අපාසාණසක්ඛරිලඤ්ච හොති, අනූසරඤ්ච හොති. ගම්භීරසීතං හොති, ආයසම්පන්නං හොති, අපායසම්පන්නං හොති, මාතිකාසම්පන්නං හොති, මරියාදසම්පන්නං හොති, එවං අට්ඨඞ්ගසමන්නාගතෙ භික්ඛවෙ, ඛෙත්තෙ බීජං වුත්තං මහප්ඵලං හොති, මහස්සාදං ඵාතිසෙය්‍යාති.

## 8. 1. 4. 4
## ඛෙත්තූපම සූත්‍රය

[සැවත්නිදන යි]

34. මහණෙනි, අටහෙකින් යුත් කෙතෙහි වපුළ බීජ මහත්ඵල නො වේ. මහත් ආස්වාද ඇත්තේ (මධුර) නො වේ. නොවැඩෙන්නේ යි. කෙසේ අටකින් යුත් කෙතෙහි ද යත්:

මහණෙනි, මෙලොවැ කෙතක් වළගොඩැලි ඇත්තේ ද වෙයි. අතළගල් කුඩාගල් හා බොරළු ඇත්තේ ද වෙයි. කරමැටි ඇත්තේ ද වෙයි. නො ද ගැඹුරට සාන ලද වෙයි. (ගලාඑන) දියමං නැත්තේ ද වෙයි. (ගලායන) දියමං ඇත්තේ ද නො වෙයි. (කුඩමහත්) දිය ඇලි ඇත්තේ ද නො වෙයි. කෙත්සීමා (මියර) සහිත වූයේ ද නො වේ. මහණෙනි, මෙසේ අටකින් යුත් කෙතෙහි වපුළ බීජ මහත්ඵල නො වෙයි, මධුර නො වේ. නො වැඩෙන්නේ යි.

මහණෙනි, එසෙයින්ම අටකින් යුත් මහණබමුණන් කෙරෙහි දුන් දන් මහත් ඵල නො වෙයි. මහානිසංස නො වෙයි. මහත් ශෝභා ඇත්තේ නො වෙයි. මහත් පැතිරීම් ඇත්තේ නො වේ. කෙසේ අටකින් යුත් මහණබමුණන් කෙරෙහි ද යත්:

මහණෙනි, මෙලොවැ මහණබමුණෝ මිථ්‍යාදෘෂ්ටිකයෝ වෙති, මිථ්‍යාසඞකල්ප ඇත්තෝ වෙති, මිථ්‍යාවචන ඇත්තෝ වෙති, මිථ්‍යාකර්මාන්ත ඇත්තෝ වෙති, මිථ්‍යාආජීව ඇත්තෝ වෙති, මිථ්‍යාව්‍යායාම ඇත්තෝ වෙති, මිථ්‍යාස්මෘති ඇත්තෝ වෙති, මිථ්‍යාසමාධි ඇත්තෝ වෙත්. මහණෙනි, මෙසේ අටකින් යුත් මහණබමුණන් කෙරෙහි දුන් දන් මහත් ඵල නො වෙයි. මහානිසංස නො වෙයි. මහාද්‍යුතික නො වෙයි. මහත් පැතිරීම් ඇත්තේ නො වේ.

මහණෙනි, අටහෙකින් යුත් කෙතෙහි වපුළ බීජ මහත්ඵල ඇත්තේ වේ. මහත් ආස්වාද ඇත්තේ (මධුර) වේ. වැඩෙන්නේ ය. කෙසේ අටහෙකින් යුත් කෙතෙහි ද යත්:

මහණෙනි, මෙ ලොවැ කෙතක් වළගොඩැලි නැත්තේ ද වෙයි. ගල් බොරළු නැත්තේ ද වෙයි. කරමැටි නැත්තේ ද වෙයි. ගැඹුරට සානලද ද වෙයි. (ගලා එන) දියමං ඇත්තේ ද වෙයි. (ගලා යන) දියමං ඇත්තේ ද වෙයි. (කුඩමහත්) දිය ඇලි ඇත්තේ ද වෙයි. කෙත් සීමා (මියර) සහිත ද වෙයි. මහණෙනි, මෙසේ අටහෙකින් යුත් කෙතෙහි වපුළ බීජ මහත්ඵල ඇත්තේ වෙයි. මධුර වෙයි. වැඩෙන්නේ යි.

එවමෙව ඛො භික්ඛවෙ, අට්ඨඞ්ගසමන්නාගතෙසු සමණබ්‍රාහ්මණෙසු දානං දින්නං මහප්ඵලං හොති මහානිසංසං මහාජුතිකං මහාවිප්ඵාරං. කථං අට්ඨඞ්ගසමන්නාගතෙසු: ඉධ භික්ඛවෙ, සමණබ්‍රාහ්මණා සම්මාදිට්ඨිකා හොන්ති සම්මාසඞ්කප්පා සම්මාවාචා සම්මාකම්මන්තා සම්මාආජීවා සම්මාවායාමා සම්මාසතිනො සම්මාසමාධිනො. එවං අට්ඨඞ්ගසමන්නාගතෙසු භික්ඛවෙ, සමණබ්‍රාහ්මණෙසු දානං දින්නං මහප්ඵලං හොති මහානිසංසං මහාජුතිකං මහාවිප්ඵාරන්ති.

1. යථාපි ඛෙත්තෙ සම්පන්නෙ – පවුත්තා බීජසම්පදා,
දෙවෙ සම්පාදයන්තම්හි – හොති ධඤ්ඤස්ස සම්පදා.

2. අනීති සම්පදා හොති – විරූළ්හී භවති සම්පදා,
වෙපුල්ලසම්පදා හොති – ඵලං වෙ හොති සම්පදා.

3. එවං සම්පන්නසීලෙසු – දින්නා භොජනසම්පදා,
සම්පදානං උපනෙති – සම්පන්නං හිස්ස තං කතං.

4. තස්මා සම්පදමාකඞ්ඛී – සම්පන්නත්ථිධ පුග්ගලො,
සම්පන්නපඤ්ඤෙ සෙවෙථ – එවං ඉජ්ඣන්ති සම්පදා.

5. විජ්ජාචරණසම්පන්නෙ – ලද්ධා චිත්තස්ස සම්පදං,
කරොති කම්මසම්පදං – ලභති ච[1] අත්ථසම්පදං.

6. ලොකං ඤත්වා යථාභූතං – පප්පුය්‍ය දිට්ඨිසම්පදං,
මග්ගසම්පදමාගම්ම – යාති සම්පන්නමානසො.

7. ඔධුනිත්වා මලං සබ්බං – පත්වා නිබ්බාන සම්පදං,
මුච්චති සබ්බදුක්ඛෙහි – සා හොති සබ්බසම්පදා.

1. ච – සී. මු.

මහණෙනි, එ පරිද්දෙන් ම අටහෙකින් යුත් මහණබමුණන් කෙරෙහි දුන් දන් මහත්ඵල වේ. මහත් අනුසස් ඇත්තේ වේ. මහාද්‍යුතික වේ. මහාපැතිරීම් ඇත්තේ වේ. කෙසේ අටහෙකින් යුත් මහණබමුණන් කෙරෙහි ද යත්: මහණෙනි, මෙලොව මහණබමුණෝ සම්‍යග්දෘෂ්ටිකයෝ වෙති. සම්‍යක්සංකල්ප ඇත්තෝ වෙති. සම්‍යක් වචන ඇත්තෝ වෙති. සම්‍යක් කර්මාන්ත ඇත්තෝ වෙති. සම්‍යක් ආජීව ඇත්තෝ වෙති. සම්‍යග්ව්‍යායාම ඇත්තෝ වෙති. සම්‍යක් ස්මෘති ඇත්තෝ වෙති. සම්‍යක් සමාධි ඇත්තෝ වෙත්. මහණෙනි, මෙසේ අටහෙකින් යුත් මහණ බමුණන් කෙරෙහි දුන් දන් මහත්පල වෙයි. මහත් අනුසස් ඇත්තේ වෙයි, මහාද්‍යුතික වෙයි. මහත් පැතිරීම් ඇත්තේ වේ.

1. පිරිපුන් සම්පත් ඇති කෙතෙහි වපුළ බීජසම්පත්ති තොමෝ වැසි මැනවින් වස්නා කල්හි යම්සේ යහපත් ධාන්‍ය සම්පත් ඇත්තී වේ ද,

2. (ඕ) පණුළවදුරු නැති බව නමැති සම්පත් ඇත්තී වෙයි. වෘද්ධි-සම්පත් ඇත්තී වෙයි. වෛපුල්‍ය සම්පත් ඇත්තී වෙයි. ඒකාන්තයෙන් ඵලසම්පත් ඇත්තී වෙයි.

3. එසේම පිරිපුන් සිල් ඇත්තවුන් කෙරෙහි දෙන ලද භෝජන සම්පත් තොමෝ කුශලසම්පත් එළවයි. ඔහු විසින් කරන ලද ඒ කර්මය යම්හෙයෙකින් පිරිපුන් වේ ද,

4. එහෙයින් මෙලොව සම්පත් කැමැත්තේ පිරිපුන් පුහුලෙක් වේවා, පිරිපුන් පැණැත්තන් සේවනය කෙරේවා. සම්පත්හු මෙසේ සමෘද්ධ වෙත්.

5. විද්‍යාවෙන් හා චරණධර්මයෙන් යුක්තවූයේ චිත්තසම්පත් (නොවිකල් බව) ලැබ කර්මසම්පත් (පරිපූර්ණ කර්ම) කෙරෙයි. (පිරිපුන්) අර්ථසම්පත් ද ලබයි.

6. (විදර්ශනා) දෘෂ්ටි සම්පත්තියට පැමිණ තත්වූ පරිදි ලොව දැන (සොතාපත්ති) මාර්ගසම්පත්තියට පැමිණ පිරිපුන් සිත් ඇත්තේ අර්හත්ත්වයට යෙයි.

7. මුළු කෙලෙස්මල කම්පිත කොට හැර නිවන් සැපතට පැමිණ සියලු දුකින් මිදෙයි. ඒ විමුක්ති තොමෝ සර්වසම්පත් නම් වෙයි.

## 8. 1. 4. 5

## දානූපපත්ති සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමා භික්ඛවෙ දානූපපත්තියො කතමා අට්ඨ:

1. ඉධ භික්ඛවෙ එකච්චො දානං දෙති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, සො යං දෙති. තං පච්චාසිංසති. සො පස්සති ඛත්තියමහාසාලෙ වා බ්‍රාහ්මණමහාසාලෙ වා ගහපතිමහාසාලෙ වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතෙ සමඞ්ගීභූතෙ පරිචාරයමානෙ. තස්ස එවං හොති: අහො වතාහං කායස්සභෙදා පරම්මරණා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති. තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති. තස්ස තං චිත්තං හීනෙ විමුත්තං උත්තරිං අභාවිතං තත්‍රූපපත්තියා සංවත්තති. කායස්ස භෙදා පරම්මරණා ඛත්තියමහාසාලානං වා බ්‍රාහ්මණමහාසාලානං වා ගහපතිමහාසාලානං වා සහව්‍යතං උපපජ්ජති. තඤ්ච ඛො සීලවතො වදාමි, නො දුස්සීලස්ස. ඉජ්ඣති භික්ඛවෙ සීලවතො චෙතොපණිධි විසුද්ධත්තා,

2. ඉධ පන භික්ඛවෙ, එකච්චො දානං දෙති, සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදී-පෙය්‍යං, සො යං දෙති තං පච්චාසිංසති, තස්ස සුතං හොති: චාතුම්මහාරාජිකා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලාති. තස්ස එවං හොති: අහොවතාහං කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති. තං චිත්තං අධිට්ඨාති. තං චිත්තං භාවෙති. තස්ස තං චිත්තං හීනෙ විමුත්තං උත්තරිං අභාවිතං තත්‍රූපපත්තියා සංවත්තති, කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. තඤ්ච ඛො සීලවතො වදාමි, නො දුස්සීලස්ස, ඉජ්ඣති භික්ඛවෙ සීලවතො චෙතොපණිධි; විසුද්ධත්තා.

# 8. 1. 4. 5
## දානූපපත්ති සූත්‍රය

**[සැවත්නිදාන යි]**

මහණෙනි, මේ දානෝපප්‍රාප්තීහු (දානය නිසා වන ඉපදීම්) අට දෙනෙකි. කවර අටෙක් ද යත්:

1. මහණෙනි, මෙලොව එකෙක් මහණකුට හෝ බමුණකුට අහර පැන් වත් යත් මල්ගඳවිලෙවුන් යහන් නිවෙස් පහන් උවාරණ දන් දෙයි. හෙතෙමේ යමක් දේද, එය නැවත පතයි. හෙතෙමේ පස්කම් ගුණයෙන් ඇලුණු, යුක්ත වූ ඉඳුරන් පිනවනු ලබන ක්ෂත්‍රිය මහාසාරයන් හෝ බ්‍රාහ්මණමහාසාරයන් හෝ ගෘහපති මහාසාරයන් හෝ දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මම කායයාගේ බිඳීමෙන් මරණින් මතු ක්ෂත්‍රියමහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණමහාසාරයන්ගේ හෝ ගෘහපති මහාසාරයන්ගේ හෝ සහවාසයට පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙක. හේ ඒ සිත තබයි, ඒ සිත ඉටයි, ඒ සිත වඩයි. හීනවූ පස්කම්ගුණයෙහි යෙදුණු ඔහුගේ ඒ සිත මත්තෙහි (මහපල පිණිස) නොවඩනා ලද්දේ එහි උපත පිණිස පවතී. කාබුන් මරණින් මතු ක්ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණමහාසාරයන්ගේ හෝ ගෘහපතිමහාසාරයන්ගේ හෝ සහවාසයට පැමිණේ. එද වනාහි සිල්වත්හට කියමි. දුශ්ශීලහට නො කියමි. මහණෙනි සිල්වත්හුගේ චිත්තප්‍රණිධිය (සිතපිහිටුවීම) පිරිසුදු බැවින් සමෘද්ධ වෙයි.

2. මහණෙනි, මේ ලෝකයෙහි එකෙක් මහණකුට හෝ බමුණකුට හෝ ආහාර පැන් වත් යත් මල්ගඳවිලෙවුන් යහන් නිවෙස් පහන් උවාරණ දන්දෙයි. හෙතෙමේ යමක් දේ ද, එය නැවත පතයි. ඔහු විසින් (මෙසේ) අසනලද්දේ වෙයි: චාතුම්මහාරාජික දෙව්ලොව දෙවියෝ දීර්ඝායුෂ්කයෝ ය, වර්ණවත්හු ය, සැපබහුල කොට ඇත්තෝ ය. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මම කාබුන් මරණින් මතු සිවුමහරජයෙහි දෙවියන්ගේ සහවාසයට පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙකැයි. හේ ඒ සිත තබයි, ඒ සිත ඉටයි, ඒ සිත වඩයි. ඔහුගේ ඒ සිත හීන වූ පස්කම් ගුණයෙහි යෙදුණේ මත්තෙහි නොවඩනා ලද්දේ එහි උපත පිණිස පවතී. කාබුන් මරණින් මත්තෙහි සිවුමහරජයෙහි දෙවියන්ගේ සහවාසයට පැමිණේ. එද වනාහි සිල්වත්හට කියමි, දුශ්ශීලහට නො කියමි. මහණෙනි, සිල්වත්හුගේ චිත්තප්‍රණිධිය පිරිසිදුබැවින් සමෘද්ධ වෙයි.

3-7 ඉධ පන භික්ඛවෙ, එකච්චො දානං දෙති. සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො යං දෙති තං පච්චාසිංසති. තස්ස සුතං හොති: තාවතිංසා දෙවා -පෙ- යාමා දෙවා - තුසිතා දෙවා - නිම්මානරතී දෙවා - පරනිම්මිතවසවත්තී දෙවා - දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලාති. තස්ස එවං හොති: අහොවතාහං කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති. තං චිත්තං අධිට්ඨාති. තං චිත්තං භාවෙති. තස්ස තං චිත්තං හීනෙ විමුත්තං උත්තරිං අභාවිතං තත්‍රූපපත්තියා සංවත්තති. කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජති. තං ච ඛො සීලවතො වදාමි නො දුස්සීලස්ස, ඉජ්ඣති භික්ඛවෙ සීලවතො චෙතොපණිධි, විසුද්ධත්තා.

8. ඉධපන භික්ඛවෙ, එකච්චො දානං දෙති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො යං දෙති තං පච්චාසිංසති. තස්ස සුතං හොති: බ්‍රහ්මකායිකා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලාති. තස්ස එවං හොති: අහොවතාහං කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති. සො තං චිත්තං දහති තං චිත්තං අධිට්ඨාති. තං චිත්තං භාවෙති. තස්ස තං චිත්තං හීනෙ විමුත්තං උත්තරිං අභාවිතං තත්‍රූපපත්තියා සංවත්තති, කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති, තඤ්ච ඛො සීලවතො වදාමි. නො දුස්සීලස්ස වීතරාගස්ස නො සරාගස්ස. ඉජ්ඣති භික්ඛවෙ සීලවතො චෙතොපණිධි වීතරාගත්තා. ඉමා ඛො භික්ඛවෙ, අට්ඨදානූපපත්තියොති.

## 8. 1. 4. 6

## පුඤ්ඤකිරියවත්ථු සුත්තං

[සාවත්ථිනිදානං]

තීණිමානි භික්ඛවෙ, පුඤ්ඤකිරියවත්ථූනි, කතමානි තීණි.

දානමයං පුඤ්ඤකිරියවත්ථු[1], සීලමයං පුඤ්ඤකිරියවත්ථු, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු.

1. පුඤ්ඤකිරියවත්ථුං. PTS..

3-7 මහණෙනි, මේ ලෝකයෙහි එකෙක් මහණකුට හෝ බමුණකුට හෝ අහර පැන් වත් යන් මල්ගඳවිලෙවුන් යහන් නිවෙස් පහන් දන් දෙයි. යමක් දේ ද, එය නැවත පතයි, ඔහු විසින් මෙසේ අසන ලද්දේ වෙයි: තාවතිංස දෙවියෝ ... යාම දෙවියෝ ... තුසිත දෙවියෝ ... නිම්මාණරති දෙවියෝ ... පරනිම්මිතවසවත්ති දෙවියෝ දීඝායුෂ්කයෝ ය. වණ්ණවත්හු ය, සැප බහුල කොට ඇත්තෝ යි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මම කාබුන් මරණින් මතු පරනිර්මිතවශවර්ති දෙවියන්ගේ සහවාසයට යන්නෙම් නම් ඉතා යෙහෙකි, හෙ ඒ සිත තබයි. ඒ සිත ඉටයි. ඒ සිත වඩයි. හීන වූ පස්කම් ගුණයෙහි යෙදුණු ඔහුගේ ඒ සිත මත්තෙහි නො වඩනා ලද්දේ එහි උපත පිණිස පවතී. කාබුන් මරණින් මතු පරනිර්මිතවශවර්ති දෙවියන්ගේ සහවාසයට පැමිණේ. එද සිල්වත්හට කියමි. දුශ්ශීලහට නො කියමි. මහණෙනි, සිල්වත්හුගේ චිත්තප්‍රණිධිය සමෘද්ධ වේ. පිරිසිදු බැවිනි.

8. මහණෙනි, මේ ලෝකයෙහි එකෙක් මහණකුට හෝ බමුණකුට හෝ අහර පැන් වත් යන් මල්ගඳවිලවුන් යහන් නිවෙස් පහන් උවාරණ දන් දෙයි. හේ යමක් දේ නම් එය නැවත පතයි. බ්‍රහ්මකායික දෙවියෝ දීර්ඝායුෂ්කයෝ ය. වර්ණවත්හු ය. සැපබහුල කොට ඇත්තෝ යි ඔහු විසින් අසන ලද්දෙ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මම කාබුන් මරණින් මතු බ්‍රහ්මකායික දෙවියන්ගේ සහවාසයට පැමිණෙන්නෙම් නම් ඉතා යෙහෙකැයි, හෙතෙමේ ඒ සිත තබයි. ඒ සිත ඉටයි. ඒ සිත වඩයි. හීනවූ පස්කම්ගුණයෙහි යෙදුණු ඔහුගේ ඒ සිත මත්තෙහි නො වඩනා ලද්දේ එහි උපත පිණිස පවතී. කාබුන් මරණින් මතු බ්‍රහ්මකායික දෙවියන්ගේ සහවාසයට පැමිණේ. එද සිල්වත්හට කියමි. දුශ්ශීලහට නො කියමි. වීතරාගයාහට කියමි. සරාගයාහට නො කියමි. මහණෙනි, සිල්වත්හුගේ චිත්තප්‍රණිධිය සමෘද්ධ වේ. පහවූ රාගය ඇති බැවිනි. මහණෙනි, මේ දානුපපත්ති අට යි.

## 8. 1. 4. 6

## පුඤ්ඤකිරියවත්ථු සූත්‍රය

**[සැවත්නිදන යි]**

මහණෙනි, මේ පින්කිරියවත් තුනෙකි. කවර තුනෙක යත්:

දානමය පුණ්‍යක්‍රියාවස්තු ය, ශීලමය පුණ්‍යක්‍රියාවස්තුය, භාවනාමය පුණ්‍යක්‍රියාවස්තු යි.

1. ඉධ භික්ඛවෙ, එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු පරිත්තං කතං හොති, සීලමයං පුඤ්ඤකිරියවත්ථු පරිත්තං කතං හොති භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු නාභිසම්භොති. සො කායස්ස භෙදා පරම්මරණා මනුස්සදොභග්ගං[1] උපපජ්ජති.

2. ඉධ පන භික්ඛවෙ, එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු මත්තසො කතං හොති, සීලමයං පුඤ්ඤකිරියවත්ථු මත්තසො කතං හොති, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු නාභිසම්භොති. සො කායස්ස භෙදා පරම්මරණා මනුස්සසොභග්ගං[2] උපපජ්ජති.

3. ඉධ පන භික්ඛවෙ, එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, සීලමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු නාභිසම්භොති. සො කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. තත්‍ර භික්ඛවෙ, චත්තාරො මහාරාජානො දානමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා[3] සීලමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා[4] චාතුම්මහාරාජිකෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා, දිබ්බෙන වණ්ණෙන, දිබ්බෙන සුඛෙන, දිබ්බෙන යසෙන, දිබ්බෙන ආධිපතෙය්‍යෙන, දිබ්බෙහි රූපෙහි, දිබ්බෙහි සද්දෙහි, දිබ්බෙහි ගන්ධෙහි, දිබ්බෙහි රසෙහි, දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

4. ඉධ පන භික්ඛවෙ, එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, සීලමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු නාභිසම්භොති. සො කායස්ස භෙදා පරම්මරණා තාවතිංසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. තත්‍ර භික්ඛවෙ, සක්කො දෙවානමින්දො දානමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා, සීලමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා තාවතිංසෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

5. ඉධ පන භික්ඛවෙ, එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, සීලමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු නාභිසම්භොති. සො කායස්ස භෙදා පරම්මරණා යාමානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. තත්‍ර භික්ඛවෙ, සුයාමො දෙවපුත්තො දානමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා සීලමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා, යාමෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති. දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

1. දොභග්‍යං – මජසං.
2. සොභග්‍යං – මජසං.
3. කත්වා – කත්වී.

1. මහණෙනි, මෙ ලොව එකකු විසින් දානමයපුණ්‍යක්‍රියා වස්තුව මඳ කොට කරන ලද වෙයි. ශීලමයපුණ්‍යක්‍රියා වස්තුව මඳ කොට කරන ලද වෙයි. භාවනාමයපුණ්‍යක්‍රියා වස්තුව නො නිපැයෙයි. හේ කාබුන් මරණින් මතු (පිළිසඳ විසින්) මිනිසුන් අතර දුර්භාග්‍යයට පැමිණෙයි.

2. මහණෙනි, මෙ ලොවැ එකකු විසින් දානමයපුණ්‍යක්‍රියාවස්තුව පමණින් කරනලද වෙයි. ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව පමණින් කරනලද වෙයි. භාවනාමයපුණ්‍යක්‍රියාවස්තුව නො නිපැයෙයි. හේ කාබුන් මරණින් මතු පිළිසඳ විසින් මිනිසුන් අතර සෞභාග්‍යයට පැමිණෙයි.

3. මහණෙනි, මෙ ලොවැ එකකු විසින් දානමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍ර කොට කරනලද වෙයි. ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍ර කොට කරනලද වෙයි. භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුව නො නිපැයෙයි. හේ කාබුන්මරණින් මතු චාතුර්මහාරාජිකදෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. මහණෙනි, එහි සිවුමහරජවරු දානමයපුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට, ශීලමයපුණ්‍යක්‍රියා වස්තුව අතිරෙක ව කොට, දිව්‍ය වූ ආයුෂයෙන්, දිව්‍ය වූ වර්ණයෙන්, දිව්‍ය වූ සුඛයෙන්, දිව්‍ය වූ යශසින්, දිව්‍ය වූ ආධිපත්‍යයෙන්, දිව්‍ය වූ රූපයෙන්, දිව්‍ය වූ ශබ්දයෙන්, දිව්‍ය වූ ගන්ධයෙන්, දිව්‍ය වූ රසයෙන්, දිව්‍ය වූ පහසිනැයි, දස කරුණෙකින් චාතුර්මහාරාජික දෙවියන් මැඩ ගෙන සිටුනාහ.

4. මහණෙනි, මෙ ලොවැ එකකු විසින් දානමයපුණ්‍යක්‍රියා වස්තුව අධිමාත්‍ර ව කරනලද වෙයි. ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍ර ව කරනලද වෙයි. භාවනාමයපුණ්‍යක්‍රියාවස්තුව නො නිපැයෙයි. හේ කාබුන් මරණින් මතු තාවතිංස දෙවියන් අතර සහභාවයට යෙයි. මහණෙනි, එහි ශක්‍රදේවේන්ද්‍ර තෙමෙ දානමයපුණ්‍යක්‍රියා වස්තුව අතිරෙක ව කොට, ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට තාවතිංසදෙවියන් දිව්‍ය වූ ආයුෂයෙන් –පෙ– දිව්‍ය වූ පහසිනැයි දස කරුණෙකින් මැඩගෙන සිටුයේ ය.

5. මහණෙනි, මෙලොවහි එකකු විසින් දානමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍රයෙන් කරනලද වෙයි. ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍රයෙන් කරනලද වෙයි. භාවනාමයපුණ්‍යක්‍රියාවස්තුව නො නිපැයෙයි. හේ කාබුන් මරණින් මතු යාමදෙවියන්ගේ සහභාවයට පැමිණේ. මහණෙනි, සුයාමදෙවපුත්‍රතෙමේ දානමයපුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට ශීලමය පුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට දිව්‍ය වූ ආයුෂයෙන් ... දිව්‍ය වූ පහසිනැයි දසකරුණෙකින් යාමදෙවියන් මැඩගෙන සිටුනේ ය.

6. ඉධ පන භික්ඛවෙ, එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, සීලමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු නාභිසම්භොති. සො කායස්ස භෙදා පරම්මරණා තුසිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. තත්‍ර භික්ඛවෙ සන්තුසිතො දෙවපුත්තො දානමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා, සීලමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා තුසිතෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති. දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

7. ඉධ පන භික්ඛවෙ, එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති. සීලමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති. භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු නාභිසම්භොති. සො කායස්ස භෙදා පරම්මරණා නිම්මාණරතීනං දෙවානං සහව්‍යතං උපපජ්ජති. තත්‍ර භික්ඛවෙ සුනිම්මිතො දෙවපුත්තො දානමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා, සීලමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා නිම්මාණරතී දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති. දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

8. ඉධ පන භික්ඛවෙ, එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, සීලමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු නාභිසම්භොති. සො කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිත වසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජති. තත්‍ර භික්ඛවෙ, වසවත්තී දෙවපුත්තො දානමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා, සීලමයං පුඤ්ඤකිරියවත්ථුං අතිරෙකං කරිත්වා, පරනිම්මිතවසවත්තී දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති දිබ්බෙන, ආයුනා, දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන, දිබ්බෙන යසෙන, දිබ්බෙන ආධිපතෙය්‍යෙන, දිබ්බෙහි රූපෙහි, දිබ්බෙහි සද්දෙහි, දිබ්බෙහි ගන්ධෙහි, දිබ්බෙහි රසෙහි, දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

ඉමානි ඛො භික්ඛවෙ, තීණි පුඤ්ඤකිරියවත්ථූනීති.

මහණෙනි, මෙ ලොව්හි එකකු විසින් දානමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍රයෙන් කරනලද වෙයි. ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍රයෙන් කරනලද වෙයි, භාවනාමයපුණ්‍යක්‍රියාවස්තුව නො නිපැයෙයි. හේ කාබුන් මරණින් මතු තුසිතදෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. මහණෙනි, එහි සන්තුෂිත දේවපුත්‍ර තෙමේ දානමයපුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට, ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට දිව්‍ය වූ ආයුෂයෙන් ... දිව්‍ය වූ පහසිනැයි දසකරුණෙකින් තුසිත දෙවියන් මැඩගෙන සිටුනේ ය.

මහණෙනි, මෙ ලොව්හි එකකු විසින් දානමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍රයෙන් කරනලද වෙයි. ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍රයෙන් කරනලද වෙයි. භාවනාමයපුණ්‍යක්‍රියාවස්තුව නො නිපැයෙයි. හේ කාබුන් මරණින් මතු නිර්මාණරති දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. මහණෙනි, එහි සුනිර්මිත දෙවපුත්‍ර තෙමේ දානමයපුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට, ශීලමය පුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට දිව්‍ය වූ ආයුෂයෙන් ... දිව්‍ය වූ පහසිනැයි දසකරුණෙකින් නිර්මාණරති දෙවියන් මැඩගෙන සිටුනේ ය.

මහණෙනි, මෙ ලොව්හි එකකු විසින් දානමය පුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍රයෙන් කරනලද වෙයි. ශීලමය පුණ්‍යක්‍රියාවස්තුව අධිමාත්‍රයෙන් කරනලද වෙයි. භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුව නො නිපැයෙයි. හේ කාබුන් මරණින් මතු පරනිර්මිත වසවත්ති දෙවියන්ගේ සහභාවයට පැමිණේ. මහණෙනි, වශවර්ති දෙවපුත්‍ර තෙම දානමයපුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට, ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව අතිරෙක ව කොට, දිව්‍ය වූ ආයුෂයෙන්, දිව්‍ය වූ වර්ණයෙන්, දිව්‍ය වූ සුඛයෙන්, දිව්‍ය වූ යශසින්, දිව්‍ය වූ ආධිපත්‍යයෙන්, දිව්‍ය වූ රූපයෙන්, දිව්‍ය වූ ශබ්දයෙන්, දිව්‍ය වූ ගන්ධයෙන්, දිව්‍ය වූ රසයෙන්, දිව්‍ය වූ පහසිනැයි දසකරුණෙකින් පරනිර්මිතවශවර්ති දෙවියන් මැඩගෙන සිටුනේ ය.

මහණෙනි, මේ තුන් පින්කිරියවත්හු වෙත්.

## 8. 1. 4. 7

## සප්පුරිසදාන සුත්තං

[සාවත්ථිනිදානං]

37. අට්ඨිමානි භික්ඛවෙ, සප්පුරිසදානානි, කතමානි අට්ඨ:

සුචිං දෙති, පණීතං දෙති, කාලෙන දෙති, කප්පියං දෙති, විචෙය්‍ය දෙති, අභිණ්හං දෙති, දදං චිත්තං පසාදෙති, දත්වා අත්තමනො හොති. ඉමානි ඛො භික්ඛවෙ, අට්ඨ සප්පුරිසදානානීති.

1. සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජනං,
අභිණ්හං දදාති දානං සුඛෙත්තෙසු[1] බ්‍රහ්මචාරිසු.

2. න ච[2] විප්පටිසාරිස්ස චජිත්වා ආමිසං බහුං,
එවං දින්නානි දානානි වණ්ණයන්ති විපස්සිනො.

3. එවං යජිත්වා මෙධාවී සද්ධො මුත්තෙන චෙතසා,
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජතීති.

## 8. 1. 4. 8

## සප්පුරිස සුත්තං

[සාවත්ථිනිදානං]

සප්පුරිසො භික්ඛවෙ, කුලෙ ජායමානො බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය හොති මාතාපිතුන්නං අත්ථාය හිතාය සුඛාය හොති. පුත්තදාරස්ස අත්ථාය හිතාය සුඛාය හොති, දාසකම්මකරපොරිසස්ස අත්ථාය හිතාය සුඛාය හොති. මිත්තාමච්චානං අත්ථාය හිතාය සුඛාය හොති. පුබ්බපෙතානං අත්ථාය හිතාය සුඛාය හොති, රඤ්ඤො අත්ථාය හිතාය සුඛාය හොති දෙවතානං අත්ථාය හිතාය සුඛාය හොති, සමණබ්‍රාහ්මණානං අත්ථාය හිතාය සුඛාය හොති.

---

1. සුඛෙත්තෙ, PTS.
2. නෙව – මජසං.

## 8. 1. 4. 7
## සප්පුරිසදාන සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ සත්පුරුෂදාන අටෙකි. කවර අටෙක යත්:

පිරිසිදු දිය දෙයි. ප්‍රණීත දිය දෙයි. සුදුසුකල්හි දෙයි. කැපවූවක් දෙයි. පරීක්ෂාකොට දෙයි. නිරතුරු දෙයි. දෙනුයේ සිත පහන් කෙරෙයි, දී තුටුසිත් ඇතියේ වෙයි. මහණෙනි, මේ සත්පුරුෂ දාන අටයි.

1. මනා ක්ෂේත්‍ර වූ බ්‍රහ්මචාරීන් කෙරෙහි පිවිතුරු වූ පිණි වූ සුදුසු කල්හි වූ කැප වූ පානභොජන සඞ්ඛ්‍යාත දානය නිතර දෙන්නේ ය.

2. බොහෝ ආමිස දී නො ද විපිළිසර වන්නේ ය. විදර්ශීහු (ප්‍රාඥයෝ) මෙසේ දෙනලද දන් වනත්.

3. සැදැහැති ස්‍වානොත්පත්තික නුවණ ඇති පණ්ඩිත තෙමේ (මසුරුමලින්) මුත් සිතින් මෙසේ දන් දී නිදුක් සැප ඇති ලොවට පැමිණේ.

## 8. 1. 4. 8
## සප්පුරිස සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, සත්පුරුෂ තෙමේ කුලෙහි උපදනේ බොහෝ දෙනාට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි, මවුපියනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි අඹුදරුවනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි, දස්කම්කරුපුරිස්නට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි, මිත්‍ර අමාත්‍යයනට (සගයහළුවනට) අර්ථ පිණිස හිත පිණිය සුව පිණිස වෙයි, පරලොව ගියවුනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි, රජුට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි, දෙවියනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. මහණ, බමුණනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වේ.

සෙය්‍යථාපි භික්ඛවෙ, මහාමෙඝො සබ්බසස්සානුසම්පාදෙන්තො බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය හොති. එවමෙව ඛො භික්ඛවෙ, සප්පුරිසො කුලෙ ජායමානො බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය හොති. මාතාපිතූනං අත්ථාය හිතාය සුඛාය හොති. පුත්තදාරස්ස අත්ථාය හිතාය සුඛාය හොති. දසකම්මකරපොරිසස්ස අත්ථාය හිතාය සුඛාය හොති. මිත්තාමච්චානං අත්ථාය හිතාය සුඛාය හොති, පුබ්බපෙතානං අත්ථාය හිතාය සුඛාය හොති. රඤ්ඤො අත්ථාය හිතාය සුඛාය හොති. දෙවතානං අත්ථාය හිතාය සුඛාය හොති. සමණබ්‍රාහ්මණානං අත්ථාය හිතාය සුඛාය හොති.

1. බහූන්නං[1] වත අත්ථාය සප්පඤ්ඤො ඝරමාවසං,
මාතරං පිතරං පුබ්බෙ රත්තින්දිවමතන්දිතො.

2. පූජෙති සහධම්මෙන පුබ්බෙ කතමනුස්සරං,
අනාගාරෙ පබ්බජිතෙ අපචෙ[2] බ්‍රහ්මචාරයො[3]

3. නිවිට්ඨසද්ධො පූජෙති ඤත්වා ධම්මෙධපෙසලෙ,[4]
රඤ්ඤො හිතො දෙවහිතො ඤාතීනං සඛීනං හිතො.

4. සබ්බෙසං සො හිතො[5] හොති සද්ධම්මෙ සුප්පතිට්ඨිතො,
විනෙය්‍ය මච්ඡෙරමලං සලොකං භජතෙ සිවන්ති.

## 8. 1. 4. 9

## පුඤ්ඤාභිසන්ද සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ, පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. කතමෙ අට්ඨ:

1. ඉධ භික්ඛවෙ, අරියසාවකො බුද්ධං සරණං ගතො හොති. අයං භික්ඛවෙ, පඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

---

1. බහූනං – මජසං.
2. අපාචෙ – සයා
3. බ්‍රහ්මචාරිනො – සයා.
4. පෙසලො – සී මු.
5. සහිතො – සයා. PTS,

මහණෙනි, යම්සේ මහාමේඝය සර්වසස්‍යයන් සමෘද්ධ කරනුයේ බොහෝ දෙනාට අර්ථය පිණිස හිත පිණිස සුව පිණිස වේ ද, මහණෙනි, එපරිදි ම සත්පුරුෂ තෙමේ කුලෙහි උපදනේ බොහෝ දෙනාට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. මවුපියනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. අඹුදරුවනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. දස් කම්කරු පුරිසනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. මිත්‍රාමාත්‍යයනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. පූර්වප්‍රේතයනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. රජුට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වෙයි. දෙවියනට අර්ථපිණිස හිත පිණිස සුව පිණිස වෙයි. මහණබමුණනට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස වේ.

1. සප්‍රාඥ තෙමේ ගෙහි වසනුයේ බොහෝ දෙනාට අර්ථ පිණිස ම (වෙයි). පළමු කොට දිව රෑ දෙක්හි අනලස් වූයේ මව හා පියා හා,

2. පෙර කළ ගුණ සමරමින් සකරුණින් (ප්‍රත්‍යය පූජායෙන්) පුදන්නේ ය. අනගාරිය වූ පැවිදි බඹසරුන් පුදන්නේ ය.

3. බැසගත් සැදැහැ ඇතියේ ධර්මයන් දන මෙ ලොව ප්‍රියශීලීන් පුදයි. රජුට හිත වූයේ දෙවියනට හිත වූයේ නෑයනට හා යහළුවනට හිත වූයේ වෙයි.

4. සදහම්හි සුපිහිටි හෙ හැමට හිත වූයේ වෙයි. හේ මසුරුමල මැඩ ස්වර්ගලෝකය බජේයි.

## 8. 1. 4. 9

## පුඤ්ඤාභිසන්ද සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, කුශල ප්‍රසව කරන සුව එළවන්නා වූ මොනවට රූපාදි අග සැප දෙන, සුඛ විපාක ඇති සගසැප පිණිස පවත්නා වූ මේ පුණ්‍යාභි-ස්‍යන්දයෝ (පින් ඉපදීමට හේතු වන කරුණු) අට දෙනෙක් ඉෂ්ටය පිණිස කාන්තය (ප්‍රියභාවය) පිණිස මනවඩනා පිණිස හිත පිණිස සුව පිණිස පවත්නාහ. කවර අට දෙනෙක යත්:

1. මහණෙනි, මෙ ලොව අරිසවු තෙමේ බුදුන් සරණ ගියේ වෙයි. මහණෙනි, කුශල ප්‍රසව කරන සුව එළවන, මොනවට අග්‍රරූපාදිය දෙන සුඛවිපාක ඇති ස්වර්ගය පිණිස පවත්නා මේ පළමුවන පුණ්‍යාභිස්‍යන්දය ඉෂ්ටය පිණිස කාන්තභාවය පිණිස මනවඩනා පිණිස හිත පිණිස සුව පිණිස පවත්නේ ය.

2. පුනචපරං භික්ඛවෙ, අරියසාවකො ධම්මං සරණං ගතො හොති. අයං භික්ඛවෙ, දුතියො පුඤ්ඤාභිසන්දො -පෙ- සංවත්තති.

3. පුනචපරං භික්ඛවෙ, අරියසාවකො සඞ්ඝං සරණං ගතො හොති. අයං භික්ඛවෙ, තතියො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

4. පඤ්චිමානි භික්ඛවෙ, දානානි මහාදානානි අග්ගඤ්ඤානි රත්තඤ්ඤානි වංසඤ්ඤානි පොරාණානි අසංකිණ්ණානි අසංකිණ්ණපුබ්බානි න සංකීයන්ති න සංකීයිස්සන්ති අප්පටිකුට්ඨානි සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. කතමානි පඤ්ච:

ඉධ භික්ඛවෙ, අරියසාවකො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති. පාණාතිපාතා පටිවිරතො භික්ඛවෙ, අරියසාවකො අපරිමාණානං සත්තානං අභයං දෙති. අවෙරං දෙති. අව්‍යාපජ්ඣං දෙති. අපරිමාණානං සත්තානං අභයං දත්වා අවෙරං දත්වා අබ්‍යාපජ්ඣං දත්වා අපරිමාණස්ස අභයස්ස අවෙරස්ස අබ්‍යාපජ්ඣස්ස භාගී හොති. ඉදං භික්ඛවෙ, පඨමං දානං මහාදානං, අග්ගඤ්ඤං රත්තඤ්ඤං වංසඤ්ඤං පොරාණං අසංකිණ්ණං අසංකිණ්ණපුබ්බං න සංකීයති න සංකීයිස්සති අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. අයං භික්ඛවෙ චතුත්ථො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

5-8 පුනචපරං භික්ඛවෙ, අරියසාවකො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති -පෙ- කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති -පෙ- මුසාවාදං පහාය මුසාවාද පටිවිරතො හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො භික්ඛවෙ අරියසාවකො අපරිමාණානං සත්තානං අභයං දෙති. අවෙරං දෙති. අබ්‍යාපජ්ඣං දෙති. අපරිමාණානං සත්තානං අභයං දත්වා අවෙරං දත්වා අබ්‍යාපජ්ඣං දත්වා අපරිමාණස්ස අභයස්ස අවෙරස්ස අබ්‍යාපජ්ඣස්ස භාගී හොති.

2. තවද මහණෙනි, අරිසවුතෙමේ දහම් සරණ ගියේ වෙයි. මහණෙනි, මේ ... දෙවන පුණ්‍යාභිස්‍යන්දය පවත්නේ ය.

3. තවද මහණෙනි, අරිසවුතෙමේ සඟුන් සරණ ගියේ වෙයි. මහණෙනි, කුශලප්‍රසවකරන, සුව එළවන, ස්වර්ගරූපාදිය දෙන සුඛවිපාක ඇති ස්වර්ගයෙහි උපතට හේතු වන මේ තෙවන පුණ්‍යාභිස්‍යන්දය ඉෂ්ටය පිණිස කාන්තභාවය පිණිස මනවඩනු පිණිස හිත පිණිස සුව පිණිස පවත්නේ ය.

4. මහණෙනි, අග්‍ර යයි දතයුතු වූ දිඝකල් පැවැත්තාහ යි දතයුතු වූ වංශ යයි දතයුතු වූ පැරණි වූ අසඩකීර්ණ වූ (නො හළ) (පෙර බුදුවරුන් විසිනුදු) අසංකීර්ණ පූර්ව වූ මහදන් වූ මේ දන්හු පස්දෙනෙක් (දනුදු) නො තෙරනා ලැබෙත් (අනායෙහිදු) නො තෙරනු ලබන්නාහ. නුවණැති මහණබමුණන් විසින් අනින්දිත වෙත්. කවර පස් දෙනෙක යත්:

මහණෙනි, මෙලොවහි අරිසවු තෙමේ පණිවා හැර පණිවායෙන් වැළැකියේ වෙයි. මහණෙනි, පණිවායෙන් වැළැකි අරිසවු තෙමේ අපරිමාණ වූ සත්නට අභය දෙන්නේ ය. අවෛරය දෙන්නේ ය. නිදුක්බව දෙන්නේ ය. අපරිමාණ වූ සත්නට අභය දී අවෛරය දී නිදුක් බව දී අපරිමාණ වූ අභයට අවෛරයට, නිදුක් බවට භාගී (හිමි) වෙයි. මහණෙනි, අග්‍ර යයි දතයුතු, දිඝකල්පැවැතියේ යයි දතයුතු, වංශ යයි දතයුතු පැරණි වූ අසඩකීර්ණ වූ අසඩකීර්ණ පූර්ව වූ නුවණැති මහණ බමුණන් විසින් නො පිළිකෙවූ කළ දානය වන මහාදනය නො තෙරනා ලැබේ. නො තෙරනාලබන්නේ ය. මහණෙනි, කුශලප්‍රසව කරන, සුව එළවන, ස්වර්ගරූපාදිය දෙන, සුඛ විපාක ඇති ස්වර්ගයෙහි උපතට හෙතු වූ මේ සිවුවන පුණ්‍යාභිස්‍යන්දය ඉෂ්ටය පිණිස කාන්තභාවය පිණිස මනවඩනු පිණිස, හිත පිණිස සුඛ පිණිස පවත්නේ ය.

5-8. තවද මහණෙනි, අරිසවු තෙමේ අයිනාදන් හැර අයිනාදනින් වැළැකියේ වෙයි ... කාමයෙහි මිසහසර හැර කාමයෙහි මිසහසරින් වෙන් වූයේ වෙයි ... මුසවා හැරදමා මුසවායෙන් වැළැකියේ වෙයි ... මද ප්‍රමාදයට කරුණු වූ රහමෙර හැර මද ප්‍රමාදයට කරුණු වූ රහමෙරින් වැළැකියේ වෙයි. මහණෙනි, මදයට හා ප්‍රමාදයට කරුණු වූ රහමෙරින් වැළැකි අරිසවු තෙමේ අපරිමාණ වූ සත්නට අභය දෙන්නේ ය. අවෛරය දෙන්නේ ය, නිදුක්බව දෙන්නේ ය. අපරිමාණ වූ සත්නට අභය දී අවෛරය දී නිදුක්බව දී අපරිමාණ වූ අභයට අවෛරයට නිදුක්බවට භාගී වෙයි.

ඉදං භික්ඛවෙ, පඤ්චමං දානං. මහාදානං අග්ගඤ්ඤං රත්තඤ්ඤං වංසඤ්ඤං පොරාණං අසංකිණ්ණං අසංකිණ්ණපුබ්බං න සඞ්කීයති න සඞ්කීයිස්සති අප්පටිකුට්ඨං සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. අයං භික්ඛවෙ අට්ඨමො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ පුඤ්ඤාභිසන්දා කුසලාභිසන්දා සුඛස්සාහාරා සොවග්ගිකා සුඛවිපාකා සග්ගසංවත්තනිකා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්තීති.

## 8. 1. 4. 10

## අපායසංවත්තනික සුත්තං

[සාවත්ථිනිදානං]

1. පාණාතිපාතො භික්ඛවෙ, ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො තිරච්ඡානයොනිසංවත්තනිකො පෙත්තිවිසයසංවත්තනිකො, යො සබ්බලහුසො පාණාතිපාතස්ස විපාකො මනුස්සභූතස්ස අප්පායුකසංවත්තනිකො හොති.

2. අදින්නාදානං භික්ඛවෙ, ආසෙවිතං භාවිතං බහුලීකතං නිරයසංවත්තනිකං තිරච්ඡානයොනිසංවත්තනිකං පෙත්තිවිසයසංවත්තනිකං, යො සබ්බලහුසො අදින්නාදානස්ස විපාකො මනුස්සභූතස්ස භොගව්‍යසනසංවත්තනිකො හොති.

3. කාමෙසු මිච්ඡාචාරො භික්ඛවෙ, ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො තිරච්ඡානයොනිසංවත්තනිකො පෙත්තිවිසයසංවත්තනිකො, යො සබ්බලහුසො කාමෙසු මිච්ඡාචාරස්ස විපාකො මනුස්සභූතස්ස වෙරසපත්තසංවත්තනිකො හොති.

මහණෙනි, අග්‍ර යයි දතයුතු, දිගුකල් පැවතියේයයි දතයුතු, වංශ යයි දතයුතු පැරණි වූ අසංකීර්ණ වූ අසංකීර්ණ පූර්ව දනය වන, නුවණැති මහණබමුණන් විසින් නො පිළිකුල් කළ මේ සිවුවන මහාදනය නො නෙරනා ලැබෙයි. නො නෙරනු ලබන්නේ යි. මහණෙනි, කුශල ප්‍රසවකරන, සුව එළවන, ස්වර්ගරූපාදිය දෙන, සුඛවිපාක ඇති, ස්වර්ගයට හේතු වන මේ අට වැනි පුණ්‍යාභිස්‍යන්දය ඉෂ්ටය පිණිස කාන්තභාවය පිණිස, මන වඩනා පිණිස හිත පිණිස සුව පිණිස පවත්නේ ය.

මහණෙනි, කුශල් ප්‍රසව කරන සුව එළවන, ස්වර්ගරූපාදිය දෙන, සුඛ විපාක ඇති ස්වර්ගයට කරුණු වන මේ අෂ්ට පුණ්‍යාභිස්‍යන්දයෝ ඉටුබව පිණිස කාන්තභාවය පිණිස මන වඩනු පිණිස හිත පිණිස සුව පිණිස පවත්නාහ යි.

## 8. 1. 4. 10

## අපායසංවත්තනික සූත්‍රය

**[සැවැත්නිදන යි]**

1. මහණෙනි, පණිවා සෙවුනා ලදුයේ වඩන ලදුයේ බහුල වශයෙන් ක්‍රන ලදුයේ නිරයෙහි උපතට කරුණු වූයේ වෙයි, තිරිසන් යොන්හි උපතට කරුණු වූයේ වෙයි. ප්‍රේතවිෂයෙහි උපතට කරුණු වූයේ වෙයි. යටතින් පණිවාහුගේ යම් විපාකයෙක් වේ නම් මිනිස් වූවහුගේ අල්පායුෂ්කභාවයට හේතු වූයේ වෙයි.

2. මහණෙනි, අයිනාදන් සෙවුනා ලදුයේ වඩන ලදුයේ බහුල වශයෙන් කරන ලදුයේ නිරයෙහි උපතට හේතු වෙයි. තිරිසන්යොන්හි උපතට හේතු වෙයි. ප්‍රේතවිෂයෙහි උපතට හේතු වෙයි. අයිනාදන්හුගේ ලුහු විසින් යම් විපාකයෙක් වේ නම් මිනිස් වූවහුගේ භොගව්‍යසනය පිණිස හේතු වූයේ වෙයි.

3. මහණෙනි, කාමයෙහි මිසහසර සෙවුනා ලදුයේ වඩනලදුයේ බහුලීකෘත වූයේ නිරයෙහි උපතට හේතු වෙයි. තිරිසන් යොන්හි උපතට හේතු වෙයි. ප්‍රෙතවිෂයෙහි උපතට හේතු වෙයි. කාමමිථ්‍යාචාරයාගේ යටතින් යම් විපාකයෙක් වේ නම් මිනිස් වූවහුගේ සතුරන් සහිත වෛරයට කරුණු වූයේවෙයි.

4. මුසාවාදො භික්ඛවෙ, ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො තිරච්ඡානයොනිසංවත්තනිකො පෙත්තිවිසයසංවත්තනිකො, යො සබ්බලහුසො[1] මුසාවාදස්ස විපාකො මනුස්සභූතස්ස අභූතබ්භක්ඛානසංවත්තනිකො හොති.

5. පිසුණා භික්ඛවෙ, වාචා ආසෙවිතා භාවිතා බහුලීකතා නිරය සංවත්තනිකා තිරච්ඡාන යොනිසංවත්තනිකා පෙත්තිවිසය සංවත්තනිකා, යො සබ්බලහුසො පිසුණාය වාචාය විපාකො මනුස්සභූතස්ස මිත්තෙහි භෙදනසංවත්තනිකො හොති.

6 ඵරුසා භික්ඛවෙ, වාචා ආසෙවිතා භාවිතා බහුලීකතා නිරය සංවත්තනිකා තිරච්ඡානයොනිසංවත්තනිකා පෙත්තිවිසයසංවත්තනිකා, යො සබ්බලහුසො ඵරුසාය වාචාය විපාකො මනුස්සභූතස්ස අමනාප සද්දසංවත්තනිකො හොති.

7. සම්ඵප්පලාපො භික්ඛවෙ, ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො තිරච්ඡානයොනිසංවත්තනිකො පෙත්තිවිසයසංවත්තනිකො. යො සබ්බලහුසො සම්ඵප්පලාපස්ස විපාකො මනුස්සභූතස්ස අනාදෙය්‍ය වාචාසංවත්තනිකො හොති.

8. සුරාමෙරයපානං භික්ඛවෙ, ආසෙවිතං භාවිතං බහුලීකතං නිරයසංවත්තනිකං තිරච්ඡානයොනිසංවත්තනිකං පෙත්තිවිසයසංවත්තනිකං, යො සබ්බලහුසො සුරාමෙරයපානස්ස විපාකො මනුස්සභූතස්ස උම්මත්තක සංවත්තනිකො හොතීති.

දානවග්ගො චතුත්ථො.

තත්‍රුද්දානං:

දෙව දානානි වත්ථූණි මෙත්තං දානුපපත්තියො
කිරියං දෙවසප්පුරිසා අභිසන්දෙ සංවත්තනීති.

1. සබ්බලහුකො – සයා.

4. මහණෙනි, මුසාවාදය සෙවුනාලද්දේ වඩන ලද්දේ බහුලීකෘත වූයේ නිරයෙහි උපතට හේතු වෙයි, තිරිසන්යොන්හි උපතට හේතු වෙයි, ප්‍රේත විෂයෙහි උපතට හේතු වෙයි. මුසාවාදයාගේ ලුහු විසින් යම් විපාකයෙක් වේ නම් මිනිස් වූවහුගේ අභූතයෙන් අභ්‍යාඛ්‍යානයට කරුණු වූයේ වෙයි.

5. මහණෙනි, පිසුණුබස් සෙවුනා ලද්දේ වඩනා ලද්දේ බහුල වශයෙන් කරන ලද්දේ නිරයෙහි උපතට හේතු වෙයි, තිරිසන් යොන්හි උපතට හේතු වෙයි, ප්‍රේත විෂයෙහි උපතට හේතු වෙයි. පිසුණවාචයාගේ ලුහු විසින් යම් විපාකයෙක් වේ නම් මිනිස් වූවහුට මිතුරන් සමග බිඳීමට කරුණු වූයේ වෙයි.

6. මහණෙනි, පරොස්බස් සෙවුනා ලදුයේ වඩනලදුයේ බහුලීකෘත වූයේ නිරයෙහි උපතට හේතු වෙයි, තිරිසන්යොන්හි උපතට හේතු වෙයි, ප්‍රේතවිෂයෙහි උපතට හේතු වෙයි. පරුෂවචනයාගේ ලුහු විසින් යම් විපාකයෙක් වේ නම් මිනිස් වූවහුගේ අමනාපශබ්දයට කරුණු වූයේ වෙයි.

7. මහණෙනි, සම්ඵප්‍රලාපය සෙවුනා ලද්දේ වඩන ලද්දේ බහුලීකෘත වූයේ නිරයෙහි උපතට කරුණු වෙයි, තිරිසන්යොන්හි උපතට කරුණු වෙයි, ප්‍රේතවිෂයෙහි උපතට කරුණු වෙයි. සම්ඵප්‍රලාපයාගේ ලුහු විසින් යම් විපාකයක් වේ නම් මිනිස් වූවහුගේ නො ඇදහිය හැකි වචනයට කරුණු වූයේ වෙයි.

8. මහණෙනි, රහමෙර පීම සෙවුනා ලද්දේ වඩනා ලද්දේ බහුලීකෘත වූයේ නිරයෙහි උපතට කරුණු වෙයි, තිරිසන් යොන්හි උපතට කරුණු වෙයි, ප්‍රේතවිෂයෙහි උපතට කරුණු වෙයි. සුරාමෙරයපානයාගේ ලුහු විසින් යම් විපාකයෙක් වේ නම් මිනිස් වූවහුට උමතුබව පිණිස කරුණු වන්නේ යි.

## සිවුවන දනවග යි.

**එහි උද්දානය:**

දනසූත්‍ර දෙක ය, (දන) වස්තුසූත්‍ර ය, ඛෙත්තසූත්‍ර ය, දනූපපත්තිසූත්‍ර ය (පුණ්‍ය) ක්‍රියා සූත්‍ර ය, සප්පුරිසසූත්‍ර දෙක ය, අභිසන්දසූත්‍ර ය සංවත්තනික සූත්‍රය ද වේ.

# 5. උපොසථවග්ගො

## 8. 1. 5. 1

## සඞ්ඛිත්ත අට්ඨඞ්ගුපොසථ සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතද වොච:

අට්ඨඞ්ගසමන්නාගතො භික්ඛවෙ, උපොසථො උපවුත්ථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො.

කථං උපවුත්ථො ච භික්ඛවෙ, අට්ඨඞ්ගසමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො:

1. ඉධ භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා සබ්බපාණභූතහිතානුකම්පිනො විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරාමි. ඉමිනාපහං[1] අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා පඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

2. යාවජීවං අරහන්තො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතා දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරාමි. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා දුතියෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

---

1. ඉමිනාපඞ්ගෙනාපහං - මජසං

# 5. උපෝසථවග්ගය

## 8. 1. 5. 1

## සඞ්ඛිත්ත අට්ඨඞ්ගුපොසථ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමැතූ සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස් වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය කරුණ වදාළ සේක:

මහණෙනි, අටඟෙකින් සමන්වාගත පෙහෙවස් වසන ලද්දයේ මහත්ඵල ඇත්තේ වෙයි, මහානෘශංස ඇත්තේ වෙයි, මහත් බැබළීම ඇත්තේ වෙයි, මහත් පැතිරීම ඇත්තේ ද වෙයි.

මහණෙනි, කෙසේ වසනලද අටඟින් යුත් පෙහෙවස මහත්ඵල වේ ද, මහානිසංස වේ ද, මහාද්‍යුතික වේ ද, මහා විස්ථාර වේ ද යත්:

1. මහණෙනි, මෙසස්නෙහි අරිසවූ මෙසේ නුවණින් සලකන්නේ ය: "රහත්හු දිවිහිම් කොට ප්‍රාණඝාත හැර ප්‍රාණඝාතයෙන් වැළකියාහු බහා තැබූ දඬු ඇත්තාහු බහාතැබූ අවි ඇත්තාහු ලජ්ජා ඇත්තාහු දයාවට පැමිණියාහු සර්වප්‍රාණිගණයා කෙරෙහි හිතානුකම්පා ඇති ව වසන්නාහ. මම ද අද මේ රැයත් මේ දවලත් පණිවා හැර පණිවායෙන් වැළකීයෙම් බහාතැබූ දඬු ඇතියෙම් බහාලූ අවි ඇතියෙම් ලජ්ජා ඇතියෙම් දයාවට පැමිණියෙම් සර්වප්‍රාණි ගණයා කෙරෙහි හිතානුකම්පා ඇතියෙම් වෙසෙමි. මම මේ අඞ්ගයෙනුදු රහතුන් අනුකරණ කෙරෙමි. මා විසින් පෙහෙවස් ද වසන ලද වනැ යි මේ පළමු අඞ්ගයෙන් සමන්වාගත වෙයි.

2. රහත්හු දිවිහිම් කොට අයිනාදන් හැර අයිනාදනින් වැළකියාහු දුන් දෑ ගන්නාහු දුන් දෑ කැමැති වන්නාහු නො සොර වූ පිවිතුරු සිතින් වසන්නාහ. මම ද අද මේ රැයත් මේ දවලත් අයිනාදන් හැරපියා අයිනාදනින් වැළැකියෙම් දුන් දෑ ගන්නෙම් දුන දෑ කැමැති වන්නෙම් නො සොර වූ පිවිතුරු වූ සිතින් වෙසෙමි. මම මේ අඞ්ගයෙනුදු රහතුන් අනුකරණ කෙරෙමි. පෙහෙවස් ද මා විසින් වසන ලද වනැ යි මේ දෙවන අඞ්ගයෙන් සමන්වාගත වෙයි.

3. යාවජීවං අරහන්තො අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරිනො ආරාචාරිනො විරතා මෙථුනා ගාමධම්මා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා විහරාමි, ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා තතියෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

4. යාවජීවං අරහන්තො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතා සච්චවාදිනො සච්චසන්ධා ථෙතා පච්චයිකා අවිසංවාදකා ලොකස්ස. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා චතුත්ථෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

5. යාවජීවං අරහන්තො සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා පඤ්චමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

6. යාවජීවං අරහන්තො ඒකභත්තිකා රත්තූපරතා විරතා විකාලභොජනා. අහම්පජ්ජ ඉමඤ්චරත්තිං ඉමඤ්චදිවසං ඒකභත්තිකො රත්තූපරතො විරතො විකාලභොජනා. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා ඡට්ඨෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

7. යාවජීවං අරහන්තො නච්චගීතවාදිතවිසූකදස්සනමාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං නච්චගීතවාදිත විසූකදස්සනමාලාගන්ධවිලෙපනධාරණමණ්ඩන විභූසනට්ඨානා පටිවිරතො. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති. ඉමිනා සත්තමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

3. රහත්හු දිවිහිමියෙන් අබ්‍රම්සර හැර බ්‍රම්සර ඇත්තාහු (අබ්‍රහ්මචර්‍ය්‍යයෙන්) දුරු ව හැසිරෙන්නාහු ග්‍රාම්‍යධර්ම සඞ්ඛ්‍යාත මෙවුන්දම්න් වැළකියාහු වෙසෙත්. මම ද අද මේ රැයත්, මේ දවලත් අබ්‍රම්සර හැර බ්‍රම්සර ඇතියෙම් (අබ්‍රහ්මචර්‍ය්‍යයෙන්) දුරු වූ හැසුරුම් ඇතියෙම් ග්‍රාමධර්ම වූ මෙවුන්දම්න් වැළකියෙම් වෙසෙමි. මම් මේ අඟිනුදු රහතුන් අනුකරණ කෙරෙමි. මා විසින් පෙහෙවස් වසන ලද වනැ යි මේ තෙවන අඞ්ගයෙන් සමන්වාගත වෙයි.

4. රහත්හු දිවිහිම් කොට මුසාවාදය හැර මුසාවාදයෙන් වැළැකියාහු සත්‍යවචන කියන්නාහු ඇත්තෙන් ඇත්ත ගළපා කියන්නාහු තහවුරු ව පිහිටි කථා ඇත්තාහු ඇදැහිය යුතු කථා ඇත්තාහු ලොව නො රවටන්නාහු වෙත්. මම ද අද මේ රැයත් මේ දහවලත් මුසවා හැර මුසවායෙන් වැළැකියෙම් ඇත්ත කියන්නෙම් ඇත්තෙන් ඇත්ත ගළපා කියන්නෙම් සථිර ව පිහිටි කථා ඇත්තෙම් ඇදැහිය යුතු කථා ඇත්තෙම් ලොව නො රවටන්නෙම් වෙමි. මම මේ කරුණින් ද රහතුන් අනුකරණ කෙරෙමි, මා විසින් පෙහෙවස් වසන ලද වනැ යි මේ සිවු වන කරුණින් සමන්වාගත වෙයි.

5. රහත්හු දිවිහිම් කොට මද ප්‍රමාදයට කරුණු වූ රහමෙර හැර මද ප්‍රමාදයට කරුණු වූ රහමෙරින් වැළැකියාහු වෙත්. මම ද මේ රැයත් මේ දවලත් මද ප්‍රමාදයට කරුණු වූ රහමෙර හැර මද ප්‍රමාදයට කරුණු වූ රහමෙරින් වැළැකියෙම් වෙමි. මම මේ කරුණිනුදු රහතුන් අනුකරණ කරමි, මා විසින් පෙහෙවස් වසන ලද වනැ යි මේ පස්වන අඞ්ගයෙන් යුතු වෙයි.

6. රහත්හු දිවිහිම් කොට එක් ම (පෙරවරු) බත ඇත්තාහු රාත්‍රි භෝජනයෙන් තොර වූවාහු විකල් බොජුනෙන් වැළැකියාහු වෙත්. මම ද අද මේ රැයත් මේ දවලත් එක භක්තික වූයෙම් රෑ බොජුනෙන් වැළැකියෙම් විකල් බොජුනෙන් වැළැකියෙම් වෙමි. මම මේ අඟිනුදු රහතුන් අනුකරණ කරමි, මා විසින් පෙහෙවස් වසන් ලද වනැ යි මේ සවන අඟින් සමන්වාගත වෙයි.

7. රහත්හු දිවිහිම් කොට නැටුම් ගැයුම් වැයුම් විසුළු දැකුම් යන මෙයින් ද මල් ගඳ විලෙවුන් යන මේ පැළැඳ ගැනුම අඩුතැන් පිරවීම ඡවිරාග කරණ යන මෙයට කරුණු වන දැයින් ද වැළැකියාහු වෙති. මම ද මේ රැයත් දවලත් නැටුම් ගැයුම් වැයුම් විසුළු දස්නෙන් හා මල් ගඳ විලෙවුන් යන මේ පැළැඳගැනුම අඩුතැන් පිරවීම ඡවිරාග කරණය යන මෙයට කරුණු වන දැයින් ද වැළකියෙම් වෙමි. මම මේ කරුණින් ද රහතුන් අනුකරණ කරමි, මා විසින් පෙහෙවස් වසන ලද වනැ යි මේ සත්වන අඞ්ගයෙන් සමන්වාගත වෙයි.

8. යාවජීවං අරහන්තො උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා අට්ඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

එවං උපවුත්ථො ඛො භික්ඛවෙ, අට්ඨඞ්ගසමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරොති.

## 8. 1. 5. 2

## විත්ථත අට්ඨඞ්ගුපොසථ සුත්තං

**[සාවත්ථිනිදානං]**

අට්ඨඞ්ගසමන්නාගතො භික්ඛවෙ, උපොසථො උපවුත්ථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො. කථං උපවුත්ථො ච භික්ඛවෙ, අට්ඨඞ්ගසමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො:

ඉධ භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා සබ්බපාණභූතෙසු හිතානුකම්පිනො විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතෙසු හිතානුකම්පී විහරාමි. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා පඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති. -පෙ-

8. රහත්හු දිවිහිමි කොට (පමණ ඉක්ම වූ) උස් අසුන් (නො කැප වූ) මහු අසුන් හැර උසසුන් මහසුනින් වැළැකියාහු හැදෙක හෝ තණ ඇතිරියෙක හෝ නිවශයයා කෙරෙත්. මම ද අද මේ රැයත් දවලත් උසසුන් මහසුන් හැර උසසුන් මහසුනින් වැළැකියෙම් හැදෙක හෝ තණ ඇතිරියෙක හෝ නිවශයයා කරමි. මම මේ අඞ්ගයෙනුදු රහතුන් අනුකරණ කරමි. මා විසින් පෙහෙවස් වසන ලද වනැ යි මේ අටවැනි අඞ්ගයෙන් සමන්වාගත වෙයි.

මහණෙනි, මෙසේ අටඟින් යුත් පෙහෙවස් වසන ලදුයේ මහත් ඵල වෙයි. මහානෘශංස වෙයි. මහාද්‍යුතික වෙයි. මහා විස්ථාර වේ.

## 8. 1. 5. 2

## විත්ථත අට්ඨඞ්ගුපොසථ සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, අටඟින් සමන්වාගත වූ පෙහෙවස් වසන ලදුයේ මහත්ඵල වෙයි, මහානෘශංස වෙයි, මහාද්‍යුතික වෙයි, මහාවිස්ථාර වෙයි. මහණෙනි, අටඟින් සමන්වාගත පෙහෙවස කෙසේ වසනාලදුයේ මහත්ඵල වේ ය, මහානෘශංස වේ ය, මහාද්‍යුතික වේ ය, මහාවිස්ථාර වේ ය යත්:

මහණෙනි, මෙසස්නෙහි අරිසවු මෙසේ නුවණින් සලකන්නේ ය: රහත්හු දිවිහිමියෙන් පණිවා හැර පණිවායෙන් දුරු වූවාහු බහා තැබූ දඬු ඇත්තාහු බහා තැබූ සැත් ඇත්තාහු ලජ්ජායෙන් යුක්ත වූවාහු දයාවට පැමිණියාහු සර්වප්‍රාණිගණයා කෙරෙහි හිතානුකම්පා ඇත්තාහු වෙසෙත්. මම ද අද මේ රැයත් මේ දවලත් පණිවා හැර පණිවායෙන් දුරු වූයෙම් බහා තැබූ දඬු ඇතියෙම් බහා තැබූ සැත් ඇතියෙම් ලජ්ජා ඇත්තෙම් දයාවට පැමිණියෙම් සර්වප්‍රාණිගණයා කෙරෙහි හිතානුකම්පා ඇත්තෙම් වෙසෙමි. මම් මේ කරුණිනුදු රහතුන් අනුකරණ කරමි. මා විසින් පෙහෙවස වසනාලද වේ යයි මේ පළමුවන අඟින් සමන්වාගත වෙයි ...

යාවජීවං අරහන්තො උච්චාසයන මහාසයනං පහාය උච්චාසයන-මහාසයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති මඤ්චකෙ වා තිණසන්ථා-රකෙ වා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි, මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති. ඉමිනා අට්ඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති. එවං උපවුත්ථො ඛො භික්ඛවෙ, අට්ඨඞ්ග සමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො.

කීවමහප්ඵලො හොති කීවමහානිසංසො කීවමහාජුතිකො කීවමහාවිප්ඵාරො:

සෙය්‍යථාපි භික්ඛවෙ, යො ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූතසත්තරතනානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙය්‍ය, සෙය්‍යථීදං: අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ්ජීනං මල්ලානං චෙතීනං වඞ්ගානං කුරූනං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං අවන්තීනං ගන්ධාරානං කම්බොජානං, අට්ඨඞ්ගසමන්නාගතස්ස උපොසථස්ස එතං කලං නාග්ඝති සොළසිං. තං කිස්ස හෙතු: කපණං භික්ඛවෙ, මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානිමානි භික්ඛවෙ, මානුසකානි පඤ්ඤාසවස්සානි චාතුම්මහාරාජිකානං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන පඤ්චවස්ස-සතානි චාතුම්මහාරාජිකානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං භික්ඛවෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නා ගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං භික්ඛවෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

රහත්හු දිවිහිමියෙන් උසසුන් මහසුන් හැර උසසුන් මහස්නෙන් වැළකියාහු හැඳෙක වෙවයි තණ ඇතිරියෙක වෙවයි නීචශයාා කෙරෙත්. මම ද අද මේ රැයත් මේ දවලත් උසසුන් මහසුන් හැර උසසුන් මහස්නෙන් වැළැකියෙමි හැඳෙක වෙවයි තණ ඇතිරියෙක වෙවයි නීචශයාා කරමි. මේ කරුණිනුදු මම් රහතුන් අනුකරණ කරමි. මා විසින් පෙහෙවස් ද වසන ලද වේ යයි. මේ අට වැනි කරුණින් සමන්වාගත වෙයි. මහණෙනි මෙසේ අටඟින් යුත් පෙහෙවස වසන ලද්දේ මහත්ඵල වෙයි, මහානෘශංස වෙයි, මහද්‍යුතික වෙයි. මහාවිස්ථාර වේ.

කොතෙක් මහත්ඵල වෙය කෙතෙක් මහානෘශංස වේ ය, කෙතෙක් මහාද්‍යුතික වේ ය, කෙතෙක් මහා විස්ථාරවේ ය යත්:

මහණෙනි, යමෙක් යම්සේ අඞ්ග ය, මගධ ය, කාසි ය, කෝසල ය, වජ්ජි ය, මල්ල ය, චෙති ය, වඞ්ග ය, කුරු ය, පඤ්චාල ය, මච්ඡ ය, සූරසේන ය, අස්සක ය, අවන්ති ය, ගන්ධාර ය, කම්බොජ ය, යන නම් ඇති බොහෝ සත් රුවන් ඇති මේ සොළොස් මහාජනපදයන් ගේ ඓශ්වර්‍ය්‍යාධිපත්‍යය ඇති රජය කරවන්නේ නම්, තෙල අටඟින් යුත් පෙහෙවස්හුගේ සොළොස්වන කලාවට ද නො අගනේ ය. එයට හේතු කවර යත්: මහණෙනි, දිව්‍ය සුඛය පිණිස මානුෂක රාජ්‍යය කෘපණ (දිළිඳු) වෙයි.

මහණෙනි, මිනිස්නට අයත් යම මේ පනස් වසෙක් වේ නම් තෙල චාතුම්මහාරාජික දෙවියන්ගේ එක් රෑ දවලෙක. එරැයින් තිස් රැයෙක් මසෙක: එ මසින් දොළොස් මසැතියේ හවුරුද්දෙක. එ හවුරුදුයෙන් පන්සිය හවුරුද්දෙක් චාතුම්මහාරාජික දෙවියන්ගේ ආයුප්‍රමාණ වෙයි. මහණෙනි, යම් කරුණෙකින් මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු චාතුම්මහාරාජික දෙවියන්ගේ සහවාසයට එළඹෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. මහණෙනි, දිව්‍යසුඛය සඳහා (ශාක්ෂ්‍ය කොට සලකා) මානුෂික රාජ්‍යය කෘපණය යන තෙල කරුණ මේ සඳහා කියන ලද්දේ ය.

යං භික්ඛවෙ මානුසකං වස්සසතං තාවතිංසානං දෙවානං එසො එකො රත්තින්දිවො; තාය රත්තියා තිංසරත්තියො මාසො; තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො; තෙන සංවච්ඡරෙන දිබ්බං වස්සසහස්සං තාවතිංසානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං භික්ඛවෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා තාවතිංසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය, ඉදං ඛො පනෙතං භික්ඛවෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි භික්ඛවෙ, මානුසකානි ද්වෙ වස්සසතානි යාමානං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බානි ද්වෙ වස්සසහස්සානි යාමානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං භික්ඛවෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා යාමානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය, ඉදං ඛො පනෙතං භික්ඛවෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි ඛො භික්ඛවෙ, මානුසකානි චත්තාරි වස්සසතානි තුසිතානං එසො එකො රත්තින්දිවො; තාය රත්තියා තිංසරත්තියො මාසො; තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බානි චත්තාරි වස්සසහස්සානි තුසිතානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං භික්ඛවෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා තුසිතානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං භික්ඛවෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි භික්ඛවෙ, මානුසකානි අට්ඨවස්සසතානි නිම්මාණරතීනං දෙවානං එසො එකො රත්තින්දිවො. තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බානි අට්ඨවස්සසහස්සානි නිම්මාණරතීනං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං භික්ඛවෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා නිම්මාණරතීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය, ඉමං ඛො පනෙතං භික්ඛවෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

මහණෙනි, මිනිසුන් සතු යම් සියක් හවුරුද්දෙක් වේ නම් තෙල තාවතිංස දෙවියන් ගේ එක් රෑ දවාලකි. එ රැයින් තිස් රැයෙක් මසෙක, එ මසින් දොළොස් මසෙක් හවුරුද්දෙක. එ හවුරුදුයෙන් දිව්‍යවර්ෂ සහස්‍රයෙක් තාවතිංස දෙවියන්ගේ ආයුප්‍රමාණ වෙයි. මහණෙනි, යම් කරුණෙකින් මෙලොවහි කිසි ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු තාවතිංස දෙවියන් ගේ සහවාසයට යේ නම් තෙල කරුණ විද්‍යමාන වෙයි: මහණෙනි, දිව්‍ය සුඛය නිසා මිනිස් රජසිරි කෘපණය යන තෙල කරුණ මේ සඳහා කියන ලදි.

මහණෙනි, මිනිසුන් පිළිබඳ යම් දෙසිය වසෙක් වේ නම් තෙල යාම දෙවියන්ගේ එක් රෑ දවලෙකි. ඒ රැයින් තිස් රැයෙක් මාසයෙක. එ මසින් දොළොස් මස් ඇතියේ හවුරුද්දෙක. ඒ හවුරුදුයෙන් දිව්‍ය වූ දෙදහසෙක් හවුරුදු යාමදෙවියන්ගේ ආයුප්‍රමාණ වෙයි. මහණෙනි, යම් කරුණෙකින් මෙලොවහි කිසි මාගමක් වේවයි පුරුෂයෙක් වේවයි අටඟින් සමන්වාගත වූ පෙහෙවස් වැස කාබුන් මරණින් මතු යාම දෙවියන්ගේ සහභාවයට එළඹෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. මහණෙනි, දිව සැපත් නිසා මානුෂක රාජ්‍යය කෘපණය යන තෙල කරුණ මේ සඳහා කියන ලදි.

මහණෙනි, යම් මානුෂක වූ හවුරුදු සාරසියෙක් වේ නම් තෙල තුසිත දෙවියනට එක් රෑ දවලෙකි. එ රැයින් තිස් රැයෙක් මසෙක. එ මසින් දොළොස් මසෙක් හවුරුද්දෙක. එ හවුරුදුයෙන් දිව්‍ය වූ සාරදහස් හවුරුදුයෙක් තුසිත දෙවියන්ගේ ආයුප්‍රමාණ වේ. මහණෙනි, යම් හෙයෙකින් මෙලොවහි කිසි මාගමක් වේවයි පිරිමියෙක් වේවයි අටඟින්යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු තුසිත දෙවියන්ගේ සහභාවයට එළඹෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. මහණෙනි, දිව්‍යසුඛය නිසා මානුෂක රාජ්‍යය දිළිඳුය යන තෙල කරුණ මේ සඳහා කියන ලදි.

මහණෙනි, මානුෂක වූ යම් අටසිය හවුරුද්දෙක් වේ නම් නිම්මාණ-රතී දෙවියනට තෙල එක් රෑ දවලෙක. එ රැයින් තිස් රැයක් ඇතියේ මාසයෙක. එමසින් දොළොස් මසෙක් හවුරුද්දෙක, එ හවුරුදුයෙන් දිව්‍යවර්ෂ අටදහසෙක් නිම්මාණරතී දෙවියන්ගේ ආයුප්‍රමාණ වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මෙලොවහි කිසි මාගමක් වේවයි පිරිමියෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින්මතු නිම්මාණරතී දෙවියන්ගේ සහභාවයට එළඹෙන්නේ නම් තෙල කරුණ විද්‍යමාන වෙයි. මහණෙනි, දිව්‍යසුඛය සාක්ෂ්‍ය කොට ගෙණ මානුෂක රාජ්‍යය කෘපණය යන තෙල කරුණ මේ සඳහා කියන ලදි.

යානි භික්ඛවෙ, මානුසකානි සොළසවස්සසතානි පරනිම්මිතවසවත්තීනං දෙවානං එසො එකො රත්තින්දිවො; තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බානි සොළසවස්සසහස්සානි පරනිම්මිතවසවත්තීනං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං භික්ඛවෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං භික්ඛවෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධායාති.

1. පාණං න හානෙ න ච දින්නමාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං.

2. මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
මඤ්චෙ ඡමායං ච සයෙථ සන්ථතෙ
එතං හි අට්ඨඞ්ගිකමාහු පොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං.

3. චන්දො ච සුරියො ච උභො සුදස්සනා
ඔභාසයං අනුපරියන්ති යාවතා,
තමොනුදා තෙ පන අන්තලික්ඛගා
නභෙ පභාසන්ති දිසාවිරොචනා.

4. එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං
මුත්තා මණි වෙළුරියඤ්ච භද්දකං
සිඞ්ගීසුවණ්ණං අථවාපි කඤ්චනං
යං ජාතරූපං හටකන්ති වුච්චති
අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස
කලම්පි තෙ නානුභවන්ති සොළසිං
චන්දප්පභා තාරගණා ච සබ්බෙ.

5. තස්මා හි නාරී ච නරො ච සීලවා
අට්ඨඞ්ගුපෙතං උපවස්සුපොසථං
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

මහණෙනි, මනුෂ්‍යයන් පිළිබඳ යම් සොළොස් සියවසෙක් වේ ද, තෙල පරනිම්මිත වසවත්ති දෙව්ලොව වැසි දෙවියනට එක් රෑ දවලෙකි. එ රැයින් තිස් රැයක් මසෙකි. ඒ මසින් දෙළොසමසෙක් හවුරුද්දෙකි. එ හවුරුදුයෙන් දිව්‍යවර්‍ෂ සොළොස් දහසක් පරනිම්මිත වසවත්ති දෙව් ලොව වැසි දෙවියන් ගේ ආයුප්‍රමාණ වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මෙ ලෙව්හි කිසි මාගමක් හෝ පුරුෂයෙක් හෝ අටඟින් යුතු පෙහෙවස් වැස කාබුන් මරණින් මතු පරනිම්මිත වසවත්ති දෙව්ලොව වැසි දෙවියන්ගේ සහවාසයට එළැඹෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි. මහණෙනි, දිව්‍යසුඛය සාක්ෂ්‍ය කොට මානුෂක රාජ්‍යය කෘපණය යන තෙල කරුණ මේ සඳහා කියන ලදී.

1. පරපණ නො නසන්නේ ය, නුදුන් දෑ නො ගන්නේ ය; මුසා නො බණන්නේ ය, මද්‍යපයෙක් ද නො වන්නේ ය, අබ්‍රහ්මචරිය වූ මෙවුන් දමින් දුරු වන්නේ ය, රෑ විකල් බොජුන් නො වළඳන්නේ ය.

2. මල් නො දරන්නේ ය, ගඳ (විලෙවුන්) නො ගල්වන්නේ ය. (මිටිරියන් පා ඇති) කැප ඇඳෙහි හෝ (පිරියම් කළ) බිම හෝ තණකොළ ආදිය අතුරා කළ ඇතිරියෙහි හෝ සයනය කරන්නේ ය, තෙල දුක්ඛයාගේ කෙළවරට පැමිණි බුදුන් විසින් වදරන ලද අෂ්ටාඞ්ගික උපොෂිතය යි කියති.

3. සඳ ද හිරු ද යන දෙදෙන මනා දකුම් ඇත්තාහු යම්තාක් බබුළු-වමින් හැසිරෙත් ද, අහස ගමන් ගත් අඳුරු දුරලන ඔහු දිගුන් බබුළුවමින් අහස් තෙලෙහි බැබැළෙත්.

4. තෙල අන්තරයෙහි උතුම් මුතු ය මිණි ය වෛරම්ණි ය සිඟුරන් ය වැලිත් (පර්වතයෙහි හටගත්) කසුන් ය යන යම් ධනයෙක් වේ ද, යම් රනෙක් හටක (කුඹුඹුවන් විසින් ගෙනෙන ලද ස්වර්ණ) යයි කියනු ලැබේ ද, ඔහු අටඟින් යුතු උපොසථයාගේ සොළොස්වන කලාවට ද නො පැමිණෙත්. සඳ එළිය ද සියලු තරුකැල ද එබඳු වෙයි.

5. එහෙයින් සිල්වත් ස්ත්‍රිය ද පුරුෂයා ද අටඟින් යුතු පෙහෙවස් වැස සුව උදා කරන පින් කොට (කිසිවකු විසින්) අනින්දිත වැ ස්වර්ගස්ථානයට එළැඹෙත්.

## 8. 1. 5. 3

## විසාඛූපොසථ සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතු-පාසාදෙ අථ ඛො විසාඛා මිගාරමාතා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා එතදවොච:

අට්ඨඞ්ගසමන්නාගතො ඛො විසාඛෙ, උපොසථො උපවුත්ථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො.

කථං උපවුත්ථො ච විසාඛෙ අට්ඨඞ්ගසමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො:

ඉධ විසාඛෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා සබ්බපාණභූතහිතානුකම්පිනො විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරාමි. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා පඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති. -පෙ-

යාවජීවං අරහන්තො උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා. ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා අට්ඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

එවං උපවුත්ථො ඛො විසාඛෙ අට්ඨඞ්ගසමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරොති.

කීව මහප්ඵලො හොති, කීව මහානිසංසො කීව මහාජුතිකො කීව මහාවිප්ඵාරො:

## 8. 1. 5. 3

## විසාඛූපොසථ සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි **පූර්වාරාම** නම් වූ මිගාරමාතුපාසාදයෙහි වැඩ වසන සේක. එකල්හි මිගාරමාතු **විසාඛා** තොමෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියා ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැද එකත්පසෙක හුනු. එකත්පසෙක හුන් විසාඛා මිගාරමාතාවට භාග්‍යවතුන් වහන්සේ මෙල කරුණ වදළ සේක.

විසාඛාවෙනි, **විසූ** අටඟින් යුත් පෙහෙවස මහත්ඵල ඇතියේ වෙයි, මහ අනුසස් ඇතියේ වෙයි, මහත් දිලුම් ඇත්තේ වෙයි, මහත් පැතුරුම් ඇත්තේ වෙයි.

විසාඛාවෙනි, කෙසේ විසූ අටඟින් යුත් පෙහෙවස මහත්ඵල වේ ය, මහානෘශංස වේ ය, මහාද්‍යුතික වේ ය, මහා විස්ථාර වේ ය යත්:

විසාඛාවෙනි, මෙසස්නෙහි අරිසවූ මෙසේ නුවණින් සලකන්නේ ය: රහත්හු දිවිහිමියෙන් පණිවා දුරැර පණිවායෙන් වැළැකියාහු බහා තැබූ දඬු ඇතියාහු බහා තැබූ සැත් ඇතියාහු පවට ලජ්ජා ඇතියාහු දයාපත් වූවාහු හැම ප්‍රාණිසමූහයා කෙරෙහි හිතානුකම්පා ඇතියාහු වෙසෙත්. මම ද අද මේ රැත් මේ දවලත් පණිවා දුරැර පණිවායෙන් වැළැකියෙම් බහා තැබූ දඬු ඇතියෙම් බහාතැබූ අවි ඇතියෙම් පවට ලජ්ජා ඇතියෙම් දයාපත් වූයෙම් හැම ප්‍රාණිභූතයන් කෙරෙහි හිතානුකම්පා ඇතියෙම් වෙසෙමි. මම මෙකරුණිනුදු රහතුන් අනුකරණ කරමි. මා විසින් පෙහෙවස් වසන ලද ද වේ යයි මේ පළමු අඟින් සමන්වාගත වෙයි...

දිවිහිමියෙන් රහත්හු උසසුන්මහසුන් දුරැර උසසුන් මහස්නෙන් වැළැකියාහු (කුරු) හැදෙක වෙවයි. තණ ඇතිරියෙහි වෙවයි නිවශයනා කරත්. මම ද අද මේ රැත් මේ දවලත් උසසුන් මහසුන් දුරැර උසසුන් මහස්නෙන් වැළැකියෙම් හැදෙක වෙවයි, තණ ඇතිරියෙහි වෙවයි නිවශයනා කෙරෙමි. මේ කරුණිනුදු මම රහතුන් අනුකරණ කරමි. මා විසින් පෙහෙවස් වුසුයේත් වන්නේ යයි මේ අටවැනි අඟින් සමන්වාගත වෙයි.

විසාඛාවෙනි, මෙසේ වුසු අටඟින් සමන්වාගත වූ පෙහෙවස මහත් ඵල වෙයි. මහානිසංස වෙයි, මහාද්‍යුතික වෙයි. මහාවිස්ථාර වේ යයි.

කොතෙක් මහත්ඵල වේ ය, කොතෙක් මහානෘශංස වේ ය, කොතෙක් මහාද්‍යුතික වේය, කොතෙක් මහාවිස්ථාරවේය යත්:

සෙය්‍යථාපි විසාඛෙ, යො ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූතසත්තරතනානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙය්‍ය, සෙය්‍යථීදං: අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ්ජීනං මල්ලානං චෙතීනං වඞ්ගානං කුරූනං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං අවන්තීනං ගන්ධාරානං කම්බොජානං, අට්ඨඞ්ගසමන්නාගතස්ස උපොසථස්ස එතං කලං නාග්ඝති සොළසිං. තං කිස්ස හෙතු:

කපණං විසාඛෙ, මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය, යානි විසාඛෙ, මානුසකානි පඤ්ඤාසවස්සානි චාතුම්මහාරාජිකානං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන පඤ්චවස්සසතානි චාතුම්මහාරාජිකානං දෙවානං ආයුප්පමාණං. ඨානං ඛො පනෙතං විසාඛෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය ඉදං ඛො පනෙතං විසාඛෙ සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යං විසාඛෙ, මානුසකං වස්සසතං තාවතිංසානං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බං වස්සසහස්සං තාවතිංසානං දෙවානං ආයුප්පමාණං, ඨානං ඛො පනෙතං විසාඛෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා තාවතිංසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය, ඉදං ඛො පනෙතං විසාඛෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි විසාඛෙ, මානුසකානි ද්වෙවස්සසතානි -පෙ- අට්ඨවස්සසතානි -පෙ- සොළසවස්සසතානි -පෙ- පරනිම්මිතවසවත්තීනං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො, තෙන සංවච්ඡරෙන දිබ්බානි සොළසවස්සසහස්සානි පරනිම්මිතවසවත්තීනං දෙවානං ආයුප්පමාණං

විසාඛාවෙනි, යම්සේ අඞ්ග ය, මගධ ය, කාශි ය, කොශල ය, වජ්ජි ය, මල්‍ය ය, චෙති ය, වඞ්ග ය, කුරු ය, පඤ්චාල ය, මත්ස්‍ය ය, ශූරසෙන ය, අශ්වක ය, අවන්ති ය, ගන්ධාර ය, කම්බෝජ ය යන බොහෝ සත් රුවන් ඇති මේ සොළොස් මහාජනපදයන්ගේ ඓශ්වර්‍ය්‍යාධිපත්‍ය ඇති රාජ්‍යය යමෙක් කරන්නේ නම් තෙල අටඟින් යුත් පෙහෙවස්හුගේ සොළොස්වන කලාවට ද නො අගනේ ය. එ කවර හෙයින යත්:

විසාඛාවෙනි, මානුෂක රාජ්‍යය දිව්‍ය සුඛය සඳහා අල්ප වෙයි. විසාඛාවෙනි, මිනිසුන්ගේ යම් පනස් හවුරුද්දෙක් වේ නම් තෙල සිව්මහරද වැසි දෙවියනට එක් රෑ දවලෙක. එ රැයින් තිස් රෑ ඇතියේ මාසයෙක, එ මසින් දෙළොස්මස් ඇතියේ හවුරුද්දෙක, එ හවුරුදුයෙන් පන්සිය හවුරුද්දෙක් සිව්මහරද වැසි දෙවියන්ගේ ආයුප්‍රමාණය වේ. විසාඛාවෙනි, යම් හෙයෙකින් මෙලොවිහි ඇතැම් මාගමක් වේවයි, පුරුෂයෙක් වේවයි අටඟින් සමන්වාගත පෙහෙවස් වැස කාබුත් මරණින් මතු සිව්මහරද වැසි දෙවියන්ගේ සහභාවයට එළඹෙන්නේ ය යන තෙල කරුණ ඇත. විසාඛාවෙනි, දිවසුව පිණිස මානුෂක රාජ්‍යය අල්ප වෙයි. යන යමක් කියන ලද නම් තෙල කරුණ මේ සඳහා කියන ලදි.

විසාඛාවෙනි, මානුෂක වූ යම් සියක් හවුරුද්දෙක් වේ නම් තව්තිසා වැසි දෙවියනට තෙල එක් රෑ දවලෙකි. එ රැයින් තිස් රයෙක් මාසයෙක, එ මසින් දෙළොස්මසෙක් හවුරුද්දෙක. එ හවුරුදුයෙන් දිව්‍යවර්ෂ සහස්‍රයෙක් තව්තිසා වැසි දෙවියනට ආයුප්‍රමාණ වෙයි. විසාඛාවෙනි, යම් හෙයෙකින් මෙලොවිහි කිසි ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි අටඟින් සමන්වාගත පෙහෙවස් වැස කාබුත් මරණින් මතු තව්තිසා වැසි දෙවියන්ගේ සහවාසයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ ඇත. විසාඛාවෙනි, දිව්‍ය සුඛය පිණිස මානුෂක රාජ්‍යය අල්ප වෙයි. යන තෙල කරුණ මේ සඳහා කියන ලදි.

විසාඛාවෙනි, මිනිසුන් සතු යම් දෙසිය හවුරුද්දෙක් වේ නම්... අටසිය හවුරුදුයෙක් .. සොළොස්සියවසෙක් පරනිම්මිතවසවත්ති දෙවියනට තෙල එක් රෑදවලෙකි. එ රැයින් තිස් රයෙක් මාසයෙක, එ මසින් දෙළොස් මසෙක් හවුරුදුයෙක. එ හවුරුදුයෙන් සොළොස් දහසක් හවුරුදු පරනිම්මිතවසවත්ති දෙවියන්ගේ ආයුප්‍රමාණය වෙයි.

ඨානං ඛො පනෙතං විසාඛෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං විසාඛෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධායාති.

1. පාණං න හානෙ න ච දින්නමාදියෙ
   මුසා න භාසෙ න ච මජ්ජපො සියා
   අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
   රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං.

2. මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
   මඤ්චෙ ඡමායං ච සයෙථ සන්ථතෙ,
   එතං හි අට්ඨඞ්ගිකමාහු පොසථං
   බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං.

3. චන්දො ච සුරියො ච උභො සුදස්සනා
   ඔභාසයං අනුපරියන්ති යාවතා,
   තමොනුදා තෙ පන අන්තලික්ඛගා
   නභෙ පභාසෙන්ති දිසාවිරොචනා.

4. එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං
   මුත්තාමණි වෙළුරියඤ්ච භද්දකං,
   සිඞ්ගීසුවණ්ණං අථවාපි කඤ්චනං
   යං ජාතරූපං හටකන්ති වුච්චති.
   අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස
   කලම්පි තෙ නානුභවන්ති සොළසිං
   චන්දප්පභා තාරගණා ච සබ්බෙ.

5. තස්මා හි නාරී ච නරො ච සීලවා
   අට්ඨඞ්ගුපෙතං උපවස්සුපොසථං
   පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි
   අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

## 8. 1. 5. 4

### වාසෙට්ඨුපොසථ සුත්තං

එකං සමයං භගවා කොසම්බියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො වාසෙට්ඨො උපාසකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නං ඛො වාසෙට්ඨං උපාසකං භගවා එතදවොච:

විසාඛාවෙනි, යම් හෙයෙකින් මෙ ලොව්හි කිසි මාගමක් වේවයි පිරිමියෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු පරනිම්මිතවසවත්ති දෙවියන්ගේ සහභාවයට එළඹෙන්නේ ය යන තෙල කරුණ ඇත. විසාඛාවෙනි, දිව්‍ය සුඛය පිණිස මානුෂක රාජ්‍යය අල්ප වෙයි. යන තෙල කරුණ මේ සඳහා කියන ලදී.

1. පරපණ නො නස්නේ ය, නුදුන් දෑ නො ද ගන්නේ ය, මුසවා නො බණන්නේ ය, මද්‍යපයෙක් ද නොවන්නේ ය, අබ්‍රම්සර වූ මෙවුන් දමින් දුරු වන්නේ ය, රෑ විකල් බොජුන් නො බුදිනේ ය,

2. මල් නො දරන්නේ ය, නො ද ගඳ අලෙවූ දෙන්නේ ය, හැදෙක හෝ බිම්හි හෝ (තණ ඈ අතුළ) ඇතිරියෙක හෝ හෝනේ ය. තෙල දුක් කෙළවරට පත් බුදුන් විසින් වදරන ලද අටඟින් යුත් පෙහෙවසැයි කියති.

3. සුදසුන් වූ සඳු හා හිරු හා දෙදෙන යම් තාක් බබුළුවමින් හැසිරෙත් ද, අඳුරු දුරුකරන ඔහු වනාහි අන්තරික්ෂගත වූවාහු දිගුන් බබුළුවමින් අහස්හි බබළත්,

4. තෙල අන්තරයෙහි උතුම් මුතු මිණි වෙරළුමිණි ද සිඟුරන් ද වැලිත් කසුන් ද යම් රනෙක් 'හටක' යයි කියනු ලැබේ නම් එ ද යන යම් ධනයෙක් ඇද්ද, ඒ අටඟින් යුත් පෙහෙවසට ඒ ධනයෝ සොළොස් වන කලාවට ද නො පැමිණෙත්. හැම සඳ පහන් හා උළු කැන්හු ද එබඳු වෙත්,

5. එහෙයින් සිල්වත් නර නාරීහු ද අෂ්ටාඞ්ග සමන්වාගත පෝෂථය වැස සුව උදකරන පින් කොට විඥප්‍රශස්ත වූවාහු ස්වර්ගස්ථානයට ද එළඹෙත්.

## 8. 1. 5. 4
## වාසෙට්ඨුපොසථ සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර සමීපයෙහි මහාවන නම් වූ කූටාගාරශාලායෙහි වැඩවසන සේක. එකල්හි වාසෙට්ඨ උපාසක තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් වාසෙට්ඨ උපාසකයාට භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළහ:

අට්ඨඞ්ගසමන්නාගතො වාසෙට්ඨ, උපොසථො උපවුත්ථො මහප්ඵලො හොති -පෙ- අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

එවං වුත්තෙ වාසෙට්ඨො උපාසකො භගවන්තං එතදවොච:

පියා මෙ භන්තෙ ඤාතිසාලොහිතා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසෙය්‍යුං. පියානම්පි මෙ අස්ස ඤාතිසාලොහිතානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙ චෙපි භන්තෙ, ඛත්තියා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසෙය්‍යුං. සබ්බෙසම්පිස්ස ඛත්තියානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙ චෙපි භන්තෙ, බ්‍රාහ්මණා -පෙ- වෙස්සා -පෙ- සුද්දා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසෙය්‍යුං. සබ්බෙසම්පිස්ස සුද්දානං දීඝරත්තං හිතාය සුඛායාති.

එවමෙතං වාසෙට්ඨ, එවමෙතං වාසෙට්ඨ, සබ්බෙ චෙපි වාසෙට්ඨ, ඛත්තියා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසෙය්‍යුං, සබ්බෙසම්පිස්ස ඛත්තියානං දීඝරත්තං හිතාය සුඛාය. සබ්බෙ චෙපි වාසෙට්ඨ, බ්‍රාහ්මණා -පෙ- වෙස්සා -පෙ- සුද්දා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසෙය්‍යුං සබ්බෙසම්පිස්ස සුද්දානං දීඝරත්තං හිතාය සුඛාය. සදෙවකො චෙපි වාසෙට්ඨ, ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා[1] තෙ අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසෙය්‍යුං. සදෙවකස්සපිස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දීඝරත්තං හිතාය සුඛාය. ඉමෙ චෙපි වාසෙට්ඨ, මහාසාලා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසෙය්‍යුං. ඉමෙසම්පිස්ස මහාසාලානං දීඝරත්තං හිතාය සුඛාය. කො පන වාදෙ මනුස්සභූතස්සාති.

## 8. 1. 5. 5

## බොජ්ඣුපොසථ සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො බොජ්ඣා උපාසිකා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො බොජ්ඣං උපාසිකං භගවා එතදවොච:

අට්ඨඞ්ගසමන්නාගතො ඛො බොජ්ඣෙ, උපොසථො උපවුත්ථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො.

1. සස්සමණ බ්‍රාහ්මණියා පජාය දෙවමනුස්සාය-කත්ථචි

වාසෙට්ඨය, වුසු අටඟින් සමන්වාගත වූ පෙහෙවස මහත්ඵල වෙයි... අභිජ්ජිත වූවාහු ස්වර්ගස්ථානයට ද එළඹෙතියි.

මෙසේ වදළ කල්හි වාසෙට්ඨ උවසු තෙමේ භාග්‍යවත් හට මෙතෙල කරුණ සැල කළේ ය:

වහන්ස, මාගේ ප්‍රිය නෑ සහලේනෑයෝ අටඟින් යුත් පෙහෙවස් වසත් නම් මාගේ ප්‍රිය නෑ සහලේනෑයනට එය දිගුකලක් හිත පිණිස සුව පිණිස වන්නේ ය. වහන්ස, හැම ක්ෂත්‍රියයෝත් අටඟින් යුත් පෙහෙවස් වෙසෙත් නම් එය හැම ක්ෂත්‍රියනට දිගුකලක් හිතයට සුඛයට වන්නේ ය. වහන්ස, හැම බ්‍රාහ්මණයෝත්... වෛශ්‍යයෝත්... ශුද්‍රයෝත් අටඟින් යුත් පෙහෙවස් වෙසෙත් නම් හැම ශුද්‍රයනට එය දිගු කලක් හිතයට සුඛයට වන්නේ යයි.

වාසෙට්ඨය, මෙතෙල කරුණ එසේ ම ය; වාසෙට්ඨය, මෙතෙල කරුණ එසේ ම ය, වාසෙට්ඨය, හැම ක්ෂත්‍රියයෝත් අටඟින් යුත් පෙහෙවස් වෙසෙත් නම්, හැම ක්ෂත්‍රියනට හිතයට සුවයට පවත්නේ ය. වාසෙට්ඨය, හැම බමුණෝත්... වෛශ්‍යයෝත්... ශුද්‍රයෝත් අටඟින් යුත් පෙහෙවස් වසන්නාහු නම් හැම ශුද්‍රයනට හිත පිණිස සුව පිණිස දිගුකලක් පවත්නේ ය, වාසෙට්ඨය, දෙවියන් සහිත මාරයන් සහිත බ්‍රහ්මයන් සහිත ලොකයා මහණබමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අටඟින් යුත් පෙහෙවස් වසා නම් දෙවියන් සහිත මරුන් සහිත බ්‍රහ්මයන් සහිත ලොකයට මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්‍යවාඛ්‍යප්‍රජාවට දිගුකලක් හිත පිණිස, සුව පිණිස පවත්නේ ය. වාසෙට්ඨය, මෙතෙල මහා සල්රුක් දෙක නමුදු (සචෙතනව) අටඟින් යුක් පෙහෙවස් වෙසෙත් නම් මේ මහ සල්රුක් දෙකට ද දිගුකලක් හිතයට සුවයට වන්නේ ය. මනුෂ්‍ය වූවක් හට කවර කථා යයි.

## 8. 1. 5. 5

## බොජ්ඣුපොසථ සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ, අනාථපිණ්ඩිකයන්ගේ ආරාමයෙහි වෙසෙන සේක. එකල්හි බොජ්ඣා උවැසි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියා. එළඹ භාග්‍යවතුන් වැද එකත්පසෙක හුනු. එකත් පසෙක හුන් බොජ්ඣා උවැසියට භාග්‍ය-වතුන් වහන්සේ මෙතෙල කරුණ වදළහ:

බොජ්ඣාවෙනි, වුසු අටඟින් යුත් පෙහෙවස් මහත්ඵල වෙයි, මහානෘශංස වෙයි, මහාද්‍යුතික වෙයි, මහාවිස්ථාර වෙයි.

කථං උපවුත්ථො ච බොජ්ඣෙ, අට්ඨඞ්ගසමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො:

ඉධ බොජ්ඣෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා සබ්බපාණභූතහිතානුකම්පිනො විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරාමි. ඉමිනාපහං අඞ්ගෙන[1] අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති. ඉමිනා පඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති -පෙ- යාවජීවං අරහන්තො උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති, මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා, ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතීති ඉමිනා අට්ඨමෙන අඞ්ගෙන සමන්නාගතො හොති.

එවං උපවුත්ථො ඛො බොජ්ඣෙ, අට්ඨඞ්ගසමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො. මහාජුතිකො මහාවිප්ඵාරොති.

කීවමහප්ඵලො හොති, කීවමහානිසංසො, කීවමහාජුතිකො කීවමහාවිප්ඵාරො:

සෙය්‍යථාපි බොජ්ඣෙ, යො ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූතසත්තරතනානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙය්‍ය සෙය්‍යථීදං: අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ්ජීනං මල්ලානං චෙතීනං වඞ්ගානං කුරූනං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං අවන්තීනං ගන්ධාරානං කම්බොජානං, අට්ඨඞ්ගසමන්නාගතස්ස උපොසථස්ස එතං කලං නාග්ඝති සොළසිං. තං කිස්ස හෙතු: කපණං බොජ්ඣෙ, මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යානි බොජ්ඣෙ, මානුසකානි පඤ්ඤාසවස්සානි චාතුම්මහාරාජිකානං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො තෙන සංවච්ඡරෙන පඤ්චවස්සසතානි චාතුම්මහාරාජිකානං දෙවානං ආයුප්පමාණං.

1. ඉමිනා පඨමෙන - මජසං

බොජ්ඣාවෙනි, කෙසේ වූසු අටඟින් යුත් පෙහෙවස මහත්ඵල වේ ය, මහානෘශංස වේ ය, මහාද්‍යුතික වේ ය, මහාවිස්ථාර වේ ය යත්:

බොජ්ඣාවෙනි, මෙ සස්නෙහි අරිසවු මෙසේ නුවණින් සලකන්නේ ය: 'රහත්හු දිවිහිමියෙන් පණිවා දුරැර පණිවායෙන් වැළැකියාහු බහා තැබූ දඬු ඇත්තාහු බහා තැබූ සැත් ඇත්තැහු පවට ලජ්ජා ඇතියාහු දයාපත් වූවාහු හැම ප්‍රාණිභූතයන් කෙරෙහි හිතානුකම්පා ඇත්තාහු වෙසෙත්. මම ද අද මෙ රැයත් මේ දවලත් පණිවා දුරැර පණිවායෙන් වැළැකියෙමි බහා තැබූ දඬු ඇතියෙමි බහා තැබූ අවි ඇතියෙමි පවට ලජ්ජා ඇතියෙමි දයාපත් වූයෙමි හැම ප්‍රාණිගණයා කෙරෙහි හිතානුකම්පා ඇතියෙමි වෙසෙමි. මම මෙකරුණිනුදු රහතුන් අනුකරණ කරමි. මා විසින් පෙහෙවස් වසන ලද වන්නේ ය යි මේ පළමුවන අඞ්ගයෙන් සමන්වාගත වෙයි.... රහත්හු දිවිහිමියෙන් උසසුන් මහසුන් දුරැර උසසුන් මහස්නෙන් වැළැකියාහු හැඳෙක හෝ තණ ඇතිරියෙක හෝ නිවශයයා කරන්නාහ. අද මම ද මෙ රැත් මෙ දවලත් උසසුන් මහසුන් දුරැර උසසුන් මහසුනෙන් වැළැකියෙමි හැඳෙක හෝ තණ ඇතිරියෙක හෝ නිවශයයා කෙරෙමි. මම මේ අඟිනුදු රහතුන් අනුකරණ කෙරෙමි. මා විසින් පෙහෙවස් වසනලද වන්නේ යි මේ අටවැනි අඟින් සමන්වාගත වෙයි.

බොජ්ඣාවෙනි, මෙසේ වූසු අටඟින් යුත් පෙහෙවස මහත්ඵල වෙයි, මහානෘශංස වෙයි. මහාද්‍යුතික වෙයි, මහාවිස්ථාර වේ.

කෙතෙක් මහත්ඵල වේ ය, කෙතෙක් මහානෘශංස වේ ය, කෙතෙක් මහාද්‍යුතික වේ ය, කෙතෙක් මහාවිස්ථාර වේ ය යත්:

බොජ්ඣාවෙනි, යම්සේ යමෙක් අඞ්ග ය, මගධ ය, කාසී ය, කෝසල ය, වජ්ජී ය, මල්ල ය, චෙතී ය, වඞ්ග ය, කුරු ය, පඤ්චාල ය, මච්ඡ ය, සූරසෙන ය, අස්සක ය, අවන්ති ය, ගන්ධාර ය, කම්බොජ ය යන බොහෝ සත් රුවන් ඇති මේ සොළොස් මහාජනපදයන්ගේ ඓශ්වර්‍ය්‍යාධිපත්‍ය ඇති රජය කරන්නේ නම් තෙල අටඟින් යුත් පෙහෙවස්හුගේ සොළොස්වන කලාවට ද නො අගනේ ය. එය කවර හෙයින යත්: බොජ්ඣාවෙනි, මානුෂක රාජ්‍යය දිව්‍යසුඛය සඳහා කෘපණ වෙයි.

බොජ්ඣාවෙනි, මානුෂක වූ යම් පනස්හවුරුදුයෙක් වේ නම් චාතුම්මහාරාජික දෙවියනට තෙල එක් රැදවලෙකි. එ රැයින් තිස්රැයෙක් මාසයෙක, ඒ මසින් දෙළොස් මසෙක් හවුරුද්දෙක, එ හවුරුදුයෙන් පන්සිය හවුරුද්දෙක් චාතුම්මහාරාජික දෙවියන්ගේ ආයුප්‍රමාණ වේ.

යාමංඛොපනෙතං බොජ්ඣෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථි වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං බොජ්ඣෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය.

යං බොජ්ඣෙ, මානුසකං වස්සසතං -පෙ- යානි බොජ්ඣෙ, මානුසකානි ද්වෙ වස්සසතානි -පෙ- චත්තාරි වස්සසතානි -පෙ- අට්ඨ වස්සසතානි -පෙ- සොළස වස්සසහස්සානි පරනිම්මිතවසවත්තීනං දෙවානං එසො එකො රත්තින්දිවො, තාය රත්තියා තිංසරත්තියො මාසො, තෙන මාසෙන ද්වාදසමාසියො සංවච්ඡරො. තෙන සංවච්ඡරෙන දිබ්බානි සොළස වස්ස සහස්සානි පරනිම්මිතවසවත්තීනං දෙවානං ආයුප්පමාණං.

ඨානං ඛො පනෙතං බොජ්ඣෙ, විජ්ජති යං ඉධෙකච්චො ඉත්ථි වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය. ඉදං ඛො පනෙතං බොජ්ඣෙ, සන්ධාය භාසිතං කපණං මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධායාති.

1. පාණං න හානෙ න ච දින්නමාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා,
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං.

2. මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
මඤ්චෙ ඡමායංව සයෙථ සන්ථතෙ,
එතං හි අට්ඨඞ්ගිකමාහුපොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං.

3. චන්දො ච සුරියො ච උභො සුදස්සනා
ඔභාසයං අනුපරියන්ති යාවතා,
තමොනුදා තෙ පන අන්තලික්ඛගා
නභෙ පභාසෙන්ති දිසා විරොචනා.

බොජ්ඣාවෙනි, යම් හෙයෙකින් මෙලොව්හි මාගමක් වේවයි පිරිමියෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු චාතුම්මහාරාජික දෙවියන්ගේ සහවාසයට එළඹෙන්නේ ය යන තෙල කරුණ ඇත. බොජ්ඣාවෙනි, දිව්‍යසුඛය පිණිස මානුෂක රාජ්‍යය අල්ප වෙයි යන තෙල කරුණ මේ සඳහා කියන ලදී.

බොජ්ඣාවෙනි, යම්බඳු මානුෂක සියක් හවුරුදු... මානුෂක වූ යම්බඳු දෙසියක් හවුරුදු... සාරසිය හවුරුදුයෙක්... අටසිය වසෙක්... සොළොස් සියවසෙක් වේ නම් තෙල පරනිම්මිතවසවත්තී දෙවියනට එක් රෑ දවලෙක, එ රැයින් තිස් රැයක් මාසයෙකි. ඒ මසින් දෙළොස් මසෙක් හවුරුද්දෙක, ඒ හවුරුදුයෙන් දිව්‍ය වම් සොළොස්දහසෙක් පරනිම්මිත වසවත්තී දෙවියනට ආයුප්‍රමාණ වේ.

බොජ්ඣාවෙනි, යම් හෙයෙකින් මෙලොව්හි කිසි මාගමක් වේවයි. පිරිමියෙක් වේවයි අටඟින් යුත් පෙහෙවස් වැස කාබුන් මරණින් මතු පරනිම්මිතවසවත්ති දෙවියන්ගේ සහවාසයට එළඹෙන්නේ ය යන තෙල කරුණ ඇත. බොජ්ඣාවෙනි, දිව්‍ය සුඛය උපනිධි කොටගෙන මානුෂක රාජ්‍යය අල්ප වෙයි යන තෙල කරුණ මේ සඳහා කියන ලදී.

1. පරපණ නො නස්නේ ය, නුදුන් දෑ නො ද ගන්නේ ය, මුසවා නො බණනේ ය, නො ද මද්‍යප වන්නේ ය, අබ්‍රම්සරින් මෙවුන්දමින් දුරුවන්නේ ය, රෑ වීකල් බොජුන් නො බුදිනේ ය.

2. මල්දම් නො දරන්නේ ය, ගඳ නො ද අලෙවු කරන්නේ ය, හැඳෙක හෝ බිම්හි හෝ තණ ඇ අතුළ ඇතිරියෙක හෝ හෝනේ ය, තෙල දුක්කෙළවරට ගිය බුදුන් විසින් පවසනලද අටඟින් යුත් පෙහෙවසැ යි කියත්.

3. අහස ගමන්ගත් අඳුර බිඳුනා දික් බබුළුවන සුදසුන් වූ සඳ හා හිරු හා දෙදෙන යම්තාක් බබුළුවමින් හැසිරෙත් ද, අඳුර බිඳුනා අන්තරීක්ෂගත වූ ඔහු වනාහි දිගුත් බබුළුවමින් අහස් තලෙහි බැබළෙත් ද,

4. එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං
මුත්තාමණිවෙළුරියඤ්ච භද්දකං,
සිඞ්ගීසුවණ්ණං අථවාපි කඤ්චනං
යං ජාතරූපං හටකන්ති වුච්චති.
අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස
කලම්පි තෙ නානුභවන්ති සොළසිං
චන්දප්පභා තාරගණා ච සබ්බෙ.

5. තස්මා හි නාරී ච නරො ච සීලවා
අට්ඨඞ්ගුපෙතං උපවස්සුපොසථං
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

## 8. 1. 5. 6

## අනුරුද්ධමනාපකායික සුත්තං

එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා අනුරුද්ධො දිවාවිහාරගතො හොති පටිසල්ලීනො. අථ ඛො සම්බහුලා මනාපකායිකා දෙවතා යෙන ආයස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං අනුරුද්ධං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා දෙවතා ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං:

මයං භන්තෙ අනුරුද්ධ, මනාපකායිකා නාම දෙවතා තීසු ඨානෙසු ඉස්සරියං කාරෙම. වසං වත්තෙම. මයං භන්තෙ අනුරුද්ධ, යාදිසකං වණ්ණං ආකඞ්ඛාම තාදිසකං වණ්ණං ඨානසො පටිලභාම. යාදිසකං සුඛං ආකඞ්ඛාම තාදිසකං සුඛං ඨානසො පටිලභාම. යාදිසකං සරං ආකඞ්ඛාම තාදිසකං සරං ඨානසො පටිලභාම. මයං භන්තෙ අනුරුද්ධ, මනාපකායිකා නාම දෙවතා ඉමෙසු තීසු ඨානෙසු ඉස්සරියං කාරෙම වසං වත්තෙමාති.

අථ ඛො ආයස්මතො අනුරුද්ධස්ස එතදහොසි: අහො වතිමා දෙවතා සබ්බාව නීලා අස්සු නීලවණ්ණා නීලවත්ථා නීලාලඞ්කාරාති. අථ ඛො තා දෙවතා ආයස්මතො අනුරුද්ධස්ස චිත්තමඤ්ඤාය සබ්බා නීලා අහෙසුං නීලවණ්ණා නීලවත්ථා නීලාලඞ්කාරා. අථ ඛො ආයස්මතො අනුරුද්ධස්ස එතදහොසි: අහො වතිමා සබ්බාව පීතා අස්සු -පෙ- සබ්බාව ලොහිතකා අස්සු -පෙ- සබ්බාව ඔදාතා අස්සු ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරාති. අථ ඛො තා දෙවතා ආයස්මතො අනුරුද්ධස්ස චිත්තමඤ්ඤාය සබ්බාව ඔදාතා අහෙසුං, ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරා.

4. තෙල අන්තරයෙහි උතුම් මුතු මිණි වෙරළුමිණිය සිඟුරත් ය, වැලිත් කසුන් ය, යම් රතෙක් හටක යයි කියනු ලැබෙ නම් එයද යන යම් ධනයෙක් ඇත් ද, ඒ ධනයෝ අටඟින් යුත් පෙහොවසට සොළොස්වන කලාවට ද නො පැමිණෙත්, හැම සඳපහන් හා ළුළ කැන්හු ද එබඳු වෙත්.

5. එහෙයින් සිල්වත් නර නාරීහු ද අෂ්ටාඞ්ග සමන්වාගත පොෂථය වැස සුව උදකරන පින් කොට විඥප්‍රශස්ත දූවාහු සවර්ගස්ථානයට ද එළඹෙත්.

## 8. 1. 5. 6

## අනුරුද්ධමනාපකායික සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ දිවාවිහාරයට ගියාහු විවේකී ව වෙසෙති. එකල්හි බොහෝ මනාපකායික දෙවතාවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වෙත එළැඹියහ. එළැඹ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වැද එකත්පසෙක සිටියහ. එකත් පසෙක සිටි ඒ දෙවතාවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට තෙල කරුණ සැළ කළහ:

වහන්ස, අනුරුද්ධයෙනි, මනාපකායික දෙවතා නම් අපි තුන් තැනෙක ඉසුරු කරමු, වශය පවත්වමු. වහන්ස, අනුරුද්ධයෙනි, අපි යම්බඳු වර්ණයක් කැමැත්තමෝ නම් එබඳු වර්ණය සැණෙකින් ලබන්නෙමු, යම්බඳු ස්වරයක් කැමැත්තමෝ නම් එබඳු ස්වරය සැණෙකින් ම ලබන්නෙමු, යම්බඳු සුවයක් කැමැත්තමෝ නම් එබඳු සුවය සැණෙකින් ම ලබන්නෙමු. වහන්ස අනුරුද්ධයෙනි, මනාපකායික දෙවතා නම් වූ අපි මේ තුන් කරුණෙහි ඉසුරු කරන්නෙමු, වශය පවත්වන්නෙමු.

ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්හට මේ සිත වී ය: "ඒකාන්තයෙන් මේ දේවතාවෝ හැම නිල් වූවාහු නිල් පැහැ ඇතියාහු නීලවස්ත්‍ර ඇතියාහු නීලාලඞ්කාර ඇතියාහු වෙත් නම් ඉතා යෙහෙක කියායි. එකල්හි ඒ දෙවතාවෝ අනුරුද්ධ තෙරුන්ගේ සිත දැන හැම නිල් වූවාහු නිල්වන් වූවාහු නිල්වත් ඇත්තාහු නීලාලඞ්කාර ඇත්තාහු වූහ. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්හට තෙල සිත වී ය: 'ඒකාන්තයෙන් මේ දෙවතාවෝ හැම රන් පැහැ වූවාහු වෙත් නම්... හැම රතු පැහැ වූවාහු වෙත් නම්... සුදු වූවාහු සුදුවන් වූවාහු සුදු වස්ත්‍ර ඇතියාහු සුදු අලඞ්කාර ඇතියාහු වෙත් නම් යෙහෙක' කියායි. එකල්හි ඒ දෙවතාවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ සිත දැන හැම අවදාත වූවාහු අවදාතවර්ණ වූවාහු අවදාත වස්ත්‍ර ඇත්තාහු අවදාතාලඞ්කාර ඇත්තාහු වූහ.

අථ ඛො තා දෙවතා එකා ච[1] ගායි, එකා ච නච්චි, එකා ච අච්ඡරිකං වාදෙසි[2] සෙය්‍යථාපි නාම පඤ්චඞ්ගිකස්ස තූරියස්ස[3] සුවිනීතස්ස සුප්පටිපතාළිතස්ස කුසලෙහි සුසමන්නාහතස්ස සද්දො හොති වග්ගු ච රජනීයො ච කමනීයො ච පෙමනීයො ච මදනීයො ච, එවමෙව තාසං දෙවතානං අලඞ්කාරානං සද්දො හොති වග්ගු ච රජනීයො ච කමනීයො ච පෙමනීයො ච මදනීයො ච. අථ ඛො ආයස්මා අනුරුද්ධො ඉන්ද්‍රියානි ඔක්ඛිපි.

අථ ඛො තා දෙවතා න ඛො අය්‍යො අනුරුද්ධො සාදියතීති තත්ථෙවන්තරධායිංසු.

අථ ඛො ආයස්මා අනුරුද්ධො සායනහසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා අනුරුද්ධො භගවන්තං එතදවොච:

ඉධාහං භන්තෙ, දිවාවිහාරගතො හොමි පතිසල්ලීනො. අථ ඛො භන්තෙ, සම්බහුලා මනාපකායිකා දෙවතා යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු, එකමන්තං ඨිතා ඛො භන්තෙ, තා දෙවතා මං එතදවොචුං:

මයං භන්තෙ අනුරුද්ධ, මනාපකායිකා නාම දෙවතා, තීසු ඨානෙසු ඉස්සරියං කාරෙම, වසං වත්තෙම, මයං භන්තෙ අනුරුද්ධ යාදිසකං වණ්ණං ආකඞ්ඛාම, තාදිසකං වණ්ණං ඨානසො පටිලභාම, යාදිසකං සරං ආකඞ්ඛාම, තාදිසකං සරං ඨානසො පටිලභාම, යාදිසකං සුඛං ආකඞ්ඛාම, තාදිසකං සුඛං ඨානසො පටිලභාම, මයං භන්තෙ අනුරුද්ධ, මනාපකායිකා නාම දෙවතා ඉමෙසු තීසු ඨානෙසු ඉස්සරියං කාරෙම, වසං වත්තෙමාති.

1. එකාව – ස්‍යා. – PTS
2. අච්ඡරං වාදෙසි – මජ්සං.
3. තූරියස්ස – මජ්සං.

ඉක්බිති ඒ දේවතාවන් අතුරෙහි එක් දේවතාවක් ගැයූ ය, එක්දේවතා-වක් නැටූ ය, එක් දේවතාවක් හස්තතාලයට වන යම්සේ මැනැවින් සකසන ලද, ස්වරසාම්‍ය සඳහා පූර්වවාදන කරනලද, සමතුන් විසින් මොනොවට වයනලද පසහතුරුහුගේ හඬ සොඳුරුත් වේ ද, සිත් රඳවන්නකුත් වේ ද, කමනීයත් වේ ද, ප්‍රෙමණීයත් වේ ද, මදනීයත් වේ ද, එසෙයින් ඒ අලඞ්කාරවත් දෙවියන්ගේ ශබ්දය වල්ගු ද වෙයි, රජනීය ද වෙයි, කමනීය ද වෙයි, ප්‍රෙමණීය ද වෙයි. මදනීය ද වේ, එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ඉඳුරන් (ඇස්) යටිහුරු කළහ.

ඉක්බිති ඒ දේවතාවෝ ආයුෂ් අනුරුද්ධයන් වහන්සේ නො ඉවසන්-නාහ යි එහි ම අතුරුදහන් වූහ,

ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ සවස්වරුයෙහි පිළිසලනින් නැඟී සිට භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියාහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළාහ:

වහන්ස, මෙහි මම දිවා විහරණයට ගියෙම් පිළිසලනෙහි යෙදුනෙම් වෙමි, වහන්ස, එකල්හි බොහෝ මනාපකායිකදෙවතාවෝ මා වෙත එළැඹියාහ. එළැඹ මා වැඳ එකත් පසෙක සිටියහ. වහන්ස, එකත්-පසෙක සිටි ඒ දෙවතාවෝ මට මෙල කීහ:

වහන්ස, අනුරුද්ධයෙනි, මනාපකායිකදේවතා වන අපි තුන් තැනෙක ඉසුරු කරමු, වසය පවත්වමු, වහන්ස, අනුරුද්ධයෙනි, අපි යම්බඳු පැහැයක් කැමැත්තමෝ නම් එබඳු පැහැ සැණෙකින් ම ලබමු, යම්බඳු ස්වරයක් කැමැත්තමෝ නම් එබඳු ස්වර සැණෙකින් ලබමු, යම් බඳු සුවයක් කැමැත්තමෝ නම් එබඳු සුව සැණෙකින් ම ලබමු, වහන්ස, අනුරුද්ධයෙනි, මනාපකායිකදේවතා වන අපි මේ තුන්තන්හි ඉසුරු කරමු. වසය පවත්වමු යි.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: අහො වතිමා දෙවතා සබ්බාව නීලා අස්සු නීලවණ්ණා නීලවත්ථා නීලාලඞ්කාරාති. අථ ඛො භන්තෙ තා දෙවතා මම චිත්තමඤ්ඤාය සබ්බාව නීලා අහෙසුං නීලවණ්ණා නීලවත්ථා නීලාලඞ්කාරා. තස්ස මය්හං භන්තෙ එතදහොසි: අහො වතිමා දෙවතා සබ්බාව පීතා අස්සු -පෙ- සබ්බාව ලොහිතකා අස්සු -පෙ- සබ්බාව ඔදාතා අස්සු ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරාති. අථ ඛො භන්තෙ තා දෙවතා මම චිත්තමඤ්ඤාය සබ්බාව ඔදාතා අහෙසුං ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරා.

අථ ඛො භන්තෙ තා දෙවතා එකා ච ගායි, එකා ච නච්චි, එකා ච අච්ඡරිකං වාදෙසි[1]. සෙය්‍යථාපි නාම පඤ්චඞ්ගිකස්ස තූරියස්ස සුවිනීතස්ස සුප්පටිපතාළිතස්ස කුසලෙහි සුසමන්නාගතස්ස සද්දො හොති වග්ගු ච රජනීයො ච කමනීයො ච පෙමනීයො ච මදනීයො ච, එවමෙව තාසං දෙවතානං අලඞ්කාරානං සද්දො හොති වග්ගු ච රජනීයො ච කමනීයො ච පෙමනීයො ච මදනීයො ච අථඛ්වාහං භන්තෙ. ඉන්ද්‍රියානි ඔක්ඛිපිං. අථ ඛො භන්තෙ තා දෙවතා න ඛො ආයස්මා අනුරුද්ධො සාදියතීති තත්ථෙව අන්තරධායිංසු,

කති හි නු ඛො භන්තෙ, ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

අට්ඨහි ඛො අනුරුද්ධ, ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති. කතමෙහි අට්ඨහි:

1. ඉධ අනුරුද්ධ, මාතුගාමො යස්ස මාතාපිතරො භත්තුනො දෙන්ති, අත්ථකාමා හිතෙසිනො අනුකම්පකා අනුකම්පං උපාදාය, තස්ස හොති පුබ්බුට්ඨායිනී පච්ඡානිපාතිනී කිඞ්කාරපටිස්සාවිනී මනාපචාරිනී පියවාදිනී.

2. යෙ තෙ භත්තුගරුනො හොන්ති, මාතාති වා පිතාති වා සමණබ්‍රාහ්මණාති වා තෙ සක්කරොති ගරුකරොති මානෙති පූජෙති අබ්භාගතෙ ච ආසනොදකෙන පටිපූජෙති.

1. අච්ඡරං වාදෙසි – මජසං.

වහන්ස, මට තෙල සිත්වි; ආශ්චර්ය්‍යයෙක, මේ දෙවියෝ හැම නිල් වූවාහු නිල්වන් වූවාහු නිල්වත් ඇතියාහු නීලාලඞ්කාර ඇතියාහු වෙත් නම් මැනැව කියා යි. වහන්ස, එකල්හි ඒ දෙවතාවෝ මා සිත දැන හැම නිල් වූහ, හැම නිල්වන් වූහ, හැම නිල්වත් ඇති වූහ, හැම නීලාලඞ්කාර ඇති වූහ. වහන්ස, මට තෙල සිත් වි: මේ දේවතාවෝ හැම රන්වන් වෙත් නම් යෙහෙක...හැම ලෙහෙවන් වෙත් නම් යෙහෙක...හැම අවදාත වූවාහු අවදාතවර්ණ ඇත්තාහු අවදාත වස්ත්‍ර ඇත්තාහු අවදාතාලඞ්කාර ඇත්තාහු වෙත් නම් යෙහෙක කියා යි. වහන්ස, එකල්හි ඒ දෙවතාවෝ හැම අවදාත වූහ, අවදාතවර්ණ වූහ, අවදාත වස්ත්‍ර ඇති වූහ, අවදාතාලඞ්කාර ඇති වූහු.

වහන්ස, ඉක්බිති, ඒ දෙවතාවෝ එකක් ගැයූ, එකක් නැටූ, එකක් හස්තතාල වැයූ, යම්සේ මැනැවින් සකසනලද, සවරසාම්‍ය සඳහා දූර්වා- දන කරනලද, සමතුන් විසින් මොනොවට වයනලද පසඟතුරුහුගේ හඩ වල්ගුවේ ද, රජනීය වේද, කමනීය වේද, ප්‍රේමණීය වේද, මදනීය වේද, එපරිද්දෙන් ඒ අලඞ්කාරවත් දෙවියන්ගේ හඩ වල්ගු වෙයි, රජනීය ද වෙයි, කමනීය ද වෙයි, ප්‍රේමණීය ද වෙයි, මදනීය ද වේ.

වහන්ස, එකල්හි මම ඉඳුරන් (දෙඇස්) යටිහුරු කළෙමි. වහන්ස, ඉක්බිති ඒ දේවතාවෝ ආයුෂ් අනුරුද්ධයන් වහන්සේ නො ඉවසන්නාහයි එහි ම අතුරුදහන් වූහ.

වහන්ස, කෙතෙක් ධර්මයන්ගෙන් සමන්වාගත වූ මාගම කාබුත් මරණින් මතු මනාපකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ ද?

අනුරුද්ධය, ධර්ම අටෙකින් සමන්වාගත මාගම කාබුත් මරණින් මතු මනාපකායික දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. කවර අටෙකින යත්:

1. අනුරුද්ධය, මෙ ලොව්හි මාගම අර්ථකාම වූ හිතෛෂී වූ අනුකම්පා ඇති මවුපියෝ අනුකම්පාව නිසා යම් හිමියකුට දෙත් නම් ඔහට පළමු නැඟී සිටින්නී පසුව හොවින්නී කුම් කෙරෙම් දැයි පිළිවිස කරන්නී මනාප හැසිරීම් ඇත්තී ප්‍රියවචන ඇත්තී වේයි.

2. මව වේවයි, පියා වේවයි, මහණබමුණු වෙත්වයි, හිමිහුගේ යම් ඒ ගුරුහු වෙත් නම් ඔවුන් සගනී, ගුරු කෙරෙයි, බුහුමන් කෙරෙයි, පුදයි, වෙත එළැඹියවුන් අස්නෙන් සහ පැනින් පුදයි.

3. යෙ තෙ භත්තු අබ්භන්තරකම්මන්තා උණ්ණාති වා කප්පාසාති වා තත්ථ දක්ඛා හොති අනලසා තත්‍රුපායාය වීමංසාය සමන්නාගතා අලං කාතුං අලං සංවිධාතුං.

4. යො සො භත්තු අබ්භන්තරො අන්තොජනො දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙසං කතඤ්ච කතතො ජානාති, අකතඤ්ච අකතතො ජානාති, ගිලානකානඤ්ච බලාබලං ජානාති, ඛාදනීයං භොජනීයඤ්චස්ස පච්චංසෙන[1] සංවිභජති.

5. යං භත්තු ආහරති ධනං වා ධඤ්ඤං වා ජාතරූපං වා තං ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති තත්ථ ච හොති අධුත්තී අථෙනී අසොණ්ඩී අවිනාසිකා.

6. උපාසිකා ඛො පන හොති බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා. සඞ්ඝං සරණං ගතා.

7. සීලවතී ඛො පන හොති පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා සුරාමෙරය-මජ්ජපමාදට්ඨානා පටිවිරතා.

8. චාගවතී ඛො පන හොති විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගා පයතපාණී වොස්සග්ගරතා යාචයොගා දානසංවිභාගරතා. ඉමෙහි ඛො අනුරුද්ධ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

1. යො නං භරති සබ්බදා නිච්චං ආතාපි උස්සුකො,
තං සබ්බකාමදං[2] පොසං භත්තාරං නාතිමඤ්ඤති.

2. න චාපි සොත්ථි භත්තාරං ඉස්සාවාදෙන රොසයෙ,
භත්තු ච ගරුනො සබ්බෙ පතිපූජෙති පණ්ඩිතා.

3. උට්ඨායිකා[3] අනලසා සඞ්ගහිතපරිජ්ජනා,
භත්තු මනාපං චරති සම්භතං අනුරක්ඛති.

4. යා එවං වත්තති නාරී භත්තු ඡන්දවසානුගා,
මනාපා නාම තෙ දෙවා[4] යත්ථ සා උපපජ්ජතීති.

1. පච්චංසෙන - සී.
2. සබ්බකාමහරං, - PTS. සයා.
3. උට්ඨාහිකා - මජසං.
4. මනාපකායිකා දෙවා - සීමු. මනාපානාම තා දෙවා - කණ්ඩි

3. හිමිහුගේ එළලොම් වේවයි, කපු වේවයි, යම් ඒ අභ්‍යන්තර කර්මාන්ත කෙනෙක් වෙත් නම් එහි දක්ෂ වූවා අනලස් වූවා, තත්‍රෝපාය විමංසායෙන් (ඒ ඒ කරුණ පිළිබඳ උපායඥානයෙන්) සමන්විත වූවා කටයුතු කිරීමෙහි සංවිධානය කිරීමෙහි සමත් වෙයි.

4. හිමිහුගේ දස්හු වෙත්වයි මෙහෙකරුවෝ වෙත්වයි කම්කරුවෝ වෙත්වයි යම් ඒ අභ්‍යන්තර වූ ඇතුළත් ජනයෝ වෙත් නම් ඔවුන් කළ දෑ කළ විසිනුත් දනියි, නො කළ දෑ නො කළ විසිනුත් දනියි, ගිලනුන්ගේත් බලාබල දනියි, ඔහු කැයුතු දෑත් බුදිය යුතු දෑත් කොටස් විසින් සංවිභාග කෙරෙයි.

5. හතිඃ තෙමේ ධන වේවයි ධාන්‍ය වේවයි රන් වේවයි යමකුත් ගෙනෙයි නම් එය ආරක්ෂායෙන් ගෝපනයෙන් සපයා තබයි. එහිදු ධූර්ත නො වූවා සොර නො වූවා ලොල් නො වූවා නො නසන්නී වෙයි.

6. බුදුන් සරණ ගිය දහම් සරණ ගිය සඟුන් සරණ ගිය උවැසි වෙයි.

7. පණිවායෙන් වැළකි, අයිනාදනින් වැළකි, කාමයෙහි මිසහසරින් වැළකි, මුසවායෙන් වැළකි මද පමා දෙකට කරුණු රහමෙරින් වැළකි සිල් ඇති වෙයි.

8. ත්‍යාගවත් වෙයි, පහ වූ මසුරු මල ඇති සිතින් මිදූ ත්‍යාග ඇත්තී දෙවූ අත් ඇත්තී දීමෙහි ඇලුනී යදිනට යොග්‍ය වූවා දනසංවිභාගයෙහි ඇලුනී ගෙහි වෙසෙයි. අනුරුද්ධය, මේ දහම් අටින් සමන්වාගත මාගම කාබුන් මරණින් මතු මනාපකායික දෙවියන්ගේ සහභාවයට යන්නී යි.

1. යම් පුරුෂයෙක් හැම කල්හි සාතත්‍යකාරී වශයෙන් වැර ඇතියේ උත්සුක වූයේ ඒ මාගම පුස්නේ වේ ද, ගෙහඹු කැමැති හැම දෑ දෙන පුස්නා එ හිමිහු හෙළා නො දක්නී ය.

2. පණ්ඩිත වූ සුන්‍දරස්ත්‍රී තොමෝ හිමියා ඊෂ්‍ර්‍යාවාදයෙන් රොෂ නො කෙරෙයි. හිමියාගේ ගුරු තන්හි සිටි හැම පුදයි.

3. උත්‍ථානවීර්‍ය්‍ය ඇත්තී අලස නො වූවා සඞ්ග්‍රහ කරනලද පිරිවර ජනයා ඇත්තී හිමියාට මන වඩන න්‍යායෙන් හැසිරෙයි. ඉපයූ ධනය රකියි.

4. යම් ස්ත්‍රියක් මෙසේ හිමියාට චන්දූරා ඡන්‍දානුවර්ති ව පවත්නී ද ඕ මනාපකායික දෙවියෝ යම් තැනෙක ද එතැන (නිම්මාණරති දෙව්ලොව) උපදිනී ය යි.

## 8. 1. 5. 7

## විසාඛාමනාපකායික සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ. අථ ඛො විසාඛා මිගාරමාතා -පෙ- එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා එතදවොච:

අට්ඨහි ඛො විසාඛෙ, ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. කතමෙහි අට්ඨහි:

ඉධ විසාඛෙ, මාතුගාමො යස්ස මාතාපිතරො භත්තුනො දෙන්ති, අත්ථකාමා හිතෙසිනො අනුකම්පකා අනුකම්පං උපාදය, තස්ස හොති පුබ්බුට්ඨායිනී පච්ඡානිපාතිනී කිංකාරපටිස්සාවිනී මනාපචාරිනී පියවාදිනී -පෙ- වාගවතී ඛො පන හොති විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගා පයතපාණී වොස්සග්ගරතා යාචයොගා දානසංවිභාගරතා. ඉමෙහි ඛො විසාඛෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

1. යො නං භරති සබ්බදා නිච්චං ආතාපි උස්සුකො,
තං සබ්බකාමදං පොසං භත්තාරං නාතිමඤ්ඤති.

2. න චාපි සොත්ථි භත්තාරං ඉස්සාවාදෙන රොසයෙ,
භත්තු ච ගරුනො සබ්බෙ පතිපූජෙති පණ්ඩිතා,

3. උට්ඨායිකා අනලසා සඞ්ගහිතපරිජ්ජනා,
භත්තු මනාපං චරති සම්භතං අනුරක්ඛති.

4. යා එවං වත්තති නාරී භත්තු ඡන්දවසානුගා,
මනාපා නාම තෙ දෙවා යත්ථ සා උපපජ්ජති.

## 8. 1. 5. 7

## විසාඛාමනාපකායික සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පූර්වාරාම නම් මුවරමාපායෙහි වැඩවසන සේක: එකල්හි විසාඛා මිගාරමාතු... එකත්පසෙක හුන් විසාඛා මිගාරමාතාවට භාග්‍යවතුන් වහන්සේ මෙතල කරුණු වදාළ සේක:

විසාඛාවෙනි, දහම් අටෙකින් සමන්වාගත මාගම කාබුන් මරණින් මතු මනාපකායික නම් දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. කවර අටෙකින යත්:

විසාඛාවෙනි, මෙ ලොව්හි මාගම, අර්ථකාම වූ හිතෛෂී වූ අනුකම්පා ඇති මා පියෝ යම් හිමියකුට අනුකම්පා නිසා දක්වා දෙත් නම් ඔහට පළමු නැඟී සිටිනී පැසුළු වැදහෙන්නී කුම් කරම් දැයි පිළිවිස කරන්නී මනා පැවැතුම් ඇත්තී ප්‍රිය වචන ඇත්තී වෙයි... ත්‍යාග ඇත්තී ද වෙයි. පහ වූ මසුරු මල ඇති සිතින් මිදූ ත්‍යාග ඇත්තී දෙනුවට දෙවූ අත් ඇත්තී දන් දීමෙහි ඇලුනී යදනට යෝග්‍ය වූවා දනසංවිභාගයෙහි ඇලුනී ගෙහි වෙසෙයි. ,විසාඛාවෙනි, මේ දහම් අටින් සමන්වාගත මාගම කාබුන් මරණින් මතු මනාපකායික නම් දෙවියන්ගේ සහභාවයට එළඹේ.

1. යම් පුරුෂයෙක් හැම කල්හි සාතත්‍යකාරී වශයෙන් වැර ඇතියේ උත්සුක වූයේ ඒ මාගම පුස්නේ වේ ද, ගෙහඹු කැමැති හැමදැ දෙන පුස්නා එ හිමිහු හෙළා නො දක්නී ය.

2. පණ්ඩිත වූ සුන්දරස්ත්‍රී තොමෝ හිමියා ඊර්ෂ්‍යා වාදයෙන් රොෂ නො කෙරෙයි. හිමියාගේ ගුරුතන්හි සිටි හැම පුදයි.

3. උත්ථානවීර්‍ය්‍ය ඇත්තී අලස නො වූවා සඟහනලද පරිජනයා ඇත්තී හිමියාට මන වඩන නියායෙන් හැසිරෙයි. ඉපැයූ ධනය රකියි.

4. යම් ස්ත්‍රියක් මෙසේ හිමියාට වත් පුරා ඡන්දානුවර්ති ව පවත්නී ද, මනාපකායික නම් දෙවියෝ යම් තැනෙක ද, එතැන (නිම්මාණරති දෙව්ලොව) හි උපදිනී ය.

## 8. 1. 5. 8

## නකුලමාතුමනාපකායික සුත්තං

එකං සමයං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ[1] භෙසකලාවනෙ මිගදායෙ. අථ ඛො නකුලමාතා ගහපතානී යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා-පෙ- එකමන්තං නිසින්නං ඛො නකුලමාතරං ගහපතානිං භගවා එතදවොච:

අට්ඨහි ඛො නකුලමාතෙ, ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. කතමෙහි අට්ඨහි:

1. ඉධ නකුලමාතෙ, මාතුගාමො යස්ස මාතාපිතරො භත්තුනො දෙන්ති අත්ථකාමා හිතෙසිනො අනුකම්පකා අනුකම්පං උපාදාය. තස්ස හොති පුබ්බුට්ඨායිනී පච්ඡානිපාතිනී කිංකාරපටිස්සාවිනී මනාපචාරිනී පියවාදිනී.

2. යෙ තෙ භත්තු ගරුනො හොන්ති මාතාති වා පිතාති වා සමණබ්‍රාහ්මණාති වා, තෙ සක්කරොති ගරුකරොති මානෙති පූජෙති. අබ්භාගතෙ ච ආසනොදකෙන පටිපූජෙති.

3. යෙ තෙ භත්තු අබ්භන්තරා කම්මන්තා උණ්ණාති වා කප්පාසාති වා, තත්ථ දක්ඛා හොති අනලසා, තත්‍රූපායාය වීමංසාය සමන්නාගතා අලංකාතුං අලං සංවිධාතුං.

4. යො සො භත්තු අබ්භන්තරො අන්තො ජනො දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා, තෙසං කතඤ්ච කතතො ජානාති, අකතඤ්ච අකතතො ජානාති, ගිලානකානඤ්ච බලාබලං ජානාති, ඛාදනීයං භොජනීයඤ්චස්ස පච්චංසෙන සංවිභජති.

5. යං භත්තා ආහරති ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා තං ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති, තත්ථ ච හොති අධුත්තී අථෙනී අසොණ්ඩී අවිනාසිකා.

6. උපාසිකා ඛො පන හොති බුද්ධං සරණං ගතා ධම්මං සරණං ගතා සඞ්ඝං සරණං ගතා,

7. සීලවතී ඛො පන හොති පාණාතිපාතා පටිවිරතා -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා -පෙ-

1. සුසුමාරගිරෙ - මජසං

## 8. 1. 5. 8

## නකුලමාතුමනාපකායික සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භග්ග ජනපදයෙහි සුංසුමාර ගිරියෙහි මෘගදය නම් වූ භෙසකලා වනයෙහි වැඩ වසන සේක. එකල්හි නකුලමාතා නම් ගෘහපත්නී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාය, එළඹ... එකත්පස්ව හුන් නකුලමාතා ගෘහපත්නියට භාග්‍යවතුන් වහන්සේ මෙල කරුණ වදළ සේක:

නකුලමාතාවෙනි, දහම් අටෙකින් සමන්වාගත මාගම කාබුන් මරණින් මතු මනාපකායික නම් දෙවියන්ගේ සහභාවයට එළඹේ. කවර අටෙකින යත්:

1. නකුලමාතාවෙනි, මෙලොවහි ස්ත්‍රීතොමෝ අභිකැමැති වූ හිත කැමැති වූ අනුකම්පා ඇති මාපියෝ අනුකම්පාව නිසා යම් හිමියකුට දක්වා දෙත් නම් ඔහට පළමු නැගී සිටිනී පැසුළු වැදහෝනී කුම් කෙරෙමදැයි පුළුවුස්නී මනාප හැසිරුම් ඇත්තී ප්‍රියවචන ඇත්තී වෙයි.

2. මව ය කියා හෝ පියා ය කියා හෝ මහණ බමුණු ය කියා හෝ හිමියාහුගේ ගරුකටයුත්තාහු වෙත් නම් ඔවුන් සගන්නී ය, ගරු කරන්නී ය, බුහුමන් කරන්නී ය, පුදන්නී ය, වෙත පැමිණියවුන් අස්නෙන් හා පැනින් පුදන්නී ය.

3. හිමියාහුගේ එළුලොම් වේවයි කපු වේවයි යම් ඒ අභ්‍යන්තර කර්මාන්ත කෙනෙක් වෙත් නම් එහි දක්ෂ වූවා අනලස් වූවා වෙයි, තත්‍රෝපාය-විමංසායෙන් සමන්වාගත වූවා කිරීමට හා සංවිධානයට පොහොසත් වෙයි.

4. හිමියාහුගේ දස්හු වෙත් වයි ප්‍රෙෂ්‍ය වෙත් වයි කම්කරු වෙත් වයි අභ්‍යන්තර වූ යම් ඒ ඇතුළත් ජන කෙනෙක් වෙත් නම් ඔවුන් කළදෑ කළ සේ දනියි. නො කළ දෑත් නො කළ සේ දනියි, ගිලනුන්ගේත් බලාබල දනියි, කැයුතු දැත් බුදියයුතු දැත් කොටස් විසින් ඔවුනට බෙදයි.

5. හිමියා තෙමේ ධනයක් වේවයි ධාන්‍යයක් වේවයි රජත වේවයි ජාතරූප වේවයි යමක් ගෙන ඒ නම් එය ආරක්ෂායෙන් ගොපනයෙන් සපයයි. එහිදු අධූර්ත වූවා නො සොර වූවා නො සොඩ වූවා අවිනාශික වූවා වෙයි.

6. බුදුන් සරණගිය දහම් සරණ ගිය සඟුන් සරණ ගිය උවැසි වෙයි.

7. පණිවායෙන් වැළකියා... මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළකියා සිල්වත් වෙයි.

8. චාගවතී ඛො පන හොති, විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගා පයතපාණිනී[1] වොස්සග්ගරතා යාචයොගා දානසංවිභාගරතා.

ඉමෙහි ඛො නකුලමාතෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

1. යො නං භරති සබ්බදා නිච්චං ආතාපි උස්සුකො,
තං සබ්බකාමදං පොසං භත්තාරං නාතිමඤ්ඤති.

2. න චාපි සොත්ථි භත්තාරං ඉස්සාවාදෙන රොසයෙ,
භත්තු ච ගරුනො සබ්බෙ පටිපූජෙති පණ්ඩිතා.

3. උට්ඨායිකා අනලසා සඞ්ගහිතපරිජ්ජනා,
භත්තු මනාපං චරති සම්භතං අනුරක්ඛති.

4. යා එවං වත්තති නාරී භත්තු ඡන්දවසානුගා,
මනාපා නාම තෙ දෙවා යත්ථ සා උපපජ්ජතීති.

## 8. 1. 5. 9

## පඨමලොකවිජය සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. අථ ඛො විසාඛා මිගාරමාතා යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා එතදවොච:

චතූහි ඛො විසාඛෙ, ධම්මෙහි සමන්නාගතො මාතුගාමො ඉධලොකවිජයාය පටිපන්නො හොති, අයංසා ලොකො ආරද්ධො හොති. කතමෙහි චතූහි: ඉධ විසාඛෙ, මාතුගාමො සුසංවිහිතකම්මන්තො හොති සඞ්ගහිතපරිජනා, භත්තු මනාපං චරති, සම්භතං අනුරක්ඛති.

1. පයතපාණි – සී, සා PTS

8. ත්‍යාග වත් වෙයි: මුක්තත්‍යාග වූවා දෙවූඅත්ඇත්තී දීමෙහි ඇලුනී යාචනයට යොග්‍ය වූවා දනසංවිභාගයෙහි ඇලුනී පහ වූ මසුරුමල ඇති සිතින් යුතු ව ගිහිගෙහි වෙසෙයි.

නකුලමාතාවෙනි, මේ අට දහමින් යුත් මාගම කාබුන් මරණින් මතු මනාපකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ යයි.

1. යම් පුරුෂයෙක් හැම කල්හි සාතත්‍යකාරී වශයෙන් වැර ඇතියේ උත්සුක වූයේ ඒ මාගම පුස්නේ වේ ද, ගෙහඹු කැමැති හැම දෑ දෙන පුස්නා ඒ හිමිහු හෙළා නො දක්නී ය.

2. පණ්ඩිත වූ සුන්දර ස්ත්‍රී තොමෝ හිමියා ඊර්ෂ්‍යාවාදයෙන් රොෂ නො කෙරෙයි. හිමියාගේ ගුරුතන්හි සිටි හැම පුදයි.

3. උත්ථානවීර්‍ය්‍ය ඇත්තී අලස නො වූවා සඞ්ගෘහීත පරිජනයා ඇත්තී හිමියාට මන වඩන නියායෙන් හැසිරෙයි, ඉපයූ ධනය රකියි.

4. යම් ස්ත්‍රියක් මෙසේ ස්වාමියාට වත් පුරා ඡන්දානුවර්තී ව පවත්නී ද මනාපකායික නම් දෙවියෝ යම් තැනෙක්හි ද, එතැන (නිම්මාණරතී දෙව්ලොව) ඕ උපදිනි යි.

## 8. 1. 5. 9

## ප්‍රථමලෝකවිජය සූත්‍රය

එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි පූර්වාරාම නම් වූ මුවරමාපායෙහි වැඩ වසනසේක. එකල්හි විසාඛා මිගාරමාතාවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහ... එකත් පසෙක හුන් විසාඛා මිගාරමාතාවට භාග්‍යවතුන් වහන්සේ මෙල කරුණ වදළ සේක:

විසාඛාවෙනි, සතර ධර්මයෙකින් සමන්වාගත වූ මාගම මෙලොව විජය පිණිස පිළිපන්නී වෙයි,අය විසින් මෙලොව ආරබ්ධ වෙයි, කවර සතරෙකින යත්: විසාඛාවෙනි, මෙ ලොව්හි මාගම මොනොවට සංවිධාන කරනලද කර්මාන්ත ඇත්තී වෙයි. සගත් පිරිවර දනා ඇත්තී වෙයි භර්තෲහට මනාව හැසිරෙයි. ඉපැයූ දෑ රකී.

1. කථඤ්ච විසාඛෙ, මාතුගාමො සුසංවිහිතකම්මන්තො හොති: ඉධ විසාඛෙ, මාතුගාමො යෙ තෙ භත්තු අබ්භන්තරා කම්මන්තා උණ්ණාති වා කප්පාසාති වා, තත්ථ දක්ඛා හොති අනලසා, තත්‍රුපායාය වීමංසාය සමන්නාගතා අලං කාතුං අලං සංවිධාතුං. එවං ඛො විසාඛෙ, මාතුගාමො සුසංවිහිතකම්මන්තො හොති.

2. කථඤ්ච විසාඛෙ මාතුගාමො සඞ්ගහිතපරිජනො හොති, ඉධ විසාඛෙ මාතුගාමො යො සො භත්තු අබ්භන්තරො අන්තොජනො දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා, තෙසං කතඤ්ච කතතො ජානාති. අකතඤ්ච අකතතො ජානාති, ගිලානකානඤ්ච බලාබලං ජානාති, ඛාදනීයභොජනීයඤ්චස්ස පච්චංසෙන සංවිභජති. එවං ඛො විසාඛෙ, මාතුගාමො සඞ්ගහිතපරිජනො හොති.

3. කථඤ්ච විසාඛෙ, මාතුගාමො භත්තු මනාපං චරති, ඉධ විසාඛෙ, මාතුගාමො යං භත්තු අමනාපසඞ්ඛාතං, තං ජීවිතහෙතුපි න අජ්ඣාචරති. එවං ඛො විසාඛෙ, මාතුගාමො භත්තු මනාපං චරති.

4. කථඤ්ච විසාඛෙ මාතුගාමො සම්භතං අනුරක්ඛති, ඉධ විසාඛෙ, මාතුගාමො යං භත්තා ආහරති, ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා, තං ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති. තත්ථ ච හොති අධුත්තී අථෙනී අසොණ්ඩී අවිනාසිකා, එවං ඛො විසාඛෙ, මාතුගාමො සම්භතං අනුරක්ඛති. ඉමෙහි ඛො විසාඛෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො ඉධ ලොකවිජයාය පටිපන්නො හොති, අයංසා ලොකො[1] ආරද්ධො හොති.

චතූහි ඛො විසාඛෙ, ධම්මෙහි සමන්නාගතො මාතුගාමො පරලොකවිජයාය පටිපන්නා හොති, පරස්සාලොකො ආරද්ධො හොති. කතමෙහි චතූහි: ඉධ විසාඛෙ, මාතුගාමො සද්ධාසම්පන්නො හොති සීලසම්පන්නො හොති, චාගසම්පන්නො හොති, පඤ්ඤාසම්පන්නො හොති.

5. කථඤ්ච විසාඛෙ මාතුගාමො සද්ධාසම්පන්නො හොති, ඉධ විසාඛෙ, මාතුගාමො සද්ධා හොති, සද්දහති තථාගතස්ස බොධිං ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. එවං ඛො විසාඛෙ, මාතුගාමො සද්ධාසම්පන්නො හොති.

1. අයං සලොකො – සයා අයං ලොකො – මජසං, PTS

1. විසාඛාවෙනි, කෙසේ නම් මාගම මොනොවට සංවිධාන කළ කර්මාන්ත ඇත්තී වේ ද යත්: විසාඛාවෙනි, මෙලොව්හි මාගම හිමියාගේ එළලොම් වේවයි කපු වේවයි යම් මේ අභ්‍යන්තර කර්මාන්ත කෙනෙක් වෙත් නම් එහි දක්ෂ වූවා අනලස් වෙයි. තත්‍රොපාය විමංසායෙන් සමන්වාගත වූවා කිරීමට හා සංවිධානයට සමත් වෙයි. විසාඛාවෙනි, මෙසේ වනාහි මාගම මොනොවට සංවිධාන කළ කර්මාන්ත ඇත්තී වෙයි.

2. විසාඛාවෙනි, කෙසේ නම් මාගම සඟත් පිරිවරදනා ඇත්තී වේ ද යත්: විසාඛාවෙනි, මෙලොව්හි මාගම හිමියාගේ අභ්‍යන්තර වූ දස්හු වෙත්වයි ප්‍රේෂ්‍ය වෙත්වයි කම්කරු වෙත්වයි යම් අන්තර්ජන කෙනෙක් වෙත් නම් ඔවුන්ගේ කළ දැත් කළ විසින් දනියි, නො කළ දැත් නො කළ විසින් දනියි, ගිලනුන්ගේත් බලාබල දනියි, ඔවුනට කෑයුතු බුදිය යුතු දෑ ද කොටස් විසින් සංවිභාග කෙරෙයි. විසාඛාවෙනි, මෙසේ මාගම සඟත් පිරිවර දනා ඇත්තී වෙයි.

3. විසාඛාවෙනි, කෙසේ නම් මාගම හිමියාහට මනාප ව හැසිරේ ය යත්: විසාඛාවෙනි, මෙලොව්හි මාගම යමක් හිමියාහට අමනාප යි කියනලද නම් එය දිවි හෙයිනුදු නො කෙරෙයි. විසාඛාවෙනි, මෙසේ වනාහි මාගම හිමියාහට මනාප ව හැසිරෙයි.

4. විසාඛ වෙනි, කෙසේ නම් මාගම ඉපයූ දෑ රකී ද යත්: විසාඛාවෙනි, මෙලොව්හි මාගම හිමියාතෙම ධනයක් වේවයි ධාන්‍යයක් වේවයි රජතයක් වේවයි ජාතරූපයක් වේවයි යම් ම දයක් උපයා ගෙන ඒ නම් එය ආරක්ෂාවෙන් ගොපනයෙන් සපයා තබයි, එහිදු අධූර්ත වූවා අචෞර වූවා අශෞණ්ඩ වූවා අවිනාශික වූවා වෙයි. විසාඛාවෙනි, මෙසේ වනාහි මාගම ඉපයූ දෑ රකියි. විසාඛාවෙනි, මේ සිවුදහමින් සමන්වාගත මාගම මෙලොව දිනුමට පිළිපන්නී වෙයි, ඇය විසින් මෙලොව ඇරයුයේ වේ.

විසාඛාවෙනි, සතර ධර්මයකින් සමන්වාගත වූ මාගම පරලොව විජය පිණිස පිළිපන්නී වෙයි, ඇය විසින් පරලොව ආරබ්ධ වෙයි, කවර සතරෙකිනයත්: විසාඛාවෙනි, මෙලොව්හි මාගම සද්ධාසම්පන්න වෙයි, සීලසම්පන්න වෙයි, චාගසම්පන්න වෙයි, පඤ්ඤාසම්පන්න වේ.

5. විසාඛාවෙනි, කෙසේ නම් මාගම සද්ධාසම්පන්න වේ ද යත්: විසාඛාවෙනි, මෙලොව්හි මාගම ශ්‍රද්ධා ඇත්තී වේද, එ භගවත් තෙමේ මෙසේ ද මෙසේ ද අර්හත් ය, සම්‍යක් සම්බුද්ධ ය, විද්‍යාචරණ සම්පන්න ය, සුගත ය, ලොකවිදූ ය, අනුත්තර පුරිසදම්මසාරථී ය, දෙවිමිනිස්නට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් ය යි තථාගතයන් වහන්සේගේ සර්වඥබොධිය හදහා ද, විසාඛාවෙනි, මෙසේ මාගම සද්ධාසම්පන්න වෙයි.

6. කථඤ්ච විසාඛෙ, මාතුගාමො සීලසම්පන්නො හොති: ඉධ විසාඛෙ මාතුගාමො පාණාතිපාතා පටිවිරතා හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා හොති. එවං ඛො විසාඛෙ, මාතුගාමො සීලසම්පන්නො හොති.

7. කථඤ්ච විසාඛෙ, මාතුගාමො චාගසම්පන්නො හොති: ඉධ විසාඛෙ මාතුගාමො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගා පයතපාණී[1] වොස්සග්ගරතා යාචයොගා දානසංවිභාගරතා. එවං ඛො විසාඛෙ, මාතුගාමො චාගසම්පන්නො හොති.

8. කථඤ්ච විසාඛෙ, මාතුගාමො පඤ්ඤාසම්පන්නො හොති: ඉධ විසාඛෙ, මාතුගාමො පඤ්ඤවා හොති -පෙ- එවං ඛො විසාඛෙ, මාතුගාමො පඤ්ඤාසම්පන්නො හොති. ඉමෙහි ඛො විසාඛෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො පරලොකවිජයාය පටිපන්නො හොති, පරස්ස ලොකො[2] ආරද්ධො හොතීති.

1. සුසංවිහිතකම්මන්තා සඞ්ගහීතපරිජ්ජනා,
   භත්තු මනාපං චරති සම්භතං අනුරක්ඛති.

2. සද්ධා සීලෙන සම්පන්නා වදඤ්ඤූ වීතමච්ඡරා,
   නිච්චං මග්ගං විසොධෙති සොත්ථානං සම්පරායිකං.

3. ඉච්චෙතෙ අට්ඨ ධම්මා ච යස්සා විජ්ජන්ති නාරියා,
   තම්පි සීලවතිං ආහු ධම්මට්ඨං සච්චවාදිනිං.

4. සොළසාකාරසම්පන්නා අට්ඨඞ්ගසුසමාගතා,
   සා තාදිසී සීලවතී උපාසිකා උපපජ්ජති දෙවලොකං මනාපං.

## 8. 1. 5. 10
## දුතියලොකවිජය සුත්තං

[සාවත්ථිනිදානං]

චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො මාතුගාමො ඉධ ලොකවිජයාය පටිපන්නො හොති. අයංසා ලොකො ආරද්ධො හොති. කතමෙහි චතූහි:

ඉධ භික්ඛවෙ මාතුගාමො සුසංවිහිතකම්මන්තො හොති, සඞ්ගහීත පරිජනො, භත්තු මනාපං චරති, සම්භතං අනුරක්ඛති.

1. පයතපාණිනී, මජසං.
2. පරලොකො, - මජසං.

විසාඛාවෙනි, මාගම කෙසේ සීලසම්පන්න වේ ද යත්: විසාඛාවෙනි, මෙ ලොව්හි මාගම ප්‍රාණඝාතයෙන් වැළැකුණී වේ ද,... මදපමා දෙකට කරුණු වූ රහමෙර පීමෙන් වැළැකුණී වේ ද, විසාඛාවෙනි, මෙසේ වනාහි මාගම සීලසම්පන්න වෙයි.

විසාඛාවෙනි, කෙසේ මාගම චාගසම්පන්න වේ ද යත්: විසාඛාවෙනි, මෙලොව්හි මාගම පහවූ මසුරුමල ඇති සිතින් මුක්තත්‍යාග වූවා දෙවූ අත් ඇත්තී දීමෙහි ඇලුණී යාචනයට යොග්‍ය වූවා දන් බෙදීමෙහි ඇලුණී ගිහිගෙයි වෙසේ ද, විසාඛාවෙනි, මෙසේ වනාහි මාගම චාගසම්පන්න වෙයි.

විසාඛාවෙනි, කෙසේ නම් මාගම ප්‍රඥාසම්පන්න වේ ද යත්: විසාඛාවෙනි, මෙලොව්හි මාගම ප්‍රඥාවත් වේ ද,... විසාඛාවෙනි, මෙසේ වනාහි මාගම ප්‍රඥාසම්පන්න වෙයි. විසාඛාවෙනි, මෙ සිවුදහමින් සමන්වාගත මාගම පරලොකවිජය පිණිස පිළිපන්නී වෙයි. ඇය විසින් පරලොව ආරාධන කරන ලද්දේ වේ යයි.

1. ස්ත්‍රියක් මොනොවට සංවිධානය කරනලද කර්මාන්ත ඇත්තී, මොනොවට සගත් පිරිවර ජනයා ඇත්තී හිමියාගේ මනාපයට අනුව හැසිරෙයි ද, සපයන ලද ධනය රකියි ද,

2. ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් සමන්වාගත වූවා යදියන්ගේ වදන් දන්නී පහවූ මසුරුබව ඇත්තී සාම්පරායික සුඛදායක මාර්ගය සතතයෙන් පිරිසිදු කෙරෙයි ද,

3. මෙ අෂ්ටධර්මයෝ යම් ස්ත්‍රියකට වෙත් නම් ඕ දහම්හි පිහිටි සත්‍යවාදී සිල්වතියකැයි කීහු.

4. සොළසාකාර සමන්වාගත වූ ද අෂ්ටාඞ්ග සමන්වාගත වූ ද එබඳු සිල්වත් ඒ උවැසිය මනාපකායික දෙව්ලොවට පැමිණේය යි.

## 8. 1. 5. 10
## දෙවැනි ලෝකවිජය සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, සිවුදහමෙකින් යුත් මාගම මෙලොව විජය පිණිස පිළිපන්නී වෙයි. ඇය විසින් මෙලොව ආරබ්ධ වෙයි. කවර සිවුදහමෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි මාගම මොනොවට සංවිධානය කරන ලද කර්මාන්ත ඇතියේ වෙයි, සගත් පිරිවර ජනයා ඇත්තේ වෙයි, හිමියාගේ මනාපයට හැසිරෙයි, සපයනුලැබූ දෙය රකියි.

1. කථඤ්ච භික්ඛවෙ, මාතුගාමො සුසංවිහිතකම්මන්තො හොති: ඉධ භික්ඛවෙ, මාතුගාමො යෙ තෙ භත්තු අබ්භන්තරා කම්මන්තා -පෙ- එවං ඛො භික්ඛවෙ, මාතුගාමො සුසංවිහිතකම්මන්තො හොති.

2. කථඤ්ච භික්ඛවෙ, මාතුගාමො සඞ්ගහිතපරිජනො හොති: ඉධ භික්ඛවෙ, මාතුගාමො යො සො භත්තු අබ්භන්තරො අන්තො ජනො -පෙ- එවං ඛො භික්ඛවෙ, මාතුගාමො සඞ්ගහිතපරිජනො හොති.

3. කථඤ්ච භික්ඛවෙ, මාතුගාමො භත්තුමනාපං චරති: ඉධ භික්ඛවෙ මාතුගාමො යං භත්තු අමනාප සඞ්ඛාතං තං ජීවිතහෙතුපි න අජ්ඣාචරති. එවං ඛො භික්ඛවෙ, මාතුගාමො භත්තු මනාපං චරති,

4. කථඤ්ච භික්ඛවෙ, මාතුගාමො සම්භතං අනුරක්ඛති: ඉධ භික්ඛවෙ මාතුගාමො යං භත්තා ආහරති -පෙ- එවං ඛො භික්ඛවෙ, මාතුගාමො සම්භතං අනුරක්ඛති. ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො ඉධ ලොකවිජයාය පටිපන්නො හොති. අයංසා ලොකො ආරද්ධො හොති.

චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො මාතුගාමො පරලොකවිජයාය පටිපන්නො හොති. පරස්සා ලොකො ආරද්ධො හොති. කතමෙහි චතූහි:

ඉධ භික්ඛවෙ මාතුගාමො සද්ධාසම්පන්නො හොති, සීලසම්පන්නො හොති, චාගසම්පන්නො හොති, පඤ්ඤාසම්පන්නො හොති.

5. කථඤ්ච භික්ඛවෙ, මාතුගාමො සද්ධාසම්පන්නො හොති: ඉධ භික්ඛවෙ, මාතුගාමො සද්ධො හොති -පෙ- එවං ඛො භික්ඛවෙ මාතුගාමො සද්ධා සම්පන්නො හොති,

6. කථඤ්ච භික්ඛවෙ, මාතුගාමො සීලසම්පන්නො හොති: ඉධ භික්ඛවෙ මාතුගාමො පාණාතිපාතා පටිවිරතා හොති -පෙ- සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා හොති -පෙ- එවං ඛො භික්ඛවෙ, මාතුගාමො සීලසම්පන්නො හොති.

1. මහණෙනි, කෙසේ මාගම මොනොවට සංවිධානය කරනලද කර්මාන්ත ඇත්තී වේ ද යත්: මහණෙනි, මෙ ලොව්හි මාගම යම් ඒ හිමියාගේ අභ්‍යන්තර කර්මාන්තයෝ... මහණෙනි, මෙසේ වනාහි මාගම මොනොවට සංවිධානය කරනලද කර්මාන්ත ඇත්තී වෙයි.

2. මහණෙනි, කෙසේ මාගම සඟත් පරිජනයා ඇති වේ ද යත්: මහණෙනි, මෙලෙව්හි මාගම යම් ඒ හිමියාගේ අභ්‍යන්තර ඇතුළත් ජනයා... මහණෙනි, මෙසේ වනාහි මාගම සඟත් පිරිවර ජනයා ඇත්තී වේ.

3. මහණෙනි, කෙසේ මාගම හිමියාහට මනාප සේ හැසිරේ ද යත්: මහණෙනි, මෙලෙව්හි මාගම හිමියාහට අමනාප සඞ්ඛ්‍යාත යමක් වේ ද, එය ජීවිත හෙතුයෙනුදු නො ඉක්මවයි. මහණෙනි, මෙසේ වනාහි මාගම හිමියාහට මනාප සේ හැසිරෙයි.

4. මහණෙනි, කෙසේ මාගම සපයන ලද්ද අනුරක්ෂණය කෙරේ ද යත්: මහණෙනි, මෙලොව්හි මාගම සියහිමි යමක් ගෙන ඒ නම්... මහණෙනි, මෙසේ වනාහි මාගම සපයා ගෙන එන ලද්ද අනුරක්ෂණය කෙරෙයි. මහණෙනි, මේ සිවුදහමින් සමන්වාගත මාගම මෙලොව විජය පිණිස පිළිපන්නී වෙයි. ඇය විසින් මෙලොව ද ආරබ්ධ වෙයි.

මහණෙනි, සිවුදහමෙකින් සමන්වාගත මාගම පරලොක විජය පිණිස පිළිපන්නී වෙයි. ඇය විසින් පරලොව ආරබ්ධ වූයේ වෙයි. කවර සිවු දහමෙකින යත්:

මහණෙනි, මෙ ලොව්හි මාගම සද්ධාසම්පන්න වෙයි, සීලසම්පන්න වෙයි, චාගසම්පන්න වෙයි, පඤ්ඤාසම්පන්න වෙයි.

5. මහණෙනි, කෙසේ මාගම සද්ධාසම්පන්න වේ ද යත්: මහණෙනි, මෙ ලොව්හි මාගම සද්ධා ඇත්තී වෙයි... මහණෙනි, මෙසේ මාගම සද්ධාසම්පන්න වෙයි.

6. මහණෙනි, කෙසේ මාගම සීලසම්පන්න වේ ද යත්: මහණෙනි, මෙලොව්හි මාගම ප්‍රාණඝාතයෙන් වැළැකුණී වෙයි... මද පමා දෙකට කරුණු වූ රහමෙර පිමෙන් වැළැකුණී වෙයි. මහණෙනි, මෙසේ මාගම සීලසම්පන්න වෙයි.

7. කථඤ්ච භික්ඛවෙ, මාතුගාමො චාගසම්පන්නො හොති; ඉධ භික්ඛවෙ, මාතුගාමො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති -පෙ- එවං ඛො භික්ඛවෙ, මාතුගාමො චාගසම්පන්නො හොති.

8. කථඤ්ච භික්ඛවෙ, මාතුගාමො පඤ්ඤාසම්පන්නො හොති: ඉධ භික්ඛවෙ, මාතුගාමො පඤ්ඤවා හොති -පෙ- එවං ඛො භික්ඛවෙ, මාතුගාමො පඤ්ඤාසම්පන්නො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො පරලොකවිජයාය පටිපන්නො හොති. පරස්ස ලොකො ආරද්ධො හොතීති.

1. සුසංවිහිතකම්මන්තා සඞ්ගහීතපරිජ්ජනා,
භත්තු මනාපං චරති සම්භතං අනුරක්ඛති.

2. සද්ධාසීලෙන සම්පන්නා වදඤ්ඤූ වීතමච්ඡරා,
නිච්චං මග්ගං විසොධෙති සොත්ථානං සම්පරායිකං.

3. ඉච්චෙවං අට්ඨධම්මා ච යස්සා විජ්ජන්ති නාරියා,
තම්පි සීලවතිං ආහු ධම්මට්ඨං සච්චවාදිනිං.

4. සොළසාකාරසම්පන්නා අට්ඨඞ්ගසුසමාගතා,
සා තාදිසී සීලවතී උපාසිකා උපපජ්ජති දෙවලොකං මනාපන්ති

උපොසථවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

සඞ්ඛිත්තෙ විත්ථත විසාඛෙ වාසෙට්ඨො බොජ්ඣාය පඤ්චමං
අනුරුද්ධ පුන විසාඛෙ නකුලා ඉධ ලොකිකා[1] ද්වෙති.

පඨමො පණ්ණාසකො*

1. ලොකියා – සීමු. *පණ්ණාසකං පඨමං – සීමු.

7. මහණෙනි, කෙසේ මාගම ත්‍යාගසම්පන්න වේ ද යත්: මහණෙනි, මෙලොවහි මාගම පහවූ මසුරුමලින් යුත් සිතින්... ගිහිගෙයි වෙසෙයි. මහණෙනි, මෙසේ මාගම ත්‍යාගසම්පන්න වෙයි.

8. මහණෙනි, කෙසේ නම් මාගම ප්‍රඥාසම්පන්න වේ ද යත්: මහණෙනි, මෙ ලොවහි මාගම ප්‍රඥාවත් වෙයි.... මහණෙනි, මෙසේ වනාහි මාගම ප්‍රඥාසම්පන්න වේ.

මහණෙනි, මේ සිවුදහමින් සමන්වාගත මාගම පරලොක විජය පිණිස පිළිපන්නේ වෙයි. ඇය විසින් පරලොව ඇරයුවා වේ යයි.

1. මොනොවට සංවිධාන කරනලද කර්මාන්ත ඇත්තී මොනොවට සගත් පිරිවරජනයා ඇත්තී භත්‍රෘහුගේ මනාපයට අනුව හැසිරෙයි, සපයනලද ධනය රකියි.

2. ශ්‍රද්ධාවෙන් හා ශීලයෙන් සමන්විත වූවා යදියන්ගේ වදන් දන්නී පහවූ මසුරුබව ඇත්තී සාම්පරායික සුවදයක මාර්ගය සතතයෙන් පිරිසිදු කෙරෙයි.

3. මේ අෂ්ටධර්මයෝ යම් ස්ත්‍රියකට වෙත් නම් ඕ දහමෙහි පිහිටි සත්‍යවාදී සිල්වතියකැයි කීහු.

4. සොළසාකාර සමන්වාගත වූ ද අෂ්ටාඞ්ගසමන්වාගත වූ ද එබඳු සිල්වත් ඒ උවැසිය මනාපකායික දෙව්ලොව උපදී යයි.

## පස් වැනි උපෝසථ වර්ග යි.

**එහි උද්දානය:**

සඞ්ඛිත්ත (අෂ්ටාඞ්ගුපොසථ) සූත්‍ර ය, විස්තර අෂ්ටාඞ්ගුපොසථ සූත්‍ර ය, විසාඛුපොසථ සූත්‍ර ය, වාසෙට්ඨ උපොසථ සූත්‍රය, බොජ්ඣුපොසථ සූත්‍ර ය, අනුරුද්ධ මනාපකායික සූත්‍ර ය, විසාඛා මනාපකායික සූත්‍ර ය, නකුලමාතුමනාපකායික සූත්‍ර ය, ලොකවිජය සූත්‍ර දෙක දැයි මෙහි සූත්‍ර දශයෙකි.

ප්‍රථම පණ්ණාසක යි.

### දුතියො පණ්ණාසකො

# 6. ගොතමීවග්ගො

## 8. 2. 6. 1

## ගොතමී සුත්තං

එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො මහාපජාපති ගොතමී යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො මහාපජාපතී ගොතමී භගවන්තං එතදවොච:

සාධු භන්තෙ, ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

අලං ගොතමී, මා තෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාති.

දුතියම්පි ඛො මහාපජාපති ගොතමී භගවන්තං එතදවොච: සාධු භන්තෙ, ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

අලං ගොතමී, මා තෙ රුච්චි, මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්ම-විනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාති.

තතියම්පි ඛො මහාපජාපති ගොතමී භගවන්තං එතදවොච: සාධු භන්තෙ, ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

අලං ගොතමී, මා තෙ රුච්චි, මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාති.

අථ ඛො මහාපජාපතී ගොතමී න භගවා අනුජානාති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

# 6. ගොතමීවග්ගය

## 8. 2. 6. 1

## ගොතමී සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කපිලවත්පු සමීපයෙහි නිග්‍රොධාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි මහාප්‍රජාපතීගොතමී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹීයාය, එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියා. එකත්පසෙක සිට ගත් මහාපජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළා ය:

වහන්ස, මාගම තථාගත ප්‍රවිදිත වූ ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද ලබන්නේ නම් මැනැවැයි.

ගෞතමිය, කම් නැත. තථාගත ප්‍රවිදිත වූ ධර්මවිනයෙහි ගිහි ගෙන් නික්ම මාගමගේ අනගාරිය පැවිද්ද තොපට රිසි නො වේව යි.

දෙවන වටත් මහාප්‍රජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළා ය: වහන්ස, තථාගත ප්‍රවිදිත වූ ධර්මවිනයෙහි මාගම ගිහිගෙන් නික්ම අනගාරිය සඞ්ඛ්‍යාත පැවිද්ද ලබන්නේ නම් මැනැවැ යි.

ගෞතමිය, කම් නැත. තථාගත ප්‍රවිදිත වූ ධර්ම විනයෙහි ගිහි ගෙන් නික්ම මාගම්හුගේ අනගාරිය පැවිද්ද තොපට රිසි නො වේවා යි.

තෙවන වටත් මහාපජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළා ය: වහන්ස, මාගම තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි අනගාරිය පැවිද්ද ලබන්නේ නම් මැනැවැයි.

ගොතමිය, කම් නැත. තොපට තථාගත ප්‍රවිදිත වූ ධර්මවිනයෙහි මාගම්ගේ අනගාරිය පැවිද්ද රිසි නො වේව යි.

ඉක්බිති මහාප්‍රජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේ මාගමට තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි අනගාරිය පැවිද්ද නො අනුදන්නා සේකැ යි දුක් ඇත්තී නො සතුටු සිතැත්තී කඳුළු පිරි මුහුණැත්තී හඬන්නී භාග්‍යවතුන් වැඳ පැදකුණු කොට බැහැර ගියා ය.

අථ ඛො භගවා කපිලවත්ථුස්මිං යථාභිරන්තං විහරිත්වා යෙන වෙසාලි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන වෙසාලි තදවසරි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං.

අථ ඛො මහාපජාපති ගොතමී කෙසෙ ඡෙදාපෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා සම්බහුලාහි සාකියානීහි සද්ධිං යෙන වෙසාලි තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන වෙසාලි මහාවනෙ කූටාගාරසාලා තෙනුපසඞ්කමි.

අථ ඛො මහාපජාපති ගොතමී සූනෙහි පාදෙහි රජොකිණ්ණෙන ගත්තෙන දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා බහිද්වාරකොට්ඨකෙ අට්ඨාසි, අද්දසා ඛො ආයස්මා ආනන්දො මහාපජාපතිං ගොතමිං සූනෙහි පාදෙහි රජොකිණ්ණෙන ගත්තෙන දුක්ඛිං දුම්මනං අස්සුමුඛිං රුදමානං බහිද්වාර කොට්ඨකෙ ඨිතං, දිස්වාන මහාපජාපතිං ගොතමිං එතදවොච:

කිං නු ත්වං ගොතමි, සූනෙහි පාදෙහි රජොකිණ්ණෙන ගත්තෙන දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා බහිද්වාරකොට්ඨකෙ ඨිතාති?

තථා හි පන භන්තෙ ආනන්ද, න භගවා අනුජානාති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

තෙන හි ගොතමි, ඉධෙව තාව[1] හොහි, යාවාහං භගවන්තං යාචාමි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

"එසා භන්තෙ, මහාපජාපති ගොතමී සූනෙහි පාදෙහි රජොකිණ්ණෙන ගත්තෙන දුක්ඛී දුම්මනා අස්සුමුඛී රුදමානා බහිද්වාර කොට්ඨකෙ ඨිතා, න භගවා අනුජානාති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති".

1. මුහුත්තං ඉධෙව තාව-චු පාළි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කපිලවස්තුවෙහි කැමති තාක් කල් වැස වෙසාලිය බලා චාරිකාවට පිටත්ව වැඩි සේක. අනුපිළිවෙළින් සැරිසරන සේක් වෛශාලියට වැදගත් සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වෙසාලියෙහි මහාවනයෙහි වූ කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක.

එකල්හි මහාපජාපතී ගොතමී කෙස් බහවා කසාවත් හැඳ බොහෝ සැකෑදූන් හා සමඟ වෙසාලිය බලා පිටත් වූ, අනුපිළිවෙළින් වෙසාලියෙහි මහාවනයෙහි කූටාගාරශාලාවට එළඹියා ය.

ඉක්බිති මහාපජාපතී ගොතමී ඉදිමුණු පයින් රජස් වැකි සිරුරින් යුතුව දුක් ඇත්තී දොම්නස් ඇත්තී කඳුළු පිරි මුහුණැත්තී හඬන්නී බිහිදොර කොටුවෙහි සිටියා ය. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ඉදිමුණු පයින් රජස් වැකි සිරුරින් දුක් ඇති දොම්නසින් යුත් කඳුළු පිරි මුහුණැතිව හඬනා බිහිදොර කොටුවෙහි සිටි මහා ප්‍රජාපතී ගොතමිය දුටහ. දැක මහාපජාපතී ගොතමියට මෙල කරුණ කීහ:

ගොතමිය, කවර හෙයින් තෙපි ඉදිමුණු පයින් හා රජස් වැකි සිරුරින් යුක්ත වූවා දුක් ඇත්තී දොම්නස් ඇත්තී කඳුළු පිරි මුහුණැත්තී හඬන්නී බිහිදොර කොටුවෙහි සිටිය වූ ද?

වහන්ස ආනන්දයෙනි, එසේ මැයි; භාග්‍යවතුන් වහන්සේ තථාගත ප්‍රවිදිත වූ ශාසනයෙහි මාගමට ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද නො අනුදන්නා සේකැ යි.

ගොතමිය, එසේ වී නම් තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි මාගමක්හට ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද භගවතුන් අතින් මම යම් තාක් යදිම් ද, ඒතාක් මෙහි ම වෙව.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළකළහ:

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගමට තථාගත ප්‍රවිදිත ශාසනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද නො අනුදන්නා සේකැයි මෙල මහාපජාපතී ගොතමී තොමෝ ඉදිමුණු පයින් රජස් වැකි සිරුරින් යුතුව දුක් ඇත්තී දොම්නස් ඇත්තී කඳුළුපිරි මුහුණැත්තී හඬන්නී බිහිදොර කොටුවෙහි සිටියා ය.

සාධු භන්තෙ, ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.''

අලං ආනන්ද, මා තෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාති.

දුතියම්පි ඛො– පෙ– තතියම්පි ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ''සාධු භන්තෙ, ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්ම විනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.''

අලං ආනන්ද, මාතෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්ම විනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: න භගවා අනුජානාති මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජං. යන්නූනාහං අඤ්ඤෙනපි පරියායෙන භගවන්තං යාචෙය්‍යං මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච; භබ්බො නු ඛො භන්තෙ, මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තඵලං වා සච්ඡිකාතුන්ති?

භබ්බො ආනන්ද මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා සොතාපත්තිඵලම්පි සකදාගාමිඵලම්පි අනාගාමිඵලම්පි අරහත්තඵලම්පි සච්ඡිකාතුන්ති.

සචෙ භන්තෙ, භබ්බො මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා සොතාපත්තිඵලම්පි – පෙ – අරහත්තඵලම්පි සච්ඡිකාතුං, බහුකාරා[1] භන්තෙ, මහාපජාපතී ගොතමී භගවතො මාතුච්ඡා ආපාදිකා පොසිකා, භගවන්තං ජනෙත්තියා කාලකතාය[2] ථඤ්ඤං පායෙසි.

සාධු භන්තෙ, ලභෙය්‍ය මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජන්ති.

සචෙ ආනන්ද, මහාපජාපතී ගොතමී අට්ඨගරුධම්මෙ පතිගණ්හාති, සාවස්සා හොතු උපසම්පදා.

---

1. බහූපකාරා - චු පාළි මජසං–ස්‍යා
2. කාලඞ්කතාය - මජසං.

වහන්ස, මාගම තථාගතප්‍රවිදිත ශාසනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද ලබනු නම් මැනැවි.''

ආනන්දය, කම් නැත. මාගමට තථාගතප්‍රවිදිත ශාසනයෙහි ගිහි ගෙන් නික්ම අනගාරිය පැවිද්ද තට රිසි නො වේව යි.

දෙවන වටද ... තෙවන වටද ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ: ''වහන්ස, මාගම තථාගතයන් වහන්සේ විසින් පහද ප්‍රකාශ කරන ලද ධර්මවිනයෙහි (ශාසනයෙහි) ගිහි ගෙන් නික්ම අනගාරිය පැවිද්ද ලබන්නේ නම් මැනැවි''යි.

ආනන්දය, කම් නැත: මාගමහට තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද තට නහමක් රුස්නේව යි.

එසඳ ආයුෂ්මත් ආනන්ද තෙරණුවනට මෙල සිත වී ය: භාග්‍යවතුන් වහන්සේ මාගමහට තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද නො අනුදන්නා සේක. මම් අන් අයුරෙකිනුදු තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි මාගමහට ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද බුදුන් යදනෙම් මනාමැ නු.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ: වහන්ස, මාගම තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්දට පැමිණ සොවත්පල හෝ සෙදගැමී පල හෝ අනගැමිපල හෝ රහත්පල හෝ පසක් කරන්නට භව්‍ය වේ දැයි?

ආනන්දය, මාගම තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්දට පැමිණ සොවත්පල හා සෙදගැමිපල හා අනගැමී පල හා රහත්පල හා පසක් කරන්නට භව්‍ය වෙයි.

ඉදින් වහන්ස, මාගම තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණ සොවත්පල හා ... රහත්පල හා පසක් කරන්නට භව්‍ය වේ නම්, වහන්ස, මහාප්‍රජාපතී ගොතමී භගවත්නට බොහෝ වහල් වුව, සුළුමවු ය, අත් පා වැඩූ ය, පෝෂණය කළා ය. මෑණියන් කලුරිය කරත් ම භගවත්නට කිරි පෙවූ ය.

වහන්ස, මාගම තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි අනගාරිය පැවිද්ද ලබන්නේ නම් මැනැව.

ආනන්දය, ඉදින් මහාප්‍රජාපතී ගොතමී අෂ්ට ගුරුධර්මයන් පිළි ගන්නී නම් ඇයට එම උපසම්පද වේවා යි.

1. "වස්සසතූපසම්පන්නාය භික්ඛුනියා තදහුපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනපච්චුට්ඨානඅඤ්ජලිකම්ම සාමීචිකම්මං කාතබ්බං. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා[1]. මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

2. න භික්ඛුනියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං උපගන්තබ්බං. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්ක-මනීයො.

3. අන්වද්ධමාසං භික්ඛුනියා භික්ඛුසඞ්ඝතො ද්වෙ ධම්මා පච්චාසිංසි-තබ්බා: උපොසථපුච්ඡකඤ්ච ඔවාදූපසඞ්කමනඤ්ච. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

4. වස්සං වුත්ථාය භික්ඛුනියා උභතොසඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බා: දිට්ඨෙන සුතෙන පරිසඞ්කාය. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

5. ගරුධම්මං අජ්ඣාපන්නාය භික්ඛුනියා උභතොසඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

6. ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය උභතොසඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

7. න කෙනචි පරියායෙන භික්ඛුනියා භික්ඛු අක්කොසිතබ්බො පරි-භාසිතබ්බො. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

8. අජ්ජතග්ගෙ ආනන්ද, ඔවටො භික්ඛුනීනං භික්ඛූසු වචනපථො, අනොවටො භික්ඛූනං භික්ඛුනීසු වචනපථො. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො."

සචෙ ආනන්ද, මහාපජාපතී ගොතමී ඉමෙ අට්ඨගරුධම්මෙ පටි-ගණ්හාති, සාවස්සා හොතු උපසම්පදා'ති.

1. ගරුඞ්කත්වා, [ම ඡ සං,

1. "උපසපන් සියක්වස් ඇති මෙහෙණ විසිතුදු එදින උපසපන් මහණක්හට අභිවාදන, ප්‍රත්‍යුත්ථාන, අඤ්ජලිකර්ම, සාමීචිකර්ම කළ යුතු ය. මෙ දහමත් සකසා ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නොයික්ම විය යුතු.

2. මෙහෙණ විසින් ඔවා දෙන මහණක්හු නැති ආවාසයෙහි වස් නො එළැඹිය යුතු. මේ දහම ද සකස් කොට ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවි හිමියෙන් නොයික්ම විය යුතු.

3. අඩමසක් පාසා මෙහෙණ විසින් බික් සඟන කෙරෙන් පෙහෙවස් පිළිවිසුම ය, ඔවා පිණිස එළැඹුම ය යන දහම්හු දෙදෙන කැමති විය යුතු වන. මෙ දහම ද සකස් කොට ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නො ඉක්ම විය යුතු.

4. වස් වුසු මෙහෙණ විසින් උභතො සඞ්ඝයා කෙරෙහි දැකීමෙන්, ඇසීමෙන්, පරිශඞ්කායෙන් යන තුන් තැනෙකින් පැවරිය යුතු ය. මෙ දහම ද සකස් කොට ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නො ඉක්ම විය යුතු.

5. ගරුඇවැත් අවත් මෙහෙණ විසින් උභතෝසඞ්ඝයා කෙරෙහි පක්ෂමානත් පිරිය යුතු ය. මෙ දහම ද සකස් කොට ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නො ඉක්මවිය යුතු.

6. දෙවසක් දහම් සයෙක හික්මුණු ශික්ෂා ඇති සික්ඛමානාව විසින් උභතොසඞ්ඝයා කෙරෙහි උපසම්පත් සෙවිය යුතු. මෙ දහම ද සකස් කොට ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නොයික්ම විය යුතු.

7. කිසි කරුණෙකිනුදු මෙහෙණ විසින් මහණ ආක්‍රොෂ පරිභාෂ නොකට යුතු. මේ දහම ද සකස් කොට ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නොයික්ම විය යුතු.

8. ආනන්දය, අද පටන් කොට මහණුන් කෙරෙහි මෙහෙණන්ගේ (අවවාදනුශාසන ධර්ම කථා සංඛ්‍යාත) වචනපථය වැසිණි, මහණුන්ගේ වචනපථය මෙහෙණන් කෙරෙහි නො වැසිණ. මේ දහම ද සකස් කොට ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නො ඉක්ම විය යුතුය."

ආනන්දය, ඉදින් මහාප්‍රජාපතී ගොතමී මේ අෂ්ට ගුරු ධර්මය පිළිගන්නී නම් ඇයට උපසම්පත් එයම වෙවයි.

අථ ඛො ආයස්මා ආනන්දො භගවතො සන්තිකෙ ඉමෙ අට්ඨගරුධම්මෙ උග්ගහෙත්වා යෙන මහාපජාපතී ගොතමී තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා මහාපජාපතිං ගොතමිං එතදවොච.

සචෙ ඛො ත්වං ගොතමි, අට්ඨගරුධම්මෙ පටිගණ්හෙය්‍යාසි, සාව තෙ භවිස්සති උපසම්පදා.

වස්සසතුපසම්පන්නාය භික්ඛුනියා තදහුපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනපච්චුට්ඨානඤ්ජලිකම්මසාමීචිකම්මං කාතබ්බං. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො -පෙ- අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුනීනං භික්ඛූසු වචනපථො, අනොවටො භික්ඛූනං භික්ඛුනීසු වචනපථො. අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො.

සචෙ ඛො ත්වං ගොතමි, ඉමෙ අට්ඨගරුධම්මෙ පටිගණ්හෙය්‍යාසි, සාව තෙ භවිස්සති උපසම්පදාති.

සෙය්‍යථාපි භන්තෙ ආනන්ද, ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො සීසං නහාතො උප්පලමාලං වා වස්සිකමාලං වා අතිමුත්තකමාලං වා ලභිත්වා උභොහි හත්ථෙහි පටිග්ගහෙත්වා උත්තමඞ්ගෙ සිරස්මිං පතිට්ඨාපෙය්‍ය[1] එවමෙව ඛො අහං භන්තෙ, ඉමෙ අට්ඨ ගරුධම්මෙ පටිගණ්හිස්සාමි යාවජීවං අනතික්කමනීයෙති.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

පටිග්ගහිතා භන්තෙ, මහාපජාපතියා ගොතමියා අට්ඨ ගරුධම්මා යාවජීවං අනතික්කමනීයාති.[2]

සචෙ ආනන්ද, නාලභිස්ස[3] මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජං, චිරට්ඨිතිකං ආනන්ද, බ්‍රහ්මචරියං අභවිස්ස, වස්සසහස්සංමෙව සද්ධම්මො තිට්ඨෙය්‍ය, යතො ච ඛො ආනන්ද, මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො, නදානි ආනන්ද, බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං භවිස්සති, පඤ්චෙවදානි ආනන්ද, වස්සසතානි සද්ධම්මො ඨස්සති.

---

1. පතිට්ඨාපෙය්‍ය - චු පා. 2. අට්ඨගරු ධම්මා. උපසම්පන්නා භගවතො මාතුච්ඡාති - චු පා.
3. නාලභිස්සා - චු පා.

ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භගවතුන් හමුයෙහි මේ අෂ්ට ගුරුධර්මයන් ඉගෙන මහාපජාපතී ගොතමිය වෙත එළඹියහ. එළඹ මහාපජාපතී ගෝතමියට මෙසේ කීහ:

ගොතමිය, ඉදින් තෙපි අෂ්ටගුරුධර්මයන් පිළිගන්නවූ නම් තොපට උපසපුව එම වෙයි.

උපසපන් සියක් වස් ඇති මෙහෙණ විසින් එදින උපසපන් මහණ හට අභිවාදන ප්‍රත්‍යුත්ථාන, අඤ්ජලිකර්ම සාමීචිකර්ම කළ යුතු ය. මෙ දහම ද සකස් කොට, ගුරු කොට, බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නො ඉක්මවියයුතු ... ... අද පටන් කොට මෙහෙණන්ගේ වචනපථය මහණුන් කෙරෙහි වැසිණි. මහණුන් ගේ වචනපථය මෙහෙණන් කෙරෙහි නො වැසිණි, මෙ දහම ද සකස් කොට ගුරු කොට බුහුමන් කොට පූජා කොට දිවිහිමියෙන් නොයික්මවිය යුතු ය,

ගෝතමිය, ඉදින් තෙපි මේ අෂ්ට ගුරු ධර්මයන් පිළිගන්නවූ නම් තොපට උපසපුව එ ම වන්නේ ය.

වහන්ස ආනන්දයෙනි, යම් සේ තුරුණු වූ යොවුන් බවට පත් සැරසුම සැහැවි කොට ඇති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ හිස් සෑනැහුයේ උපුල් මල්දමක් වේව යි සමන්මල්දමක් වේව යි යොහොඹුමල්දමක් වේවයි ලැබගෙන දෙ අතින් පිළිගෙන උත්තමාඞ්ගය වූ සිරස්හි පිහිටුවන්නේ වේ ද, වහන්ස, එපරිදි ම මම දිවිහිමියෙන් නොඉක්මවිය යුතු මෙ අෂ්ට ගුරු ධර්මයන් පිළිගනිමි.

ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැද එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ:

වහන්ස, මහාප්‍රජාපතී ගොතමිය විසින් දිවිහිමියෙන් නො ඉක්මිය යුතු අෂ්ටගුරු ධර්මයෝ පිළිගන්නා ලදහ යි.

ආනන්දය, ඉදින් මාගම තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද නො ලැබූ නම්, ආනන්දය සස්න චිරස්ථිතික වීය. (අධිගම) සද්ධර්මය වර්ෂසහස්‍රයක් ම සිටුනේ ය. ආනන්දය, යම් හෙයකින් මාගම තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි ගිහිගෙන් නික්ම සස්නට වැදගත්තී ද, ආනන්දය, දැන් බ්‍රහ්මචර්‍ය්‍යය චිරස්ථිතික නො වේ. ආනන්දය, දැන් (අධිගම) සද්ධර්මය පස්වාසියක් ම සිටුනේ ය.

සෙය්‍යථාපි ආනන්ද, යානි කානිචි කුලානි බහුත්ථිකානි[1] අප්පපුරිසකානි, තානි සුප්පධංසියානි හොන්ති චොරෙහි කුම්භත්ථෙනකෙහි. එවමෙව ඛො ආනන්ද, යස්මිං ධම්මවිනයෙ ලභති මාතුගාමො අගාරස්මා අනගාරියං පබ්බජ්ජං, න තං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං හොති.

සෙය්‍යථාපි ආනන්ද, සම්පන්නෙ සාලික්ඛෙත්තෙ සෙතට්ඨිකා නාම රොගජාති නිපතති, එවං තං සාලික්ඛෙත්තං න චිරට්ඨිතිකං හොති. එවමෙව ඛො ආනන්ද, යස්මිං ධම්මවිනයෙ ලභති මාතුගාමො අගාරස්මා අනගාරියං පබ්බජ්ජං න තං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං හොති.

සෙය්‍යථාපි ආනන්ද, සම්පන්නෙ උච්ඡුක්ඛෙත්තෙ මඤ්ජෙට්ඨිකා නාම රොගජාති නිපතති, එවං තං උච්ඡුක්ඛෙත්තං න චිරට්ඨිතිකං හොති, එවමෙව ඛො ආනන්ද, යස්මිං ධම්මවිනයෙ ලභති මාතුගාමො අගාරස්මා අනගාරියං පබ්බජ්ජං න තං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං හොති.

සෙය්‍යථාපි ආනන්ද, පුරිසො මහතො තළාකස්ස පටිගච්චෙව ආළිං බන්ධෙය්‍ය යාවදෙව උදකස්ස අනතික්කමනාය, එවමෙව ඛො ආනන්ද මයා පටිගච්චෙව භික්ඛුනීනං අට්ඨ ගරුධම්මා පඤ්ඤත්තා යාවජීවං අනතික්කමනීයාති.

## 8. 2. 6. 2

## භික්ඛුනොවාදක සුත්තං

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

කති හි නු ඛො භන්තෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු භික්ඛුනොවාදකො සම්මන්නිතබ්බොති.

1. බහුත්ථිකානි. – ම ජ සං, බහුඉත්ථිකානි චූ.

ආනන්දය, යම් පරිදි බොහෝ ස්ත්‍රීන් ඇති අල්පපුරුෂයන් ඇති යම් කිසි කුලයෝ වෙත් නම් ඒ කුලයෝ කුම්භථෙන්නක (කුඹුයෙහි පහන් දල්වා ඒ එළියෙන් ගෙයි බඩු සොයා සොරකම් කරන) සොරුන් විසින් පහසුයෙන් නැසිය හැකි වෙත් ද, ආනන්දය, එපරිදි ම යම් ධර්ම විනයෙක මාගම ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද ලබා ද, ඒ බ්‍රහ්ම-චර්‍යය චිරස්ථිතික නො වෙයි.

ආනන්දය, යම් පරිදි සම්පන්න ශාලික්ෂේත්‍රයක (පණුවන් විදීමෙන් හටගන්නා) සෙතට්ඨිකා නම් ශස්‍යරොග ජාතියෙක් උපදනේ ද, එසේ ඇතිවත් ම ඒ ශාලික්ෂෙත්‍රය චිරස්ථිතික නො වේ ද, ආනන්දය, එපරිදි ම යම් ධර්මවිනයෙක මාගම ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්ද ලබා ද, ඒ බ්‍රහ්මචර්‍යය චිරස්ථිතික නො වෙයි.

ආනන්දය, යම් පරිදි සමෘද්ධ වූ උක්කෙතෙක (උක් ගස තුළ රතුවන) මඤ්ජෙට්ඨිකා නම් ඉක්ෂු රොගයෙක් උපදනේ ද, එසේ වත් ම ඒ ඉක්ෂු ක්ෂේත්‍රය චිරස්ථිතික නො වේ ද, ආනන්දය, එපරිදි ම යම් ධර්මවිනයෙක මාගම ගිහි ගෙන් නික්ම අනගාරිය පැවිද්ද ලබා නම් ඒ බ්‍රහ්මචර්‍යය චිරස්ථිතික නො වෙයි.

ආනන්දය, යම් පරිදි පුරුෂයෙක් මහත් තඩාගයක්හුගේ නියර (දිය නො බැස යනු පිණිස කැල ම), බඳනේ වේ ද, ආනන්දය, එ පරිදි ම මා විසින් කැල ම මෙහෙණනට දිවිහිමියෙන් නො ඉක්මවිය යුතු අෂ්ට ගුරුධර්මයෝ පණවන ලදහ යි.

## 8. 2. 6. 2
## භික්ඛුනොවාදක සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෙසාලි නගර සමීපයෙහි මහාවනයෙහි වූ කූටාගාරශාලාවෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කළහ:

වහන්ස, කෙතෙක් කරුණින් සමන්වාගත මහණ මෙහෙණනට ඔවා දෙනුයේ සම්මත කටයුත්තේ දැ යි?

අට්ඨහි ඛො ආනන්ද, ධම්මෙහි සමන්නාගතො භික්ඛු භික්ඛුනොවාදකො සම්මන්නිතබ්බො. කතමෙහි අට්ඨහි:

ඉධානන්ද භික්ඛු සීලවා හොති -පෙ- සමාදය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධො. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා, පටිබලො හොති භික්ඛුනීසඞ්ඝස්ස ධම්මියා කථාය සන්දස්සෙතුං සමාදපෙතුං සමුත්තෙජෙතුං සම්පහංසෙතුං, යෙභුය්‍යෙන භික්ඛුනීනං පියො හොති මනාපො, න ඛො පනෙතං භගවන්තං උද්දිස්ස පබ්බජිතාය කාසායවත්ථවසනාය ගරුධම්මං අජ්ඣාපන්නපුබ්බො හොති, වීසතිවස්සො වා හොති අතිරෙකවීසති වස්සො වා.

ඉමෙහි ඛො ආනන්ද, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භික්ඛුනොවාදකො සම්මන්නිතබ්බොති.

## 8. 2. 6. 3

## සඞ්ඛිත්ත ගොතමියොවාද සුත්තං

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං, අථ ඛො මහාපජාපති ගොතමී යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො මහාපජාපති ගොතමී භගවන්තං එතදවොච:

සාධු භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා වූපකට්ඨා අප්පමත්තා ආතාපිනී පහිතත්තා විහරෙය්‍යන්ති,

ආනන්දය, මෙහෙණනට ඕවා දෙන මහණ කරුණු අටෙකින් සමන්වාගත වූයේ සම්මත කටයුතු ය. කවර අටෙකින යත්:

ආනන්දය, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි.... සිකපද විෂයෙහි මොනොවට ගෙන හික්මෙයි. බහුශ්‍රැත වෙයි... දෘෂ්ටියෙන් මොනොවට සුප්‍රතිවිද්ධ ය. ඔහු විසින් උභය ප්‍රාතිමොක්ෂයෝ විස්තර විසින් ස්වාගත (මනාසේ ප්‍රගුණ) වෙති (සූත්‍ර වශයෙන් අනුව්‍යඤ්ජන වශයෙන්) මොනවට විභාග කරන ලද්දාහු (ආවර්ජන කළ තන්හි) මොනොවට පැවැත්තාහු මොනොවට විනිශ්චය කරන ලද්දාහු වෙති කල්‍යාණ වචන ඇත්තේ වෙයි. කල්‍යාණ වාක්කරණ (සුන්දර වචන ශොභ) ඇත්තේ වෙයි, පළිබොධ (බාධා) නැති නිර්දෝෂ වූ අර්ථවිඥාපනයට (අරුත් හඟවන්නට) පොහොසත් පරිපූර්ණ වචනයෙන් සමන්වාගත වෙයි, මෙහෙණ සඟනට දැහැමි කථායෙන් කරුණු දක්වන්නට සමාදන් කරවන්නට තෙද ගන්වන්නට සතුටු කරවන්නට ප්‍රතිබල වෙයි, බෙහෙවින් මෙහෙණනට ප්‍රිය වෙයි, මන වඩන්නේ වෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි වූ කහවත් හඳනා මෙහෙණක හා කායසංසර්ගයට නො පැමිණිවිරූ වෙයි, විසි වස් පිරුණේ හෝ විසි වසින් වැඩි සිටියේ හෝ වෙ.

ආනන්දය, මෙහෙණනට ඕවා දෙන මහණ මේ කරුණු අටින් සමන්වාගත වූයේ සම්මත කටයුතු යි.

## 8. 2. 6. 3

## සංක්ෂිප්ත ගොතමීයොවාද සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෙසාලී නගර සමීපයෙහි වූ මහවෙනෙහි කූටාගාරශාලායෙහි වැඩ වසන සේක. එකල්හි මහා පජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේ කරා එළඹුණා ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්නා ය. එකත් පසෙක හුන් මහාපජාපතී ගොතමී භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කළා ය:

වහන්ස, මම භාග්‍යවතුන්ගේ යම් දහමක් අසා (කාය ගණ ආදියෙන්) වෙන් වූයෙම් නො පමා වූයෙම් වැර ඇතියෙම් නිවනට මෙහෙයූ සිතැතියෙම් වෙසෙම් ද, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් ඒ දහම් දෙසන සේක් නම් මැනැව.

යෙ ඛො ත්වං ගොතමී, ධම්මෙ ජානෙය්‍යාසි ඉමෙ ධම්මා සරාගාය සංවත්තන්ති නො විරාගාය, සංයොගාය සංවත්තන්ති නො විසංයොගාය, ආචයාය සංවත්තන්ති නො අපචයාය, මහිච්ඡතාය සංවත්තන්ති නො අප්පිච්ඡතාය, අසන්තුට්ඨියා සංවත්තන්ති නො සන්තුට්ඨියා. සඞ්ගණිකාය සංවත්තන්ති නො පවිවෙකාය. කොසජ්ජාය සංවත්තන්ති නො විරියාරම්භාය. දුබ්භරතාය සංවත්තන්ති නො සුභරතාය, එකංසෙන ගොතමී; ධාරෙය්‍යාසි නෙසො ධම්මො නෙසො විනයො නෙතං සත්ථුසාසනන්ති.

යෙ ච ඛො ත්වං ගොතමී, ධම්මෙ ජානෙය්‍යාසි ඉමෙ ධම්මා විරාගාය සංවත්තන්ති නො සරාගාය, විසංයොගාය සංවත්තන්ති නො සංයොගාය, අපචයාය සංවත්තන්ති නො ආචයාය, අප්පිච්ඡතාය සංවත්තන්ති නො මහිච්ඡතාය, සන්තුට්ඨියා සංවත්තන්ති නො අසන්තුට්ඨියා, පවිවෙකාය සංවත්තන්ති නො සඞ්ගණිකාය, විරියාරම්භාය සංවත්තන්ති නො කොසජ්ජාය, සුභරතාය සංවත්තන්ති නො දුබ්භරතායාති. එකංසෙන ගොතමී, ධාරෙය්‍යාසි එසො ධම්මො එසො විනයො එතං සත්ථුසාසනන්ති.

## 8. 2. 6. 4

## ව්‍යග්ඝපජ්ජ සුත්තං

4. එකං සමයං භගවා කොලියෙසු විහරති කක්කරපත්තං නාම කොලියානං නිගමො. තත්‍ර[1] ඛො දීඝජාණු කොලියපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො දීඝජාණු කොලියපුත්තො භගවන්තං එතදවොච:

මයං භන්තෙ, ගිහී කාමභොගී[2] පුත්තසම්බාධසයනං අජ්ඣාවසාම, කාසිකචන්දනං පච්චනුභොම, මාලාගන්ධවිලෙපනං ධාරයාම, ජාතරූපරජතං සාදියාම. තෙසං නො භන්තෙ, භගවා තථා ධම්මං දෙසෙතු, යෙ අම්හාකං අස්සු ධම්මා දිට්ඨධම්මහිතාය දිට්ඨධම්මසුඛාය සම්පරායහිතාය සම්පරායසුඛායාති.

1. අථ ඛො - ම ඡ සං.
2. ගිහී කාමභොගිනො. - ම ඡ සං.

ගෞතමිය, තෙපි 'මේ දහම්හු සරාගය පිණිස වැටෙති, විරාගයට නො වැටෙත්; සංසාර සංයෝගයට වැටෙති, විසංයෝගයට නො වැටෙත්, සසර වඩනට පවතිති, නො වඩනට නො පවතිත්, මහිච්ඡතා පිණිස පවතිති, අප්පිච්ඡතා පිණිස නො පවතිත්, අසන්තුට්ඨිය පිණිස පවතිති, සන්තුට්ඨිය පිණිස නො පවතිත්, සඞ්ගණිකාව පිණිස පවතිති, ප්‍රවිවේකය පිණිස නො පවතිත්, කුසීත භාවය පිණිස පවතිති, වීර්‍ය්‍යාරම්භය පිණිස නො පවතිත්, දුෂ්පෝෂණය පිණිස පවතිති. සුපෝෂණය පිණිස නො පවතිත් යයි යම් දහමුන් දන්නෙහි ද, ගෞතමිය, ඒකාන්තයෙන් 'මේ දහම නො වෙයි, මේ විනය නො වෙයි, මේ ශාස්තෘ ශාසනය නො වේ'යයි දරව.

ගෞතමීය, තෙපි "මේ ධර්මයෝ විරාගයට වැටෙති, සරාගයට නො වැටෙති; විසංයෝගයට වැටෙති, සංයෝගයට නො වැටෙති; වට නො වඩනට වැටෙති, වට වඩනට නො වැටෙති, අප්පිච්ඡතාවට වැටෙති, මහිච්ඡතාවයට නො වැටෙති; සංතුට්ඨියට වැටෙති, අසංතුට්ඨියට නො වැටෙති; ප්‍රවිවේකයට වැටෙති, සඞ්ගණිකාවට නො වැටෙති; වීර්‍ය්‍යාරම්භයට වැටෙති, කුසීත භාවයට නො වැටෙති; සුභරතාවට වැටෙති, දුභරතාවට නො වැටෙත්'යයි දන්නවූ නම්, ගෞතමීය, ඒකාන්තයෙන් තෙල ධර්මය වෙයි, තෙල විනය වෙයි, තෙල ශාස්තෘ ශාසනය වේ යයි දරව යි.

## 8. 2. 6. 4

## ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කෝලිය ජනපදයෙහි කක්කරපත්ත නම් වූ කෝලියයන්ගේ නියම්ගම්හි වෙසෙන සේක. එකල්හි දීඝජාණු නම් කෝලිය පුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හිඳ. එකත් පසෙක හුන් දීඝජාණු කොලියපුත්‍ර තෙමේ භගවත්නට තෙල සැල කළේ ය.

වහන්ස, ගෘහස්ථ කාමභෝගී වන අපි පුත්‍රදරයන් විසින් සම්බාධ ඇති සයනයෙහි වසන්නෙමු. කසීසළු හා සඳුන් වළඳ කරම්හ, මල්ගඳවිලෙවුන් දරම්හ, රන් හා රිදී හා ඉවසම්හ; වහන්ස, ඒ අපට යම් දහම් කෙනෙක් අපගේ ඉහාත්මයෙහි හිත පිණිස ඉහාත්මයෙහි සුව පිණිස, පරලොවහි සැප පිණිස වන්නාහු නම් එලෙසින් දහම් දෙසන සේක් වා.

චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ, ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති දිට්ඨධම්මසුඛාය. කතමෙ චත්තාරො: උට්ඨානසම්පදා ආරක්ඛසම්පදා කල්‍යාණමිත්තතා සමජීවිකතා.[1]

1. කතමා ච ව්‍යග්ඝපජ්ජ, උට්ඨානසම්පදා: ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො යෙන කම්මට්ඨානෙන ජීවිකං කප්පෙති, යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන[2] යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන. තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ, උට්ඨානසම්පදා.

2. කතමා ච ව්‍යග්ඝපජ්ජ, ආරක්ඛසම්පදා: ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තස්ස භොගා හොන්ති උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා, තෙ ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති 'කින්ති මෙ ඉමෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං න චොරා හරෙය්‍යුං න අග්ගි ඩහෙය්‍ය න උදකං වහෙය්‍ය න අප්පියා දායාදා හරෙය්‍යුන්ති'. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ, ආරක්ඛසම්පදා.

3. කතමා ච ව්‍යග්ඝපජ්ජ, කල්‍යාණමිත්තතා: ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති. තත්ථ යෙ තෙ හොන්ති ගහපතී වා ගහපතිපුත්තා වා දහරා වා වුද්ධසීලිනො වුද්ධා වා වුද්ධසීලා සද්ධාසම්පන්නා සීලසම්පන්නා චාගසම්පන්නා පඤ්ඤාසම්පන්නා' තෙහි සද්ධිං සන්තිට්ඨති සල්ලපති සාකච්ඡං සමාපජ්ජති. යථාරූපානං සද්ධාසම්පන්නානං සද්ධාසම්පදං අනුසික්ඛති, යථාරූපානං සීලසම්පන්නානං සීලසම්පදං අනුසික්ඛති යථාරූපානං චාගසම්පන්නානං චාගසම්පදං අනුසික්ඛති, යථාරූපානං පඤ්ඤාසම්පන්නානං පඤ්ඤාසම්පදං අනුසික්ඛති. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ, කල්‍යාණමිත්තතා.

4. කතමා ච ව්‍යග්ඝපජ්ජ සමජීවිකතා: ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො ආයඤ්ච භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති නාච්චොගාළ්හං නාතිහීනං, එවං මෙ ආයො වයං පරියාදාය ඨස්සති, න ච මෙ වයො ආයං පරියාදාය ඨස්සතීති.

---

1. සමජීවිතා. ම ඡ සං.
2. ඉස්සත්තෙන. ම ඡ සං.

ව්‍යාඝ්‍රපද්‍යය, මේ සතර දහම් කෙනෙක් කුලපුත්හුගේ ඉහාත්ම භාවයෙහි හිත පිණිස, ඉහාත්මභාවයෙහි සුව පිණිස පවත්නාහ. කවර සතර දෙනෙක යත්: උත්‍ථාන සම්පත් ය, ආරක්ෂා සම්පත් ය, කල්‍යාණමිත්‍ර තාව ය, සමජීවිකතා ය යනු යි.

1. ව්‍යාඝ්‍රපද්‍යය, උත්‍ථානසම්පත් කවර යත්: ව්‍යාඝ්‍රපද්‍යය, මෙ ලොව්හි කුලපුත් තෙමේ කෘෂිකර්මයෙන් වේවායි වණික්කර්මයෙන් වේවයි. ගෝරක්ෂායෙන් වේවයි දුනුවෑකමින් වේවයි රාජපුරුෂ භාවයෙන් වේවයි අන්‍යතර ශිල්පයෙකින් වේවයි යම්බඳු වූ ම කර්මාන්ත- යෙකින් ජීවිකා කෙරෙයි නම්, එහි අනලස් වූයේ තත්‍රොපාය විමංසායෙන් සමන්වාගත වූයේ කරන්නට සමත් වූයේ සංවිධානයට සමත් වූයේ දක්ෂ වෙයි. ව්‍යාඝ්‍රපද්‍යය, මේ උත්‍ථානසම්පත් යයි කියනු ලැබේ.

2. ව්‍යාඝ්‍රපද්‍යය, ආරක්ෂාසම්පත් කවර යත්: ව්‍යාඝ්‍රපද්‍යය, මෙ ලොව්හි කුලපුත් හට උත්‍ථානවීර්‍ය්‍යයෙන් ලබන ලද බාහුබලයෙන් රැස් කරන ලද ඩහදිය හෙළා උපදවන ලද දැහැමි වූ දැහැමින් ලද භොගයෝ වෙත්. ඔහු ආරක්ෂායෙන් ගෝපනයෙන් 'මාගේ භෝගයන් රජවරු කිමැ හැර නො ගනිත් ද, සොරු පැහැර නො ගනිත් ද ගින්න නො දවා ද, දිය හෝ ගසාගෙන නො යේ ද, අප්‍රිය බන්‍ධූහු නො ගනිත් දැයි ආරක්ෂායෙන් ගොපනයෙන් පිළියෙළ කර තබයි' ව්‍යාඝ්‍රපද්‍යය, මේ ආරක්ෂාසම්පත් යයි කියනු ලැබේ.

3. ව්‍යාඝ්‍රපද්‍යය, කල්‍යාණමිත්‍රතාව කවරයත්. ව්‍යාඝ්‍රපද්‍යය, මෙ ලොව්හි කුලපුත් තෙමේ යම් ගමෙක වේවයි නියම් ගමෙක වේවයි වෙසේ නම් එහි ගෘහපති වේවයි ගෘහපති පුත්‍ර වේවයි ළදරු වූ වෘද්ධ සවභාව ඇත්තාහු වෙත්වයි, වෘද්ධ සවභාව ඇති වෘද්ධයෝ වෙත්වයි යම් ඒ ශ්‍රද්ධාසම්පන්න වූවාහු ශීලසම්පන්න වූවාහු ත්‍යාගසම්පන්න වූවාහු ප්‍රඥසම්පන්න වූවාහු වෙත් නම් ඔවුන් හා සමඟ සිටුනේ ය, සල්ලාප කරන්නේ ය, සාකච්ඡාවට පැමිණෙන්නේ ය, යම් බඳු වූ ශ්‍රද්ධාසම්පන්නයන් ගේ ශ්‍රද්ධාසම්පත් අනුව හික්මෙයි. යම්බඳු ශීලසම්පන්නයන් ගේ ශීලසම්පත් වේ නම් ඒ අනුව හික්මෙයි. යම්බඳු ත්‍යාගසම්පන්නයන් ගේ ත්‍යාගසම්පත් වේ නම් ඒ අනුව හික්මෙයි: යම්බඳු ප්‍රඥසම්පන්නයන් ගේ ප්‍රඥාසම්පත් වේ නම් ඒ අනුව හික්මෙයි. ව්‍යාඝ්‍රපද්‍යය, මේ කල්‍යාණමිත්‍රතා යි කියනු ලැබේ.

4. ව්‍යාඝ්‍රපද්‍යය සමජීවිකතා කවර යත්: ව්‍යාඝ්‍රපද්‍යය, මෙ ලොව්හි කුලපුත්‍ර තෙමේ භෝගයන් ගේ අයදූ දැන, භෝගයන් ගේ වැයදූ දැන ඉමහත් ද නො වූ ඉතා පහත් ද නො වූ සම දිවිපැවැත්ම කෙරෙයි. මෙ ලෙසින් මාගේ අය ව්‍යය ගෙවා සිටුනේ ය, මාගේ ව්‍යය අය ගෙවා නො සිටුනේ යයි කියා යි.

සෙය්‍යථාපි ව්‍යග්ඝපජ්ජ, තුලාධාරො වා තුලාධාරන්තෙවාසී වා තුලං පග්ගහෙත්වා ජානාති එත්තකෙන වා ඔනතං එත්තකෙන වා උන්නතන්ති. එවමෙව ඛො ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො ආයඤ්ච භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති, න ච අච්චොගාළ්හං න අතිහීනං. එවං මෙ ආයො වයං පරියාදය ඨස්සති, න ච මෙ වයො ආයං පරියාදය ඨස්සතීති. සචායං ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො අප්පායො සමානො උළාරං ජීවිකං කප්පෙති, තස්ස භවන්ති වත්තාරො උදුම්බරඛාදිකං වායං[1] කුලපුත්තො භොගෙ ඛාදතී'ති.

සචෙ පනායං ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො මහායො සමානො කසිරං ජීවිකං කප්පෙති, තස්ස භවන්ති වත්තාරො 'අජද්ධුමාරිකං වායං[2] කුලපුත්තො මරිස්සතී'ති.

යතො ච ඛ්වායං ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො ආයඤ්ච භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති න අච්චොගාළ්හං නාතිහීනං, එවං මෙ ආයො වයං පරියාදය ඨස්සති, න ච මෙ වයො ආයං පරියාදය ඨස්සතීති. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ, සමජීවිකතා.

එවං සමුප්පන්නානං ව්‍යග්ඝපජ්ජ භොගානං චත්තාරි අපායමුඛානි හොන්ති: ඉත්ථිධුත්තො හොති සුරාධුත්තො අක්ඛධුත්තො පාපමිත්තො පාපසහායො පාපසම්පවඞ්කො. සෙය්‍යථාපි ව්‍යග්ඝපජ්ජ, මහතො තළාකස්ස චත්තාරි චෙව ආයමුඛානි. චත්තාරි ච අපායමුඛානි, තස්ස පුරිසො යානි-චෙව ආයමුඛානි තානි පිදහෙය්‍ය, යානි ච අපායමුඛානි තානි විවරෙය්‍ය, දෙවො ච න සම්මාධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, එවං හි තස්ස ව්‍යග්ඝපජ්ජ මහතො තළාකස්ස හානියෙව පාටිකඞ්ඛා. නො වුද්ධි. එවමෙව ඛො ව්‍යග්ඝපජ්ජ, එවං සමුප්පන්නානං භොගානං චත්තාරි අපායමුඛානි හොන්ති: ඉත්ථිධුත්තො හොති සුරාධුත්තො අක්ඛධුත්තො පාපමිත්තො පාපසහායො පාපසම්පවඞ්කො.

1. උදුම්බරඛාදිවායං-මජසං
2. අජෙළමරණං වායං-මජසං

ව්‍යාඝ්‍රපද්‍යය, යම් සේ තුලාව දරන්නෙක් වේවයි, තුලා දරන්නකු ගේ අතැවැසියෙක් වේව යි තුලාව ඔසවා ගෙන මෙ පමණෙකින් අවනත මෙපමණකින් උන්නත වෙයයි දන්නේ ද, ව්‍යාඝ්‍රපද්‍යය, එ පරිද්දෙන් ම කුලපුත් තෙමේ භොගයන් ගේ අයත් දැන භොගයන්ගේ වැයත් දැන ඉමහත් ද නො වූ ඉතා හීන ද නො වූ සම වූ ජීවිකා කෙරෙයි. මෙ සෙයින් මාගේ අය ව්‍යය ගෙවා සිටුනේ ය, මාගේ ව්‍යයය අය ගෙවා නො සිටුනේ ය කියා යි.

ව්‍යාඝ්‍රපද්‍යය, ඉදින් මේ කුලපුත් තෙමේ අල්පවූ අය ඇතියේ ම උදරව ජීවිකා කෙරේ නම්, ඔහට 'මෙ කුලපුත් දිඹුල් කෑමක් සෙයින් භෝගයන් වළඳන්නේ ය'යි කියන්නාහු වෙත්. ව්‍යාඝ්‍රපද්‍යය, ඉදින් මේ කුලපුත් මහත් වූ අය ඇතියේ ම අල්පව ජීවිකා කරන්නේ නම් ඔහට 'මෙ කුල පුත් අනාථ මරණයෙන් මැරෙන්නකු සෙයින් මැරෙන්නේ ය'යි කියන්නෝ වෙති.

ව්‍යාඝ්‍රපද්‍යය යම්හෙයකින් කුලපුත්‍ර භෝගයන්ගේ අය ද සලකා භෝගයන්ගේ වැය ද සලකා ඉතා මහත් නොව ඉතා හීන නොව සම ව ජීවිකාව කෙරේ ද, මෙ සෙයින් මාගේ අය විය ම මැඩ ගෙන සිටුනේ ය. මාගේ වැය ආදයම මැඩ ගෙන නො ද සිටුනේ ය යි. ව්‍යග්ඝපජ්ජය, මේ සමජීවිකතා යී කියනු ලැබේ.

ව්‍යග්ඝපජ්ජය, මෙසේ උපන් භෝගයනට අපාය මුඛයෝ සතර දෙනෙක් වෙත්: ස්ත්‍රීධූර්ත වෙයි, සුරාධූර්ත වෙයි, අක්ෂධූර්ත වෙයි, පවිටු යහළුවන් ඇති පාපසහායයන් ඇති පවිටනට බෙහෙවින් නැඹුරු වූවෙක් වෙයි. ව්‍යග්ඝපජ්ජය, යම්සේ මහත් තඩාගයකට සතර ආයමුඛ (ආගමන මාර්ග) කෙනෙක් ද සතර අපායමුඛ (විනාශ මාර්ග) කෙනෙක් ද වෙත් නම් පුරුෂයෙක් ඒ තඩාගයාගේ යම්බඳු අයමුඛ වෙත් නම් ඔහු වසාලන්නේ වෙයි. යම්බඳු අපායමුඛ කෙනෙක් වෙත් නම් ඔහු විවර කෙරෙයි. මෙසය ද මෙනවට වැසි දහර නො වස්වන්නේ වෙයි ව්‍යග්ඝපජ්ජය, මෙසේ ඇති කල්හි ඒ මහත් තඩාගයට හානියෙක් ම කැමැති විය යුතු, වෘද්ධියෙක් කැමති නො විය යුතු. ව්‍යග්ඝපජ්ජය, එ පරිදි ම මෙසේ උපන් භෝගයනට සතර අවාමුව කෙනෙක් වෙත්: ස්ත්‍රීධූර්ත වෙයි, සුරාධූර්ත වෙයි., අක්ෂධූර්ත වෙයි පවිටු මිතුරන් ඇතියේ ප වූ යහළුවන් ඇතියේ පවිටු මිතුරනට නැඹුරු වූවෙක් වෙයි.

එවං සමුප්පන්නානං ව්‍යග්ඝපජ්ජ, භොගානං චත්තාරි ආයමුඛානි හොන්ති. න ඉත්ථිධුත්තො හොති න සුරාධුත්තො න අක්ඛධුත්තො කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො. සෙය්‍යථාපි ව්‍යග්ඝපජ්ජ, මහතො තළාකස්ස චත්තාරි චෙව ආයමුඛානි චත්තාරි චෙව අපායමුඛානි, තස්ස පුරිසො යානි චෙව ආයමුඛානි තානි විවරෙය්‍ය, යානි ච අපායමුඛානි තානි පිදහෙය්‍ය, දෙවො ච සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, එවං හි තස්ස ව්‍යග්ඝපජ්ජ, මහතො තළාකස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා නො පරිහානි, එවමෙව ඛො ව්‍යග්ඝපජ්ජ, එවං සමුප්පන්නානං භොගානං චත්තාරි ආයමුඛානි හොන්ති න ඉත්ථිධුත්තො හොති, න සුරාධුත්තො න අක්ඛධුත්තො කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො.

ඉමෙ ඛො ව්‍යග්ඝපජ්ජ, චත්තාරො ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති, දිට්ඨධම්මසුඛායාති.

චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ, ධම්මා කුලපුත්තස්ස සම්පරායහිතාය සංවත්තන්ති සම්පරායසුඛාය. කතමෙ චත්තාරො: සද්ධාසම්පදා සීලසම්පදා චාගසම්පදා පඤ්ඤාසම්පදා.

5. කතමා ච ව්‍යග්ඝපජ්ජ, සද්ධාසම්පදා: ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ, සද්ධාසම්පදා.

6. කතමා ච ව්‍යග්ඝපජ්ජ, සීලසම්පදා: ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානා පටිවිරතො හොති කාමෙසුමිච්ඡාචාරා පටිවිරතො හොති මුසාවාදා පටිවිරතො හොති සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ සීලසම්පදා.

7. කතමා ච ව්‍යග්ඝපජ්ජ චාගසම්පදා: ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ, චාගසම්පදා.

ව්‍යග්ඝපජ්ජය, මෙසේ උපන් භෝගයනට සතර ආයමුව කෙනෙක් වෙත්: ස්ත්‍රීධූර්ත නො වෙයි, සුරාධූර්ත නො වෙයි, අක්ෂධූර්ත නො වෙයි, කළණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණ යහළුවනට නැඹුරු වූවෙක් වෙයි. ව්‍යග්ඝපජ්ජය, යම් පරිදි මහත් වූ තඩාගයකට සතර ආයමුව කෙනෙක් ද සතර අපායමුව කෙනෙක් ද වෙත් නම් පුරුෂයෙක් ඒ තඩාගයා ගේ යම් ආයමුවයෝ වෙත් නම් ඒ විවර කෙරෙයි. යම් අපායමුව කෙනෙක් වෙත් නම් ඒ වසා තබන්නේ වෙයි, මෙසය ද මොනොවට වැසිදහර වස්වන්නේ වෙයි. ව්‍යග්ඝපජ්ජය, මෙසේ ඇති කල්හි ඒ මහාතඩාගයා ගේ වෘද්ධියෙක් ම කැමැති විය යුතු යි, පරිහානියෙක් නො වෙයි. ව්‍යග්ඝපජ්ජය, එපරිදි ම මෙසේ උපන් භොගයනට සතර අයමුව කෙනෙක් වෙත්: ස්ත්‍රීධූර්ත නො වෙයි, සුරාධූර්ත නො වෙයි, අක්ෂධූර්ත නො වෙයි කලණ මිතුරන් ඇති, කලණ යහළුවන් ඇති, කලණයනට නැඹුරු වූවෙක් වෙයි.

ව්‍යග්ඝපජ්ජය, මේ සතර දහම්හු කුලපුත්හුගේ දිටුදැම්හයෙහි හිත පිණිස දිටුදැම්හයෙහි සුව පිණිස පවතිත්.

ව්‍යග්ඝපජ්ජය, මේ සතර ධර්ම කෙනෙක් කුල පුත්හුගේ පරලොව හිත පිණිස, පරලොව සුව පිණිස පවතිත්, කවර සතරධම් කෙනෙක යත්; සද්ධාසම්පද සීලසම්පද චාගසම්පද පඤ්ඤාසම්පද යි.

5. ව්‍යග්ඝපජ්ජය, සද්ධාසම්පද කවර යත්: ව්‍යග්ඝපජ්ජය, මෙලොව්හි කුලපුත් සැදැහැතියේ වෙයි. තථාගතයන් ගේ බොධිය හදහයි: මෙ කරුණෙනුදු ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගත්හ, ලොකවිද්හ, අනුත්තර පුරුෂදම්‍යසාරථිහ, දෙව්මිනිස්නට ශාස්තෘහ, බුද්ධයහ, බගවත්හ යි. ව්‍යග්ඝපජ්ජය, මේ සද්ධාසම්පද යි කියනු ලැබෙයි.

6. ව්‍යග්ඝපජ්ජය, සීලසම්පද කවර යත්: ව්‍යග්ඝපජ්ජය, මෙ ලොව්හි කුලපුත් පණිවායෙන් වැළකියේ වෙයි, අයිනාදනින් වැළකියේ වෙයි, කාමයෙහි මිසහසරින් වැළකියේ වෙයි, මුසවායෙන් වැළකියේ වෙයි, මද පමා දෙකට කරුණු රහමෙරින් වැළක්කෙ වේ. ව්‍යග්ඝපජ්ජය, මේ සීලසම්පද යි කියනු ලැබේ.

7. ව්‍යග්ඝපජ්ජය, චාගසම්පද කවර යත්: ව්‍යග්ඝපජ්ජය, මෙ ලොව්හි කුලපුත් දුරු කළ මසුරුමල ඇති සිතින් මිදූ ත්‍යාග ඇත්තේ දීමට දෙවූ අත් ඇත්තේ ව්‍යවසර්ගයෙහි (දනයෙහි) ඇලුණේ යදනට සුදුසු වූයේ දනසංවිභාගයෙහි ඇලුණේ ගිහිගෙයි වෙසෙයි. ව්‍යග්ඝපජ්ජය, මේ ත්‍යාගසම්පද යි කියනු ලැබෙයි.

8. කතමා ච ව්‍යග්ඝපජ්ජ පඤ්ඤාසම්පදා: ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො, අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ පඤ්ඤාසම්පදා.

ඉමෙ ඛො ව්‍යග්ඝපජ්ජ, චත්තාරො ධම්මා කුලපුත්තස්ස සම්පරායහිතාය සංවත්තන්ති සම්පරායසුඛායාති.

1. උට්ඨාතා කම්මධෙය්‍යෙසු අප්පමත්තො විධානවා,
සමං කප්පෙති ජීවිකං[1] සම්භතං අනුරක්ඛති.

2. සද්ධො සීලෙන සම්පන්නො වදඤ්ඤූ වීතමච්ඡරො,
නිච්චං මග්ගං විසොධෙති සොත්ථානං සම්පරායිකං.

3. ඉච්චෙතෙ අට්ඨධම්මා ච සද්ධස්ස ඝරමෙසිනො,
අක්ඛාතා සච්චනාමෙන උභයත්ථ සුඛාවහා.

4. දිට්ඨධම්මහිතත්ථාය සම්පරායසුඛාය ච
එවමෙතං ගහට්ඨානං චාගො පුඤ්ඤං පවඩ්ඪතීති.

## 8. 2. 6. 5
## උජ්ජය සුත්තං

[සාවත්ථිනිදානං]

අථ ඛො උජ්ජයො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උජ්ජයො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

මයං භො ගොතම, පවාසං ගන්තුකාමා, තෙසං නො භවං ගොතමො අම්හාකං තථා ධම්මං දෙසෙතු යෙනම්හාකං අස්ස ධම්මා දිට්ඨධම්මහිතාය දිට්ඨධම්මසුඛාය සම්පරායහිතාය සම්පරායසුඛායාති.

චත්තාරොමෙ බ්‍රාහ්මණ, ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති දිට්ඨධම්මසුඛාය. කතමෙ චත්තාරො:

උට්ඨානසම්පදා ආරක්ඛසම්පදා කල්‍යාණමිත්තතා සමජීවිකතා:

1. ජීවිතං - සිමු. -මජසං

8. ව්‍යග්ඝපජ්ජය, පඤ්ඤාසම්පද කවර යත්: ව්‍යග්ඝපජ්ජය, මෙ ලොව්හි කුලපුත් උදයව්‍යයව යන නිර්වේදය පිණිස පවත්නා මොනොවට දුක් කෙළවර කිරීම පිණිස පවත්නා ආර්‍ය්‍ය වූ ප්‍රඥාවෙන් සමන්වාගත වූයේ පැනවත් වෙයි. ව්‍යග්ඝපජ්ජය, මේ පඤ්ඤාසම්පද යි කියනු ලැබෙ.

ව්‍යග්ඝපජ්ජය, මේ සතර දහම්හු කුලපුත්හු ගේ සම්පරාය හිත පිණිස සම්පරාය සුබ පිණිස පවත්නාහ යි.

1. කර්මාන්ත කරන තන්හි උත්ථානවීර්‍ය්‍ය ඇත්තේ නො පමා වූයේ සංවිධාන ඇත්තේ සමජීවිකා කෙරෙයි, සපයන ලද්ද රක්නේ ය.

2. සැදැහැතියේ සිල්සපන් වූයේ යැදි වදන් දන්නේ පහ වූ මසුරු මල ඇතියේ සුබ දයක වූ සාම්පරායික මාර්ගය නිතර පිරිසිදු කෙරෙයි.

3. මෙසේ තෙල අටදහම්හු සැදැහැති ගිහියාගේ දෙලොව සුව එළවත් යයි අවිතථ නම් ඇති බුදුන් විසින් පවසන ලදහ.

4. දිටුදැමියෙහි හිත පිණිස ද පරලොව්හි සුව පිණිස ද මෙසේ ත්‍යාගය තෙමේ ගෘහස්ථයනට තෙල පින් වඩන්නේ යයි.

## 8. 2. 6. 5
## උජ්ජය සූත්‍රය

**[සැවත් නිදනයි]**

එකල්හි උජ්ජය බමුණු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහිකට යුතු කථාව නිමවා එකත්පසෙක හින, එකත්පසෙක හුන් උජ්ජය බමුණු භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළේ ය:

භවත් ගෞතමයන් වහන්ස, අපි ප්‍රවාසයට (පිටත වාසයට) යනු කැමැත්තම්හ. යම් හෙයෙකින් අපට දිටුදැමියෙහි හිත පිණිස දිටුදැමියෙහි සුව පිණිස සම්පරායෙහි හිත පිණිස සම්පරායෙහි සුව පිණිස ධර්ම කෙනෙක් වෙත් නම් භාග්‍යවතුන් වහන්සේ එයේ අපට දහම් දෙසන සේක් ව යි.

බමුණ, මේ සතර දහම්හු කුලපුත්හු ගේ දිටුදැමියෙහි හිත පිණිස දිටුදැහැමියෙහි සුව පිණිස පවත්නාහ. කවර සතර දෙනෙක යත්:

උට්ඨානසම්පදය, ආරක්ඛසම්පදය, කල්‍යාණමිත්තතා ය, සමජීවිකතා යි.

1. කතමා ච බ්‍රාහ්මණ. උට්ඨානසම්පදා: ඉධ බ්‍රාහ්මණ, කුලපුත්තො යෙන කම්මට්ඨානෙන ජීවිකං කප්පෙති යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන, තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුන්ති. අයං වුච්චති බ්‍රාහ්මණ, උට්ඨානසම්පදා.

2. කතමා ච බ්‍රාහ්මණ ආරක්ඛසම්පදා: ඉධ බ්‍රාහ්මණ, කුලපුත්තස්ස භොගා හොන්ති උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා තෙ ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති, කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං න චොරා හරෙය්‍යුං න අග්ගි ඩහෙය්‍ය න උදකං වහෙය්‍ය න අප්පියා දායාද හරෙය්‍යුන්ති. අයං වුච්චති බ්‍රාහ්මණ ආරක්ඛසම්පදා.

3. කතමා ච බ්‍රාහ්මණ කල්‍යාණමිත්තතා: ඉධ බ්‍රාහ්මණ, කුලපුත්තො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති තත්‍ර යෙ තෙ හොන්ති ගහපති වා ගහපතිපුත්තා වා දහරා වා වුද්ධසීලිනො වුද්ධා වා වුද්ධසීලිනො සද්ධාසම්පන්නා සීලසම්පන්නා චාගසම්පන්නා පඤ්ඤාසම්පන්නා, තෙහි සද්ධිං සන්තිට්ඨති සල්ලපති සාකච්ඡං සමාපජ්ජති, යථාරූපානං සද්ධාසම්පන්නානං සද්ධාසම්පදං අනුසික්ඛති. යථාරූපානං සීලසම්පන්නානං සීලසම්පදං අනුසික්ඛති. යථාරූපානං චාගසම්පන්නානං චාගසම්පදං අනුසික්ඛති. යථාරූපානං පඤ්ඤාසම්පන්නානං පඤ්ඤාසම්පදං අනුසික්ඛති, අයං වුච්චති බ්‍රාහ්මණ කල්‍යාණමිත්තතා.

4. කතමා ච බ්‍රාහ්මණ සමජීවිකතා: ඉධ බ්‍රාහ්මණ, කුලපුත්තො ආයං ච භොගානං විදිත්වා වයං ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති, නාච්චොගාළ්හං නාතිහීනං ‘එවං මෙ ආයො වයං පරියාදාය ඨස්සති, න ච මෙ වයො ආයං පරියාදාය ඨස්සතී’ති.

1. බමුණ, උට්ඨානසම්පද කවර: බමුණ, මෙ ලොවෙහි කුලපුත් සීසෑමෙන් වේවයි වෙළඳාමින් වේවයි ගෙරිරක්මෙන් වේවයි දුනුවාකැමින් වේවයි රාජසේවයෙන් වේවයි අන්‍යතර ශිල්පයෙකින් වේවයි යම්බඳු වූ කර්මාන්තයෙකින් ජීවිකා කෙරේ නම් එහි අනලස් වූයේ තත්‍රොපායවීමංසායෙන් සමන්වාගත වූයේ දක්ෂ වෙයි. කිරීමට සමත් වෙයි. සංවිධානයට සමත් වෙයි. බමුණ, මේ උට්ඨානසම්පද යි කියනු ලැබේ.

2. බමුණ, ආරක්ඛසම්පද කවර: බමුණ, මෙලොවෙහි කුලපුත්හට උත්ථානවීර්‍ය්‍යයෙන් ලබනලද බාහුබලයෙන් රැස්කරන ලද ඩහදිය වැගිරවීමෙන් උපයන ලද දැහැමි වූ දැහැමින් ලද භොගයෝ වෙත්. ඒ භොග ආරක්ෂායෙන් ගොපනයෙන් පිළියෙළ කොට තබයි. කිමෙක, මාගේ භොග රජහු හැර නො ගනිත් නම්, සොරු පැහැර නො ගනිත් නම් ගිනි නො දවා නම්, වතුරු ගසාගෙන නො යේ නම්, අප්‍රිය බෑණුවු පැහැර නොගනිත් නම් ශයහෙක කියායි. බමුණ, මෙ ආරක්ඛසම්පද යි කියනු ලැබෙයි.

3. බමුණ, කල්‍යාණමිත්තතා නම් කවර: බමුණ මෙ ලොවෙහි කුලපුත් යම් ගමෙක වේවයි නියම්ගමෙක වේවයි වෙසේ නම් එහි ගැහැවි හෝ ගැහැවිපුත්හු හෝ වෘද්ධශීලී දහරයෝ හෝ වෘද්ධශීලී වෘද්ධයෝ හෝ හෝ ශ්‍රද්ධා සම්පන්න වූවාහු ශීලසම්පන්න වූවාහු ත්‍යාග සම්පන්න වූවාහු ප්‍රඥාසම්පන්න වූවාහු යම් ඒ කෙනෙක් වෙත් නම් ඔවුන් හා සමග සිටුනේ ය. සල්ලාප කරන්නේ ය. සාකච්ඡාවට එළඹෙන්නේ ය. යම් බඳු සැදැහැතියන්ගේ ශ්‍රද්ධාසම්පත් අනුව හික්මේ නම්, යම්බඳු ශීලසම්පන්නයන් ගේ ශීලසම්පත් අනුව හික්මෙ නම්, යම්බඳු ත්‍යාගසම්පන්නයන් ගේ ත්‍යාගසම්පත් අනුව හික්මෙ නම්, යම්බඳු ප්‍රඥාසම්පන්නයන් ගේ ප්‍රඥාසම්පත් අනුව හික්මෙ නම් බමුණ, මෙ කල්‍යාණ මිත්තතා යි කියනු ලැබෙයි.

4. බමුණ, සමජීවිකතා කවර: බමුණ, මෙ ලොවෙහි කුලපුත් භෝගයන් ගේ අය ද දැන භෝගයන්ගේ වැය ද දැන ඉතා දැඩි ද නො වූ ඉතා හීන ද නො වූ සම වූ ජීවිකා කෙරෙයි, මෙසේ මාගේ අය තෙමේ වැය මැඩගෙන සිටුනේ ය. මාගේ වැය තෙමේ අය මැඩගෙන නො සිටුනේ ය කියා යි.

සෙයාථාපි බ්‍රාහ්මණ, තුලාධාරො වා තුලාධාරන්තෙවාසී වා තුලං පග්ගහෙත්වා ජානාති එත්තකෙන වා ඔනතං එත්තකෙන වා උන්නතන්ති. එවමෙව ඛො බ්‍රාහ්මණ කුලපුත්තො ආයඤ්ච භොගානං විදිත්වා වයං ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති නාච්චොගාළ්හං නාතිහීනං, එවං මෙ ආයො වයං පරියාදය ඨස්සති, න ච මෙ වයො ආයං පරියාදය ඨස්සතී'ති.

සචායං බ්‍රාහ්මණ, කුලපුත්තො අප්පායො සමානො උළාරං ජීවිකං කප්පෙති, තස්ස භවන්ති වත්තාරො 'උදුම්බරඛාදිකං වායං කුලපුත්තො භොගෙ ඛාදතී'ති.

සචෙ පනායං බ්‍රාහ්මණ, කුලපුත්තො මහායො සමානො කසිරං ජීවිකං කප්පෙති, තස්ස භවන්ති වත්තාරො 'අජද්ධුමාරිකං වායං කුලපුත්තො මරිස්සතී'ති.

යතො ච ඛො අයං බ්‍රාහ්මණ, කුලපුත්තො ආයඤ්ච භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති නාච්චොගාළ්හං නාතිහීනං එවං මෙ ආයො වයං පරියාදය ඨස්සති, න ච මෙ වයො ආයං පරියාදය ඨස්සතීති, අයං වුච්චති බ්‍රාහ්මණ සමජීවිකතා.

එවං සමුප්පන්නානං බ්‍රාහ්මණ, භොගානං චත්තාරි අපායමුඛානි හොන්ති: ඉත්ථිධුත්තො සුරාධුත්තො අක්ඛධුත්තො පාපමිත්තො පාපසහායො පාපසම්පවඞ්කො.

සෙයාථාපි බ්‍රාහ්මණ, මහතො තළාකස්ස චත්තාරි චෙව ආයමුඛානි චත්තාරි ච අපායමුඛානි, තස්ස පුරිසො යානි චෙව ආයමුඛානි තානි පිදහෙය්‍ය, යානි ච අපායමුඛානි තානි විවරෙය්‍ය, දෙවො ච න සම්මාධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, එවං තස්ස බ්‍රාහ්මණ, මහතො තළාකස්ස පරිහානියෙව පාටිකඞ්ඛා නො වුද්ධි.

එවමෙව ඛො බ්‍රාහ්මණ, එවං සමුප්පන්නානං භොගානං චත්තාරි අපායමුඛානි හොන්ති: ඉත්ථිධුත්තො සුරාධුත්තො අක්ඛධුත්තො පාපමිත්තො පාපසහායො පාපසම්පවඞ්කො. එවං සමුප්පන්නානං බ්‍රාහ්මණ, භොගානං චත්තාරි ආයමුඛානි හොන්ති: න ඉත්ථිධුත්තො න සුරාධුත්තො න අක්ඛධුත්තො කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො.

බමුණ, යම් පරිදි තුලා දරන්නෙක් වේවයි තුලා දරන්නකුගේ අතැවැස්සෙක් වේවයි තුලාව ගෙන මෙතෙකින් අවනතය මෙතෙකින් උන්නතය යි දන්නේ ද, බමුණ, එපරිදි ම කුලපුත් භොගයන් ගේ අය ද දැන භෝගයන්ගේ වැය ද දැන ඉතා දැඩීත් නො වූ ඉතා හීනත් නො වූ සම වූ ජීවිකාව කෙරෙයි. මෙසේ මාගේ අය තෙමේ වැය මැඩ ගෙන සිටුනේ ය. මාගේ වැය තෙමේ අය මැඩ ගෙන නො සිටුනේ ය කියායි.

බමුණ, ඉදින් මේ කුලපුත් අල්ප වූ අය ඇතියේ ම උළාරව ජීවිකා කෙරේ නම් 'ඔහට මෙ කුලපුත් දිඹුල් කනු සෙයින් භොගයන් කා දමන්නේ ය'යි කියන්නාහු වෙත්.

බමුණ, ඉදින් මේ කුලපුත් මහත් අය ඇතියේ ම හීන ව ජීවිකා කෙරේ නම් ඔහට 'මේ කුල පුත් අනාථමරණයෙන් මැරෙන්නේ ය'යි කියන්නාහු වෙත්.

බමුණ, යම් හෙයෙකින් මේ කුලපුත් භෝගයන් ගේ අය ද දැන භොගයන් ගේ වැය ද දැන ඉතා දැඩි නො වූ ඉතා හීන නො වූ සමජීවිකා කෙරේ ද, මෙසේ ඇති කල්හි මාගේ අය වැය මැඩ ගෙන සිටුනේ ය. මාගේ වැය අය මැඩ ගෙන නො සිටුනේ ය'යි. බමුණ, මේ සමජීවිකතා යි කියනු ලැබේ;

බමුණ, මෙසේ උපන් භෝගයන් ගේ සතර අවාමුව කෙනෙක් වෙත්: ස්ත්‍රීධූර්ත වෙයි, සුරාධූර්ත වෙයි. අක්ෂධූර්ත වෙයි. පාපමිත්‍රයන් ඇති පවිටු යහළුවන් ඇති පවිටනට නැඹුරු වූවෙක් වෙයි.

බමුණ, යම් පරිදි මහත් තඩාගයකට සතර අයමුව කෙනෙක් වෙත් ද, සතර අවාමුව කෙනෙකුත් වෙත් ද, පුරුෂයෙක් ඒ තඩාගයාගේ යම්බඳු අයමුව වෙත් නම් ඔවුන් වසා තබන්නේ ය. යම් අවාමුව කෙනෙක් වෙත් නම් ඔවුන් විවර කරන්නේ ය. මෙසය ද මොනොවට වැසිදහර නො වස්වන්නේ ය. මෙසේ ඇති කල්හි බමුණ, ඒ මහාතඩාගයාගේ පරිහානිය ම කැමැති විය යුතු, වෘද්ධියෙක් නො වේ.

බමුණ, එ පරිදි ම මෙසේ උපන් භෝගයනට අවාමුව සතරෙක් වේ: ස්ත්‍රීධූර්ත වෙයි, සුරාධූර්ත වෙයි, අක්ෂධූර්ත වෙයි. පවිටු යහළුවන් ඇති පවට නැඹුරු වූ පාපමිත්‍රයන් ඇතියෙක් වේ, බමුණ, මෙසේ උපන් භොගයනට අයමුව සතරෙක් වෙයි: ස්ත්‍රීධූර්ත නො වේ, සුරාධූර්ත නො වේ. අක්ෂධූර්ත නො වේ. කලණ මිතුරන් ඇති, කලණ යහළුවන් ඇති, කලණයනට නැඹුරු වූවෙක් වේ.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ, මහතො තළාකස්ස චත්තාරි චෙව ආයමුඛානි චත්තාරි ච අපායමුඛානි, තස්ස පුරිසො යානි චෙව ආයමුඛානි තානි විවරෙය්‍ය යානි ච අපායමුඛානි තානි පිදහෙය්‍ය, දෙවො ච සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, එවං හි තස්ස බ්‍රාහ්මණ මහතො තළාකස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා. නො පරිහානි. එවමෙව ඛො බ්‍රාහ්මණ, එවං සමුප්පන්නානං භොගානං චත්තාරි ආයමුඛානි හොන්ති: න ඉත්ථී ධුත්තො-පෙ-කල්‍යාණසම්පවඞ්කො.

ඉමෙ ඛො බ්‍රාහ්මණ, චත්තාරො ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති දිට්ඨධම්මසුඛාය.

චත්තාරො මෙ බ්‍රාහ්මණ, ධම්මා කුලපුත්තස්ස සම්පරායහිතාය සංවත්තන්ති, සම්පරායසුඛාය. කතමෙ චත්තාරො: සද්ධාසම්පදා සීලසම්පදා චාගසම්පදා පඤ්ඤාසම්පදා.

5. කතමා ච බ්‍රාහ්මණ, සද්ධාසම්පදා: ඉධ බ්‍රාහ්මණ, කුලපුත්තො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං 'ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. අයං වුච්චති බ්‍රාහ්මණ, සද්ධාසම්පදා.

6. කතමා ච බ්‍රාහ්මණ, සීලසම්පදා: ඉධ බ්‍රාහ්මණ, කුලපුත්තො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, අයං වුච්චති බ්‍රාහ්මණ, සීලසම්පදා.

7. කතමා ච බ්‍රාහ්මණ, චාගසම්පදා: ඉධ බ්‍රාහ්මණ, කුලපුත්තො[3] විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො, අයං වුච්චති බ්‍රාහ්මණ, චාගසම්පදා.

8. කතමා ච බ්‍රාහ්මණ, පඤ්ඤාසම්පදා: ඉධ බ්‍රාහ්මණ කුලපුත්තො පඤ්ඤවා හොති -පෙ- සම්මාදුක්ඛක්ඛයගාමිනියා. අයං වුච්චති බ්‍රාහ්මණ පඤ්ඤාසම්පදා.

බමුණ, යම් පරිදි මහත් තඩාගයෙක සතර අයමුව කෙනෙක් හා සතර අවාමුව කෙනෙක් හා වේ නම් පුරුෂයෙක් ඒ තඩාගයා ගේ යම් අයමුව වෙත් නම් විවර කෙරෙයි, යම් අවාමුව වෙත් නම් වසාලයි. මෙසයත් මොනොවට වැසි දහර වස්වන්නේ ය. බමුණ, මෙසේ ඇති කල්හි ඒ මහාතඩාගයාගේ වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානිය නො වේ. බමුණ එපරිදි ම මෙසේ උපන් භොගයන් ගේ සිව් අයමුව කෙනෙක් වෙත්: ස්ත්‍රීධූර්ත නො වෙයි. ... කලණට නැඹුරු වූයේ වේ.

බමුණ, මේ සතර ධර්මයෝ කුලපුත්හුගේ දිට්ඨධම්යෙහි හිත පිණිස දිට්ඨධම්යෙහි සුව පිණිස පවතිත්.

බමුණ, මේ සතර දහම් කෙනෙක් කුල පුත්හු ගේ සම්පරාය හිත පිණිස සම්පරාය සුව පිණිස පවතිත්, කවර සතර දෙනෙක යත්: සද්ධා සම්පදය, සීලසම්පදය, චාග සම්පදය, පඤ්ඤාසම්පද යි.

5. බමුණ, සද්ධා සම්පද නම් කවර: බමුණ, මෙ ලොව්හි කුලපුත් සැදැහැතියේ වෙයි. තථාගතයන් ගේ බෝධිය හදහයි. මෙ කරුණෙනුදු ඒ හගවත්හු... දෙව්මිනිස්නට ශාස්තෘ හ, සිවුසස් පිළිවිදියහ, භගවත්හ, කියා යි. බමුණ, මෙ සද්ධාසම්පද යි කියනු ලැබෙයි.

6. බමුණ, සීල සම්පද නම් කවර: මෙ බමුණ, මෙ ලොව්හි කුලපුත් පණිවායෙන් වැළැකියේ වෙයි ... මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළැක්කේ වෙයි. බමුණ, මේ සීල සම්පද යි කියනු ලැබෙයි.

7. බමුණ, චාගසම්පද නම් කවර බමුණ, මෙ ලොව්හි කුලපුත් පහ වූ මසුරු මල ඇති සිතින් යුතුව මුදු ලූ ත්‍යාග ඇතියේ, දෙවූ අත් ඇතියේ ව්‍යවසර්ගයෙහි (දනයෙහි) ඇලුනේ යදනට සුදුසු වූයේ දනසංවිභාගයෙහි ඇලුනේ ගිහි ගෙයි වෙසෙයි. බමුණ, මේ චාග-සම්පද යි කියනු ලැබෙයි.

8. බමුණ, පඤ්ඤාසම්පද නම් කවර: බමුණ, මෙ ලොව්හි කුල පුත්... මැනැවින් දුඃඛක්ෂයට යන සුලු නුවණින් පැන ඇත්තේ වෙයි. බමුණ, මේ පඤ්ඤාසම්පද යි කියනු ලැබේ,

ඉමෙ ඛො බ්‍රාහ්මණ, චත්තාරො ධම්මා කුලපුත්තස්ස සම්පරායහිතාය සංවත්තන්ති සම්පරායසුඛායාති.

1. උට්ඨාතා කම්මධෙය්‍යෙසු අප්පමත්තො විධානවා,
සමං කප්පෙති ජීවිකං සම්භතං අනුරක්ඛති.

2. සද්ධො සීලෙන සම්පන්නො වදඤ්ඤූ වීතමච්ඡරො,
නිච්චං ධම්මං විසොධෙති සොත්ථානං සම්පරායිකං.

3. ඉච්චෙතෙ අට්ඨ ධම්මා ච සද්ධස්ස ඝරමෙසිනො,
අක්ඛාතා සච්චනාමෙන උභයත්ථ සුඛාවහා.

4. දිට්ඨධම්මහිතත්ථාය සම්පරායසුඛාය ච,
එවමෙතං ගහට්ඨානං චාගො පුඤ්ඤං පවඩ්ඪතී ති.

## 8. 2. 6. 6

## කාමාධිවචන සුත්තං

[සාවත්ථිනිදානං]

භයන්ති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, දුක්ඛන්ති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, රොගොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, ගණ්ඩොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, සල්ලන්ති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, සඞ්ගොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං පඞ්කොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං. ගබ්භොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං

කස්මා ච භික්ඛවෙ, භයන්ති කාමානමෙතං අධිවචනං: යස්මා ච කාමරාගරත්තායං භික්ඛවෙ, ඡන්දරාගවිනිබද්ධො දිට්ඨධම්මිකාපි භයා න පරිමුච්චති, සම්පරායිකාපි භයා න පරිමුච්චති, තස්මා භයන්ති කාමානමෙතං අධිවචනං.

කස්මා ච භික්ඛවෙ, දුක්ඛන්ති -පෙ- රොගොති -පෙ- ගණ්ඩොති-පෙ- සල්ලන්ති -පෙ-සඞ්ගොති -පෙ- පඞ්කොති-පෙ-ගබ්භොති කාමානමෙතං අධිවචනං;

බමුණ, මේ සතර දහම්හු කුල පුත්හු ගේ සම්පරාය හිත පිණිස සම්පරාය සුව පිණිස පවත්නා හයි.

1. කර්මාන්ත කරන තන්හි උත්සාහවියෑ ඇත්තේ අප්‍රමත්ත වූයේ විධාන ඇත්තේ සමදිවි ගෙවයි. ඉපයූ දැ දරන්නේ ය.

2. සැදැහැතියේ සිල් සපන් වූයේ යැදියන්ගේ වදන් දන්නේ පහ වූ මසුරු මල ඇතියේ සම්පරායට හිත වූ සුබදයක මාර්ගය නිතර පිරිසිදු කෙරෙයි.

3. මෙසේ තෙල අටදහම් හු සැදැහැති ගිහිහුගේ දෙලෝ සුව එළවන්නාහ යි සත්‍ය වූ නම් ඇති බුදුන් විසින් පවසන ලදහ.

4. දිටුදැමියෙහි හිත පිණිස පරලොව සැප පිණිස ත්‍යාගය ගැහැවියන්ගේ තෙල පින මෙසේ වඩන්නේ යයි.

## 8. 2. 6. 6

## කාමාධිවචන සූත්‍රය

මහණෙනි, භය යන මෙය කාමයනට නමෙකි. මහණෙනි දුක්ඛ යන මෙය කාමයනට නමෙකි. මහණෙනි, රොග යන මෙය කාමයනට නමෙකි. මහණෙනි, ගණ්ඩ යන මෙය කාමයනට නමෙකි. මහණෙනි, සල්ල යන මෙය කාමයනට නමෙකි. මහණෙනි, සඞ්ග යන මෙය කාමයනට නමෙකි. මහණෙනි, පඞ්ක යන මෙය කාමයනට නමෙකි. මහණෙනි, ගබ්භ යන මෙය කාමයනට නමෙකි,

මහණෙනි, කවර හෙයින් භය යන මෙය කාමයනට නම් වේ ද යත්: මහණෙනි, යම් කරුණෙකින් කාමරාගයෙන් රත්වූ ඡන්දරාගයෙන් බැඳුණු මෙ දුඃඛල් දිටුදැමියෙහි බියෙනුදු නො මිදෙයි. පරලොවහි බියෙනුදු නොමිදේ. එහෙයින් භය යන මෙය කාමයනට නමෙකි.

මහණෙනි, කවර හෙයින් දුක්ඛ යන ... රොග යන ... ගණ්ඩ යන ... සල්ල යන ...සඞ්ග යන ... ගබ්භ යන මෙය කාමයනට නම් වේ ද, යත්:

යස්මා ච කාමරාගරත්තායං භික්ඛවෙ, ඡන්දරාගවිනිබද්ධො දිට්ඨ-ධම්මිකාපි ගබ්භා න පරිමුච්චති, සම්පරායිකාපි ගබ්භා න පරිමුච්චති. තස්මා ගබ්භොති කාමානමෙතං අධිවචනං.

1. භයං දුක්ඛඤ්ච රොගො ච ගණ්ඩො සල්ලඤ්ච සඞ්ගො ච,
පඞ්කො ගබ්භො ච උභයං එතෙ කාමා පවුච්චන්ති,
යත්ථ සත්තො පුථුජ්ජනො.

2. ඔතිණ්ණො සාතරූපෙන පුනගබ්භාය ගච්ඡති,
යතො ච භික්ඛු ආතාපී සම්පජඤ්ඤං න රිඤ්චති[1]

3. සො ඉමං පලිපං දුග්ගං අතික්කම්ම තථාවිධො,
පජං ජාති ජරූපෙතං ඵන්දමානං අවෙක්ඛතීති.

## 8. 2. 6. 7

## පඨම ආහුනෙය්‍යභික්ඛු සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස, කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු සීලවා හොති-පෙ-සමාදාය සික්ඛති සික්ඛා-පදෙසු, බහුස්සුතො හොති-පෙ දිට්ඨියා සුප්පටිවිද්ධො. කල්‍යාණමිත්තො හොති, කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො. සම්මාදිට්ඨිකො හොති. සම්මාදස්සනෙන සමන්නාගතො. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති. අකිච්ඡලාභී අකසිරලාභී. අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං. එකම්පි ජාතිං ද්වෙපි ජාතියො-පෙ-ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන - පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

1. විවෙචති - සීමු.

මහණෙනි, යම් හෙයකින් කාමරාගයෙන් රත් වූ ඡන්දරාගයෙන් බැඳුණු මෙ පුහුල් දිටුදැමි ගැබිනුදු නො මීදේ, පරලෝ ගැබිනුදු නො මිදේ. එහෙයින් ගබ්භ යන මෙය කාමයනට නමෙකි.

1. භය ද දුක්ඛ ද රොග ද ගණ්ඩ ද සල්ල ද සඞ්ග ද පඞ්ක හා ගබ්භ යන මේ දෙදෙන දැයි යනු මොහු කාමය යයි කියනු ලැබෙත්. යම් තැනෙක පුහුදුන් සත්ත්ව තෙමේ ඇලුනේ ද එහෙයිනි.

2. සුඛස්වරූපයෙන් (කාම සුඛයෙන්) අවතීර්ණ වූයේ යළි (පුනර්භව සඞ්ඛ්‍යාත) ගර්භයට යෙයි. යම් කලෙක පටන් කෙලෙස් නවන වැර ඇති මහණ සම්ප්‍රජ්ඥතය නො හරි ද–

3. එබඳු හේ මෙ දුර්ගී වූ පලිපය (සංසාර නැමැති මහමඩවළ) ඉක්මවා ජාති ජරායෙන් යුත් (තුන් භවයෙහි) සැලෙන ප්‍රජාව (විදසුන් නැණින්) දක්නේ යයි.

## 8. 2. 6. 7

## පඨම ආහුනෙය්‍ය භික්ඛු සූත්‍රය

[සැවත්නිදන යි]

මහණෙනි, දහම් අටෙකින් යුතු මහණ සිවුපසය පිළිගැනීමට සුදුසු වෙයි, ආගන්තුක දනාදියට සුදුසු වෙයි. පරලොව අදහා දෙන දනයට සුදුසු වෙයි, ඇඳිලිබැඳීමට සුදුසු වෙයි, ලොවට අසදෘශ පුණ්‍යක්ෂෙත්‍ර වේ.

කවර අටෙකින යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි....සමාදන් කොට ගෙන සික පදයන් හි හික්මෙයි, බහුශ්‍රැත වෙයි ... දෘෂ්ටි (ප්‍රඥ) යෙන් මොනොවට පිළිවිදියේ වෙයි, කල්‍යාණ සහායයන් ඇත්තේ කල්‍යාණයනට නැඹුරු වූයේ කල්‍යාණ මිත්‍ර වෙයි, සම්‍යක් දර්ශන-යෙන් සමන්වාගත වූයේ සම්‍යක්දෘෂ්ටික වෙයි, ඉහාත්මයෙහි සුඛ විහරණ ඇති අධිචිත්තයෙහි උපන් සිවුදැහැන් කැමැති සේ ලබන ලුසු වූයේ සුවසේ ලබන සුලු වූයේ විපුලසේ ලබන සුලු වූයේ වෙයි, අනෙකවිධ වූ පූර්නිවාසය සිහි කරන්නේ ය. කෙසේ ය යත්: එක් දැයකුදු දෙ දැයකුදු ... මෙසේ ආකාර සහිත වූ උදෙස සහිත වූ නන් වැදෑරුම් පූර්නිවාසය සිහි කරයි. විශුද්ධ වූ මිනිසැස ඉක්ම පවත්නා දිවැසින් ... කම් වූ පරිදි පරලොව ගිය සත්ත්වයන් දක්නේය. ආස්‍රවක්ෂයයෙන් ... ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වෙසේ. මහණෙනි, මේ අට දහමින් සමන්වාගත වූ මහණ ආහුනෙය්‍ය වෙයි. ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙ යයි.

## 8. 2. 6. 8

## දුතියාහුනෙය්‍යභික්ඛු සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි අට්ඨහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති.-පෙ-සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා. ආරද්ධවිරියො විහරති ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. ආරඤ්ඤිකො හොති පන්ත-සෙනාසනො. අරතිරති සහො හොති, උප්පන්නං අරතිං අභිභුය්‍ය අභිභුය්‍ය විහරති. භයභෙරවසහො හොති, උප්පන්නං භයභෙරවං අභිභුය්‍ය අභිභුය්‍ය විහරති. චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානං ඛයා -පෙ සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 8. 2. 6. 9

## පඨම අට්ඨපුග්ගල සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ අට්ඨ:

සොතාපන්නො සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො' සකදාගාමී සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, අනාගාමී අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, අරහා අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නො. ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨපුග්ගලා ආහුනෙය්‍යා -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

1. චත්තාරො ච පටිපන්නා චත්තාරො ච ඵලෙ ඨිතා,
   එස සඞ්ඝො උජුභූතො පඤ්ඤාසීලසමාහිතො.

2. යජමානානං මනුස්සානං පුඤ්ඤපෙක්ඛානපාණිනං[1]
   කරොතං ඔපධිකං පුඤ්ඤං සඞ්ඝෙ දින්නං මහප්ඵලන්ති.

---

1. පුඤ්ඤපෙමාන පාණිනං–කට්ඨි

## 8. 2. 6. 8

## දෙවැනි ආහුනෙය්‍ය භික්ඛු සූත්‍රය

[සැවත්නිදන යි]

8. මහණෙනි, අටදහමෙකින් සමන්වාගත මහණ ... ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වෙයි. කවර අටෙකින යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ සිල්වත් වෙයි ... සමාදන් කොට ගෙන සිකපදයන්හි හික්මෙයි, බහුශ්‍රැත වෙයි ... දෘෂ්ටියෙන් මොනොවට පිළිපිදියෙ වෙයි, ඇරඹූ වැර ඇතියේ වීර්‍ය්‍යස්ථාමයෙන් යුක්ත වූයේ දළ පැරකුම් ඇතියේ කුශල ධර්මයන් කෙරෙහි නො බහා තැබූ වීර්‍ය්‍යධුර ඇතියේ වෙසෙයි: ප්‍රාන්ත ශයනාසන ඇතියේ ආරණ්‍යක වෙයි, අරති හා රති හා ඉවසනුයේ වෙයි, උපන් අරතිය මැඩ මැඩ වෙසේ, භය හා භෛරව හා ඉවසනුයේ උපන් අරතිය මැඩ මැඩ වෙසේ, අධිචිත්තයෙහි උපන් දිවුදුහැමියෙහි සුඛ විහරණ වූ සතර ධ්‍යානයන් කැමතිසේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුලසේ ලබනුයේ වෙයි. ආස්‍රවක්ෂයයෙන්... පසක් කොට එයට එළඹ වාසය කරයි මහණෙනි, මේ අට කරුණින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි ... ලොකයට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වේ.

## 8. 2. 6. 9

## ප්‍රථම අට්ඨපුග්ගල සූත්‍රය

[සැවත්නිදන යි]

මහණෙනි, මේ අෂ්ට පුද්ගලයෝ ආහුනෙය්‍ය වෙත්, පාහුනෙය්‍ය වෙත්, දක්ඛිණෙය්‍ය වෙත්, අඤ්ජලිකරණීය වෙත්, ලෝකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙත්. කවර අටදෙනෙක යත්:

සෝතාපන්නය, සෝවන් ඵල පසක් කිරීමට පිළිපන්නෝ ය, සකදගාමීය, සකදගාමීඵල පසක් කිරීමට පිළිපන්නෝ ය, අනාගාමී ය, අනාගාමීඵල පසක් කිරීමට පිළිපන්නෝ ය. රහත් ය, රහත්ඵල පසක් කිරීමට පිළිපන්නෝ යි. මහණෙනි, මෙ අෂ්ට පුද්ගලයෝ ආහුනෙය්‍ය වෙති ... ලොකයට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වෙත්.

1. සතර මඟට පිළිපන්නාහු ය, සතර ඵලයෙහි සිටියහ යන මෙල සඞ්ඝ තෙමේ ඍජු වූයේ ප්‍රඥ ශීල සමාධියෙන් යුක්ත වූයේ ය.

2. දන් දෙන මිනිස්නට පින් කැමති ප්‍රාණීන්හට උපධිවිපාක ඇති (ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයෙන් සැප විපාක දෙන) පින් කරනුවනට සඞ්ඝයා කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වෙයි.

## 8. 2. 6. 10

## දුතිය අට්ඨපුග්ගල සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ, පුග්ගලා ආහුනෙය්‍යා–පෙ–අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ අට්ඨ: සොතාපන්නො සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නො -පෙ- අරහා අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නො. ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨපුග්ගලා ආහුනෙය්‍යා–පෙ–අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

1. චත්තාරො ච පටිපන්නා චත්තාරො ච ඵලෙ ඨිතා,
   එස සඞ්ඝො සමුක්කට්ඨො සත්තානං අට්ඨපුග්ගලා.

2. යජමානානං මනුස්සානං පුඤ්ඤපෙක්ඛාන පාණිනං,
   කරොතං ඔපධිකං පුඤ්ඤං එත්ථ දින්නං මහප්ඵලන්ති.

ගොතමීවග්ගො ඡට්ඨො.

තස්සුද්දානං:

ගොතමී ඔවාදං සංඛිත්තං දීඝජාණුව උජ්ජයො,
භයං ද්වෙ ආහුනෙය්‍යා ච ද්වෙ ච අට්ඨපුග්ගලා ති.

## 8. 2. 6. 10
## ද්විතීය අට්ඨපුග්ගල සූත්‍රය

[සැවත්නිදනයි]

මහණෙනි, මේ පුද්ගලයෝ අටදෙනෙක් ආහුනෙය්‍ය වෙත්,... ලොකයට අනුත්තරපුණ්‍යක්ෂෙත්‍ර වෙත්. කවර අට දෙනෙක යත්: සොතාපන්න ය, සෝවන් ඵල පසක් කිරීමට පිළිපන්නෝ ය, සකදාගාමීය. සකදාගාමිඵල පසක් කිරීමට පිළිපන්නෝ ය; අනාගාමී ය, අනාගාමි ඵල පසක් කිරීමට පිළිපන්නෝ ය, රහත් ය, රහත්ඵල පසක් කිරීමට පිළිපන්නෝයි මහණෙනි, මේ පුද්ගලයෝ අට දෙන ආහුනෙය්‍ය වෙත් ... ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙත්.

1. මාර්ගයට පිළිපන් සතර දෙනෙක් ද ඵලයෙහි පිහිටි සත දෙනෙක් ද යන පුද්ගලයෝ අට දෙනෙක් වෙත්. සත්ත්වයනට මෙය උත්කෘෂ්ට සඞ්ඝ වෙයි.

2. දන් දෙන මිනිස්නට පින් කැමති සත්නට උපධිවිපාක ඇති පින් කරනුවනට මේ සඞ්ඝයා කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වේයයි.

**සවැනි ගෝතමී වර්ගය යි.**

**එහි උද්දනය:**

ගොතමී සූත්‍රය, ඔවාද සූත්‍රය, සඞ්ඛිත්ත (ගොතමීයො වාද) සූත්‍රය, දීඝජාණු (ව්‍යග්ඝපජ්ජ) සූත්‍ර ය, උජ්ජය සූත්‍ර ය, භය (කාමාදි වචන) සූත්‍ර ය, ආහුනෙය්‍ය සූත්‍ර දෙකය අට්ඨපුග්ගල සූත්‍ර දෙක දැයි සූත්‍ර දශයෙකි.

# 7. චාපාලවග්ගො

## 8. 2. 7. 1

## ලාභිච්ඡා සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ අට්ඨ:

1. ඉධ භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්තවුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො උට්ඨහති ඝටති වායමති ලාභාය. තස්ස උට්ඨහතො ඝටතො වායමතො ලාභාය ලාභො නුප්පජ්ජති, සො තෙන අලාභෙන සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. උට්ඨහති ඝටති වායමති ලාභාය. න ච ලාභී, සොචී ච පරිදෙවී ච චුතො ච සද්ධම්මා.

2. ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්ත-වුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො උට්ඨහති ඝටති වායමති ලාභාය, තස්ස උට්ඨහතො ඝටතො වායමතො ලාභාය ලාභො උප්පජ්ජති. සො තෙන ලාභෙන මජ්ජති පමජ්ජති පමාදමාපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු ඉච්ඡො විහරති ලාභාය, උට්ඨහති ඝටති වායමති ලාභාය ලාභී ච මදී ච පමාදී ච චුතො ච සද්ධම්මා.

3. ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්ත-වුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො න උට්ඨහති න ඝටති න වායමති ලාභාය, තස්ස අනුට්ඨහතො අඝටතො අවායමතො ලාභාය, ලාභො නුප්පජ්ජති. සො තෙන අලාභෙන සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු ඉච්ඡො විහරති ලාභාය, න උට්ඨහති න ඝටති න වායමති ලාභාය. න ච ලාභී සොචී ච පරිදෙවී ච චුතො ච සද්ධම්මා.

# 7. ව්‍යාපාලවර්ගය

## 8. 2. 7. 1

## ලාභිච්ඡා සූත්‍රය

මහණෙනි, ලොව්හි විද්‍යමාන මේ පුද්ගලයෝ අටදෙනෙක් ඇත. කවර අටදෙනෙක යත්:

1. මහණෙනි, මෙ සස්නෙහි ප්‍රකර්ෂ විවේකයට ගිය (කිසිවක්හි) අයත් පැවැතුම් නැතිව වෙසෙන (විදර්ශනා කම්මික) මහණහට ප්‍රත්‍යය ලාභය පිණිස ඉච්ඡායෙක් උපදී. හේ ලාභය පිණිස උත්සාහ වීර්‍ය්‍ය කරයි, සටයි, වැර කරයි. ලාභය සඳහා උත්සාහ වීර්‍ය්‍යය කරන සටනා කරන ව්‍යායාම කරන ඔහට ලාභය නූපදනේය. හේ ඒ අලාභයෙන් ශොක කරන්නේය; ක්ලාන්ත වෙයි; පරිදේවනා කරන්නේය, ළෙහි අත් පැහැරැ හඬනේය, සම්මෝහයට පැමිණේ. මහණෙනි, මෙ මහණ ලාභයට ඉච්ඡා ඇතිව වසයි, ලාභය පිණිස උත්සාහවීර්‍ය්‍ය කරයි, සටයි, වැයම් කරයි, (ඉච්ඡිතය) නො ලබන සුලු වූයේ ශොක කරනුයේ පරිදේවනා කරනුයේ සද්ධර්මයෙන් (විදර්ශනායෙන්) ච්‍යුත වූයේ යි කියනු ලැබේ.

2. මහණෙනි, මෙ සස්නෙහි ප්‍රවිවික්තව වෙසෙන අයත් පැවතුම් නැති මහණහට ලාභයට ඉච්ඡායෙක් උපදනේ ය. හේ ලාභය පිණිස උත්සාහ වීර්‍ය්‍ය කරයි, සටයි, ව්‍යායාම කරයි. උත්සාහවීර්‍ය්‍ය කරන සටන ව්‍යායාම කරන ඔහට ලාභය උපදනේ ය. හේ ඒ ලාභයෙන් මත්-වෙයි, ප්‍රමත්ත වෙයි, ප්‍රමාදයට පැමිණෙයි. මහණෙනි, මේ මහණ ලාභයට ඉච්ඡා ඇතියේ වෙසේ. ලාභයට උත්සාහ වීර්‍ය්‍ය කරයි, සටයි, වැයම් කරයි. ලාභි වූයේත් මදැතියේත් ප්‍රමාදී වූයේත් සද්ධර්මයෙන් ච්‍යුත වූයේත් වී යයි කියනු ලැබේ.

3. මහණෙනි, මෙ සස්නෙහි ප්‍රවිවික්ත ව වසන අයත් නැති පැවතුම් ඇති මහණහට ලාභය පිණිස ඉච්ඡායෙක් උපදනේ ය. හේ ලාභය පිණිස උත්සාහ වීර්‍ය්‍ය නො කරයි. නො සටයි, ව්‍යායාම නො කරයි. ලාභය පිණිස වැර නො කරන සටනා නො කරන ව්‍යායාම නො කරන ඔහට ලාභය නූපදනේ ය. හේ එ අලාභයෙන් ශෝක කරයි, ක්ලාන්ත වෙයි, පරිදෙවනා කරයි, ළෙහි අත් පැහැරැ හඬයි, සම්මෝහයට පැමිණේ. මහණෙනි, මේ මහණ ලාභයට ඉච්ඡා ඇතියේ වෙසේ. උත්සාහ වීර්‍ය්‍ය නො කරයි, නො සටයි, ව්‍යායාම නො කරයි. නො ද (ඉච්ඡිතය) ලබන සුලුයේ ශොක කරනුයේ ද පරිදෙවනා කරනුයේ ද සද්ධර්මයෙන් ච්‍යුත වූයේ ද වේ යයි කියනු ලැබේ.

4. ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්ත-වුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො න උට්ඨහති න ඝටති න වායමති ලාභාය. තස්ස අනුට්ඨහතො අඝටතො අවායමතො ලාභාය ලාභො උප්පජ්ජති. සො තෙන ලාභෙන මජ්ජති පමජ්ජති පමාදමාපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු ඉච්ඡො විහරති ලාභාය න උට්ඨහති න ඝටති න වායමති ලාභාය, ලාභී ච මදී ච පමාදී ච චුතො ච සද්ධම්මා.

5. ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්ත-වුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො උට්ඨහති ඝටති වායමති ලාභාය. තස්ස උට්ඨහතො ඝටතො වායමතො ලාභාය ලාභො නුප්පජ්ජති. සො තෙන අලාභෙන න සොචති න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. උට්ඨහති ඝටති වායමති ලාභාය, න ච ලාභී න ච සොචී න ච පරිදෙවී අච්චුතො ච සද්ධම්මා.

6. ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්ත-වුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො උට්ඨහති ඝටති වායමති ලාභාය. තස්ස උට්ඨහතො ඝටතො වායමතො ලාභාය ලාභො උප්පජ්ජති. සො තෙන ලාභෙන න මජ්ජති, න පමජ්ජති, න පමාදමාපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ඉච්ඡො විහරති ලාභාය, උට්ඨහති ඝටති වායමති ලාභාය, ලාභී ච න ච මදී ච නච පමාදී අච්චුතො ච සද්ධම්මා.

7. ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්ත-වුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො න උට්ඨහති න ඝටති න වායමති ලාභාය. තස්ස අනුට්ඨහතො අඝටතො න වායමතො ලාභාය ලාභො නුප්පජ්ජති. සො තෙන අලාභෙන න සොචති න කිලමති න පරිදෙවති, න උරත්තාළිංකන්දති, න සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ඉච්ඡො විහරති ලාභාය, න උට්ඨහති න ඝටති න වායමති ලාභාය, න ච ලාභී, න ච සොචී, න ච පරිදෙවී අච්චුතො ච සද්ධම්මා.

4. මහණෙනි, මෙ සස්නෙහි ප්‍රවිවික්ත ව වසන අයත් පැවතුම් නැති ව වෙසෙන මහණහට ලාභයට ඉච්ඡායෙක් උපදනේ ය. හේ ලාභයට උත්‍ථානවීර්‍ය්‍ය නො කරයි. නො සටයි. ව්‍යායාම නො කරයි. ලාභය පිණිස උත්‍ථානවීර්‍ය්‍ය නො කරන නො සටන ව්‍යායාම නො කරන ඔහට ලාභය උපදනේ ය. හේ ඒ ලාභයෙන් මත් වෙයි. ප්‍රමත්ත වෙයි. ප්‍රමාදයට යෙයි. මහණෙනි, මේ මහණ ලාභයට ඉච්ඡා ඇතිවැ වෙසෙයි. උත්‍ථානවීර්‍ය්‍ය නො කරයි. නො සටයි. ව්‍යායාම නො කරයි. ලාභී වූයේත් මදනියේ ද ප්‍රමාදී ද සද්ධර්මයෙන් හුණුයේ ද යි කියනු ලැබේ.

5. මහණෙනි, මෙ සස්නෙහි ප්‍රවිවික්ත ව වෙසෙන අයත් පැවතුම් නැති මහණහට ලාභයට ඉච්ඡායෙක් උපදනේ ය. හේ ලාභය පිණිස උත්‍ථාන වීර්‍ය්‍ය කරයි, සටයි, ව්‍යායාම කරයි, ලාභය පිණිස උත්‍ථානවීර්‍ය්‍ය කරන සටනා කරන වැයම් කරන ඔහට ලාභය නුපදනේ ය. හේ අලාභයෙන් ශොක නො කරයි, ක්ලාන්ත නො වෙයි, පරිදේවනා නො කරයි. ළෙහි පැහැර නො හඬයි, සම්මොහයට නො යේ. මහණෙනි, මේ මහණ ලාභයට ඉච්ඡා ඇති වැ වෙසේ. ලාභය පිණිස උත්‍ථාන වීර්‍ය්‍ය කෙරේ. සටනා කෙරේ. ව්‍යායාම කෙරේ. ලාභී නො වූයේ ශෝක නො කරනුයේ යයි ද, පරිදේවනා නො කරන සුලුයේ යයි ද, සද්ධර්මයෙන් ච්‍යුත නො වූයේ යයි ද කියනු ලැබේ.

6. මහණෙනි, මෙ සස්නෙහි ප්‍රවිවික්ත ව වෙසෙන අයත් පැවතුම් නැති මහණහට ලාභය පිණිස ඉච්ඡා උපදනේ ය. හේ ලාභය පිණිස උත්‍ථාන කරයි. සටයි. වැයම් කරයි. ලාභය පිණිස උත්‍ථාන කරන සටනා කරන ව්‍යායාම කරන ඔහට ලාභය උපදනේ ය. හේ ලාභයෙන් මත් නො වෙයි, ප්‍රමත්ත නො වෙයි. ප්‍රමාදයට නො යෙයි, මහණෙනි, මේ මහණ ලාභයට ඉච්ඡා ඇතියේ වෙසේ, ලාභය පිණිස උත්‍ථාන කෙරේ, සටනා කෙරේ, ව්‍යායාම කෙරේ. ලාභී වූයෙත් මද නැතියේ යයි ද ප්‍රමාද නැතියේ යයි ද සද්ධර්මයෙන් අච්‍යුත යයි ද කියනු ලැබේ.

7. මහණෙනි, මෙ සස්නෙහි ප්‍රවිවික්ත ව වෙසෙන අයත් පැවතුම් නැති මහණහට ලාභය පිණිස ඉච්ඡා උපදනේ ය. හේ ලාභය පිණිස උත්‍ථාන නො කරයි. සටනා නො කරයි. ව්‍යායාම නො කරයි. ලාභය පිණිස උත්‍ථාන නො කරන, සටනා නො කරන, ව්‍යායාම නො කරන ඔහට ලාභය නුපදනේ ය. හේ ඒ අලාභයෙන් ශොක නො කරයි. ක්ලාන්ත නො වෙයි. පරිදෙවනා නො කරයි. ළය තළමින් නො හඬයි. සම්මොහයට නො යේ. මහණෙනි, මෙ මහණ ලාභය පිණිස ඉච්ඡා ඇතියේ වෙසේ. උත්‍ථාන නො කෙරේ. සටනා නො කෙරේ, ව්‍යායාම නො කෙරේ. ලාභී නො වූයේත් ශොක නො කරන සුලුයේ යයි ද පරිදේවනා නො-කරන සුලු යයි ද සද්ධර්මයෙන් අච්‍යුත යයි ද කියනු ලැබේ.

8. ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්තවුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය, සො න උට්ඨහති න සටති න වායමති ලාභාය. තස්ස අනුට්ඨහතො අසටතො න වායමතො ලාභාය ලාභො උප්පජ්ජති. සො තෙන ලාභෙන න මජ්ජති න පමජ්ජති. න පමාදමාපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු ඉච්ඡො විහරති ලාභාය, න උට්ඨහති න සටති න වායමති ලාභාය. ලාභී ච න ච මදී න ච පමාදී අචුතො ච සද්ධම්මා.

ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 8. 2. 7. 2

## අලං සුත්තං

**[සාවත්ථිනිදානං]**

1. ඡහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, අලං පරෙසං. කතමෙහි ඡහි:

ඉධ භික්ඛවෙ භික්ඛු ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු, සුතානං ධම්මානං ධාරණජාතිකො හොති, ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති, අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති, කල්‍යාණවාචො ච හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං.

8. මහණෙනි, මෙ සස්නයෙහි ප්‍රවිවික්ත ව වෙසෙන අයත් පැවතුම් නැති මහණහට ලාභය පිණිස ඉච්ඡා උපදනේ ය. හේ ලාභය පිණිස උත්‍ථාන නො කරයි, නො සටයි, ව්‍යායාම නො කරයි. ලාභය පිණිස උත්‍ථාන නො කරන, සටනා නො කරන, ව්‍යායාම නො කරන ඔහට ලාභය උපදනේ ය. හේ ඒ ලාභයෙන් මත් නො වෙයි, පමා නො වෙයි, ප්‍රමාදයට නො යෙයි. මහණෙනි, මේ මහණ ලාභය පිණිස ඉච්ඡා ඇතියේ වෙසේ, ලාභය පිණිස උත්‍ථාන නො කෙරේ, සටනා නො කෙරේ, ව්‍යායාම නො කෙරේ, ලාභී වූයේත් මද නැතියේ යයි ද ප්‍රමද නැතියේ යයි ද සද්ධර්මයෙන් අච්‍යුත යයි ද කියනු ලැබෙ.

මහණෙනි, මේ ලෝකයෙහි විද්‍යාමාන පුද්ගලයෝ අට දෙන වෙත්. යයි,

## 8. 2. 7. 2

## අලං සූත්‍රය

[සැවැත්නිදන යි]

1. මහණෙනි, කරුණු සයෙකින් සමන්‍වාගත මහණ තමහට (හිත ප්‍රතිපත්තියෙහිලා) සුදුසු වෙයි, පරහට (හිත ප්‍රතිපත්තියෙහිලා) සුදුසු වෙයි. කවර සයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ (ස්කන්‍ධ, ධාතු, ආයතනාදි) කුශල ධර්මයන්හි වහා උපධාරණ කරන්නේත් වෙයි, ඇසූ දහමුන් දරන සැහැවි ඇත්තේත් වෙයි, දරූ දහමුන්ගෙ අරුත් විමසනුයේත් වෙයි, අරුත් දන පෙළ දහම් දන ධර්මානු ධර්මයට පිළිපන්නේත් වෙයි, සුන්‍දර වාග්ඝොෂ ඇතියේ නො පැකුළුණු නිදෙස් නො ගිලිහුණු අර්‍ථ විඥපන-යෙන් යුත් පිරිපුන් තෙපුලින් සමන්‍වාගත වූයේ කල්‍යාණ කථා ඇතියේ වෙයි, සබ්‍රම් සරුනට සමාදන් කරනුයේ සමුත්තෙජනා කරනුයේ සම්ප්‍ර-හර්‍ෂණ කරනුයේ කරුණු දක්වනුයේත් වෙයි. මහණෙනි, මෙ ස කරුණින් සමන්වාගත මහණ තමහට (හිත ප්‍රතිපත්ති පිණිස) සුදුසු වෙයි, පරහට (හිත ප්‍රතිපත්ති පිණිස) සුදුසු වෙ.

2. පඤ්චහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො අලං පරෙසං. කතමෙහි පඤ්චහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු. සුතානඤ්ච ධම්මානං ධාරණජාතිකො හොති, ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති, අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති, කල්‍යාණවාචො හොති -පෙ- අත්ථස්ස විඤ්ඤාපනියා, සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, අලං පරෙසං.

3. චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං. කතමෙහි චතූහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු. සුතානඤ්ච ධම්මානං ධාරණජාතිකො හොති, ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති, අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති. නො ච කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා, නො ච සන්දස්සකො හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං.

4. චතූහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං, නාලං අත්තනො. කතමෙහි චතූහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු. සුතානඤ්ච ධම්මානං ධාරණජාතිකො හොති, නො ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති, න ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, කල්‍යාණවාචො ච හොති කල්‍යාණවාක්කරණො -පෙ- අත්ථස්ස විඤ්ඤාපනියා සන්දස්සකො ච හොති -පෙ- සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො භික්ඛවෙ, චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං, නාලං අත්තනො.

2. මහණෙනි, කරුණු පසෙකින් සමන්වාගත වූ මහණ තමහට සුදුසු වෙයි, පරහට සුදුසු වෙයි. කවර පසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කුසල ධර්මයන්හි වහා උපධාරණ කරනුයේ නො ම වෙයි. ඇසූ දහම් දරන සැහැවි ඇතියේ වෙයි, දරූ දහමුන්ගේ අරුත් විමසා දන්නේත් වෙයි, අටුවා දැන, පෙළ දහම් දැන ධර්මානුධර්මයෙහි පිළිපන්නේත් වෙයි අභිවිඥපනයට හිත වූ ... කල්‍යාණකථා ඇතියේ වෙයි, සබ්‍රම්සරුනට සමාදන් කරනුයේ සමුත්තෙජනා කරනුයේ සම්ප්‍රහර්ෂණ කරනුයේ සන්‍දර්ශක ද වෙයි. මහණෙනි, මේ දහම් පසින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි, පරහට සුදුසු වේ.

3. මහණෙනි, සිවු කරුණෙකින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි. පරහට සුදුසු නො වේ. කවර සතරෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කුශල ධර්මයන්හි ඛිප්පනිසන්තී ද වෙයි. ඇසූ දහමුන් දරන සැහැවි ඇතියේත් වෙයි. දරූ දහමුන්ගේ අරුත් විමසනුයේත් වෙයි. අටුවා දැන පෙළ දම් දැන ධර්මානුධර්මයට පිළිපන්නේත් වෙයි. නො පැකුළුණු නිදොස් නො ගිලිහුණු, අරුත් හඟවන පිරුණු වදනින් සමන්වාගත වූයෙ කල්‍යාණ වාග්ඝොෂ ඇතියේ කල්‍යාණ කථා ඇත්තේ ද නො වෙයි. සබ්‍රම්සරුනට සමාදන් කරවන සමුත්තෙජන කරන සම්ප්‍රහර්ෂණ කරන සන්‍දර්ශක ද නො වෙයි. මහණෙනි, මේ සිවු කරුණින් සමන්වාගත මහණ තම හට සුදුසු වෙයි. පරහට සුදුසු නො වේ.

4. මහණෙනි, සතර කරුණෙකින් සමන්වාගත මහණ පරහට (හිත පිළිවෙත් පිණිස) සුදුසු වෙයි, තම හට (හිත පිළිවෙත් පිණිස) නො සුදුසු වෙයි. කවර සතරෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කුශල ධර්මයන්හි ඛිප්පනිසන්තී ද වෙයි. ඇසූ දහම් දරන සැහැවි ඇතියේ ද වෙයි, දරූ දහමුන්ගේ අරුත් විමසනුයේ නො වෙයි, අටුවා දැන පෙළ දම් දැන ධර්මානුධර්මයට පිළිපන්නේත් නො වෙයි, සොඳුරු වදන් ඇතියේ සුන්‍දර වාග් ඝොෂ ඇතියේ ... අරුත් හැඟවීමට සුදුසු තෙපුලින් සමන්වාගත වූයේ ... කල්‍යාණ කථා ඇතියේ වෙයි, සබ්‍රම්සරුනට සන්‍දර්ශක ද වෙයි. ... මහණෙනි, මේ සතර දහමින් සමන්වාගත මහණ පරහට සුදුසු වෙයි. තමහට සුදුසු නො වේ.

5. තීහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං. කතමෙහි තීහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු. සුතානඤ්ච ධම්මානං ධාරණජාතිකො හොති, ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති, අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති, නො ච කල්‍යාණවාචො හොති, කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා, නො ච සන්දස්සකො හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො භික්ඛවෙ, තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං.

6. තීහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං. නාලං අත්තනො[1] කතමෙහි තීහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු. සුතානඤ්ච ධම්මානං ධාරණජාතිකො හොති. නො ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති. නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. කල්‍යාණවාචො ච හොති -පෙ- අත්ථස්ස විඤ්ඤාපනියා. සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො භික්ඛවෙ, තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං., නාලං අත්තනො.[1]

7. ද්වීහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං,[2] කතමෙහි ද්වීහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති හොති කුසලෙසු ධම්මෙසු. නො ච සුතානං ධම්මානං ධාරණජාතිකො හොති. ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති. නො ච කල්‍යාණවාචො හොති -පෙ- අත්ථස්ස විඤ්ඤාපනියා නො ච සන්දස්සකො හොති -පෙ- සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං.[2]

1. නො අත්තනො–සීමු.
2. නො පරෙසං–සීමු.

5. මහණෙනි, දහම් තුනෙකින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි, පරහට සුදුසු නො වෙයි. කවර තුනෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති ද නො වෙයි, දූරූ දහමුන් දරන සැහැවි ඇතියේ ද වෙයි, දූරූ දහමුන්ගේ අරුත් පිරික්සනුයේ ද වෙයි, අරුත් දූන දහම් දූන ධර්මානුධර්මයෙහි පිළිපදනේත් වෙයි, කලණ තෙපුල් ඇතියේ අරුත් හැඟවීමට සුදුසු වූ වුහුවු නිදෙස් වූ නො ගිලිහුණු අරුත් ඇති අස්විඥපනයෙන් යුක්ත වූ සොඳුරු වචනයෙන් සමන්වාගත වූයේ කල්‍යාණවාක් ඇතියේ වෙයි. සබ්‍රම්සරුනට කරුණු සමාදන් කරවන, මොනොවට තෙද ගන්වන සම්ප්‍රහර්ෂණය කරන සංදර්ශකයෙක් ද නො වෙයි. මහණෙනි, මේ තුන් කරුණෙන් සමන්වාගත ව මහණ තමාට හිත පිණිස සුදුසු වෙයි, පරහට හිත පිණිස සුදුසු නො වෙයි.

6. මහණෙනි, කරුණු තුනෙකින් සමන්වාගත වූ මහණ මෙරමාහට සුදුසු වෙයි, තමහට සුදුසු නො වෙයි. කවර තුනෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති නො ම වෙයි. ඇසූ දහමුන් දරන සැහැවිද වෙ. දූරූ දහමුන්ගේ අරුත් පිරික්-සනුයේ වෙයි. අරුත් දූන දහම් දූන ධර්මානුධර්ම ප්‍රතිපත්තියට නො-පිළිපන්නේත් වෙයි ... අරුත් හැඟවීමට හිත ... කලණ වදන් ඇතියේත් වෙයි. සබ්‍රම්සරුනට සමාදන් කරවන, සමුත්තේජනා කරවන, සම්ප්‍රහර්ෂණය කරන සන්දර්ශකයෙක් ද වෙයි. මහණෙනි, මේ දහම් තුනෙන් සමන්වාගත මහණ මෙරමාහට යෝග්‍ය වෙයි, තමහට අයෝග්‍ය වෙයි.

7. මහණෙනි, කරුණු දෙකෙකින් සමන්වාගත මහණ තම හට සුදුසු වෙයි. පරහට සුදුසු නො වෙයි. කවර දෙකෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති නො වෙයි. ඇසූ දහම් දරන සැහැවි ඇතියේත් නො වෙයි. දූරූ දහමුන්ගේ අරුත් පිරික්සන්නේ වෙයි. අරුත් දූන දහම් දූන ධර්මානුධර්මයට පිළිපන්නේත් වෙයි. ... අරුත් හැඟැවීමට සුදුසු ... කලණ වදන් ඇතියේ නො වෙයි. සබ්‍රම්සරුනට සන්දර්ශක ද නො වෙයි. මහණෙනි, මේ දහම් දෙකින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි. පරහට සුදුසු නො වෙයි.

8. ද්වීහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලංපරෙසං, නාලං අත්තනො[1] කතමෙහි ද්වීහි:

ඉධ භික්ඛවෙ, භික්ඛු නහෙව ඛො ඛිප්පනිසන්ති හොති කුසලෙසු ධම්මෙසු. නො ච සුතානං ධම්මානං ධාරණජාතිකො හොති. නො ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති. නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. කල්‍යාණවාචො ච හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො භික්ඛවෙ, ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං, නාලං අත්තනොති.[1]

## 8. 2. 7. 3

## සංඛිත්තදෙසිත සුත්තං

**[සාවත්ථිනිදානං]**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු. යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

එවමෙව පනිධෙකච්චෙ මොඝපුරිසා මමඤ්ඤෙව අජ්ඣෙසන්ති. ධම්මෙ ච භාසිතෙ මමඤ්ඤෙව අනුබන්ධිතබ්බං මඤ්ඤන්ති.

දෙසෙතු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං, දෙසෙතු සුගතො සංඛිත්තෙන ධම්මං, අප්පෙවනාමාහං භගවතො භාසිතස්ස අත්ථං ආජානෙය්‍යං, අප්පෙවනාමාහං භගවතො භාසිතස්ස දායාදො අස්සන්ති.

1. නො අත්තනො-සිමු

8. මහණෙනි, දහම් දෙකෙකින් සමන්වාගත වූ මහණ පරහට සුදුසු වෙයි, තමහට සුදුසු නො වෙයි. කවර දෙකෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති නො ම වෙයි. ඇසූ දහමුන් දරන සැහැවි ඇතියේත් නො වෙයි. දරූ දහමුන්ගේ අරුත් පිරික්සනුයේත් නො වෙයි. අරුත් දැන දහම් දැන ධර්මානුධර්මයට පිළිපන්නේත් නො වෙයි. සුහුර කථා ඇතියේ වුහුටු නිදෙස් නො ගිලිහුණු අරුත් හඟවන සොඳුරු වදනින් සමන්වාගත වූයේ කලණ වදන් ඇතියේ වෙයි. සබ්‍රම්සරුනට සන්‍දශක වූයේ සමාදන් කරවන්නේ උත්තෙජනා කරන්නේ සම්ප්‍රහර්ෂණය කරන්නේ වෙයි. මහණෙනි, මේ දහම් දෙකින් සමන්වාගත මහණ පරහට සුදුසු ජීවයි. තම හට සුදුසු නො වේ යි.

## 8. 2. 7. 3

## සඩ්ඛිත්තදෙසිත සූත්‍රය

[සැවැත්නිදන යි]

එකල එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හින. එකත් පසෙක හුන් එ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා එකලා වූයෙම් සඞ්ඝනිකායෙන් දුරු වූයෙම් නො පමා වූයෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් නිවන් කෙරේ යැවූ සිත් ඇතියෙම වෙසෙම් නම භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් එ දහම් දෙසන සේක් නම් මැනැවැ යි.

මෙ ලොව්හි ඇතැම් හිස් පුහුලෝ මෙ ලෙසින් ම මට අධ්‍යෂණ කෙරෙත්. දහම් දෙසූ කල්හිත් මා ම ලුහුබැඳිය යුතු කොට හඟිත්.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් දම් දෙසන සේක්වා, සුගතයන් වහන්සේ සැකෙවින් දහම් දෙසන සේක්වා, භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයේ අර්ථය මම දැන ගන්නෙම් නම් මනා මැ නු: භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට මම දයාද වන්නෙම් නම් මනා මැ නු.

තස්මාතිහ තෙ භික්ඛු, එවං සික්ඛිතබ්බං: අජ්ඣත්තමෙව[1] චිත්තං ඨිතං භවිස්සති සුසණ්ඨිතං. න චුප්පන්නා[2] පාපකා අකුසලා ධම්මා චිත්තං පරියාදාය ඨස්සන්තීති. එවං හි තෙ භික්ඛු, සික්ඛිතබ්බං.

යතො ඛො තෙ භික්ඛු, අජ්ඣත්තං චිත්තං ඨිතං හොති සුසණ්ඨිතං, න චුප්පන්නා පාපකා අකුසලා ධම්මා චිත්තං පරියාදාය තිට්ඨන්ති, තතො තෙ භික්ඛු, එවං සික්ඛිතබ්බං: මෙත්තා මෙ චෙතොවිමුත්ති භාවිතා භවිස්සති බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධාති. එවං හි තෙ භික්ඛු, සික්ඛිතබ්බං.

යතො ඛො තෙ භික්ඛු, අයං සමාධි එවං භාවිතො හොති බහුලීකතො තතො ත්වං භික්ඛු, ඉමං සමාධිං සවිතක්කම්පි සවිචාරං[3] භාවෙය්‍යාසි. අවිතක්කම්පි විචාරමත්තං[4] භාවෙය්‍යාසි. අවිතක්කම්පි අවිචාරං[5] භාවෙය්‍යාසි. සප්පීතිකම්පි භාවෙය්‍යාසි, නිප්පීතිකම්පි භාවෙය්‍යාසි, සාතසහගතම්පි භාවෙය්‍යාසි උපෙක්ඛාසහගතම්පි භාවෙය්‍යාසි.

යතො ඛො තෙ භික්ඛු, අයං සමාධි එවං භාවිතො හොති සුභාවිතො, තතො තෙ භික්ඛු, එවං සික්ඛිතබ්බං: කරුණා මෙ චෙතොවිමුත්ති -පෙ- මුදිතා මෙ චෙතොවිමුත්ති -පෙ- උපෙක්ඛා මෙ චෙතොවිමුත්ති භාවිතා භවිස්සති බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධාති. එවං හි තෙ භික්ඛු, සික්ඛිතබ්බං.

යතො ඛො තෙ භික්ඛු අයං සමාධි එවං භාවිතො හොති සුභාවිතො, තතො ත්වං භික්ඛු, ඉමං සමාධිං සවිතක්කම්පි සවිචාරං භාවෙය්‍යාසි, අවිතක්කම්පි විචාරමත්තං භාවෙය්‍යාසි, අවිතක්කම්පි අවිචාරං භාවෙය්‍යාසි, සප්පීතිකම්පි භාවෙය්‍යාසි, නිප්පීතිකම්පි භාවෙය්‍යාසි, සාතසහගතම්පි භාවෙය්‍යාසි උපෙක්ඛාසහගතම්පි භාවෙය්‍යාසි.

1. අජ්ඣත්තං මෙ - මජසං
2. න ච උප්පන්නා - මජසං
3. සවිතක්කසවිචාරම්පි - මජසං
4. අවිතක්කවිචාරමත්තම්පි මජසං
5. අවිතක්කඅවිචාරම්පි - මජසං

මහණ, එ හෙයින් තොප මෙසේ හික්මිය යුතුය: මාගේ සිත මොනොවට පිහිටියේ අධ්‍යාත්මයෙහි ම සිටියෙක් වන්නේ ය. උපන් ලමු අකුශල ධර්මයෝ සිත මැඩ ගෙන නො ද සිටුනාහයි මහණ තොප මෙසේ ම හික්මිය යුතුය.

මහණ, යම් කලෙක තොපගේ සිත මනාව සිටියේ අධ්‍යාත්මයෙහි සිටියේ වේ ද, උපන් ලමු අකුශල ධර්මයෝත් සිත මැඩ ගෙන නො- සිටිනාහු ද, මහණ, එකල්හි තා විසින් මෙසේ හික්මිය යුතු: මාගේ මෛත්‍රීචිත්තවිමුක්ති තොමෝ භාවිත වූවා බහුලීකෘත වූවා යානාවක්මෙන් කරන ලද වූවා වාස්තුවක් මෙන් කෘත වූවා සුපිහිටි වූවා මනාසේ වඩන ලද වූවා සුසමාරබ්ධ වූවා වන්නීය කියා යි. මහණ තොප විසින් මෙසේ ම හික්මිය යුතු.

මහණ, යම් කලෙක තොප මේ සමාධිය මෙසේ වඩන ලද්දේ වේ ද බහුලීකෘත වේද, එකල්හි මහණ තොපි මේ සමාධිය සවිතර්ක කොට ද සවිචාර කොට ද වඩන්නහු, විචාරමාත්‍ර වූ අවිතර්ක කොට ද වඩන්නහු, අවිතර්ක කොට ද අවිචාර කොට ද වඩන්නහු, සප්‍රීතික කොට ද වඩන්නහු, නිෂ්ප්‍රීතික කොට ද වඩන්නහු, සුඛ සහගත කොට ද වඩන්නහු, උපෙක්ෂා සහගත කොට ද වඩන්නහුය.

මහණ, යම් කලෙක තොප විසින් මේ සමාධිය මෙසේ භාවිත වූයේ මොනවට වඩනා ලදුයේ වේ ද, මහණ, එ කල්හි තොප මෙසේ හික්මිය යුතු: මාගේ කරුණාචිත්ත විමුක්ති තොමෝ... මාගේ මුදිතාචිත්ත විමුක්ති තොමෝ... මාගේ උපේක්ෂා චිත්තවිමුක්ති තොමෝ භාවිත වූවා බහුලීකෘත වූවා යානීකෘත වූවා වස්තුකෘත වූවා අනුෂ්ඨිත වූවා පරිචිත වූවා සුසමාරබ්ධ වූවා වන්නී ය කියා යි. මහණ, තොප මෙසේ ම හික්මිය යුතු.

මහණ, යම් කලෙක තොප විසින් මේ සමාධිය මෙසේ භාවිත වූයේ බහුල කරන ලද්දේ වේ ද, මහණ, එකල තොපි මේ සමාධිය සවිතර්ක කොටත් සවිචාර කොටත් වඩනහු, අවිතර්ක විචාරමාත්‍ර කොටත් වඩනහු, අවිතර්ක අවිචාරමාත්‍ර කොටත් වඩනහු, සප්‍රීතික කොටත් වඩනහු, නිෂ්ප්‍රීතික කොටත් වඩනහු, සුඛසහගත කොටත් වඩනහු, උපෙක්ෂා සහගත කොටත් වඩනහුය,

යතො ඛො තෙ භික්ඛු, අයං සමාධි එවං භාවිතො හොති සුභාවිතො, තතො තෙ භික්ඛු, එවං සික්ඛිතබ්බං: කායෙ කායානුපස්සී විහරිස්සාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍යලොකෙ අභිජ්ඣාදොමනස්සන්ති. එවං හි තෙ භික්ඛු, සික්ඛිතබ්බං.

යතො ඛො තෙ භික්ඛු, අයං සමාධි එවං භාවිතො හොති බහුලීකතො තතො ත්වං භික්ඛු, ඉමං සමාධිං සවිතක්කම්පි සවිචාරං භාවෙය්‍යාසි, අවිතක්කම්පි විචාරමත්තං භාවෙය්‍යාසි, අවිතක්කම්පි අවිචාරං භාවෙය්‍යාසි, සප්පීතිකම්පි භාවෙය්‍යාසි, නිප්පීතිකම්පි භාවෙය්‍යාසි, සාතසහගතම්පි භාවෙය්‍යාසි, උපෙක්ඛා සහගතම්පි භාවෙය්‍යාසි.

යතො ඛො තෙ භික්ඛු, අයං සමාධි එවං භාවිතො හොති සුභාවිතො, තතො තෙ භික්ඛු, එවං සික්ඛිතබ්බං: වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරිස්සාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සන්ති. එවං හි තෙ භික්ඛු, සික්ඛිතබ්බං.

යතො ඛො තෙ භික්ඛු, අයං සමාධි එවං භාවිතො හොති බහුලීකතො, තතො ත්වං භික්ඛු, ඉමං සමාධිං සවිතක්කම්පි සවිචාරං භාවෙය්‍යාසි, අවිතක්කම්පි විචාරමත්තං භාවෙය්‍යාසි, අවිතක්කම්පි අවිචාරං භාවෙය්‍යාසි, සප්පීතිකම්පි භාවෙය්‍යාසි, නිප්පීතිකම්පි භාවෙය්‍යාසි, සාතසහගතම්පි භාවෙය්‍යාසි, උපෙක්ඛාසහගතම්පි භාවෙය්‍යාසි.

යතො ඛො තෙ භික්ඛු, අයං සමාධි එවං භාවිතො භවිස්සති සුභාවිතො, තතො ත්වං භික්ඛු, යෙන යෙනෙව ගච්ඡසි ඵාසුඤ්ඤෙව ගච්ඡසි. යත්‍ථ යත්‍ථ ඨස්සසි ඵාසුඤ්ඤෙව ඨස්සසි. යත්‍ථ යත්‍ථ නිසීදිස්සසි ඵාසුඤ්ඤෙව නිසීදිස්සසි. යත්‍ථ යත්‍ථ සෙය්‍යං කප්පෙස්සසි ඵාසුඤ්ඤෙව' සෙය්‍යං කප්පෙස්සසීති

මහණ, යම් කලෙක තා විසින් මේ සමාධිය මෙසේ වඩන ලද්දේ සුභාවිත වේ ද, මහණ, එ කල්හි තා විසින් මෙසේ හික්මිය යුතු: කයෙහි කය අනුව දක්නාසුලු වූයෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් සම්‍යග්ඥාන ඇතියෙම් සිහි ඇතියෙම් පඤ්චස්කන්ධ ලෝකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍යයන් මැඩගෙන වෙසෙන්නෙමි යි කියා යි. මහණ, තා විසින් මෙසේ ම හික්මිය යුතු:

මහණ, යම් කලෙක තා විසින් මේ සමාධිය මෙසේ වඩන ලද්දේ බහුලීකෘත වේ ද, මහණ තෝ එ කල්හි මේ සමාධිය සවිතර්ක සවිචාර කොටත් වඩනෙහි, අවිතර්ක විචාරමාත්‍ර කොටත් වඩනෙහි, අවිතර්ක අවිචාර කොටත් වඩනෙහි, සප්‍රීතික කොටත් වඩනෙහි, නිෂ්ප්‍රීතික කොටත් වඩනෙහි, සුඛ සහගත කොටත් වඩනෙහි, උපෙක්ෂා සහගත කොටත් වඩනෙහි.

මහණ, යම් කලෙක තා විසින් මේ සමාධිය මෙසේ වඩන ලද්දේ සුභාවිත වේ ද, මහණ එකල තා විසින් මෙසේ හික්මිය යුතු: වේදනා-වන්හි... චිත්තයෙහි... ධර්මයන්හි ධර්මානුදර්ශී වූයෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් මනා කොට දන්නෙම් සිහි ඇතියෙම් ලෙව්හි අභිධ්‍යා දෞර්මනස්‍යයන් මැඩගෙන වෙසෙන්නෙමි යි කියා යි. මහණ, තා විසින් මෙසේ ම හික්මිය යුතු.

මහණ, යම් කලෙක තා විසින් මේ සමාධිය මෙසේ වඩන ලද්දේ බහුලීකෘත වේ ද, මහණ, එකල තෝ මේ සමාධිය සවිතර්ක සවිචාර කොටත් වඩනෙහි, අවිතර්ක විචාරමාත්‍ර කොටත් වඩනෙහි, අවිතර්ක අවිචාර කොටත් වඩනෙහි, සප්‍රීතික කොටත් වඩනෙහි, නිෂ්ප්‍රීතික කොටත් වඩනෙහි, සුඛ සහගත කොටත් වඩනෙහි, උපෙක්ෂා සහගත කොටත් වඩනෙහි.

මහණ, යම් කලෙක තා විසින් මේ සමාධිය මෙසේ වඩනාලද්දේ සුභාවිත වේ ද, මහණ, එකල තෝ යම් යම් ම තැනෙක යෙහි නම් සුවසේ ම යෙහි, යම් යම් ම තැනෙක සිටුනෙහි නම් සුවසේ ම සිටුනෙහි. යම් යම් ම තැනෙක හිඳුනෙහි නම් සුවසේ ම හිඳුනෙහි, යම් යම් ම තැනෙක ශය්‍යා කෙරෙහි නම් සුවසේ ම ශය්‍යා කරන්නෙහි යි.

අථ ඛො සො භික්ඛු එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 8. 2. 7. 4

## අධිදෙවඤාණදස්සන සුත්තං

එකං සමයං භගවා ගයායං විහරති ගයාසීසෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

1. පුබ්බාහං භික්ඛවෙ, සම්බොධා අනභිසම්බුද්ධො බොධිසත්තොව සමානො ඔභාසඤ්ඤෙව ඛො[1] සඤ්ජානාමි, නො ච රූපානි පස්සාමි.

2. තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: සචෙ ඛො අහං ඔභාසඤ්චෙව සඤ්ජානෙය්‍යං, රූපානි ච පස්සෙය්‍යං, එවං මෙ ඉදං ඤාණදස්සනං පරිසුද්ධතරං අස්සාති. සො ඛො අහං භික්ඛවෙ, අපරෙන සමයෙන අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො ඔභාසඤ්චෙව සඤ්ජානාමි රූපානි ච පස්සාමි. නො ච ඛො තාහි දෙවතාහි සද්ධිං සන්තිට්ඨාමි, සල්ලපාමි, සාකච්ඡං සමාපජ්ජාමි.

3. තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: සචෙ ඛො අහං ඔභාසඤ්චෙව සඤ්ජානෙය්‍යං රූපානි ච පස්සෙය්‍යං තාහි ච දෙවතාහි සද්ධිං සන්තිට්ඨෙය්‍යං සල්ලපෙය්‍යං සාකච්ඡං සමාපජ්ජෙය්‍යං, එවං මෙ ඉදං ඤාණදස්සනං පරිසුද්ධතරං අස්සාති.

සො ඛො අහං භික්ඛවෙ, අපරෙන සමයෙන අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො ඔභාසඤ්චෙව සඤ්ජානාමි, රූපානි ච පස්සාමි, තාහි ච දෙවතාහි සද්ධිං සන්තිට්ඨාමි, සල්ලපාමි, සාකච්ඡං සමාපජ්ජාමි. නො ච ඛො තා දෙවතා ජානාමි, ඉමා දෙවතා අමුකම්හා වා අමුකම්හා වා දෙවනිකායාති.

---

1. ඔභාසං හි ඛො-සීමු

එකල්හි ඒ මහණ එකලා වූයේ සඞ්ඝනිකායෙන් දුරු වූයේ අප්‍රමත්ත වූයේ කෙලෙස් තවන වැර ඇතියේ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතිව වෙසෙනුයේ නොබෝ කලෙකින් ම කුලපුත්හු යමක් පිණිස මොනොවට ගිහිගෙන් නික්ම පැවිද්දට වදනාහු නම් ඒ අනුත්තර බ්‍රහ්මචර්‍ය්‍යය පර්‍ය්‍යවසාන කොට ඇති රහත්ඵලය ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ට ඥනයෙන් දැන පසක් කොට එයට පැමිණ විසී ය. ජාතිය ක්ෂීණ විය. බඹසර වසනා ලද, සිවුමඟ කටයුතු කරන ලද, මේ රහත් බව පිණිස (කටයුතු) අනිකෙක් නැතැයි මොනොවට දත්තේ ය. ඒ මහණ රහතුන් කෙරෙහි අන්‍යතරයෙක් ද විය.

## 8. 2. 7. 4
## අධිදෙවඤාණදස්සන සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ගයා නගර සමීපයෙහි ගයාශීර්ෂයෙහි වෙසෙන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙතෙල වදාළ සේක:

1. මහණෙනි, මම සම්බෝධියෙන් පූර්වයෙහි අභිසම්බුද්ධ නො වූයෙම් ම බෝසත් වූයෙම් අවභාසයක් (දිව්‍ය නුවණ එළියක්) ම හඳුනමි. රූපයන් නො දක්මි.

2. මහණෙනි, ඒ මට මෙතෙල සිත විය: ඉදින් මම අවභාසයත් හැඳින ගන්නෙම් රූපයන් ද දක්නෙම් නම් මෙසේ මාගේ මේ ඥන දර්ශනය (දිව්‍ය නුවණ නමැති දැකීම) පරිශුද්ධතර වන්නේ ය කියා යි. මහණෙනි, ඒ මම අපරසමයෙහි අප්‍රමත්ත වූයෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් නිවනට මෙහෙය වූ සිතැතිව වසන්නෙම් අවභාසය ද හඳුනමි. රූ ද දක්මි. ඒ දෙවියන් හා නො ද සිටිමි, සල්ලාප නො කරමි, සාකච්ඡාවට නො පැමිණෙමි.

3. මහණෙනි, ඒ මට මෙතෙල සිත විය: ඉදින් මම අවභාසයත් දන්නෙම් රූ ද දක්නෙම් ඒ දෙවියන් හාත් සිටුනෙම් සල්ලාප කරන්නෙම් සාකච්ඡාවට පැමිණෙම් නම් මෙසේ මාගේ මේ ඥන දර්ශනය පරිශුද්ධතර වන්නේ ය කියා යි.

මහණෙනි, ඒ මම අපරසමයෙහි අප්‍රමත්ත වූයෙම් ආතාප ඇතියෙම් ප්‍රහිතාත්ම ව වෙසෙන්නෙමි අවභාසයත් හඳුනමි, රූ ද දකිමි, ඒ දෙවියන් හාත්සිටිමි, සල්ලාප කරමි, සාකච්ඡාවට පැමිණෙමි, මේ දේවතාවෝ අසෝ අසෝ දෙවනිකායෙන් පත් වූහයි ඒ දෙවතාවන් නො දනිමි.

4. තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: සචෙ ඛො අහං ඔභාසඤ්චෙව සඤ්ජානෙය්‍යං, රූපානි ච පස්සෙය්‍යං, තාහි ච දෙවතාහි සද්ධිං සන්තිට්ඨෙය්‍යං සල්ලපෙය්‍යං සාකච්ඡං සමාපජ්ජෙය්‍යං, තා ච දෙවතා ජානෙය්‍යං ඉමා දෙවතා අමුකම්හා වා අමුකම්හා වා දෙවනිකායාති, එවං මෙ ඉදං ඤාණදස්සනං පරිසුද්ධතරං අස්සාති.

සො ඛො අහං භික්ඛවෙ, අපරෙන සමයෙන අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො ඔභාසඤ්චෙව සඤ්ජානාමි, රූපානි ච පස්සාමි, තාහි ච දෙවතාහි සද්ධිං සන්තිට්ඨාමි සල්ලපාමි සාකච්ඡං සමාපජ්ජාමි. තා ච දෙවතා ජානාමි ඉමා දෙවතා අමුකම්හා වා අමුකම්හා වා දෙවනිකායාති. නො ච ඛො තා දෙවතා ජානාමි ඉමා දෙවතා ඉමස්ස කම්මස්ස විපාකෙන ඉතො චුතා තත්‍ථ උපපන්නාති. -පෙ-

5. තා ච දෙවතා ජානාමි, ඉමා දෙවතා ඉමස්ස කම්මස්ස විපාකෙන ඉතො චුතා තත්‍ථ උපපන්නා'ති. නො ච ඛො තා දෙවතා ජානාමි, ඉමා දෙවතා ඉමස්ස කම්මස්ස විපාකෙන එවමාහාරා එවං සුඛදුක්ඛපටිසංවෙදිනියොති. -පෙ-

6. තා ච දෙවතා ජානාමි, ඉමා දෙවතා ඉමස්ස කම්මස්ස විපාකෙන එවමාහාරා එවං සුඛදුක්ඛපටිසංවෙදිනියොති, නො ච ඛො තා දෙවතා ජානාමි, ඉමා දෙවතා එවං දීඝායුකා එවං චිරට්ඨිතිකාති. -පෙ-

7. තා ච දෙවතා ජානාමි, ඉමා දෙවතා එවං දීඝායුකා එවං චිරට්ඨිතිකාති. නො ච ඛො තා දෙවතා ජානාමි, යදි වා මෙ ඉමාහි දෙවතාහි සද්ධිං සන්නිවුත්‍ථපුබ්බං යදි වා න සන්නිවුත්‍ථපුබ්බ'න්ති.

8. තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: සචෙ ඛො අහං ඔභාසඤ්චෙව සඤ්ජානෙය්‍යං, රූපානි ච පස්සෙය්‍යං, තාහි ච දෙවතාහි සද්ධිං සන්තිට්ඨෙය්‍යං සල්ලපෙය්‍යං සාකච්ඡං සමාපජ්ජෙය්‍යං, තා ච දෙවතා ජානෙය්‍යං ඉමා දෙවතා අමුකම්හා වා අමුකම්හා වා දෙවනිකායාති, තා ච දෙවතා ජානෙය්‍යං ඉමා දෙවතා ඉමස්ස කම්මස්ස විපාකෙන ඉතො චුතා තත්‍ථ උපපන්නාති, තා ච දෙවතා ජානෙය්‍යං ඉමා දෙවතා එවමාහාරා එවං සුඛදුක්ඛපටිසංවෙදිනියොති, තා ච දෙවතා ජානෙය්‍යං ඉමා දෙවතා එවං දීඝායුකා එවං චිරට්ඨිතිකාති, තා ච දෙවතා ජානෙය්‍යං යදි වා මෙ ඉමාහි දෙවතාහි සද්ධිං සන්නිවුත්‍ථපුබ්බං යදි වා න සන්නිවුත්‍ථපුබ්බන්ති. එවං මෙ ඉදං ඤාණදස්සනං පරිසුද්ධතරං අස්සාති.

සො ඛො අහං භික්ඛවෙ, අපරෙන සමයෙන අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො ඔභාසඤ්චෙව සඤ්ජානාමි, රූපානි ච පස්සාමි තාහි ච දෙවතාහි සද්ධිං සන්තිට්ඨාමි සල්ලපාමි සාකච්ඡං සමාපජ්ජාමි,

4. මහණෙනි, ඒ මට මෙතෙල සිත විය: ඉදින් මම අවභාසයත් හඳුනන්නෙම් රූත් දන්නෙම් ඒ දෙවියන් හාත් සිටුනෙම් සල්ලාප කරනෙම් සාකච්ඡාවට පැමිණෙම් නම් මේ දෙවතාවෝ අසෝ දෙවනිකායෙන් පැමිණියහයි ඒ දෙවියන් ද දන්නෙම් නම් මෙසේ මාගේ මේ ඥාන දර්ශනය පරිශුද්ධතර වන්නේ ය කියා යි.

මහණෙනි, ඒ මම අපරසමයෙහි අප්‍රමත්ත වූයෙම්, ආතාප ඇතියෙම් ප්‍රහිතාත්මව වසන්නෙම් අවභාසයත් හඳුනමි, රූත් දක්මි, ඒ දෙවතාවන් හාත් සිටිමි, සල්ලාප කරමි, සාකච්ඡාවට පැමිණෙමි....

5. මේ දේවතාවෝ අසෝ අසෝ දෙවනිකායෙන් පැමිණියහ යි ඒ දෙවියනුත් දනිමි. මේ දෙවතාවෝ මෙ නම් කර්මයක්හුගේ විපාකයෙන් මෙයින් සැව එහි උපන්හ යි ඒ දෙවියන් නො දනිමි. මේ දෙවතාවෝ මේ කර්මයාගේ විපාකයෙන් මෙයින් චුතවූවාහු එහි උපන්හ යි ඒ දෙවතාවනුත් දනිමි. ඒ දෙවතාවනුදු 'මේ දෙවතාවෝ මේ කර්මයාගේ විපාකයෙන් මෙබඳු ආහාර ඇත්තාහු මෙබඳු සුවදුක් විඳින්නාහු'යයි නො දනිමි....

6. මේ දේවතාවෝ මෙ කර්මයාගේ විපාකයෙන් මෙබඳු ආහාර ඇත්තාහු මෙ බඳු සුවදුක් විඳිනාහු යයි ඒ දෙවතාවනුදු දනිමි....

7. මේ දේවතාවෝ මෙබඳු දීර්ඝායුෂ ඇත්තාහු මෙසේ චිරස්ථිතිකහ යි ඒ දෙවතාවන් නො දනිමි. මේ දෙවතාවෝ මෙසේ දීර්ඝායුෂ ඇත්තාහු මෙසේ චිරස්ථිතිකයහ යි ඒ දෙවියනුදු දනිමි. මේ දෙවියන් සමග මා (එකතුව) විසූ විරූ දැයි කියා හෝ නො විසූ විරූ දැයි කියා හෝ ඒ දෙවියන් නො දනිමි.

8. මහණෙනි ඒ මට මෙ සිත විය: ඉදින් මම අවභාසයත් හඳුනන්-නෙම් නම්, රූ ද දක්නෙම් නම්, ඒ දෙවියනුත් සමග සිටුනෙම් නම්, සල්ලාප කෙරෙම් නම් සාකච්ඡාවට පැමිණෙම් නම්, ඒ දෙවියනුත් මේ දෙවතාවෝ අසෝ අසෝ දෙවනිකායෙන් පැමිණියහ යි දන්නෙම් නම්, මේ දෙවතාවෝ මේ කර්මයාගේ විපාකයෙන් මෙයින් සැව එහි උපන්හ යි ඒ දෙවියනුත් දන්නෙම් නම්, මේ දෙවතාවෝ මෙබඳු ආහාර ඇත්තාහු මෙබඳු සුවදුක් විඳිනාහු යයි ඒ දෙවතාවන් දන්නෙම් නම්, මේ දෙවතාවෝ මෙසේ දීර්ඝායුෂ ඇත්තාහු මෙසේ චිරස්ථිතිකයහ යි ඒ දෙවතාවන් ද දන්නෙම් නම්, මේ දෙවියන් සමග (මා එකතුව) විසූ විරූ ද යි කියා හෝ නො විසූ විරූ දැයි කියා හෝ ඒ දෙවියනුදු දන්නෙම් නම් මෙසේ මාගේ මේ ඥානදර්ශනය පරිශුද්ධතර වන්නේ යයි.

මහණෙනි, ඒ මම අපරසමයෙහි අප්‍රමත්ත වූයෙම් ආතාප ඇතියෙම් ප්‍රහිතාත්ම ව වසන්නෙම් අවභාසයත් හඳුනමි. රූ ද දකිමි, ඒ දෙවතාවන් සමගත් සිටිමි සල්ලාප කරමි. සාකච්ඡාවට වදිමි.

තා ච දෙවතා ජානාමි: ඉමා දෙවතා අමුකම්හා වා අමුකම්හා වා දෙවනිකායාති. තා ච දෙවතා ජානාමි: ඉමා දෙවතා ඉමස්ස කම්මස්ස විපාකෙන ඉතො චුතා තත්‍ථ උපපන්නාති. තා ච දෙවතා ජානාමි: ඉමා දෙවතා එවමාහාරා එවං සුඛදුක්ඛපටිසංවෙදිනියොති. තා ච දෙවතා ජානාමි ඉමා දෙවතා එවං දීඝායුකා එවං චිරට්ඨිතිකාති. තා ච දෙවතා ජානාමි: යදි වා මෙ ඉමාහි දෙවතාහි සද්ධිං සන්නිවුත්‍ථපුබ්බං, යදි වා න සන්නිවුත්‍ථපුබ්බන්ති.

යාවකීවඤ්ච මෙ භික්ඛවෙ, එවං අට්ඨපරිවට්ටං අධිදෙවඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි, නෙව තාවාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං, යතො ච ඛො මෙ භික්ඛවෙ, එවං අට්ඨපරිවට්ටං අධිදෙවඤාණදස්සනං සුවිසුද්ධං අහොසි. අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: "අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්‍ථිදානි පුනබ්භවො"ති.

## 8. 2. 7. 5

## අභිභායතන සුත්තං

**[සාවත්‍ථිනිදානං]**

1. අට්ඨිමානි භික්ඛවෙ, අභිභායතනානි, කතමානි අට්ඨ: අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ දුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති, ඉදං පඨමං අභිභායතනං.

2. අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං දුතියං අභිභායතනං.

3. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං තතියං අභිභායතනං.

මේ දේවතාවෝ අසෝ අසෝ දෙවනිකායෙනැයි ඒ දෙවියනුත් හඳුනමි. මේ දෙවතාවෝ මේ කර්මයාගේ විපාකයෙන් මෙයින් ච්‍යුත-වූවාහු එහි උපන්හ යි ඒ දෙවතාවන් ද දනිමි. මේ දෙවතාවෝ මෙබඳු ආහාර ඇත්තාහු මෙබඳු සුවදුක් විඳිනාහු යයි ඒ දෙවතාවන් ද දනිමි, මේ දෙවතාවෝ මෙබඳු දීඝායුෂ ඇතියාහු මෙසේ චිරස්ථිතිකයහ යි ඒ දෙවියනුත් දනිමි, මේ දෙවතාවන් සමග මා විසූවිරූ දූයි හෝ නො-විසූවිරූ දූයි හෝ කියාත් ඒ දෙවතාවන් ද දනිමි.

මහණෙනි යම්තාක් මෙසේ අෂ්ටපරිවර්ත (දිවැස් ආදි නුවණ අටෙක පෙරළියක්) ඇති මාගේ අධිදෙව ඥානදර්ශනය සුවිශුද්ධ නොවී ද, මහණෙනි, ඒ තාක් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොව්හි මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජායෙහි අනුත්තර සම්‍යක් සම්බොධිය අභිසම්බුද්ධයෙමි යි පිළින නො කෙළෙමි. මහණෙනි, යම් කලෙක පටන් අෂ්ටපරිවර්ත ඇති මාගේ අධිදෙව ඥානදර්ශනය සුවිශුද්ධ වී නම් මහණෙනි, එ කල්හි මම සදෙවක සමාරක සබ්‍රහ්මක ලොව්හි මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජායෙහි අනුත්තර සම්‍යක් සම්බොධිය අභි-සම්බුද්ධයෙමැ යි පිළින කෙළෙමි, මාගේ ඥානදර්ශනයත් උපන: ''මාගේ චිත්තවිමුක්තිය අකොප්‍ය ය. මේ අන්තිම ජාතිය ය, දැන් පුනර්භවයෙක් නැතැ'' යි.

## 8. 2. 7. 5

## අභිභායතන සූත්‍රය

[සැවැත්නිදන යි]

1. මහණෙනි, මේ අභිභායතනයෝ (සතුරු දහම් හා අරමුණු මඩින කරුණු) අටදෙනෙකි. කවර අටදෙනෙකයත්: අධ්‍යාත්මරූපයෙහි (පරිකර්ම වශයෙන්) රූප සංඥා ඇත්තේ එකෙක් නො වැඩූ සුවර්ණ දුර්වර්ණ බාහිර රූපායතන දක්නේ ය. ඕවුන් මැඩගෙන දන්මි දක්මි යි යන මෙබඳු සංඥා ඇත්තේ වෙයි. මේ ප්‍රථම අභිභායතන යි.

2. අධ්‍යාත්මයෙහි රූපසංඥා ඇත්තේ එකෙක් අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ බාහිර රූපයන් දකියි, ඕවුන් මැඩගෙන දන්මි දක්මි යි යන මෙබඳු සංඥා ඇත්තේ වේ. දෙවන අභිභායතන යි.

3. අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇත්තේ එකෙක් නො වැඩූ සුවර්ණ දුර්වර්ණ බාහිර රූපයන් දකියි, ඔවුන් මැඩගෙන දන්මි දක්මි යි යන මෙබඳු සංඥා ඇත්තේ වෙයි. මේ තෘතීය අභිභායතන යි.

4. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං චතුත්ථං අභිභායතනං.

5. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං පඤ්චමං අභිභායතනං.

6. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං ඡට්ඨං අභිභායතනං.

7. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං සත්තමං අභිභායතනං.

8. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං අට්ඨමං අභිභායතනං. ඉමානි ඛො භික්ඛවෙ, අට්ඨ අභිභායතනානීති.

## 8. 2. 7. 6

## විමොක්ඛ සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ, විමොක්ඛා කතමෙ අට්ඨ:

1. රූපී රූපානි පස්සති. අයං පඨමො විමොක්ඛො.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො[1] බහිද්ධා රූපානි පස්සති. අයං දුතියො විමොක්ඛො.

1. එකො, මජසං--නත්ථි

4. අඤ්ඣාත්මයෙහි අරූපසංඥා ඇත්තේ එකෙක් අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ බාහිර රූපයන් දක්නේ ය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන මෙබඳු සංඥා ඇත්තේ වේ. මේ චතුර්ථ අභිභායතන යි.

5. අඤ්ඣාත්මයෙහි අරූපසංඥා ඇතියේ එකෙක් නීල් වූ නිල්වන් වූ නීලනිදර්ශන වූ නීලාවභාස වූ බාහිර රූපයන් දක්නේ ය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යන මෙබඳු සංඥා ඇත්තේ වේ. මේ පඤ්චම අභිභායතන යි.

6. අඤ්ඣාත්මයෙහි අරූපසංඥා ඇතියේ එකෙක් පීත ව පීතවර්ණ වූ පීතනිදර්ශන වූ පීතාවභාස වූ බාහිර රූපයන් දක්නේ ය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. මේ ෂෂ්ඨ අභිභා-යතන යි.

7. අඤ්ඣාත්මයෙහි අරූපසංඥා ඇතියේ එකෙක් ලොහිත වූ ලොහිතක වර්ණ වූ ලොහිතක නිදර්ශන වූ ලොහිතාවභාස ඇති බාහිර රූපයන් දක්නේ ය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. මේ සප්තම අභිභායතන යි.

8. අඤ්ඣාත්මයෙහි අරූපසංඥා ඇතියේ එකෙක් අවදාත වූ අවදාතවර්ණ වූ අවදාත නිදර්ශන වූ අවදාතාවභාස ඇති බාහිර රූපයන් දක්නේ ය. ඔවුන් මැඩගෙන දනිමි දකිමි යි මෙබඳු සංඥා ඇතියේ වෙයි. මේ අෂ්ටම අභිභායතන යි. මහණෙනි, මේ අෂ්ට අභිභායතන යි.

## 8. 2. 7. 6

## විමොක්ඛ සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ විමොක්ෂයෝ අටදෙනෙකි. කවර අටදෙනෙක යත්:

1. (අඤ්ඣාත්මයෙහි උපදවන ලද) රූපධ්‍යාන ඇත්තේ බැහැර (නීලකසිණාදි) රූපයන් (දහැන් ඇසින්) දකියි. මේ ප්‍රථම විමොක්ෂ යි.

2. එකෙක් අඤ්ඣාත්මයෙහි අරූපසංඥා (නූපදවන ලද රූපාවචර ධ්‍යානයන්) ඇත්තේ බැහැර රූපයන් (රූපාවචර ධ්‍යානයන්) දකියි. මේ දෙවන විමොක්ෂ යි.

3. සුඤ්ඤන්තෙව අධිමුත්තො හොති. අයං තතියො විමොක්ඛො.

4. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා[1] නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථො විමොක්ඛො.

5. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමො විමොක්ඛො.

6. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨො විමොක්ඛො.

7. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමො විමොක්ඛො.

8. සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමො විමොක්ඛොති. ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨ විමොක්ඛාති.

## 8. 2. 7. 7

## අනරියවොහාර සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ, අනරියවොහාරා. කතමෙ අට්ඨ:

අදිට්ඨෙ දිට්ඨවාදිතා, අසුතෙ සුතවාදිතා, අමුතෙ මුතවාදිතා, අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා, දිට්ඨෙ අදිට්ඨවාදිතා, සුතෙ අසුතවාදිතා, මුතෙ අමුතවාදිතා, විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා. ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ අනරියවොහාරාති.

---

1. අත්ථගමා-මජ්ඣං

3. (වර්ණකසිණයන්හි ධ්‍යානයෙහි) සුභ ම ය යි ඇලුණේ වෙයි. මේ තුන්වන විමොක්ෂ යි.

4. සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තංගමයෙන් නානාත්වසංඥාවන්ගේ අමනසිකාරයෙන් (කසිණුගඝාටීම) ආකාසය අනන්තය යි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙයි. මේ සිවුවන විමොක්ෂ යි.

5. සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඥානය අනන්තය යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසෙයි. මේ පස්වන විමොක්ෂ යි.

6. සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිත් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. මේ සවන් විමොක්ෂ යි.

7. සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. මේ සත්වන විමොක්ෂ යි.

8. සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤා-වෙදයිතනිරොධයට පැමිණ වෙසෙයි. මේ අටවන විමොක්ෂ යි.

මහණෙනි, මේ අෂ්ට විමොක්ෂයෝ වෙතැ යි.

## 8. 2. 7. 7

## අනරියවොහාර සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ අනාර්ය ව්‍යවහාරයෝ අට දෙනෙකි. කවර අට දෙනෙක යත්:

නො දක්නා ලද්දෙහි දක්නා ලද යි කියන බව ය, නො අසන ලද්දෙහි අසන ලද යි කියන බව ය, අමුතයෙහි (ඝ්‍රාණජිව්හාකායද්වාරයනට නොපත් ගන්ධ රස ඵොට්ඨබ්බයෙහි) මුතවාදී (ඝ්‍රාණාදිද්වාරයනට ගන්ධාදි ආයතන පැමිණෙන ලද යි කියන) බව ය, සිතින් නො දන්නා ලද්දෙහි දන්නා ලද යි කියන බව ය, දක්නා ලද්දෙහි අදිට්ඨවාදිතා ය, අසන ලද්දෙහි අසුතවාදිතා ය, මුතයෙහි (ගන්ධරස ඵොට්ඨබ්බාරම්මණයන් ලබන ලද කල්හි ඒ නැතැ යි කියන) අමුතවාදිතා ය, සිතින් දන්නා ලද්දෙහි නො දන්නා ලද යි කියන බව ය. මහණෙනි, මේ අෂ්ට අනාර්යව්‍යවහාරයෝ යි.

## 8. 2. 7. 8

## අරියවොහාර සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ, අරියවොහාරා. කතමෙ අට්ඨ: අදිට්ඨෙ අදිට්ඨවාදිතා, අසුතෙ අසුතවාදිතා, අමුතෙ අමුතවාදිතා, අවිඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා. දිට්ඨෙ දිට්ඨවාදිතා, සුතෙ සුතවාදිතා, මුතෙ මුතවාදිතා, විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා. ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨ අරියවොහාරාති.

## 8. 2. 7. 9

## පරිස සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමා භික්ඛවෙ පරිසා කතමා අට්ඨ: ඛත්තියපරිසා, බ්‍රාහ්මණපරිසා, ගහපතිපරිසා, සමණපරිසා, චාතුම්මහාරාජිකපරිසා, තාවතිංසපරිසා, මාරපරිසා, බ්‍රහ්මපරිසා.

අභිජානාමි ඛො පනාහං භික්ඛවෙ, අනෙකසතං ඛත්තියපරිසං උපසඞ්කමිතා. තත්‍රපි මයා සන්නිසින්නපුබ්බඤ්චෙව සල්ලපිතපුබ්බඤ්ච. සාකච්ඡා ච සමාපන්නපුබ්බා, තත්‍ථ යාදිසකො තෙසං වණ්ණො හොති, තාදිසකො මයහං වණ්ණො හොති, යාදිසකො තෙසං සරො හොති, තාදිසකො මයහං සරො හොති, ධම්මියා ච කථාය සන්දස්සෙමි සමාදපෙමි සමුත්තෙජෙමි, සම්පහංසෙමි, භාසමානඤ්ච මං න ජානන්ති, කො නු ඛො අයං භාසති දෙවො වා මනුස්සො වාති. ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා අන්තරධායාමි. අන්තරහිතඤ්ච මං න ජානන්ති කො නු ඛො අන්තරහිතො දෙවො වා මනුස්සො වාති.

අභිජානාමි ඛො පනාහං භික්ඛවෙ, අනෙකසතං බ්‍රාහ්මණපරිසං -පෙ- ගහපතිපරිසං -පෙ- සමණපරිසං -පෙ- චාතුම්මහාරාජිකපරිසං -පෙ- තාවතිංසපරිසං -පෙ- මාරපරිසං -පෙ- බ්‍රහ්මපරිසං උපසඞ්කමිතා. තත්‍රපි මයා සන්නිසින්නපුබ්බඤ්චෙව සල්ලපිතපුබ්බඤ්ච සාකච්ඡා ච සමාපන්නපුබ්බා. තත්‍ථ යාදිසකො තෙසං වණ්ණො හොති තාදිසකො මයහං වණ්ණො හොති. යාදිසකො තෙසං සරො හොති, තාදිසකො මයහං සරො හොති. ධම්මියා ච කථාය සන්දස්සෙමි සමාදපෙමි සමුත්තෙජෙමි සම්පහංසෙමි. භාසමානඤ්ච මං න ජානන්ති කො නු ඛො අයං භාසති දෙවො වා මනුස්සො වාති. ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා අන්තරධායාමි. අන්තරහිතඤ්ච මං න ජානන්ති කො නු ඛො අයං අන්තරහිතො දෙවො වා මනුස්සො වාති. ඉමා ඛො භික්ඛවෙ, අට්ඨපරිසාති.

## 8. 2. 7. 8

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ ආර්‍ය්‍යව්‍යවහාරයෝ අට දෙනෙකි. කවර අට-දෙනෙක යත්: අදිට්ඨයෙහි අදිට්ඨවාදිතා ය, අසුතයෙහි අසුතවාදිතා ය, අමුතයෙහි අමුතවාදිතා ය, අවිඤ්ඤාතයෙහි අවිඤ්ඤාතවාදිතා ය, දිට්ඨයෙහි දිට්ඨවාදිතා ය, සුතයෙහි සුතවාදිතා ය, මුතයෙහි මුතවාදිතා ය, විඤ්ඤාත-යෙහි විඤ්ඤාතවාදිතා යි. මහණෙනි, මේ ආර්‍ය්‍යව්‍යවහාරයෝ අටදෙනා යි.

## 8. 2. 7. 9

## පරිස සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ පිරිස් අටෙකි. කවර අටෙක යත්: ක්ෂත්‍රිය-පිරිස ය, බ්‍රාහ්මණපිරිස ය, ගෘහපතිපිරිස ය, ශ්‍රමණපිරිස ය, චාතුර්මහාරාජික පිරිස ය, තාවතිංසපිරිස ය, මාරපිරිස ය, බ්‍රහ්මපිරිස යි.

මහණෙනි, මම නේසිය කැත්පිරිස් වෙත එළඹියෙම් දනිම් ම ය. එහිදු මා විසින් හුන්විරූ ද බිණූවිරූ ද වේ. සාකච්ඡාවට පැමිණිවිරූ ද වේ. එහි යම් බඳු ඔවුන්ගේ වර්ණයක් වේ ද, එබඳු වර්ණයෙක් මට ද වෙයි. යම් බඳු ඔවුන්ගේ ස්වරයෙක් වේ ද, එබඳු ස්වරයෙක් මට ද වේ. දැහැමි කථායෙන් ද සන්දර්ශනය කරමි. සමාදන් කරවමි. සමුත්තේජන කරමි, සම්පහංසන කරමි, මේ දෙවි හෝ මිනිස් හෝ කවරෙක් ‘බෙණේ දැයි බණන මා නො දනිත්. දැහැමි තෙපුලෙන් සන්දර්ශනය කොට සමාදන් කොට සමුත්තේජන කොට සම්පහංසන කොට අතුරුදන් වෙමි. දෙවි වූ හෝ මිනිස් වූ හෝ මේ කවරෙක් නම් අතුරුදන් වී දැයි අතුරුදන් වූ ද මා නො දනිත්.

මහණෙනි, මම නේසිය බමුණු පිරිස් වෙත... ගැහැවිපිරිස් වෙත... මහණ පිරිස් වෙත... සිවමහරදපිරිස් වෙත ... තව්තිසපිරිස් වෙත ... මරපිරිස් වෙත .. බඹපිරිස් වෙත එළඹියෙම් දනිමි. එහිදු මා විසින් හුන්විරූ ද බිණූවිරූ ද වේ. සාකච්ඡා ද කළවිරූ ය. එහි යම් බඳු ඔවුන්ගේ වර්ණයක් වේ ද, එබඳු වර්ණයෙක් මට ද වෙයි. ඔවුන්ගේ යම් බඳු ස්වරයෙක් වී නම් මට ද එබඳු ස්වරයෙක් වේ. දැහැමි කථායෙනුදු සන්දර්ශනය කරමි, සමාදන් කරමි, සමුත්තේජනය කරමි, සම්පහංසනය කරමි, මේ කවර නම් දෙවියක් හෝ මිනිසෙක් බෙණේ-දැයි බණන මා නො දනිත්. දැහැමි කථායෙන් සන්දර්ශනය කොට, සමාදන් කොට, සමුත්තේජනය කොට සම්පහංසනය කොට අතුරුදන් වෙමි. මේ කවර නම් දෙවියෙක් හෝ මිනිසෙක් හෝ අතුරුදන් වී දැයි අතුරුදන් වූ ද මා නො දනිත්. මහණෙනි මේ පිරිස් අට ය.

## 8. 2. 7. 10

## භූමිචාල සුත්තං

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලියං පිණ්ඩාය පාවිසි. වෙසාලියා පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි; ගණ්හාහි ආනන්ද නිසීදනං, යෙන චාපාලං චෙතියං[1] තෙනුපසඞ්කමිස්සාම දිවාවිහාරායාති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා නිසීදනමාදාය භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි.

අථ ඛො භගවා යෙන චාපාලං චෙතියං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: රමණීයා ආනන්ද වෙසාලි, රමණීයං උදෙනං චෙතියං, රමණීයං ගොතමකං චෙතියං, රමණීයං සත්තම්බං[2] චෙතියං, රමණීයං බහුපුත්තං චෙතියං, රමණීයං සාරන්දදං චෙතියං රමණීයං චාපාලං චෙතියං.*

යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, ආකඞ්ඛමානො සො, ආනන්ද කප්පං වා[3] තිට්ඨෙය්‍ය, කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, ආකඞ්ඛමානො ආනන්ද[4] තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය, කප්පාවසෙසං වාති. එවම්පි ඛො ආයස්මා ආනන්දො භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං. න භගවන්තං යාචි: තිට්ඨතු භන්තෙ, භගවා කප්පං තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති, යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො.

1. පාවාලචෙතියං, ස්‍යා. චාපාලචෙතියං PTS
2. සත්තම්බකං—සිමු PTS
* දීඝනිකායෙ මහාපරිනිබ්බානසුත්තෙ—"රමණීයං උදෙනචෙතියං—පෙ— රමණීයං චාපාලචෙතියං"
3. මයා ආකඞ්ඛමානෙ කප්පං වා—දීනි
4. යො ආකඞ්ඛමානො ආනන්ද—දීනි

## 8. 2. 7. 10

## භූමිචාල සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වෙසාලි නගර සමීප-යෙහි වූ මහාවනයෙහි කූටාගාරශාලාහි වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙන විසාලාවට පිඩු පිණිස පිවිසි සේක. විසාලායෙහි පිඩු පිණිස හැසිර පස්බත පිඩුවායෙන් පෙරළා වැඩි සේක් ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූ සේක: ආනන්‍ද ය, නිසී-දනය (පත්කඩ) ගනුව, චාපාලචෛත්‍ය වෙත දිවාවිහාරය පිණිස යම්හයි, වහන්ස, එසේ යයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා අනඳ තෙරහු නිසීදනය ගෙන භාග්‍යවතුන් වහන්සේ පසුපස් ලුහුබැඳියහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චාපාලචෛත්‍ය වෙත එළඹි සේක. එළැඹ පැන වූ අස්නෙහි හුන් සේක. හිඳ භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් ඇමතූ සේක: ආනන්‍දය, වෙසාලිය රමණී වෙයි. උදෙනචෛත්‍ය රමණී වෙයි. ගොතමකචෛත්‍ය රමණී වෙයි. සත්තම්බචෛත්‍ය රමණී වෙයි. බහුපුත්තචෛත්‍ය රමණී වෙයි. සාරන්‍දදචෛත්‍ය රමණී වෙයි. චාපාලචෛත්‍ය රමණී වෙයි.

ආනන්‍දය, යම් කිසිවකුන් විසින් සතර ඍද්ධිපාදයෝ භාවිත ද බහුලීකෘත ද, යානීකෘත ද, වස්තුකෘත ද, අනුෂ්ඨිත ද, පරිචිත ද, සුසමාරබ්ධ ද, ආනන්‍දය, හේ කැමැති වනුයේ කපක් (ආයුෂ්කල්පයක්) හෝ කල්පාව-ශෙෂයක් හෝ (ආයුෂ්කල්පයෙන් වැඩියක්) සිටුනේ ය. ආනන්‍දය, තථාගත-යන් විසින් සතර ඉදුපා භාවිත ය, බහුලීකෘත ය, යානීකෘත ය, වස්තුකෘත ය, අනුෂ්ඨිත ය, පරිචිත ය, සුසමාරබ්ධ ය, ආනන්‍ද ය, තථාගත තෙමේ කැමැති වනුයේ කපක් හෝ කල්පාවශෙෂයක් හෝ සිටුනේ ය. මෙසේත් ආයුෂ්මත් ආනන්‍ද තෙරහු භාග්‍යවතුන් වහන්සේ විසින් ඖදරික නිමිති පහළ කළ කල්හිදු ඖදරික අවභාසය (ආලොකය) පහළ කළ කල්හිදු පිළිවිදුනට නො හැකි වූහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කපක් කල් සිටුනා සේක්වා, වහන්ස, සුගතයන් වහන්සේ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොකානුකම්පා පිණිස දෙවිමිනිස්නට අර්ථය පිණිස හිත පිණිස සුව පිණිස කපක් කල් සිටුනා සේක්වා යි මරහු විසින් මැඩි සිතැතියකු සේ භාග්‍යවතුන් වහන්සේ නො යැදූහ.

දුතියම්පි ඛො භගවා -පෙ- තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: රමණීයා ආනන්ද, වෙසාලි, රමණීයං උදෙනං චෙතියං රමණීයං ගොතමකං චෙතියං, රමණීයං සත්තම්බකං චෙතියං, රමණීයං බහුපුත්තං චෙතියං, රමණීයං සාරන්දදං චෙතියං, රමණීයං චාපාලං චෙතියං. යස්ස කස්සචි ආනන්ද, චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, ආකඞ්ඛමානො සො ආනන්ද, කප්පං වා[1] තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද, චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, ආකඞ්ඛමානො ආනන්ද[2] තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වාති. එවම්පි ඛො ආයස්මා ආනන්දො භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං. න භගවන්තං යාචි: තිට්ඨතු භන්තෙ, භගවා කප්පං තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති, යථා තං මාරෙන පරියුට්ඨිත චිත්තො.

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ගච්ඡ ත්වං ආනන්ද, යස්සදානි කාලං මඤ්ඤසීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා භගවතො අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි.

අථ ඛො මාරො පාපිමා අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ආනන්දෙ භගවන්තං එතදවොච; පරිනිබ්බාතු භන්තෙ, භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලොදානි භන්තෙ, භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා: න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද පත්තයොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා[3] සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසිස්සන්ති[4] පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානී[5] කරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසිස්සන්තීති.

1. සො ආකඞ්ඛමානො කප්පං වා-දී.නි.
2. සො ආකඞ්ඛමානො ආනන්ද-දී.නි.
3. ධම්මානුධම්මප්පටිපන්නා-සාමීචිප්පටිපන්නා-කත්ථචි.
4. දෙසෙස්සන්ති-දී.නි.ම.සු
5. උත්තානිං-කත්ථචි

දෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ... තෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූ සේක: ආනන්දය, වෛශාලිය රමණී වෙයි. උදෙන චෛත්‍යය රමණී වෙයි, ගෞතමක චෛත්‍යය රමණී වෙයි, සත්තම්බ චෛත්‍යය රමණී වෙයි. බහුපුත්‍ර චෛත්‍යය රමණී වෙයි. සාරන්දද චෛත්‍යය රමණී වෙයි, චාපාල චෛත්‍යය රමණී වෙයි, ආනන්දය, යම් කිසිවකු විසින් සතර ඉද්ධිපාද භාවිත ද, බහුලීකෘත ද, යානීකෘත ද, වස්තුකෘත ද, අනුෂ්ඨිත ද, පරිචිත ද, සුසමාරබ්ධ ද, ආනන්දය හේ කැමැති වනුයේ කපක් හෝ කල්පාවශේෂයක් හෝ සිටුනේ ය. ආනන්දය, තථාගතයන් විසින් සතර ඉද්ධිපාද භාවිත ය, බහුලීකෘතය, යානීකෘතය, වස්තුකෘත ය, අනුෂ්ඨිත ය, පරිචිත ය, සුසමාරද්ධ ය, ආනන්දය, කැමැති- වනුයේ තථාගත තෙමේ කපක් හෝ කල්පාවශෙෂයක් හෝ සිටුනේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේත් ඖදරිකනිමිත්ත පහළ කරනු ලබන කල්හි ඖදරික අවභාසය පහළ කරනු ලබන කල්හි ආයුෂ්මත් අනඳ තෙරහු පිළිවිදුනට නො හැකි වූහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කපක් සිටුනා සේක්වා, සුගතයන් වහන්සේ බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලෝකානුකම්පා පිණිස දෙව්මිනිස්නට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස කපක් සිටුනා සේක්වා යි මරහු විසින් මැඩි සිතැතියකු සෙයින් භාග්‍යවතුන් වහන්සේ නො යැදූහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූ සේක: ආනන්දය, තෝ යව, දැන් යමකට කල් නම් ඒ දනුවයි. වහන්ස, එසේ යයි ආයුෂ්මත් අනඳ තෙරහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේට නුදුරු එක්තරා රුක්මුලෙක හුන්හ.

එකල්හි පවිටු මාර තෙමේ අනඳ තෙරුන් නික්ම ගිය නොබෝ කලෙකින් භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකෙළේ ය: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක්වා, සුගතයන් වහන්සේ පිරි- නිවෙන සේක්වා, වහන්ස, භාග්‍යවතුන් වහන්සේට දැන් පිරිනිවෙන්නට කලි, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් "පාපිමය, යම්තාක් කල් මාගේ භික්ෂු ශ්‍රාවකයෝ ව්‍යක්ත වූවාහු විනීත වූවාහු විශාරද වූවාහු පැමිණි යෝගක්ෂෙම ඇත්තාහු බහුශ්‍රැත වූවාහු ධර්මධර වූවාහු ධර්මානු- ධර්මයට පිළිපන්නාහු සාමීචි පිළිවෙතෙහි යෙදුනාහු අනුධර්මචාරී වූවාහු වෙත් ද, ස්ව-ආචාර්‍ය්‍යවාදය උගෙන. කියන්නාහු ද, දෙසන්නාහු ද, පන- වන්නාහු ද, තබන්නාහු ද විවරණ කරන්නාහු ද, විභාග කරන්නාහු ද, ප්‍රකට කරන්නාහු ද; උපන් පරප්‍රවාදය සහධර්මයෙන් මොනොවට නිගෙන සප්‍රාතිහාර්‍ය්‍ය ධර්මය දෙසන්නාහු ද, එතෙක් මම නො පිරිනිවෙන්නෙමි යන තෙල වචනය කියන ලද මැයි.

එතරහි භන්තෙ භික්ඛූ භගවතො සාවකා වියත්තා විනීතා විසාරද පත්තයොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචි-පටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති, විවරන්ති විභජන්ති උත්තානී කරොන්ති. උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු 'දානි භන්තෙ භගවා පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බානකාලො' දානි භන්තෙ, භගවතො.

භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා: න තාවාහං පාපිම, පරිනිබ්බායිස්සාමි, යාව මෙ භික්ඛුනියො න සාවිකා -පෙ- යාව මෙ උපාසකා න සාවකා -පෙ- යාව මෙ උපාසිකා න සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද පත්තයොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිප්පටිපන්නා අනුධම්මචාරිනියො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති, දෙසිස්සන්ති, පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානිකරිස්සන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පටිහාරියං ධම්මං දෙසිස්සන්තීති.

එතරහි භන්තෙ උපාසිකා භගවතො සාවිකා වියත්තා විනීතා විසාරද පත්තයොගක්ඛෙමා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචි-පටිපන්නා අනුධම්මචාරිනියො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානී-කරොන්ති. උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති.

පරිනිබ්බාතු 'දානි භන්තෙ භගවා පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බාන කාලො' දානි භන්තෙ භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා: න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි. යාව මෙ ඉදං බ්‍රහ්මචරියං න ඉද්ධං චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං[1] බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතන්ති. එතරහි භන්තෙ භගවතො බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං.

පරිනිබ්බාතු 'දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බාන කාලො' දානි භන්තෙ භගවතොති.

1. විත්ථාරිතං-කත්ථචි

වහන්ස, මෙ කල්හි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂුහු ව්‍යක්ත වූවාහු විනීත වූවාහු විශාරද වූවාහු පැමිණි යොගක්ෂෙම ඇත්තාහු බහුශ්‍රැත වූවාහු ධර්මධර වූවාහු ධර්මානුධර්මප්‍රතිපන්න වූවාහු සාමීචියට පිළිපන්නාහු අනුධර්මචාරී වූවාහු ස්වකීය ආචාර්‍ය්‍යවාදය උගෙන කියත් දෙසත්, පනවත්, තබත් විස්තර කරත්, විභාග කරත්, ප්‍රකට කරත්, උපන් පරප්‍රවාදය සහධර්මයෙන් නිගෙන සප්‍රාතිහාර්‍ය්‍ය ධර්මය දෙසත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවෙන සේක්වා, සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට දැන් පිරිනිවෙනට කලි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බස වදරන ලදී: පාපිමය, යම්තාක් මාගේ භික්ෂුණී ශ්‍රාවිකාවෝ... යම්තාක් මාගේ උපාසක ශ්‍රාවකයෝ... යම්තාක් මාගේ උපාසිකා ශ්‍රාවිකාවෝ ව්‍යක්ත වූවාහු විනීත වූවාහු විශාරද වූවාහු පැමිණි යොගක්ෂෙම ඇත්තාහු බහුශ්‍රැත ධර්මධර වූවාහු ධර්මානුධර්මප්‍රතිපන්න වූවාහු සාමීචි පිළිවෙතට පිළිපන්නාහු අනුධර්මචාරිනී වූවාහු වෙත් ද, සිය ආචාර්‍ය්‍යවාදය උගෙන කියන්නාහු ද, දෙසන්නාහු ද, පනවන්නාහු ද, තබන්නාහු ද, විවරණ කරන්නාහු ද, විභාග කරන්නාහු ද, ප්‍රකට කරන්නාහු ද, උපන් පරප්‍රවාදය සහධර්මයෙන් මොනොවට නිගෙන සප්‍රාතිහාර්‍ය්‍ය ධර්මය දෙසන්නාහු ද, ඒ තාක් මම නො පිරිනිවෙන්නෙමි යි කියා යි.

වහන්ස, මෙකල භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවිකා උපාසිකාවෝ බහුශ්‍රැතයහ, ධර්මධරයහ, ධර්මානුධර්ම ප්‍රතිපන්නයහ, සාමීචි ප්‍රතිපන්නයහ, ව්‍යක්තයහ. විනීතයහ, විශාරදයහ, පැමිණි යොගක්ෂෙම ඇත්තාහ. අනුධර්මචාරී වූවාහු සිය ආචාර්‍ය්‍යවාදය උගෙන කියත්, දෙසත්, පනවත්, තබත්, විවරණ කරත්. විභාග කරත්, ප්‍රකට කරත්, උපන් පරප්‍රවාදය සහධර්මයෙන් මොනවට නිගෙන සප්‍රාතිහාර්‍ය්‍ය ධර්මය දෙසත්.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවෙන සේක්වා, සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට දැන් පිරිනිවෙන්නට කලි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල බස වදරන ලදී: පාපිමය යම්තාක් මාගේ මේ බ්‍රහ්මචර්‍ය්‍යය සමෘද්ධ වූයේත් වැඩුණේත් විස්තෘත වූයේත් බොහෝ දෙනා අතර ප්‍රකට වූයේත් පෘථුල-භාවයට ගියේත් යම්තාක් දෙව්මිනිසුන් විසින් සුප්‍රකාශිත වූයේත් වේ ද, ඒ තාක් නො පිරිනිවෙන්නෙමැයි කියා යි.

වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක්වා, සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක්වා, භාග්‍යවතුන් වහන්සේට මේ පිරිනිවීමට කල් වේය යි.

අප්පොස්සුක්කො ත්වං පාපිම හොහි, නචිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති, ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතීති.

අථ ඛො භගවා චාපාලෙ චෙතියෙ[1] සතො සම්පජානො ආයුසඞ්ඛාරං ඔස්සජි. ඔස්සට්ඨෙ ච භගවතා ආයුසඞ්ඛාරෙ මහාභූමිචාලො අහොසි භිංසනකො[2] සලොමහංසො.[3] දෙවදුන්දුභියො ච ඵලිංසු. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

1. තුලමතුලඤ්ච සම්භවං
භවසඞ්ඛාරමවස්සජි[4] මුනි,
අජ්ඣත්තරතො සමාහිතො
අභින්දි කවචමිවත්තසම්භවන්ති.

අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: මහා වතායං භූමිචාලො, සුමහා වතායං භූමිචාලො භිංසනකො සලොමහංසො දෙවදුන්දුභියො ච ඵලිංසු. කො නු ඛො හෙතු. කො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවායාති :

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

* මහා වතායං භන්තෙ භූමිචාලො* සුමහා වතායං භන්තෙ භූමිචාලො භිංසනකො සලොමහංසො. දෙවදුන්දුභියො ච ඵලිංසු. කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවායාති:

අට්ඨ ඛො මෙ ආනන්ද[5] හෙතු, අට්ඨ පච්චයා මහතො භූමිචාලස්ස පාතුභාවාය, කතමෙ අට්ඨ:

1. චාපාලචෙතියෙ-දී.නි.
2. භීසනකො-කත්ථචි
3. ලොමහංසනො-කත්ථචි
4. ඔස්සජි-සිමු.
* "අච්ඡරියං වත භො අබ්භුතං වත භො මහා වතායං භූමිචාලො" ඉච්චාදිවශෙන මහාපරිනිබ්බාන සුත්තෙ දිස්සති.
5. අට්ඨ ඛො ඉමෙ ආනන්ද-දී.නි.ම.සු

පාපිමය, තෝ අල්පොත්සුක වව, නොබෝ කලෙකින් තථාගතයන්ගේ පරිනිර්වාණය වන්නේ ය. මෙයින් තුන්මසක්හුගේ ඇවෑමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහ යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍යයෙහි ස්මෘති ඇත්තාහු සම්ප්‍රජන්‍යය ඇත්තාහු ආයුසංස්කාරය හළ සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් ආයුසංස්කාරය හළ කල්හි බිහිසුණු වූ ලොමුදහගන්වන මහා භූමිකම්පනයෙක් විය. දෙව්බෙරහු (මෙඝයෝ) සැලුණාහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තෙල අරුත් දැන ඒ වෙලාවෙහි මේ උදානය ඇනූසේක.

1. නියකාධ්‍යාත්මයෙහි ඇලුණු උපචාරාර්පණා සමාධි වශයෙන් සමාහිත වූ බුද්ධ මුනි තෙමේ කාමාවචර අරූපාවචර කර්මය හා මහද්ගත කර්මය දූයි දෙවැ දැරුම් වූ උත්පත්තිජනක වූ පුනර්භව සංස්කාරක වූ කර්මය හළේ ය (නොහොත් අතුල සඞ්ඛ්‍යාත නිර්වාණය හා භවය හා තුලනා කෙරෙමින් භවගාමි කර්මය හළේ ය.) ආත්මසම්භව වූ ක්ලේශය ද සන්නාහයක් සෙයින් බෝ මුල දී බිඳලී ය.

එ කල්හි ආයුෂ්මත් අනද තෙරුනට මෙ සිත විය: ඒකාන්තයෙන් මේ මහාභූමිචාලයෙක. ඒකාන්තයෙන් ඉමහත් වූ මේ භූමිචාලය බිහිසුණු ද ලොමුදහගන්වන්නේ ද වෙයි. දෙවදුන්දුභීහු (දෙව්බෙර නම් වූ මෙඝයෝ) ද සැලුනාහ. මහත් වූ භූමිචාලයක්හුගේ ප්‍රාදුර්භාවයට හෙතු කවරැ? ප්‍රත්‍යය කවරැ? යි

ඉක්බිති ආයුෂ්මත් අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ:

"වහන්ස, එකැතින් මේ මහාභූමිචාලයෙක: වහන්ස, එකැතින් ඉමහත් වූ මෙ භූමිචාලය බිහිසුණු වෙයි, ලොමුදහගන්වන්නෙකි. දෙවදුන්දුභීදු සැලුණහ, වහන්ස, මහත් වූ භූමිචාලයක්හුගේ ප්‍රාදුර්භාවයට හෙතු කවරැ? ප්‍රත්‍යය කවරැ? යී.

ආනන්දය, මහාභූමිචාලයක ප්‍රාදුර්භාවය පිණිස මේ හෙතුහු අටදෙනෙක. ප්‍රත්‍යයෝ අට දෙනෙක කවර අට දෙනෙක යත්:

1. අයං ආනන්ද මහාපඨවී[1] උදකෙ පතිට්ඨිතා. උදකං වාතෙ ඨිතං, වාතො ආකාසට්ඨො හොති. සො ආනන්ද[2] සමයො යං මහාවාතා වායන්ති, මහාවාතා වායන්තා උදකං කම්පෙන්ති. උදකං කම්පිතං පඨවිං කම්පෙති. අයං ආනන්ද පඨමො හෙතු[3] පඨමො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

2. පුනවපරං ආනන්ද සමණො වා බ්‍රාහ්මණො වා ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවතා වා මහිද්ධිකා මහානුභාවා[4] තස්ස පරිත්තා පඨවීසඤ්ඤා භාවිතා හොති, අප්පමාණා ආපොසඤ්ඤා. සො ඉමං පඨවිං කම්පෙති, සඞ්කම්පෙති, සම්පකම්පෙති[5] අයං ආනන්ද* දුතියො හෙතු, දුතියො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

3. පුනවපරං ආනන්ද යදා බොධිසත්තො තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, තදායං පඨවී කම්පති සඞ්කම්පති සම්පකම්පති[6] අයං ආනන්ද* තතියො හෙතු. තතියො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

4. පුනවපරං ආනන්ද යදා බොධිසත්තො සතො සම්පජානො මාතුකුච්ඡිස්මා නික්ඛමති, තදායං පඨවී කම්පති සඞ්කම්පති සම්පකම්පති. අයං ආනන්ද* චතුත්ථො හෙතු චතුත්ථො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

5. පුනවපරං ආනන්ද යදා තථාගතො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣති, තදායං පඨවී කම්පති, සඞ්කම්පති සම්පකම්පති[6] අයං ආනන්ද* පඤ්චමො හෙතු පඤ්චමො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

6. පුනවපරං ආනන්ද යදා තථාගතො අනුත්තරං ධම්මචක්කං පවත්තෙති, තදායං පඨවී කම්පති, සඞ්කම්පති සම්පකම්පති.[6] අයං ආනන්ද* ඡට්ඨො හෙතු, ඡට්ඨො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය.

---

1. මහාපඨවී-මජසං
2. සො ඛො ආනන්ද-දී.නි.ම.සු
3. අයං පඨමො හෙතු-දී.නි.ම.සු

* 'ආනන්ද' ඉතිපදං ම.ප. සුත්තෙ නත්ථි

4. දෙවො වා මහිද්ධිකො මහානුභාවො-මජසං
5. සම්පකම්පෙති සම්පවෙධෙති-දී.නි.ම.සු
6. සම්පති සම්පවෙධති-දී.නි.ම.සු

1. ආනන්දය, මේ මහපොළොව දියෙහි පිහිටියා ය, දිය වාතයෙහි පිහිටියේ ය. වාතය ආකාශස්ථ වෙයි. ආනන්දය, යම් හෙයෙකින් මහා වාතයෝ හමන් නම් එබඳු කලෙක් වෙයි. හමන්නා වූ මහාවාතයෝ දිය කම්පිත කරත්. කම්පිත උදකය පොළොව සලයි. ආනන්දය, මහත් භූමිචාලයක්හුගේ ප්‍රාදුර්භාවයට මේ පළමු හෙතු ය. මේ පළමු ප්‍රතයෙ යි.

2. ආනන්දය, තවද සෘද්ධිමත් වූ චිත්තවශීප්‍රාප්ත වූ මහණෙක් වේව යි, බමුණෙක් වේව යි මහත් සෘද්ධි ඇති මහත් අනුභාව ඇති දෙවතාවෙක් වේවයි ඇත. ඔහු විසින් සවල්ප වූ පෘථිවිසංඥ තොමෝ වඩන ලද වෙයි. අප්සංඥ තොමෝ බලවත් කොට වඩන ලද. හේ මේ පොළොව සොලවයි, හාත්පසින් සොලවයි, බොහෝ සෙයින් කම්පිත කරයි. ආනන්දය මහත් භූමිචාලයක්හුගේ ප්‍රාදුර්භාවය පිණිස මේ දෙවන හෙතු යි, මේ දෙවන ප්‍රත්‍යය යි.

3. ආනන්දය, තවද යම් කලෙක බොධිසත්ත්ව තුසී දෙව්ලොවින් සැව සිහි ඇතියේ මනා නුවණැතියේ මව් කුසට වදනේ ද එකල්හි මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි, බොහෝ සෙයින් කම්පිත වෙයි. ආනන්දය, මහත් භූමිචාලයක්හුගේ ප්‍රාදුර්භාවයට මේ තෙවන හෙතු යි, මේ තෙවන ප්‍රත්‍යය යි.

4. ආනන්දය, යම් කලෙක බොධිසත්ත්ව සිහි ඇතියේ මනා නුවණැතියේ මව්කුසින් බිහිවේ ද එකල මේ පොළොව සැලෙයි. හාත්පසින් සැලෙ යි. බොහෝසේ කම්පිත වෙයි. ආනන්දය, මහත් භූමිචාලයක්හු ගේ ප්‍රාදුර්භාවයට මේ සිවුවන හෙතුව යි, සිවු වන ප්‍රත්‍යය යි.

5. ආනන්දය, තවද, යම් කලෙක්හි තථාගත අනුත්තර සම්‍යක් සම්බොධිය අවබෝධ කෙරෙත් ද, එ කල්හි මේ පොළොව සැලෙයි. හාත්පසින් සැලෙ යි, බොහෝ සෙයින් කම්පිත වෙයි. ආනන්දය, මහා භූමිචාලයක්හුගේ පහළවීමට මේ පස්වන හෙතු යි, පස්වන ප්‍රත්‍යය යි.

6. ආනන්දය, තවද, යම් කලෙක තථාගතයෝ අනුත්තර ධර්ම චක්‍රය පවත්වත් ද, එකල පොළොව සැලෙයි, හාත්පසින් සැලෙ යි, බොහෝසේ කම්පිත වෙයි. ආනන්දය, මහාභූමිචාලයක්හුගේ පහළවීමට මේ සවන හෙතු යි, සවන ප්‍රත්‍යය යි.

7. පුනචපරං ආනන්ද යද තථාගතො සතො සම්පජානො ආයුසඞ්ඛාරං ඔස්සජ්ජති,[2] තදයං පඨවී කම්පති, සඞ්කම්පති, සම්පකම්පති[1]. අයං ආනන්ද* සත්තමො හෙතු, සත්තමො පච්චයා මහතො භූමිචාලස්ස පාතුභාවාය.

8. පුනචපරං ආනන්ද යද තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, තදයං පඨවී කම්පති, සඞ්කම්පති, සම්පකම්පති.[1] අයං ආනන්ද* අට්ඨමො හෙතු, අට්ඨමො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය. ඉමෙ ඛො ආනන්ද අට්ඨහෙතූ, අට්ඨපච්චයා මහතො භූමිචාලස්ස පාතුභාවායාති.

භූමිචාලවග්ගො සත්තමො.

තත්‍රුද්දානං:

ඉච්ඡා අලඤ්ච සඞ්ඛිත්තං-ගයා අභිභූනා සහ
විමොක්ඛා දෙව ච වොහාරා-පරිසා භූමිචාලෙනාති.

1. සම්පකම්පති සම්පවෙධති – දී.නි.මහාපරිනිබ්බානසුත්ත 2. ඔස්සජ්ජති-මජසං
* 'ආනන්ද' ඉති පදං ම.ප. සුත්තෙනත්ථි
* "අච්ඡරියං වත භො අබ්භුතං වත භො මහාවතායං භූමිචාලො" ඉච්චාදිවසෙන මහාපරිනිබ්බානසුත්තෙන දිස්සති.

7. ආනන්දය, තවද, යම් කලෙක තථාගතයෝ සිහි ඇතියේ මනානුවණැති ව ආයුසසංස්කාරය හරිත් ද, එකල්හි මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි, බොහෝ සෙයින් කම්පිත වෙයි. ආනන්දය, මහාභූමිචාලයක්හුගේ පහළවීමට මේ සත්වන හෙතු යි. සත්වන ප්‍රත්‍යය යි.

8. ආනන්දය, තවද, යම් කලෙක තථාගතයෝ අනුපාදිශෙෂ පරිනිර්වාණධාතුයෙන් පිරි නිවෙත් ද, එකල්හි මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි, බොහෝසේ කම්පිත වෙයි. ආනන්දය, මහත් භූමිචාලයක්හුගේ පහළවීමට මේ අටවැනි හේතු යි, අටවැනි ප්‍රත්‍යය යි.

**සත්වැනි චාපාල වර්ග යි.**

**එහි උද්දානය:**

ඉච්ඡා සූත්‍රය, අලං සූත්‍රය, සඩ්ඪිත්ත දෙසිත සූත්‍රය, ගයා ශීර්ෂයෙහි දී වදළ අධිදෙවඥානදසැන සූත්‍රය, අභිභායතන සූත්‍රය හා විමොක්ඛ සූත්‍රය ද වොහාර සූත්‍ර දෙක ද පරිස සූත්‍රය ද භූමිචාල සූත්‍රය දැයි දශයෙකි.

# 8. යමකවග්ගො

## 8. 2. 8. 1

### පඨම සමන්තපාසාදික සුත්තං

[සාවත්ථිනිදානං]

සද්ධො ච[1] භික්ඛවෙ භික්ඛු හොති, නො ච සීලවා[2], එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං 'කින්තාහං සද්ධො ච අස්සං සීලවා චා'ති. යතො ච ඛො භික්ඛවෙ භික්ඛු සද්ධො ච හොති සීලවා ච. එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

සද්ධො ච භික්ඛවෙ භික්ඛු හොති සීලවා ච නො ච බහුස්සුතො එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං, "කින්තාහං සද්ධො ච අස්සං සීලවා ච බහුස්සුතො චා'ති. යතො ච ඛො භික්ඛවෙ භික්ඛු සද්ධො ච හොති සීලවා ච බහුස්සුතො ච, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

සද්ධො ච භික්ඛවෙ භික්ඛු හොති සීලවා ච, බහුස්සුතො ච, නො ච ධම්මකථිකො,-පෙ-ධම්මකථිකො ච නො ච පරිසාවචරො,-පෙ- පරිසාවචරො ච නො ච විසාරදො පරිසාය ධම්මං දෙසෙති, -පෙ- විසාරදො ච පරිසාය ධම්මං දෙසෙති. නො ච චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛ විහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී -පෙ- චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති. අකිච්ඡලාභි අකසිරලාභී, නො ච ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති: එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං, කින්තාහං සද්ධො ච අස්සං සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදො ච පරිසාය ධම්මං දෙසෙය්‍යං, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිරලාභී ආසවානංඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති.

---

1. සද්ධො- ස්‍යා  2. නොසීලවා- ස්‍යා

# 8. යමකවර්ගය

## 8. 2. 8. 1

## ප්‍රථම සමන්තපාසාදික සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, භික්ෂු තෙමේ සැදැහැතියේ ද වෙයි: නො ද සිල්වත් වෙයි: මෙසේ හේ මහණ ඒ ඇඟින් පරිපූර වූයේ නො වෙයි. ඒ මහණ විසින් කවර නම් උපායෙකින් සැදැහැතියෙම් වෙම් ද සිල්වත් ද වෙම්දැ යි ඒ අඞ්ගය පිරිය යුතු. මහණෙනි, යම් කලෙක මහණ සැදැහැති යේත් සිල්වත් වූයේත් වේ ද මෙසේ මහණ ඒ ඇඟින් පරිපූර වූයේ වෙයි.

මහණෙනි, මහණ සැදැහැතියේ ද වෙයි. සිල්වත් ද වෙයි. නො ද බහුශ්‍රැත වෙයි. මෙසේ හේ ඒ ඇඟින් අපරිපූර වෙයි. ඔහු විසින් "කවර නම් උපායෙකින් මම සැදැහැයෙම්, සිල්වත් වූයෙම් බහුශ්‍රැත ද වූයෙම් වෙම් දැයි ඒ මහණ විසින් ඒ අඞ්ගය පිරිය යුතුයි. මහණෙනි, යම් කලෙක මහණ සැදැහැතියේත්, සිල්වත් වූයේත් බහුශ්‍රැත වූයේත් වේ ද, මෙසේ ඒ මහණ ඒ ඇඟින් පරිපූරකාරී වෙයි.

මහණෙනි, මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් බහුශ්‍රැත වූයේත් වේ ද, නො ද ධර්මකථික වේ ද... ධර්මකථිකත් වේ ද, පරිසාවචර (පිරිස්හි හැසිරෙන්නෙක්) නොවේ ද... පරිසාවචර වූයේත් විශාරද ව පිරිස්හි දහම් නො දෙසා ද... විශාරද ව පිරිස්හි දහම් දෙසනුයේත් දෘෂ්ටධර්ම සුඛ විහරණ ඇති ආභිචෙතසික (උතුම්සිත් ඇසුරු කළ) සතරදැහැන් කැමැති සේ නො ලබන සුල්ලේ නිදුකින් ලබන සුල්ලේත් සුවසේ ලබන සුල් ලේත් නො වේ ද... දෘෂ්ටධර්ම සුඛවිහරණ ඇති ආභිචෙතසික වූ සතර දැහැන් කැමැති සේ ලබන සුල්ලේ නිදුකින් ලබන සුල්ලේ, සුවසේ ලබන සුල්ලේත් වෙයි. ආශ්‍රවක්ෂයෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඉහාත්මයෙහි ම තමා විසින් මොනොවට දැන පසක්කොට එළඹ නො වෙසෙයි. මෙසේ හෙතෙමේ ඒ ඇඟින් අපරිපූර වෙයි. "කවර නම් උපායෙකින් මම සැදැහැතියෙම් සිල් ඇතියෙම් බහුශ්‍රැත වූයෙම් ධර්ම කථික වූයෙම් පරිසාවචර වූයෙම් විශාරද ව පිරිස්හි දහම් දෙසනුයෙම් දෘෂ්ටධර්මසුඛවිහරණ ඇති ආභිචෙතසික සතර දැහැන් කැමැති සේ ලබනුයෙම් නිදුකින් ලබනුයෙම් සුවසේ ලබනුයෙම් ආශ්‍රවක්ෂය කිරීමෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය දිටුදම්හියෙහි ම තමා විසින් විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එළඹ වෙසෙන්නෙම් දැ"යි ඔහු විසින් ඒ අඞ්ගය පිරිය යුතු ය.

යතො ච ඛො භික්ඛවෙ, භික්ඛු සද්ධො ච හොති සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදො ච පරිසාය ධම්මං දෙසෙති, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සමන්තපාසාදිකො ච හොති සබ්බාකාරපරිපූරො චාති.

## 8. 2. 8. 2
## දුතිය සමන්තපාසාදික සුත්තං

[සාවත්ථිනිදානං]

සද්ධො ච භික්ඛවෙ, භික්ඛු හොති නො ච සීලවා. එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං කින්තාහං සද්ධො ච අස්සං සීලවා චාති. යතො ච ඛො භික්ඛවෙ, භික්ඛු සද්ධො ච හොති, සීලවා ච, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

සද්ධො ච භික්ඛවෙ, භික්ඛු හොති සීලවා ච නො ච බහුස්සුතො -පෙ- බහුස්සුතො ච නො ච ධම්මකථිකො, -පෙ- ධම්මකථිකො ච නො ච පරිසාවචරො, -පෙ- පරිසාවචරො ච හොති නො ච විසාරදො පරිසාය ධම්මං දෙසෙති,-පෙ- විසාරදො ච ධම්මං දෙසෙති නො ච යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵුසිත්වා විහරති, -පෙ- යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵුසිත්වා විහරති නො ච ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං: කින්තාහං සද්ධො ච අස්සං සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදො ච පරිසාය ධම්මං දෙසෙය්‍යං, යෙතෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා, තෙ කායෙන ඵුසිත්වා විහරෙය්‍යං -පෙ- ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති.

මහණෙනි, යම් කලෙක මහණ සැදැහැති යේත් සිල් ඇතියේ ත් බහුශ්‍රැත වූයේත් ධර්මකථික වූයේ ත් පරිසාවචර වූයේ ත් විසාරද වූයේත් පිරිස්හි දහම් දෙසන්නේ වේ ද, දෘෂ්ටධර්ම සුඛවිහරණ ඇති ආභිචෙතසික සතර දැහැන් කැමැති සේ ලබන සුල්ලේ නිදුකින් ලබන සුල්ලේ සුවසේ ලබන සුල්ලේත් වේ ද, ආස්‍රවක්ෂය කිරීමෙන් අනාස්‍රව චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය දිටුදැමියෙහි තමා විසින් ම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එළැඹ වෙසේ ද, මෙසේ හේ ඒ ඇඟින් පරිපූර වෙයි.

මහණෙනි, මේ අට දහමින් සමන්වාගත මහණ සමන්තපාසාදික ද වෙයි. සර්වාකාර පරිපූර ද වේ යයි.

## 8. 2. 8. 2
## දෙවැනි සමනතපාසාදික සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මහණ සැදැහැතියේත් වෙයි සිල් ඇතියේ නො ද වෙයි, මෙසේ හේ ඒ ඇඟින් අපරිපූර වෙයි. කිනම් උපායෙකින්, මම සැදැහැතියෙම් ද සිල් ඇතියෙම් ද වෙම් දැ යි ඔහු විසින් ඒ අඩඟය පිරිය යුතු. මහණෙනි, යම් කලෙක මහණ සැදැහැතියේත්, සිල් ඇතියේත් වේ ද, මෙසේ ඒ ඇඟින් පරිපූර වෙයි.

මහණෙනි, මහණ සැදැහැතියේ ත් සිල් ඇතියේ ත් වෙයි. නො ද බහුශ්‍රැත වෙයි...බහුශ්‍රැත වූයේත් නො ද ධර්මකථික වෙයි... ධර්මකථික වූයේත් නො ද පරිසාවචර වෙයි... පරිසාවචර වූයේත් විසාරද ව පිරිස්හි නො ද දහම් දෙසන් නේ වෙයි...විසාරද ව දහම් දෙසනුයේත් වෙයි. රූපාවචර ධ්‍යානයන් ඉක්ම යම් ඒ ආරූප්‍ය වූ ශාන්ත විමොක්ෂ කෙනෙක් වෙත් නම් ඔවුන් නාම කායයෙන් ස්පර්ශ කොට නො ද වාසය කරන්නේ ය... රූපාවචරධ්‍යාන යන් ඉක්ම යම් ආරූප්‍ය වූ ශාන්ත විමොක්ෂ කෙනෙක් වෙත් නම් ඒ අරූපාවචර ධ්‍යානයන් නාමකායයෙන් පැහැස ගෙන වාසය කරයි... ආස්‍රවක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් දිටුදැමියෙහි ම තමා විසින් විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එළඹ වාසය නොකරයි මෙසේ හේ ඒ ඇඟින් අපරිපූරකාරී වෙයි. කිනම් උපායෙකින් මම සැදැහැති ද වූයෙම් සිල්වත් ද වූයෙම් බහුශ්‍රැත ද වූයෙම් ධර්මකථිකත් වූයෙම් පරිසාවචරත් වූයෙම් විශාරදත් වූයෙම් පිරිස්හි දහම් දෙසන්නෙම් රූපාවචරධ්‍යානයන් ඉක්ම ආරූප්‍ය වූ යම් ඒ ශාන්ත විමොක්ෂ කෙනෙක් වෙත් නම් ඒ අරූපාවචර ධර්මයන් නාමකයින් පැහැස වෙසෙම් දැයි... ආස්‍රවක්ෂය කිරීමෙන්... සාක්ෂාත් කොට එළඹ වෙසෙම් දැ''යි ඔහු විසින් ඒ අඩඟය පිරිය යුතු යි.

යතො ච ඛො භික්ඛවෙ, භික්ඛු සද්ධො ච හොති සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදො ච පරිසාය ධම්මං දෙසෙති, යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵුසිත්වා විහරති. ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සමන්තපාසාදිකො ච හොති සබ්බාකාර පරිපූරො චාති.

## 8. 2. 8. 3

## පඨම මරණසති සුත්තං

එකං සමයං භගවා නාදිකෙ[1] විහරති ගිඤ්ජකාවසථෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

මරණසති භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානා. භාවෙථ නො තුම්හෙ භික්ඛවෙ මරණසතින්ති?

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: අහං ඛො භන්තෙ, භාවෙමි මරණසතින්ති.

යථා කථං පන ත්වං භික්ඛු, භාවෙසි මරණසතින්ති? ඉධ මය්හං භන්තෙ, එවං හොති: අහො වතාහං රත්තින්දිවං ජීවෙය්‍යං, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. එවං ඛො අහං භන්තෙ, භාවෙමි මරණසතින්ති.

1. නාතිකෙ- මජසං, නාටිකෙ- PTS

මහණෙනි, යම් කලෙක මහණ සැදැහැතියේත්, සිල්වත් වූයෙත් බහුශ්‍රැත වූයේත් ධර්මකථික වූයේත් පරිසාවචර වූයේත් විශාරද වූයේත් වේ ද, පිරිස්හි දහම් දෙසනුයේ වේ ද, රූපාවචර ධ්‍යානයන් ඉක්මවා ආරූප්‍ය වූ යම් ඒ ශාන්තවිමොක්ෂ කෙනෙක් වෙත් නම් ඒ අරූපාවචර ධ්‍යානයන් නාමකායයෙන් ස්පර්ශ කොට වාසය කරයි ද, ආස්‍රවයන් ක්ෂය කිරීමෙන්... ප්‍රත්‍යක්ෂ කොට එළඹ වෙසෙත් ද, මෙසේ හෙතෙමේ ඒ අඞ්ගයෙන් පරිපූර වෙයි.

මහණෙනි, මේ දහම් අටින් සමන්වාගත මහණ සමන්තපාසාදිකත් වෙයි. සර්වාකාර පරිපූරත් වේ යයි.

## 8. 2. 8. 3
## ප්‍රථම මරණසති සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **නාදික නම් ගම්හි ගිඤ්ජකාවසථයෙහි** (ගඩොළුමුවා පහයෙහි) වැඩ වසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භගවත් හට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළ සේක:

මහණෙනි, භාවිත, බහුලීකෘත මරණානුස්මෘතිය මහත්ඵල වෙයි, මහානිසංස වෙයි. අමෘතයට බැස සිටියා වෙයි. අමෘතය කෙළවර කොට ඇත්තේ ද වෙයි. මහණෙනි, තෙපි මරණසී වඩව් දැයි.

මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය: වහන්ස, මම මරණානුස්මෘතිය වඩමැයි කියා යි.

මහණ, තෝ කෙසේ නම් මරණසී වඩනෙහිදැ යි? වහන්ස, මෙහිලා මට මෙබඳු සිතෙක් වෙයි: 'මම එක රැදවාලක් ජීවත්වන්නෙම් නම් යෙහෙක, භගවත්හුගේ සස්න (ආර්යමාර්ග ප්‍රතිවෙධාවහ වූ අවවාදය) මෙනෙහි කරන්නෙම් නම් මා විසින් එකතින් බොහෝ ආත්මහිත මහණකිස කරන ලද්දේ වෙයි, කියා යි. වහන්ස, මම මෙසේ මරණානුස්මෘතිය වඩමි.

2. අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ, භාවෙමි මරණසතින්ති.

යථා කථං පන ත්වං භික්ඛු භාවෙසි මරණසතින්ති? ඉධ මය්හං භන්තෙ, එවං හොති: අහොවතාහං දිවසං ජීවෙය්‍යං භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. එවං ඛො අහං භන්තෙ, භාවෙමි මරණසතින්ති.

3. අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ, භාවෙමි මරණසතින්ති.

යථා කථං පන ත්වං භික්ඛු, භාවෙසි මරණසතින්ති? ඉධ මය්හං භන්තෙ, එවං හොති: අහොවතාහං උපඩ්ඪදිවසං ජීවෙය්‍යං භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. එවං ඛො අහං භන්තෙ, භාවෙමි මරණසතින්ති.

4. අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ, භාවෙමි මරණසතින්ති.

යථා කථං පන ත්වං භික්ඛු භාවෙසි මරණසතින්ති? ඉධ මය්හං භන්තෙ එවං හොති: අහොවතාහං තදන්තරං ජීවෙය්‍යං යදන්තරං එකං පිණ්ඩපාතං භුඤ්ජාමි, භගවතො සාසනං මනසි කරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. එවං ඛො අහං භන්තෙ, භාවෙමි මරණසතින්ති.

5. අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ, භාවෙමි මරණසතින්ති. යථා කථං පන ත්වං භික්ඛු භාවෙසි මරණසතින්ති. ?

ඉධ මය්හං භන්තෙ, එවං හොති: අහොවතාහං තදන්තරං ජීවෙය්‍යං යදන්තරං උපඩ්ඪපිණ්ඩපාතං භුඤ්ජාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණසතින්ති.

2. අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේය; "වහන්ස මමත් මරණානුස්මෘතිය වඩමැ"යි කියා යි.

මහණ තෝ කෙසේ නම් මරණසි වඩනෙහි දැයි? වහන්ස, මෙහිලා මට මෙබඳු සිතෙක් වෙයි: 'මම දවසක් ජීවත් වෙම් නම් යෙහෙක, භගවත්හුගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් ඒකාන්තයෙන් මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කරන ලද්දේ වන්නේ ය. කියා යි. වහන්ස, මෙසේ වනාහි මම මරණානුස්මෘතිය වඩමැ යි.

3. අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැල කෙළේ ය: "වහන්ස, මමත් මරණානුස්මෘතිය වඩමැ"යි කියා යි.

මහණ, කෙසේ නම් තෝ මරණානුස්මෘතිය වඩනෙහි ද යි? වහන්ස, මෙහිලා මට මෙබඳු සිතෙක් වෙයි: මම අඩ දවසක් ජීවත් වන්නේ නම් යෙහෙක, භගවත්හුගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් ඒකාන්තයෙන් මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේත් වන්නේ ය කියා යි. වහන්ස, මෙසේ මම මරණස්මෘතිය වඩමි යි.

4. අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැල කෙළේ ය:

"වහන්ස, මමත් මරණ ස්මෘතිය වඩමි" යි කියා යි. මහණ, තෝ කෙසේ නම් මරණස්මෘතිය වඩහි" ද යි? වහන්ස, මට මෙ කරුණෙහි ලා මෙබඳු සිතෙක් වෙයි: මම යම් පමණ කලෙකින් එක් පිඩුවායක් (එක් දවසක් පමණ යැපෙන අහරක්) වළඳම් නම් එතෙක් කල් ජීවත් වන්නෙම් නම් මනා ය. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන් නෙම් නම් ඒකාන්තයෙන් එකතින් බොහෝ ආත්මහිත මහණකිස කළේ වන්නේ ය කියා යි, වහන්ස, මම මෙසේ මරණස්මෘතිය වඩමැයි.

5. අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

වහන්ස, මමත් මරණ ස්මෘතිය වඩමි කියා යි. මහණ තෝ කෙසේ නම් මරණ ස්මෘතිය වඩන්නෙහි ද යි.? වහන්ස මෙහිලා මට මෙබඳු සිතෙක් වෙයි: මම යම් පමණ කලෙකින් අඩ පිඩුවා වළඳම් නම් එතෙක් කල් ජීවත් වන්නෙම් නම් යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් මා විසින් ඒකාන්තයෙන් බොහෝ ආත්මහිත මහණකිස කෙළේත් වන්නේ ය කියා යි: වහන්ස, මම මෙසේ මරණ ස්මෘතිය වඩමි යි.

6. අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ භාවෙමි මරණසතින්ති. යථා කථං පන ත්වං භික්ඛු, භාවෙසි මරණසතින්ති ?

ඉධ මය්හං භන්තෙ, එවං හොති: අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං චත්තාරො පඤ්ච ආලොපෙ සඞ්ඛාදිත්වා අජ්ඣොහරාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං බහුං වත මෙ කතං අස්සාති. එවං ඛො අහං භන්තෙ, භාවෙමි මරණසතින්ති.

7. අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ භාවෙමි මරණසතින්ති. යථා කථං පන ත්වං භික්ඛු, භාවෙසි මරණසතින්ති ?

ඉධ මය්හං භන්තෙ එවං හොති: අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං යදන්තරං එකං ආලොපං සඞ්ඛාදිත්වා අජ්ඣොහරාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණසතින්ති.

8. අඤ්ඤතරොපි ඛො භික්ඛු භගවන්තං එතදවොච: අහම්පි ඛො භන්තෙ භාවෙමි මරණසතින්ති.

යථාකථම්පන ත්වං භික්ඛු, භාවෙසි මරණසතින්ති ? ඉධ මය්හං භන්තෙ එවං හොති: අහො වතාහං තදන්තරං ජීවෙය්‍යං යදන්තරං අස්සසිත්වා වා පස්සසාමි, පස්සසිත්වා වා අස්සසාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. එවං ඛො අහං භන්තෙ භාවෙමි මරණසතින්ති.

6. අන්‍යතර මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ ය: "වහන්ස, මමත් මරණ ස්මෘතිය වඩමි' කියායි. මහණ, තෝ කෙසේනම් මරණ ස්මෘතිය වඩහිදැ යි?

වහන්ස, මට මෙහිලා මෙබඳු සිතෙක් වෙයි. මම යම් පමණ කලෙකින් බත් සතර පස් පිඩක් සපා ගිලිම් ද, ඒතාක් කල් ජීවත් වන්නෙම් නම් යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් එකතින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේ වන්නේ ය කියා යි. වහන්ස, මම මෙසේ මරණ ස්මෘතිය වඩමි යි.

7. එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේය: වහන්ස, මමත් මරණස්මෘතිය වඩමි' කියා යි. මහණ තෝ කෙසේ නම් මරණස්මෘතිය වඩන්නෙහිදැ යි?

වහන්ස, මට මෙහිලා මෙබඳු සිතෙක් වෙයි: මම යම් පමණ කලෙකින් එක ආලෝපයක් සපා ගිලිම් ද, ඒතාක් කල් ජීවත් වන්නෙම් නම් යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් ඒකාන්තයෙන් මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේ වන්නේ ය කියා යි. වහන්ස, මම මෙසේ මරණස්මෘතිය වඩමි යි.

8. අන්‍යතර මහණෙක් ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය: 'වහන්ස, මමත් මරණස්මෘතිය වඩමි කියා යි.

මහණ, තෙපි කෙසේ නම් මරණස්මෘතිය වඩන්නෙහි දැ යි? වහන්ස, මෙහිලා මට මෙබඳු සිතෙක් වෙයි: මම යම් පමණ කලෙකින් ආශ්වාස කොට හෝ ප්‍රශ්වාස කෙරෙම් ද, ප්‍රශ්වාස කොට හෝ ආශ්වාස කෙරෙම් ද, ඒතාක් කල් ජීවත්වන්නෙම් නම් යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් ඒකාන්තයෙන් මා විසින් බොහෝ ආත්මහිත මහණ කිස කෙළේ වන්නේ ය කියා යි. වහන්ස, මම මෙසේ මරණස්මෘතිය වඩමි යි.

එවං වුත්තෙ භගවා තෙ භික්ඛූ එතදවොච: යවායං භික්ඛවෙ, භික්ඛු එවං මරණසතිං භාවෙති: අහොවතාහං රත්තින්දිවං ජීවෙය්‍යං භගවතො සාසනං මනසිකරෙය්‍යං බහුං වත මෙ කතං අස්සාති, යොපායං භික්ඛවෙ, භික්ඛු එවංමරණසතිං භාවෙති: අහොවතාහං දිවසං ජීවෙය්‍යං භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. යොපායං භික්ඛවෙ, භික්ඛු එවං මරණසතිං භාවෙති, අහොවතාහං උපඩ්ඪදිවසං ජීවෙය්‍යං, භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුංවත මෙ කතං අස්සාති, යොපායං භික්ඛවෙ, භික්ඛු එවං මරණසතිං භාවෙති: අහොවතාහං තදන්තරං ජීවෙය්‍යං යදන්තරං එකං පිණ්ඩපාතං භුඤ්ජාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති. යොපායං භික්ඛවෙ, භික්ඛු එවං මරණසතිං භාවෙති: අහොවතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං උපඩ්ඪපිණ්ඩපාතං භුඤ්ජාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති, යොපායං භික්ඛවෙ භික්ඛු එවං මරණසතිං භාවෙති: අහොවතාහං තදන්තරං ජීවෙය්‍යං යදන්තරං චත්තාරො වා පඤ්ච ආලොපෙ සඞ්ඛාදිත්වා අජ්ඣොහරාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ භික්ඛූ පමත්තා විහරන්ති දන්ධං මරණසතිං භාවෙන්ති ආසවානං ඛයාය.

යො ච ඛ්වායං භික්ඛවෙ භික්ඛු එවං මරණසතිං භාවෙති; අහොවතාහං තදන්තරං ජීවෙය්‍යං යදන්තරං එකං ආලොපං සඞ්ඛාදිත්වා අජ්ඣොහරාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං බහුං වත මෙ කතං අස්සාති, යොපායං භික්ඛවෙ භික්ඛු මරණසතිං භාවෙති: අහොවතාහං තදන්තරං ජීවෙය්‍යං, යදන්තරං අස්සසිත්වා වා පස්සසාමි ච පස්සසිත්වා වා අස්සසාමි, භගවතො සාසනං මනසිකරෙය්‍යං, බහුං වත මෙ කතං අස්සාති, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ භික්ඛූ අප්පමත්තා විහරන්ති තික්ඛං මරණසතිං භාවෙන්ති ආසවානං ඛයාය.

තස්මා තිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: අප්පමත්තා විහරිස්සාම, තික්ඛං මරණසතිං භාවෙය්‍යාම ආසවානං ඛයායාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ එ මහණුනට තෙල වදළ සේක. මහණෙනි, යම් මහණෙක් 'එකතින් මම එක රෑ දවාලක් ජීවත් වන්නෙම් නම් යෙහෙක භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් එකාන්තයෙන් මා විසින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේ වන්නේ ය' යි මෙසේ මරණස්මෘතිය වඩනේ ද, මහණෙනි යම් මහණෙක් මම දවලක් ජීවත් වන්නෙම් නම් යෙහෙක, භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් මා විසින් එකතින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේ වන්නේ ය' යි මෙසේ මරණ ස්මෘතිය වඩනේ ද, මහණෙනි, යම් මේ මහණ කෙනෙක් 'මම එකතින් අඩදිනක ජීවත් වන්නෙම් නම් යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් මා විසින් එකතින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේ වන්නේ ය'' යි මෙසේ මරණස්මෘතිය වඩනේ ද, මහණෙනි, යම් මේ මහණෙක් මම යම් පමණ කලෙකින් එක් පිඩුවායක් වළඳම් නම් එතෙක් කල් ජීවත් වන්නෙම් නම් යෙහෙක, භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් මා විසින් එකතින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේ වන්නේ යයි මෙසේ මරණස්මෘතිය වඩනේ ද, මහණෙනි, යම් මේ මහණෙක් ''මම යම් පමණ කලෙකින් අඩපිඩුවායක් වළඳම් නම් ඒතාක් කල් ජීවත්වන්නෙම් නම් යෙහෙක, භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් මා විසින් ඒකාන්තයෙන් බොහෝ ආත්මහිත මහණ කිස කෙළේ වන්නේ ය'' යි මෙසේ මරණස්මෘතිය වඩනේ ද, මහණෙනි, යම් මේ මහණෙක් ''මම යම් පමණ කලෙකින් බත් සතර පස් පිඩක් සපා ගිලිම් නම් එතෙක් ජීවත් වන්නෙම් නම් යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් මා විසින් එකතින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේ වන්නේ ය' යි මෙසේ මරණස්මෘතිය වඩනේ ද. මහණෙනි, මේ භික්ෂූහු ප්‍රමාද ව වෙසෙති ද ආස්‍රවක්ෂය පිණිස ලැසි ව මරණසතිය වඩත් යයි ද කියනු ලැබෙත්.

මහණෙනි, යම් මෙ මහණෙක් ''මම යම් පමණ කලෙකින් එක් පිඩක් සපා ගිලිම් නම් ඒතාක් කල් ජීවත් වන්නෙම් නම් යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරනනෙම් නම් මා විසින් එකාන්තයෙන් බොහෝ ආත්මහිත මහණකිස කෙළේ වන්නේය යි මෙසේ මරණස්මෘතිය වඩනේ ද, මහණෙනි, යම් මේ මහණෙක් ''මම යම් පමණ කලෙකින් අසස් කොට හෝ පසස් කරන්නෙම් ද, පසස් කොට හෝ අසස් කරන්නෙම් ද ඒ තාක් කල් ජීවත් වන්නෙම් නම් යෙහෙක. භාග්‍යවතුන් වහන්සේගේ සස්න මෙනෙහි කරන්නෙම් නම් මා විසින් එකතින් බොහෝ ආත්මහිත මහණකිස කෙළේත් වන්නේ ය යි මෙසේ මරණස්මෘතිය වඩනේ ද, මහණෙනි, මේ භික්ෂූහු අප්‍රමත්ත ව වෙසෙන්නාහයි ද ආස්‍රවක්ෂය කරනු පිණිස තික්ෂණ ව මරණස්මෘතිය වඩන්නාහයි ද කියනු ලැබෙත්.

මහණෙනි, එහෙයින් මෙසේ හික්මිය යුතු: අප්‍රමත්ත ව වාසය කරම්හ. ආස්‍රවයන් ක්ෂය කරනු පිණිස තික්ෂණ ව මරණස්මෘතිය වඩම්හ කියා යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

## 8. 2. 8. 4

## දුතියමරණසති සුත්තං

එකං සමයං භගවා නාදිකෙ විහරති ගිඤ්ජකාවසථෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

මරණසති භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානා. කථං භාවිතා ච භික්ඛවෙ, මරණසති කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානා:

ඉධ භික්ඛවෙ භික්ඛු දිවසෙ නික්ඛන්තෙ රත්තියා පතිහිතාය[1] ඉති පටිසඤ්චික්ඛති: බහුකා ඛො මෙ පච්චයා මරණස්ස. අහි වා මං ඩංසෙය්‍ය, විච්ඡිකො වා මං ඩංසෙය්‍ය, සතපදී වා මං ඩංසෙය්‍ය, තෙන මෙ අස්ස කාලකිරියා. සො මම අස්ස අන්තරායො, උපක්ඛලිත්වා වා පපතෙය්‍යං, භත්තං වා මෙ භුත්තං බ්‍යාපජ්ජෙය්‍ය, පිත්තං වා මෙ කුප්පෙය්‍ය, සෙම්හං වා මෙ කුප්පෙය්‍ය, සත්ථකා වා මෙ වාතා කුප්පෙය්‍යුං, මනුස්සා වා මං උපක්කමෙය්‍යුං, අමනුස්සා වා මං උපක්කමෙය්‍යුං, තෙන මෙ අස්ස කාලකිරියා, සො මම අස්ස අන්තරායොති.

තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: අත්ථි නු ඛො මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු රත්තිං කාලං කරොන්තස්ස අන්තරායායාති. සචෙ භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අත්ථි මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු රත්තිං කාලං කරොන්තස්ස අන්තරායායාති. තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤං ච කරණීයං.

1. පටිහිතාය– PTS.

## 8. 2. 8. 4

## දෙවැනි මරණසති සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාදික ගමහි ගිඤ්ජකාවසථයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල වදාළසේක.

මහණෙනි, භාවිත බහුලීකෘත මරණස්මෘතිය මහත්ඵල මහානෘශංස වෙයි, අමෘතාවගාහ වේ, අමෘතපර්‍ය්‍යාවසාන වේ. මහණෙනි. කෙසේ භාවිත කෙසේ බහුලීකෘත මරණස්මෘතිය මහත්ඵල වේ ද, මහානෘශංස වේ ද, අමෘතාවගාහ වේ ද, අමෘතපර්‍ය්‍යාවසාන වේ ද:

මහණෙනි මේ සස්නෙහි මහණ දවල ඉක්මගිය කල්හි රෑ නැවත එළඹී කල්හි මෙසේ පස්විකයි: මාගේ මරණයට ප්‍රත්‍යයයෝ බොහෝ වෙති. සර්පයෙක් හෝ මා ඩස්නේ ය, ගෝනුස්සෙක් හෝ මා ඩස්නේ ය, පත්තැයෙක් හෝ මා ඩස්නේ ය. එයින් මාගේ කාලක්‍රියාව වෙයි. ඒ මට ජීවිතාන්තරාය වෙයි. පැකිල හෙන්නෙම් හෝ වෙමි. මා වැළඳූ බත හෝ නො දිරන්නේ ය. මාගේ පිත හෝ කිපෙයි. මාගේ සෙම හෝ කිපෙයි, මාගේ ශස්ත්‍රක වාතයෝ හෝ කිපෙති, මිනිස්සු හෝ මට උපක්‍රම කෙරෙති අමනුෂ්‍යයෝ හෝ මට උපක්‍රම කෙරෙත්. එයින් මාගේ කාලක්‍රියාව වන්නේ ය. ඒ මට අන්තරාය වෙයි.

මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ නුවණින් සිතිය යුතු යි: "රෑ කාලක්‍රියා කරන මට අන්තරාය පිණිස යම් අකුශල කෙනෙක් වෙත් නම් එබඳු ලමු අකුසල් දහම්හු මට අප්‍රහීණ වූවාහු ඇත් ද කියා යි. මහණෙනි, ඉදින් මහණ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරනුයේ මෙසේ දන්නේ ද: "රෑ කාලක්‍රියා කරන මට යම් අකුශලධර්ම කෙනෙක් අන්තරාය පිණිස වෙත් නම් මට අප්‍රහීණ වූ එබඳු ලමු අකුශල ධර්මයෝ ඇතැයි. මහණෙනි ඒ මහණහු විසින් ඒ ලමු අකුසල් දහමුන්ගේ ම ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයත් ව්‍යායාමයත් උත්සාහයත් අධිමාත්‍ර උත්සාහයත් නො කලකිරුමත් ස්මෘතියත් සම්ප්‍රජන්‍යයත් කටයුතු.

සෙය්‍යථාපි භික්ඛවෙ, ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ, තෙන භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

සචෙ පන භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: නත්ථි මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු රත්තිං කාලං කරොන්තස්ස අන්තරායායාති, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

ඉධ පන භික්ඛවෙ භික්ඛු රත්තියා නික්ඛන්තාය දිවසෙ පතිහිතෙ ඉති පටිසඤ්චික්ඛති: බහුකා ඛො මෙ පච්චයා මරණස්ස; අහි වා මං ඩංසෙය්‍ය, විච්ඡිකො වා මං ඩංසෙය්‍ය, සතපදී වා මං ඩංසෙය්‍ය, තෙන මෙ අස්ස කාලකිරියා, සො මම අස්ස අන්තරායායාති. උපක්ඛලිත්වා වා පපතෙය්‍යං, භත්තං වා මෙ භුත්තං බ්‍යාපජ්ජෙය්‍ය, පිත්තං වා මෙ කුප්පෙය්‍ය සෙම්හං වා මෙ කුප්පෙය්‍ය, සත්ථකා වා මෙ වාතා කුප්පෙය්‍යුං, මනුස්සා වා මං උපක්කමෙය්‍යුං, අමනුස්සා වා මං උපක්කමෙය්‍යුං, තෙන මෙ අස්ස කාලකිරියා. සො මම අස්ස අන්තරායායාති. තෙන භික්ඛවෙ භික්ඛුනා ඉති පටිසඤ්චික්ඛිතබ්බං: අත්ථි නු ඛො මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු දිවා කාලං කරොන්තස්ස අන්තරායායාති.

සචෙ භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අත්ථි මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා යෙ මෙ අස්සු දිවා කාල කරොන්තස්ස අන්තරායායාති. තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

මහණෙනි, යම් සෙයින් ඇවිළ දන වස්ත්‍රය ඇතියෙක් වේවයි ඇවිළ දන හිසැතියේ වේවයි එම වස්ත්‍රය හෝ හිස නිවීම පිණිස අධිමාත්‍ර ඡන්දයත් ව්‍යායාමයත් උත්සාහයත් අධිමාත්‍ර උත්සාහයත් උකටලී නො වීමත් ස්මෘතියත් සම්ප්‍රජන්‍යයත් කෙරේ ද, මහණෙනි, එසෙයින් ම ඒ මහණහු විසින් එම ලාමක අකුසල් දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයත්, ව්‍යායාමයත්, උත්සාහයත් අධික වීර්‍ය්‍යයත් උකටලී නොවීමත් ස්මෘතියත් සම්ප්‍රජන්‍යයත් කටයුතු යි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවේක්ෂා කරනුයේ 'යම් අකුසල් දහම් කෙනෙක් රෑ කළුරිය කරන මට අන්තරාය පිණිස වෙත් නම් එබඳු අප්‍රහීණ වූ ලාමක අකුසල් දහම්හු මට නැතැ යි මෙසේ දන්නේ වේ ද, මහණෙනි, ඒ මහණහු විසින් දවරැහි කුසල් දහම්හි හික්මෙනුවහු විසින් එම ප්‍රීතිප්‍රමොද්‍යයෙන් වාස කටයුතු යි.

මහණෙනි, මෙ සස්නෙහි මහණ රෑ නික්ම ගිය කල්හි දවස නැවත ආ කල්හි මෙසේ නුවණින් සිතයි: මාගේ මරණයට බොහෝ ප්‍රත්‍යයෝ වෙත්: සර්පයෙක් හෝ මා ඩස්නේ ය, වෘශ්චිකයෙක් හෝ මා ඩස්නේ ය. ශතපදියෙක් හෝ මා ඩස්නේ ය, එයින් මාගේ කාලක්‍රියාව වෙයි. එය මට අන්තරාය පිණිස වෙයි, පා පැකිළ හෝ වැටෙනෙම වෙමි, මා වැළඳූ බත හෝ නො දිරයි, මාගේ පිත හෝ කිපෙයි, මාගේ සෙම හෝ කිපෙයි, මාගේ ශස්ත්‍රකවාතයෝ හෝ කිපෙත්. මිනිස්සු හෝ මට උපක්‍රම කරත් අමනුෂ්‍යයෝ හෝ මට උපක්‍රම කරත්, එයින් මාගේ කාලක්‍රියාව වෙයි, ඒ මට අන්තරාය පිණිස වෙයි, කියා යි. මහණෙනි, ඒ මහණහු විසින් මෙසේ සිතිය යුතු යි: දවල් කාලක්‍රියා කරන මට අන්තරාය පිණිස යම් අකුසල් කෙනෙක් වෙත් නම්, එබඳු අප්‍රහීණ වූ ලාමක අකුසල් දහම්හු මට ඇත කියා යි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවේක්ෂා කරනුයේ මෙසේ දන්නේ ද: "දවල් කාලක්‍රියා කරන මට අන්තරාය පිණිස යම් අකුශල ධර්ම කෙනෙක් වෙත් නම් එබඳු ලාමක අකුශල ධර්මයෝ අප්‍රහීණ වූවාහු මට ඇත කියා යි. මහණෙනි, ඒ මහණහු විසින් ඒ ලාමක අකුශල ධර්මයන්ගේ ම ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයත්, ව්‍යායාමයත් උත්සාහයත් උත්සොළ්හියත් අප්‍රතිවානියත් ස්මෘතියත් සම්ප්‍රජන්‍යයත් කට යුතු යි.

සෙය්‍යථාපි භික්ඛවෙ, ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච, උස්සාහඤ්ච, උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ, තෙන භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

සචෙ පන භික්ඛවෙ, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: නත්ථි මෙ පාපකා අකුසලා ධම්මා අප්පහීනා, යෙ මෙ අස්සු දිවාකාලං කරොන්තස්ස අන්තරායායාති, තෙන භික්ඛවෙ භික්ඛුනා තෙනෙව පීතිපාමොජ්ජෙන විහාතබ්බං අහොරත්තානුසික්ඛිනා කුසලෙසු ධම්මෙසු.

එවං භාවිතා ඛො භික්ඛවෙ මරණසති එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති.

## 8. 2. 8. 5

## පඨමසම්පදා සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමා භික්ඛවෙ සම්පදා. කතමා අට්ඨ: උට්ඨානසම්පදා, ආරක්ඛසම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිතා, සද්ධාසම්පදා, සීලසම්පදා, චාගසම්පදා, පඤ්ඤාසම්පදා, ඉමා ඛො භික්ඛවෙ, අට්ඨ සම්පදාති.

1. උට්ඨාතා කම්මධෙය්‍යෙසු– අප්පමත්තො විධානවා
සමං කප්පෙති ජීවිකං– සම්භතං අනුරක්ඛති.

2. සද්ධො සීලෙන සම්පන්නො වදඤ්ඤූ වීතමච්ඡරො,
නිච්චං මග්ගං විසොධෙති– සොත්ථානං සම්පරායිකං.

3. ඉච්චෙතෙ අට්ඨධම්මා ච සද්ධස්ස ඝරමෙසිනො
අක්ඛාතා සච්චනාමෙන උභයත්ථ සුඛාවහා.

4. දිට්ඨධම්මහිතත්ථාය සම්පරායසුඛාය ච
එවමෙතං ගහට්ඨානං චාගො පුඤ්ඤං පවඩ්ඪතීති.

මහණෙනි, යම් සෙයෙකින් ඇවිළ දන වස්ත්‍ර ඇතියේ හෝ ඇවිළ දන හිසැතියේ ඇවිළ දන ඒ වස්ත්‍රය හෝ ඇවිළ දන ඒ හිස හෝ නිවීමට අධිමාත්‍ර ඡන්දයත්, ව්‍යායාමයත්, උත්සාහයත් උසොාල්හියත්, නො කලකිරුමත් ස්මෘතියත් සම්ප්‍රජන්‍යයත් කෙරේ නම්, මහණෙනි, එපරිද්දෙම ඒ මහණහු විසින් එම ලාමක අකුශල ධර්ම යන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයත්, ව්‍යායාමයත්, උත්සාහයත් උසොාල්හියත් අප්‍රතිවානියත් ස්මෘතියත් සම්ප්‍රජන්‍යයත් කටයුතු යි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ ද: දවල් කලුරිය කරන මට අන්තරාය පිණිස යම් අකුශල ධර්ම කෙනෙක් වෙත් නම් එබඳු ලාමක අකුශල ධර්මයෝ අප්‍රහීණ වූවහු මට නැත. මහණෙනි, මහණහු විසින් කුශල ධර්මයන්හි දව ර හික්මෙනුවහු එම ප්‍රීති ප්‍රමොද්‍යයෙන් වාසය කටයුතු යි.

මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුලීකෘත මරණස්මෘතිය මහත්ඵල වෙයි, මහානෘශංස වෙයි, අමෘතාවගාහ වෙයි, අමෘත පර්‍යවසානත් වේ යයි.

## 8. 2. 8. 5

## ප්‍රථම සමපද සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ සම්පත්හු අට දෙනෙකි. කවර අට දෙනෙක යත්: උත්ථානසම්පද ය, ආරක්ෂාසම්පද ය, කල්‍යාණමිත්‍රතා ය, සමජීවිතා ය, ශ්‍රද්ධාසම්පද ය, ශීලසම්පද ය, ත්‍යාගසම්පද ය, ප්‍රඥසම්පද යි. මහණෙනි, මේ අෂ්ට සම්පත වෙයි.

1. කමතෙහි (කර්මාන්ත කරන තන්හි) නැඟී සිටුනා වැර ඇතියේ නො පමා වූයේ විධාන ඇතියේ සම ව ජීවිකා කෙරෙයි. රැස්කළ දැ රක්නේ යි.

2. සැදැහැතියේ ශීලයෙන් යුතු වූයේ බිණූ බස්හි අරුත් දන්නේ හළ මසුරුමල ඇතියේ පරලොව ඇසිරිකළ සුව ලැබීමට හේතු වූ කුසල් මහ නිරතුරු හෙළි කෙරෙයි.

3. ගිහිගෙවැසි සැදැහැති කුලපුත්‍රයාට දෙලොව සුව එළවන තෙල අට දහම්හු සත්‍යනාම (අන්වර්ථ නාම) ඇති බුදුන් විසින් මෙසේ වදරන ලදහ.

4. ගිහියනට දෘෂ්ටධර්මහිතය පිණිස ද සම්පරායික සුව ය පිණිස ද මෙසේ තෙල දහම වෙයි. ත්‍යාගය පින් වඩනේ යයි.

## 8. 2. 8. 6

## දුතිය සම්පදා සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමා භික්ඛවෙ සම්පදා: කතමා අට්ඨ: උට්ඨානසම්පදා, ආරක්ඛසම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිකතා, සද්ධාසම්පදා, සීලසම්පදා, චාගසම්පදා, පඤ්ඤාසම්පදාති.

1. කතමා ච භික්ඛවෙ උට්ඨානසම්පදා:

ඉධ භික්ඛවෙ කුලපුත්තො යෙන කම්මට්ඨානෙන ජීවිකං කප්පෙති යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන, තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං, අයං වුච්චති භික්ඛවෙ උට්ඨානසම්පදා.

2. කතමා ච භික්ඛවෙ ආරක්ඛසම්පදා;

ඉධ භික්ඛවෙ කුලපුත්තස්ස භොගා හොන්ති උට්ඨානවීරියාධිගතා බාහාබලපරිචිතා සෙදවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා සො තෙ[1] ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති 'කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං, න චොරා හරෙය්‍යුං, න අග්ගි ඩහෙය්‍ය, න උදකං වහෙය්‍ය, න අප්පියා දයාද හරෙය්‍යුන්ති. අයං වුච්චති භික්ඛවෙ ආරක්ඛසම්පදා.

3. කතමා ච භික්ඛවෙ කල්‍යාණමිත්තතා;

ඉධ භික්ඛවෙ කුලපුත්තො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති. තත්ථ යෙ තෙ හොන්ති ගහපති වා ගහපතිපුත්තා වා දහරා වා වුද්ධසීලිනො, වුද්ධා වා වුද්ධසීලිනො සද්ධාසම්පන්නා සීලසම්පන්නා චාගසම්පන්නා පඤ්ඤාසම්පන්නා, තෙහි සද්ධිං සන්තිට්ඨති, සල්ලපති, සාකච්ඡං සමාපජ්ජති, යථාරූපානං සද්ධාසම්පන්නානං සද්ධාසම්පදං අනුසික්ඛති, යථාරූපානං සීලසම්පන්නානං සීලසම්පදං අනුසික්ඛති, යථාරූපානං චාගසම්පන්නානං චාගසම්පදං අනුසික්ඛති, යථාරූපානං පඤ්ඤාසම්පන්නානං පඤ්ඤාසම්පදං අනුසික්ඛති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණමිත්තතා.

1. සො තෙ න - කත්ථචි.

## 8. 2. 8. 6

# ද්විතීය සම්පද සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ සම්පත්හු අටදෙනෙකි. කවර අටදෙනෙක යත්: උත්ථානසම්පද ය, ආරක්ෂසම්පද ය, කල්‍යාණමිත්‍රතා ය, සමජීවිකතා ය, ශ්‍රද්ධාසම්පද ය, ශීලසම්පද ය, ත්‍යාගසම්පද ය, ප්‍රඥසම්පද යි.

1. මහණෙනි, උත්ථානසම්පද නම් කවර:

මහණෙනි, මෙ ලොව්හි කුලපුත් සීසෑමෙන් වේවයි, වෙළඳමෙන් වේවයි, ගෙරි රැක්මෙන් වේවයි, දුනුවා කමින් වේවයි, රජ මෙහෙවරින් වේවයි, අන්‍යතර ශිල්පයෙකින් වේවයි, යම් ම කර්මාන්තයකින් ජීවිකාව කෙරේද, එහි ලා දක්ෂ වෙයි, අනලස් වෙයි, තත්‍රෝපාය විමංසායෙන් සමන්වාගත වෙයි, කරන්නට සමර්ථ වෙයි, සංවිධානයට සමර්ථ වෙයි. මහණෙනි මේ උත්ථාන සම්පද යි කියනු ලැබෙ.

2. මහණෙනි, ආරක්ෂසම්පද නම් කවර:

මහණෙනි, මෙ ලොව්හි කුලපුතක් හට උත්ථානවීර්‍යයෙන් ලැබූ, බාහුබලයෙන් රැස් කළ, සෝදිය වැහීමෙන් රැස් කළ, එයින් දැහැමි වූ, දැහැමින් ලත් භෝග කෙනෙක් වෙත් ද, හේ ඒ භොගයන් ආරක්ෂායෙන් සැහැවීමෙන් සපයා තබයි, කෙසේ ය: මා අයත් භොගයන් කෙසේ රජදරුවෝ පැහැර නො ගනිත් ද, සොරු පැහැර නො ගනිත් ද, ගිනි නො දවා ද, දිය පා නො කෙරේ ද, අප්‍රිය වූ දයාදයෝ බන්ධුහු හෝ පැහැර නො ගනිත් ද කියා යි. මහණෙනි, මේ ආරක්ෂසම්පද යි කියනු ලැබෙ.

3. මහණෙනි, කල්‍යාණමිත්‍රතා නම් කවර:

මහණෙනි, මෙ ලොව්හි කුලපුත් යම් ම ගම්කෙනෙක වේවයි, නියම් ගමෙක වේවයි වෙසේ ද, එහි ශ්‍රද්ධාසම්පන්න ශීලසම්පන්න ත්‍යාගසම්පන්න ප්‍රඥසම්පන්න වෘද්ධශීලී දහරයෝ වෙත්වයි, වෘද්ධශීලී වෘද්ධයෝ වෙත්වයි යම් ඒ ගැහැවි කෙනෙක් හෝ ගැහැවි පුත් කෙනෙක් හෝ ඇද්ද, ඔවුන් හා එක්ව සිටුනේ ය. එක්ව බණන්නේ ය. සාකච්ඡාවට වදනේ ය. යම්බඳු (නො වෙනස් ව සිටුනා) සැදෑ සපනුන්ගේ සැදෑ සපුව අනුව හික්මේ ද, යම් බඳු (නො වෙනස් ව සිටුනා) සිල් සපනුන්ගේ සිල්සපුව අනුව හික්මේ ද, යම් බඳු (නො වෙනස් ව සිටුනා) ත්‍යාගසම්පන්නයන්ගේ ත්‍යාගසම්පත් අනුව හික්මේ ද, යම් බඳු (නො වෙනස් ව සිටුනා) ප්‍රඥ සම්පන්නයන්ගේ ප්‍රඥසම්පත් අනුව හික්මේ ද. මහණෙනි, මේ කල්‍යාණ මිත්‍රතා යි කියනු ලැබෙ.

4. කතමාච භික්ඛවෙ සමජීවිතා:

ඉධ භික්ඛවෙ කුලපුත්තො ආයඤ්ච[1] භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති, න අච්චොගාළ්හං, නාතිහීනං, එවං මෙ ආයො වයං පරියාදය ඨස්සති න ච මෙ වයො ආයං පරියාදය ඨස්සතීති. සෙය්‍යථාපි භික්ඛවෙ, තුලාධාරො වා තුලාධාරන්තෙවාසී වා තුලං පග්ගහෙත්වා ජානාති, එත්තකෙනෙව ඔනතං, එත්තකෙනෙව උන්නතන්ති. එව මෙව ඛො භික්ඛවෙ කුලපුත්තො ආයඤ්ච භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති, න අච්චොගාළ්හං, න අතිහීනං, එවං මෙ ආයො වයං පරියාදය ඨස්සති. න ච මෙ වයො ආයං පරියාදය ඨස්සතීති.

සචායං භික්ඛවෙ කුලපුත්තො අප්පායො සමානො උළාරං ජීවිකං කප්පෙති, තස්ස භවන්ති වත්තාරො: උදුම්බරඛාදිකං වායං[2] කුලපුත්තො භොගෙ ඛාදතීති. සචෙ පනායං භික්ඛවෙ කුලපුත්තො මහායො සමානො කසිරං ජීවිකං කප්පෙති, තස්ස භවන්ති වත්තාරො: අජද්ධුමාරිකං[3] වායං කුලපුත්තො මරිස්සතී'ති. යතො ච ඛ්වායං භික්ඛවෙ කුලපුත්තො ආයං ච භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති, න අච්චොගාළ්හං, න අතිහීනං, එවං මෙ ආයො වයං පරියාදය ඨස්සති, න ච මෙ වයො ආයං පරියාදය ඨස්සතීති. අයං වුච්චති භික්ඛවෙ සමජීවිතා.

5. කතමා ච භික්ඛවෙ සද්ධාසම්පදා:

ඉධ භික්ඛවෙ කුලපුත්තො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං, "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. අයං වුච්චති භික්ඛවෙ, සද්ධාසම්පදා.

6. කතමා ච භික්ඛවෙ සීලසම්පදා:

ඉධ භික්ඛවෙ කුලපුත්තො පාණාතිපාතා පටිවිරතො හොති. -පෙ- සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. අයං වුච්චති භික්ඛවෙ සීලසම්පදා.

7. කතමාච භික්ඛවෙ චාගසම්පදා:

ඉධ භික්ඛවෙ කුලපුත්තො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති -පෙ- යාචයොගො දානසංවිභාගරතො. අයං වුච්චති භික්ඛවෙ චාගසම්පදා.

---

1. අයඤ්ච- කත්ථචි.
2. උදුම්බරඛාදී වායං - මජ්ඣං.
3. අජෙළමරණං වායං - මජ්ඣං.

4. මහණෙනි, සමජීවිතා නම් කවර:

මහණෙනි, මෙ ලොවිහි කුලපුත් භෝගයන්ගේ අයත් දැන භෝගයන්ගේ වැයත් දැන මෙසේ මාගේ අය වැය යට කොට ගෙන සිටුනේ ය, මාගේ වැය අය යට නොට ගෙන නො සිටුනේ ය යි අත්‍යවගාහ නො කොට අතිහීන නො කොට මොනොවට ජීවිකා කෙරෙයි. මහණෙනි, යම් පරිදි තුලධරයෙක් හෝ තුලධරු අතැවැසියෙක් හෝ තුලාව නගා ගෙන මෙතෙකින්ම නතුවිය. මෙතෙකින් ම මතුවී ය යි දන්නේ වේද, මහණෙනි, එපරිදි ම කුලපුත් භොගයන්ගේ අයත් දැන භොගයන්ගේ වැයත් දැන අත්‍යවගාහ නො කොට අතිහීන නො කොට මොනොවට ජීවිකා කරන්නේ ය. මෙසේ මාගේ අය, වැය යටකොට සිටුනේ ය. මාගේ වැය, අය යට කොටගෙන නොසිටුනේ ය යි කියා යි.

මහණෙනි, ඉදින් මේ කුලපුත් මද අය ඇතියේ උදර සේ ජීවිකා කෙරේ ද, එවිට "මේ කුලපුත් දිඹුල් කනුවක්හු සෙයින් භොගයන් වළඳ කෙරේය යි. ඔහට නිගාබණනුවෝ ඇත. මහණෙනි, ඉදින් මේ කුලපුත් මහත් අය ඇතියේ දුකසේ ජීවිකා කෙරේ ද, 'මේ කුලපුත් අනාථ මරණ ඇතියකු සෙයින් මැරේ'ය යි ඔහට නිගා බණනුවෝ ඇත. මහණෙනි, යම් හෙයකින් මේ කුලපුත් ඉමහත් නො කොට අතිහීන නො කොට මෙසේ මා අයත් අය, වැය යට කොට සිටුනේ ය, මාගේ වැය, අය යට කොට නො සිටුනේ ය යි භොගයන්ගේ අයත් දැන භොගයන්ගේ වැයත් දැන මොනොවට ජීවිකා කෙරෙයි ද, මහණෙනි, මේ සමජීවිතා යයි කියනු ලැබේ.

5. මහණෙනි, ශ්‍රද්ධා සම්පත් කවර:

මහණෙනි, මෙ ලොවිහි කුලපුත් සැදැහැතියේ වෙයි, 'ඒ භාග්‍යවත්හු මෙසේත්... දෙව්මිනිස්නට ශාස්තෘයහ, සිවුසස් දතුවහ, භගවත්හ''යි තථාගතයන් වහන්සේගේ සම්‍යක් සම්බොධිය අදහයි. මහණෙනි, මේ ශ්‍රද්ධාසම්පද යි කියනු ලැබේ.

6. මහණෙනි, ශීලසම්පත් කවර:

මහණෙනි, මෙ ලොවිහි කුලපුත් පණිවායෙන් දුරු වෙයි... මද පමා දෙකට කරුණු වූ රහමෙර පිමෙන් දුරු වෙයි. මහණෙනි, මේ ශීලසම්පද යි කියනු ලැබේ.

7. මහණෙනි, ත්‍යාගසම්පත් කවර:

මහණෙනි, මෙ ලොවිහි කුලපුත් පහව ගිය මලමසුරු ඇති සිතින් ගෙහි වසනේ ය... යදනට නිසි වූයේ දනසංවිභාගයෙහි ඇලුණේ වෙයි. මහණෙනි, මේ ත්‍යාගසම්පද යි කියනු ලැබේ.

8. කතමාච භික්ඛවෙ පඤ්ඤාසම්පදා:

ඉධ භික්ඛවෙ කුලපුත්තො පඤ්ඤවා හොති -පෙ- සම්මා දුක්ඛක්ඛයගාමිනියා. අයං වුච්චති භික්ඛවෙ පඤ්ඤාසම්පදා.

ඉමා ඛො භික්ඛවෙ අට්ඨසම්පදාති.

21. උට්ඨාතා කම්මධෙය්‍යෙසු අප්පමත්තො විධානවා,
සමං කප්පෙති ජීවිකං සම්භතං අනුරක්ඛති.

22. සද්ධො සීලෙන සම්පන්නො වදඤ්ඤූ වීතමච්ඡරො,
නිච්චං මග්ගං විසොධෙති සොත්ථානං සම්පරායිකං.

23. ඉච්චෙතෙ අට්ඨධම්මා ච සද්ධස්ස ඝරමෙසිනො,
අක්ඛාතා සච්චනාමෙන උභයත්ථ සුඛාවහා.

24. දිට්ඨධම්මහිතත්ථාය සම්පරායසුඛාය ච,
එවමෙතං ගහට්ඨානං චාගො පුඤ්ඤං පවඩ්ඪතීති,

## 8. 2. 8. 7

## ඉච්ඡා සුත්තං

[සාවත්ථිනිදානං]

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවොති ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං ආයස්මා සාරිපුත්තො එතදවොච.

අට්ඨිමෙ ආවුසො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ. අට්ඨ:

ඉධාවුසො භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්තවුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො උට්ඨහති ඝටති වායමති ලාභාය: තස්ස උට්ඨහතො ඝටතො වායමතො ලාභාය ලාභො නුප්පජ්ජති. සො තෙන අලාභෙන සොචති කිලමති පරිදෙවති, උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. අයං වුච්චතාවුසො භික්ඛු ඉච්ඡො විහරති ලාභාය, උට්ඨහති ඝටති, වායමති ලාභාය. න ච ලාභී සොචී ච පරිදෙවී ච චුතො ච සද්ධම්මා.

8. මහණෙනි, ප්‍රඥාසම්පත් කවර: මහණෙනි, මේ ලොව්හි කුලපුත් ප්‍රඥාවත් වෙයි... මොනොවට දුඃඛක්ෂයගාමිනි වූ... මහණෙනි, මේ ප්‍රඥාසම්පද යි කියනු ලැබේ.

මහණෙනි, මේ සම්පත්හු අට දෙන වෙත්,

1. කායභී කරන තන්හි නැගී සිටුනා වෙර ඇතියේ නොපමා වූයේ විදහන් ඇතියේ මොනොවට ජීවිකා කෙරෙයි. රැස් කළ දෑ රකියි.

2. සැදැහැතියේ ශීලයෙන් යුක්ත වූයේ වදන් දන්නේ හළ මසුරු මල ඇතියේ පරලොව ඇසිරි කළ සුබදයක මාර්ගය නිතර හෙළි කෙරෙයි.

3. ගිහිගෙයි වැසි සැදැහැති කුලපුත්හට දෙලොව සුව එළවන තෙල අට දහම්හු සත්‍යනාම (අන්වර්ථනාම) ඇති බුදුන් විසින් වදරන ලදහ.

4. මෙසේ තෙල දහම ගෘහස්ථයන්ගේ මෙලොව හිත පිණිස ද පරලොව සුව පිණිස ද වෙයි. ත්‍යාගය තෙමේ පින් වඩන්නේ යයි.

## 8. 2. 8. 7

## ඉච්ඡා සූත්‍රය

**[සැවැත්නිදන යි]**

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ 'ඇවැත්නි මහණෙනි' යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු 'ඇවැත්නි' යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල කීහ: ඇවැත්නි, මේ පුද්ගලයෝ අට දෙනෙක් ලෝකයෙහි ඇත්තාහ. විද්‍යමාන වෙත්. කවර අට දෙනෙක් ද යත්:

4. ඇවැත්නි, මෙ සස්නෙහි ප්‍රවිවෙකයෙන් වසන්නා වූ (කිසිවක් කෙරෙහි) අයත් පැවැතුම් ඇති (විදර්ශනා කාර්මික) මහණක්හට ලාභය පිණිස ඉච්ඡාවක් උපදියි. හෙ තෙමේ උත්සාහ කරයි. (පූර්වාපරවශයෙන්) සටයි. වැයම් කරයි. ලාභය පිණිස උත්සාහ කරන සටන වැයම් කරන ඔහුට ලාභය නූපදියි. හෙ තෙමේ ඒ අලාභයෙන් ශොක කෙරෙයි. ක්ලාන්ත වෙයි. වැලපෙයි. ළෙහි අත් ගසා හඩයි. මුළාවට පැමිණෙයි. ඇවැත්නි, මේ මහණ ලාභය පිණිස ඉච්ඡා ඇතියේ මෙසේ ලාභය පිණිස උත්සාහ කරයි. සටයි. වැයම් කරයි. ලාභ නොලබන සුල්ලේ ශෝක කරන්නේ ද වැලැපෙන්නේ ද ශාසනයෙන් ගිලිහුණේ ද වෙ යයි කියනු ලැබේ.

2. ඉධ පනාවුසො භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්තවුත්ති-නො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො උට්ඨහති, ඝටති වායමති ලාභාය. තස්ස උට්ඨහතො ඝටතො වායමතො ලාභාය ලාභො උප්පජ්ජති. සො තෙන ලාභෙන මජ්ජති පමජ්ජති, මද පමාදමාපජ්ජති. අයං වුච්චතාවුසො භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. උට්ඨහති ඝටති වායමති ලාභාය. ලාභී ච මදී ච පමාදී ච චුතො ච සද්ධම්මා.

3. ඉධ පනාවුසො භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්තවුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො න උට්ඨහති න ඝටති න වායමති ලාභාය. තස්ස අනුට්ඨහතො අඝටතො අවායමතො ලාභාය ලාභො නුප්පජ්ජති. සො තෙන අලාභෙන සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති. සම්මොහං ආපජ්ජති. අයං වුච්චතාවුසො භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. න උට්ඨහති න ඝටති න වායමති ලාභාය. න ච ලාභී සොචී ච පරිදෙවී ච චුතො ච සද්ධම්මා.

4. ඉධ පනාවුසො භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්තවුත්ති-නො ඉච්ඡා උප්පජ්ජති ලාභාය, සො න උට්ඨහති, න ඝටති න වායමති ලාභාය. තස්ස අනුට්ඨහතො අඝටතො අවායමතො ලාභාය ලාභො උප්පජ්ජති. සො තෙන ලාභෙන මජ්ජති පමජ්ජති. මද පමාදමාපජ්ජති, අයං වුච්ච-තාවුසො භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. න උට්ඨහති, න ඝටති, න වායමති ලාභාය. ලාභී ච මදී ච පමාදී ච චුතො ච සද්ධම්මා.

5. ඉධ පනාවුසො භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්තවුත්ති-නො ඉච්ඡා උප්පජ්ජති ලාභාය, සො උට්ඨහති, ඝටති වායමති ලාභාය, තස්ස උට්ඨහතො ඝටතො වායමතො ලාභාය ලාභො නුප්පජ්ජති. සො තෙන අලාභෙන න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති. අයං වුච්චතාවුසො භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. උට්ඨහති ඝටති වායමති ලාභාය. නච ලාභී න ච සොචී න ච පරිදෙවී අච්චුතො ච සද්ධම්මා.

2. ඇවැත්නි, මෙ සස්නෙහි ප්‍රවිවෙකයෙන් වසන (කිසිවක් කෙරෙහි) අයත් පැවතුම් නැති මහණක්හට ලාභයට ඉච්ඡාවක් උපදියි. හෙතෙමේ ලාභය පිණිස උත්සාහ කරයි, සටයි, වෑයම් කරයි, ලාභය පිණිස උත්සාහ කරන සටනා කරන වෑයම් කරන ඔහුට ලාභය උපදියි. හේ ලාභයෙන් මත්වෙයි, ප්‍රමත්ත වෙයි, මදයෙන් ප්‍රමාදයට පැමිණෙයි. ඇවැත්නි, මේ මහණ ලාභයට ඉච්ඡා ඇතියේ වෙසෙයි, ලාභය පිණිස උත්සාහ කරයි, සටයි, වෑයම් කරයි, ලාභ ලබනසුලුවූයේ ද මත්වනසුලු වූයේ ද ප්‍රමාදවන සුලු වූයේ ද සස්නෙන් ගිලිහුණේ ද වේ යයි කියනු ලැබේ.

3. ඇවැත්නි, මේ සස්නෙහි ප්‍රවිවෙකයෙන් වසන, (කිසිවක් කෙරෙහි) අයත් පැවැතුම් නැති මහණක්හට ලාභය පිණිස ඉච්ඡාවක් උපදියි. හේ ලාභය පිණිස උත්සාහ නො කෙරෙයි, නො සටයි, වෑයම් නොකරයි. ලාභ පිණිස උත්සාහ නො කරන නො සටන, වෑයම් නො කරන ඔහුට ලාභය නූපදියි, හෙ තෙමේ ඒ අලාභයෙන් ශොක කෙරෙයි, ක්ලාන්ත වෙයි, වැළැපෙයි, ළෙහි අත්ගසා හඬයි, මුළාවට පැමිණෙයි, ඇවැත්නි, මෙ මහණ ලාභය පිණිස රිසි ඇතියේ වෙසෙයි. ලාභය පිණිස උත්සාහ නො කරයි, නො සටයි: වෑයම් නො කරයි, ලාභ නො ලබන සුලු වූයේ ශොක කරන්නේ ද වැලැපෙන්නේ ද සස්නෙන් චුත වූයේ ද වේ යයි කියනු ලැබේ.

4. ඇවැත්නි, මෙ සස්නෙහි ප්‍රවිවෙකයෙන් වසන (කිසිවක් කෙරෙහි) අයත් පැවැතුම් නැති මහණක්හට ලාභය පිණිස ඉච්ඡාවක් උපදියි. හේ ලාභය පිණිස උත්සාහ නො කරයි, සටනා නො කරයි, වෑයම් නො කරයි, ලාභය පිණිස උත්සාහ නො කරන නො සටන වෑයම් නො කරන ඔහුට ලාභය උපදියි. හේ ඒ ලාභයෙන් මත් වෙයි. ප්‍රමත්ත වෙයි. මදයෙන් ප්‍රමාදයට පැමිණෙයි, ඇවැත්නි, මේ මහණ ලාභයට රිසි ඇතියේ වෙසෙයි, ලාභය පිණිස උත්සාහ නො කරයි, නො සටයි, වෑයම් නො කරයි, ලාභී වූයේ ද මත් වූයේ පමා වූයේ සස්නෙන් ගිලිහුණේ ද වේ යයි කියනු ලැබේ.

5. ඇවැත්නි, මෙ සස්නෙහි ප්‍රවිවෙකයෙන් වසන (කිසිවක් කෙරෙහි) අයත් පැවැතුම් නැති මහණක්හට ලාභය පිණිස රිසියෙක් උපදියි. හෙ ලාභය පිණිස උත්සාහ කරයි. සටයි, වෑයම් කරයි, ලාභය පිණිස උත්සාහ කරන සටනා කරන වෑයම් කරන ඔහුට ලාභය නූපදියි. හේ ඒ අලාභයෙන් ශොක නො කරයි. ක්ලාන්ත නො වෙයි. නො වැළැපෙයි. ළෙහි අත් පැහැර නො හඬයි, මුළාවට නො පැමිණෙයි, ඇවැත්නි, මෙ මහණ ලාභය පිණිස උත්සාහ කරයි, සටයි, වෑයම් කරයි, ලාභය නොලබනසුලු වූයේ ද ශොක නොරනසුලු වූයේ ද නො වැළැපෙනසුලු වූයේ ද සස්නෙන් නො ගිලිහුණේ ද වේ යයි කියනු ලැබේ.

6. ඉධ පනාවුසො භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්තවුත්ති-තො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො උට්ඨහති ඝටති වායමති ලාභාය. තස්ස උට්ඨහතො ඝටතො වායමතො ලාභාය ලාභො උප්පජ්ජති. සො තෙන ලාභෙන න මජ්ජති න පමජ්ජති න පමාදමාපජ්ජති. අයං වුච්චතාවුසො භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. උට්ඨහති ඝටති වායමති ලාභාය. ලාභී ච න ච මදී න ච පමාදී අච්චුතො ච සද්ධම්මා.

7. ඉධ පනාවුසො භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්ත වුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය. සො න උට්ඨහති න ඝටති න වායමති ලාභාය. තස්ස අනුට්ඨහතො අඝටතො අවායමතො ලාභාය ලාභො නුප්පජ්ජති. සො තෙන අලාභෙන න සොචති න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති. න සම්මොහං ආපජ්ජති. අයං වුච්චතාවුසො, භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. න උට්ඨහති, න ඝටති, න වායමති ලාභාය. න ච ලාභී න ච සොචී න ච පරිදෙවී අච්චුතො ච සද්ධම්මා.

8. ඉධ පනාවුසො භික්ඛුනො පවිවිත්තස්ස විහරතො නිරායත්ත වුත්තිනො ඉච්ඡා උප්පජ්ජති ලාභාය, සො න උට්ඨහති න ඝටති න වායමති ලාභාය, තස්ස අනුට්ඨහතො අඝටතො අවායමතො ලාභාය ලාභො උප්පජ්ජති. සො තෙන ලාභෙන න මජ්ජති, න පමජ්ජති න පමාද මාපජ්ජති. අයං වුච්චතාවුසො භික්ඛු ඉච්ඡො විහරති ලාභාය. න උට්ඨහති න ඝටති න වායමති ලාභාය. ලාභී ච න ච මදී ච න ච පමාදී ච අච්චුතො ච සද්ධම්මා.

ඉමෙ ඛො ආවුසො අට්ඨ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

6. ඇවැත්නි, මෙ සස්නෙහි ප්‍රවිවේකයෙන් වසන (කිසිවෙක්හි) අයත් පැවැතුම් නැති මහණක් හට ලාභය සඳහා ඊප්සායෙක් උපදනේ ය. හේ ලාභය සඳහා උත්සාහ කරයි, සටයි, ව්‍යායාම කරයි, ලාභය සඳහා නැඟී සිටුනා, සටන, ව්‍යායාම් කරන ඔහුට ලාභය උපදනේ ය. හේ ඒ ලාභයෙන් මත් නො වෙයි, පමා නො වෙයි, ප්‍රමාදයට නො යෙයි. ඇවැත්නි, මේ මහණ ලාභය සඳහා ඊප්සා ඇතියේ වාසය කෙරේ. ලාභය සඳහා උත්සාහ කරයි, සටයි, ව්‍යායාම කරයි. ලාභී වූයේත්. මද නැතියේත් පමා නැතියේත් සස්නෙන් නො ගිලිහුණේත් වෙ යයි කියනු ලැබෙ.

7. ඇවැත්නි, මෙ සස්නෙහි ප්‍රවිවේකයෙන් වසන (කිසිවෙක්හි) අයත් පැවැතුම් නැති මහණක්හට ලාභය සඳහා ඊප්සායෙක් උපදනේ ය. හේ ලාභය සඳහා උත්සාහ නො කරයි, නො සටයි, ව්‍යායාම නො කරයි, ලාභය සඳහා නැඟී නො සිටුන නො සටන ව්‍යායාම නොකරන ඔහුට ලාභය නූපදියි. හේ ඒ අලාභයෙන් නො සොස්නේ ය. ක්ලාන්ත නො කරයි, පරිදෙවනා නො කරයි, ළෙහි අත් ගසා නො හඩයි, මුළාවට නො පැමිණෙයි, ඇවැත්නි, මේ මහණ ලාභය සඳහා ඊප්සා ඇතියේ වාසය කෙරේ. ලාභය සඳහා උත්සාහ නො කරයි. නො සටයි, ව්‍යායාම නො කරයි. නො ද ලාභී වූයේ නො ද සොස්නාසුලු වූයේ නො ද පරිදෙවනා කරනසුලු වූයේ සස්නෙන් නො ද ගිලිහුණේ වේය යි කියනු ලැබෙ.

8. ඇවැත්නි, මෙ සස්නෙහි ප්‍රවිවෙක ඇති (කිසිවෙක්හි) අයත් වැටුම් නැති මහණක් හට ලාභය සඳහා ඊප්සායෙක් උපදනේ ය. හේ ලාභය සඳහා නැඟී නො සිටියි. නො සටයි, ව්‍යායාම නො කරයි, ලාභය පිණිස උත්සාහ නො කරන නො සටන ව්‍යායාම නො කරන ඔහුට ලාභය උපදියි. හේ ඒ ලාභයෙන් මත් නො වෙයි. පමා නො වේ. පමාවට නො පැමිණෙයි. ඇවැත්නි, ලාභය සඳහා මේ මහණ ඊප්සා ඇතියේ වාසය කෙරේ. ලාභී වූයේත් මද මත් නො වූයේත් පමා නැති යේත් සස්නෙන් නො ගිලිහුණේත් වෙ යයි කියනු ලැබෙ.

ඇවැත්නි, මේ පුද්ගලයෝ අට දෙන ලොවහි ඇත්තාහ, විද්‍යමාන වන්නාහ යි.

## 8. 2. 8. 8

## අලං සුත්තං

[සාවත්ථිනිදානං]

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛු ආමන්තෙසි -පෙ- ඡහි ආවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො අලං පරෙසං. කතමෙහි ඡහි:

ඉධාවුසො භික්ඛු ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු, සුතානඤ්ච ධම්මානං ධාරකජාතිකො හොති, ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛී හොති. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති. කල්‍යාණවාචො ච හොති, කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං.

ඉමෙහි ඛො ආවුසො ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො අලං පරෙසං.

පඤ්චහාවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, අලං පරෙසං. කතමෙහි පඤ්චහි;

ඉධාවුසො භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු, සුතානඤ්ච ධම්මානං ධාරකජාතිකො හොති, ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛී හොති. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්ම පටිපන්නො ච හොති. කල්‍යාණවාචො ච හොති -පෙ- සන්දස්සකො ච හොති -පෙ- සබ්‍රහ්මචාරීනං.

ඉමෙහි ඛො ආවුසො පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, අලං පරෙසං.

චතුහාවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං.[1] කතමෙහි චතුහි:

ඉධාවුසො භික්ඛු ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු, සුතානඤ්ච ධම්මානං ධාරකජාතිකො හොති, ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛී හොති, අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. නො ච කල්‍යාණවාචො හොති -පෙ- නො ච සන්දස්සකො හොති -පෙ- 'සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො ආවුසො චතුහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො නාලං පරෙසං.[1]

---

1. නො පරෙසං - සිමු.

## 8. 2. 8. 8
## අලං සූත්‍රය

[සැවැත්නිදන යි]

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ... ඇවැත්නි, දහම් සයෙකින් සමන්වාගත මහණ තමාහට සුදුසු වෙයි. මෙරමාහට සුදුසු වෙයි. කවර සයෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති (වහා දක්නාසුලු) ද වෙයි. දූරු දහමුන්ගේ අර්ථ පිරික්සනුයේ වෙයි. අරුත් දූන දහම් දූන ධර්මානුධර්මප්‍රතිපත්තියට පිළිපන්නෝ වෙයි. කල්‍යාණ වචන ඇතියේ කලණබස් හඬ ඇත්තේ ද වෙයි. අරුත් හඟවන විශිෂ්ට වූ නිදෙස් වූ පෞර වචනයෙන් සමන්විත වෙයි. සබ්‍රම්සරුනට කරුණු දක්වනුයේත් සමාදන් කරවනුයේත් සමුත්තෙජනා කරනුයේත් සම්පහංසනා කරනුයේත් වෙයි.

ඇවැත්නි, මෙ කරුණු සයින් සමන්වාගත වූ මහණ තමාහට සුදුසු වූයේ වෙයි. මෙරමාහට සුදුසුවූයේ වෙයි.

ඇවැත්නි, කරුණු පසෙකින් සමන්වාගත මහණ තමහට සුදුසු වූයේ මෙරමා හට සුදුසු වූයේ වෙයි. කවර පසෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති නොම වෙයි. ඇසූ දහම් දරන්නෙ වෙයි. දූරු දහමුන්ගේ අර්ථ පිරික්සනුයේත් වෙයි. අරුත් දූන දහම් දූන ධර්මානුධර්ම ප්‍රතිපන්න ද වෙයි...කලණ වදන් ඇතියේත් වෙයි...සබ්‍රම්සරුනට...සන්දශක ද වෙයි.

ඇවැත්නි, මෙ කරුණු පසින් සමන්වාගත මහණ තම හට සුදුසු වෙයි. මෙරමා හට සුදුසු වෙයි.

ඇවැත්නි, කරුණු සතරෙකින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි. පරහට සුදුසු නො වෙයි. කවර සතරෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති ද වෙයි. ඇසූ දහමුන් දරනසුල්ලෙ වෙයි. දූරු දහමුන්ගේ අරුත් පිරික්සනසුලු-වූයේත් වෙයි. අරුත් දූන දහම් දූන ධර්මානුධර්මප්‍රතිපන්නත් වෙයි. කලණ වදන් ඇතියේත් නො වෙයි...... සබ්‍රම්සරුනට...... සන්දශක නො වෙයි. මහණෙනි, මෙ සතර කරුණෙන් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි. පරහට සුදුසු නො වෙයි.

චතූහාවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං නාලං අත්තනො.[1] කතමෙහි චතූහි:

ඉධාවුසො භික්ඛු ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු සුතානඤ්ච ධම්මානං ධාරකජාතිකො හොති. නො ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛී හොති, නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. කල්‍යාණවාචො ච හොති -පෙ- සන්දස්සකො ච හොති සබ්‍රහ්මචාරීනං, ඉමෙහි ඛො ආවුසො චතූහි ධම්මෙහි සමන්නාගතො අලං පරෙසං, නාලං අත්තනො.[1]

තීහාවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං.[2] කතමෙහි තීහි:

ඉධාවුසො භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු සුතානඤ්ච ධම්මානං ධාරකජාතිකො හොති. ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛී හොති. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති. නො ච කල්‍යාණවාචො හොති -පෙ- නො ච සන්දස්සකො හොති සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො ආවුසො තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො, නාලං පරෙසං.[2]

තීහාවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං, නාලං අත්තනො[1]. කතමෙහි තීහි:

ඉධාවුසො භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු, සුතානඤ්ච ධම්මානං ධාරකජාතිකො හොති. නො ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛී හොති. නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, කල්‍යාණවාචො ච හොති -පෙ- සන්දස්සකො ච හොති -පෙ- සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො ආවුසො තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං නාලං අත්තනො,[1]

ද්වීහාවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො නො පරෙසං[3] කතමෙහි ද්වීහි:

ඉධාවුසො භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු. සුතානඤ්ච ධම්මානං ධාරකජාතිකො හොති. ධතානඤ්ච ධම්මානං අත්ථූපපරික්ඛී හොති, අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති. නො ච කල්‍යාණවාචො හොති -පෙ- නො ච සන්දස්සකො හොති -පෙ- සබ්‍රහ්මචාරීනං, ඉමෙහි ඛො ආවුසො ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අත්තනො. නාලං පරෙසං,[3]

---

1. නො අත්තනො - සිමු.
2. නො පරෙසං - සිමු.
3. නො පරෙසං - සිමු.

ඇවැත්නි, සතර කරුණෙකින් සමන්වාගත මහණ පරහට සුදුසු වෙයි, තමහට සුදුසු නො වෙයි. කවර සතරෙකින යත්:

ඇවැත්නි. මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති ද වෙයි. ඇසූ දහමුන් දරනසුලු ද වෙයි, දූරූ දහමුන්ගේ අරුත් පිරික්සන සුලු ද නො වෙයි, අරුත් දූන දහම් දූන ධම්මානුධම්මප්‍රතිපන්නත් නො වෙයි ... කලණබස් ඇතියේ ද වෙයි....සබ්‍රම්සරුනට...සඤ්ඤශික ද වෙයි. ඇවැත්නි, මෙ කරුණු සතරින් සමන්වාගත මහණ පරහට සුදුසු වෙයි, තමහට සුදුසු නො වෙයි.

ඇවැත්නි, තුන්දහමෙකින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි, පරහට සුදුසු නො වෙයි. කවර තුනෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති ද වෙ ම ය. ඇසූ දහමුන් දරන සැහැවි ඇත්තේ ද වෙයි. දූරූ දහමුන්ගේ අරුත් පිරික්සනසුලු ද වෙයි, අරුත් දූන දහම් දූන ධම්මානුධම්ම ප්‍රතිපන්නත් වෙයි, කලණවදන් ඇත්තේත් නො වෙයි.... සබ්‍රම්සරුනට සඤ්ඤශික ද නො වෙයි, ඇවැත්නි, මේ තුන්දහමින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි, පරහට සුදුසු නො වෙයි.

ඇවැත්නි, තුන්දහමෙකින් සමන්වාගත මහණ පරහට සුදුසු වෙයි. තමහට සුදුසු නො වෙයි. කවර තුනෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කුසල්දහම්හි ඛිප්පනිසන්ති ද නො වෙ ම ය. ඇසූ දහමුන් දරන සැහැවි ඇත්තේ ද වෙයි, දූරූ දහමුන්ගේ අරුත් පිරික්සන්නේ ද නො වෙයි, අරුත් දූන දහම් දූන ධම්මානුධම්ම ප්‍රතිපන්නත් නො වෙයි. කලණවදන් ඇත්තේත් වෙයි.... සබ්‍රම්සරුනට සඤ්ඤශික ද වෙයි. ඇවැත්නි, මේ තුන් දහමුන්ගෙන් සමන්වාගත මහණ පරහට සුදුසු වෙයි, තමහට සුදුසු නො වෙයි.

ඇවැත්නි, දෙදහමෙකින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි, පරහට සුදුසු නො වෙයි. කවර දෙකෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කුසල් දහම්හි ඛිප්පනිසන්ති ද නො වෙම ය. ඇසූ දහම් දරන සැහැවි ඇත්තේත් වෙයි, දූරූ දහමුන්ගේ අරුත් පිරික්සන සුල්ලේත් වෙයි, අරුත් දූන දහම් දූන ධම්මානුධම්ම ප්‍රතිපන්න ද වෙයි, කලණවදන් ඇත්තේ ද නො වෙයි ... සබ්‍රම්සරුනට ... සඤ්ඤශික ද නො වෙයි. ඇවැත්නි, මේ දෙදහමින් සමන්වාගත මහණ තමහට සුදුසු වෙයි, පරහට සුදුසු නො වෙයි.

ද්වීහාවුසො ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං නාලං අත්තනො[1] කතමෙහි ද්වීහි:

ඉධාවුසො භික්ඛු න හෙව ඛො ඛිප්පනිසන්ති ච හොති කුසලෙසු ධම්මෙසු, නො ච සුතානං ධම්මානං ධාරකජාතිකො හොති -පෙ- නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. කල්‍යාණ වාචො ච හොති, කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. ඉමෙහි ඛො ආවුසො ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං පරෙසං, නාලං අත්තනො[1]ති.

## 8. 2. 8. 9

## සෙඛපරිහානිය සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති. කතමෙ අට්ඨ:

කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා, සඞ්ගණිකාරාමතා, ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා, භොජනෙ අමත්තඤ්ඤුතා, සංසග්ගාරාමතා, පපඤ්චාරාමතා. ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

අට්ඨිමෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. කතමෙ අට්ඨ:

න කම්මාරාමතා, න භස්සාරාමතා, න නිද්දාරාමතා, න සඞ්ගණිකාරාමතා, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, භොජනෙ මත්තඤ්ඤුතා, අසංසග්ගාරාමතා, නිප්පපඤ්චාරාමතා, ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්තීති.

1. ඡනො අත්තනො - සිමු.

ඇවැත්නි, මෙදදහමෙකින් සමන්වාගත මහණ පරහට සුදුසු වෙයි, තමහට සුදුසු නො වෙයි. කවර දහම් දෙකෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කුසල්දහම්හි ඕපැනිසන්තී ද නො වෙ ම ය. ඇසූ දහම් දරන සැහැවි ඇත්තේ නො වෙයි...අරුත් දන දහම් දන ධර්මානුධර්මප්‍රතිපන්නත් නො වෙයි. යහපත් වචනඝොෂ ඇතියේ යහපත් වදන් ඇතියේ ද වෙයි. පළිබොධරහිත නිදොස් නො ගිලිහුණු පද ව්‍යඤ්ජන ඇති අරුත් ඇඟවීමෙහි සමත් පිරිපුන් වදනින් සමන්වාගත වෙයි. සබ්‍රම්සරුනට සම්මුඛයෙහි මෙත් කොට දක්වයි, සමාදන් කරවයි, උත්සාහවත් කරයි, ගුණ කියමින් සතුටු කරවයි, ඇවැත්නි, මේ දෙදහමින් සමන්වාගත මහණ පරහට සුදුසු වෙයි. තමහට සුදුසු නො වෙයි.

## 8. 2. 8. 9

## සේඛපරිහානිය සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ අටදහම් කෙනෙක් ශෛක්‍ෂ භික්ෂුහුගේ පරිහානිය පිණිස පවතිත්. කවර අටදෙනෙක යත්:

නවකම්හි නිරත බව ය, අල්ලාපසල්ලාපයෙහි නිරත බව ය, නිද්‍රායෙහි නිරත බවය, ගණසඞ්ගනිකායෙහි නිරත බව ය, ඉඳුරන්හි නො අවුරන ලද දෙරඇති බව ය, බොජුන්හි පමණ නොදන්නා බවය, (පස්වැදෑරුම්) සංසර්‍ගයෙහි නිරත බව ය, (තණ්හාමානදිට්ඨි) ප්‍රපඤ්චයන්හි නිරත බවයි. මහණෙනි, මේ අටදහම්හු ශෛක්‍ෂ භික්ෂුහුගේ පරිහානිය පිණිස පවතිත්.

මහණෙනි, මේ අටදහම් කෙනෙක් ශෛක්‍ෂ භික්ෂුහුගේ නො පිරිහීම පිණිස පවතිත්. කවර අට දෙනෙක යත්:

නවකම්හි නිරත නො වන බව ය, අලප්සලප්හි නිරත නො වන බව ය, නිද්‍රායෙහි නිරත නො වන බව ය, ගණසඞ්ගණිකායෙහි නිරත නො වන බව ය. ඉඳුරන්හි අවුරන ලද දෙර ඇති බව ය, බොජුන්හි පමණ දන්නා බව ය, සංසර්‍ගයෙහි නිරත නො වන බව ය, ප්‍රපඤ්චයන්හි නිරත නො වන බවයි. මහණෙනි, මේ අටදහම්හු ශෛක්‍ෂ භික්ෂුහුගේ නො පිරිහීම පිණිස පවතිත්.

## 8. 2. 8. 10

## කුසීතාරම්භවත්ථු සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨිමානි භික්ඛවෙ කුසීතවත්ථූනි. කතමානි අට්ඨ:

1. ඉධ භික්ඛවෙ භික්ඛුනා කම්මං කත්තබ්බං හොති. තස්ස එවං හොති: කම්මං ඛො මෙ කත්තබ්බං භවිස්සති. කම්මං ඛො පන මෙ කරොන්තස්ස කායො කිලමිස්සති හන්දාහං නිපජ්ජාමීති. සො නිපජ්ජති, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ පඨමං කුසීතවත්ථු.

2. පුනචපරං භික්ඛවෙ භික්ඛුනා කම්මං කතං හොති. තස්ස එවං හොති: අහං ඛො කම්මං අකාසිං, කම්මං ඛො පන මෙ කරොන්තස්ස කායො කිලන්තො, හන්දාහං නිපජ්ජාමීති. සො නිපජ්ජති, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං භික්ඛවෙ දුතියං කුසීතවත්ථු.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛුනා මග්ගො ගන්තබ්බො හොති. තස්ස එවං හොති: 'මග්ගො මෙ ගන්තබ්බො භවිස්සති, මග්ගං ඛො පන මෙ ගච්ඡන්තස්ස කායො කිලමිස්සති, හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය ඉදං භික්ඛවෙ, තතියං කුසීතවත්ථු.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛුනා මග්ගො ගතො හොති. තස්ස එවං හොති: අහං ඛො මග්ගං අගමාසිං, මග්ගං ඛො පන මෙ ගච්ඡන්තස්ස කායො කිලන්තො, හන්දාහං නිපජ්ජාමී'ති, සො නිපජ්ජති, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ චතුත්ථං කුසීතවත්ථු.

## 8. 2. 8. 10

## කුසීතාරම්භවත්ථු සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ කුසීතවත්ථු අටදෙනෙක් වෙති. කවර අටදෙනෙක යත්:

1. මහණෙනි, මෙ සස්නෙහි මහණ (චීවරවිචාරණාදි) කම් කටයුතු වෙයි. ඔහුට මෙ බඳු සිත් වෙ: "මා විසින් කම් කටයුතු වන්නේ ය. කම් කරන මාගේ කය ක්ලාන්ත වෙයි. එහෙයින් මම හොවිමි"යි හේ හොවියි. නො පත් ධ්‍යානාදියට පැමිණෙනු පිණිස අධිගම නො කළ ධ්‍යානාදිය අධිගම කරණු පිණිස සාක්ෂාත් නො කළ ධ්‍යානාදිය සාක්ෂාත් කරනු පිණිස වැර නො අරඹයි. මහණෙනි, මේ ප්‍රථම කුසීතවස්තුව යි.

2. තවද මහණෙනි, මහණ විසින් කම් කරන ලද්දයේ වෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: "මම කම් කෙළෙම් ම ය. කම් කරන මාගේ කය ක්ලාන්ත විය. එහෙයින් මම හොවිමි" යි හේ හොවියි. නොපත් ධ්‍යානාදියට පැමිණෙනු පිණිස අධිගම නො කළ ධ්‍යානාදිය අධිගම කරනු පිණිස සාක්ෂාත් නො කළ ධ්‍යානාදි සාක්ෂාත් කරනු පිණිස වැර නො අරඹයි. මහණෙනි, මේ ද්විතීය කුසීත වස්තුව යි.

3. තවද මහණෙනි, මහණහු විසින් මඟ යා යුතු වෙයි. ඔහුට මෙබඳු සිතක් වෙයි: "මා විසින් මඟ යා යුතු වෙයි. මඟ යන මාගේ කය ක්ලාන්ත වෙයි. එහෙයින් මම හොවිමි" යි හේ හොවියි. නොපත් ධ්‍යානාදියට පැමිණෙනු පිණිස අධිගම නො කළ ධ්‍යානාදිය අධිගම කරනු පිණිස සාක්ෂාත් නො කළ ධ්‍යානාදිය සාක්ෂාත් කරනු පිණිස වැර නො අරඹයි. මහණෙනි, මේ තෘතීය කුසීතවස්තුව යි.

4. තවද මහණෙනි, මහණහු විසින් මඟ ගියේ වෙයි ඔහුට මෙ බඳු සිතෙක් වෙ: "මම මඟ ගියෙමි වෙමි, මඟ යන මාගේ කය ක්ලාන්ත ය, එහෙයින් මම හොවිමි" යි. හේ හොවියි. නොපත් ධ්‍යානාදියට පැමිණෙනු පිණිස අධිගම නො කළ ධ්‍යානාදිය අධිගම කරනු පිණිස සාක්ෂාත් නො කළ ධ්‍යානාදිය සාක්ෂාත් කරනු පිණිස වැර නො අරඹයි. මහණෙනි, මෙ චතුර්ථ කුසීත වස්තුව යි.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො නාලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස මෙ කායො කිලන්තො, අකම්මඤ්ඤෙහං, නිපජ්ජාමී'ති. සො නිපජ්ජති. -පෙ- අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ, පඤ්චමං කුසීතවත්ථු.

6. පුනචපරං භික්ඛවෙ භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො අලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මෙ කායො ගරුකො අකම්මඤ්ඤො, මාසාචිතං[1] මඤ්ඤෙ, හන්දාහං නිපජ්ජාමී'ති සො නිපජ්ජති -පෙ- අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ ඡට්ඨං කුසීතවත්ථු.

7. පුනචපරං භික්ඛවෙ භික්ඛුනො උප්පන්නො හොති අප්පමත්තකො ආබාධො, තස්ස එවං හොති: "උප්පන්නො ඛො මෙ අයං අප්පමත්තකො ආබාධො, අත්ථිකප්පො[2] නිපජ්ජිතුං[3] හන්දාහං නිපජ්ජාමී'ති. සො නිපජ්ජති -පෙ- අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ සත්තමං කුසීතවත්ථු.

8. පුනචපරං භික්ඛවෙ භික්ඛු ගිලානා වුට්ඨිතො හොති, අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා. තස්ස එවං හොති: අහං ඛො ගිලානා වුට්ඨිතො අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා, තස්ස මෙ කායො දුබ්බලො අකම්මඤ්ඤො. හන්දාහං නිපජ්ජාමීති. සො නිපජ්ජති, න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ අට්ඨමං කුසීතවත්ථු.

ඉමානි ඛො භික්ඛවෙ අට්ඨ කුසීතවත්ථූනි ති.

1. මාසාචිතකං - සිමු.
2. අට්ඨිකප්පො - සිමු.
3. නිපජ්ජිතුං - සිමු.

5. තවද මහණෙනි, මහණ ගමෙක වේව යි නියම් ගමෙක වේව යි පිඬු පිණිස හැසිරෙන්නේ රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ භෝජනයක් කැමැති-තාක් පිරිපුන් කොට නො ලබයි. ඔහුට මෙ බඳු සිතක් වෙයි: “මම වනාහි ගම්හි වේව යි නියම්ගම්හි වේවයි පිඬු පිණිස හැසිරෙන්නෙම් රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජන කැමැති තාක් පිරිපුන් කොට නො ලත් මි. ඒ මාගේ කය ක්ලාන්ත ය. මම අකර්මණ්‍යයෙම් හොවිමි” යි. හේ හොවි යි...සාක්ෂාත් නො කළ ධ්‍යානාදිය සාක්ෂාත් කරනු පිණිස .. මහණෙනි, මේ පඤ්චම කුසීතවස්තුව යි.

6. තවද මහණෙනි, මහණ ගමෙක වේව යි නියම්ගමෙක වේව යි පිඬු පිණිස හැසිරෙනුයේ රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජන කැමැති තාක් පරිපූර්ණ කොට ලබයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: “මම වනාහි ගමෙක වේව යි නියම්ගමෙක වේවයි පිඬු පිණිස සෙරෙනුයෙම් රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ භොජන කැමැති තාක් පිරිපුන් කොට ලත්මි. ඒ මාගේ කුස බරෙක් වෙයි. අකර්මණ්‍ය වෙයි. තෙත් මෑ ඇටක් මෙනි. (නොහොත් මෑ බත් කෑවකුගේ කුස මෙනි. නොහොත් මෑ ඇට පිරූ පසිබ්බකයක් මෙනි) එහෙයින් මම හොවිමි”යි හේ හොවියි... සාක්ෂාත් නො කළ ධ්‍යානාදිය සාක්ෂාත් කරනු පිණිස... මහණෙනි, මේ ෂෂ්ඨ කුසීත වස්තු යි.

7. තවද මහණෙනි, මහණහට ස්වල්පමාත්‍ර ආබාධයෙක් උපන්නේ වෙයි. ඔහට මෙ බඳු සිතෙක් වෙයි: “මට ස්වල්පමාත්‍ර ආබාධයෙක් උපනේ වෙයි. හෝනට අදහසෙක් ඇත. එහෙයින් මම හොවිමි”යි හේ හොවියි... සාක්ෂාත් නො කළ ධ්‍යානාදිය සාක්ෂාත් කරනු පිණිස... මහණෙනි, මේ සප්තම කුසීතවස්තු යි.

8. තවද මහණෙනි, මහණ ගිලන් බැවින් නැඟී සිටියේ වෙයි. ගිලන් බැවින් නැඟී සිටි නොබෝ කල් ඇති වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: “මම වනාහි ගිලන් බැවින් නැඟී සිටියෙම් ගිලන් බැවින් නැඟී සිටි නොබෝකල් ඇතියෙම් වෙමි. ඒ මාගේ කය දුර්වල වූයේ අකර්මණ්‍ය වෙයි. එ හෙයින් මම හොවිමි” යි හේ හොවි. නො පත් ධ්‍යානාදියට පැමිණෙනු පිණිස අධිගම නො කළ ධ්‍යානාදිය අධිගම කරනු පිණිස, සාක්ෂාත් නො කළ ධ්‍යානාදිය සාක්ෂාත් කරනු පිණිස වැර නො අරඹයි. මහණෙනි, මේ අෂ්ටම කුසීතවස්තු යි.

මහණෙනි, මේ අෂ්ටකුසීත වස්තූහු වෙත්.

අට්ඨිමානි භික්ඛවෙ ආරම්භවත්ථූනි. කතමානි අට්ඨ:

1. ඉධ භික්ඛවෙ භික්ඛුනා කම්මං කත්තබ්බං හොති. තස්ස එවං හොති: කම්මං ඛො මෙ කත්තබ්බං භවිස්සති, කම්මං ඛො පන මෙ කරොන්තෙන න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං, හන්දාහං පටිගච්චෙව විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියායා'ති සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ පඨමං ආරම්භවත්ථු.

2. පුනචපරං භික්ඛවෙ භික්ඛුනා කම්මං කතං හොති. තස්ස එවං හොති: අහං ඛො කම්මං අකාසිං, කම්මං ඛො පනාහං කරොන්තො නාසක්ඛිං බුද්ධානං සාසනං මනසිකාතුං, හන්දාහං විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ දුතියං ආරම්භවත්ථු.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛුනා මග්ගො ගන්තබ්බො හොති. තස්ස එවං හොති: මග්ගො ඛො මෙ ගන්තබ්බො භවිස්සති, මග්ගං ඛො පන මෙ ගච්ඡන්තෙන න සුකරං බුද්ධානං සාසනං මනසිකාතුං. හන්දාහං පටිගච්චෙව විරියං ආරභාමි. -පෙ-. ඉදං භික්ඛවෙ තතියං ආරම්භවත්ථු.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛුනා මග්ගො ගතො හොති. තස්ස එවං හොති: අහං ඛො මග්ගං අගමාසිං, මග්ගං ඛො පනාහං ගච්ඡන්තො නාසක්ඛිං බුද්ධානං සාසනං මනසිකාතුං, හන්දාහං විරියං ආරභාමි -පෙ- ඉදං භික්ඛවෙ චතුත්ථං ආරම්භවත්ථු.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො නාලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස මෙ කායො ලහුකො කම්මඤ්ඤො, හන්දාහං විරියං ආරභාමි -පෙ- ඉදං භික්ඛවෙ පඤ්චමං ආරම්භවත්ථු.

මහණෙනි, මේ ආරම්භ වත්ථු අටෙකි. කවර අටෙකයත්:

1. මහණෙනි, මෙ සස්නෙහි මහණහු විසින් (චීවරවිචාරණාදී) කර්මාන්ත කටයුතු වෙයි, ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මා විසින් කර්මාන්ත කටයුතු වෙයි, කර්මාන්ත කරන මා විසින් බුදුවරුන්ගේ සස්න මෙනෙහි කිරීමට සුකර නො වෙයි, එහෙයින් මම පළමු ම අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස වැර අරඹමි" යි හේ අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස වැර වඩයි. මහණෙනි, මේ ප්‍රථමාරම්භවස්තු යි.

2. මහණෙනි, තවද මහණහු විසින් කර්මාන්ත කෙළේ වෙයි. ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මම වනාහි (චීවරාදී) කර්මාන්ත කෙළෙමි, කර්මාන්ත කරන මට බුදුන්ගේ සස්න මෙනෙහි කිරීමට නො හැකි වීමි, එ හෙයින් මම අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්-කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස වැර වඩමි" යි හේ අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස වැර වඩයි. මහණෙනි, මේ ද්විතියාරම්භවස්තු යි.

3. තවද මහණෙනි, මහණහු විසින් මඟ යා යුතු වෙයි. ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මඟ මා විසින් යා යුතු වෙයි. මඟ යන මා විසින් බුදුවරුන්ගේ සස්න මෙනෙහි කිරීමට සුකර නො වෙයි. එ හෙයින් මම... පළමු ව වැර අරඹමි". මහණෙනි, මේ තෘතිය ආරම්භ වස්තු යි.

4. තවද මහණෙනි, භික්ෂූහු විසින් මඟ යන ලද වෙයි. ඔහට මෙ බඳු සිතෙක් වෙයි: ""මම මඟ ගියෙමි. මඟ යන මට බුදුවරුන්ගේ සස්න මෙනෙහි කිරීමට නො හැකිවීමි. එ හෙයින් මම.... වැර අරඹමි". මහණෙනි, මේ චතුර්ථ ආරම්භ වස්තු යි.

5. මහණෙනි, තව ද මහණ ගමෙක වේවයි නියම් ගමෙක වේවයි පිඩු පිණිස සරනුයේ රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජන කැමැති තාක් පරිපූර්ණ කොට නො ලබයි. ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මම ගමෙක වේව යි නියම් ගමෙක වේව යි පිඩු පිණිස සරනුයෙම් රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භෝජන කැමැති තාක් පරිපූර්ණ කොට නො ලත්මි. ඒ මාගේ කය ලඝු වූයේත් කර්මණ්‍ය වූයේත් වෙයි. එහෙයින් මම...... වැර අරඹමි". මහණෙනි, මේ පඤ්චම ආරම්භවස්තු යි.

6. පුනචපරං භික්ඛවෙ, භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති: අහං ඛො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො අලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මෙ කායො බලවා කම්මඤ්ඤො. හන්දාහං විරියං ආරභාමි -පෙ- ඉදං භික්ඛවෙ, ඡට්ඨං ආරම්භවත්ථු.

7. පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො උප්පන්නො හොති අප්පමත්තකො ආබාධො. තස්ස එවං හොති: උප්පන්නො ඛො මෙ අයං අප්පමත්තකො ආබාධො. ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ ආබාධො පවඩ්ඪෙය්‍ය, හන්දාහං පටිගච්චෙව විරියං ආරභාමි -පෙ- ඉදං භික්ඛවෙ, සත්තමං ආරම්භවත්ථු.

8. පුනචපරං භික්ඛවෙ, භික්ඛු ගිලානා වුට්ඨිතො හොති, අචිර වුට්ඨිතො ගෙලඤ්ඤා. තස්ස එවං හොති: අහං ඛො ගිලානා වුට්ඨිතො, අචිර-වුට්ඨිතො ගෙලඤ්ඤා. ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ ආබාධො පච්චුදාවත්තෙය්‍ය, හන්දාහං පටිගච්චෙව විරියං ආරභාමි අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. සො විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං භික්ඛවෙ, අට්ඨමං ආරම්භවත්ථු.

ඉමානි ඛො භික්ඛවෙ, අට්ඨ ආරම්භවත්ථූනීති.

**යමකවග්ගො අට්ඨමො.**

**තස්සුද්දානං:**

දෙව සද්ධා දෙව මරණසති - දෙව සම්පද අථාපරෙ
ඉච්ඡා අලං පරිහානං - කුසීතං ආරම්භවත්ථූනීති.

6 මහණෙනි, තව ද මහණ ගමෙක වේව යි නියම් ගමෙක වේව යි පිඬු පිණිස සරනුයේ රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජන කැමැති තාක් පරිපූර්ණ කොට ලබයි. ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මම ගමෙක වේව යි නියම් ගමෙක වේවයි පිඬු පිණිස සරනුයෙම් රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජන කැමැති තාක් පරිපූර්ණ කොට ලත්මි. ඒ මාගේ කය බලවත් වූයේ කර්මණ්‍ය වේ. එ හෙයින් මම...වැර අරඹමි. මහණෙනි, මේ ෂෂ්ඨ ආරම්භ වස්තු යි.

7. මහණෙනි, තව ද මහණ හට අල්පමාත්‍ර ආබාධයෙක් උපනේ වෙයි. ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මට මේ අල්පමාත්‍ර ආබාධය උපනේ වෙයි. යම් හෙයෙකින් මාගේ මේ ආබාධය වැඩේ නම් තෙල කරුණ විද්‍යමාන වේ, එ හෙයින් මම පළමුම...... වැර අරඹමි". මහණෙනි, මේ සප්තම ආරම්භවස්තු යි.

8. තව ද මහණෙනි, මහණ ගිලන් බැවින් නැඟී සිටි නො බෝ කල් ඇතියේ ගිලන් බැවින් නැඟී සිටියේ වෙයි. ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මම ගිලන් බැවින් නැඟී සිටි නොබෝ කල් ඇතියෙම් ගිලන් බැවින් නැඟී සිටියෙම් වෙමි. යම් හෙයෙකින් මාගේ ආබාධය පෙරළා නැඟී සිටුනේ නම් තෙල කරුණ විද්‍යමාන වෙයි. එහෙයින් මම අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත්කරණය පිණිස වැර අරඹමි". යි හේ අප්‍රාප්තයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘතයාගේ සාක්ෂාත් කිරීම පිණිස වැර අරඹයි. මහණෙනි, මේ අෂ්ටම ආරම්භ වස්තු යි.

මහණෙනි, මොහු අෂ්ට ආරම්භ වස්තූහු වෙත්.

**අටවැනි යමකවග්ග යි.**

එහිලඳුනය:

සද්ධාව මුල්කොට ඇති (සමන්තපාසාදික) සූත්‍ර දෙකය, මරණසති සූත්‍ර දෙකය, සම්පද සූත්‍ර දෙකය, වැලි අනෙක් ඉච්ඡා සූත්‍රය, අලං සූත්‍රය, පරිහාන සූත්‍රය, කුසීතාරම්භවත්ථු සූත්‍රය දැයි දසයෙකි.

# 9. සතිවග්ගො

## 8. 2. 9. 1

## සතිසම්පජඤ්ඤ සුත්තං

[සාවත්ථිනිදානං]

සතිසම්පජඤ්ඤෙ භික්ඛවෙ, අසති සතිසම්පජඤ්ඤවිපන්නස්ස හතූපනිසං හොති හිරොත්තප්පං. හිරොත්තප්පෙ අසති හිරොත්තප්පවිපන්නස්ස හතූපනිසො හොති ඉන්ද්‍රියසංවරො. ඉන්ද්‍රියසංවරෙ අසති ඉන්ද්‍රියසංවරවිපන්නස්ස හතූපනිසං හොති සීලං. සීලෙ අසති සීලවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසො හොති නිබ්බිදවිරාගො. නිබ්බිදවිරාගෙ අසති නිබ්බිදවිරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ, රුක්ඛො සාඛාපලාසවිපන්නො, තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි න පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ, සතිසම්පජඤ්ඤෙ අසති සතිසම්පජඤ්ඤවිපන්නස්ස හතූපනිසං හොති හිරොත්තප්පං. හිරොත්තප්පෙ අසති හිරොත්තප්පවිපන්නස්ස හතූපනිසං හොති -පෙ- විමුත්තිඤාණදස්සනං.

සතිසම්පජඤ්ඤෙ භික්ඛවෙ, සති සතිසම්පජඤ්ඤසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති හිරොත්තප්පං. හිරොත්තප්පෙ සති හිරොත්තප්පසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති ඉන්ද්‍රියසංවරො. ඉන්ද්‍රියසංවරෙ සති ඉන්ද්‍රියසංවරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති සීලං. සීලෙ සති සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති නිබ්බිදවිරාගො. නිබ්බිදවිරාගෙ සති නිබ්බිදවිරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

# 9. සති වර්ගය

## 8. 2. 9. 1

## සතිසම්පජඤ්ඤ සූත්‍රය

**[සැවැත්නිදාන යි]**

මහණෙනි, ස්මෘතිසම්ප්‍රජන්‍යය නැති කල්හි ස්මෘතිසම්ප්‍රජන්‍යය නටුවහුගේ හිරිඔතප් හතොපනිඃශ්‍රය (නටඋපනිඃශ්‍රය ඇතියේ) වෙයි. හිරිඔතප් නැති කල්හි නට හිරිඔතප් ඇතියහුගේ ඉන්ද්‍රියසංවරය හතොපනිඃශ්‍රය වෙයි. ඉන්ද්‍රිය සංවරය නැති කල්හි ඉන්ද්‍රියසංවර විපන්නයාගේ සීලය හතොපනිඃශ්‍රය වෙයි. ශීලය නැති කල්හි ශීලවිපන්නයාගේ සම්‍යක්සමාධිය හතොපනිඃශ්‍රය වෙයි. සම්‍යක්සමාධිය නැතිකල්හි සම්‍යක්සමාධි විපන්නයාගේ යථාභූතඥනදර්‍ශනය හතොපනිඃශ්‍රය වෙයි. යථාභූතඥනදර්‍ශනය නැතිකල්හි යථාභූත ඥනදර්‍ශනවිපන්නයාගේ (බලවත් විදර්ශනා සඞ්ඛ්‍යාත) නිර්වේදය හා (ආර්‍යමාර්ග සඞ්ඛ්‍යාත) විරාගය හතොපනිඃශ්‍රය වෙයි. නිර්වේද විරාගය නැතිකල්හි නිර්වේද විරාග විපන්නයාගේ (අර්හත්ඵල හා ප්‍රත්‍යවෙක්ෂාඥන සඞ්ඛ්‍යාත) විමුක්තිඥන දර්‍ශනය හතොපනිඃශ්‍රය වේ.

මහණෙනි, අතුකොළ නැති රුකෙක් යම්සේ වේ නම් එහි පොතු ද පිරිපුන්බවට නොයෙයි, සිවියත් බොරුද් හරත් පිරිපුන්බවට නොයේ. මහණෙනි, එසෙයින් ම ස්මෘතිසම්ප්‍රජන්‍යය නැතිකල්හි ස්මෘති සම්ප්‍රජන්‍ය විපන්නයාගේ හිරිඔතප් නටුවා වූ ප්‍රත්‍යය ඇත්තේ වෙයි. හිරිඔතප් නැති කල්හි හිරිඔතප් විපන්නයාගේ ... විමුක්තිඥනදර්ශනය නටුවාවූ ප්‍රත්‍යය ඇත්තේ වේ.

මහණෙනි, ස්මෘතිසම්ප්‍රජන්‍යය ඇතිකල්හි ස්මෘතිසම්ප්‍රජන්‍ය සම්පන්නයාගේ හිරිඔතප් උපනිඃශ්‍රය සම්පන්න වෙයි. හිරිඔතප් ඇතිකල්හි හිරිඔතප්සපන්හුගේ ඉන්ද්‍රියසංවරය උපනිඃශ්‍රය සම්පන්න වෙයි. ඉන්ද්‍රිය සංවරය ඇතිකල්හි ඉන්ද්‍රිය සංවරසම්පන්නයාගේ ශීලය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ශීලය ඇතිකල්හි ශීලසම්පන්නයාගේ සම්‍යක්සමාධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සම්‍යක්සමාධිය ඇතිකල්හි සම්‍යක්සමාධිසම්පන්නයාගේ යථාභූතඥනදර්‍ශනය උපනිඃශ්‍රය සම්පන්න වෙයි. යථාභූතඥනදර්‍ශනය ඇතිකල්හි යථාභූතඥනදර්‍ශනසම්පන්නයාගේ නිර්වේදවිරාගය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිර්වේදවිරාගය ඇතිකල්හි නිර්වේදවිරාගසම්පන්නයාගේ විමුක්තිඥනදර්‍ශනය උපනිඃශ්‍රය සම්පන්න වේ.

සෙය්‍යථාපි භික්ඛවෙ, රුක්ඛො සාඛාපලාස සම්පන්නො තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ, සති සම්පජඤ්ඤෙ සති සතිසම්පජඤ්ඤසම්පන්නස්ස උපනිස සම්පන්නං හොති හිරොත්තප්පං, හිරොත්තප්පෙ සති හිරොත්තප්ප සම්පන්නස්ස උපනිසසම්පන්නං හොති -පෙ- විමුත්තිඤාණදස්සනන්ති.

## 8. 2. 9. 2

## පුණ්ණිය සුත්තං

**[සාවත්ථිනිදානං]**

අථ ඛො ආයස්මා පුණ්ණියො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා පුණ්ණියො භගවන්තං එතදවොච:

කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙන අප්පෙකදා තථාගතං ධම්මදෙසනා පටිභාති, අප්පෙකදා නප්පටිභාතීති?

සද්ධො ච පුණ්ණිය, භික්ඛු හොති, නො ච උපසඞ්කමිතා. නෙව තාව තථාගතං ධම්මදෙසනා පටිභාති. යතො ච ඛො පුණ්ණිය, භික්ඛු සද්ධො ච හොති, උපසඞ්කමිතා ච. එවං තථාගතං ධම්මදෙසනා පටිභාති.

සද්ධො ච පුණ්ණිය, භික්ඛු හොති උපසඞ්කමිතා ච නො ච පයිරුපාසිතා -පෙ- පයිරුපාසිතා ච නො ච පරිපුච්ඡිතා -පෙ- පරිපුච්ඡිතා ච නො ච ඔහිතසොතො ධම්මං සුණාති -පෙ- ඔහිත සොතො ච ධම්මං සුණාති නො ච සුත්වා ධම්මං ධාරෙති. -පෙ- සුත්වා ච ධම්මං ධාරෙති නො ච ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති -පෙ- ධතානඤ්ච ධම්මානං අත්ථං උපපරික්ඛති නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානු-ධම්මපටිපන්නො හොති, නෙව තාව තථාගතං ධම්මදෙසනා පටිභාති.

යතො ච ඛො පුණ්ණිය, භික්ඛු සද්ධො ච හොති උපසඞ්කමිතා ච පයිරුපාසිතා ච පරිපුච්ඡිතා ච ඔහිතසොතො ච ධම්මං සුණාති, සුත්වා ච ධම්මං ධාරෙති, ධතානඤ්ච ධම්මානං අත්ථං උපපරික්ඛති, අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති. එවං තථාගතං ධම්මදෙසනා පටිභාති. ඉමෙහි ඛො පුණ්ණිය අට්ඨහි ධම්මෙහි සමන්නාගතො එකන්තපටිභානං තථාගතං ධම්මදෙසනා හොතීති.

මහණෙනි, යම්පරිදි අතුකොළින් යුත් රුකෙක් වේ නම් එහි පොතුත් පිරිපුන් බවට යෙයි ද, සිවියත් බොරුත් හරත් පිරිපුන් බවට යෙයි ද, මහණෙනි, එපරිදි ම ස්මෘතිසම්ප්‍රජන්‍යය ඇතිකල්හි ස්මෘතිසම්ප්‍රජන්‍ය සම්පන්නයාගේ හිරිඔතප් උපනිඃශ්‍රය සම්පන්න වෙයි. හිරිඔතප් ඇතිකල්හි හිරිඔතප් සපන්හුගේ ... විමුක්තිඥානදර්‍ශනය උපනිඃශ්‍රය සම්පන්න වේ යයි.

## 8. 2. 9. 2

## පුණ්ණිය සූත්‍රය

**[සැවැත්නිදන යි]**

එකල්හි ආයුෂ්මත් පුණ්ණිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹිය හ ... එකත්පසෙක හුන් ආයුෂ්මත් පුණ්ණිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කීහ:

වහන්ස, යම් කරුණෙකින් තථාගතහට කිසිකලෙක ධර්‍මදේශනාව වටහා නම්, කිසිකලෙක නො වටහා නම් එයට හේතු කවර යැ, ප්‍රත්‍යය කවර යැ යි?

පුණ්ණිය, භික්ෂු තෙමේ ශ්‍රද්ධා ඇතියේ ද වෙයි, එළඹෙන සුලු ද නො වෙයි. ඒ තාක් කල් තථාගතහට ධර්‍මදේශනාව නො වටහයි. පුණ්ණිය, යම් කලෙක භික්ෂු තෙමේ ශ්‍රද්ධා ඇතියේත් වේ ද, එළැඹෙන සුලුත්වේ ද, එසේවත් ම තථාගතහට ධර්‍මදේශනාව වටහයි.

පුණ්ණිය, භික්ෂු ශ්‍රද්ධා ඇතියේත් වෙයි, එළැඹෙනුයේත් වෙයි, ඇසුරු නො කරනුයේත් වෙයි. ... ඇසුරුකරනුයේත් වෙයි, පරිපෘච්ඡා නො කරනුයේත් වෙයි ... පරිපෘච්ඡා කරනුයේත් වෙයි, යොමුකළ කන් ඇතියේ දහම් නො ද අසයි ... යොමු කළ කන්ඇතියේ දහම් අස අසා දහම් නො ද ධරයි. ... අසා ධර්‍මය ධරන්නේත් වෙයි. දැරූ දහමුන්ගේ අරුත් නො පිරික්සයි ... දැරූ දහමුන්ගේ අර්‍ථ ද පිරික්සයි අරුත් දැන දහම් දැන ධර්මානු-ධර්මප්‍රතිපන්න නො වේ. එතාක් තථාගතහට ධර්මදෙශනාව නො වටහ යි.

පුණ්ණිය, යම් කලෙක භික්ෂු තෙමේ ශ්‍රද්ධා ඇතියේත් වේ ද, වෙත එළැඹෙනුයේත් වේ ද, ඇසුරුකරනුයේත් වේ ද, පරිපෘච්ඡාකරනුයේත් වේ ද, අවහිතශ්‍රොත්‍ර වූයේත් දහම් අසා ද, අසා දහමත් ධරා ද, ධැරූ දහමුන්ගේ අරුත් පිරික්සන්නේ ද, අරුත් දැන, දහම් දැන ධර්මානුධර්ම ප්‍රතිපන්නත් වේ ද, මෙසේ තථාගතහට ධර්මදේශනාව වටහ යි. පුණ්ණිය, මේ දහම් අටින් සමන්වාගත වූවහුට තථාගතයන්ගේ ඒකාන්ත ප්‍රතිභානඇති ධර්මදේශනාව වේ ය යි.

## 8. 2. 9. 3

## කිංමූලක සුත්තං

[සාවත්ථිනිදානං]

සචෙ භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කිංමූලකා ආවුසො, සබ්බෙ ධම්මා, කිංසම්භවා සබ්බෙ ධම්මා, කිංසමුදයා සබ්බෙ ධම්මා, කිංසමොසරණා සබ්බෙ ධම්මා, කිංපමුඛා සබ්බෙ ධම්මා, කිංආධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, කිංඋත්තරා සබ්බෙ ධම්මා, කිංසාරා සබ්බෙ ධම්මාති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං කින්ති බ්‍යාකරෙය්‍යාථාති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා භගවංනෙත්තිකා භගවං පටිසරණා. සාධු භන්තෙ, භගවන්තං යෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්ති ති.

තෙන හි භික්ඛවෙ, සුණාථ[1] සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සචෙ භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කිංමූලකා ආවුසො, සබ්බෙ ධම්මා, කිංසම්භවා සබ්බෙ ධම්මා, කිංසමුදයා සබ්බෙ ධම්මා, කිංසමොසරණා සබ්බෙ ධම්මා, කිංපමුඛා සබ්බෙ ධම්මා, කිංආධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, කිංඋත්තරා සබ්බෙ ධම්මා, කිං සාරා සබ්බෙ ධම්මාති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථ:

ඡන්දමූලකා ආවුසො, සබ්බෙ ධම්මා, මනසිකාරසම්භවා සබ්බෙ ධම්මා, ඵස්සසමුදයා සබ්බෙ ධම්මා, වෙදනා සමොසරණා සබ්බෙ ධම්මා, සමාධිපමුඛා සබ්බෙ ධම්මා, සතාධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, පඤ්ඤුත්තරා සබ්බෙ ධම්මා, විමුත්තිසාරා සබ්බෙ ධම්මා'ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරෙය්‍යාථාති.

1. දෙසෙස්සාමි. තං සුණාථ - මජසං

## 8. 2. 9. 3

## කිංමූලක සූත්‍රය

[සැවැත්නිදන යි]

ඉදින් මහණෙනි, අන් තොටු පිරිවැජියෝ මෙසේ පුළුවුස්නාහු ද: ඇවැත්නි, හැම දහම්හු (පඤ්චස්කන්ධයෝ) කුමක් මුල්කොට ඇත්තාහු ද, හැමදහම්හු කුමක් ප්‍රභවකොට ඇත්තාහු ද, හැමදහම්හු කුමක් සමුදයකොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් වැදගැනුම් කොට ඇත්තාහු ද, හැමදහම්හු කුමක් ප්‍රමුඛ කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් ආධිපත්‍යය කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් උතුරු කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් හරකොට ඇත්තාහු ද? කියායි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි අන්තොටු පිරිවැජියනට කුමැයි පවසවු ද?

වහන්ස, අපගේ ධර්මයෝ භගවත්හු මුල්කොට ඇත්තාහ. භගවත්හු නෙතෘකොට ඇත්තාහ. භගවත්හු පිළිසරණ කොට ඇත්තාහ. වහන්ස, තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා! භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අසා භික්ෂූහු ධරත්යි.

එසේ නම් මහණෙනි, අසවු, මොනොවට මෙනෙහි කරවු, කියමි යි. වහන්ස, එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක:

මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, හැම දහම්හු කුමක් මුල්කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් සමුදය කොට ඇත්තාහුද, හැම දහම්හු කුමක් වැදගැනුම් කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් ප්‍රමුඛ කොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් ආධිපත්‍යය කොට ඇත්තාහුද, හැම දහම්හු කුමක් උතුරුකොට ඇත්තාහු ද, හැම දහම්හු කුමක් හරකොට ඇත්තාහු දයි මෙසේ පුළුවුස්නාහු නම් මහණෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසවු.

ඇවැත්නි, හැම දහම්හු ඡන්දය (අධ්‍යාශයඡන්දය, කත්තුකම්‍යතා ඡන්දය) මුල්කොට ඇත්තාහ, හැම දහම්හු මනසිකාරය ප්‍රභවකොට ඇත්තාහ, හැම දහම්හු ස්පර්ශය සමුදය කොට ඇත්තාහ, හැම දහම්හු වෙදනාව වැදගැනුම් කොට ඇත්තාහ, හැම දහම්හු සමාධිය ප්‍රමුඛ කොට ඇත්තාහ, හැමදහම්හු ස්මෘතිය ආධිපත්‍යය කොට ඇත්තාහ, හැම දහම්හු ප්‍රඥව උතුරු කොට ඇත්තාහ, හැම දහම්හු විමුක්තිය සාරකොට ඇත්තාහ යි. මහණෙනි, මෙසේ පුළුවුස්නාලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසවු යි.

## 8. 2. 9. 4.

## මහා චොරඞ්ග සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො මහාචොරො බිප්පං පරියාපජ්ජති, න චිරට්ඨිතිකො හොති. කතමෙහි අට්ඨහි:

අප්පහරන්තස්ස පහරති, අනවසෙසං ආදියති, ඉත්ථිං හනති, කුමාරිං දූසෙති, පබ්බජිතං විලුම්පති, රාජකොසං විලුම්පති, අච්චාසන්නෙ කම්මං කරොති, න ච නිධානකුසලො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහඞ්ගෙහි සමන්නාගතො මහාචොරො බිප්පං පරියාපජ්ජති, න චිරට්ඨිතිකො හොති.

අට්ඨහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො මහාචොරො න බිප්පං පරියාපජ්ජති, චිරට්ඨිතිකො හොති. කතමෙහි අට්ඨහි;

න අප්පහරන්තස්ස පහරති, න අනවසෙසං ආදියති, න ඉත්ථිං හනති, න කුමාරිං දූසෙති, න පබ්බජිතං විලුම්පති, න රාජකොසං විලුම්පති, න අච්චාසන්නෙ කම්මං කරොති, නිධාන කුසලො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ, අට්ඨහි අඞ්ගෙහි සමන්නාගතො මහාචොරො න බිප්පං පරියාපජ්ජති. චිරට්ඨිතිකො හොතීති.

## 8. 2. 9. 5.

## තථාගතාධිවචන සුත්තං

[සාවත්ථිනිදානං]

සමණොති භික්ඛවෙ, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මා-සම්බුද්ධස්ස. බ්‍රාහ්මණොති භික්ඛවෙ, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. භිසක්කොති භික්ඛවෙ, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. වෙදගූ ති භික්ඛවෙ, තථාගතස්සෙතං අධි-වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. නිම්මලො ති භික්ඛවෙ, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. විමලොති භික්ඛවෙ, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. ඤාණී ති භික්ඛවෙ තථා-ගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. විමුත්තො ති භික්ඛවෙ; තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්සාති.

## 8. 2. 9. 4

## මහාචොරඞ්ග සූත්‍රය

**[සැවත්නිදන යි]**

මහණෙනි, අටහෙකින් සමන්වාගත මහසොර වහා අවසානයට පැමිණෙයි, චිරසථිතික නො වෙයි. කවර අටෙකින යත්:

නො පහරනුවහට පහර දෙයි, නිඃශෙෂ කොට ගනියි, ස්ත්‍රිය නසයි. කුමරිය දූෂණ කෙරෙයි පැවිද්ද පැහැර ගනියි, රාජභාණ්ඩාගාරය පැහැර ගනියි, ඉතා නුදුරෙහි සොරකම කෙරෙයි, නිධානයෙහි (ලද දෙය පරලොව තකා දක්ෂිණාර්හයන් වෙත පිදීමෙහි) දක්ෂ නො වේ. මහණෙනි, මේ අටහින් සමන්වාගත මහසොර වහා ගැනුමට යෙයි, චිරසථිතික නො වේ.

මහණෙනි, අටහෙකින් සමන්වාගත මහසොර වහා අවසානයට නො යෙයි, චිරසථිතික වෙයි. කවර අටකින යත්:

නො පහරනුව හට නො පහරයි, නිඃශෙෂකොට නො ගනියි, ස්ත්‍රිය නො නසයි, කුමරිය දූෂණ නො කරයි, පැවිද්ද වොලො ගැනුම් නො කෙරෙයි, රාජකොෂය වොලො ගැනුම් නො කෙරෙයි, ඉතා නුදුරෙහි සොරකම නො කෙරෙයි, නිධානයෙහි කුශල වේ. මහණෙනි, මේ අටහින් සමන්වාගත මහසොර වහා ගැනුමට නො යෙයි, චිරසථිතික වේ.

## 8. 2. 9. 5

## තථාගතාධිවචන සූත්‍රය

**[සැවත්නිදන යි]**

මහණෙනි, ශ්‍රමණ යන මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට නමෙකි. මහණෙනි, බ්‍රාහ්මණ යන මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට නමෙකි. මහණෙනි, වෙදගු යන මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට නමෙකි. මහණෙනි, භිසක්ක යන මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට නමෙකි. මහණෙනි, නිම්ල යන මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට නමෙකි. මහණෙනි, විමල යන මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට නමෙකි. මහණෙනි, ඤාණී යන මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට නමෙකි. මහණෙනි, විමුත්ත යන මේ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට නමෙකි.

1. යං සමණෙන පත්තබ්බං බ්‍රාහ්මණෙන වුසීමතා,
යං වෙදගුනා පත්තබ්බං භිසක්කෙන අනුත්තරං.

2. යං නිම්මලෙන පත්තබ්බං විමලෙන සුචීමතා,
යං ඤාණිනා පත්තබ්බං විමුත්තෙන අනුත්තරං.

3. සොහං විජිතසඞ්ගාමො මුත්තො මොචෙමි බන්ධනා,
නාගොම්හි පරමො දන්තො අසෙඛො පරිනිබ්බුතො ති.

## 8. 2. 9. 6

## නාගිත සුත්තං

එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන ඉච්ඡානඞ්ගලං නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. අස්සොසුං ඛො ඉච්ඡානඞ්ගලකා බ්‍රාහ්මණගහපතිකා සමණො-ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො ඉච්ඡානඞ්ගලං අනුප්පත්තො ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො -පෙ- සාධු ඛො පන තථා-රූපානං අරහතං දස්සනං හොතී'ති.

අථ ඛො ඉච්ඡානඞ්ගලකා බ්‍රාහ්මණගහපතිකා තස්සා රත්තියා අච්චයෙන පහූතං ඛාදනීයං භොජනීයං ආදාය යෙන ඉච්ඡානඞ්ගලවනසණ්ඩො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා බහිද්වාරකොට්ඨකෙ අට්ඨංසු උච්චාසද්දා මහාසද්දා.

තෙන ඛො පන සමයෙන ආයස්මා නාගිතො භගවතො උපට්ඨාකො හොති. අථ ඛො භගවා ආයස්මන්තං නාගිතං ආමන්තෙසි: 'කෙ පන තෙ නාගිත, උච්චාසද්දා මහාසද්දා කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙ''ති?

එතෙ භන්තෙ ඉච්ඡානඞ්ගලකා බ්‍රාහ්මණගහපතිකා පහූතං ඛාදනීයං භොජනීයං ආදාය බහිද්වාරකොට්ඨකෙ ඨිතා භගවන්තංයෙව උද්දිස්ස භික්ඛුසඞ්ඝඤ්චාති.

1. බ්‍රාහ්මණ වූ වැස නිම වූ බඹසර ඇති මහණහු විසින් යමකට පැමිණිය යුතු ද, ඤණයෙහි කෙළවරට පත් වෙදහු විසින් අනුත්තර වූ යමකට පැමිණිය යුතු ද,

2. විමල වූ මනා නුවණ ඇති නිම්ලහු විසින් යමකට පැමිණිය යුතු ද, ඤණී වූ විමුක්තයා විසින් අනුත්තර වූ යමකට පැමිණිය යුතු ද,

3. දිනූ සඞ්ග්‍රාම ඇති ඒ මම මිදුනෙමි භවබන්ධනයෙන් (පෙස්සන්) මුදවමි. දමුණු කෙලෙස් පිරිනිවනින් පිරිනිවී අශෛක්ෂ වූ උතුම් නාග වෙමි යි.

## 8. 2. 9. 6

## නාගිත සූත්‍රය

එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල්රට මහබික්සඟුන් හා සැරිසරන සේක් කොසලයන්ගේ ඉච්ඡානඞ්ගල නම් බමුණුගමට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ ඉච්ඡානඞ්ගලයෙහි වූ ඉච්ඡානඞ්ගලවනළැහැබ්හි වසන සේක. ඉච්ඡානඞ්ගලක බමුණන් හා ගැහැවියෝ (සැහැපුත් සැහැකුලෙන් පැවිදි වූ) පින්වත් මහණ ගොයුම් ඉච්ඡානඞ්ගලයට පැමිණියේ ඉච්ඡානඞ්ගලයෙහි වූ ඉච්ඡානඞ්ගල වනළැහැබ්හි වාස කෙරේ යයි ඇසූහ. "මෙ කරුණෙනුදු ඒ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයහ ...... ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳු කලණකිත්ගොස උස්ව නැඟියේය. එබඳු රහතුන්ගේ දර්ශනය වේ නම් මැනැවැ" යි.

ඉක්බිති ඉච්ඡානඞ්ගලක බමුණන් හා ගැහැවියෝ ඒ රෑ ඉක්මයාමෙන් පසු බොහෝ ඛාද්‍ය භොජ්‍යයන් ගෙන ඉච්ඡානඞ්ගල වනළැහැබට එළැඹියහ. එළැඹ උස්හඬ- මහහඬ ඇත්තාහු බිහිදෙරොටුයෙහි සිටගත්හ.

එසමයෙහි ආයුෂ්මත් නාගිත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වෙත්. එකල භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නාගිත තෙරුන් ඇමතූසේක: නාගිතය, මසුන් මරා විකුණන තන්හි කෙවුළන් සෙයින් උස් හඬ- මහහඬ ඇති ඔහු කවරහ යි.

වහන්ස, මෙල ඉච්ඡානඞ්ගලක බමුණන් හා ගැහැවියෝ බොහෝ ඛාද්‍ය- භෝජ්‍ය ගෙන භාග්‍යවතුන් වහන්සේ හා භික්ෂුසඞ්ඝයා උදෙසා බිහිදෙරොටුයෙහි සිටියහයි.

මාහං නාගිත, යසෙන සමාගමං, මා ච මයා යසො, යො ඛො නාගිත, නයිමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්ස අකිච්ඡලාභී අකසිරලාභී, යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිරලාභී. සො තං මීළ්හසුඛං මිද්ධසුඛං ලාභසක්කාරසිලොකසුඛං සාදියෙය්‍යාති.

අධිවාසෙතු'දානි භන්තෙ, භගවා, අධිවාසෙතු සුගතො, අධිවාසනකාලො'දානි භන්තෙ, භගවතො. යෙන යෙනෙව'දානි භන්තෙ, භගවා ගමිස්සති, තන්නින්නාව භවිස්සන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා චෙව ජානපද ච. සෙය්‍යථාපි භන්තෙ, ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ යථා නින්නං උදකානි පවත්තන්ති, එවමෙව ඛො භන්තෙ, යෙන යෙනෙව'දානි භගවා ගමිස්සති, තන්නින්නාව භවිස්සන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා චෙව ජානපද ච තං කිස්ස හෙතු: තථා හි[1] භන්තෙ, භගවතො සීලපඤ්ඤාණන්ති.

මාහං නාගිත, යසෙන සමාගමං. මා ච මයා යසො. යො ඛො නාගිත නයිමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්ස අකිච්ඡලාභී අකසිරලාභී. යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිරලාභී, සො තං මීළ්හසුඛං මිද්ධසුඛං ලාභසක්කාරසිලොකසුඛං සාදියෙය්‍ය.

දෙවතාපි ඛො නාගිත, එකච්චා නයිමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභිනියො අස්සු අකිච්ඡලාභිනියො අකසිරලාභිනියො, යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිරලාභී.

1. තථා හි මෙ - සීමු.

නාගිතය, මම යශස් හා නො එක්වෙම්වා! යශස් මා හා නො එක් වේවා! නාගිතය, මම යම් ම නෙක්ඛම්මසුඛයක් පවිවෙකසුඛයක්, උපසම-සුඛයක්, සම්බොධසුඛයක්, කැමැතිසේ ලබනුයෙම් නිදුක්සේ ලබනුයෙම්, විපුල කොට ලබනුයෙම් වෙම් ද, යමෙක් මේ නෙක්ඛම්මසුඛය පවිවෙක සුඛය උපසමසුඛය සම්බොධසුඛය කැමැතිසේ නො ලබනුයේ නිදුක්සේ නො ලබනුයේ විපුල සේ නො ලබනුයේ වේ නම් හෙ මීළ්හසුඛ වූ මිද්ධ සුඛ වූ ඒ ලාභසත්කාර කීර්ත්ති සුඛය ඉවසන්නේ ය.

වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ ඉවසන සේක්වා! සුගතයන් වහන්සේ ඉවසන සේක්වා! වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ අධි-වාසන කාලයයි. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේ යම් යම් තැනෙකින් ම වඩනා සේක් ද, නියම්ගම් වැසිවූත් දනවු වැසිවූත් බමුණන් හා ගැහැවියෝ එතැනට නතුවූවාහු ම වෙත්. වහන්ස, යම්පරිදි දළ පොද ඇති මේඝය වස්නා කල්හි නතු තැන් නො ඉක්මැ දිය වැටේ ද, වහන්ස, එපරිදිම දැන් භාග්‍යවතුන් වහන්සේ යම් යම් තැනෙකින්ම වඩනා සේක්ද, නියම්ගම් වැසි වූත් දනවු වැසිවූත් බමුණන් හා ගැහැවියෝ එතැනට නතු වූවාහු ම වෙත්. ඒ කවර හෙයිත: වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ශීලය හා ප්‍රඥව එසේ මැයි.

නාගිතය, මම යශස් හා නො එක්වෙම්වා! යශස් ද මා හා නො එක් වේවා! නාගිතය, මම යම් ම නෙක්ඛම්මසුඛයක් පවිවෙක සුඛයක් උප-සම සුඛයක් සම්බොධ සුඛයක් කැමැතිසේ ලබනුයෙම්, නිදුක්සේ ලබනු-යෙම්, විපුලකොට ලබනුයෙම් වෙම් ද, යමෙක් මේ නෙක්ඛම්ම සුඛය, පවිවෙක සුඛය, උපසම සුඛය, සම්බොධ සුඛය කැමැතිසේ නො ලබනුයේ නිදුක්සේ නො ලබනුයේ විපුලසේ නො ලබනුයේ වේ නම් හෙතෙමේ මීළ්හසුඛ (අසුචිසුඛ) වූ මිද්ධ සුඛ (නිද්‍රාසුඛ) වූ ඒ ලාභසත්කාර ශ්ලොක-සුඛය ඉවසන්නේ ය.

නාගිතය, මම යම් නෙක්ඛම්මසුඛයක් පවිවෙක සුඛයක් උපසම සුඛයක් සම්බොධ සුඛයක් කැමැතිසේ ලබනුයෙම් නිදුක්සේ ලබනුයෙම් විපුලසේ ලබනුයෙම් වෙම් නම් ඇතැම් දෙවතාවෝත් මේ නෙක්ඛම්මසුඛය පවිවෙක සුඛය උපසම සුඛය සම්බොධ සුඛය කැමැතියේ ලබන්නාහු නිදුක්සේ ලබන්නාහු විපුලසේ ලබන්නාහු නො වෙත්.

1. තුම්හාකම්පි ඛො නාගිත, සඞ්ගම්ම සමාගම්ම සඞ්ගණිකවිහාරං අනුයුත්තානං විහරතං එවං හොති: නහනූන මෙ ආයස්මන්තො ඉමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභිනො අස්සු, අකිච්ඡලාභිනො අකසිරලාභිනො, යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිරලාභී තථා හි පනමෙ[1] ආයස්මන්තො සඞ්ගම්ම සමාගම්ම සඞ්ගණික විහාරං අනුයුත්තා විහරන්ති.

2. ඉධාහං නාගිත, භික්ඛූ පස්සාමි අඤ්ඤමඤ්ඤං අඞ්ගුලිපතොදකෙහි සඤ්ජග්ඝන්තෙ සඞ්කීළන්තෙ. තස්ස මය්හං නාගිත, එවං හොති: නහනූනමෙ[2] ආයස්මන්තො ඉමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභිනො අකිච්ඡලාභිනො අස්සු අකසිරලාභිනො යස්සාහං නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසම සුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිරලාභී තථා හි පනමෙ[1] ආයස්මන්තො අඤ්ඤමඤ්ඤං අඞ්ගුලිපතොදකෙහි සඤ්ජග්ඝන්ති[3] සඞ්කීළන්ති.

3. ඉධාහං[4] නාගිත, භික්ඛූ පස්සාමි යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං[5] මිද්ධසුඛං අනුයුත්තෙ විහරන්තෙ. තස්ස මය්හං නාගිත, එවං හොති: නහනූන මෙ[2] ආයස්මන්තො ඉමස්ස නෙක්ඛම්මසුඛස්ස පවිවෙකසුඛස්ස උපසම සුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභිනො අස්සු අකිච්ඡලාභිනො අකාරලාභිනො යස්සාහං නෙක්ඛම්ම සුඛස්ස පවිවෙකසුඛස්ස උපසමසුඛස්ස සම්බොධසුඛස්ස නිකාමලාභී අස්සං, අකිච්ඡලාභී අකසිරලාභී තථා හි මෙ ආයස්මන්තො යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං[5] මිද්ධසුඛං අනුයුත්තා විහරන්ති.

4. ඉධාහං[4] නාගිත, භික්ඛුං පස්සාමි ගාමන්තවිහාරිං සමාහිතං නිසින්නං, තස්ස මය්හං නාගිත, එවං හොති:

1. තථා හි මෙ - සීමු.
2. නාහිනූනමෙ-මජසං.
3. සඤ්ජග්ඝන්ති, - මජසං
4. ඉමාහං, - මජසං
5. එස්සසුඛං - සීමු..

1. නාගිතය, රැස්ව මුළුදී සඞ්ගණිකවිහාරයෙහි ඇලී වෙසෙන තොපට ද මෙබඳු සිතෙක් වෙයි: මම යම් ම නෙක්ඛම්ම සුඛයක් පවිවෙක සුඛයක් උපසම සුඛයක් සම්බොධ සුඛයක් කැමැතිසේ ලබනුයෙම් නිදුක්සේ ලබනුයෙම් විපුලසේ ලබනුයෙම් වෙම් නම්, මේ ආයුෂ්මත්හු එකැතියෙන් මේ නෙක්ඛම්ම සුඛය, පවිවෙක සුඛය, උපසම සුඛය සම්බොධ සුඛය කැමැතිසේ ලබන්නාහු නිදුක්සේ ලබන්නාහු විපුලසේ ලබන්නාහු නො වෙති. එහෙයින්ම මේ ආයුෂ්මත්හු රැස්ව මුළුදී සඞ්ගණික විහාරයෙහි යෙදුණාහු වෙසෙති කියා යි.

2 . නාගිතය, මෙ සස්නෙහි උනුන් ඇඟිලියෙන් ගිරිතිකැවීමෙන් (ඇඟිලි කැවිටි කොට ගෙන විදීමෙන්) මහහඬින් සිනාසෙන ක්‍රීඩා කරන මහණුන් මම දක්මි. නාගිතය, ඒ මට මෙ සිත වෙයි: එකැතින් මේ ආයුෂ්මත්හු මම යම් ම නෙක්ඛම්ම සුඛයක් පවිවෙක සුඛයක් උපසම සුඛයක් සම්බොධ සුඛයක් කැමැතිසේ ලබනුයෙම්, නිදුක්සේ ලබනුයෙම්, විපුලසේ ලබනුයෙම් වෙම් නම් මේ ආයුෂ්මත්හු මේ නෙක්ඛම්ම සුඛය, පවිවෙක සුඛය, උපසම සුඛය, සම්බොධ සුඛය කැමැතිසේ ලබන්නාහු නිදුක්සේ ලබන්නාහු විපුලසේ ලබන්නාහු නො වෙති. එහෙයින්ම මේ ආයුෂ්මත්හු උනුන් ඇඟිලියෙන් ගිරිතිකැවීමෙන් මහහඬින් සිනාසෙති, ක්‍රීඩා කෙරෙති කියා යි.

3. නාගිතය, මම් මෙසස්නෙහි මහණුන් කැමැතිතාක් කුස්පුරා වළඳා ශය්‍යා සුඛයෙහි පාර්ශ්ව සුඛයෙහි මිද්ධ සුඛයෙහි යෙදී වාස කරනුවන් දක්මි. නාගිතය, එබඳු මට මෙ සිත වේ: එකතින් මේ ආයුෂ්මත්හු මම යම් ම නෙක්ඛම්ම සුඛයක් පවිවෙක සුඛයක් උපසම සුඛයක් සම්බොධ සුඛයක් කැමැතිසේ ලබනුයෙම්, නිදුක්සේ ලබනුයෙම්, විපුලසේ ලබනුයෙම් වෙම් නම් මේ ආයුෂ්මත්හු එතකින් මේ නෙක්ඛම්ම සුඛය පවිවෙක සුඛය උපසම සුඛය සම්බොධ සුඛය කැමැතිසේ ලබන්නාහු නිදුක්සේ ලබන්නාහු විපුලසේ ලබන්නාහු නො වෙත්. එහෙයින් ම මේ ආයුෂ්මත්හු කැමැතිතාක් කුස්පුරා වළඳා සෙය්‍යසුඛයෙහි එස්සසුඛයෙහි මිද්ධසුඛයෙහි යෙදුණාහු වෙසෙති කියා යි.

4, නාගිතය, මෙසස්නෙහි ග්‍රාමාන්තවිහාරී වූ සමාධිගත ව හුන් මහණකු මම දක්මි. නාගිතය, එබඳු මට මෙ සිත වෙයි:

ඉදානි ඉමං ආයස්මන්තං ආරාමිකො වා පච්චෙස්සති සමණුද්දෙසො වා, තං තම්හා සමාධිම්හා චාවෙස්සතීති. තෙනාහං නාගිත තස්ස භික්ඛුනො න අත්තමනො හොමි ගාමන්තවිහාරෙන.

5. ඉධ පනාහං නාගිත භික්ඛුං පස්සාමි ආරඤ්ඤකං ආරඤ්ඤෙ පචලායමානං නිසින්නං. තස්ස මය්හං නාගිත එවං හොති: ඉදානි අයං ආයස්මා ඉමං නිද්දකිලමථං පටිවිනොදෙත්වා අරඤ්ඤසඤ්ඤං යෙව මනසි කරිස්සති එකත්තන්ති. තෙනාහං නාගිත තස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙන.

6. ඉධ පනාහං නාගිත භික්ඛුං පස්සාමි ආරඤ්ඤකං අරඤ්ඤෙ අසමාහිතං නිසින්නං. තස්ස මය්හං නාගිත එවං හොති: ඉදානි අයමායස්මා අසමාහිතං වා චිත්තං සමාදහිස්සති, සමාහිතං වා චිත්තං අනුරක්ඛිස්සතීති. තෙනාහං නාගිත තස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙන.

7. ඉධ පනාහං නාගිත භික්ඛුං පස්සාමි ආරඤ්ඤකං අරඤ්ඤෙ සමාහිතං නිසින්නං. තස්ස මය්හං නාගිත එවං හොති: ඉදානි අයමායස්මා අවිමුත්තං වා චිත්තං විමුච්චිස්සති, විමුත්තං වා චිත්තං අනුරක්ඛිස්සතීති. තෙනාහං නාගිත තස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙන.

8. යස්මාහං නාගිත සමයෙ අද්ධානමග්ගප්පටිපන්නො න කඤ්චි පස්සාමි පුරතො වා පච්ඡතො වා, ඵාසු මෙ නාගිත තස්මිං සමයෙ හොති අන්තමසො උච්චාරපස්සාවකම්මායාති.

## 8. 2. 9. 7.

## පත්තනිකුජ්ජන සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස උපාසකස්ස ආකඞ්ඛමානො සඞ්ඝො පත්තං නිකුජ්ජෙය්‍ය. කතමෙහි අට්ඨහි:

භික්ඛූනං අලාභාය පරිසක්කති, භික්ඛූනං අනත්ථාය පරිසක්කති[1] භික්ඛූනං අවාසාය පරිසක්කති, භික්ඛූනං අක්කොසති පරිභාසති. භික්ඛූ භික්ඛූහි භෙදෙති බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති, ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතස්ස උපාසකස්ස ආකඞ්ඛමානො සඞ්ඝො පත්තං නිකුජ්ජෙය්‍ය.

1. අනාවාසාය-සීමු,-සයා

දැන් අරම් මෙහෙකරුවෙක් හෝ මේ ආයුෂ්මත්හු කරා පෙරළා එන්නේ ය. හෙරණෙක් හෝ ඒ සමාධියෙන් ඔහු පහකරන්නේ ය, නාගිතය, මම ඒ මහණහුගේ ඒ ග්‍රාමාන්ත විහාරයෙන් සතුටුසිතැතියෙම් නො වෙමි.

5. නාගිතය, මම මෙ සස්නෙහි අරනෙහි නිදමින් හුන් ආරණ්‍යක මහණක්හු දක්මි. නාගිතය, එබඳු මට මෙ සිත වෙයි: දැන් මේ ආයුෂ්මත් මේ නිද්‍රාක්ලමථය දුරු කොටලා එකත්‍වය වූ අරණ්‍යසංඥාව ම මෙනෙහි කරන්නේ ය කියා යි. නාගිතය, මම ඒ මහණහුගේ එ අරනවිහරණ-යෙන් තුටුසිතැතියෙම් වෙමි.

6. නාගිතය, මම මෙ සස්නෙහි අරනෙහි අසමාහිත ව හුන් ආරණ්‍ය මහණක්හු දක්මි. නාගිත, ඒ මට මෙබඳු සිතෙක් වෙයි: දැන් මේ ආයුෂ්මත් අසමාහිත වූ හෝ සිත සමාහිත කරන්නේ ය, සමාධිගත වූ හෝ සිත රක්නේ ය කියා යි. නාගිතය, මම එ භික්ෂුහුගේ ඒ අරන විහරණින් සතුටු සිතැතියෙම් වෙමි.

7. නාගිතය, මම මෙ සස්නෙහි අරනෙහි සමාහිත ව හුන් ආරණ්‍යක මහණක්හු දකිමි. නාගිතය, මට මෙබඳු සිතෙක් වෙයි: දැන් මේ ආයුෂ්මත් අවිමුක්ත වූ හෝ සිත විමුක්ත කරයි, විමුක්ත වූ හෝ සිත රක්නේ ය කියා යි. නාගිතය, එ මහණහුගේ එම අරන විහරණින් මම තුටුසිතැතියෙම් වෙමි.

8. නාගිතය, යම් සමයෙක්හි මම අදන්මඟට පිළිපන්නෙම් ඉදිරිපස්හි වේවයි පසුපස්හි වේවයි කිසිවකු නොදක්නෙම් නම් නාගිතය, එකල්හි මට යටත්පිරිසෙයින් මලමූකිසට ද පහසු වෙයි.

## 8. 2. 9. 7

## පත්තනික්කුජ්ජන සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, අටඟින් සමන්වාගත උපාසකයාහට සඞ්ඝ තෙමේ කැමැති වේ නම් පත්තනික්කුජ්ජන කර්මය කරන්නේ ය. කවර අටෙකින යත්:

භික්ෂූන්ගේ අලාභය පිණිස උත්සාහ කෙරෙයි. භික්ෂූන්ගේ අනර්ථය පිණිස උත්සාහ කෙරෙයි. භික්ෂූන්ගේ අවාසය පිණිස උත්සාහ කෙරෙයි, භික්ෂූන්ට ආක්‍රෝශ කෙරෙයි, පරිභව කෙරෙයි. මහණුන් මහණුන් හා බිඳුවයි. බුදුන්ගේ අගුණ කියයි, දහම්හි අගුණ කියයි, සඟුන්ගේ අගුණ කියයි. මහණෙනි, මේ අටඟින් සමන්වාගත උපාසකයාහට කැමැති වේ නම් සඞ්ඝයා පත්තනික්කුජ්ජන කර්මය (පිඩුවා නො පිළිගැනුම) කරන්නේ ය.

අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස උපාසකස්ස ආකඞ්ඛමානො සඞ්ඝො පත්තං උක්කුජ්ජෙය්‍ය. කතමෙහි අට්ඨහි:

න භික්ඛූනං අලාභාය පරිසක්කති, න භික්ඛූනං අනත්ථාය පරිසක්කති, න භික්ඛූනං ආවාසාය පරිසක්කති, න භික්ඛූනං අක්කොසති, පරිභාසති, න භික්ඛූ භික්ඛූහි භෙදෙති, බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සඞ්ඝස්ස වණ්ණං භාසති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතස්ස උපාසකස්ස ආකඞ්ඛමානො සඞ්ඝො පත්තං උක්කුජ්ජෙය්‍යාති,

## 8. 2. 9. 8.

## අප්පසාදප්පසාද සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානා උපාසකා අප්පසාදං පවෙදෙය්‍යුං. කතමෙහි අට්ඨහි:

ගිහීනං අලාභාය පරිසක්කති, ගිහීනං අනත්ථාය පරිසක්කති, ගිහීනං අක්කොසති පරිභාසති, ගිහී ගිහීහි භෙදෙති. බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති, අගොචරෙ ච නං පස්සන්ති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානා උපාසකා අප්පසාදං පවෙදෙය්‍යුං.

අට්ඨහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානා උපාසකා පසාදං පවෙදෙය්‍යුං. කතමෙහි අට්ඨහි:

න ගිහීනං අලාභාය පරිසක්කති' න ගිහීනං අනත්ථාය පරිසක්කති, න ගිහීනං අක්කොසති පරිභාසති, න ගිහී ගිහීහි භෙදෙති, බුද්ධස්ස වණ්ණං භාසති. ධම්මස්ස වණ්ණං භාසති, සඞ්ඝස්ස වණ්ණං භාසති, ගොචරෙ ච නං පස්සන්ති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානා උපාසකා පසාදං පවෙදෙය්‍යුන්ති.

මහණෙනි, අටහෙකින් සමන්වාගත උපාසකහට කැමැති වේ නම් සඞ්ඝයා පත්ත උක්කුජ්ජන කර්මය කරන්නේ ය. කවර අටහෙකින යත්:

භික්ෂූන්ගේ අලාභය පිණිස උත්සාහ නො කෙරෙයි, භික්ෂූන්ට අනර්ථය පිණිස උත්සාහ නො කෙරෙයි. භික්ෂූන්ට අවාසය පිණිස උත්සාහ නො කෙරෙයි. භික්ෂූන්ට ආක්‍රොෂ නො කෙරෙයි. පරිභව නො කෙරෙයි. භික්ෂූන් භික්ෂූන් හා නො බිඳුවයි. බුදුන්ගේ ගුණ වනයි. දහම්හි ගුණ වනයි. සඟුන්ගේ ගුණ වනයි. මහණෙනි, මේ අටහින් සමන්වාගත උපාසකයාහට කැමැති වේ නම් සඞ්ඝයා පත්ත උක්කුජ්ජන කර්මය කරන්නේ යි.

# 8. 2. 9. 8

## අප්පසාදප්පසාද සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, අටහෙකින් සමන්වාගත මහණහට උපාසකයෝ කැමැති වෙත් නම් අප්‍රසාදය දන්වන්නාහ. කවර අටහෙකින යත්:

ගිහියනට අලාභය පිණිස උත්සාහ කෙරෙයි. ගිහිනට අනර්ථය පිණිස උත්සාහ කෙරෙයි. ගිහිනට ආක්‍රොෂ කෙරෙයි, පරිභව කෙරෙයි, ගිහියන් ගිහියන් හා බිඳුවයි. බුදුන්ගේ අගුණ කියයි, දහම්හි අගුණ කියයි, සඟුන්ගේ අගුණ කියයි. අගොචරයෙහිදු ඔහු දකිති. මහණෙනි, මේ අටහින් සමන්වාගත මහණහට උපාසකයෝ කැමැති වන්නාහු නම් අප්‍රසාදය දන්වන්නාහ.

මහණෙනි, දහම් අටකින් සමන්වාගත මහණහට උපාසකයෝ කැමැති වෙත් නම් ප්‍රසාදය දන්වන්නාහ. කවර අටකරුණෙකින යත්:

ගිහීන්ගේ අලාභය සඳහා උත්සාහ නො කෙරෙයි. ගිහීනට අනර්ථ සඳහා උත්සාහ නො කෙරෙයි. ගිහීනට ආක්‍රොෂ නො කෙරෙයි. පරිභව නො කෙරෙයි. ගිහියන් ගිහියන් හා නො බිඳුවයි. බුදුන්ගේ ගුණ කියයි. දහම්හි ගුණ කියයි. සඟුන්ගේ ගුණ කියයි. ගොචරස්ථානයෙහිදු ඔහු දකිති. මහණෙනි, උපාසකයෝ කැමැති වෙත් නම් මේ අටකරුණින් සමන්වාගත මහණහට ප්‍රසාදය දන්වන්නාහු යි.

## 8. 2. 9. 9.

## පටිසාරණීයකම්ම සුත්තං

[සාවත්ථිනිදානං]

අට්ඨහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො පටිසාරණීයකම්මං කරෙය්‍ය. කතමෙහි අට්ඨහි:

ගිහීනං අලාභාය පරිසක්කති, ගිහීනං අනත්ථාය පරිසක්කති, ගිහීනං අක්කොසති පරිභාසති. ගිහී ගිහීහි භෙදෙති, බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති. ධම්මිකඤ්ච ගිහීපටිස්සවං න සච්චාපෙති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො පටිසාරණීය කම්මං කරෙය්‍ය.

අට්ඨහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො පටිසාරණීය කම්මං පටිප්පස්සම්භෙය්‍ය. කතමෙහි අට්ඨහි:

න ගිහීනං අලාභාය පරිසක්කති, න ගිහීනං අනත්ථාය පරිසක්කති, න ගිහීනං අක්කොසති පරිභාසති, න ගිහී ගිහීහි භෙදෙති, බුද්ධස්ස වණ්ණං භාසති ධම්මස්ස වණ්ණං භාසති, සඞ්ඝස්ස වණ්ණං භාසති, ධම්මිකඤ්ච ගිහීපටිස්සවං සච්චාපෙති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහි ධම්මෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො පටිසාරණීය කම්මං පටිප්පස්සම්භෙය්‍යාති.

## 8. 2. 9. 10.

## තස්සපාපියස්සිකා සම්මාවත්තන සුත්තං

[සාවත්ථිනිදානං]

තස්සපාපියස්සිකාකම්මකතෙන භික්ඛවෙ භික්ඛුනා අට්ඨසු ධම්මෙසු සම්මා වත්තිතබ්බං. න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො, න භික්ඛුනොවාදකසම්මුති සාදිතබ්බා, සම්මතෙන පි භික්ඛුනියො න ඔවදිතබ්බා, න කාචි සඞ්ඝසම්මුති සාදිතබ්බා, න කිස්මිඤ්චි පච්චෙකට්ඨානෙ ඨපෙතබ්බො. න ච තෙනමූලෙන වුට්ඨාපෙතබ්බං.

තස්ස පාපියස්සිකාකම්මකතෙන භික්ඛවෙ භික්ඛුනා ඉමෙසු අට්ඨසු ධම්මෙසු සම්මා වත්තිතබ්බන්ති.

සතිවග්ගො නවමො.

තස්සුද්දානං

සති පුණ්ණියමූලෙන චොරාදිච්චවනා[1] පඤ්චමං
නාගිත පත්තාපසාදෙ[2] පටිසාරණීයඤ්ච වත්තති.

1. චොරසමණෙන - සිමු.
2. යසො පත්තපසාදෙන - සිමු.

## 8. 2. 9. 9

## පටිසාරණීයකම්ම සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, දහම් අටෙකින් සමන්වාගත මහණහට සඞ්ඝයා කැමැති වේ නම් පටිසාරණීය කර්මය කරන්නේ ය. කවර අට දහම්හ යත්:

ගිහිනට අලාභය සඳහා උත්සාහ කෙරෙයි. ගිහිනට අනර්ථය සඳහා උත්සාහ කෙරෙයි. ගිහිනට ආක්‍රොශ කෙරෙයි. පරිභව බෙණෙයි ගිහියන් ගිහියන් හා බිඳුවයි. බුදුන්ගේ අගුණ කියයි. දහම්හි අගුණ කියයි. සඟුන්ගේ අගුණ කියයි. දහැමි වූ ද ගිහි පිළිණ සත්‍ය නො කෙරෙයි. (වරදවයි.) මහණෙනි, මේ දහම් අටින් සමන්වාගත වූ මහණහට කැමැති වේ නම් සඞ්ඝයා පටිසාරණීය කර්මය කරන්නේ ය.

මහණෙනි, කරුණු අටෙකින් සමන්වාගත මහණහට සඞ්ඝයා කැමැති වේ නම් පටිසාරණීය කර්මය සන්හිඳුවන්නේ ය. කවර අටකරුණෙකින්හයත්:

ගිහිනට අලාභය සඳහා උත්සාහ නො කෙරෙයි. ගිහිනට අනර්ථය සඳහා උත්සාහ නො කෙරෙයි. ගිහිනට ආක්‍රොශ නො කෙරෙයි. පරිභව නො බෙණෙයි. ගිහියන් ගිහියන් හා නො බිඳුවයි. බුදුන්ගේ ගුණ කියයි. දහම්හි ගුණ කියයි. සඟුන්ගේ ගුණ කියයි. දහැමි ගිහි පිළිණ ද සත්‍ය කෙරෙයි. මහණෙනි, මේ කරුණු අටින් සමන්වාගත මහණහට කැමැති වේ නම් සඞ්ඝයා පටිසාරණීය කර්මය සංහිඳුවන්නේ යි.

## 8. 2. 9. 10

## තස්සපාපියාසිකා සම්මාවත්තන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, තස්සපාපියාසිකා කර්මය කරනලද මහණහු විසින් දහම් අටෙක මොනොවට පැවැත්තයුතු: උපසපන් නො කට යුතු. නිස නො දිය යුතු. මෙහෙණක් නො එළවිය යුතු භික්ඛුනොවාදක සම්මුතිය නො ඉවසිය යුතු. සම්මත වූවහු විසිනුදු මෙහෙණන් ඔවා නො දිය යුතු කිසි සඞ්ඝසම්මුතියක් නො ඉවසිය යුතු. කිසි දෙවු තැනෙක නො තැබිය යුතු. ඔහු පාමොක් කොට ඇති සඟහු විසින් අබ්භාන කම් නො කට යුතු.

මහණෙනි, තස්සපාපියාසිකාකර්මය කරනලද මහණහු විසින් මේ අටදහම්හි මොනොවට පැවැත්ත යුතු.

## නවවැනි සතිවග්ග යි.

එහි උද්දානය:

සතිසූත්‍රය, පුණ්ණියසූත්‍රය, මූලසූත්‍රය, චොරසූත්‍රය, පස්වැනි තථාගතාධිවචනසූත්‍රය, නාගිතසූත්‍රය, පත්තසූත්‍රය, පසාදසූත්‍රය, පටිසාරණීය සූත්‍රය වත්තනාසූත්‍රයදැයි දසය යි.

# 10. සාමඤ්ඤවග්ගො

## 8. 2. 10. 1-27

[සාවත්ථිනිදානං]

අථ ඛො බොජ්ඣා උපාසිකා -පෙ- සිරිමා - පදුමා - සුතනා - මනුජා - උත්තරා - මුත්තා - ඛෙමා - සොමා[1] - රුචී - චුන්දී රාජකුමාරී - බිම්බී[2] උපාසිකා - සුමනා රාජකුමාරී - මල්ලිකා දෙවී - තිස්සා උපාසිකා - තිස්සාය මාතා[3] සොණා - සොණාය මාතා[4] - කාණා - කාණාය මාතා[5] - උත්තරා නන්දමාතා - විසාඛා මිගාරමාතා - ඛුජ්ජුත්තරා උපාසිකා - සාමාවතී උපාසිකා - සුප්පවාසා කොලියධීතා[6] සුප්පියා උපාසිකා - නකුලමාතා ගහපතානී -පෙ-.*

සාමඤ්ඤවග්ගො දසමො.

දුතියො පණ්ණාසකො සමත්තො.

1. සොමා ඉති - මජසං පොත්ථකෙසු න දිස්සති.
2. විම්බී, - සිමු.
3. තිස්සමාතා, - මජසං
4. සොණමාතා, - සයා.
5. කාණමාතා, - මජසං.
6. කොලියධීතා, - සයා, PTS.

* "ඉමාසං එත්තකානං අට්ඨඞ්ගසමන්නාගතං උපොසථකම්මමෙව කථිතං" ඉති අට්ඨකථායං දිස්සති. ඉච්ඡන්තෙන හෙට්ඨා 192 පිට්ඨෙ බොජ්ඣුපොසථ සුත්තෙ වුත්තනයෙන විත්ථාරෙත්වා කථෙතබ්බං.

# 10. සාමඤ්ඤවර්ගය

## 8. 2. 10. 1-27

[සැවැත්නිදන යි]

1–27. එකල්හි බොජ්ඣා උවැසි ... සිරිමා උවැසි ... පදුමා ... සුතණා ... මනුජා ... උත්තරා ... මුත්තා ... ඛෙමා ... සොමා ... රුචී උවැසි ... චුන්දී රාජකුමාරි ... බිම්බී උවැසි ... සුමනා රාජකුමාරි ... මල්ලිකා දේවී ... තිස්සා උවැසි ... තිස්සාවගේ මාතා ... සොණා ... සොණාවගේ මාතා ... කාණා ... කාණාවගේ මාතා ... උත්තරා නම් නන්ද මාතා ... විශාඛා මිගාර මාතෘ ... ඛුජ්ජුත්තරා උපාසිකා ... සාමාවතී උපාසිකා ... කොලිය දුහිතෘ සුප්පවාසා ... සුප්පියා උපාසිකා ... නකුලමාතෘ ගෘහපත්නී ... යි.*

දසවැනි සාමඤ්ඤවග්ග යි.

දුතිය පණ්ණාසකය සමාප්ත යි.

* "මෙ පමණ මොවුන් ගේ අවඟින් යුත් පෙහෙවස්කම ම කියන ලද"යි අටුවායෙහි දක්වෙ. අර්ථිනු විසින් යට 192 පිටුයෙහි බොජ්ඣපොසථ සූත්‍රයෙහි කී නයින් විස්තර කොට කිය යුතු.

# 11. රාගාදිපෙය්‍යාලං

## 8. 11. 1. 3

## අට්ඨමග්ගඞ්ග සුත්තං

[සාවත්ථිනිදානං]

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය අට්ඨ ධම්මා භාවෙතබ්බා, කතමෙ අට්ඨ:

සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා-ආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ අට්ඨධම්මා භාවෙතබ්බාති.

## 8. 11. 2

## අට්ඨඅභිභායතන සුත්තං

[සාවත්ථිනිදානං]

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය අට්ඨධම්මා භාවෙතබ්බා. කතමෙ අට්ඨ:

අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ දුබ්බණ්ණානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ-දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ-දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි, පීතානි පීතවණ්ණානි –පෙ– ලොහිතකානි ලොහිතකවණ්ණානි –පෙ– ඕදාතානි ඕදාතවණ්ණානි. –පෙ– ඕදාතනිභාසානි, අතානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. රාගස්ස භික්ඛවෙ භිඤ්ඤාය ඉමෙ අට්ඨධම්මා භාවෙතබ්බා.

# 11. රාගපෙය්‍යාලය

## 8. 11. 1
## අට්ඨමග්ගඞ්ග සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස අෂ්ටධර්ම කෙනෙක් බැවිය යුතුවහ. කවර අටදෙනෙක යත්:

සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මාවායාමය, සම්මාසතිය, සම්මාසමාධි යි. මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස මේ අෂ්ටධර්මයෝ බැවිය යුතුවහ යි.

## 8. 11. 2
## අට්ඨඅභිභායතන සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස අෂ්ටධර්මයෝ බැවිය යුතුවහ. කවර අටදෙනෙක යත්:

අධ්‍යාත්මයෙහි රූපසංඥා ඇතියේ නො වැඩූ සුවර්ණ දුර්වර්ණ බාහිර රූපායතනයන් දක්නේ ය. ඔවුන් මැඩගෙන දන්මි දක්මියි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. අධ්‍යාත්මයෙහි රූපසංඥා ඇතියේ අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහිර රූපායතනයන් දක්නේ ය ඔවුන් මැඩගෙන දන්මි දක්මි යන මෙබඳු සංඥා ඇතියේ ය. අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇතියේ නො වැඩූ සුවර්ණ දුර්වර්ණ වූ බාහිර රූපායතනයන් දක්නේය. ඔවුන් මැඩ ගෙන දන්මි දක්මි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇතියේ අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ වූ බාහිර රූපායතනයන් දක්නේ ය. ඔවුන් මැඩ ගෙන දන්මි දක්මියි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇතියේ නීල වූ නීලවර්ණ වූ නීල නිදර්ශන වූ (එක නීලවරපත්තෙ) නීල ප්‍රභා ඇති බාහිර රූපායතනයන් දක්නේ ය ... පීතවූ පීතවර්ණ වූ ... ලොහිත වූ ලොහිතවර්ණ වූ ... අවදාත වූ අවදාතවර්ණ වූ ... අවදාත ප්‍රභා ඇත්තා වූ ඔවුන් මැඩගෙන දන්මි දක්මි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස මේ අට දහම්හු බැවිය යුතුවහ යි.

## 8. 11. 3.

## අට්ඨවිමොක්ඛ සුත්තං

[සාවත්ථිනිදානං]

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය අට්ඨ ධම්මා භාවෙතබ්බා. කතමෙ අට්ඨ:
රූපී රූපානි පස්සති, අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති. සුභන්තෙව අධිමුත්තො හොති. සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති.

සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිත නිරොධං උපසම්පජ්ජ විහරති. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ අට්ඨ ධම්මා භාවෙතබ්බා.

## 8. 11. 4– 510

[සාවත්ථිනිදානං]

රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය. -පෙ- පහානාය. -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය -පෙ- ඉමෙ අට්ඨ ධම්මා භාවෙතබ්බා.

දොසස්ස -පෙ- මොහස්ස - කොධස්ස - උපනාහස්ස - මක්ඛස්ස පළාසස්ස - ඉස්සාය - මච්ඡරියස්ස - මායාය - සාඨෙය්‍යස්ස - ථම්භස්ස - සාරම්භස්ස - මානස්ස - අතිමානස්ස - මදස්ස - පමාදස්ස - අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය-පරික්ඛයාය - පහානාය - ඛයාය - වයාය - විරාගාය-නිරොධාය-චාගාය-පටිනිස්සග්ගාය -පෙ- ඉමෙ අට්ඨ ධම්මා භාවෙතබ්බාති.

රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං*

## අට්ඨකනිපාතො සමත්තො.

* රාගපදතො පට්ඨාය පමාදපදපරියන්තෙසු සත්තරසසු පදෙසු එකමෙකං අභිඤ්ඤායාදි දසපදෙහි යොජෙත්වා 'අට්ඨධම්මා භාවෙතබ්බා'ති නිද්දිට්ඨෙහි තීහි අට්ඨමග්ගඞ්ග–අට්ඨ අභිභායතන–අට්ඨවිමොක්ඛ සුත්තෙහි පච්චෙකං සට්ඨානි සබ්බසුත්තානි දසාධික පඤ්චසතානි හොන්ති

## 8. 11. 3

## අට්ඨවිමොක්ඛ සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිස අටදහම්හු බැවිය යුතුවහ. කවර අටදෙනෙක යත්:

රූපී වූයේ රූපායතනයන් දක්නේ ය. අධ්‍යාත්මයෙහි අරූපසංඥ ඇතියේ බාහිර රූපායතනයන් දක්නේ ය. සුභයැයි කියාම අධිමුක්ත වූයේ වෙයි. හැම අයුරින් රූපසංඥවන්ගේ සමතික්‍රමණයෙන් ප්‍රතිඝ ඥවන්ගේ අස්තගමයෙන් නානාත්‍වසංඥවන්ගේ අමනසිකාරයෙන් ආකාසය අනන්ත යී ආකාසානඤ්චායතනට එළැඹ වෙසේ. හැම පරිදි ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්ත යි. විඤ්ඤාණඤ්චායතනයට එළැඹ වාස කෙරේ.

හැම අයුරින් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා නත්‍ථිකිඤ්චි යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වෙසේ. හැම අයුරින් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. හැම අයුරින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට එළැඹ වෙසෙයි. මහණෙනි, රාගයාගේ අභිජානනය පිණිය මේ අටදහම්හු බැවිය යුතුව හ යි.

## 8. 11. 4- 510

**[සැවැත්නිදන යි]**

මහණෙනි, රාගයාගේ පරිජානනය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරොධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිස්සර්ගය පිණිස ... මේ අටදහම්හු බැවිය යුතුවහ.

ද්වෙෂයාගේ ... මොහයාගේ ... ක්‍රොධයාගේ ... උපනාහයාගේ ... මක්ඛයාගේ ... පලාසයාගේ ... ඊර්ෂ්‍යාවගේ ... මාත්සය්‍ය්‍යාගේ ... මායාවගේ ... සාඨෙය්‍යයාගේ ... ථම්භයාගේ ... සාරම්භයාගේ ... මානයාගේ ... අතිමානයාගේ ... මදයාගේ ... පමාදයාගේ ... අභිජානනය පිණිස ... පරිජානනය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරොධය ... පිණිස ... ත්‍යාගය ... පිණිස ප්‍රතිනිස්සර්ගය පිණිස මේ අටදහම්හු බැවිය යුතුවහ යි.

**රාගපෙය්‍යාලය නිමි.***

## අට්ඨක නිපාත සමාප්ත යි.

* රාග පදය පටන් පමාද පදය කෙළවර කොට ඇති සතළොස් පදයන්හි එක එක පදය අභිඤ්ඤාය ආදි පද දසය සමඟ යොද 'දහම් අටෙක් බැවියයුතුහ යි දක්වුණු අට්ඨමග්ගඞ්ග- අට්ඨඅභිභායතන- අට්ඨවිමොක්ඛ සූත්‍ර සමඟ වෙන වෙන යොද ගන්නා ලැබූ සියලු සූත්‍රයෝ දසයක් අධික කොට ඇති පන්සියයෙක් (510) වෙති.

# නවකනිපාතො

## පඨමො පණණාසකො

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස**

## සමෙබාධිවගෙගා

### 9. 1. 1. 1

### සමෙබාධිපකඛිය සුතතං

එවං මෙ සුතං එකං සමයං භගවා සාවතථියං විහරති ජෙතවනෙ අනාථපිණඩිකසස ආරාමෙ, තතර ඛො භගවා භිකඛූ ආමනෙතසි. භිකඛවොති. භදනෙතති තෙ භිකඛූ භගවතො පචචසෙසාසුං භගවා එතදවොච:

සචෙ භිකඛවෙ අඤඤතිතථියා පරිබබාජකා එවං පුචෙඡයයුං: සමෙබාධිපකඛියානං[1] ආවුසො ධමමානං කා උපනිසා භාවනායාති. එවං පුටඨා තුමෙහ භිකඛවෙ තෙසං අඤඤතිතථියානං පරිබබාජකානං කිනති බයාකරෙයයාථාති.

භගවංමූලකා නො භනෙත ධමමා භගවංනෙතතිකා, භගවංපටි-සරණා, සාධු වත භනෙත භගවනතංයෙව පටිභාතු එතසස භාසිතසස අතෙථා. භගවතො සුතවා භිකඛූ ධාරෙසසනතීති.

තෙන හි භිකඛවෙ සුණාථ සාධුකං මනසිකරොථ, භාසිසසාමීති. එවං භනෙතති ඛො තෙ භිකඛූ භගවතො පචචසෙසාසුං. භගවා එතදවොච:

සචෙ භිකඛවෙ අඤඤතිතථියා පරිබබාජකා එවං පුචෙඡයයුං සමෙබාධිපකඛියානං ආවුසො ධමමානං කා උපනිසා භාවනායාති. එවං පුටඨා තුමෙහ භිකඛවෙ තෙසං අඤඤතිතථියානං පරිබබාජකානං එවං බයාකරෙයයාථ:

1. සමෙබාධිපකඛිකානං—මජසං

# නවකනිපාතය

## ප්‍රථමපණ්ණාසකය

ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට
නමස්කාර වේවා!

# 1. සම්බොධිවර්ගය

### 9. 1. 1. 1

### සම්බොධිපක්ඛිය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල කරුණ වදළ සේක:

මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි චතුර්මාර්ග-සඞ්ඛ්‍යාත සම්බොධිපක්ෂයෙහි වූ ධර්මයන්ගේ වැඩීමට කවර උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙක් දැ''යි මෙසේ පුළුවුස්නාහු නම්, මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට කුමැයි පවසන්නාහු ද ?යි.

වහන්ස අපගේ ධර්මයෝ භාග්‍යවතුන් මුල් කොට ඇතියහ. භාග්‍යවතුන් ප්‍රධාන කොට ඇතියහ. භාග්‍යවතුන් පිළිසරණ කොට ඇතියහ. වහන්ස එකැතින් මෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වටහා නම් මැනැව. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා දරන්නාහ යි,

මහණෙනි එසේ වී නම් අසවු, මොනොවට මෙනෙහි කරවු. දෙසන්නෙමි යි. වහන්ස, එසේ ය යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල අර්ථය වදළ සේක:

මහණෙනි ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි සම්බොධි පාක්ෂිකධර්මයන්ගේ භාවනාව සඳහා කවර උපනිඃශ්‍රයප්‍රත්‍යයෙක් වේ දැ''යි මෙසේ පුළුවුස්නාහු නම් මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන් තොටු පිරිවැජියනට මෙසේ ප්‍රකාශ කරවු.

1. ඉධාවුසො භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො. සම්බොධිපක්ඛියානං ආවුසො ධම්මානං අයං පඨමා උපනිසා භාවනාය.

2. පුනචපරං ආවුසො භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. සම්බොධිපක්ඛියානං ආවුසො ධම්මානං අයං දුතියා උපනිසා භාවනාය.

3. පුනචපරං ආවුසො භික්ඛු යායං කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා සෙය්‍යථීදං: අප්පිච්ඡකථා සන්තුට්ඨිකථා පවිවෙකකථා අසංසග්ගකථා විරියාරම්භකථා සීලකථා සමාධිකථා පඤ්ඤාකථා විමුත්තිකථා විමුත්තිඤාණදස්සනකථා. එවරූපියා කථාය නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. සම්බොධිපක්ඛියානං ආවුසො ධම්මානං අයං තතියා උපනිසා භාවනාය.

4. පුනචපරං ආවුසො භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. සම්බොධිපක්ඛියානං ආවුසො ධම්මානං අයං චතුත්ථී[1] උපනිසා භාවනාය.

5. පුනචපරං ආවුසො භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. සම්බොධිපක්ඛියානං ආවුසො ධම්මානං අයං පඤ්චමී උපනිසා භාවනාය.

කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස සීලවා භවිස්සති පාතිමොක්ඛසංවරසංවුතො විහරිස්සති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස යායං කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා සෙය්‍යථීදං: අප්පිච්ඡකථා -පෙ- එවරූපියා කථාය නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභී.

1. චතුත්ථා-සිමු.

1. ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කලණමිතුරන් ඇතියේ කලණ යහළුවන් ඇතියේ කලණමිතුරන් කෙරෙහි නැමුණේ වෙයි. ඇවැත්නි, සම්බොධිපාක්ෂිකධර්මයන්ගේ භාවනාව පිණිස මේ ප්‍රථම උපනිඃශ්‍රය ප්‍රත්‍යය යි.

2. තවද ඇවැත්නි, මහණ සිල්වත් වෙයි. ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූයේ ආචාර ගෝචර සම්පන්න වූයේ වාසය කෙරෙයි. අණුමාත්‍ර වද්‍යයෙහි බිය දක්නා සුලු වූයේ සමාදන් කොට ගෙන සිකපදයන්හි හික්මෙයි. ඇවැත්නි, සම්බොධිපාක්ෂිකධර්මයන්ගේ භාවනාව පිණිස මේ දෙවන උපනිඃශ්‍රය ප්‍රත්‍යය යි.

3. තවද ඇවැත්නි, යම් මේ කථාවක් ක්ලෙශාභිලෙඛනයට හිත ද, ශමථ විදර්ශනා චිත්තයාගේ විවරණයට සත්ප්‍රාය ද, එනම් අප්පිච්ඡකථාය, සන්තුට්ඨිකථාය, පවිවෙකකථාය, අසංසග්ගකථා ය, වීරියාරම්භකථා ය, සීලකථා ය, සමාධිකථා ය, පඤ්ඤාකථා ය, විමුත්තිකථා ය, විමුත්තිඤාණ දස්සනකථා යයි, එබඳු කථා කැමැති කැමැති පරිදි ලබන සුලු සුවසේ ලබන සුලු විපුල ව ලබන සුලු වෙයි. ඇවැත්නි සම්බොධිපාක්ෂික ධර්මයන්ගේ භාවනාව පිණිස මේ තෙවන උපනිඃශ්‍රයප්‍රත්‍යය යි.

4. තවද ඇවැත්නි මහණ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසම්පත් පිණිස ඇරඹූ වැර ඇතියේ ස්ථාමයෙන් යුක්ත වූයේ දෘඪපරාක්‍රම ඇතියේ කුශලධර්මයන්හි බහා නො තබන ලද ධුර ඇතියේ වාස කෙරෙයි. ඇවැත්නි, සම්බොධිපාක්ෂිකධර්මයන්ගේ භාවනාව පිණිස මේ සිවුවන උපනිඃශ්‍රය ප්‍රත්‍යය යි:

5. තවද ඇවැත්නි, මහණ (පඤ්චස්කන්ධයන්ගේ) උදය හා විනාශය පිළිවිදිනු සමත් වූ පිරිසිදු වූ කෙලෙස් විදලීමට සමත් වූ මොනොවට දුඃඛක්ෂයට යන සුලු ප්‍රඥයෙන් සමන්වාගත වූයේ ප්‍රඥවත් වෙයි. ඇවැත්නි, සම්බොධිපාක්ෂිකධර්මයන්ගේ භාවනාව පිණිස මේ පස්වන උපනිඃශ්‍රය ප්‍රත්‍යය යි.

මහණෙනි, කලණමිතුරන් ඇති කලණයහළුවන් ඇති කලණමිතුරන් කෙරෙහි නැඹුරු වූ මහණහු විසින් මෙල කැමැති විය යුතු: ''සිල්වත් වන්නේ ය, ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවෘත වූයේ ආචාරගොචර සම්පන්නව වාසය කරන්නේ ය. අණුමාත්‍රවද්‍යයෙහිදු බියදක්නාසුලු සමාදන් කොට ගෙන සිකපදයන්හි හික්මෙයි'' කියා යි.

මහණෙනි, කලණමිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණ යහළුවන් කෙරෙහි නැඹුරු වූ මහණහු විසින් මෙල කැමැති විය යුතු: අප්පිච්ඡකථා ය...විමුත්තිඤාණදස්සනකථාය යි ක්ලෙශාභිලෙඛනයට හිත වූ ශමථවිදර්ශනාචිත්තයාගේ විවරණයට සත්ප්‍රාය වූ යම් මේ කථායෙක් වේ නම් එබඳු කථා කැමැති පරිදි ලබනසුලු සුවසේ ලබනසුලු විපුල ව ලබන සුලු වන්නේ ය කියා යි.

කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස: ආරද්ධවිරියො විහරිස්සති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු.

කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස: පඤ්ඤවා භවිස්සති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා.

තෙන ච පන භික්ඛවෙ භික්ඛුනා ඉමෙසු පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය චත්තාරො ධම්මා උත්තරිං භාවෙතබ්බා:

6-9. අසුභා භාවෙතබ්බා රාගස්ස පහානාය. මෙත්තා භාවෙතබ්බා ව්‍යාපාදස්ස පහානාය. ආනාපානසති භාවෙතබ්බා විතක්කුපච්ඡෙදාය. අනිච්චසඤ්ඤා භාවෙතබ්බා අස්මිමානසමුග්ඝාතාය, අනිච්චසඤ්ඤිනො භික්ඛවෙ භික්ඛුනො අනත්තසඤ්ඤා සණ්ඨාති. අනත්තසඤ්ඤී අස්මිමානසමුග්ඝාතං පාපුණාති, දිට්ඨෙව ධම්මෙ නිබ්බානන්ති.

## 9. 1. 1. 2

## නිස්සයසම්පන්න සුත්තං

[සාවත්ථිනිදානං]

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා, එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: නිස්සයසම්පන්නො නිස්සයසම්පන්නොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛු නිස්සයසම්පන්නො හොතී ති.

සද්ධංඛො භික්ඛු, භික්ඛු නිස්සාය[1] අකුසලං පජහති කුසලං භාවෙති පහීනමෙවස්ස තං අකුසලං හොති. හිරිංඛො භික්ඛු, භික්ඛු නිස්සාය[2] -පෙ- ඔත්තප්පංඛො භික්ඛු, භික්ඛු නිස්සාය[3] -පෙ- විරියංඛො භික්ඛු, භික්ඛු නිස්සාය[4] -පෙ- පඤ්ඤංඛො භික්ඛු, භික්ඛු නිස්සාය[5] අකුසලං පජහති, කුසලං භාවෙති, පහීනමෙවස්ස තං අකුසලං හොති. තං හිස්ස භික්ඛුනො අකුසලං පහීනං හොති සුප්පහීනං, යංස අරියාය පඤ්ඤාය දිස්වා පහීනං.

1. සද්ධංඛෙව භික්ඛු නිස්සාය–සීමු.
2. හිරිංඛෙව භික්ඛු නිස්සාය–සීමු.
3. ඔත්තප්පංඛෙව භික්ඛු නිස්සාය–සීමු.
4. විරියංඛෙව භික්ඛු නිස්සාය–සීමු.
5. පඤ්ඤංඛෙව භික්ඛු නිස්සාය–සීමු.

මහණෙනි කල්‍යාණමිත්‍රයන් ඇති, කල්‍යාණ යහළුවන් ඇති, කල්‍යාණමිත්‍රයන් කෙරෙහි නැඹුරු වූ මහණහු විසින් මෙතෙල කැමැති විය යුතු: අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසම්පත් පිණිස රුකුළු වැර ඇතියේ ස්ථාම ඇතියේ දළ පැරකුම් ඇතියේ කුශලධර්මයන්හි අනික්ෂිප්ත ධුර ඇතියේ වන්නේ ය කියා යි.

මහණෙනි කල්‍යාණමිත්‍රයන් ඇති, කල්‍යාණ යහළුවන් ඇති, කල්‍යාණ මිත්‍රයන් කෙරෙහි නැඹුරු වූ මහණහු විසින් මෙතෙල කැමැති විය යුතු; උදයව්‍යයගාමිනී වූ ආර්‍ය්‍ය වූ නිර්වේදය පිණිස පවත්නා මොනොවට දුඃඛක්ෂයට යන සුලු ප්‍රඥයෙන් සමන්වාගත වූයේ ප්‍රඥවත් වන්නේ ය කියා යි.

මහණෙනි, එ මහණ විසින් මෙ පඤ්චධර්මයන්හි පිහිටා මත්තෙහි සතර ධර්ම කෙනෙක් වැඩිය යුතුවහ.

රාගයාගේ ප්‍රහාණය පිණිස අසුභය වැඩියයුතු. ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස මෛත්‍රිය වැඩිය යුතු. විතර්කොපච්ඡේදය පිණිස ආනාපානසතිය වැඩිය යුතු. අස්මිමානසමුද්ඝාතය පිණිස අනිත්‍යසංඥ වැඩිය යුතු. මහණෙනි, අනිත්‍යසංඥ ඇති මහණහට අනාත්මසංඥව සිටුනේ ය. අනාත්මසංඥ ඇතියේ අස්මිමානසමුද්ඝාතයට පැමිණෙයි. දිටුදැමියෙහි ම නිර්වාණයට ද පැමිණෙයි.

## 9. 1. 1. 2
## නිස්සයසම්පන්න සූත්‍රය

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් එ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැලකෙළේ ය: වහන්ස, නිස්සයසම්පන්න ය නිස්සයසම්පන්න ය යි කියනු ලැබෙයි. වහන්ස, මහණ කෙතෙක් කරුණින් නිස්සයසම්පන්න වේ දැයි.

මහණ, ඉදින් මහණ (අවකල්පන) ශ්‍රද්ධාව නිසා අකුශලය දුරු කෙරේ ද කුශලය වඩා ද ඔහුගේ ඒ අකුශලය ප්‍රහීණ ම වෙයි. මහණ, ඉදින් හිරිය නිසා ... මහණ ඉදින් ඔත්තප්පය නිසා ... මහණ ඉදින් ප්‍රඥාව නිසා අකුශලය දුරු කෙරේ ද, කුසල් වඩා ද, ඔහුගේ අකුශලය ප්‍රහීණ ම වෙයි. ඒ මහණහුගේ යම් අකුශලයක් ආර්‍ය්‍ය ප්‍රඥායෙන් දැක ප්‍රහීණ වී ද, එ මහණහුගේ ඒ අකුශලය ප්‍රහීණ ම වූයේ සුප්‍රහීණ වූයේ වෙයි.

තෙන ච පන භික්ඛු, භික්ඛුනා ඉමෙසු පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය චත්තාරො ධම්මා උපනිස්සාය විහාතබ්බා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛු, භික්ඛු සඞ්ඛායෙකං පටිසෙවති, සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති, සඞ්ඛායෙකං විනොදෙති, එවං ඛො භික්ඛු, භික්ඛු නිස්සය-සම්පන්නො හොතීති.

## 9. 1. 1. 3

## මෙඝිය සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා චාලිකායං විහරති චාලිකාය පබ්බතෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා මෙඝියො භගවතො උපට්ඨාකො හොති, අථ ඛො ආයස්මා මෙඝියො යෙන භගවා තෙනුප-සඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: ඉච්ඡාමහං භන්තෙ, ජන්තුගාමං[1] පිණ්ඩාය පවිසිතුන්ති. යස්සදානි ත්වං මෙඝිය කාලං මඤ්ඤසීති.

අථ ඛො ආයස්මා මෙඝියො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර-මාදාය ජන්තුගාමං පිණ්ඩාය පාවිසි: ජන්තුගාමෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන කිමිකාලාය නදියා තීරං තෙනුපසඞ්කමි. අද්දසා ඛො ආයස්මා මෙඝියො කිමිකාලාය නදියා තීරෙ ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො අම්බවනං පාසාදිකං රමණීයං. දිස්වානස්ස එතදහොසි: පාසාදිකං වතිදං අම්බවනං රමණීයං, අලං වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස පධානාය. සචෙ මං භගවා අනුජානෙය්‍ය, ආගච්ඡෙය්‍යාහං ඉමං අම්බවනං පධානායාති.

අථ ඛො ආයස්මා මෙඝියො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ජන්තුගාමං පිණ්ඩාය පාවිසිං. ජන්තුගාමෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන කිමිකාලාය නදියා තීරං තෙනුපසඞ්කමිං.

---

1. ජතුගාමං - ස්‍යා

මහණෙනි, ඒ මහණහු විසින් මේ පඤ්චධර්මයන්හි පිහිටා සතර ධර්ම කෙනෙක් ඇසුරු කොට විසිය යුත්තාහ. කවර සතර කෙනෙක යත්: මහණ, මෙසස්නෙහි මහණ සෙවිය යුතු එකක් දැන සෙවුනේ ය. ඉවැසිය යුතු එකක් දැන ඉවසන්නේ ය. දුරලිය යුතු එකක් දැන දුරලන්නේ ය. හළ යුතු එකක් දැන හරනේ ය. මහණ, මෙසේ මහණ නිඃසයසම්පන්න වෙ.

## 9. 1. 1. 3

## මේඝිය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ චාලිකා නගරසමීපයෙහි වූ චාලිකාපර්වතයෙහි වාසය කරන සේක. එ සමයෙහි ආයුෂ්මත් මේඝිය ස්ථවිර භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වෙයි. එකල්හි ආයුෂ්මත් මෙඝිය ස්ථවිර භාග්‍යවතුන් වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි ආයුෂ්මත් මෙඝිය ස්ථවිර භාග්‍යවතුන්හට තෙල සැළකෙළේ ය. වහන්ස, මම ජන්තුග්‍රාමයට පිඩු පිණිස වදනට කැමැති යෙමි යි. මෙඝිය යමක් පිණිස තෝ දැන් කලැයි හඟනේ නම් එය කරවයි.

එකල්හි ආයුෂ්මත් මෙඝිය ස්ථවිර පෙරවරු යෙහි හැඳ පෙරවැ පාසිවුරු ගෙන ජන්තුග්‍රාමයට පිඩු පිණිස පිවිසියේ ය. ජන්තුග්‍රාමයෙහි පිඩු පිණිස හැසිර පසුබත්හි පිඩුවායෙන් පෙරළා පැමිණියේ කිමිකාලා නදී තීරය යම් තැනෙක්හි ද එහි එළැඹියේ ය. ආයුෂ්මත් මේඝිය ස්ථවිර තෙම කිමිකාලා නදී තීරයෙහි ජඞ්ඝාවිහරණයෙන් සක්මන් කරනුයේ අනුවිචරණය කරනුයේ පහන් එළවන රමණී අඹවනයක් දිටී. දැක ඔහට මෙ සිත වී: එකතින් මෙ අඹවනය පහන් එළවයි, රමණී වෙයි, එකතින් මෙය ප්‍රධන්වියත් වඩනු කැමැති කුලපුතක්හුගේ ප්‍රධන් වැඩීම පිණිස සුදුසු ය, ඉදින් භාග්‍යවතුන් වහන්සේ මා අනුදන්නා සේක් නම් ප්‍රධන් පිණිස මම මේ අඹවනයට එමැයි.

ඉක්බිති ආයුෂ්මත් මේඝියස්ථවිර භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් ආයුෂ්මත් මේඝියස්ථවිර භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළේ ය: වහන්ස, මෙහි මම පෙරවරුයෙහි හැඳ පෙරෙවැ පා සිවුරු ගෙන ජන්තුග්‍රාමයට පිඩු පිණිස වන්මි. ජන්තුග්‍රාමයෙහි පිඩු පිණිස හැසිර පසු බත්හි පිඩුවායෙන් පෙරළා පැමිණියෙම් කිමිකාලා නදී තීරයට එළැඹියෙමි.

අද්දසං ඛො අහං භන්තෙ, කිමිකාලාය නදියා තීරෙ ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො අම්බවනං පාසාදිකං රමණීයං, දිස්වාන මෙ එතදහොසි: පාසාදිකං වතිදං අම්බවනං රමණීයං, අලං වතිදං කුලපුත්තස්ස පධානත්ථිකස්ස පධානාය. සචෙ මං භගවා අනුජානෙය්‍ය ආගච්ඡෙය්‍යාහං ඉමං අම්බවනං පධානායාති. සචෙ මං භගවා අනුජානෙය්‍ය ගච්ඡෙය්‍යාහං තං අම්බවනං පධානායාති.

ආගමෙහි තාව මෙඝිය, එකකම්හා[1] තාව යාව අඤ්ඤොපි කොචි භික්ඛු ආගච්ඡතීති.

දුතියම්පි ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: භගවතො භන්තෙ, නත්ථි කිඤ්චි උත්තරිං කරණීයං, නත්ථි කතස්ස පතිචයො. මය්හං ඛො පන භන්තෙ, අත්ථි උත්තරිං කරණීයං, අත්ථි කතස්ස පතිචයො. සචෙ මං භගවා අනුජානෙය්‍ය, ගච්ඡෙය්‍යාහං තං අම්බවනං පධානායාති.

ආගමෙහි තාව මෙඝිය, එකකම්හා[1] තාව යාව අඤ්ඤොපි කොචි භික්ඛු ආගච්ඡතීති.[2]

තතියම්පි ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: භගවතො භන්තෙ නත්ථි කිඤ්චි උත්තරිං කරණීයං, නත්ථි කතස්ස වා පතිචයො, මය්හං ඛො පන භන්තෙ අත්ථි උත්තරිං කරණීයං, අත්ථි කතස්ස පතිචයො. සචෙ මං භගවා අනුජානෙය්‍ය, ගච්ඡෙය්‍යාහං තං අම්බවනං පධානායාති.

පධානන්ති ඛො මෙඝිය වදමානං කින්ති වදෙය්‍යාම, යස්සදානි ත්වං මෙඝිය කාලං මඤ්ඤසීති.

අථ ඛො ආයස්මා මෙඝියො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන තං අම්බවනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං අම්බවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. අථ ඛො ආයස්මතො මෙඝියස්ස තස්මිං අම්බවනෙ විහරන්තස්ස යෙභුය්‍යෙන තයො පාපකා අකුසලා විතක්කා සමුදචරන්ති. සෙය්‍යථීදං: කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො. අථ ඛො ආයස්මතො මෙඝියස්ස එතදහොසි: අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, සද්ධාය වත චම්හි අගාරස්මා අනගාරියං පබ්බජිතො. අථ ච පන ඉමෙහි තීහි පාපකෙහි අකුසලෙහි විතක්කෙහි අන්වාසත්තො කාමවිතක්කෙන ව්‍යාපාදවිතක්කෙන විහිංසාවිතක්කෙනාති.

1. එකකම්හි-මජසං 2. දිස්සතුති සීමු.

වහන්ස, කිමිකාලා නදී තීරයෙහි ජඞ්ඝාවිහාරයෙන් මම සක්මන් කරනුයෙම් අනුසඤ්චරණ කරනුයෙම් පහන් එළවන රමණී අඹවනයක් දිටිමි. දැක මට මෙ සිත විය. එකතින් මේ අඹවනය පහන් එළවන්නෙකි, රමණී වෙයි, ප්‍රධානාර්ථී වූ කුලපුත්‍රක්හට ප්‍රධන් පිණිස සුදුසු ය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ මා අනුදන්නා සේක් නම් ප්‍රධන් පිණිස මම මේ අඹවනයට එමි යි. ඉදින් භාග්‍යවතුන් වහන්සේ මා අනුදන්නා සේක් නම් මම ඒ අඹවනයට ප්‍රධන් පිණිස යෙමි යි.

මෙඝිය ය, මඳකලක් බලව, (අපි) එකලා වම්හ. අන් කිසි මහණක්හු එන තාක් බල.

දෙවන වටත් ආයුෂ්මත් මෙඝිය ස්ථවිර භගවතුන් හට තෙල සැල-කළේය: වහන්ස, භගවන්නට මතුයෙහි කටයුතු කිසිවෙක් නැත. කෘතයක්හුගේ දූනපුනා කිරීමෙක් නැති. වහන්ස, මට වැලිත් මතුයෙහි කරණී ඇත. කළ දෑයක්හුගේ පුනපුනා කිරීමෙක් ඇති. ඉදින් භාග්‍යවතුන් වහන්සේ මා අනුදන්නා සේක් නම් මම ඒ අඹවනයට ප්‍රධන් පිණිස යන්නෙමැ යි.

මෙඝිය ය, මඳකලක් බල, (අපි) එකලා වම්හ. අන් කිසි මහණක්හු එන තාක් බල.

තෙවන වටත් ආයුෂ්මත් මේඝිය ස්ථවිර භගවතුන්ට තෙල සැළ කෙළේ ය: වහන්ස, භාග්‍යවතුන්හට මතුයෙහි කටයුතු කිසිවෙක් නැත. කෘතයක්හුගේ පුනපුනා කිරීමෙක් නැති. වහන්ස, මට වැලිත් මතුයෙහි කරණී ඇත. කෘතයාගේ පුනපුනා කිරීමෙක් ඇති ඉදින් භාග්‍යවතුන් වහන්සේ මා අනුදන්නා සේක් නම් මම ඒ අඹවනයට ප්‍රධන් පිණිස යෙමි යි.

මෙඝිය, ප්‍රධන් ය යි කියනුව හට කුමැයි කියමෝ ද? මෙඝිය, තෝ දූන් යමක් සඳහා කලැයි හඟිහි නම් එය කර.

එකල්හි ආයුෂ්මත් මේඝිය හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් සකසා වැඳ පැදකුණු කොට ඒ අඹවනය කරා එළැඹියේ ය. එළැඹ ඒ අඹවනයට වැද ගෙන එක්තරා රුක්මුලෙක දිවාවිහාර පිණිස හුන්නේය. ඉක්බිති එ අඹ වෙනෙහි වෙසෙන ආයුෂ්මත් මේඝිය ස්ථවිරහට බෙහෙවින් තුන් ලාමක අකුශල විතර්කයෝ පහළ වෙති. එනම්: කාමවිතර්ක ව්‍යාපාදවිතර්කය විහිංසා විතර්ක යි. එකල්හි ආයුෂ්මත් මෙඝියස්ථවිරහට මෙ සිත විය: භවත්නි, එකැතින් ආශ්වර්‍ය්‍ය යි, භවත්නි, එකැතින් අද්භුත යි. එකැතින් මම සැදැහැයෙන් ගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වූයෙම් වෙමි. වැලිත් කාමවිතර්කයෙන් ව්‍යාපාදවිතර්කයෙන් විහිංසාවිතර්කයෙනැයි මේ තුන් ලමු අකුශල විතර්කයන් විසින් ලුහුබැඳියෙම් වෙමි.

අථ ඛො ආයස්මා මෙඝියො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මෙඝියො භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ තස්මිං අම්බවනෙ විහරන්තස්ස යෙභුය්‍යෙන තයො පාපකා අකුසලා විතක්කා සමුදාචරන්ති. සෙය්‍යථීදං: කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො. තස්ස මය්හං භන්තෙ, එතදහොසි: අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, සද්ධාය ච වතම්හි අගාරස්මා අනගාරියං පබ්බජිතො. අථ ච පනිමෙහි තීහි පාපකෙහි අකුසලෙහි විතක්කෙහි අන්වාපන්නො කාමවිතක්කෙන ව්‍යාපාදවිතක්කෙන විහිංසාවිතක්කෙනාති.

අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා පඤ්චධම්මා පරිපක්කාය සංවත්තන්ති. කතමෙ පඤ්ච:

1. ඉධ මෙඝිය, භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො, අපරිපක්කාය මෙඝිය චෙතො විමුත්තියා අයං පඨමො ධම්මො පරිපක්කාය සංවත්තති.

2. පුනචපරං මෙඝිය භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු අපරිපක්කාය මෙඝිය, චෙතොවිමුත්තියා අයං දුතියො ධම්මො උරිපක්කාය සංවත්තති.

3. පුනචපරං මෙඝිය භික්ඛු යායං කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා, සෙය්‍යථීදං: අප්පිච්ඡකථා -පෙ- එවරූපියා කථාය නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. අපරිපක්කාය මෙඝිය, චෙතොවිමුත්තියා අයං තතියො ධම්මො පරිපක්කාය සංවත්තති.

4. පුනචපරං මෙඝිය භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදය, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා අයං චතුත්ථො ධම්මො පරිපක්කාය සංවත්තති.

5. පුනචපරං මෙඝිය භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා, අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා අයං පඤ්චමො ධම්මො පරිපක්කාය සංවත්තති.

ඉක්බිති ආයුෂ්මත් මේඝියස්ථවිර භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් ආයුෂ්මත් මෙඝිය ස්ථවිර භගවත්නට මෙල සැල කළේය: වහන්ස, මෙහි ඒ අඹවෙනෙහි විසන මට බෙහෙවින් කාම-විතර්කය, ව්‍යාපාදවිතර්කය, විහිංසාවිතර්කය යන තුන් ලමු අකුශල විතර්කයෝ පහළ වෙත්. වහන්ස, ඒ මට මෙ සිත විය: භවත්නි, එකතින් ආශ්චර්ය්‍ය ය. භවත්නි, එකතින් අද්භූත ය. ගෙන් නික්ම අනගාරිය සස්නෙහි පැවිදි වූයෙම් සැදැහැයෙන් වෙමි. වැලිත් කාමවිතර්කයෙන, ව්‍යාපාදවිතර්කයෙන, විහිංසාවිතර්කයෙනැයි මේ තුන් ලමු අකුශල-විතර්කයෙන් ලුහුබැඳියෙම් වෙමි.

මේඝිය ය, නො මුහුකළ චිත්තවිමුක්තිහුගේ මුහුකිරීම පිණිස පඤ්චධර්ම කෙනෙක් වෙති. කවර පසෙක යත්:

1. මේඝිය, මෙ සස්නෙහි මහණ කලණමිතුරන් ඇතියේ කලණ යහළුවන් ඇතියේ කලණ යහළුවන් කෙරෙහි නැඹුරු වූයේ වෙයි. මේඝිය ය, නො පිරිපැසුණු චිත්තවිමුක්තිහුගේ පරිපාකය පිණිස මේ පළමු දහම වෙයි.

2. මේඝිය, තවද මහණ සිල්වත් වූයේ ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූයේ වෙයි. ආචාරගොචරසම්පන්න වූයේ අණුමාත්‍රවද්‍යයෙහි භය දක්නා සුලු වැ වාස කෙරෙයි. සමාදන් කොට ගෙන සික‍පදයන්හි හික්මෙයි. මෙඝිය ය, නො පිරිපැසුණු චිත්තවිමුක්තිහුගේ පරිපාකය පිණිස මේ දෙවන ධර්මය වෙයි.

3. මේඝිය ය, තවද මහණ යම් මේ කථාවක් ක්ලෙශාභිලෙඛනයට හිතද, ශමථවිදර්ශනා චිත්තවිවරණයට සත්ප්‍රාය ද, එනම්, අප්පිච්ඡකථාය... විමුත්තිඤාණදස්සනකථා යි. එබඳු කථා කැමැති සේ ලබනසුලු සුවසේ ලබනසුලු විඳුල ව ලබන සුලු වෙයි. මෙඝිය ය, නො පිරිපැසුණු චිත්තවිමුත්තිහුගේ පරිපාකය පිණිස මේ තෙවන ධර්මය වෙයි.

4. තවද මේඝිය ය, මහණ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශල-ධර්මයන්ගේ උපසම්පත් පිණිස ස්ථාම ඇතියේ දළපැරකුම් ඇතියේ කුශල-ධර්මයන්හි නිඃක්ෂිප්ත ධූර ඇතියේ ඇරඹූ වැර ඇතියේ වෙසෙයි. මේඝිය ය, නො පිරිපැසුණු චිත්තවිමුක්තිහුගේ පරිපාකය පිණිස මේ සිවුවන ධර්මය වෙයි.

5. තවද මේඝිය ය, මහණ උදයව්‍යයගාමිනී වූ ආර්‍ය්‍ය වූ නිර්වේදය ඇසුරු කළ මොනොවට දුඃඛක්ෂයට යනසුලු ප්‍රඥයෙන් සමන්වාගත වූයේ පැණවත් වෙයි. මේඝිය ය, නො පිරිපැසුණු චිත්තවිමුක්තිහුගේ පරිපාකය පිණිස මේ පස්වන ධර්මය වෙයි.

කල්‍යාණමිත්තස්සෙතං මෙඝිය භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණ-සහායස්ස, කල්‍යාණසම්පවඞ්කස්ස: සීලවා භවිස්සති පාතිමොක්ඛසංවර-සංවුතො විහරිස්සති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු.

කල්‍යාණමිත්තස්සෙතං මෙඝිය භික්ඛුනො පාටිකඞ්ඛං, කල්‍යාණ-සහායස්ස, කල්‍යාණසම්පවඞ්කස්ස. යායං කථා අභිසල්ලෙඛිකා චෙතො-විවරණසප්පායා, සෙය්‍යථීදං; අප්පිච්ඡකථා -පෙ- විමුත්තිඤාණදස්සනකථා, එවරූපියා කථාය නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභී.

කල්‍යාණමිත්තස්සෙතං මෙඝිය භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණ සහායස්ස, කල්‍යාණසම්පවඞ්කස්ස ආරද්ධවිරියො විහරිස්සති -පෙ- කුසලෙසු ධම්මෙසු.

කල්‍යාණමිත්තස්සෙතං මෙඝිය භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණ-සහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස: පඤ්ඤවා භවිස්සති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා.

6-9 තෙන ච පන මෙඝිය භික්ඛුනො ඉමෙසු පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය චත්තාරො ධම්මා උත්තරිං භාවෙතබ්බා: අසුභා භාවෙතබ්බා රාගස්ස පහානාය, මෙත්තා භාවෙතබ්බා ව්‍යාපාදස්ස පහානාය, ආනාපානසති භාවෙතබ්බා විතක්කුපච්ඡෙදය, අනිච්චසඤ්ඤා භාවෙතබ්බා අස්මිමාන-සමුග්ඝාතාය. අනිච්චසඤ්ඤිනො මෙඝිය අනත්තසඤ්ඤා සණ්ඨාති. අනත්තසඤ්ඤී අස්මිමානසමුග්ඝාතං පාපුණාති. දිට්ඨෙව ධම්මෙ නිබ්බානන්ති.

## 9. 1. 1. 4

## නන්දක සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා නන්දකො උපට්ඨානසාලායං භික්ඛූ ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙති සම්පහංසෙති.

මේඝිය ය, කල්‍යාණමිතුරන් ඇති කල්‍යාණයහළුවන් ඇති කල්‍යාණමිතුරන් කෙරෙහි නැඹුරු වූ මහණහු විසින් මෙල කැමැති විය යුතු: ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවෘත වූයේ සිල්වත් වන්නේ ය, ආචාරගොචරසම්පන්න වූයේ අණුමාත්‍රවද්‍යයෙහි බිය දක්නා සුලු වැ වාස කරන්නේ ය, සමාදන් කොට ගෙන සිකපදයන්හි හික්මෙන්නේ ය කියා යි.

මේඝිය ය, කල්‍යාණ මිතුරන් ඇති කල්‍යාණ යහළුවන් ඇති කල්‍යාණ මිතුරන් කෙරෙහි නැඹුරු වූ මහණ විසින් මෙල කැමැති විය යුතු: අප්පිච්ඡකථා ය ... විමුත්තිඤාණදස්සනකථා ය යන අභිසල්ලෙඛයට හිත වූ චිත්තවිවරණයට සත්ප්‍රාය වූ යම මේ කථායෙක් වේ නම් එබඳු කථා කැමැති සේ ලබන සුලු, විපුල ව ලබන සුලු, නිදුකින් ලබන සුලු වෙයි.

මේඝිය ය, කල්‍යාණ මිතුරන් ඇති කල්‍යාණ යහළුවන් ඇති කල්‍යාණ මිතුරන් කෙරේ නැඹුරු මහණහු විසින් මෙල කැමැති විය යුතු: කුසල් දහම්හි ... ඇරඹූ වැර ඇතියේ වාස කරන්නේ ය කියා යි.

මේඝිය ය, කල්‍යාණමිතුරන් ඇති කල්‍යාණයහළුවන් ඇති කල්‍යාණ මිතුරන් කෙරේ නැඹුරු වූ මහණහු විසින් මෙල කැමැති විය යුතු: උදයව්‍යයගාමිනි වූ ආර්‍ය වූ නිර්වෙදයට හිත වූ මොනොවට දුඃඛක්ෂයට යනසුලු ප්‍රඥයෙන් සමන්වාගත වූයේ පැණවත්වන්නේ ය කියා යි.

6-9 මේඝිය ය, එ මහණහු විසින් මේ පඤ්චධර්මයන්හි පිහිටා මතුයෙහි සතර ධර්ම කෙනෙක් වැඩිය යුතුවහ: රාගයාගේ ප්‍රහාණය පිණිස අසුභයෝ වැඩිය යුතුවහ. ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස මෛත්‍රිය වැඩිය යුතුය. විතර්කොපච්ඡෙදය පිණිස ආනාපානසතිය වැඩිය යුතුය. අස්මිමාන-සමුද්ඝාතය පිණිස අනිත්‍යසංඥ වැඩිය යුතු. මෙඝිය, අනිත්‍යසංඥ ඇතියහුට අනාත්මසංඥ සිටුනේ ය. අනාත්මසංඥ ඇතියේ අස්මිමාන-සමුද්ඝාතයට පැමිණෙයි. ඉහාත්මයෙහි ම නිර්වාණයට පැමිණෙයි.

## 9. 1. 1. 4

## නන්‍දක සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වාසය කරන සේක. එසමයෙහි ආයුෂ්මත් නන්‍දක සථවිර උවටන්හල්හි දහැමි කථායෙන් මහණුන්ට කරුණු දක්වයි, සමාදන් කරවයි, සමුත්තෙජනා කරවයි, මොනොවට පහන් කරවයි.

අථ ඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන උපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බහිද්වාරකොට්ඨකෙ අට්ඨාසි කථාපරියොසානං ආගමයමානො. අථ ඛො භගවා කථාපරියොසානං විදිත්වා උක්කාසිත්වා අග්ගලං ආකොටෙසි. විවරිංසු ඛො තෙ භික්ඛූ භගවතො ද්වාරං. අථ ඛො භගවා උපට්ඨානසාලං පාවිසි. පවිසිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං නන්දකං එතදවොච: දීඝො ඛො ත්‍යායං නන්දක ධම්මපරියායො භික්ඛූනං පටිභාසි. අපි ච මෙ[1] පිට්ඨි ආගිලායති බහිද්වාරකොට්ඨකෙ ඨිතස්ස කථාපරියොසානං ආගමයමානස්සාති.

එවං වුත්තෙ ආයස්මා නන්දකො සාරජ්ජායමානරූපො[2] භගවන්තං එතදවොච, න ඛො මයං භන්තෙ ජානාම භගවා බහිද්වාරකොට්ඨකෙ ඨිතොති. සචෙ හි මයං භන්තෙ ජානෙය්‍යාම භගවා බහිද්වාරකොට්ඨකෙ ඨිතොති එත්තකම්පි[3] නො නප්පටිභාසෙය්‍යාති.

අථ ඛො භගවා ආයස්මන්තං නන්දකං සාරජ්ජායමානරූපං විදිත්වා ආයස්මන්තං නන්දකං එතදවොච: සාධු සාධු නන්දක, එවං ඛො නන්දක, තුම්හාකං පතිරූපං කුලපුත්තානං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතානං යං තුම්හෙ ධම්මියා කථාය සන්නිසීදෙය්‍යාථ. සන්නිපතිතානං වො නන්දක ද්වයං කරණීයං: ධම්මී වා කථා, අරියො වා තුණ්හීභාවො.

සද්ධො ච නන්දක භික්ඛු හොති නො ච සීලවා, එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං: කින්තාහං සද්ධො ච අස්සං සීලවා චාති. යතො ච ඛො නන්දක, භික්ඛු සද්ධො ච හොති සීලවා ච, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

සද්ධො ච නන්දක භික්ඛු හොති සීලවා ච, නො ච ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස. එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං: කිං තාහං සද්ධො ච අස්සං සීලවා ච ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්සාති. යතො ච ඛො නන්දක භික්ඛු සද්ධො ච හොති සීලවා ච, ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති. සද්ධො ච නන්දක භික්ඛු හොති සීලවා ච, ලාභී ච අජ්ඣත්තං චෙතො සමථස්ස. න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය. එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති.

---

1. අපි මෙ–මජසං
2. සාරජ්ජමානරූපො–මජසං
සාරජ්ජයමානරූපො–සීමු
3. එත්තකම්පි ධම්මං–මජසං

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වරුයෙහි පිළිසලතින් නැඟී සේක් උවටන්හල වෙත එළැඹි සේක. එළැඹ බිහිදෙරටුයෙහි කථාපර්‍යවසානය බලන සේක් වැඩ සිටියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කථාපර්‍යවසානය දැන කාරා දෙරඟල පහළහ. ඒ මහණහු භගවත්නට දොර විවර කළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ උපස්ථානශාලාවට පිවිසිය හ. පිවිස පැන වූ අස්නෙහි හුන්හ. හිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දකහට තෙල වදාළ සේක: නන්දකය, තාගේ මේ දීඝධර්මපර්‍යායය මහණුන් හට වැටහිණ. එතෙකුදු වුව බිහි දෙරටුයෙහි කතා කෙළවර බලා සිටි මාගේ පිට රිදෙයි.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් නන්දක බියපත් සැහැවී ඇත්තේ භාග්‍යවතුනට තෙල සැල කෙළේ ය: වහන්ස, අපි භාග්‍යවතුන් බිහි දෙරටුයෙහි සිටියහ යි නොදත්මු. වහන්ස, ඉදින් අපි භගවතුන් බිහි-දෙරටුයෙහි සිටියහ යි දත්තමෝ නම් අපට මෙ පමණකුදු නො වැටහේ යී. (නො කියවෙන්නේ යි.)

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දක ස්ථවිර බියපත් සැහැවී ඇතියහු දැන ආයුෂ්මත් නන්දක හට තෙල වදාළ සේක: නන්දකය, මැනවි, මැනවි. නන්දකය, කුලපුත්‍ර වූ සැදැහැයෙන් ගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වූ තොපට යම් හෙයකින් මෙබඳු දැහැමි කථායෙන් තෙපි හිඳිනහු නම් එය සුදුසු වෙයි. නන්දකය රැස් වූ තොප විසින් කටයුතු දෙකෙකි: දැහැමි කථාව හෝ ආර්‍යතූෂ්ණීම්භාවය හෝ යි.

නන්දකය, මහණ සැදැහැතියේ වෙයි. සිල්වත් නො ද වෙයි. මෙසේ හේ ඒ කරුණින් අපරිපූර්ණ වෙයි. ඔහු විසින් එකරුණ පිරිය යුතු: කවර උපායෙන් මම සැදැහැතියෙම් ද සිල් ඇතියෙම් ද වෙම් යි. නන්දකය, යම් කලෙක මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් වේ ද, මෙසේ හේ එකරුණින් පරිපූර්ණ වෙයි.

නන්දකය, මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් වෙයි. අධ්‍යාත්මයෙහි චිත්තසමථය නො ලබනසුලු වෙයි. මෙසේ හේ එකරුණින් අපරිපූර්ණ වෙයි. ඔහු විසින් එකරුණ පිරිය යුතු: කිමෙකින් මම සැදැහැතියෙම් ද සිල් ඇතියෙම් ද අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබනසුලු යෙම් ද වෙම්දැ යි. නන්දකය, යම් කලෙක මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබනසුලුයේත් වේ ද, මෙසේ හේ එ කරුණින් පරිපූර්ණ වෙයි. නන්දකය, මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබනසුලුයේත් වෙයි, සංස්කාරපරිග්‍රහවිදර්ශනාඥානය නොලබනසුලුයේ වෙයිද, මෙසේ හේ එකරුණින් අපරිපූර්ණ වේ.

සෙය්‍යථාපි නන්‍දක පාණකො චතුප්පාදකො, තස්සස්ස එකො පාදො ඔමකො ලාමකො, එවං සො තෙනඞ්ගෙන අපරිපූරො අස්ස, එවමෙව ඛො නන්‍දක භික්ඛු සද්ධො ච හොති සීලවා ච ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං; කින්තාහං සද්ධො ච අස්සං සීලවා ච ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤා-ධම්ම විපස්සනායාති. යතො ච ඛො නන්‍දක, භික්ඛු සද්ධො ච හොති සීලවා ච ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස ලාභී ච අධිපඤ්ඤා-ධම්මවිපස්සනාය, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොතීති.

ඉදමවොච භගවා ඉදං වත්‍වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො ආයස්මා නන්‍දකො අචිරපක්කන්තස්ස භගවතො භික්ඛු ආමන්තෙසි; ඉදනාවුසො භගවා චතූහි පදෙහි කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙත්‍වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: "සද්ධො ච නන්‍දක භික්ඛු හොති, නො ච සීලවා, එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති, තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං: කින්තාහං සද්ධො ච අස්සං සීලවාචාති. යතො ච ඛො නන්‍දක භික්ඛු සද්ධො ච හොති සීලවා ච, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති. සද්ධො ච නන්‍දක භික්ඛු හොති සීලවා ච, නො ච ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස -පෙ- ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති.

සෙය්‍යථාපි නන්‍දක, පාණකො චතුප්පාදකො, තස්සස්ස එකො පාදො ඔමකො ලාමකො, එවං සො තෙනඞ්ගෙන අපරිපූරො අස්ස. එවමෙව ඛො නන්‍දක, භික්ඛු සද්ධො ච හොති සීලවා ච, ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති, තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං. කින්තාහං සද්ධො ච අස්සං සීලවා ච ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනායාති. යතො ච ඛො නන්‍දක භික්ඛු සද්ධො ච හොති සීලවා ච ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොතීති.

නන්දකය, යම් පරිදි සිවුපා ඇති ප්‍රාණියෙක් වේ ද, ඔහුගේ එක පයෙක් හීන වූයේ ලාමක වූයේ වෙයි. මෙසේ හේ එ කරුණින් අපරිපූර්ණ වන්නේ ය. නන්දකය, එපරිදි ම මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුලුයේත් වෙයි. අධිප්‍රඥ ධර්මවිදර්ශනාව (සංස්කාරපරිග්‍රහවිදර්ශනාඥනය) නො ලබනසුලුයේ වෙයි. මෙසේ හේ එකරුණින් අපරිපූර්ණ වෙයි. ඔහු විසින් එකරුණ පිරිය යුතු: කවර කරුණින් මම සැදැහැතියෙම් සිල්ඇතියෙම් අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබනසුලු යෙම් ද සංස්කාරපරිග්‍රහ විදර්ශනාඥනය ලබනසුලුයෙම් ද වෙම් යි. නන්දකය, යම් කලෙක මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබනසුලුයේත් සංස්කාරපරිග්‍රහවිදර්ශනාඥන ලබනසුලුයේත් වේ ද, හේ මෙසේ එ කරුණින් පරිපූර්ණ වෙයි.

භගවත්හු මේ වදළහ: සුගත්හු මේ වදරා හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසියහ.

එකල්හි ආයුෂ්මත් නන්දක භාග්‍යවතුන් වහන්සේ වැඩි නො බෝ වේලාවෙකින් මහණුන් ඇමතී ය: ඇවැත්නි, දැන් භාග්‍යවතුන් වහන්සේ සිවුපෙදෙකින් සර්වපරිපූර්ණ වූ පරිශුද්ධ වූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කොට හුනස්නෙන් නැඟී (ගඳකිළි) වෙහෙරට පිවිසියහ. "නන්දකය, මහණ සැදැහැති වෙයි. නො ද සිල්වත් වෙයි. මෙසේ හේ එ කරුණින් අපරිපූර්ණ වෙයි. ඔහු විසින් එ කරුණ පිරිය යුතු: කවර කරුණින් මම සැදැහැතියෙම් ද සිල් ඇතියෙම් ද වෙම්"යි. නන්දකය, යම් කලෙක මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් වේ ද, මෙසේ හේ එ කරුණින් පරිපූර්ණ වෙයි. නන්දකය, මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් වෙයි. අධ්‍යාත්මයෙහි චිත්තසමථය නො ලබනසුලුයේත් වෙයි ... අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුලුයේත් වෙයි. සංස්කාරපරිග්‍රහවිදර්ශනාඥනය නො ලබන සුලුයේ වෙයි. මෙසේ හේ එකරුණින් අපරිපූර්ණ වෙයි.

නන්දකය, යම් පරිදි සිවුපා ඇති ප්‍රාණියෙක් වේ ද, ඔහුගේ එක් පයෙක් ඕමකය, ලාමකය, මෙසේ හේ එකරුණින් අපරිපූර්ණ වෙයි. නන්දකය, එ පරිදි ම මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබනසුලුයේත් වෙයි. සංස්කාරපරිග්‍රහවිදර්ශනාඥනය නො ලබනසුලුයේ වෙයි. මෙසේ හේ එකරුණින් අපරිපූර්ණ වෙයි. ඔහු විසින් එ කරුණ පිරිය යුතු. කවර කරුණින් මම සැදැහැතියෙම් ද සිල් ඇතියෙම් ද ආධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුලුයෙම් ද සංස්කාරපරිග්‍රහවිදර්ශනාඥන ලබනසුලුයෙම් ද වෙම් යි. නන්දකය, යම් කලෙක මහණ සැදැහැතියේත්, සිල් ඇතියේත්, අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුලුයේත් සංස්කාරපරිග්‍රහවිදර්ශනාඥන ලබන සුලුයේත් වේ ද, මෙසේ හෙතෙම එකරුණින් පරිපූර්ණ වේ"යයි.

පඤ්චිමෙ ආවුසො, ආනිසංසා කාලෙන ධම්මසවණෙ, කාලෙන ධම්මසාකච්ඡාය. කතමෙ පඤ්ච:

ඉධාවුසො, භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. යථා යථා ආවුසො, භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං -පෙ- පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති, තථා තථා සො සත්ථු පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච අයං ආවුසො, පඨමො ආනිසංසො කාලෙන ධම්මසවණෙ, කාලෙන ධම්මසාකච්ඡාය.

පුනචපරං ආවුසො, භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. යථා යථා ආවුසො, භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති, තථා තථා සො තස්මිං ධම්මෙ අත්ථපටිසංවෙදී ච හොති ධම්මපටිසංවෙදී ච, අයං ආවුසො, දුතියො ආනිසංසො කාලෙන ධම්මසවණෙ, කාලෙන ධම්මසාකච්ඡාය.

පුනචපරං ආවුසො, භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. යථා යථා ආවුසො භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති, තථා තථා සො තස්මිං ධම්මෙ ගම්භීරං අත්ථපදං පඤ්ඤාය අතිවිජ්ඣ පස්සති, අයං ආවුසො, තතියො ආනිසංසො කාලෙන ධම්මසවණෙ, කාලෙන ධම්මසාකච්ඡාය.

පුනචපරං ආවුසො, භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. යථා යථා ආවුසො භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. තථා තථා නං සබ්‍රහ්මචාරී උත්තරිං සම්භාවෙන්ති, "අද්ධා අයමායස්මා පත්තො වා පජ්ජති වා"[1]ති, අයං ආවුසො චතුත්ථො ආනිසංසො කාලෙන ධම්මසවණෙ, කාලෙන ධම්මසාකච්ඡාය.

පුනචපරං ආවුසො භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති: ආදිකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. යථා යථා ආවුසො, භික්ඛු භික්ඛූනං ධම්මං දෙසෙති ආදිකල්‍යාණං -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. තත්ථ තත්ථ යෙ තෙ භික්ඛු සෙඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති, තෙ තං ධම්මං සුත්වා විරියං ආරභන්ති අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. යෙ පන තත්ථ භික්ඛු අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා, තෙ තං ධම්මං සුත්වා දිට්ඨධම්මසුඛවිහාරඤ්ඤෙව අනුයුත්තා විහරන්ති. අයං ආවුසො, පඤ්චමො ආනිසංසො කාලෙන ධම්මසවණෙ, කාලෙන ධම්මසාකච්ඡාය. ඉමෙ ඛො ආවුසො, පඤ්ච ආනිසංසා කාලෙන ධම්මසවණෙ, කාලෙන ධම්මසාකච්ඡායාති.

1. පජ්ජති වා-මජසං. ගච්ඡති වා-සහා.

ඇවැත්නි, සුදුසු කල්හි ධර්මශ්‍රවණයෙහි, සුදුසු කල්හි ධර්මසාකච්ඡායෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණෙක් මහණුනට ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍යවසානකල්‍යාණ වූ සාර්‍ථසව්‍යඤ්ජන වූ දහම් දෙසයි. කෙවලපරිපූර්‍ණ වූ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍ය ප්‍රකාශ කරයි. ඇවැත්නි, යම් යම් පරිදි මහණ මහණුනට ආදිකල්‍යාණ වූ .. දහම් දෙසා නම් පරිශුද්ධබ්‍රහ්ම-චර්‍ය්‍ය පවසා නම් ඒ ඒ පරිදි හේ ශාස්තෘහට ප්‍රිය ද වෙයි. මනාප ද වෙයි. ගරුතන්හි සිටියේ වෙයි. සම්භාවනාවට සුදුසු ද වෙයි. ඇවැත්නි, මේ සුදුසු කල්හි ධර්මශ්‍රවණයෙහි, සුදුසු කල්හි ධර්මසාකච්ඡා කිරීමෙහි පළමු අනුසයි.

තවද ඇවැත්නි, මහණ මහණුනට ආදිකල්‍යාණ වූ ... දහම් දෙසයි. සසුන් බඹසර පවසයි. ඇවැත්නි, යම් යම් පරිදි මහණ මහණුනට ආදිකල්‍යාණ වූ දහම් දෙසා නම් බඹසර පවසා නම් ඒ ඒ පරිදි හේ එ දහම්හි අරුත් දන්නේත් වෙයි. පෙළ දහම් දන්නේත් වෙයි. ඇවැත්නි, සුදුසු කල්හි දහම් ඇසුම්හි, සුදුසු කල්හි ධර්මසාකච්ඡායෙහි මේ දෙවන අනුසසි.

තව ද ඇවැත්නි, මහණ මහණුනට ආදිකල්‍යාණ වූ ... දහම් දෙසයි. බඹසර පවසයි. ඇවැත්නි, යම් යම් පරිදි මහණ මහණුනට ආදිකල්‍යාණ වූ ... දහම් දෙසා නම් බඹසර පවසා නම් ඒ ඒ පරිදි හේ එ දහම්හි ගැඹුරු අරුත් පද විවසුන් සහගිය මහනුවණින් විනිවිද දක්නේ යි. ඇවැත්නි, කල්හි දහම් ඇසුම්හි, කල්හි ධර්මසාකච්ඡායෙහි මේ තෙවන අනුසසි.

තවද ඇවැත්නි, මහණ මහණුනට ආදිකල්‍යාණ වූ ... දහම් දෙසයි. බඹසර පවසයි. ඇවැත්නි, මහණ යම් යම් පරිදි මහණුනට ආදිකල්‍යාණ වූ ... දහම් දෙසා නම් බඹසර පවසා නම් ඒ ඒ පරිදි සබ්‍රම්සරහු ඔහට මතුයෙහි සම්භාවනා කෙරෙති: ''එකාන්තයෙන් මේ ආයුෂ්මත් (රහත්බවට) පැමිණියේ හෝ පැමිණෙන්නේ හෝ වේ''යයි. ඇවැත්නි, කල්හි දහම් ඇසුම්හි, කල්හි ධර්මසාකච්ඡායෙහි මේ සිවුවන අනුසසි.

තව ද ඇවැත්නි, මහණ මහණුනට ආදිකල්‍යාණ වූ ... දහම් දෙසයි. බඹසර පවසයි. ඇවැත්නි, යම් යම් පරිදි මහණ මහණුනට ආදිකල්‍යාණ වූ ... දහම් දෙසා නම් බඹසර පවසා නම් ඒ ඒ කරුණෙහි යම් ඒ මහණ කෙනෙක් ශෛක්‍ෂ වූවාහු රහත් පලයට නො පත් සිත් ඇත්තාහු අනුත්තර රහත්පල පතන්නාහු වෙසෙත් නම් ඔහු එ දහම් අසා අප්‍රාප්තමාර්‍ගඵලයාගේ ප්‍රාප්තිය පිණිස අනධිගතමාර්‍ගඵලයාගේ අධිගමය පිණිස අසාක්ෂාත්කෘත-යාගේ සාක්ෂාත්කරණය පිණිස වැර අරඹත්. යම් ඒ මහණ කෙනෙක් එහි ලා රහත් වූවාහු ක්ෂීණාශ්‍රව වූවාහු වැස නිම වූ මහබඹසර ඇත්තාහු කළ සිවුමහ කරණී ඇත්තාහු බහා තැබූ කෙලෙස්බර ඇතියාහු පැමිණි රහත්පල ඇතියාහු පරික්ෂීණ භවසංයෝජන ඇතියාහු මොනොවට දැන මිදුණාහු වෙත් නම් ඔහු එ දහම් අසා ඉහාත්මසුඛවිහරණ-යෙහි ම යෙදුණාහු වෙසෙත්. ඇවැත්නි, කල්හි දහම් ඇසුම්හි කල්හි ධර්ම සාකච්ඡායෙහි මේ පස්වන අනුසසි.

## 9. 1. 1. 5

## බලසඞ්ගහවත්ථු සුත්තං

[සාවත්ථිනිදානං]

චත්තාරිමානි භික්ඛවෙ බලානි, කතමානි චත්තාරි: පඤ්ඤාබලං විරියබලං අනවජ්ජබලං සඞ්ගහබලං. කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤාබලං: යෙ ධම්මා අකුසලා අකුසලසඞ්ඛාතා, යෙ ධම්මා කුසලා කුසලසඞ්ඛාතා, යෙ ධම්මා සාවජ්ජා සාවජ්ජසඞ්ඛාතා, යෙ ධම්මා අනවජ්ජා අනවජ්ජසඞ්ඛාතා, යෙ ධම්මා කණ්හා කණ්හසඞ්ඛාතා, යෙ ධම්මා සුක්කා සුක්කසඞ්ඛාතා, යෙ ධම්මා අසෙවිතබ්බා අසෙවිතබ්බසඞ්ඛාතා, යෙ ධම්මා සෙවිතබ්බා සෙවිතබ්බසඞ්ඛාතා, යෙ ධම්මා නාලමරියා නාලමරියසඞ්ඛාතා, යෙ ධම්මා අලමරියා අලමරියසඞ්ඛාතා, ත්‍යාස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා හොන්ති. ඉදං වුච්චති භික්ඛවෙ පඤ්ඤාබලං.

කතමඤ්ච භික්ඛවෙ විරියබලං: යෙ ධම්මා අකුසලා අකුසලසඞ්ඛාතා, යෙ ධම්මා සාවජ්ජා සාවජ්ජසඞ්ඛාතා, යෙ ධම්මා කණ්හා කණ්හසඞ්ඛාතා, යෙ ධම්මා අසෙවිතබ්බා අසෙවිතබ්බසඞ්ඛාතා, යෙ ධම්මා නාලමරියා නාලමරියසඞ්ඛාතා, තෙසං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. යෙ ධම්මා කුසලා කුසල-සඞ්ඛාතා, යෙ ධම්මා අනවජ්ජා අනවජ්ජසඞ්ඛාතා, යෙ ධම්මා සුක්කා සුක්කසඞ්ඛාතා, යෙ ධම්මා සෙවිතබ්බා සෙවිතබ්බසඞ්ඛාතා, යෙ ධම්මා අලමරියා අලමරියසඞ්ඛාතා, තෙසං ධම්මානං පටිලාභාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉදං වුච්චති භික්ඛවෙ විරියබලං.

## 9. 1. 1. 5
## බලසඞ්ගහවත්තු සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ බල සතරෙකි. කවර සතරෙක යත්: පඤ්ඤාබල ය, විරියබල ය, අනවජ්ජබල ය, සඞ්ගහබල යි. මහණෙනි, පඤ්ඤාබල නම් කවර යත්: අකුශල වූ අකුශලසඞ්ඛ්‍යාත වූ යම් දහම් කෙනෙක් වෙත් ද කුශල වූ කුශලසඞ්ඛ්‍යාත වූ යම් දහම් කෙනෙක් වෙත් ද, සාවද්‍ය වූ සාවද්‍යසඞ්ඛ්‍යාත වූ යම් දහම් කෙනෙක් වෙත් ද, අනවද්‍ය වූ අනවද්‍යසඞ්ඛ්‍යාත වූ යම් දහම් කෙනෙක් වෙත් ද, කෘෂ්ණ වූ කෘෂ්ණසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, ශුක්ල වූ ශුක්ලසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, අසෙවිතව්‍ය වූ අසෙවිතව්‍යසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, සෙවිතව්‍ය වූ සෙවිතව්‍යසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, ආය්‍ය්‍යභාවකරණයට අසමර්ථ වූ ආය්‍ය්‍යභාවකරණයට අසමර්ථ ය යි කියන ලද යම් ධර්ම කෙනෙක් වෙත් ද, ආය්‍ය්‍යභාවකරණයට සමර්ථ වූ ආය්‍ය්‍යභාවකරණයට සමර්ථ ය යි කියනලද යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඔහු විසින් ඒ ධර්මයෝ මොනොවට දක්නාලද්දහු වෙත්. මනොද්වාරයෙහි මොනොවට සමුදචාරප්‍රාප්ත වෙති. මහණෙනි, මේ පඤ්ඤාබල යි කියනු ලැබේ.

මහණෙනි, විරිය බල නම් කවර යත්: අකුශල වූ අකුශලසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, සාවද්‍ය වූ සාවද්‍යසඞ්ඛ්‍යාත වූ යම් ධර්මකෙනෙක් වෙත් ද, කෘෂ්ණ වූ කෘෂ්ණසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, අසේවිතව්‍ය වූ අසේවිතව්‍යසඞ්ඛ්‍යාත යම් ධර්ම කෙනෙක් වෙත් ද, ආය්‍ය්‍යභාවකරණයට අසමර්ථ වූ ආය්‍ය්‍යභාවකරණයට අසමර්ථ ය යි කියන ලද යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඒ දහමුන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය දනවයි, ව්‍යායාම කෙරෙයි, වැර අරඹයි, සිත නඟා ගනියි, ප්‍රධන්වීය්‍ය්‍ය කෙරෙයි, කුශල් වූ කුශලසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, අනවද්‍ය වූ අනවද්‍යසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, ශුක්ල වූ ශුක්ලසඞ්ඛ්‍යාත වූ යම් ධර්මකෙනෙක් වෙත් ද, සේවිතව්‍ය වූ සේවිතව්‍යසඞ්ඛ්‍යාත වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, ආය්‍ය්‍යභාවකරණයට සමර්ථ වූ ආය්‍ය්‍යභාවකරණයට සමර්ථ ය යි කියන ලද යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඒ දහමුන්ගේ ප්‍රතිලාභය පිණිස ඡන්දය දනවයි, ව්‍යායාම කරයි, වැර වඩයි, සිත නඟා ගනියි, ප්‍රධන් කෙරෙයි. මහණෙනි, මේ විරියබලැයි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ, අනවජ්ජබලං: ඉධ භික්ඛවෙ අරියසාවකො අනවජ්ජෙන කායකම්මෙන සමන්නාගතො හොති, අනවජ්ජෙන වචීකම්මෙන සමන්නාගතො හොති, අනවජ්ජෙන මනොකම්මෙන සමන්නාගතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ අනවජ්ජබලං.

කතමඤ්ච භික්ඛවෙ, සඞ්ගහබලං: චත්තාරිමානි භික්ඛවෙ සඞ්ගහවත්ථූනි. දානං පෙය්‍යවජ්ජං අත්ථචරියා සමානත්තතා. එතදග්ගං භික්ඛවෙ, දානානං යදිදං ධම්මදානං. එතදග්ගං භික්ඛවෙ, පෙය්‍යවජ්ජානං යදිදං අත්ථිකස්ස ඔහිතසොතස්ස පුනප්පුනං ධම්මං දෙසෙති. එතදග්ගං භික්ඛවෙ, අත්ථචරියානං යදිදං අස්සද්ධං සද්ධාසම්පදාය සමාදපෙති නිවෙසෙති පතිට්ඨාපෙති. දුස්සීලං සීලසම්පදාය සමාදපෙති නිවෙසෙති පතිට්ඨාපෙති, මච්ඡරිං චාගසම්පදාය සමාදපෙති නිවෙසෙති පතිට්ඨාපෙති. දුප්පඤ්ඤං පඤ්ඤාසම්පදාය සමාදපෙති නිවෙසෙති පතිට්ඨාපෙති, එතදග්ගං භික්ඛවෙ, සමානත්තතානං යදිදං සොතාපන්නො සොතාපන්නස්ස සමානත්තො, සකදාගාමී සකදාගාමිස්ස සමානත්තො, අනාගාමී අනාගාමිස්ස සමානත්තො, අරහං අරහතො සමානත්තො. ඉදං වුච්චති භික්ඛවෙ සඞ්ගහබලං. ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි බලානීති.

ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි බලෙහි සමන්නාගතො අරියසාවකො පඤ්චභයානි සමතික්කන්තො හොති, කතමානි පඤ්ච: ආජීවිකභයං අසිලොකභයං, පරිසසාරජ්ජභයං, මරණභයං, දුග්ගතිභයං. ස ඛො සො භික්ඛවෙ අරියසාවකො ඉතිපටිසඤ්චික්ඛති: නාහං ආජීවිකභයස්ස භායාමි, කිස්සාහං ආජීවිකභයස්ස භායිස්සාමි, අත්ථි මෙ චත්තාරි බලානි, පඤ්ඤාබලං විරියබලං අනවජ්ජබලං සඞ්ගහබලං. දුප්පඤ්ඤො ඛො ආජීවිකභයස්ස භායෙය්‍ය, කුසීතො ආජීවිකභයස්ස භායෙය්‍ය, සාවජ්ජකායකම්මන්තො වචීකම්මන්තො මනොකම්මන්තො ආජීවිකභයස්ස භායෙය්‍ය, අසඞ්ගාහකො ආජීවිකභයස්ස භායෙය්‍ය. නාහං අසිලොකභයස්ස භායාමි -පෙ- නාහං පරිසසාරජ්ජභයස්ස භායාමි -පෙ- නාහං මරණභයස්ස භායාමි -පෙ- නාහං දුග්ගතිභයස්ස භායාමි -පෙ- කිස්සාහං දුග්ගතිභයස්ස භායිස්සාමි අත්ථි මෙ චත්තාරි බලානි: පඤ්ඤාබලං විරියබලං අනවජ්ජබලං සඞ්ගහබලං. දුප්පඤ්ඤො ඛො දුග්ගතිභයස්ස භායෙය්‍ය. කුසීතො දුග්ගතිභයස්ස භායෙය්‍ය සාවජ්ජකායකම්මන්තො -පෙ- වචීකම්මන්තො -පෙ- මනොකම්මන්තො -පෙ- දුග්ගතිභයස්ස භායෙය්‍ය, අසඞ්ගාහකො දුග්ගතිභයස්ස භායෙය්‍ය, ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි බලෙහි සමන්නාගතො අරියසාවකො ඉමානි පඤ්චභයානි සමතික්කන්තො හොතීති.

මහණෙනි, අනවජ්ජබල නම් කවර: මහණෙනි, මෙසස්නෙහි අරිසවු අනවද්‍ය කායකර්මයෙන් සමන්වාගත වෙයි. අනවද්‍යවාක්කර්මයෙන් සමන්වාගත වෙයි. අනවද්‍ය මනඃකර්මයෙන් සමන්වාගත වේ. මහණෙනි, මේ අනවද්‍ය බලැයි කියනු ලැබේ.

මහණෙනි, සඞ්ගහබල නම් කවර යත්: මහණෙනි, මේ සඞ්ග්‍රහවස්තු සතරෙකි: දාන ය, ප්‍රියවචන ය, අර්ථචර්‍ය්‍යා ය, සමානාත්මතා යි. මහණෙනි, යම් මේ ධර්මදානයෙක් වේ ද, දානයන් අතුරෙහි මේ අග්‍ර යි. මහණෙනි, කන් යොමු කොටගත් ධර්මදෙශනායෙන් ප්‍රයොජන ඇතියකු හට පුනපුනා දම් දෙසන්නේය යන යමෙක් වේ නම් ප්‍රියවචන අතුරෙහි තෙල අග්‍ර යි. මහණෙනි, අශ්‍රාද්ධයකු ශ්‍රද්ධාසම්පත්හි සමාදන් කරවයි වස්වයි, පිහිටුවයි. දුසිල්හු ශීලසම්පත්හි සමාදන් කරවයි, වසවයි, පිහිටුවයි. මසුරන්හු ත්‍යාගසම්පත්හි සමාදන් කරවයි, වස්වයි, පිහිටුවයි. දුෂ්ප්‍රාඥයන් ප්‍රඥ-සම්පත්හි සමාදන් කරවයි, වස්වයි, පිහිටුවයි යන මෙ බඳු යමෙක් වේ නම් අර්ථචර්‍ය්‍යාවන් අතුරෙහි මේ අග්‍ර යි. සෝතාපන්න වූයේ සෝතාපන්න-යකුහට සමානාත්ම වෙයි. සකදාගාමී වූයේ සකදාගාමියක්හට සමානාත්ම වෙයි. අනාගාමී වූයේ අනාගාමියක්හට සමානාත්ම වෙයි. අර්හත් වූයේ අර්හත්හට සමානාත්ම වෙයි යන මෙබඳු යමෙක් වේ නම් සමානාත්ම-තාවන් අතුරෙහි මේ අග්‍ර යි. මහණෙනි, මේ සඞ්ග්‍රහබලැයි කියනු ලැබේ. මහණෙනි, මේ සතර බලයි.

මහණෙනි, මේ සතර බලයෙන් සමන්වාගත අරිසවු පස්බිය ඉක්ම වූයේ වෙයි. කවර පස් බියෙක යත්: ආජීවිකභය, (ජීවිතවෘත්තිය පිළිබඳ බිය) අසිලොකභය (ගැරහුම්ලැබීමේ බිය), පරිසසාරජ්ජභය, (පිරිස්මැද පසුබෑමේ බිය) මරණභය, දුග්ගතිභය (අපාය බිය) යි. මහණෙනි; ඒ අරිසවු තෙමේ මෙසේ සලකයි: මම ආජීවිකභයින් (දිවිවැටුම් බියෙන්) නො බානෙමි. කවර හෙයින් මම ආජීවිකභයින් බානෙම් ද, මට පඤ්ඤාබලය විරිය බලය, අනවජ්ජ බලය, සඞ්ගහබලය යන සතර බල ඇත. දුෂ්ප්‍රාඥ වූයේ ම ආජීවිකභයින් බානේ ය. කුසීත වූයේ ම ආජීවිකභයින් බානේ ය. සාවද්‍ය කායකර්මාන්ත ඇතියේ වාක්කර්මාන්ත ඇතියේ මනඃකර්මාන්ත ඇතියේ ආජීවිකභයින් බානේ ය. අසඞ්ග්‍රාහක වූයේ ආජීවිකභයින් බානේ ය. මම අසිලොක භයින් නො බමි ... මම පරිසසාරජ්ජභයින් නො බමි ... මම මරණභයින් නො බමි ... මම දුග්ගතිභයින් නො බමි ... කවර හෙයින් මම දුග්ගතිභයින් බානෙම් ද? මට සිවුබලයෙකෙනෙක් ඇත. පඤ්ඤාබලය, විරියබලය, අනවජ්ජබලය, සඞ්ගහබලයි. දුෂ්ප්‍රාඥ වූයේ ම දුග්ගතිභයින් බානේ ය. කුසීත වූයේ දුග්ගතිභයින් බානේ ය. සාවද්‍යකායකර්ම ඇතියේ.. වාක්කර්ම ඇතියේ... මනඃකර්ම ඇතියේ දුග්ගතිභයින් බානේ ය. අසඞ්ග්‍රාහක වූයේ දුග්ගතිභයින් බානේ ය. මහණෙනි, මේ සිවුබලෙන් සමන්වාගත අරිසවු මේ පස්බිය ඉක්ම ගියේ වෙයි.

# 9. 1. 1. 6

## සෙවිතබ්බාසෙවිතබ්බ සුත්තං

**[සාවත්ථිනිදානං]**

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවොති, ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං, ආයස්මා සාරිපුත්තො එතදවොච: පුග්ගලොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපි, චීවරම්පි ආවුසො දුවිධෙන වෙදිතබ්බං සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. පිණ්ඩපාතොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපි, සෙනාසනම්පි ආවුසො දුවිධෙන වෙදිතබ්බං සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. ගාමනිගමොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපි. ජනපදපදෙසොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපි.

"පුග්ගලොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපි"ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං තත්‍ථ යං ජඤ්ඤා පුග්ගලං "ඉමං ඛො මෙ පුග්ගලං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති යෙ ච ඛො මෙ පබ්බජිතෙන ජීවිත පරික්ඛාරා සමුදානෙතබ්බා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරා, තෙ ච කසිරෙන සමුදාගච්ඡන්ති. යස්ස චම්හි අත්‍ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො, සො ච මෙ සාමඤ්ඤත්‍ථො න භාවනා පාරිපූරිං ගච්ඡති"ති. තෙනාවුසො, පුග්ගලෙන සො පුග්ගලො රත්තිභාගං වා දිවසභාගං වා සඞ්ඛාපි අනාපුච්ඡා පක්කමිතබ්බං නානුබන්ධිතබ්බො:

තත්‍ථ යං ජඤ්ඤා පුග්ගලං "ඉමං ඛො මෙ පුග්ගලං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති. යෙ ච ඛො මෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා චීවරපිණ්ඩපාතසෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ ච අප්පකසිරෙන සමුදාගච්ඡන්ති. යස්ස චම්හි අත්‍ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො, සො ච මෙ සාමඤ්ඤත්‍ථො න භාවනා පාරිපූරිං ගච්ඡතීති, තෙනාවුසො පුග්ගලෙන සො පුග්ගලො සඞ්ඛාපි අනාපුච්ඡා පක්කමිතබ්බං නානුබන්ධිතබ්බො.

## 9. 1. 1. 6

## සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රය

[සැවැත්නිදන යි]

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ 'ඇවැත් මහණෙනි'යි මහණුන් ඇමතූ හ. ඇවැත්නි යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ තෙල කී හ: ඇවැත්නි, පුඟුලාත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි දෙපරිද්දෙන් දත යුත්තේ ය. ඇවැත්නි, චීවරයත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි දෙපරිද්දෙන් දතයුතු. පිණ්ඩපාතයත් සෙවිතව්‍යද අසෙවිතව්‍යදැ යි දෙපරිදියෙන් දතයුතු. ඇවැත්නි, සෙනසුනුත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍යදැ යි දෙපරිදියෙන් දතයුතු. ඇවැත්නි, ගම් නියම්ගමුත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි දෙපරිදියෙන් දතයුතු. ඇවැත්නි, දනවුපියෙසුත් සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැ යි දෙපරිදියෙන් දතයුතු.

''ඇවැත්නි, පුඟුල් ද සෙවිතව්‍ය ද අසෙවිතව්‍යදැ යි දෙපරිද්දෙන් දතයුතු වේ ය''යි තෙල යමෙක් කියන ලද නම් තෙල කුමක් සඳහා කියන ලද ද යත්: එහි යම් පුඟුලකු ''මෙ පුඟුල්හු සෙවුනාහට අකුසල් දහම්හු වැඩෙත්, කුසල් දහම්හු පිරිහෙත්. පැවිදි වූ මා විසින් ජීවිත පරිෂ්කාර වූ යම් සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර කෙනෙක් රැස්කර ගතයුතු වෙද් ද, ඔහුදු දුක සේ උපදිත්. යමක් ම සඳහා මම් ගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් වෙම් නම් මාගේ ඒ ශ්‍රාමණ්‍යාර්‍ථය ද භාවනායෙන් පිරිපුන් බවට නො යේ''යී දන්නේ නම් ඇවැත්නි, එ පුඟුල්හු විසින් ඒ පුද්ගල දැනත් රාත්‍රිභාගයෙහි වේවයි දිවසභාගයෙහි වේවයි නො විමසා බැහැර යායුතු යි. නො ලුහුබැඳිය යුතු.

එහි යම් පුඟුලකු ''මෙ පුඟුල් සෙවුනාවූ මාගේ අකුසල් දහම්හු වැඩෙත්; කුසල් දහම්හු පිරිහෙත්, පැවිදි වූ මා විසින් ජීවිතපරිෂ්කාර වූ යම් සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර කෙනෙක් රැස් කර ගතයුතු වෙත් නම් ඔහුත් නො දුකින් උපදිත්. යමක් ම සඳහා මම් ගෙන් නික්ම අනගාරිය සස්නෙහි පැවිදි වූයෙම් වෙම් නම් ඒ මාගේ ශ්‍රාමණ්‍යාර්‍ථයත් භාවනායෙන් පිරිපුන් බවට නො යේ''යී දන්නේ නම් ඇවැත්නි, එ පුඟුල්හු විසින් දැනත් එ පුඟුල් නො විමසා බැහැර යා යුතුයි. නො ලුහුබැඳිය යුතු.

තත්‍ථ යං ජඤ්ඤා පුග්ගලං "ඉමං බො මෙ පුග්ගලං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. යෙ ච බො මෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදනෙතබ්බා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ ච කසිරෙන සමුදගච්ඡන්ති. යස්ස චම්හි අත්‍ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො, සො ච මෙ සාමඤ්ඤත්‍ථො භාවනා පාරිපූරිං ගච්ඡති"ති. තෙනාවුසො පුග්ගලෙන සො පුග්ගලො සඞ්ඛාපි අනුබන්ධිතබ්බො න පක්කමිතබ්බං.

තත්‍ථ යං ජඤ්ඤා පුග්ගලං "ඉමං බො මෙ පුග්ගලං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති. යෙ ච බො මෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදනෙතබ්බා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තෙ ච අප්පකසිරෙන සමුදගච්ඡන්ති. යස්ස චම්හි අත්‍ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො. සො ච මෙ සාමඤ්ඤත්‍ථො භාවනා පාරිපූරිං ගච්ඡති"ති. තෙනාවුසො පුග්ගලෙන සො පුග්ගලො යාවජීවං අනුබන්ධිතබ්බො න පක්කමිතබ්බං අපි පනුජ්ජමානෙන. "පුග්ගලොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපි"ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

චීවරම්පි බො ආවුසො[1]: දුවිධෙන වෙදිතබ්බං සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි"ති. ඉති බො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ථ යං ජඤ්ඤා චීවරං "ඉදං බො මෙ චීවරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති"ති. එවරූපං චීවරං න සෙවිතබ්බං. තත්‍ථ යං ජඤ්ඤා චීවරං ඉදං බො මෙ චීවරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති"ති. එවරූපං චීවරං සෙවිතබ්බං. "චීවරම්පි බො ආවුසො දුවිධෙන වෙදිතබ්බං සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි"ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

"පිණ්ඩපාතොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපි"ති ඉති බො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ථ යං ජඤ්ඤා පිණ්ඩපාතං "ඉමං බො මෙ පිණ්ඩපාතං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති"ති. එවරූපො පිණ්ඩපාතො න සෙවිතබ්බො. තත්‍ථ යං ජඤ්ඤා පිණ්ඩපාතං ඉමං බො මෙ පිණ්ඩපාතං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති"ති. එවරූපො පිණ්ඩපාතො සෙවිතබ්බො "පිණ්ඩපාතොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපි"ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

1. චීවරම්පි ආවුසො-මජසං

එහිලා යම් පුඟුලක්හු "මෙ පුඟුල් සෙවුනා මාහට අකුශල ධර්මයෝ පිරිහෙත්, කුශලධම්යෝ වැඩෙත්, පැවිදි වූ මා විසින් ජීවිතපරිෂ්කාර වූ යම්බඳු සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකර උපදවාගත යුතු වී නම් එද නිදුකින් උපදතේ ය, යම් ම අර්හත් ඵල සඞ්ඛ්‍යාත අත්‍ථයක් පිණිස ගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් නම් මාගේ ඒ ශ්‍රාමණ්‍යාත්‍ථයත් භාවනායෙන් පිරිපුන්බවට යේ" යයි දන්නේ නම් ඇවැත්නි, ඒ පුඟුල්හු විසින් එ පුඟුල් දනගෙන ද ලුහුබැඳිය යුත්තේය. බැහැර නොයා යුතු.

එහිලා යම් පුඟුලකු "මේ පුඟුල්හු සෙවුනා මාහට අකුශල ධම්යෝ පිරිහෙත්. කුශලධම්යෝ වැඩෙත්, පැවිදිවූ මා විසින් සිවුරු පිඩුවා සෙනසුන්ගිලන්පසබෙහෙත්පිරිකර බඳු යම් ම ජීවිතපරිෂ්කාර කෙනෙක් උපයාගතයුතු වෙත් නම් ඔහුද නිදුකින් ඉපැයෙතැයි ද යම් රහත් පලක් පිණිස ගෙන් නික්ම පැවිද්දට පැමිණියෙම් වෙම් නම් මාගේ තෙල ශ්‍රාමණ්‍යාත්‍ථත් භාවනායෙන් පිරිපුන් බවට යේ යයි දන්නේ නම් ඇවැත්නි, ඒ පුඟුල්හු විසින් එ ම පුද්ගල දිවිහිමියෙන් ලුහුබැඳියයුත්තේ ය. නෙරනා ලදහු විසිනුදු බැහැර නොයා යුතු. "ඇවැත්නි, පුද්ගලයා ද සෙවිතව්‍ය ය, අසෙවිතව්‍යය යි දෙපරිදියෙන් දත යුත්තේ"යි ඒ යමක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලදි.

"ඇවැත්නි, චීවරත් සෙවිතව්‍ය ය අසෙවිතව්‍ය යයි දෙපරිදියෙන් දතයුතු"යි මෙසේ තෙල යමෙක් කියනලද නම් තෙල කුමක් සඳහා කියන ලද ද යත්: එහි ලා යම් චීවරයක් "මේ චීවරය සෙවුනා මට අකුශල-ධම්යෝ වැඩෙත්, කුශලධම්යෝ පිරිහෙත්"යයි දන්නේ නම් එබඳු චීවරය නො සෙවිය යුතු. එහි යම් චීවරයෙක් "මේ චීවරය සෙවුනා මට අකුශලධම්යෝ පිරිහෙත්, කුශලධම්යෝ වැඩෙත්" යයි දන්නේ නම් එබඳු චීවරය සෙවිය යුතු. "ඇවැත්නි, චීවරයත් සෙවියයුතුය නො සෙවිය යුතු යයි දෙපරිදියෙන් දතයුතු ය"යි මෙසේ ඒ යමෙක් කියන ලද නම් තෙල මේ සඳහා කියන ලදි.

"ඇවැත්නි, පිණ්ඩපාතයත් සෙවිතව්‍ය ය අසෙවිතව්‍ය ය යි දෙපරිදි-යෙන් දත යුතු ය"යි මෙසේ තෙල යමෙක් කියන ලද නම් තෙල කුමක් සඳහා කියන ලද ද යත්: එහිලා යම් පිණ්ඩපාතයක් "මේ පිණ්ඩපාතය සෙවුනා මට අකුශලධම්යෝ වැඩෙත්. කුශලධම්යෝ පිරිහෙත්"යයි දන්නේ නම් එබඳු පිණ්ඩපාතය නො සෙවිය යුත්තේ ය, එහිලා යම් පිණ්ඩපාතයක් "මේ පිණ්ඩපාතය සෙවුනා මට අකුශලධම්යෝ පිරිහෙත්, කුශලධම්යෝ වැඩෙත්" යයි දන්නේ නම් එබඳු පිණ්ඩපාතය සෙවිය යුත්තේ ය. "ඇවැත්නි; පිණ්ඩපාතයත් සෙවිතව්‍ය ය අසෙවිතව්‍ය යයි දෙ පරිදියෙන් දතයුතු ය"යි ඒ යමක් කියනලද නම් තෙල මෙ කරුණ සඳහා කියන ලදි.

"සෙනාසනම්පි ආවුසො දුවිධෙන වෙදිතබ්බං සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී"ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්චවුත්තං: තත්‍ර යං ජඤ්ඤා සෙනාසනං "ඉදං ඛො මෙ සෙනාසනං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තී"ති එවරූපං සෙනාසනං න සෙවිතබ්බං. තත්‍ර යං ජඤ්ඤා සෙනාසනං "ඉදං ඛො මෙ සෙනාසනං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී"ති එවරූපං සෙනාසනං සෙවිතබ්බං. "සෙනාසනම්පි ආවුසො දුවිධෙන වෙදිතබ්බං සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී"ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්චවුත්තං.

"ගාමනිගමොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපී"ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්චවුත්තං: තත්‍ර යං ජඤ්ඤා ගාමනිගමං "ඉමං ඛො මෙ ගාමනිගමං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තී"ති එවරූපො ගාමනිගමො න සෙවිතබ්බො. තත්‍ර යං ජඤ්ඤා ගාමනිගමං "ඉමං ඛො මෙ ගාමනිගමං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී"ති එවරූපො ගාමනිගමො සෙවිතබ්බො. "ගාමනිගමොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපී"ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

"ජනපදපදෙසොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපී"ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ර යං ජඤ්ඤා ජනපදපදෙසං "ඉමං ඛො මෙ ජනපදපදෙසං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තී"ති එවරූපො ජනපදපදෙසො න සෙවිතබ්බො. තත්‍ර යං ජඤ්ඤා ජනපදපදෙසං "ඉමං ඛො මෙ ජනපදපදෙසං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී"ති එවරූපො ජනපදපදෙසො සෙවිතබ්බො. "ජනපදපදෙසොපි ආවුසො දුවිධෙන වෙදිතබ්බො සෙවිතබ්බොපි අසෙවිතබ්බොපී"ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

"ඇවැත්නි, සේනාසනත් සේවිතව්‍ය ය අසේවිතව්‍ය යයි දෙපරිදියෙන් දතයුතු ය''යි මෙසේ තෙල යමෙක් කියන ලද නම් තෙල කුමක් සඳහා කියන ලද ද යත්: එහිලා යම් සෙනාසනයක් "මේ සෙනසුන සෙවුනා මට අකුශලධර්මයෝ වැඩෙත්, කුශලධර්මයෝ පිරිහෙත්'' යයි දන්නේ නම් එබඳු සේනාසනය නො සෙවිය යුතු ය. එහිලා යම් සේනාසනයක් "මේ සෙනසුන සෙවුනා මට අකුශලධර්මයෝ පිරිහෙත්, කුශලධර්මයෝ වැඩෙතැ''යි දන්නේ නම් එබඳු සේනාසනය සෙවිය යුතු යි. "ඇවැත්නි, සේනාසනයත් සෙවිතව්‍ය ය අසෙවිතව්‍ය ය යි දෙපරිදියෙන් දතයුතු'' යයි මෙසේ තෙල යමෙක් කියන ලද නම් තෙල මේ සඳහා කියනලද.

"ඇවැත්නි, ගම්නියම්ගමුදු සේවිතව්‍ය ය අසේවිතව්‍ය ය යි දෙපරිදියෙන් දත යුතු ය''යි මෙසේ තෙල යමෙක් කියන ලද නම් තෙල කුමක් සඳහා කියන ලද ද: එහිලා යම් ගම්නියම්ගමක් 'මේ ගම්නියම්ගම් සෙවුනා මට අකුශලධර්මයෝ වැඩෙත්, කුශලධර්මයෝ පිරිහෙති'යි දන්නේ නම් එබඳු ගම්නියම්ගම නො සෙවියයුතු. එහි යම් ගම් නියම්ගමක් "මේ ගම් නියම්ගම් සෙවුනා මට කුශලධර්මයෝ වැඩෙත්, අකුශලධර්මයෝ පිරිහෙති''යි දන්නේ නම් එබඳු ගම් නියම්ගම් සෙවිය යුතුයි. "ඇවැත්නි, ගම් නියම්ගමුදු සේවිතව්‍ය ය අසේවිතව්‍ය ය යි දෙපරිදියෙන් දතයුත්තේ ය''යි මෙසේ ඒ යමෙක් කියන ලද නම් තෙල මේ සඳහා කියනලද.

"ඇවැත්නි, දනවු පියෙසත් සේවිතව්‍ය ය අසේවිතව්‍ය ය යි දෙපරිදියෙන් දත යුතු ය''යි මෙසේ තෙල යමෙක් කියන ලද නම් තෙල කුමක් සඳහා කියන ලද ද යත්: එහිලා යම් දනවුපියෙසක් "මේ දනවුපියෙස සෙවුනා මට අකුශලධර්මයෝ වැඩෙත්, කුශලධර්මයෝ පිරිහෙති''යි දන්නේ නම් එබඳු දනවුපියෙස නො සෙවිය යුත්තේය, එහි ලා යම් දනවු පියෙසක් 'මේ දනවුපියෙස සෙවුනා මට කුශලධර්මයෝ වැඩෙත්, අකුශලධර්මයෝ පිරිහෙති'යි දන්නේ නම් එබඳු දනවුපියෙස සෙවිය යුතු ය. "ඇවැත්නි, දනවුපියෙස ද සේවිතව්‍ය ය අසේවිතව්‍ය ය යි දෙපරිදියෙන් දතයුතුය''යි මෙසේ ඒ යමෙක් කියනලද නම් තෙල මේ සඳහා කියනලද.

## 9. 1. 1. 7

## සුතවාපරිබ්බාජක සුත්තං

ඒවං මෙ සුතං, එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො සුතවා පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුතවා පරිබ්බාජකො භගවන්තං එතදවොච:

එකමිදං භන්තෙ, සමයං භගවා ඉධෙව රාජගහෙ විහරති ගිරිබ්බජෙ, තත්‍ර මෙ භන්තෙ, භගවතො සම්මුඛා පටිග්ගහිතං "යො සො සුතවා[1] භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො, අභබ්බො සො පඤ්චඨානානි අජ්ඣාචරිතුං. අභබ්බො ඛීණාසවො භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සම්පජානමුසා භාසිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සන්නිධිකාරකං කාමෙ පරිභුඤ්ජිතුං, සෙය්‍යථාපි පුබ්බෙ අගාරිකභූතොති." කච්චි මෙතං භන්තෙ, භගවතො සුස්සුතං සුග්ගහිතං සුමනසිකතං සූපධාරිතන්ති.

තග්ඝ තෙතං[2] සුතවා, සුස්සුතං සුග්ගහිතං සුමනසිකතං සූපධාරිතං. පුබ්බෙචාහං සුතවා, එතරහි ච එවං වදාමි. "යො සො භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤාවිමුත්තො. අභබ්බො සො නවඨානානි අජ්ඣාචරිතුං: අභබ්බො ඛීණාසවො භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සම්පජානමුසා භාසිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සන්නිධිකාරකෙ කාමෙ පරිභුඤ්ජිතුං, සෙය්‍යථාපි පුබ්බෙ අගාරියභූතො.

1. සුතං--ස්‍යා    2. තෙ.එතං--මජසං

## 9. 1. 1. 7

## සුතවාපරිබ්බාජක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි ගිජුකුළුපව්වෙහි වසන සේක. එකල්හි සුතවා පිරිවැජි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමඟ සතුටු විය. සතුටු විය යුතු සාරාණීය කථාව කොට නිම වා එකත්පස් ව හිඳ. එකත්පස් ව හුන් සුතවා පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ ය:

වහන්ස, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මේ (පර්වත වළල්ලෙන් වටවූ හෙයින්) ගිරිව්‍රජ නම් වූ රජගහනුවර ම වාස කරනසේක. වහන්ස, එකල්හි මා විසින් "සුතවායෙනි, යම් ඒ අර්හත් ක්ෂීණාස්‍රව වූ වැස නිමකළ මහ බඹසර ඇති කළ සිවුමහකරණී ඇති, බහාතැබූ කෙලෙස්බරැති, පැමිණි රහත් බැව් ඇති පරික්ෂීණ භව සංයොජන ඇති, මොනොවට දැන විමුක්ත වූ මහණෙක් වේ නම් හේ කරුණු පසක් ඉක්මවන්නට අභව්‍ය වෙයි: ක්ෂීණාස්‍රව මහණ දැන දැන ප්‍රාණියකු දිවියෙන් ගලවනට අභව්‍ය වෙයි. ක්ෂීණාස්‍රව මහණ ථෙය්‍ය සඞ්ඛ්‍යාත නුදුන් දැ සොරසිතින් ගන්නට අභව්‍ය වෙයි. ක්ෂීණාස්‍රව මහණ මෙවුන් දම් සෙවුමට අභව්‍ය වෙයි. ක්ෂීණාස්‍රව මහණ දැන දැන මුසවා කීමට අභව්‍ය වෙයි. ක්ෂීණාශ්‍රව මහණ පෙර ගිහි වූ පරිදි සන්නිධිකාරක ව හෙවත් තැන්පත් කොට තබාගෙන කාමයන් සෙවුමට අභව්‍ය වේ ය"යි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි අසන ලදී. හමුවෙහි පිළිගන්නා ලදී. වහන්ස, කිම මා විසින් භාග්‍යවතුන් වහන්සේගේ ඒ භාෂිතය මනාකොට අසන ලද ද? මනාකොට උගන්නා ලද ද? මොනොවට මෙනෙහි කරන ලද ද? මොනොවට දරන ලද දැ?යි.

සුතවායෙනි, එකතින් ඒ තා විසින් මොනොවට අසන ලද, මොනොවට උගන්නා ලද, මොනොවට මෙනෙහි නරන ලද, මනාකොට දරන ලද, සුතවායෙනි, දැනුදු මම මෙසේ කියමි: "අර්හත් ක්ෂීණාස්‍රව වූ වැස නිම වූ මහබඹසර ඇති, කළුමහ කිස ඇති බහාතැබූ කෙලෙස් බර ඇති පැමිණි රහත්පල ඇති ගෙවූ භවසංයොජන ඇති මොනොවට දැන මිදුණු යම් ඒ මහණෙක් වේ නම් හේ කරුණු පසක් මඩනට අභව්‍ය වෙයි. රහත්මහණ දැන දැන සතක්හු දිවියෙන් ගැලවීමට අභව්‍ය වෙයි. රහත්මහණ ථෙය්‍යසඞ්ඛ්‍යාත සොරසිතින් නුදුන් දැ ගන්නට අභව්‍ය වෙයි, රහත්මහණ මෙවුන්දම් සෙවුනට අභව්‍ය වෙයි. රහත්මහණ දැන දැන මුසවා කියනට අභව්‍ය වෙයි. රහත් මහණ පෙරගිහි වූ පරිදි සන්නිධිකාරක ව කාමයන් වළඳනට අභව්‍ය වෙයි.

අභබ්බො ඛීණාසවො භික්ඛු බුද්ධං පච්චක්ඛාතුං[1] අභබ්බො ඛීණාසවො භික්ඛු ධම්මං පච්චක්ඛාතුං[2] අභබ්බො ඛීණාසවො භික්ඛු සඞ්ඝං පච්චක්ඛාතුං[3] අභබ්බො ඛීණාසවො භික්ඛු සික්ඛං පච්චක්ඛාතුං[4]. පුබ්බෙවාහං සුතවා, එතරහි ච එවං වදමි: යො සො භික්ඛු අරහං වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. අභබ්බො සො ඉමානි නවට්ඨානානි අජ්ඣාචරිතුන්ති.

## 9. 1. 1. 8
## සජ්ඣපරිබ්බාජක සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති, ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො සජ්ඣො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි., සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සජ්ඣො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

එකමිදං භන්තෙ, සමයං භගවා ඉධෙව රාජගහෙ විහරති ගිරිබ්බජෙ. තත්‍ර මෙ භන්තෙ භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. "යො සො සජ්ඣ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. අභබ්බො සො පඤ්චට්ඨානානි අජ්ඣාචරිතුං:

අභබ්බො ඛීණාසවො භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු අදින්නං ථෙය්‍ය සඞ්ඛාතං ආදාතුං. අභබ්බො ඛීණාසවො භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවිතුං. අභබ්බො ඛීණාසවො භික්ඛු සම්පජානමුසා භාසිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සන්නිධිකාරකෙ කාමෙ පටිසෙවිතුං සෙය්‍යථාපි පුබ්බෙ අගාරියභූතොති. කච්චිමෙතං භන්තෙ, භගවතො, සුස්සුතං සුග්ගහීතං සුමනසිකතං සූපධාරිතන්ති.

1. පච්චාචික්ඛිතුං, සිමු-ඡන්දාගතිං ගන්තුං-මජසං
2. පච්චාචික්ඛිතුං, සිමු-දොසාගතිං ගන්තුං-මජසං
3. පච්චාචික්ඛිතුං, සිමු-මොහාගතිං ගන්තුං-මජසං
4. පච්චාචික්ඛිතුං සිමු-භයාගතිං ගන්තුං-මජසං

රහත්මහණ බුදුන් ප්‍රතික්ෂෙප කරනට අභව්‍ය වෙයි. රහත්මහණ ධර්මය ප්‍රතික්ෂෙප කරනට අභව්‍ය වෙයි. රහත්මහණ සංඝයා ප්‍රතික්ෂෙප කරනට අභව්‍ය වෙයි. රහත් මහණ ශික්ෂා ප්‍රතික්ෂෙප කරනට අභව්‍ය වෙ'' යයි. සූතවංශයෙනි, මම පෙරත් දතුත් ''අර්හත් වැසනිම වූ මහ බඹසර ඇති කළ සිවුමහකිස ඇති බහා තැබූ කෙලෙස් බරැති පත් රහත් පල ඇති ගෙවූ භවසංයොජන ඇති, යම් ඒ මහණෙක් වෙ නම්, හේ මේ කරුණු නවය මඩනට අභව්‍ය ය''යි මෙසේ ම කියමි යි.

## 9. 1. 1. 8
## සජ්ඣපරිබ්බාජක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි ගිජුකුළු පවුයෙහි වාසය කරන සේක. එකල්හි සජ්ඣ පිරිවැජි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතු සාරාණිය කථාව කොට නිමවා එකත්පස්ව හින. එකත්පස්ව හුන් සජ්ඣ පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකෙළේ ය:

වහන්ස, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මේ ගිරිව්‍රජ නම් වූ රජගහනුවර ම වාසය කරන සේක. වහන්ස, එකල්හි මා විසින් ''සජ්ඣයෙනි, අර්හත්, ක්ෂීණාසුව වූ වැසනිම වූ මහබඹසර ඇති, කළ සිවුමහකරණී ඇති බහාතැබූ කෙලෙස් බර ඇති පැමිණි රහත්ඵලසඞ්ඛ්‍යාත ස්වාර්ථ ඇති ගෙවූ භවසංයෝජන ඇති මනාකොට දැන විමුක්ත වූ යම් ඒ මහණෙක් වෙ නම් හේ කරුණු පසක් මඩනට අභව්‍ය වෙ''යි. භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අසනලදි. හමුයෙහි පිළිගන්නා ලදි:

රහත් මහණ දැන දැන පරපණ දිවියෙන් ගැලවුමට අභව්‍ය වෙයි. රහත් මහණ ථෙය්‍ය සඞ්ඛ්‍යාතය ගන්නට අභව්‍ය වෙයි. රහත් මහණ මෙවුන්දම් සෙවුනට අභව්‍ය වෙයි. රහත් මහණ දැන දැන මුසවා කීමට අභව්‍ය වෙයි, රහත් මහණ පෙර ගිහි වූ පරිදි සන්නිධිකාරක ව කාමයන් වළඳනට අභව්‍ය වෙ ය''යි. වහන්ස, කිම, මෙල මා විසින් මැනවින් අසන ලද ද? මනාකොට උගන්නා ලද ද? මොනොවට මෙනෙහි කරන ලද ද? මොනොවට දරන ලදද' යි.

තගස තෙ තං[1] සජ්ඣ, සුසසුතං සුගහිතං, සුමනසිකතං, සුපධාරිතං පුබ්බෙ චාහං සජ්ඣ, එතරහි ච එවං වදමි. "යො සො භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤාවිමුත්තො, අභබ්බො සො නවඨානානි අජ්ඣාචරිතුං, අභබ්බො ඛීණාසවො භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතුං -පෙ- අභබ්බො ඛීණාසවො භික්ඛු සන්නිධිකාරකෙ කාමෙ පරිභුඤ්ජිතුං, සෙය්‍යථාපි පුබ්බෙ අගාරියභූතො. අභබ්බො ඛීණාසවො භික්ඛු ඡන්දාගතිං ගන්තුං, අභබ්බො ඛීණාසවො භික්ඛු දොසාගතිං ගන්තුං, අභබ්බො ඛීණාසවො භික්ඛු මොහාගතිං ගන්තුං, අභබ්බො ඛීණාසවො භික්ඛු භයාගතිං ගන්තුං. පුබ්බෙචාහං සජ්ඣ, එතරහි ච එවං වදමි "යො ඛො භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො, අභබ්බො සො ඉමානි නවඨානානි අජ්ඣාචරිතු"න්ති.

## 9. 1. 1. 9

## පුග්ගල සුත්තං

[සාවත්ථිනිදානං]

නව ඉමෙ භික්ඛවෙ, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ නව: අරහා, අරහත්තාය පටිපන්නො, අනාගාමී, අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, සකදාගාමී, සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, සොතාපන්නො, සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො, පුථුජ්ජනො. ඉමෙ ඛො භික්ඛවෙ, නවපුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති.

## 9. 1. 1. 10

## ආහුනෙය්‍යපුග්ගල සුත්තං

[සාවත්ථිනිදානං]

නව ඉමෙ භික්ඛවෙ පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ නව: අරහා, අරහත්තාය පටිපන්නො, අනාගාමී, අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, සකදාගාමී, සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, සොතාපන්නො, සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො, ගොත්‍රභූ. ඉමෙ ඛො භික්ඛවෙ, නවපුග්ගලා ආහුනෙය්‍යා -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

සම්බොධිවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

සම්බොධිනිස්සයො චෙව මෙඝියං නන්දකං බලං,
සෙවනා සුතවා සජ්ඣො පුග්ගලො ආහුනෙය්‍යො චාති.

---

1. තෙ එතං–මජසං

සජ්ඣයෙනි, එකතින් තා විසින් එය මොනොවට අසන ලද, මොනොවට උගන්නා ලද, මොනොවට මෙනෙහි කරන ලද, මොනොවට දරන ලද වෙයි. සජ්ඣයෙනි, පෙර ද දුනුදු මම මෙසේ කියමි: ''අර්හත් වූ ක්ෂීණාශ්‍රව, වැසනිමවූ මහබඹසර ඇති, කළ සිවුමහකරණී ඇති බහාතැබූ කෙලෙස් බර ඇති, පිළිවෙළින් පත් අර්හත්‍වය ඇති, පරික්ෂීණභව-සංයොජන ඇති මොනොවට දන විමුක්ත වූ යම් ඒ මහණෙක් වේ නම් හේ නව කරුණකි මඩනට අභව්‍ය වේ: රහත් මහණ දන දන සතක්හු දිවියෙන් ගැළවීමට අභව්‍ය වෙයි, රහත් මහණ ථෙය්‍යසඞ්ඛ්‍යාතය ගැනුමට අභව්‍ය වෙයි. රහත් මහණ මෙවුන්දම් සෙවුනට අභව්‍ය වෙයි. රහත් මහණ දන දන මුසවා බණනට අභව්‍ය වෙයි, රහත් මහණ පෙර ගිහි වූ පරිදි සන්නිධිකාරක ව කාමයන් වළඳනට අභව්‍ය වෙයි. රහත් මහණ ඡන්දයෙන් අගතියට යනුවට අභව්‍ය වෙයි. රහත් මහණ ද්වෙෂයෙන් අගතියට යනුවට අභව්‍ය වෙයි. රහත්මහණ මෝහයෙන් අගතියට යනුවට අභව්‍ය වෙයි. රහත් මහණ භයෙන් අගතියට යනුවට අභව්‍ය වෙයි.'' සජ්ඣයෙනි, පෙරත් දුනුත් මම මෙසේ කියමි: රහත් වූ ක්ෂීණාශ්‍රව වූ වැස නිමවූ බඹසර ඇති, කළ සිවුමහකිස ඇති, බහාතැබූ කෙලෙස්බර ඇති, පිළිවෙළින් පත් රහත්බව ඇති, ගෙවූ භවසංයෝජන ඇති මොනොවට දන විමුක්ත වූ යම් ඒ මහණෙක් වේ නම්, හේ මේ නව කාරණයන් මඩනට අභව්‍ය වේ ය''යි.

## 9. 1. 1. 9
## පුග්ගල සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, ලොවිහි මේ පුද්ගලයෝ නවදෙනෙක් ඇතියහ. විද්‍යමාන වෙත්: කවර නවදෙනෙක යත්: අර්හත් ය, අර්හත්වයට පිළිපන්නෝ ය, අනාගාමී ය, අනාගාමීඵල සාක්ෂාත්කරණයට පිළිපන්නෝ ය, සකෘදගාමී ය, සකෘදගාමීඵල සාක්ෂාත්කරණට පිළිපන්නෝය. සොතාපන්න යැ සොතාපත්තිඵල පසක්කිරීමට පිළිපන්නෝ යැ, පෘථග්ජන යි. මහණෙනි, ලොවිහි මේ පුද්ගලයෝ නවදෙන ඇතියහ. විද්‍යමාන වෙත්.

## 9. 1. 1. 10
## ආහුනෙය්‍යපුග්ගල සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, ආහුනාර්හ, ප්‍රාඝූණාර්හ, දක්ෂිණාර්හ, අඤ්ජලි, කරණීය, ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ මේ පුද්ගලයෝ නවදෙනෙකි, කවර නවදෙනෙක යත්: අර්හත් ය, අර්හත්වයට පිළිපන්නෝ ය-අනාගාමී ය, අනාගාමීඵල සාක්ෂාත්කරණයට පිළිපන්නෝය, සකෘදගාමී ය. සකෘදගාමීඵල සාක්ෂාත් කරණයට පිළිපන්නෝ ය. ස්‍රොතාපන්න ය, ස්‍රොතාපත්තිඵල සාක්ෂාත්කරණයට පිළිපන්නෝ ය. ගොත්‍රභූ ය. මහණෙනි, මේ පුද්ගලයෝ නවදෙන ආහුනාර්හ ... ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වෙත්

**ප්‍රථම සම්බොධිවර්ග යි.**

එහි උද්දනය:

සම්බොධි සූත්‍රය, නිස්සය සූත්‍රය, මෙඝිය සූත්‍රය, නන්දක සූත්‍රය, බල සූත්‍රය, සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රය, සුතවා සූත්‍රය, සජ්ඣ සූත්‍රය, පුග්ගල සූත්‍රය, ආහුනෙය්‍ය සූත්‍රය යි දශයෙක.

# 2. සීහනාදවග්ගො

## 9. 1. 2. 1

## සාරිපුත්ත සීහනාද සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: "වුත්ථො මෙ භන්තෙ, සාවත්ථියං වස්සාවාසො, ඉච්ඡාමහං භන්තෙ, ජනපදචාරිකං පක්කමිතු"න්ති. යස්සදානි ත්වං සාරිපුත්ත, කාලං මඤ්ඤසීති. අථ ඛො ආයස්මා සාරිපුත්තො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො අඤ්ඤතරො භික්ඛු අචිරපක්කන්තෙ ආයස්මන්තෙ සාරිපුත්තෙ භගවන්තං එතදවොච: "ආයස්මා මං භන්තෙ, සාරිපුත්තො ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කන්තො"ති.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: "එහි ත්වං භික්ඛු, මම වචනෙන සාරිපුත්තං ආමන්තෙහි: 'සත්ථා තං ආවුසො සාරිපුත්ත, ආමන්තෙතී'ති". "එවං භන්තෙ"ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "සත්ථා තං ආවුසො සාරිපුත්ත, ආමන්තෙතී"ති. එවමාවුසොති ඛො ආයස්මා සාරිපුත්තො තස්ස භික්ඛුනො පච්චස්සොසි.

තෙන ඛො පන සමයෙන ආයස්මා ච මහාමොග්ගල්ලානො ආයස්මා ච ආනන්දො අවාපුරණං[1] ආදාය විහාරෙන විහාරං අන්වාහිණ්ඩන්ති[2] අභික්කමථායස්මන්තො, අභික්කමථායස්මන්තො, ඉදානායස්මා සාරිපුත්තො භගවතො සම්මුඛා සීහනාදං නදිස්සතීති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච: ඉධ තෙ සාරිපුත්ත, අඤ්ඤතරො සබ්‍රහ්මචාරී ඛීයනධම්මං ආපන්නො. "ආයස්මා මං භන්තෙ, සාරිපුත්තො ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කන්තො"ති.

1. අපාපුරණං, සයා.
2. ආහිණ්ඩන්ති, මජසං. විහාරං ආහිණ්ඩන්ති, සයා.

# 2. සිහනාදවග්ගය

## 9. 1. 2. 1

### සාරිපුත්ත සීහනාද සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු මහ සිටුහුගේ අරමහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වෙත එළැඹිය හ. එළැඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පස් ව හුන් හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භගවතුන්ට මෙසේ සැලකළහ: "වහන්ස, මා විසින් සැවැත්හි වස්සාවාසය වැස නිමවී ය. වහන්ස, මම ජනපදචාරිකාවට පිටත් වනු කැමැතියෙමි" යි. ශාරීපුත්‍ර ය, තෙපි දැන් යමක් සඳහා කල් දනිවූ නම් එය කරව, ඉක්බිති සැරියුත් තෙරණුවෝ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් සකසා වැඳ පැදකුණු කොට බැහැර ගියහ.

එකල එක්තරා මහණෙක් ආයුෂ්මත් සැරියුත් තෙරුන් ගිය නො බෝ කල්හි භගවත්නට මෙසේ සැලකළේ ය: "වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මා සටා වරද නො දෙසා චාරිකාවට පිටත් වූහ" යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු ඇමතූහ: මහණ, එව. තෙපි මාගේ වචනයෙන් "ඇවැත් ශාරීපුත්‍රයෙනි, ශාස්තෘහු තොප කැඳවති"යි සාරිපුත්‍රයන් අමතව, 'වහන්ස, එසේ ය'යි ඒ මහණ භගවත් නට පිළිවදන් අස්වා සැරියුත්තෙරුන් වෙත එළැඹියේ ය. එළැඹ මෙසේ කී ය: "ඇවැත් ශාරීපුත්‍රයෙනි, ශාස්තෘහු තොප අමතති"යි "ඇවැත්නි එසේය"යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ඒ මහණහට පිළිවදන් ඇස් වූ හ.

එ සමයෙහි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ද ආයුෂ්මත් ආනඳ තෙරණුවෝ ද දොරයතුරු ගෙන වෙහෙරින් වෙහෙර ඇවිදිනාහ. "ආයුෂ්මත්නි, එව ආයුෂ්මත්නි, එව දැන් ආයුෂ්මත් සැරියුත්තෙරණුවෝ භාග්‍යවතුන් හමුයෙහි සිංහනාද කරති"යි.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියහ. පැමිණ භගවතුන් සකසා වැඳ එකක්පසෙක හුන්හ. එකත් පස්ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරුනට භගවත්හු මෙසේ වදළහ: ශාරිපුත්‍රයෙනි, මෙහි තොපගේ එක්තරා සබ්‍රම්සරයකෙනෙක් කථාධම්යකට (දෙස් පැවසීමකට) පැමිණියහ. වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මා සටා නො කමවා චාරිකාවට පිටත් වූහ"යි.

1. යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස, සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය. සෙය්‍යථාපි භන්තෙ, පඨවියං[1] සුචිම්පි නික්ඛිපන්ති, අසුචිම්පි නික්ඛිපන්ති, ගූථගතම්පි නික්ඛිපන්ති, මුත්තගතම්පි නික්ඛිපන්ති, ඛෙළගතම්පි නික්ඛිපන්ති, පුබ්බගතම්පි නික්ඛිපන්ති, ලොහිතගතම්පි නික්ඛිපන්ති, න ච තෙන පඨවී අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා එවමෙව ඛො අහං භන්තෙ පඨවීසමෙන චෙතසා විහරාමි විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන.

2. යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස, සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය, සෙය්‍යථාපි භන්තෙ, ආපස්මිං සුචිම්පි ධොවන්ති, අසුචිම්පි ධොවන්ති, ගූථගතම්පි ධොවන්ති, මුත්තගතම්පි ධොවන්ති, ඛෙළගතම්පි ධොවන්ති, ලොහිතගතම්පි ධොවන්ති, න ච තෙන ආපො අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා එවමෙව ඛො අහං භන්තෙ ආපොසමෙන චෙතසා විහරාමි විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන.

3. යස්ස නූන භන්තෙ කායෙ කායගතා සති අනුපට්ඨිතා අස්ස, සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය. සෙය්‍යථාපි භන්තෙ, තෙජො සුචිම්පි ඩහති, අසුචිම්පි ඩහති, ගූථගතම්පි ඩහති, මුත්තගතම්පි ඩහති, ඛෙළගතම්පි ඩහති, පුබ්බගතම්පි ඩහති, ලොහිතගතම්පි ඩහති. න ච තෙන තෙජො අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා. එවමෙව ඛො අහං භන්තෙ තෙජොසමෙන චෙතසා විහරාමි, විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන.

යස්ස නූන භන්තෙ කායෙ කායගතා සති අනුපට්ඨිතා අස්ස, සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය. සෙය්‍යථාපි භන්තෙ, වායො සුචිම්පි උපවායති, අසුචිම්පි උපවායති, ගූථගතම්පි උපවායති, මුත්තගතම්පි උපවායති, ඛෙළගතම්පි උපවායති, පුබ්බගතම්පි උපවායති, ලොහිතගතම්පි උපවායති. න ච තෙන වායො අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා. එවමෙව ඛො අහං භන්තෙ, වායොසමෙන චෙතසා විහරාමි, විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන.

1. පඨවියං, මජසං.

1. වහන්ස, යමක්හට එකැතින් කයෙහි කාගියා සිහි නො එළැඹ සිටී නම් හේ මෙහි එක්තරා සබ්‍රම්සරකු සටා වරද නො දෙසා චාරිකාවට පිටත් වන්නේ ය. වහන්ස, යම් පරිදි පොළෝහි සුචිදැත් බහත් ද, අසුචි දැත් බහත් ද, මල හා මූ හා බහත් ද. කෙළත් බහත් ද, පූයාත් බහත් ද, ලෙහෙත් බහත් ද, පොළෝ ඉන් නො පෙළෙයි ලජ්ජිත හෝ නො වෙයි ජුගුප්සාවට හෝ නො පැමිණේ යි. වහන්ස, එ පරිදි ම මම පොළෝ සම වූ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ සිතින් වාස කරමි.

2. වහන්ස, යමකුට එකැතින් කයෙහි කාගියා සිහි නොඑළැඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා නො කමවා චාරිකාවට යන්නේ ය. වහන්ස, යම් පරිදි (ජලයෙහි) සුචිදැත් දෙවත්ද, අසුචිදැත් දෙවත් ද, ගූථත් දෙවත් ද, මුත්‍රත් දෙවත් ද, කෙළත් දෙවත් ද, පූයාත් දෙවත් ද, ලෙහෙත් දෙවත් ද, එයින් ආපය නො පෙළෙයි ලජ්ජිත හෝ නො වෙයි, ජුගුප්සා හෝ නො කෙරෙයි. වහන්ස, එපරිදිම මම විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ ආපොසම සිතින් වාස කරමි.

3. වහන්ස, එකැතින් යමකුට කයෙහි කාගියා සී නො එළැඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා නො කමවා චාරිකා පිණිස යන්නේ ය. වහන්ස, යම්පරිදි තේජස් (ගින්න) සුචිදැත් දවා ද, අසුචි දැත් දවා ද, ගූථත් දවා ද, මුත්‍රත් දවා ද, කෙළත් දවා ද, පූයාත් දවා ද, ලෙහෙත් දවා ද එයින් තෙජස් නො පෙළෙයි ලජ්ජිත නොවෙයි ජුගුප්සා නො කෙරෙයි. වහන්ස, එපරිදි ම මම් විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ තේජස් සම සිතින් වාස කරමි.

4. වහන්ස, එකැතින් යමකුට කයෙහි කාගියා සී නො එළඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා නො කමවා චාරිකාවට නික්මෙන්නේ ය. වහන්ස, යම් පරිදි වායුව සුචිදැත් ගෙන හමා ද, අසුචිදැත් ගෙන හමා ද, ගූථත් ගෙන හමා ද, මූත්‍රත් ගෙන හමා ද, කෙළත් ගෙන හමා ද, පූයාත් ගෙන හමා ද, ලෙහෙත් ගෙන හමාද එයින් වායුව නො ද පෙළෙයි ද ලජ්ජිත හෝ නො වෙයි ද ජුගුප්සා හෝ නො කෙරෙයි ද වහන්ස, එ පරිදි ම මම් විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ වායුසම සිතින් වාස කරමි.

5. යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස, සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය. සෙය්‍යථාපි භන්තෙ, රජොහරණං සුචිම්පි පුඤ්ඡති, අසුචිම්පි පුඤ්ඡති, ගූථගතම්පි පුඤ්ඡති මුත්තගතම්පි පුඤ්ඡති, ඛෙලගතම්පි පුඤ්ඡති, පුබ්බගතම්පි පුඤ්ඡති, ලොහිතගතම්පි පුඤ්ඡති. න ච තෙන රජොහරණං අට්ටීයති වා හරායති වා ජිගුච්ඡති වා. එවමෙව ඛො අහං භන්තෙ රජොහරණසමෙන චෙතසා විහරාමි, විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන.

6. යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස, සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය, සෙය්‍යථාපි භන්තෙ චණ්ඩාලකුමාරකො වා චණ්ඩාලකුමාරිකා වා කළොපිහත්ථො නන්තකවාසී ගාමං වා නිගමං වා පවිසන්තො නීචචිත්තංයෙව උපට්ඨපෙත්වා පවිසති. එවමෙව ඛො අහං භන්තෙ චණ්ඩාලකුමාරකසමෙන චෙතසා විහරාමි විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන.

7. යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස, සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය. සෙය්‍යථාපි භන්තෙ උසභො ඡින්නවිසාණො සොරතො[1] සුදන්තො සුවිනීතො රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං අන්වාහිණ්ඩන්තො න කිඤ්චි හිංසති පාදෙන වා විසාණෙන වා. එවමෙව ඛො අහං භන්තෙ උසභඡින්නවිසාණසමෙන චෙතසා විහරාමි විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන.

8. යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස. සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය. සෙය්‍යථාපි භන්තෙ ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා වා මණ්ඩනකජාතිකො සීසං නහාතො අහිකුණපෙන වා කුක්කුරකුණපෙන වා මනුස්සකුණපෙන වා කණ්ඨෙ ආසත්තෙන අට්ටීයෙය්‍ය, හරායෙය්‍ය ජිගුච්ඡෙය්‍ය. එවමෙව ඛො අහං භන්තෙ ඉමිනා පූතිකායෙන අට්ටීයාමි හරායාමි ජිගුච්ඡාමි.

1. සුරතො- ස්‍යා. PTS සූරතො-කත්ථචි.

5. වහන්ස, එකැතින් යමකුට කයෙහි කායගතාසතිය නො එළැඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා නො කමවා චාරිකාවට නික්මෙන්නේ ය. වහන්ස, යම් පරිදි පිස්නාකඩ සුවිදැත් පිස්නේ ද, අසුවිදැත් පිස්නේ ද, ගූථත් පිස්නේ ද මූත්‍රත් පිස්නේ ද කෙළත් පිස්නේ ද, පූයාත් පිස්නේ ද, ලෙහෙත් පිස්නේ ද, එයින් පිස්නාකඩ නො ද පෙළෙයි නො ද ලජ්ජිත වෙයි නො ද ජුගුප්සා කෙරෙයි. වහන්ස, එ පරිදි ම මම් විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ පිස්නා කඩ බඳු සිතින් වාස කරමි.

6. වහන්ස, යමකුට එකැතින් කයෙහි කායගතාසතිය නො එළැඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා වරද නො දෙසා චාරිකාවට පිටත් වන්නේ ය. වහන්ස, යම් පරිදි සැඩොල් දරුවෙක් හෝ සැඩොල් දූරියක් හෝ පැසක් ගත් අත් ඇත්තේ පියලි කඩක් හැඳියේ ගමකට වේවයි නියම්ගමකට වේවයි වදනේ හළ මන් ඇති සිත් ම එළවා වදනේ ද, වහන්ස, එ පරිදි ම මම් විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ සැඩොල් දරුවකු සම සිතින් වාස කරමි.

7. වහන්ස, යමකුට එකැතින් කයෙහි කාගියාසිහි නො එළැඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා නො කමවා චාරිකාවට යන්නේ ය. වහන්ස, යම් පරිදි සුන් අං ඇති ගොනෙක් සූරත වූයේ දමුණේ සුවිනීත වූයේ වෙයින් වෙය සිවුමංසලින් සිවුමංසල ඇවිදුනේ පයින් වේවයි හඟින් වේවයි කිසිවකු නො පෙළා ද, වහන්ස, එ පරිදි ම මම් විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ සුන් අං ඇති වැහැප් බඳු සිතින් වාස කරමි.

8. වහන්ස, එකැතින් යමකුට කයෙහි කාගියාසිහි නො එළඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා නො කමවා චාරිකාවට යන්නේ ය. වහන්ස, යම් පරිදි තරුණ වූ හෝ තුරුණු බැවිහි සිටියාවූ හෝ සැරසුම් සැහැවි ඇති ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි හිසැ නහා ලූයේ ගෙළ බැඳි අහිකුණපයෙන් හෝ කුක්කුරකුණපයෙන් හෝ මනුෂ්‍යකුණපයෙන් හෝ පෙළේ ද, ලජ්ජිත වේ ද, ජුගුප්සා කෙරේ ද, වහන්ස, එපරිදි ම මම මේ කුණුකයින් පෙළෙමි, ලජ්ජිතයෙමි, ජුගුප්සා කෙරෙමි.

9. යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍ය. සෙය්‍යථාපි භන්තෙ පුරිසො මෙදකථාලිකං පරිහරෙය්‍ය ඡිද්දං විච්ඡිද්දං[1] උග්ඝරන්තං පග්ඝරන්තං. එවමෙව ඛො අහං භන්තෙ ඉමං කායං පරිහරාමි, ඡිද්දං විච්ඡිද්දං උග්ඝරන්තං පග්ඝරන්තං.

යස්ස නූන භන්තෙ කායෙ කායගතාසති අනුපට්ඨිතා අස්ස, සො ඉධ අඤ්ඤතරං සබ්‍රහ්මචාරිං ආසජ්ජ අප්පටිනිස්සජ්ජ චාරිකං පක්කමෙය්‍යාති.

අථ ඛො සො භික්ඛු උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: "අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං. යොහං ආයස්මන්තං සාරිපුත්තං අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛිං. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායා"ති.

තග්ඝ තං[2] භික්ඛු අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං යො ත්වං සාරිපුත්තං අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛි. යතො ච ඛො ත්වං භික්ඛු අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි, තං තෙ මයං පතිගණ්හාම. වුද්ධිහෙසා භික්ඛු අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජතීති.

අථ ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි: ඛම සාරිපුත්ත ඉමස්ස මොඝපුරිසස්ස පුරා තස්ස එත්ථෙව සත්තධා මුද්ධා ඵලිස්සතීති.

ඛමාමහං භන්තෙ තස්ස ආයස්මතො සචෙ මං සො ආයස්මා එවමාහ: ඛමතු ච මෙ[3] සො ආයස්මාති.

1. ඡිද්දවච්ඡිද්දං,-මජසං.
2. තග්ඝ ත්වං,-සිමු. PTS
3. ඛමතු මෙ, සිමු.

වහන්ස, එකැතින් යමෙකුට කයෙහි කායගතාසිහි නො එළැඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා නො කමවා චාරිකාවට යන්නේය. වහන්ස, යම් පරිදි පුරුෂයෙක් සිදුරු ඇති මහසිදුරු ඇති උඩු මුවින් වැහෙන යුසඇති යටිමුවින් ගලන යුස ඇති සිදුරු මෙද තෙල් පිරුණු සැළියක් නොහොත් යුස නික්මීම පිණිස තන්හි තන්හි කළ සිදුරු ඇති ථාලිකාවක් (මසින් පූරවාගෙන) පරිහරණ කෙරේ ද, වහන්ස, එපරිදි ම මම් කුදු මහත් සිදුරු ඇති උඩුමුවින් වැහෙන අසුචි ඇති යටිමුවින් ගලන අසුචි ඇති මේ කය පරිහරණය කරමි.

වහන්ස, එකැතින් යමකුට කයෙහි කායගතාසිහි නො එළැඹ සිටී නම් හේ මෙ සස්නෙහි එක්තරා සබ්‍රම්සරක්හු සටා නො කමවා චාරිකාවට යන්නේ ය.

ඉක්බිති එ මහණ හුනස්නෙන් නැඟී උත්තරාසඞගය එකස් කොට ලා භගවතුන්ගේ පාමුල හිසින් හෙව භගවත්නට තෙල සැලකළේ ය. ''වහන්ස, බාලයකු කරා යම්සේ නම් මූඪයකු කරා යම්සේ නම් අදක්ෂයකු කරා යම්සේ නම් එසේ දෙෂය මා ඉක්ම ගියේ ය. යම්බඳු මම් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් අසත්‍ය වූ සිස් වූ මුසා වූ අභූතයෙන් අබ්බවා කියෙම් නම් එ හෙයිනි. වහන්ස, භගවතුන් මතුයෙහි සංවර පිණිස ඒ මාගේ අපරාධය අපරාධ වීසින් පිළිගන්නා සේක්වා''යි.

යම් බඳු වූ තෙපි සැරියුත් තෙරුන් අසත්‍ය වූ තුච්ඡ වූ මෘෂා වූ අභූත යෙන් අබ්බවා කීහු ද නියතින් බාලයකුට යම්සේ නම් මූඪයකුට යම්සේ නම් අදක්ෂයකුට යම්සේ නම් එසේ දෙෂය තොප ඉක්මැ ගියේ ය. මහණ, යම් හෙයෙකින් තෙපි වරද වරද වීසින් දක දහම් වූ පරිදි ප්‍රතික්‍රියා කරවූ නම් අපි තොපගේ ඒ වරද පිළිගනිමු. මහණ ආර්‍ය්‍ය විනයෙහි යමෙක් වරද වරද වීසින් දක දහම් වූ පරිදි ප්‍රතික්‍රියා කෙරේ නම් මතුයෙහි සංවරයට පැමිණේ නම් තෙල වෘද්ධියෙක් ම ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන් ඇමතූහ: ''ශාරිපුත්‍රය, මොහුගේ හිස මෙ තන්හි ම සත්කඩෙක් ව පැළේ නම් එයට පළමු ම මේ හිස් පුහුල් හට සමා කරව''යි.

''වහන්ස, ඉදින් ඒ ආයුෂ්මත් මට ක්ෂමා කෙරේව''යි මෙසේ කියා නම් ඒ ආයුෂ්මත් හට මම් කමමි''යි.

## 9. 1. 2. 2

### සොපාදිසෙස සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩි-කස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි. අථ ඛො ආයස්මතො සාරි-පුත්තස්ස එතදහොසි: "අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුප-සඞ්කමෙය්‍ය"න්ති. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථි-යෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි.

තෙන ඛො පන සමයෙන තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: "යො හි කොචි ආවුසො සොපාදිසෙසො[1] කාලං කරොති සබ්බො සො අපරිමුත්තො නිරයා, අපරිමුත්තො තිරච්ඡානයොනියා, අපරිමුත්තො පෙත්තිවිසයා, අපරි-මුත්තො අපාය දුග්ගති විනිපාතා"ති.

අථ ඛො ආයස්මා සාරිපුත්තො තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජ-කානං භාසිතං නෙව අභිනන්දි, න පටික්කොසි. අනභිනන්දිත්වා අප්පටික්කො-සිත්වා උට්ඨායාසනා පක්කාමි, "භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමී"ති අථ ඛො ආයස්මා සාරිපුත්තො සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච:

"ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසිං. තස්ස මය්හං භන්තෙ එතදහොසි: "අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍ය"න්ති. අථඛ්වාහං භන්තෙ යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිං. උප-සඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං.

1. සඋපාදිසෙසො,-මජසං. සිමු.

## 9. 1. 2. 2

## සොපාදිසෙස සූත්‍රය

1. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවසනසේක. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙන සැවැත්හි පිඩු පිණිස පිවිසියහ. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරුනට තෙල සිත විය: ''සැවැත්හි පිඩු පිණිස සරනට ඉතා කල් ඇත්තේ ය. මම අන්තොටු පිරිවැජි අරම යම්තන්හි ද, එහි එළඹෙම් නම් ඉතා මැනැවැ''යි. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අන්තොටු පිරිවැජි අරමට එළඹිය හ. එළැඹ ඒ අන්තොටු පිරිවැජියන් හා සතුටු වූහ සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ.

එසමයෙහි රැස්ව හුන් ඒ පිරිවැජියන් අතර මේ අතුරු කථාව උපන: ''ඇවැත්නි, යම් කිසිවෙක් උපාදන ශේෂ ඇතියේ කලුරිය කෙරේ නම් ඒ හැම දෙන නිරයෙන් නො මිදුණේ වෙයි. තිරිසන්යෝනින් නො මිදුණේ වෙයි. ප්‍රේතවිෂයෙන් නො මිදුණේ වෙයි. අපායදුගතියෙන් නො මිදුණේ වෙ''යි.

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ඒ අන් තොටු පිරිවැජියන්ගේ භාෂිතය නො ම පිළිගත්හ. නො ම පිළිකෙව් කළහ. නො පිළිගෙන නො පිළිකෙව් කොට හුනස්නෙන් නැඟී නික්ම ගියහ, ''භගවතුන් හමුයෙහි තෙල භාෂිතයාගේ අරුත් දැන ගනිමැ''යි. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සැවැත්හි පිඩු පිණිස සැරැ පසුබත්හි පිඩුවායෙන් වැළකුණාහු භගවතුන් වෙත එළඹිය හ. එළැඹ භගවතුන් සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භගවත්නට තෙල සැලකළහ.

''වහන්ස, මෙහි මම් පෙරවරුයෙහි හැඳ පෙරව පා සිවුරු ගෙන සැවැත්හි පිඩු පිණිස පිවිසියෙමි. වහන්ස, ඒ මට තෙල සිත විය. 'සැවැත්හි පිඩු පිණිස සරනට ඉතාකල් ඇත්තේ ය. මම අන්තොටු පිරිවැජියන්ගේ අසපුව යම්තෙනෙක්හි ද, එහි එළඹෙන්නෙම් නම්, ඉතා යෙහෙකැ''යි. වහන්ස, ඉක්බිති මම අන්තොටු පිරිවැජියන්ගේ අසපුව යම්තෙනෙක්හි ද, එහි එළඹියෙමි. එළඹ ඒ අන්තොටු පිරිවැජියන් හා සතුටු වූයෙමි. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්මි.

තෙන ඛො පන සමයෙන තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: "යොහිකොචි ආවුසො සොපාදිසෙසො කාලං කරොති, සබ්බො සො අපරිමුත්තො නිරයා, අපරිමුත්තො තිරච්ඡානයොනියා, අපරිමුත්තො පෙත්තිවිසයා අපරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා''ති. අථ්‍ඛවාහං භන්තෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිං න පටික්කොසිං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කාමිං භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමී''ති.

කෙ ච[1] සාරිපුත්ත අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා බාලා අබ්‍යත්තා, කෙ ච සොපාදිසෙසං[2] වා උපාදිසෙසොති ජානිස්සන්ති, අනුපාදිසෙසං වා අනුපාදිසෙසොති ජානිස්සන්ති.

නව ඉමෙ සාරිපුත්ත පුග්ගලා සොපාදිසෙසා කාලං කුරුමානා පරිමුත්තා නිරයා, පරිමුත්තා තිරච්ඡානයොනියා, පරිමුත්තා පෙත්තිවිසයා, පරිමුත්තා අපායදුග්ගතිවිනිපාතා. කතමෙ නව:

1. ඉධ සාරිපුත්ත එකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං පරිපූරකාරී පඤ්ඤාය මත්තසොකාරී.[3] සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරා පරිනිබ්බායී හොති. අයං සාරිපුත්ත, පඨමො පුග්ගලො සොපාදිසෙසො කාලං කුරුමානො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා පරිමුත්තො පෙත්තිවිසයා පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

2-5 පුනචපරං සාරිපුත්ත ඉධෙකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං පරිපූරකාරී, පඤ්ඤාය මත්තසොකාරී[4] සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා උපහච්ච පරිනිබ්බායී හොති -පෙ- අසඞ්ඛාරපරිනිබ්බායී හොති -පෙ- සසඞ්ඛාර පරිනිබ්බායී හොති -පෙ- උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. අයං සාරිපුත්ත පඤ්චමො පුග්ගලො සොපාදිසෙසො කාලං කුරුමානො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගති විනිපාතා.

---

1. කෙචි-PTS. සයා.
2. සඋපාදිසෙසං- මජසං, සීමු.
3. න පරිපූරකාරී, සීමු.
4. න පරිපූරකාරී, සීමු.

වහන්ස, එසමයෙහි, රැස්ව හුන් ඒ අන්තොටු පිරිවැජියන්ගේ මේ අතුරු කථාව උපන: "ඇවැත්නි, යම් කිසිවෙක් උපාදනශේෂ ඇතියේ කලුරිය කළේ නම් ඒ හැමදෙන නිරයෙන් නො මිදුණේ වෙයි, තිරිසන්යොනින් නො මිදුණේ වෙයි, ප්‍රේතවිෂයෙන් නො මිදුණේ වෙයි, අපායදුගතින් නොමිදුණේ වේ"යි. වහන්ස, එකල්හි මම ඒ අන්තොටුපිරිවැජියන්ගේ භාෂිතය නො ම පිළිගතිමි, නො ම පිළිකෙව් කෙළෙමි. නො පිළිගෙන නො පිළිකෙව් කොට හුනස්නෙන් නැඟී "භගවතුන් හමුයෙහි තෙල භාෂිතයාගේ අරුත් දනගන්මි"යි නික්ම ගියෙමි යි.

ශාරිපුත්‍රය, බාල වූ අව්‍යක්ත වූ ඒ අන්තොටු පිරිවැජියෝ කවරහ: කවරහු සඋපාදනශේෂ ඇතියකු හෝ සෝපාදිසේසයෙකැයි දනිත්ද, අනුපාදිශේෂයකු හෝ අනුපාදිශේෂයෙකැයි දනිත්ද:

ශාරිපුත්‍රය, මේ සෝපාදිශෙෂ පුද්ගලයෝ නවදෙනෙක් කලුරිය කරන්නාහු නිරයෙන් මිදුණාහු වෙති. තිරිසන් යොනින් මිදුණාහු වෙති. ප්‍රේතවිෂයෙන් මිදුණාහු වෙති. අපාය දුර්ගති විනිපාතයෙන් මිදුනාහු වෙති. කවර නවදෙනෙක යත්:

1. ශාරිපුත්‍රය, මෙ සස්නෙහි ඇතැම් පුහුලෙක් ශීලයෙහි පරිපූරකාරි වෙයි. සමාධියෙහි පරිපූරකාරි වෙයි. ප්‍රඥයෙහි මාත්‍රකාරී වෙයි. හේ පඤ්චඔරම්භාගිය සංයෝජනයන්ගේ පරික්ෂයෙන් අන්තරාපරිනිබ්බායී වෙයි. ශාරිපුත්‍රය, මේ සොපාදිසෙසව කලුරිය කරන නිරයෙන් මුත් තිරිසන් යොනින් මුත් ප්‍රේතවිෂයෙන් මුත් අපායදුර්ගතිවිනිපාතයෙන් මුත් ප්‍රථමපුද්ගල යි.

2–5 ශාරිපුත්‍රයෙනි, තවද, මෙ සස්නෙහි ඇතැම් පුහුලෙක් සීලයෙහි පරිපූරකාරි වෙයි. සමාධියෙහි පරිපූරකාරි වෙයි. ප්‍රඥයෙහි මාත්‍රකාරි වෙයි. හේ පඤ්චඔරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයෙන් උපහච්ච-පරිනිබ්බායී වෙයි... අසඞ්ඛාර පරිනිබ්බායී වෙයි.... සසඞ්ඛාර පරිනිබ්බායී වෙයි... උද්ධං සොත අකණිට්ඨගාමී වෙයි... ශාරිපුත්‍රය, මේ සොපාදිසෙසව කලුරිය කරන නිරයෙන් මුත් තිරිසන්යොනින් මුත් ප්‍රෙතවිෂයෙන් මුත් අපායදුර්ගතිවිනිපාතයෙන් මුත් පස්වැනි පුද්ගල යි.

6. පුනචපරං සාරිපුත්ත, ඉධෙකච්චො පුග්ගලො, සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං මත්තසොකාරී, පඤ්ඤාය මත්තසොකාරී.[1] සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා රාගදෙසමොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයං සාරිපුත්ත ඡට්ඨො පුග්ගලො සොපාදිසෙසො කාලං කුරුමානො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගති විනිපාතා.

7. පුනචපරං සාරිපුත්ත ඉධෙකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී හොති සමාධිස්මිං මත්තසොකාරී[1] පඤ්ඤාය මත්තසොකාරී[1], සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා එකබීජී හොති එකඤ්ඤෙව මානුසකං භවං නිබ්බත්තෙත්වා දුක්ඛස්සන්තං කරොති. අයං සාරිපුත්ත සත්තමො පුග්ගලො සොපාදිසෙසො කාලං කුරුමානො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගති-විනිපාතා.

8. පුනචපරං සාරිපුත්ත ඉධෙකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං මත්තසොකාරී, පඤ්ඤාය මත්තසොකාරී, සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා කොලංකොලො හොති, ද්වෙ වා තීණි වා කුලානි සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තකරො. අයං සාරිපුත්ත, අට්ඨමො පුග්ගලො සොපාදිසෙසො කාලං කුරුමානො පරිමුත්තො නිරයා -පෙ- පරිමුත්තො අපායදුග්ගතිවිනිපාතා.

9. පුනචපරං සාරිපුත්ත ඉධෙකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී හොති සමාධිස්මිං මත්තසොකාරී පඤ්ඤාය මත්තසොකාරී. සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සත්තක්ඛත්තුපරමො හොති, සත්තක්ඛත්තුපරමං දෙවෙ ච මානුසෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති. අයං සාරිපුත්ත නවමො පුග්ගලො සොපාදිසෙසො කාලං කුරුමානො පරිමුත්තො නිරයා, පරිමුත්තො තිරච්ඡානයොනියා, පරිමුත්තො පෙත්තිවිසයා, පරිමුත්තො අපායදුග්ගති විනිපාතා.

කෙ ච සාරිපුත්ත අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා බාලා අබ්‍යත්තා, කෙ ච සොපාදිසෙසං වා සොපාදිසෙසොති ජානිස්සන්ති. අනුපාදිසෙසං වා අනුපාදි-සෙසොති ජානිස්සන්ති.

ඉමෙ ඛො සාරිපුත්ත නව පුග්ගලා සොපාදිසෙසා කාලං කුරුමානා පරිමුත්තා නිරයා, පරිමුත්තා තිරච්ඡානයොනියා, පරිමුත්තා පෙත්තිවිසයා, පරිමුත්තා අපායදුග්ගතිවිනිපාතා. න තාවායං සාරිපුත්ත ධම්මපරියායො පටිභාසි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. තං කිස්ස හෙතු: මායිමං ධම්මපරියායං සුත්වා පමාදං ආහරිස්සන්ති, අපි ච මයා සාරිපුත්ත ධම්මපරියායො පඤ්හාධිප්පායෙන භාසිතොති.

1. න පරිපූරකාරී, සිමු.

6. ශාරිපුත්‍රය, තවද මෙ සස්නෙහි ඇතැම් පුහුලෙක් සීලයෙහි පරිපූරකාරි වෙයි. සමාධියෙහි පරිපූරකාරි වෙයි, ප්‍රඥායෙහි මාත්‍රකාරි වෙයි, හේ ත්‍රිවිධ සංයොජනයන්ගේ පරික්ෂයෙන් රාග ද්වෙෂ මෝහයන්ගේ තනුත්‍ව-යෙන් සකෘදගාමී වෙයි. වරක් ම මේ ලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි. ශාරිපුත්‍රය, මෙ සොපාදිසෙස ව කලුරිය කරන නිරයෙන් මුත්, තිරිසන් යොනින් මුත් ප්‍රෙතවිෂයෙන් මුත් අපාය දුර්ගති විනිපාතයෙන් මුත් සවැනි පුද්ගල යි.

7. ශාරිපුත්‍රය, තවද මෙ සස්නෙහි ඇතැම් පුහුලෙක් සීලයෙහි පරිපූරකාරි වෙයි. සමාධියෙහි මාත්‍රකාරි වෙයි. ප්‍රඥාවෙහි මාත්‍රකාරී වෙයි.. හේ ත්‍රිවිධ සංයොජනයන්ගේ පරික්ෂයෙන් එකබීජී වෙයි. එක් ම මිනිසත් බවක් නිපදවා දුක් කෙළවර කෙරෙයි. ශාරිපුත්‍රය, මේ සොපාදිසෙස ව කලුරිය කරන නිරයෙන් මුත් තිරිසන් යොනින් මුත් ප්‍රේතවිෂයෙන් මුත් අපාය දුර්ගති විනිපාතයෙන් මුත් සත්වැනි පුද්ගල යි.

8. ශාරිපුත්‍රය, තවද මෙ සස්නෙහි ඇතැම් පුහුලෙක් සීලයෙහි පරිපූරකාරි වෙයි. සමාධියෙහි, මාත්‍රකාරි වෙයි. ප්‍රඥායෙහි මාත්‍රකාරි වෙයි. හේ ත්‍රිවිධසංයොජනයන්ගේ පරික්ෂයෙන් කොලංකොල වෙයි. දෙකක් හෝ තුනක් හෝ කුලයන් (කාමලොකයෙහි) දිව හැසිර දුක් කෙළවර කෙරෙයි. ශාරිපුත්‍රය, මේ සොපාදිසෙස ව කලුරිය කරන නිරයෙන් මුත්... අපාය දුර්ගති විනිපාතයෙන් මුත් අටවැනි පුද්ගල යි.

9. ශාරිපුත්‍රය, තවද මෙසස්නෙහි ඇතැම් පුහුලෙක් සීලයෙහි පරිපූරකාරි වෙයි, සමාධියෙහි මාත්‍රකාරි වෙයි, ප්‍රඥයෙහි මාත්‍රකාරි වෙයි. හේ ත්‍රිවිධ සංයොජනයන්ගේ පරික්ෂයෙන් සත්තක්ඛත්තු පරම වෙයි. දෙව ලොව ද මිනිස් ලොව ද සත්වරක් පරම කොට දිව හැසිර දුක් කෙළවර කෙරෙයි. ශාරිපුත්‍රය, මේ සොපාදිසෙස ව කලුරිය කරන නිරයෙන් මුත් තිරිසන් යොනින් මුත් ප්‍රෙතවිෂයෙන් මුත් අපාය දුර්ගති විනිපාතයෙන් මුත් නවවැනි පුද්ගල වෙයි.

ශාරිපුත්‍රය, බාල වූ අව්‍යක්ත වූ ඒ අන්තොටු පිරිවැජියෝ කවරහ: කවරහු සඋපාදනශේෂයකු සෝපාදිසේසයෙකැයි හෝ දනිත් ද: අනුපාදි සෙයකු අනුපාදිසේසයෙකැයි හෝ දනිත් ද?

ශාරිපුත්‍රය, මේ සෝපාදිශෙෂ පුද්ගලයෝ නවදෙනෙක් කලුරිය කරන්නාහු නිරයෙන් මිදුණාහු වෙති. තිරිසන් යොනින් මිදුණාහු වෙති. ප්‍රෙතවිෂයෙන් මිදුණාහු වෙති. අපාය දුර්ගතිවිනිපාතයෙන් මිදුණාහු වෙත්. ශාරිපුත්‍රය, මේ ධර්ම පරියායය භික්ෂූන්ට, භික්ෂුණීන්ට උපාසකයන්ට, උපාසිකාවන්ට මෙතාක් නො වැටහිණි. (මම නො කියෙමි) ඒ කවර හෙයින යත්: මේ ධර්මපර්‍යායය අසා (මතුරහත් බව පිණිස වැර නොකරන ඔහු) ප්‍රමාදයට නොපැමිණෙත්වා යි. වැලිත් ශාරිපුත්‍රය ප්‍රශ්නාධිප්‍රායයෙන් (තොප ඇසූ ප්‍රශ්නයට සභාග වශයෙන්) මා විසින් මේ ධර්මපර්‍යායය දෙසනලදි යි.

# 9. 1. 2. 3

## මහාකොට්ඨිත සුත්තං

**[සාවත්ථිනිදානං]**

අථ ඛො ආයස්මා මහාකොට්ඨිතො[1] යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

කින්නු ඛො ආවුසො සාරිපුත්ත යං කම්මං දිට්ඨධම්මවෙදනීයං තං මෙ කම්මං සම්පරායවෙදනීයං හොතූති, එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කිම්පනාවුසො සාරිපුත්ත යං කම්මං සම්පරායවෙදනීයං, තමෙම කම්මං දිට්ඨධම්මවෙදනියං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත යං කම්මං සුඛවෙදනියං, තං මෙ කම්මං සුඛවෙදනියං[2] හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත යං කම්මං දුක්ඛවෙදනියං තං මෙ කම්මං සුඛවෙදනියං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත යං කම්මං පරිපක්කවෙදනියං තං මෙ කම්මං අපරිපක්කවෙදනියං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කිම්පන ආවුසො සාරිපුත්ත යං කම්මං අපරිපක්කවෙදනියං තං මෙ කම්මං පරිපක්කවෙදනියං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කින්නු ඛො ආවුසො සාරිපුත්ත යං කම්මං බහුවෙදනියං තං මෙ කම්මං අප්පවෙදනියං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

---

1. මහාකොට්ඨිකො-මජසං, 2. දුක්ඛවෙදනියං-මජසං,

## 9. 1. 2. 3

## මහාකොට්ඨිත සූත්‍රය

**(සැවැත්නිදාන යි)**

එකල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වෙත එළැඹිය හ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරුන් සමඟ සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මෙසේ කීහ:

ඇවැත් ශාරිපුත්‍රය, කිමෙක යම් කර්මයෙක් දෘෂ්ටධර්මවේදනීය වේ නම් මාගේ ඒ කර්මය සම්පරාය වේදනීය වේවායි යන මෙම කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දැයි? ඇවැත්නි, මෙය නො වේ මැයි.

ඇවැත් ශාරිපුත්‍රය, කිම යම් කර්මයෙක් සම්පරාය වේදනීය නම් මාගේ ඒ කර්මය දෘෂ්ටධර්ම වේදනීය වේවායි යන මෙම කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේද්ද යි? ඇවැත්නි, මෙය නො වේ මැයි.

ඇවැත් ශාරිපුත්‍රය, කිම යම් කර්මයෙක් සුඛවේදනීය වේ නම් මාගේ ඒ කර්මය සුඛවේදනීය ම වේවායි මෙම කරුණෙහි අරුත් සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ ද යි? ඇවැත්නි, මෙය නො වේ මැයි.

කිම ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් දුඃඛවේදනීය වේ නම් මාගේ ඒ කර්මය සුඛවේදනීය වේවායි මෙම කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දැයි? ඇවැත්නි, මෙය නො වේ මැයි.

ඇවැත් ශාරිපුත්‍රය, කිම යම් කර්මයෙක් පරිපක්වවේදනීය වේ නම් මාගේ ඒ කර්මය අපරිපක්වවේදනීය වේව යි මෙම කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේදැයි? ඇවැත්නි, මෙය නො වේ මැයි.

ඇවැත් ශාරිපුත්‍රය, කිම යම් කර්මයෙක් අපරිපක්වවේදනීය වේ නම් මාගේ ඒ කර්මය පරිපක්වවේදනීය වේවායි මෙම කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේදැයි? ඇවැත්නි, මෙය නො වේ ම යි.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් බහුවේදනීය වේ නම් මාගේ ඒ කර්මය අල්පවේදනීය වේවායි මෙම කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දැයි? ඇවැත්නි, මෙය නො වේ මැයි.

කිම්පනාවුසො සාරිපුත්ත, යං කම්මං අප්පවෙදනීයං තං මෙ කම්මං බහුවෙදනීයං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කිනනු ඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං වෙදනීයං තං මෙ කම්මං අවෙදනීයං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කිම්පනාවුසො සාරිපුත්ත, යං කම්මං අවෙදනීයං තං මෙ කම්මං වෙදනීයං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති? නො හිදං ආවුසො.

කිනනු ඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං දිට්ඨධම්මවෙදනීයං තං මෙ කම්මං සම්පරායවෙදනීයං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

කිනනු ඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං සම්පරාය වෙදනීයං තං මෙ කම්මං දිට්ඨධම්මවෙදනීයං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

කිනනු ඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං සුඛවෙදනීයං තං මෙ කම්මං සුඛවෙදනීයං[1] හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

කිනනු ඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං දුක්ඛවෙදනීයං තං මෙ කම්මං සුඛවෙදනීයං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

කිනනු ඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං පරිපක්කවෙදනීයං තං මෙ කම්මං අපරිපක්කවෙදනීයං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

කිනනු ඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං අපරිපක්කවෙදනීයං තං මෙ කම්මං පරිපක්කවෙදනීයං හොතූති එතස්ස අත්ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

1. දුක්ඛවෙදනීයං, මජසං.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් අල්පවෙදනීය වෙ නම් මාගේ ඒ කර්මය බහුවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේද්දයි? ඇවැත්නි, මෙය නො වේ මැ යි.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් වෙදනීය නම් මාගේ ඒ කර්මය අවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භගවතුන් කෙරෙහි බඹසර වැසේද්දයි? ඇවැත්නි, මෙය නො වේ මැ යි.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් අවෙදනීය නම් මාගේ ඒ කර්මය වෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දදයි? ඇවැත්නි, මේ නො වේ මැයි.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් දෘෂ්ට ධර්මවෙදනීය නම් මාගේ ඒ කර්මය සම්පරායවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේද්දයි මෙසේ පුළුවුස්නා ලද්දූයේ ම ඇවැත්නි, මෙය නො වේ මැයි කියහි.

කිමෙක, ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් සම්පරායවෙදනීය වේ නම් මාගේ ඒ කර්මය දෘෂ්ටධර්මවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දදයි මෙසේ පුළුවුස්නා ලද්දූයේ ම ඇවැත්නි, මෙය නො වේ මැයි කියහි.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් සුඛවෙදනීය නම් මාගේ ඒ කර්මය දුඃඛවෙදනීය ම වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දදයි මෙසේ පුළුවුස්නා ලද්දූයේ ම ඇවැත්නි, මෙය නො වේ මැයි කියහි.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් දුඃඛ වෙදනීය නම් මාගේ ඒ කර්මය සුඛවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දදයි මෙසේ පුළුවුස්නා ලද්දූයේ ම ඇවැත්නි, මෙය නො වේ මැයි කියහි.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් පරිපක්ව වෙදනීය වේ නම් මාගේ ඒ කර්මය අපරිපක්ව වෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දදයි මෙසේ පුළුවුස්නා ලද්දූයේ ඇවැත්නි, මෙය නොවේ මැයි කියහි.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් අපරිපක්වවෙදනීය නම් මාගේ ඒ කර්මය පරිපක්වවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ දදයි මෙසේ පුළුවුස්නා ලද්දූයේ ඇවැත්නි, මෙය නො වේ මැයි කියහි.

කිනනුඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං බහුවෙදනියං තං මෙ කම්මං අප්පවෙදනියං හොතූති එතස්ස අත්‍ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

කිනනුඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං අප්පවෙදනියං තං මෙ කම්මං බහුවෙදනියං හොතූති එතස්ස අත්‍ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

කිනනුඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං වෙදනියං තං මෙ කම්මං අවෙදනියං හොතූති එතස්ස අත්‍ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි.

කිනනුඛො ආවුසො සාරිපුත්ත, යං කම්මං අවෙදනියං තං මෙ කම්මං වෙදනියං හොතූති එතස්ස අත්‍ථාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති ඉති පුට්ඨො සමානො නො හිදං ආවුසොති වදෙසි. අථ කිමත්‍ථං චරහාවුසො, භගවති බ්‍රහ්මචරියං වුස්සතීති?

යං ඛ්වස්සාවුසො,[1] අඤ්ඤාතං අදිට්ඨං අප්පත්තං අසච්ඡිකතං අනභිසමෙතං, තස්ස ඤාණාය දස්සනාය පත්තියා සච්ඡිකිරියාය අභිසමායා භගවති බ්‍රහ්මචරියං වුස්සතීති.

කිම්පනස්සාවුසො, අඤ්ඤාතං අදිට්ඨං අප්පත්තං අසච්ඡිකතං අනභිසමෙතං යස්ස ඤාණාය දස්සනාය පත්තියා සච්ඡිකිරියාය අභිසමායා භගවති බ්‍රහ්මචරියං වුස්සතීති?

ඉදං දුක්ඛන්ති ඛ්වස්ස ආවුසො අඤ්ඤාතං අදිට්ඨං අප්පත්තං අසච්ඡිකතං අනභිසමෙතං. තස්ස ඤාණාය දස්සනාය පත්තියා සච්ඡිකිරියාය අභිසමායා භගවති බ්‍රහ්මචරියං වුස්සතීති. අයං දුක්ඛසමුදයොති ඛ්වස්ස ආවුසො -පෙ- අයං දුක්ඛනිරොධොති ඛ්වස්ස ආවුසො -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී-පටිපදාති ඛ්වස්ස ආවුසො, අඤ්ඤාතං අදිට්ඨං අප්පත්තං අසච්ඡිකතං අනභිසමෙතං. තස්ස ඤාණාය දස්සනාය පත්තියා සච්ඡිකිරියාය අභිසමායා භගවති බ්‍රහ්මචරියං වුස්සතීති, ඉදං ඛ්වස්ස ආවුසො අඤ්ඤාතං අදිට්ඨං අප්පත්තං අසච්ඡිකතං අනභිසමෙතං. තස්ස ඤාණාය දස්සනාය පත්තියා සච්ඡිකිරියාය අභිසමායා භගවති බ්‍රහ්මචරියං වුස්සතීති.

1. යං ඛ්වස්ස ආවුසො මජසං'

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම්කර්මයෙක් බහුවෙදනීය නම් මාගේ ඒ කර්මය අල්පවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේදැයි මෙසේ පුළුවුස්නා ලදුයේ ඇවැත්නි, මෙය නොවේ මැයි කියති.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් අල්පවෙදනීය වේ නම් මාගේ ඒ කර්මය බහුවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේදැයි මෙසේ පුළුවුස්නා ලදුයේ ම ඇවැත්නි, මෙය නොවේ මැයි කියති.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් වෙදනීය වේ නම් මාගේ ඒ කර්මය අවෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේදැයි මෙසේ පුළුවුස්නා ලදුයේ ම ඇවැත්නි, මෙය නො වේ මැයි කියති.

කිමෙක ඇවැත් ශාරිපුත්‍රය, යම් කර්මයෙක් අවෙදනීය වේ නම් මාගේ ඒ කර්මය වෙදනීය වේවයි තෙල කරුණ සඳහා භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේදැයි මෙසේ පුළුවුස්නා ලදුයේ ම ඇවැත්නි, මෙය නොවේමැයි කියති, වැලි කුමහෙයින් ඇවැත්නි, භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේදැයි?

ඇවැත්නි, යම් කිවනක් අඥාත ද, අදෘෂ්ට ද, අප්‍රාප්ත ද, අසාක්ෂාත්කෘත ද, අනවබුද්ධ ද, ඒ නිර්වාණයාගේ ඥානය පිණිස දර්ශනය පිණිස, ප්‍රාප්තිය පිණිස සාක්ෂාත් ක්‍රියාව පිණිස අවබෝධය පිණිස භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ යි.

ඇවැත්නි, යමක් ම දැනගන්නා පිණිස දකුම පිණිස ප්‍රාප්තිය පිණිස පසක් කිරීම පිණිස අභිසමය පිණිස භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ නම් ඒ අඥාතය අදෘෂ්ටය අප්‍රාප්තය අසාක්ෂාත්කෘතය අනවබුද්ධය කවර?

ඇවැත්නි, "මේ දුකැ"යි යන මොහුගේ අඥාතයෙක් අදෘෂ්ටයෙක් අප්‍රාප්තයෙක් අසාක්ෂාත් කෘතයෙක් අනවබුද්ධයෙක් වේ නම් එහි දැනුම් පිණිස දකුම් පිණිස ලැබුම් පිණිස පසක් කරනු පිණිස අභිසමය පිණිස භාග්‍යවතුන් කෙරෙහි බඹසර වැසේ යි. ඇවැත්නි, 'මේ දුක්ඛසමුදය'යි යන මොහුගේ... 'මේ දුක්ඛනිරොධ'යි යන මොහුගේ...'මේ දුක්ඛනිරොධගාමිනීපටිපද'යි යන මොහුගේ අඥාතයෙක් අදෘෂ්ටයෙක් අප්‍රාප්තයෙක් අසාක්ෂාත් කෘතයෙක් අනභිසමෙතයෙක් වේ නම් එහි දැනුම පිණිස දකුම පිණිස ලැබුම් පිණිස පසක් කැරුම් පිණිස අභිසමය පිණිස භගවතුන් කෙරෙහි බඹසර වැසේ යි. ඇවැත්නි, මෙය අඥාත වෙයි, අදෘෂ්ට වෙයි, අප්‍රාප්ත වෙයි, අසාක්ෂාත්කෘත වේ. අනභිසමෙත වේ. එහි ඥානය පිණිස දර්ශනය පිණිස ප්‍රාප්තිය පිණිස සාක්ෂාත්කෘතිය පිණිස, අභිසමය පිණිස භගවතුන් කෙරෙහි බඹසර වැසේ යි.

## 9. 1. 2. 4
## සමිද්ධි සුත්තං

**[සාවත්ථිනිදානං]**

අථඛො ආයස්මා **සමිද්ධි** යෙනායස්මා **සාරිපුත්තො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සමිද්ධිං ආයස්මා සාරිපුත්තො එතදවොච:

**'කිමාරම්මණා සමිද්ධි, පුරිසස්ස සඞ්කප්පවිතක්කා උප්පජ්ජන්තීති?** නාමරූපාරම්මණා භන්තෙති.

තෙ පන **සමිද්ධි,** කව නානත්තං ගච්ඡන්තීති? ධාතූසු භන්තෙති.

තෙ පන සමිද්ධි, කිං සමුදයාති? ඵස්සසමුදයා භන්තෙති.

තෙ පන **සමිද්ධි,** කිං සමොසරණාති? වෙදනා සමොසරණා භන්තෙති.

තෙ පන සමිද්ධි, කිං පමුඛාති? සමාධිපමුඛා භන්තෙති.

තෙ පන **සමිද්ධි,** කිං ආධිපතෙය්‍යාති? සතාධිපතෙය්‍යා භන්තෙති.

තෙ පන **සමිද්ධි,** කිමුත්තරාති? පඤ්ඤුත්තරා භන්තෙති.

තෙ පන සමිද්ධි, කිං සාරාති? විමුත්තිසාරා භන්තෙති.

තෙ පන සමිද්ධි කිං ඔගධාති? අමතොගධා භන්තෙති.

**කිමාරම්මණා** සමිද්ධි, **පුරිසස්ස සඞ්කප්පවිතක්කා** උප්පජ්ජන්තීති? ඉති පුට්ඨො සමානො නාමරූපාරම්මණා භන්තෙති වදෙසි.

තෙ පන සමිද්ධි, කව නානත්තං ගච්ඡන්තීති. ඉති පුට්ඨො සමානො ධාතූසු භන්තෙති වදෙසි.

## 9. 1. 2. 4

## සමිද්ධි සූත්‍රය

[සැවැත් නිදනයි]

එකල්හි ආයුෂ්මත් සමිදධි තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළැඹියහ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරුන් වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් සමිද්ධි තෙරුනට ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙල කීහ:

සමිද්ධිය, පුරුෂයාට සඞ්කල්පවූ විතර්කයෝ කුමක් අරමුණු කොට උපදනාහු දැයි? වහන්ස, නාමරූප ප්‍රත්‍යය කොට ය.

සමිද්ධිය, ඔහු කොතන්හි නානාසවභාවයට යෙත් දැයි.? වහන්ස, ධාතූන් කෙරෙහි ය.

සමිද්ධිය, ඔහු කුමක් සමුදය කොට ඇත්තාහු දැයි.? වහන්ස, ස්පර්ශ සමුදය කොට ඇතිය හ.

සමිද්ධිය, ඔහු කුමක් සමවසරණ (එක් රැස්වීම සවභාව) කොට ඇත්තාහු දැයි. වහන්ස, වේදනාව සමවසරණ කොට ඇත්තාහුය.

සමිද්ධිය, ඔහු කුමක් ප්‍රමුඛ කොට ඇත්තාහු දැයි? වහන්ස, සමාධිය ප්‍රමුඛ කොට ඇත්තාහ.

සමිද්ධිය, ඔහු කුමක් අධිපති කොට ඇත්තාහු දැයි? වහන්ස, ස්මෘතිය අධිපති කොට ඇත්තාහ.

සමිද්ධිය, ඔහු කුමක් උතුරු කොට ඇත්තාහු දැයි? වහන්ස, ප්‍රඥව උතුරු කොට ඇතියහයි.

සමිද්ධිය, ඔහු කුමක් සාරය කොට ඇත්තාහුදැයි? වහන්ස, විමුක්තිය සාර කොට ඇත්තාහ.

සමිද්ධිය, ඔහු කිමෙක බැසගන්තාහු දැයි? වහන්ස, අමෘතයෙහි බැසගත්තාහයි.

සමිද්ධිය, පුරුෂයාගේ සඞ්කල්ප විතර්කයෝ කුමක් ප්‍රත්‍යය කොට උපදනාහුදැයි මෙසේත් පුළුවුස්නා ලදුයේ වහන්ස, නාමරූප ප්‍රත්‍යය කොට ය'යි කියති.

සමිද්ධිය, ඔහු කො තන්හි නානාසවභාවයට යෙත් දැයි පුළුවුස්නා ලදුයේ 'වහන්ස, ධාතූන් කෙරෙහි'යි කියති.

තෙ පන සමිද්ධි, කිංසමුදයාති ඉති පුට්ඨො සමානො ඵස්සසමුදයා භන්තෙති වදෙසි.

තෙ පන සමිද්ධි, කිංසමොසරණාති ඉති පුට්ඨො සමානො වෙදනාසමොසරණා භන්තෙති වදෙසි.

තෙ පන සමිද්ධි, කිංපමුඛාති ඉති පුට්ඨො සමානො සමාධිපමුඛා භන්තෙති වදෙසි.

තෙ පන සමිද්ධි, කිංඅධිපතෙය්‍යාති ඉති පුට්ඨො සමානො සතාධිපතෙය්‍යා භන්තෙති වදෙසි.

තෙ පන සමිද්ධි, කිංඋත්තරාති ඉති පුට්ඨො සමානො පඤ්ඤුත්තරා භන්තෙති වදෙසි.

තෙ පන සමිද්ධි, කිංසාරාති ඉති පුට්ඨො සමානො විමුත්තිසාරා භන්තෙති වදෙසි.

තෙ පන සමිද්ධි, කිංඔගධාති ඉති පුට්ඨො සමානො අමතොගධා භන්තෙති වදෙසි.

සාධු සාධු සමිද්ධි, සාධු ඛො ත්වං සමිද්ධි, පඤ්හං පුට්ඨො විස්සජ්ජෙසි තෙන ච මා මඤ්ඤීති.

## 9. 1. 2. 5
## ගණ්ඩොපම සුත්තං

**[සාවත්ථිනිදානං]**

සෙය්‍යථාපි භික්ඛවෙ, ගණ්ඩො අනෙකවස්සගණිකො තස්සස්සු නව වණමුඛානි නව අභෙදනමුඛානි, තතො යං කිඤ්චි පග්ඝරෙය්‍ය අසුචියෙව පග්ඝරෙය්‍ය, දුග්ගන්ධංයෙව පග්ඝරෙය්‍ය, ජෙගුච්ඡියංයෙව පග්ඝරෙය්‍ය. යං කිඤ්චි පසවෙය්‍ය අසුචියෙව පසවෙය්‍ය, දුග්ගන්ධංයෙව පසවෙය්‍ය, ජෙගුච්ඡියංයෙව පසවෙය්‍ය.

සමිද්ධිය, ඔහු කුමක් සමුදය කොට ඇත්තාහුදැයි මෙසේ පුළුවුස්නා ලද්දේ 'වහන්ස, ස්පර්ශය සමුදය කොට ඇතියහ'යි කියහි.

සමිද්ධිය, ඔහු කුමක් සමවසරණ කොට ඇත්තාහුදැයි මෙසේ පුළුවුස්නා ලද්දේ 'වහන්ස, වේදනා සමොසරණ කොට ඇතියහ'යි කියහි.

සමිද්ධිය, ඔහු කුමක් ප්‍රමුඛ කොට ඇත්තාහුද යි මෙසේ පුළුවුස්නා ලද්දේ 'වහන්ස, සමාධිප්‍රමුඛයහ'යි කියහි.

සමිද්ධිය, ඔහු කුමක් අධිපති කොට ඇත්තාහුද යි මෙසේ පුළුවුස්නා ලද්දේ 'වහන්ස, සතාධිපතෙයයහ'යි කියහි.

සමිද්ධිය, ඔහු කුමක් උතුරු කොට ඇත්තාහුද යි මෙසේ පුළුවුස්නා ලද්දේ 'වහන්ස, පඤ්ඤුත්තරයහ'යි කියහි.

සමිද්ධිය, ඔහු කුමක් සාර කොට ඇත්තාහුද යි මෙසේ පුළුවුස්නා ලද්දේ 'වහන්ස, විමුත්තිසාරයහ'යි කියහි.

සමිද්ධිය, ඔහු කුමක් ප්‍රතිෂ්ඨා කොට ඇත්තාහුද යි මෙසේ පුළුවුස්නා ලද්දේ 'වහන්ස, අමෘතය ප්‍රතිෂ්ඨා කොට ඇතියහ'යි කියහි.

සමිද්ධිය, මැනැව, මැනැව, තෝ පැණ පුළුවුස්නා ලද්දේ මොනොවට විසඳුයෙහි, ඉනුදු (අගසවුවකු ඇසූ පැණ විසැඳියෙමියි) මානය නො කොළෙහි යි.

## 9. 1. 2. 5

## ගණ්ඩොපම සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, නොයෙක් වස් ගණන් ඇති ගඩක් යම්පරිදි වේද, එයට නවවණ මුඛකෙනෙක් වෙත්. (කිසිවකු විසින් බිඳ නො කළ) කම් සමුත්ථිත වූම නව අංභේදන මුඛ කෙනෙක් වෙත්. එයින් යම් කිසිවක් ම වැහේ නම් අශුචි ම වැහේ, දුගඳ ම වැහේ, ජුගුප්සා කටයුතු ම වැහෙයි. යම් කිසිවක් ම ගලා නම් අශුචි වූවක් ම ගලයි. දුර්ගන්ධ වූවක් ම ගලයි ජුගුප්සා කටයුතු වූවක් ම ගලයි.

'ගණ්ඩො'ති ඛො භික්ඛවෙ, ඉමස්සෙව චාතුම්මහාභූතිකස්ස කායස්ස අධිවචනං මාතාපෙත්තිකසම්භවස්ස ඔදනකුම්මාසූපචයස්ස අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මස්ස. තස්ස නව වණමුඛානි, නව අභෙදනමුඛානි, තතො යං කිඤ්චි පග්ඝරති අසුචියෙව පග්ඝරති, දුග්ගන්ධංයෙව පග්ඝරති, ජෙගුච්ඡියංයෙව පග්ඝරති. යං කිඤ්චි පසවති අසුචියෙව පසවති, දුග්ගන්ධංයෙව පසවති, ජෙගුච්ඡියංයෙව පසවති. තස්මාතිහ භික්ඛවෙ ඉමස්මිං කායෙ නිබ්බින්දථාති.

## 9. 1. 2. 6

## සඤ්ඤා සුත්තං

[සාවත්ථිනිදානං]

නව ඉමා භික්ඛවෙ, සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා. කතමා නව?

අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටික්කූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාග සඤ්ඤා. ඉමා ඛො භික්ඛවෙ, නව සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා, අමතපරියොසානාති.

## 9. 1. 2. 7

## කුලොපගමන සුත්තං

[සාවත්ථිනිදානං]

නවහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා නාලං උපගන්තුං, උපගන්ත්වා වා නාලං උපනිසීදිතුං[1] කතමෙහි නවහි:

න මනාපෙන පච්චුට්ඨෙන්ති, න මනාපෙන අභිවාදෙන්ති, න මනාපෙන ආසනං දෙන්ති, සන්තමස්ස පරිගුහන්ති, බහුකම්පි ථොකං දෙන්ති, පණීතම්පි ලූඛං දෙන්ති, අසක්කච්චං දෙන්ති නො සක්කච්චං, න උපනිසීදන්ති ධම්මස්සවණාය, භාසිතස්ස න රසීයන්ති. ඉමෙහි ඛො භික්ඛවෙ, නවහඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා නාලං උපගන්තුං, උපගන්ත්වා වා නාලං උපනිසීදිතුං.

1 නිසීදිතුං - මජසං.

මහණෙනි, 'ගණ්ඩ' යනු සතරමහාභූතයෙන් උපන්, මවුපියන්ගේ ශුක්‍රශොණිතයෙන් හටගත්, බතින් හා කොමුයෙන් වැඩුණු, අනිත්‍යස්වභාව ඇති සුවඳ ඉලීම හා පිරිමැදීම් සැහැවී කොට ඇති, හෙදන හා විද්ධවංසනය ස්වභාව කොට ඇති මේ කයට ම නමෙකි. එයට ව්‍රණමුඛ නවයෙක, අභෙදනමුඛ නවයෙකි. එයින් යම් කිසිත් ම වැහේ නම් අශුචි වූවක් ම වැහෙයි, දුර්ගන්ධ වූවක් ම වැහෙයි, ජුගුප්සා කටයුත්තක්ම වැහෙයි. යම් කිසිත් ගලා නම්, අශුචි වූවක් ම ගලයි. දුර්ගන්ධ වූවක් ම ගලයි, ජුගුප්සා කටයුතු වූවක්ම ගලයි. මහණෙනි, එහෙයින් ම මේ කායයෙහි උකටලී වවු.

## 9. 1. 2. 6
## සඤ්ඤා සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ නව සංඥවෝ භාවිත වූවාහු, බහුලීකෘත වූවාහු මහත්ඵල ද මහානෘශංස ද අමෘතාවගාහ ද අමෘතපර්‍ය්‍යවසාන ද වෙත්. කවර නවයෙක යත්:

අසුභසඤ්ඤ ය, මරණ සඤ්ඤ ය, ආහාරයෙහි පටික්කූල සඤ්ඤ ය, සර්වලොකයෙහි අනභිරතසඤ්ඤ ය. අනිච්චසඤ්ඤ ය, අනිත්‍යයෙහි දුක්ඛ සඤ්ඤ ය, දුඃඛයෙහි අනාත්මසඤ්ඤ ය, පහානසඤ්ඤ ය, විරාගසඤ්ඤ යි. මහණෙනි, මේ නව සංඥවෝ භාවිත බහුලීකෘත වූවාහු මහත්ඵල ද මහානෘශංස ද අමෘතාවගාහ ද අමෘතපර්‍ය්‍යවසාන ද වෙත්.

## 9. 1. 2. 7
## කුලොපගමන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, කරුණු නවයෙකින් සමන්වාගත කුලය (පෙර) නො එළැඹ ම හෝ එළැඹෙනුවට නුසුදුසු ය, එළැඹ හෝ හිඳුමට නුසුදුසු ය, කවර නවයෙකින යත්:

මනා අයුරින් හුනස්නෙන් නැගිට පෙරගමන් නො කරත්. මනා අයුරින් නො වඳිත්. මැනැවින් අසුන් නො දෙත්. ඔහට සතු දැ සඟවත්. බොහෝ ඇත ද මදක් දෙත්. පිණී දැ ඇත ද රූක්ෂයක් ම දෙත්. සකසා නොව නො සකසා දෙත්. ධර්ම ශ්‍රවණයට ළඟ නො හිඳිත්. භාෂිතයාගේ අර්ථරස විඳිමින් සතුටු නො වෙත්. මහණෙනි, මේ නව කරුණින් සමන්‍වාගත කුලය (පෙර) නො එළැඹ හෝ එළැඹීමට නුසුදුසුය. එළැඹ හෝ හිඳිනට නුසුදුසු ය.

නවහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා අලං උපගන්තුං, උපගන්ත්වා වා අලං උපනිසීදිතුං. කතමෙහි නවහි:

මනාපෙන පච්චුට්ඨෙන්ති, මනාපෙන අභිවාදෙන්ති, මනාපෙන ආසනං දෙන්ති, සන්තමස්ස න පරිගුහන්ති, බහුකම්පි බහුකං දෙන්ති, පණීතම්පි පණීතං දෙන්ති, සක්කච්චං දෙන්ති නො අසක්කච්චං, උපනිසීදන්ති ධම්මසවණාය, භාසිතස්ස රසීයන්ති.

ඉමෙහි ඛො භික්ඛවෙ, නවහඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා අලං උපගන්තුං, උපගන්ත්වා වා අලං උපනිසීදිතුන්ති.

## 9. 1. 2. 8

## නවඞ්ගුපොසථ සුත්තං

**[සාවත්ථිනිදානං]**

නවහඞ්ගෙහි සමන්නාගතො[1] භික්ඛවෙ උපොසථො උපවුත්ථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො. කථං උපවුත්ථො ච භික්ඛවෙ, නවහඞ්ගෙහි සමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො:

1. ඉධ භික්ඛවෙ, අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති "යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා නිහිතදණ්ඩා නිහිතසත්ථා ලජ්ජී දයාපන්නා සබ්බපාණභූතහිතානුකම්පී[2] විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරාමි. ඉමිනාපඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතී"ති. ඉමිනා පඨමෙනඞ්ගෙන සමන්නාගතො හොති.

2. "යාවජීවං අරහන්තො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතා දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අදින්නාදානං පහාය -පෙ- උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සතී"ති. ඉමිනා දුතියෙනඞ්ගෙන සමන්නාගතො හොති.

---

1. නවහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො-මජසං.
2. සබ්බපාණභූතහිතානුකම්පිනො-මජසං.

මහණෙනි, කරුණු නවයෙකින් සමන්‍විගත කුලය (පෙර) එළැඹ හෝ එළැඹීමට සුදුසු ය. එළැඹ හෝ හිඳිනට සුදුසු ය. කවර නවයෙකින යත්:

මැනැවින් හුනස්නෙන් නැගී පෙරගමන් කරත්. මැනැවින් අභිවාදනා කෙරෙත්, මැනැවින් අසුන් දෙත්, ඔහුට ඇති දැ නො සඟවත්. බොහෝ ඇතිවත් බොහෝ කොට දෙත්. පිණි දැ ඇතිවත් පිණි දැ ම දෙත්. සකස් කොට දෙත් නො සකසා නො දෙත්, දහම්ඇසීමට ළඟ හිඳිත්, භාෂිතයාගේ රසවිඳිමින් සතුටු වෙත්.

මහණෙනි, මේ නව කරුණින් සමන්‍විගත කුලය නො එළැඹ හෝ එළැඹුමට සුදුසු ය. එළැඹ හිඳිනට හෝ සුදුසු යි.

## 9. 1. 2. 8
## නවඞ්ගුපෝසථ සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, නව අඟින් සමන්‍විගත පෙහෙවස් වුසූයේ මහත්ඵල වෙයි. මහානිසංස වෙයි. මහාද්‍යුතික වෙයි. මහාවිස්ථාර වෙයි. මහණෙනි, කෙසේ වුසූ නවඟින් සමන්‍විගත උපොසථය මහත්ඵල, මහා නෘශංස, මහාද්‍යුතික, මහාවිස්ථාර වේය යත්:

1. මහණෙනි, මෙ සස්නෙහි අරිසවු මෙසේ නුවණින් සිතයි: "යවදිව රහත්හු පණිවා හැර පණිවායෙන් වැළැකියාහු බහාතැබූ දඬු ඇත්තාහු බහාතැබූ අවි ඇත්තාහු ලජ්ජාවත් වූවාහු දයාවට පැමිණියාහු සර්වප්‍රාණීන් කෙරේ හිතානුකම්පී ව විහරණ කරත්: අද මමත් මේ රැත් මේ දවලත් පණිවා හැර පියා පණිවායෙන් වැළැකියෙම් බැහූ දඬු ඇතියෙම් බැහූ අවි ඇතියෙම් ලදතියෙම් දයාවට පැමිණියෙම් සර්වප්‍රාණීන් කෙරේ හිතානුකම්පී වූයෙම් විහරණ කරමි. මෙ කරුණෙනුදු රහතුනට අනුක්‍රියා කරමි. මා විසින් උපෝසථය ද වුසූයේ වෙයි. මේ පළමු අඟින් සමන්‍විගත වෙයි.

2. "රහත්හු යවදිව අයිනාදන් හැර පියා අයිනාදනින් වැළැකියාහු දුන් දැ ගන්නා සුල්ලහු දුන් දැ කැමැතිවන්නාහු නොසොර පිවිතුරු සිතින් වෙසෙත්. අද මමත් මේ රැත් මේ දවලත් අයිනාදන් හැරපියා... මා විසින් පෙහෙවස් ද වුසූයේ වෙයි. මේ දෙවන අඟින් සමන්‍විගත වූයේ වෙයි.

3. "යාවජීවං අරහන්තො අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආරාචාරී විරතා මෙථුනා ගාමධම්මා. අහම්පජ්ජ -පෙ- උපොසථො ච මෙ උපවුත්තො භවිස්සතී"ති. ඉමිනා තතියෙනඞ්ගෙන සමන්නාගතො හොති.

4. යාවජීවං අරහන්තො මුසාවාදං පහාය මුසාවාද පටිවිරතා සච්චවාදී සච්චසන්ධා ථෙතා පච්චයිකා අවිසංවාදකා ලොකස්ස, අහම්පජ්ජ -පෙ- උපවුත්තො භවිස්සතීති. ඉමිනා චතුත්ථෙනඞ්ගෙන සමන්නාගතො හොති.

5. යාවජීවං අරහන්තො සුරාමෙරය මජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා. අහම්පජ්ජ -පෙ- උපවුත්තො භවිස්සතීති. ඉමිනා පඤ්චමෙනඞ්ගෙන සමන්නාගතො හොති.

6. යාවජීවං අරහන්තො එකභත්තිකා රත්තූපරතා විරතා විකාල භොජනා. අහමපජ්ජ -පෙ- උපවුත්තො භවිස්සතීති. ඉමිනා ඡට්ඨෙනඞ්ගෙන සමන්නාගතො හොති.

7. යාවජීවං අරහන්තො නච්චගීතවාදිතවිසූකදස්සනමාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතා අහම්පජ්ජ -පෙ- උපවුත්තො භවිස්සතීති. ඉමිනා සත්තමෙනඞ්ගෙන සමන්නාගතො හොති.

8. යාවජීවං අරහන්තො උච්චාසයනමහාසයනං පහාය උච්චාසයනමහාසයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා අහම්පජ්ජ -පෙ- උපවුත්තො භවිස්සතීති. ඉමිනා අට්ඨමෙනඞ්ගෙන සමන්නාගතො හොති.

9. ඉධ භික්ඛවෙ, අරියසාවකො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං -පෙ- තථා තතියං -පෙ- තථා චතුත්ථිං -පෙ- ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. ඉමිනා නවමෙනඞ්ගෙන සමන්නාගතො හොති.

එවං උපවුත්තො ඛො භික්ඛවෙ, නවහඞ්ගෙහි සමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරොති.

3. ''රහත්හු යාවජ්ජීව අබ්‍රම්සර හැර පියා බ්‍රහ්මචාරී වූවාහු ගැමිදම් වූ මෙවුන් දමින් වැළැකියාහු ආරාචාරී වූවාහු වෙත්. දුන් මම ද... මා විසින් පෙහෙවස් වුසුයේත් වන්නේය. මේ තෙවන අඟින් සමන්නාගත වෙයි.

4. 'රහත්හු යාවජ්ජීව මුසවා හැර පියා මුසවායෙන් වැළැකියාහු සත්‍යවාදී වූවාහු සත්‍යසන්ධ වූවාහු ස්ථිර කථා ඇත්තාහු හැදෑහිය හැකි තෙපුල් ඇත්තාහු ලොවට අවිසංවාදක වූවාහු වෙත්. දුන් මම ද... වුසුයේ වෙයි. මේ සිවුවන අඟින් සමන්වාගත වෙයි.

5. රහත්හු යාවජ්ජීව මදපමා දෙකට කරුණුවූ රහමෙර හැර පියා මද පමා දෙකට කරුණු වූ රහමෙරින් වැළැකියාහු වෙත්. අද මම ද... වුසුයේ වෙයි. මේ පස්වන අඟින් සමන්වාගත වෙයි.

6. යාවජ්ජීව රහත්හු ඒකභක්තික වූවාහු රාත්‍රි භෝජනයෙන් වැළැකියාහු විකල් බොජුනින් දුරුවූවාහූ වෙත්. මම ද අද... වුසුයේ වෙයි. මේ සවන අඟින් සමන්වාගත වෙයි.

7. රහත්හු යාවජ්ජීව නැටුම් ගැයුම් වැයුම් විසුළු දස්න මල්ගඳ විලවුන් දැරුම් සිරුර උනුතැන් පිරවීම් සිරුරු සැරසුම් යන කරුණින් වැළකියාහු වෙත්. මම ද අද ... වුසුයේ වෙයි. මේ සත්වන අඟින් සමන්වාගත වෙයි.

8. යාවජ්ජීව රහත්හු උසසුන් මහසුන් හැරපියා උසසුන් මහස්නෙන් වැළැකියාහු මැස්සෙක හෝ තණ ඇතිරියෙක හෝ නීචශය්‍යා කරත්. මම ද අද ... වුසුයේ වෙයි. මේ අටවැනි කරුණින් සමන්වාගත වෙයි.

9. මහණෙනි, මෙ සස්නෙහි අරිසවු මෙත්සහගිය සිතින් එක් දිගක් පැතිර වාසය කරයි. එපරිදි ම දෙවන... එපරිදි ම තෙවන ... එපරිදිම සතර වන... මෙසේ උඩ යට සරස හැම තැන්හි සර්වාත්ම භාවයෙන් සියල්ලෙන් යුත් ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ මෙත් සහගිය සිතින් පැතිර වෙසෙයි.

මහණෙනි, මෙසේ වුසූ නවඟින් යුත් පෙහෙවස මහපළ වෙයි. මහානිසංස වෙයි. මහාද්‍යුතික වෙයි. මහාවිප්ඵාර වෙය යි.

# 9. 1. 2. 9

## දෙවතා සුත්තං

[සාවත්ථිනිදානං]

ඉමං[1] භික්ඛවෙ, රත්තිං සම්බහුලා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ, තා දෙවතා මං එතදවොචුං:

උපසඞ්කමිංසු නො භන්තෙ, පුබ්බෙ මනුස්සභූතානං පබ්බජිතා අගාරානි, තා මය[2] භන්තෙ, පච්චුට්ඨිම්හ, නො ච ඛො අභිවාදිම්හ, තා මයං භන්තෙ, අපරිපුණ්ණකම්මන්තා විප්පටිසාරිනියො පච්ඡානුතාපිනියො[3] හීනං කායං උපපන්නා''ති.

අපරාපි මං භික්ඛවෙ, සම්බහුලා දෙවතා උපසඞ්කමිත්වා එතදවොචුං ''උපසඞ්කමිංසු නො භන්තෙ පුබ්බෙ මනුස්සභූතානං පබ්බජිතා අගාරානි තා[2] මයං භන්තෙ පච්චුට්ඨිම්හ, අභිවාදිම්හ[4] නො ච ඛො[5] ආසනං අදම්හ, තා මයං භන්තෙ, අපරිපුණ්ණකම්මන්තා විප්පටිසාරිනියො පච්ඡානුතාපිනියො හීනං කායං උපපන්නා''ති,

අපරාපි මං භික්ඛවෙ, සම්බහුලා දෙවතා උපසඞ්කමිත්වා එතදවොචුං ''උපසඞ්කමිංසු නො භන්තෙ, පුබ්බෙ මනුස්සභූතානං පබ්බජිතා අගාරානි, තා මයං භන්තෙ පච්චුට්ඨිම්හ, අභිවාදිම්හ, ආසනඤ්ච අදම්හ[6] නො ච ඛො යථාසත්ති යථාබලං සංවිභජිම්හ -පෙ- යථාසත්ති යථාබලං සංවිභජිම්හ. නො ච ඛො උපනිසීදිම්හ ධම්මසවණාය -පෙ- උපනිසීදිම්හ[7] ධම්මසවණාය, නො ච ඛො ඔහිතසොතා ධම්මං සුණිම්හ -පෙ- ඔහිතසොතා[8] ධම්මං සුණිම්හ, නො ච ඛො සුත්වා ධම්මං ධාරයිම්හ -පෙ- සුත්වා[9] ධම්මං ධාරයිම්හ, නො ච ඛො ධතානං[10] ධම්මානං අත්ථං උපපරික්ඛිම්හ -පෙ- ධතානං[11] ධම්මානං අත්ථං උපපරික්ඛිම්හ, නො ච ඛො අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජිම්හ. තා මයං භන්තෙ, අපරිපුණ්ණකම්මන්තා විප්පටිසාරිනියො පච්ඡානුතාපිනියො හීනං කායං උපපන්නා''ති.

1. ඉමඤ්ච-මජසං.
2. තෙ මයං;-මජසං
3. පච්චානුතාපිනියො-මජසං.
4. පච්චුට්ඨිම්හ ච අභිවාදිම්හ ච-සතා.
5. නො ච නෙසං-මජසං.
6. ආසනං අදම්හ-මජසං.
7. උපනිසීදිම්හ ච-සතා.
8. ඔහිතසොතා ච-මජසං
9. දුත්වා ච-මජසං.
10. ධාතානං-මජසං.
11. ධාතානඤ්ච-මජසං

## 9. 1. 2. 9

# දේවතා සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මෙ රෑ බොහෝ දේවතාවෝ රෑ බෙහෙවින් දක්මගිය කල්හි විසිතුරු පැහැ ඇත්තාහු මුළු දෙව්රම බබුළුවා මා වෙත එළැඹියහ. එළැඹ මා සකසා වැඳ එකත්පස්ව සිට ගත්හ. මහණෙනි, එකත්පස්ව සිට ගත් ඒ දේවතාවෝ මට මෙල කීහ:

"වහන්ස, පෙර මිනිස් වූ අපගේ අගාරයනට පැවිද්දෝ එළැඹියහ. වහන්ස, ඒ අපි (ඔවුන්ට) ප්‍රත්‍යුපස්ථාන කළම්හ. නො ද අභිවාදනා කළම්හ. වහන්ස, නොපිරිපුන් කම් ඇති ඒ අපි විපිළිසර වන්නමෝ පසුතැවෙන්නමෝ හීන කායයට පැමිණියම්හ"යි.

මහණෙනි, අනෙක් බොහෝ දේවතා කෙනෙක් මා වෙත එළැඹ මෙල කීහු: "වහන්ස, පෙර මිනිස් වූ අපගේ නිවෙස් කරා පැවිද්දෝ එළැඹියහ. වහන්ස, ඒ අපි ඔවුන්ට ප්‍රත්‍යුපස්ථාන කළම්හ. අභිවාදනා කළම්හ, නො ද අසුන් දුනුම්හ. වහන්ස, ඒ අපි නො පිරිපුන් කම් ඇත්තමෝ විපිළිසර වන්නමෝ පසුතැවෙන්නමෝ හීන කායයට පැමිණියම්හ"යි.

මහණෙනි, අනෙක් බොහෝ දේවතා කෙනෙක් ද මා කරා එළැඹ මෙල සැළකළහ: "වහන්ස, පෙර මිනිස් බවට පැමිණි අපගේ නිවෙස් කරා පැවිද්දෝ පැමිණියහ. වහන්ස, ඒ අපි ඔවුන්ට ප්‍රත්‍යුපස්ථාන කළම්හ. අභිවාදනා කළම්හ. අසුන් ද දුනුම්හ. යථාශක්තියෙන් යථාබලයෙන් සංවිභාග නොකළම් හ. දහම් අසනු සඳහා නො ද ළඟ හුනුම්හ.... දහම් ඇසුමට ළඟ හුනුම් හ. යොමු කළ කන් ඇත්තමෝ නො ද දහම් ඇසුම්හ.... යොමු කළ කන් ඇත්තමෝ දහමුදු ඇසුම්හ. අසා දහම් නො ම දැරුම් හ.... අසා දහම් දැරුම්හ, දැරූ දහමුන්ගේ නො ම අරුත් පිරික්සුම් හ... දැරූ දහමුන්ගේ අරුත් පිරික්සුම්හ. අරුත් දැන පෙළදම් දැන ධර්මානුධර්මය නො ම පිළිපැදියම්හ. වහන්ස, ඒ අපි අපරිපූර්ණ කර්මාන්ත ඇත්තමෝ විපිළිසර වන්නමෝ පසු තැවෙන්නමෝ හීන කායයට පැමිණියම්හ"යි.

අපරාපි මං භික්ඛවෙ, සම්බහුලා දෙවතා උපසඞ්කමිත්වා එතදවොචුං: "උපසඞ්කමිංසු නො භන්තෙ, පුබ්බෙ මනුස්සභූතානං පබ්බජිතා අගාරානි. තා මයං භන්තෙ, පච්චුට්ඨිම්හ, අභිවාදිම්හ, ආසනං අදම්හ, යථාසත්ති යථාබලං සංවිභජිම්හ, උපනිසීදිම්හ ධම්මසවණාය, ඔහිතසොතා ච ධම්මං සුණිම්හ, සුත්වා ච ධම්මං ධාරයිම්හ, ධතානඤ්ච ධම්මානං අත්ථං උපපරික්ඛිම්හ. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජිම්හ. තා මයං භන්තෙ, පරිපුණ්ණකම්මන්තා අවිප්පටිසාරිනියො අපච්චානුතාපිනියො පණීතං කායං උපපන්නා"ති.

එතානි භික්ඛවෙ, රුක්ඛමූලානි එතානි සුඤ්ඤාගාරානි ඣායථ භික්ඛවෙ, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, සෙය්‍යථාපි තා පුරිමිකා දෙවතාති.

## 9. 1. 2. 10

## වෙලාම සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

අපි නු තෙ ගහපති, කුලෙ දානං දීයතීති? දීයති මෙ භන්තෙ, කුලෙ දානං, තඤ්ච ඛො ලූඛං කණාජකං බිලඞ්ගදුතියන්ති.

ලූඛඤ්චෙපි[1] ගහපති, දානං දෙති පණීතං වා, තඤ්ච අසක්කච්චං දෙති, අචිත්තීකත්වා[2] දෙති, අසහත්ථා දෙති, අපවිද්ධං[3] දෙති, අනාගමනදිට්ඨිකො දෙති. යත්ථ යත්ථ තස්ස තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, න උළාරාය භත්තභොගාය චිත්තං නමති, න උළාරාය වත්ථභොගාය චිත්තං නමති, න උළාරාය යානභොගාය චිත්තං නමති, න උළාරෙසු පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති. යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා, තෙපි න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති. තං කිස්සහෙතු: එවං හෙතං[4] ගහපති, හොති අසක්කච්චකතානං[5] කම්මානං විපාකො.

1. ලූඛං වාපි;-සයා.
2. අපචිත්තිං කත්වා;-සයා. අචිත්තිකත්වා;-PTS.
3. අපවිට්ඨං;-සයා.
4. එවඤ්හෙතං;-සයා.
5. අසක්කච්චං කතානං;-මජසං.

මහණෙනි, අනෙක් බොහෝ දේවතා කෙනෙකුදු මා කරා එළැඹ මෙසේ කීහ.

"වහන්ස, පෙර මිනිස් බවට පැමිණියා වූ ම අපගේ නිවෙස් කරා පැවිද්දෝ එළැඹියහ. වහන්ස, ඒ අපි උවටැන් කළෙම්හ. වන්දනා කළෙම්හ. අසුන් දුන්නෙම්හ. යථාශක්තියෙන් යථාබලයෙන් දාන සංවිභාග කළෙම්හ. දහම් ඇසීමට වෙත හුන්නෙම්හ. යොමු කළ කන් ඇත්තමෝ දහමුදු ඇසුම්හ. අසා දහමුදු දැරුම්හ. දැරූ දහමුන්ගේ අරුත් පිරික්සුම්හ. අරුත් දැන පෙළ දැන ධර්මානුධර්මය පිළිපැදියම්හ. වහන්ස, ඒ අපි පරිපූර්ණ කර්මාන්ත ඇත්තමෝ විපිළිසර නො වූමෝ නො පසු තැවෙන්නමෝ ප්‍රණීත කායයට පැමිණියම්හ" යි.

මහණෙනි, මෙල රුක් මුල් ය, මෙල ශූන්‍යාගාර ය, මහණෙනි, ධ්‍යාන කරවු, පමා නො වවු, මෙල පළමු දෙවතාවන් සෙයින් පසු තහමක් විපිළිසර වවු යි.

## 9. 1. 2. 10

## වේලාම සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඩු මහසිටුහුගේ අරම්හි වසනසේක. එකල්හි අනේපිඩු ගැහැවි භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පස්ව හිඳ, එකත් පස්ව හුන් අනේපිඩු ගැහැවි හට භාග්‍යවතුන් වහන්සේ මෙල වදාළ සේක:

ගැහැවිය, තාගේ කුලයෙහි දන් දෙනු ලැබේ දැයි. "වහන්ස, මාගේ කුලෙහි දන් දෙනු ලැබේ. හෙද වනාහි රූක්ෂ වූ කාඩි දිය දෙවනු කොට ඇති නිවුඩු බතෙකැ" යි.

ගැහැවිය, රූක්ෂ වේව යි ප්‍රණීත වේව යි දන් දේ නම් හෙද නොසකස් කොට දේ නම් අගරු කොට දේ නම් සියතින් නො දේ නම් නිරතුරු කොට නො දේ නම් කම්පල සඳහා නො දේ නම් යම් යම් ම තැනෙක ඒ ඒ දනයාගේ විපාක පහළ වේ ද උදර භක්තානුභවය පිණිස ඔහු සිත නො නැමෙයි. උදර වස්ත්‍රභෝගය පිණිස ඔහු සිත නො නැමෙයි. උදර යානභොගය පිණිස ඔහු සිත නො නැමෙයි. උදර පස්කම්හි ගුණෙහි භොගය පිණිස සිත නො නැමෙයි. ඔහුගේ පුත්‍රයහ කියා වේවයි අඹුහු කියා වේව යි දස්හ කියා වේව යි, ප්‍රෙෂ්‍යයහ (මෙහෙකරු වහල්ලු) කියා වේව යි, කම්කරුහ කියා වේව යි යම් ඒ කෙනෙක් වෙත් නම් උහුත් වදන් අසනු නො කැමැති වෙත්, සවන් නො දෙත්, දැනුමට සිත නො එළවත්, එ කවර හෙයිනැ: ගැහැවිය, නො සකස් කොට කළ කර්මයන්ගේ විපාකය එබඳු වේ ද එහෙයිනි.

ලූඛඤ්චෙපි ගහපති, දානං දෙති, පණීතං වා. තඤ්ච සක්කච්චං දෙති, චිත්තීකත්වා දෙති, සහත්ථා දෙති, අනපවිද්ධං දෙති, ආගමනදිට්ඨිකො දෙති. යත්ථ යත්ථ තස්ස තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, උළාරාය භත්තභොගාය චිත්තං නමති. උළාරාය වත්ථභොගාය චිත්තං නමති. උළාරාය යානභොගාය චිත්තං නමති. උළාරෙසු පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති. යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි සුස්සූසන්ති සොතං ඔදහන්ති, අඤ්ඤාය චිත්තං උපට්ඨපෙන්ති. තං කිස්ස හෙතු: එවං හෙතං ගහපති, හොති සක්කච්චකතානං[1] කම්මානං විපාකො.

භූතපුබ්බං ගහපති, වෙලාමො නාම බ්‍රාහ්මණො අහොසි. සො එවරූපං දානං අදාසි මහාදානං: චතුරාසීතිසුවණ්ණපාතිසහස්සානි අදාසි රූපියපූරානි. චතුරාසීති රූපියපාතිසහස්සානි අදාසි සුවණ්ණපූරානි, චතුරාසීති කංසපාතිසහස්සානි අදාසි හිරඤ්ඤපූරානි, චතුරාසීති හත්ථිසහස්සානි අදාසි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලසඤ්ඡන්නානි. චතුරාසීතිරථසහස්සානි අදාසි සීහචම්මපරිවාරානි ව්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්මපරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලසඤ්ඡන්නානි.[2] චතුරාසීති ධෙනුසහස්සානි අදාසි දුකූලසන්දස්සනානි[3] කංසූපධාරණානි, චතුරාසීතිකඤ්ඤාසහස්සානි අදාසි ආමුත්තමණිකුණ්ඩලායො.[4] චතුරාසීතිපල්ලඞ්කසහස්සානි අදාසි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි[5] සඋත්තරච්ඡදානි උභතො ලොහිතකූපධානානි. චතුරාසීති වත්ථකොටිසහස්සානි අදාසි ඛොමසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං කප්පාසිකසුඛුමානං. කො පන වාදො අන්නස්ස පානස්ස ඛජ්ජස්ස භොජ්ජස්ස ලෙය්‍යස්ස පෙය්‍යස්ස? නජ්ජො මඤ්ඤෙ විස්සන්දන්ති.[6]

සියා ඛො පන තෙ ගහපති, එවමස්ස "අඤ්ඤො නූන තෙන සමයෙන වෙලාමො බ්‍රාහ්මණො අහොසි සො තං දානං අදාසි මහාදානන්ති න ඛො පනෙතං ගහපති, එවං දට්ඨබ්බං, අහං තෙන සමයෙන වෙලාමො බ්‍රාහ්මණො අහොසිං, අහං තං දානං අදාසිං මහාදානං.

තස්මිං ඛො පන ගහපති, දානෙ න කොචි දක්ඛිණෙය්‍යො අහොසි. න තං කොචි දක්ඛිණං විසොධෙති. යං ගහපති, වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි, මහාදානං. යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය, ඉදං තතො මහප්ඵලතරං.

---

1. සක්කච්චං කතානං-මජසං.
2. හෙමජාලපටිච්ඡන්නානි-මජසං.
3. දුකූලසන්ධනානි-මජසං. දුකූලසණ්ඨනානි; සයා-දුකූලසන්ථනානි-PTS.
4. ආමුත්තමණිකුණ්ඩලායො-සීමු, මජසං.
5. කදලිමිගපවරපච්චත්ථරණානි-මජසං:
6. විස්සන්දති; සීමු-PTS.

ගැහැවිය, රූක්ෂ වේවයි ප්‍රණීත වේවයි දන් දේ නම් එද සකසා දේ නම් ගරු කොට දේ නම් සියතින් දේ නම් නිරතුරු කොට දේ නම් කම්පල ගැහා දේ නම් යම් යම් තැනෙක ඒ ඒ දනයාගේ විපාක පහළ වේ ද, උදර භක්තභෝගය පිණිස සිත නැමෙයි. උදර වස්ත්‍රභොගය පිණිස සිත නැමෙයි. උදර යානභොගය පිණිස සිත නැමෙයි. උදර පස්කම්-ගුණෙහි භොගයට සිත නැමේ. ඔහුගේ පුත්‍රයහ කියා වේව යි අඹුහ කියා වේව යි, දස්හ කියා වේව යි ප්‍රෙෂ්‍යයහ කියා වේව යි කම්කරුහ කියා වේවයි යම් ඒ කෙනෙක් වෙත් නම් ඔහු ද අසනු කැමැති වෙත්. සවන් දෙත්. දැනුමට සිත් එළවත්. එහෙයිනැ: කවර ගැහැවිය, සකස් කොට කළ කර්මයන්ගේ විපාකය එබඳු වේද එහෙයිනි.

ගැහැවිය, පෙරවූවක් කියමි. වේලාම නම් බමුණෙක් වී ය. හේ මෙ බඳු මහාදන නම් දනක් දින: රිදියෙන් පිරූ සුවාසූ දහසක් රන්මුවා පා දින. රනින් පිරූ සුවාසූ දහසක් රිදීමුවා පා දින. අමුරනින් පිරූ සුවාසූ දහසක් කස්ලෝපා දින. ස්වර්ණාලඞ්කාර ඇති රන් දද ඇති රන් රසු දැලින් ගැවසුණු සුවාසූ දහසක් ඇතුන් දින. සිහසම් අතුළ, වගසම් අතුළ, දිවිසම් අතුළ, පඩු ඇඹුල් අතුළ රන්ලකර ඇති රන් දද ඇති රන්රසු දැලින් ගැවසුණු සුවාසූ දහසක් රිය දිනි. දුහුල් අතුළ කස්ලෝ කොසු ඇති සුවාසූ දහසක් දෙනුන් දින. මිණි කොඩොල් පැළඳි සුවාසූ දහසක් කන්‍යාවන් දින. කොඳුපලස් අතුළ සුදු ඇතිරි අතුළ ඝනපුප් එළලොම් ඇතිරි අතුළ කෙසෙල් මුව සමින් කළ උතුම් පසතුරුණු ඇති, උඩුවියන් සහිත දෙපස තැබූ කණ්වයින් ඇති සුවාසූ දහසක් පළඟ දින. සියුම් කොමු පිළිය සියුම් කෝසෙය්‍ය පිළිය, සියුම් කම්බිලිය, සියුම් කපුපිළිය යන කෙළ සුවාසූ දහසක් වස්ත්‍ර දින. අන්නපාන ඛාද්‍ය භොජ්‍ය ලෙහ්‍ය පෙය පිළිබඳ කවර කථා ය? නදීන් මෙන් ගලති.

ගැහැවිය තට මෙ බඳු සිතෙක් වන්නේ ම ය: එසමයෙහි වෙලාම බමුණු අනිකෙක් ම විය. හේ මහාදන නම් ඒ දන දින'' යි, ගැහැවිය, තෙල මෙසේ නො දත යුතු: එසමයෙහි මම වෙලාම බ්‍රාහ්මණ වීමි, මහාදන නම් වූ ඒ දන මම දිනිමි.

ගැහැවිය, ඒ දනයෙහි දක්ෂිණාර්හ කිසිවෙක් නො වී ය. කිසිවෙක් ඒ දක්ෂිණාව පිරිසිදු නො කළේ ය. ගැහැවිය වෙලාම බමුණු මහාදන නම් යම් දනක් දිනී ද, යමෙකුත් එක් දිට්ඨිසම්පන්න (සොතාපන්න) යකු වළඳවා ද, මෙය එයට මහත්ඵලතරයි.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං, යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය, යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය, ඉදං තතො මහප්ඵලතරං.

යඤ්ච ගහපති වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි මහාදානං, යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය, යො චෙකං අනාගාමිං භොජෙය්‍ය,-පෙ- යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය, යො චෙකං අරහන්තං භොජෙය්‍ය -පෙ- යො ච සතං අරහන්තානං භොජෙය්‍ය, යො චෙකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය -පෙ- යො ච සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය, යො ච තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය -පෙ- යො ච බුද්ධපමුඛං[1] භික්ඛුසඞ්ඝං භොජෙය්‍ය -පෙ- යො ච චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කාරාපෙය්‍ය-පෙ-යො ච පසන්නචිත්තො බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගච්ඡෙය්‍ය -පෙ- යො ච පසන්නචිත්තො සික්ඛාපදානි සමාදියෙය්‍ය පාණාතිපාතා වෙරමණිං, අදින්නාදානා වෙරමණිං, කාමෙසුමිච්ඡාචාරා වෙරමණිං, මුසාවාද වෙරමණිං සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණිං. යො ච අන්තමසො ගන්ධූහනමත්තම්පි[2] මෙත්තචිත්තං භාවෙය්‍ය ඉදං තතො මහප්ඵලතරං

යඤ්ච ගහපති, වෙලාමො බ්‍රාහ්මණො දානං අදාසි, මහාදානං, යො චෙකං දිට්ඨිසම්පන්නං භොජෙය්‍ය, යො ච සතං දිට්ඨිසම්පන්නානං භොජෙය්‍ය, යො චෙකං සකදාගාමිං භොජෙය්‍ය, යො ච සතං සකදාගාමීනං භොජෙය්‍ය, යො චෙකං අනාගාමිං භොජෙය්‍ය, යො ච සතං අනාගාමීනං භොජෙය්‍ය, යො චෙකං අරහන්තං භොජෙය්‍ය, යො ච සතං අරහන්තානං භොජෙය්‍ය, යො චෙකං පච්චෙකබුද්ධං භොජෙය්‍ය, යො ච සතං පච්චෙකබුද්ධානං භොජෙය්‍ය. යො ච තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං භොජෙය්‍ය, යො ච බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං භොජෙය්‍ය, යො ච චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කාරාපෙය්‍ය, යො ච පසන්නචිත්තො බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගච්ඡෙය්‍ය, යො ච පසන්නචිත්තො සික්ඛාපදානි සමාදියෙය්‍ය පාණාතිපාතා වෙරමණී-පෙ-සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණී. යො ච අන්තමසො ගන්ධූහනමත්තම්පි මෙත්තචිත්තං භාවෙය්‍ය, යො ච අච්ඡරාසඞ්ඝාතමත්තම්පි අනිච්චසඤ්ඤං භාවෙය්‍ය ඉදං තතො මහප්ඵලතරන්ති.

**සීහනාදවග්ගො දුතියො.**

**තස්සුද්දානං**

නාදෙ[1] ස උපාදිසෙසො ච කොට්ඨිතෙන සමිද්ධිනා
ගණ්ඩසඤ්ඤා කුලං මෙත්තා දෙවතා වෙලාමෙනවාති

---

1. සොධෙති-අට්ඨකථායං
1. බුද්ධප්පමුඛං-මජසං:
2. ගන්ධොහනමත්තම්පි-මජසං ගද්දූහනමත්තම්පි-කත්ථචි

ගැහැවිය, වේලාම බමුණු මහාදන නම් යම් දනක් දිනි ද, යමෙක් දිට්ඨිසම්පන්නයන් සියයක් වළඳවා ද, යමෙකුත් එක් සකෘදගාමී පුහුලකු වළඳවා නම් මෙය එයට මහත්ඵලතර යි.

ගැහැවිය, වෙලාම බමුණු මහාදන නම් යම් දනක් දිනි නම් යමෙකුත් සකෘදගාමීන් සියයක් වළඳවා නම්... යමෙකුත් එක් අනාගාමියකු වළඳවා නම්... යමෙකුත් සියක් අනාගාමීන් වළඳවා නම්... එක් රහතකු වළඳවා නම්... යමෙකුත් සියක් රහතුන් වළඳවා නම්... යමෙකුත් එක් පසේ බුදු කෙනකුන් වළඳවා නම්... යමෙකුත් සියක් පසේ බුදු කෙනකුන් වළඳවා නම්... යමෙකුත් තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වළඳවා නම්... යමෙකුත් බුදුපාමොක් බික්සඟන වළඳවා නම්... යමෙකුත් සිවුදිගින් වඩනා සඟුන් උදෙසා, වෙහෙරක් කරවා නම්... යමෙකුත් පහන් සිතැතියේ බුදුන් දහම් සඟුන් යරණ යේ නම්... යමෙකුත් පහන් සිතැතියේ පණිවායෙන් දුරුවීම ය, අයිනාදනින් දුරුවීම ය, කාමයන්හි මිසහසරින් දුරුවීම ය, මුසවායෙන් දුරුවීම ය, මද පමා දෙකට කරුණු වූ රහමෙරින් දුරු වීම ය යන සිකපද සමාදන් වේ නම්... යමෙකුත් යටත්පිරිසෙයින් ගද සුඹුනා පමණ කලක් මෙත්සිත වඩා නම් මෙය එයට මහත්ඵලතර යි.

ගැහැවිය, වේලාම බමුණු මහාදන නම් යම් දනක් දිනි නම් යමෙකුත් දිට්ඨිසම්පන්නයකු වළඳවා නම්, යමෙකුත් සියක් දිට්ඨිසම්පන්නයන් වළඳවා නම් යමෙකුත් එක් සකෘදගාමියකු වළඳවා නම් යමෙකුත් සියක් සකෘදගාමීන් වළඳවා නම්, යමෙකුත් එක් අනාගාමියකු වළඳවා නම්, යමෙකුත් සියක් අනාගාමීන් වළඳවා නම්, යමෙකුත් එක් රහතකු වළඳවා නම්, යමෙකුත් සියක් රහතුන් වළඳවා නම්, යමෙකුත් එක් පසේ බුදු කෙනකුන් වළඳවා නම්, යමෙකුත් සියක් පසේබුදුකෙනෙකුන් වළඳවා නම්, යමෙකුත් තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වළඳවා නම්, යමෙකුත් බුදුපාමොක් බික්සඟුන් වළඳවා නම්, යමෙකුත් සිවුදිග්හි සඟුන් උදෙසා වෙහෙරක් කරවා නම්, යමෙකුත් පහන් සිතැතියේ බුදුන් දහම් සඟුන් සරණ යේ නම්, යමෙකුත් පහන් සිතැතියේ පණිවායෙන් දුරුවීම ය... මද පමා දෙකට කරුණු රහමෙරින් දුරුවීමය යන සිකපද සමාදන් වේ නම්, යමෙකුත් යටත් පිරිසෙයින් ගද සුඹුනා පමණ කලකුත් මෙත් සිත් වඩා නම් යමෙකුත් අසුරුසන් ගසන පමණ කලකුත් අනිත්‍ය සංඥ වඩා නම් මේ එයට මහත්ඵලතර යි.

දෙවැනි සීහනාද වග් යි.

එහි උද්දනය:

සීහනාදය, සොපාදිසෙසය, කොට්ඨිතය, සමිද්ධිය, ගණ්ඩය, සඤ්ඤය, කුලය, මෙත්තාය, දෙවතාය, වේලාම ය යි, දස සූත්‍ර යි.

# 3. සත්තාවාසවග්ගො

## 9. 1. 3. 1

### ඨාන සුත්තං

[සාවත්ථිනිදානං]

තීහි භික්ඛවෙ, ඨානෙහි උත්තරකුරුකා මනුස්සා දෙවෙ ච තාවතිංසෙ අධිගණ්හන්ති[1] ජම්බුදීපිකෙ ච මනුස්සෙ. කතමෙහි තීහි:

අමමා අපරිග්ගහා, නියතායුකා, විසෙසභුනො.[1] ඉමෙහි ඛො භික්ඛවෙ, තීහි ඨානෙහි උත්තරකුරුකා මනුස්සා දෙවෙ ච තාවතිංසෙ අධිගණ්හන්ති ජම්බුදීපිකෙ ච මනුස්සෙ.

තීහි භික්ඛවෙ, ඨානෙහි දෙවා තාවතිංසා උත්තරකුරුකෙ ච මනුස්සෙ අධිගණ්හන්ති ජම්බුදීපිකෙ ච මනුස්සෙ. කතමෙහි තීහි:

දිබ්බෙන ආයුනා, දිබ්බෙන වණ්ණෙන, දිබ්බෙන සුඛෙන. ඉමෙහි ඛො භික්ඛවෙ, තීහි ඨානෙහි දෙවා තාවතිංසා උත්තරකුරුකෙ ච මනුස්සෙ අධිගණ්හන්ති ජම්බුදීපිකෙ ච මනුස්සෙ.

තීහි භික්ඛවෙ, ඨානෙහි ජම්බුදීපිකා මනුස්සා උත්තරකුරුකෙ ච මනුස්සෙ අධිගණ්හන්ති දෙවෙ ච තාවතිංසෙ. කතමෙහි තීහි:

සූරා, සතිමන්තො, ඉධ බ්‍රහ්මචරියවාසො. ඉමෙහි ඛො භික්ඛවෙ, තීහි ඨානෙහි ජම්බුදීපිකා මනුස්සා උත්තරකුරුකෙ ච මනුස්සෙ අධිගණ්හන්ති දෙවෙ ච තාවතිංසෙති.

## 9. 1. 3. 2

### ඛලුඞ්ක සුත්තං

[සාවත්ථිනිදානං]

තයො ච භික්ඛවෙ, අස්සඛලුඞ්කෙ දෙසිස්සාමි තයො ච පුරිසඛලුඞ්කෙ, තයො ච අස්සසදස්සෙ[2], තයො ච පුරිසසදස්සෙ[3] තයො ච භද්‍රෙ[4] අස්සාජානීයෙ තයො ච භද්‍රෙ පුරිසාජානීයෙ තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති.

---

1. විසෙසගුණා මජසං
2. අස්සපරස්සෙ මජසං
3. පුරිසපරස්සෙ – මජසං
4. භද්දෙ – මජසං

# 3. සත්තාවාස වර්ගය

## 9. 1. 3. 1
## ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, කරුණු තුනෙකින් උතුරුකුරුදිවයින්වැසි මිනිස්සු තව්තිසා වැසි දෙවියන් ද දඹදිව වැසි මිනිසුන් ද මැඩ සිටුනාහ (විශිෂ්ට වෙති) කවර තුනෙකින් යත්:

මමත්වය නැතියාහු පරිග්‍රහ රහිතයහ, නියතගති හා ආයු හා ඇතියහ, වෙසෙස් වැඩුම් ඇතියහ. මහණෙනි, මේ තෙකරුණින් උතුරුකුරු දිවයින් වැසි මිනිස්සු තව්තිසා වැසි දෙවියනුදු දඹදිවවැසි මිනිසුනුදු මැඩ සිටුනාහ.

මහණෙනි, කරුණු තුනෙකින් තව්තිසා වැසි දෙවියෝ උතුරුකුරු දිවයින් වැසි මිනිසුනුදු දඹදිවවැසි මිනිසුනුදු මැඩ සිටුනාහ. කවර තුනෙකින් ද යත්:

දිව්‍ය ආයුෂයෙන, දිව්‍යවර්ණයෙන, දිව්‍ය සුඛයෙනැ මහණෙනි, මේ තෙකරුණින් තව්තිසාවැසි දෙවියෝ උතුරුකුරු දිවයින් වැසි මිනිසුනුදු දඹදිවවැසි මිනිසුනුදු මැඩ සිටුනාහ.

මහණෙනි, තෙකරුණෙකින් දඹදිවවැසි මිනිස්සු උතුරුකුරුදිවයින්වැසි මිනිසුනුදු තව්තිසා වැසි දෙවියනුදු මැඩ සිටුනාහ. කවර තුනෙකින යත්:

ශූරයහ, ස්මෘතිමත් හ, මෙ අත්බව්හි බඹසර විසුම ය. මහණෙනි, මේ තෙකරුණින් දඹදිව් වැසි මිනිස්සු උතුරුකුරු දිවයින්වැසි මිනිසුනුදු තව්තිසා වැසි දෙවියනුදු මැඩ සිටුනාහ.

## 9. 1. 3. 2
## ඛලුඞ්කොපම සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, තුන් අස්කුඩයනුදු තුන් මිනිස් කුඩයනුදු තුන් අභිජාත අශ්වයනුදු තුන් අභිජාත පුරුෂයනුදු තුන් භද්‍ර අශ්වාජානෙය-යනුදු තුන් භද්‍රපුරුෂාභිජානෙයයනුදු දෙසමි. ඒ අසවු, මොනොවට මෙනෙහි කරවු, දෙසමි යි.

එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

කතමෙ ච භික්ඛවෙ, තයො අස්සඛළුඞ්කා:

ඉධ භික්ඛවෙ, එකච්චො අස්සඛළුඞ්කො ජවසම්පන්නො ච හොති, න වණ්ණසම්පන්නො, න ආරොහපරිණාහ සම්පන්නො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො අස්සඛළුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච, න ආරොහපරිණාහ සම්පන්නො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො අස්සඛළුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහසම්පන්නො ච. ඉමෙ ඛො භික්ඛවෙ, තයො අස්සඛළුඞ්කා.

කතමෙ ච භික්ඛවෙ, තයො පුරිසඛළුඞ්කා: ඉධ භික්ඛවෙ, එකච්චො පුරිසඛළුඞ්කො ජවසම්පන්නො හොති න වණ්ණසම්පන්නො හොති, න ආරොහපරිණාහ සම්පන්නො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො පුරිසඛළුඞ්කො ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච, න ආරොහපරිණාහ සම්පන්නො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො පුරිසඛළුඞ්කො ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච, ආරොහපරිණාහ සම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ, පුරිසඛළුඞ්කො ජවසම්පන්නො හොති න වණ්ණසම්පන්නො, න ආරොහපරිණාහ සම්පන්නො:

ඉධ භික්ඛවෙ, භික්ඛු 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො සංසාදෙති, නො විස්සජ්ජෙති, ඉදමස්ස න වණ්ණස්මිං වදාමි. න ඛො පන ලාභී හොති චීවර පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, ඉදමස්ස න ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ, පුරිසඛළුඞ්කො ජවසම්පන්නො හොති න වණ්ණසම්පන්නො, න ආරොහපරිණාහ සම්පන්නො.

එසේය වහන්සැ යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවත්හු මෙල වදළහ:

මහණෙනි, තුන් අස්කුංඩයෝ කවරහ යත්:

මහණෙනි, මෙ ලොවිහි එක් අස්කුංඩයෙක් ජවසම්පන්න වෙයි. වර්ණසම්පන්න නො වෙයි, ආරොහපරිණාහසම්පන්න නො වේ.

මහණෙනි, මෙලොවිහි එක් අස්කුංඩයෙක් ජවසම්පන්න ද වෙයි, වර්ණසම්පන්න ද වෙයි. ආරොහපරිණාහසම්පන්න නො වේ.

මහණෙනි, මෙ ලොවිහි එක් අස්කුංඩයෙක් ජවසම්පන්න ද වෙයි, වර්ණසම්පන්න ද වෙයි, ආරොහ පරිණාහ සම්පන්න ද වේ. මහණෙනි, මේ අස් කුංඩයෝ තුන්දෙන ය.

මහණෙනි, මිනිස් කුංඩයෝ තිදෙන කවරහ යත්:

මහණෙනි, මෙ ලොවිහි එක් මිනිස් කුංඩයෙක් ජවසම්පන්න වෙයි, වර්ණසම්පන්න නො වෙයි, ආරොහ පරිණාහ සම්පන්න නො වේ.

මහණෙනි, මෙලොවිහි එක් මිනිස් කුංඩයෙක් ජවසම්පන්න ද වෙයි, වර්ණසම්පන්න ද වෙයි, ආරොහපරිණාහසම්පන්න නො වේ.

මහණෙනි, මෙ ලොවිහි එක් මිනිස් කුංඩයෙක් ජවසම්පන්න ද වෙයි, වර්ණසම්පන්න ද වෙයි, ආරොහපරිණාහසම්පන්න ද වෙයි.

මහණෙනි, මිනිස් කුංඩයා කෙසේ ජවසම්පන්න වේද, වර්ණසම්පන්න නො වේද, ආරොහපරිණාහසම්පන්න නො වේද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ 'මේ දුකැ'යි යථාභූත කොට (ඇති සැටියෙන්) දනී. 'මේ දුඃඛසමුදය' යි යථාභූතය දනී. ''මේ දුඃඛ නිරොධ ය'යි යථාභූත කොට දනී. 'මේ දුඃඛනිරොධ ගාමිනී ප්‍රතිපද'යි යථාභූතකොට දනී. මේ ඔහුගේ ජවයෙහි ලා කියමි. අභිධර්මවිෂයෙහි අභිවිනය විෂයෙහි පැණ පුළුවුස්නා ලද්දුයේ (කථාව) හිඳුවයි. විසර්ජනා නො කෙරෙයි. මේ ඔහුගේ අවර්ණයයි කියමි. සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර නො ලබනසුලු වෙයි. මෙය ඔහුගේ අනාරොහ පරිණාහයි කියමි. මහණෙනි, මෙසේ මිනිස් කුංඩයා ජවසම්පන්න වෙයි. වර්ණසම්පන්න නො වෙයි. ආරොහපරිණාහ සම්පන්න නො වෙයි.

කථඤ්ච භික්ඛවෙ, පුරිසඛළුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච, න ආරොහපරිණාහ සම්පන්නො:

ඉධ භික්ඛවෙ, භික්ඛු 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති නො සංසාදෙති. ඉදමස්ස වණ්ණස්මිං වදාමි, න ඛො පන ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං ඉදමස්ස න ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ, පුරිසඛළුඞ්කො ජවසම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච, න ආරොහපරිණාහසම්පන්නො.

කථඤ්ච භික්ඛවෙ, පුරිසඛළුඞ්කො ජව සම්පන්නො ච හොති වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහ සම්පන්නො ච:

ඉධ භික්ඛවෙ, භික්ඛු 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති – පෙ – අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති, ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති, නො සංසාදෙති. ඉදමස්ස වණ්ණස්මිං වදාමි. ලාභී ඛො පන හොති චීවර පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, ඉදමස්ස ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ පුරිසඛළුඞ්කො ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහ සම්පන්නො ච. ඉමෙ ඛො භික්ඛවෙ, තයො පුරිසඛළුඞ්කා.

කතමෙ ච භික්ඛවෙ, තයො අස්සසදස්සා:[1]

ඉධ භික්ඛවෙ, එකච්චො අස්සසදස්සො –පෙ– ජවසම්පන්නො ච හොති, වණ්ණ සම්පන්නො ච, ආරොහපරිණාහ සම්පන්නො ච, ඉමෙ ඛො භික්ඛවෙ තයො අස්සසදස්සා.

කතමෙ ච භික්ඛවෙ, තයො පුරිස සදස්සා:

ඉධ භික්ඛවෙ, එකච්චො පුරිසසදස්සො –පෙ– ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච, ආරොහපරිණාහ සම්පන්නො ච.

1. අස්සපරස්සා – මජසං

මහණෙනි, කෙසේ මිනිස් කුංඩයා ජවසම්පන්නත් වර්ණසම්පන්නත් වේ ද, ආරොහපරිණාහසම්පන්න නො වේ ද:

මහණෙනි, මෙ සස්නෙහි මහණ 'මේ දුකැ'යි යථාභූත කොට දන්නේ ය, 'මේ දුඃඛ සමුදය'යි යථාභූත කොට දන්නේය, 'මේ දුඃඛ නිරොධය'යි යථාභූත කොට දන්නේය, 'මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද'යි යථාභූත කොට දන්නේ ය. මේ ඔහුගේ ජවයයි කියමි. අභිධර්ම විෂයෙහි අභිවිනය විෂයෙහි පැණ පුළුවුස්නා ලද්දුයේ විසර්ජනා කෙරෙයි. අවසාදනා නො කෙරෙයි. මේ ඔහුගේ වර්ණයයි කියමි සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර නො ලබන සුලු වෙයි. මේ ඔහුගේ අනාරොහපරිණාහයයි කියමි. මහණෙනි, මෙසේ මිනිස් කුංඩයා ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි. ආරොහපරිණාහ සම්පන්න නො වේ.

මහණෙනි, මිනිස් කුංඩයා කෙසේ ජවසම්පන්න වේ ද, වර්ණසම්පන්න වේද, ආරොහපරිණාහසම්පන්න වේ ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ 'මේ දුකැ'යි යථාභූත කොට දන්නේ ය. ... 'මේ දුඃඛ නිරොධගාමිනී ප්‍රතිපද'යි යථාභූත කොට දන්නේ ය. මේ ඔහුගේ ජවයයි කියමි. අභිධර්මයෙහි අභිවිනයෙහි පැණ පුළුවුස්නා ලද්දුයේ විසර්ජනා කෙරෙයි (කථාව) නො හිඳුවයි. මේ ඔහුගේ වර්ණයයි කියමි. සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකර ලබනසුලු වෙයි. මේ ඔහුගේ ආරොහපරිණාහයයි කියමි. මහණෙනි, මෙසේ මිනිස් පොච්වා ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි. ආරොහපරිණාහසම්පන්න ද වෙයි. මහණෙනි, මේ මිනිස් කුංඩයෝ තිදෙන ය.

මහණෙනි, අභිජාතාශ්වයෝ තිදෙන කවරහ යත්:

මහණෙනි, මෙ ලොව්හි එක් අභිජාත අශ්වයෙක් ... ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි. ආරොහපරිණාහ සම්පන්න ද වේ. මහණෙනි, මේ අභිජාත අශ්වයෝ තිදෙනා යි.

මහණෙනි, අභිජාත පුරුෂයෝ තිදෙන කවරහ යත්: මහණෙනි, මෙ සස්නෙහි එක් අභිජාත පුරුෂයෙක් ... ජවසම්පන්න ද වෙයි. වර්ණසම්පන්න ද වෙයි. ආරොහපරිණාහ සම්පන්න ද වෙයි.

කථඤ්ච භික්ඛවෙ, පුරිසසද්දෙසො -පෙ- ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච, ආරොහපරිණාහ සම්පන්නොච:

ඉධ භික්ඛවෙ, භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්‍ථ පරිනිබ්බායී හොති අනාවත්තිධම්මො තස්මා ලොකා, ඉදමස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති නො සංසාදෙති, ඉදමස්ස වණ්ණස්මිං වදාමි. ලාභී ඛො පන හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරානං, ඉදමස්ස ආරොහපරිණාහස්මිං වදාමි. එවං ඛො භික්ඛවෙ, පුරිසසද්දෙසො ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච ආරොහ-පරිණාහසම්පන්නො ච. ඉමෙ ඛො භික්ඛවෙ, තයො පුරිසසද්දස්සා.

කතමෙ ච භික්ඛවෙ, තයො භද්‍රා අස්සාජානීයා:

ඉධ භික්ඛවෙ, එකච්චො භද්‍රො අස්සාජානීයො -පෙ- ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහ සම්පන්නො ච. ඉමෙ ඛො භික්ඛවෙ, තයො භද්‍රා අස්සාජානීයා.

කතමෙ ච භික්ඛවෙ, තයො භද්‍රා පුරිසාජානීයා.

ඉධ භික්ඛවෙ, එකච්චො භද්‍රො පුරිසාජානීයො -පෙ- ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච ආරොහපරිණාහ සම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ, භද්‍රො පුරිසාජානීයො - පෙ - ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච, ආරොහපරිණාහ සම්පන්නො ච:

ඉධ භික්ඛවෙ, භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤා විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්‍වා උපසම්පජ්ජ විහරති. ඉද-මස්ස ජවස්මිං වදාමි. අභිධම්මෙ ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති, නො සංසාදෙති. ඉදමස්ස වණ්ණස්මිං වදාමි, ලාභී ඛො පන හොති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, ඉද-මස්ස ආරොහපරිණාහස්මිං වදාමි.

එවං ඛො භික්ඛවෙ, භද්‍රො පුරිසාජානීයො ජවසම්පන්නො ච හොති, වණ්ණසම්පන්නො ච, ආරොහපරිණාහ සම්පන්නො ච. ඉමෙ ඛො භික්ඛවෙ, තයො භද්‍රා පුරිසාජානීයාති.

මහණෙනි, කෙසේ අභිජාතපුරුෂ ... ජවසම්පන්න වේද, වර්‍ණසම්පන්න වේද, ආරොහ පරිණාහ සම්පන්න වේද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ පඤ්ච ඔරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයයෙන් ඔපපාතික වෙයි. එ ලොවින් නො පෙරළෙන සැහැවි ඇතියේ එහි පිරිනිවෙන සුලු වෙයි. මේ ඔහුගේ ජවයයි කියමි. අභිධර්මයෙහි අභිවිනයෙහි පැන පුළුවුස්නා ලද්දේ විසර්ජනා කෙරෙයි. කථාව නො හිදුවයි. මේ ඔහුගේ වර්‍ණය යි කියමි. සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබනසුලු වෙයි. මේ ඔහුගේ ආරොහපරිණාහ යයි කියමි. මහණෙනි, මෙසේ අභිජාත පුරුෂ ජවසම්පන්න ද වෙයි. වර්‍ණසම්පන්න ද වෙයි. ආරොහපරිණාහසම්පන්න ද වේ. මහණෙනි, මේ පුරුෂාභිජාතයෝ තිදෙනායහ.

මහණෙනි, භද්‍රාශ්වාජානෙයයෝ තිදෙන කවරහ යත්:

මහණෙනි, මෙලොවෙහි එක් භද්‍ර අශ්වාජානෙයයෙක් ... ජවසම්පන්න ද වෙයි. වර්‍ණසම්පන්න ද වෙයි. ආරොහපරිණාහ සම්පන්න ද වෙයි. මහණෙනි, මේ භද්‍ර අශ්වාජානෙයයෝ තිදෙන යි.

මහණෙනි, භද්‍රපුරුෂාජානෙයයෝ තිදෙන කවරහ යත්:

මහණෙනි, මෙ ලොවෙහි එක් භද්‍ර පුරුෂාජානෙයයෙක් ... ජවසම්පන්න වෙයි. වර්‍ණසම්පන්න වෙයි. ආරොහපරිණාහ සම්පන්න වේ.

මහණෙනි, කෙසේ භද්‍රපුරුෂාජානෙය තෙමේ ජවසම්පන්න වේ ද, වර්‍ණසම්පන්නත් වේ ද, ආරොහපරිණාහසම්පන්නත් වේ ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ආශ්‍රවක්ෂයයෙන් අනාශ්‍රව චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙලොවෙහි ම තෙමේ දැන පසක් කොට එළැඹ වෙසෙයි. මේ ඔහුගේ ජවයයි කියමි, අභිධර්මයෙහි අභිවිනයෙහි පැණ පුළුවුස්නාලද්දේ විසර්ජනා කරයි. කථාව නො හිදුවයි. මේ ඔහුගේ වර්‍ණයයි කියමි, සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබනසුලු වෙයි. මේ ඔහුගේ ආරොහපරිණාහයයි කියමි.

මහණෙනි, මෙසේ භද්‍රපුරුෂාජානෙය ජවසම්පන්න ද වෙයි. වර්‍ණසම්පන්න ද වෙයි. ආරොහපරිනාහසම්පන්න ද වේ. මහණෙනි, මේ භද්‍රපුරුෂාජානෙයයෝ තිදෙනාහ යි.

## 9. 1. 3. 3

### තණ්හාමූලක සුත්තං

**[සාවත්ථිනිදානං]**

නව භික්ඛවෙ, තණ්හාමූලකෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමෙ ච භික්ඛවෙ, නව තණ්හාමූලකා ධම්මා? තණ්හං පටිච්ච පරියෙසනා. පරියෙසනං පටිච්ච ලාභො, ලාභං පටිච්ච විනිච්ඡයො විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො, ඡන්දරාගං පටිච්ච අජ්ඣොසානං, අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛා, ආරක්ඛාධිකරණං දණ්ඩාදනසත්ථාදන[1] කලහ විග්ගහ විවාද[2] තුවංතුවංපෙසුඤ්ඤමුසාවාද අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. ඉමෙ ඛො භික්ඛවෙ, නව තණ්හාමූලකා ධම්මාති.

## 9. 1. 3. 4

### සත්තාවාස සුත්තං

**[සාවත්ථිනිදානං]**

නව ඉමෙ භික්ඛවෙ, සත්තාවාසා. කතමෙ නව:

1. සන්ති භික්ඛවෙ, සත්තා නානත්තකායා නානත්තසඤ්ඤිනො සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. අයං පඨමො සත්තාවාසො.

2. සන්ති භික්ඛවෙ, සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා. අයං දුතියො සත්තාවාසො.

3. සන්ති භික්ඛවෙ, සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං තතියො සත්තාවාසො.

4. සන්ති භික්ඛවෙ, සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා. අයං චතුත්ථො සත්තාවාසො.

---

1. දණ්ඩාදනං සත්ථාදනං – මජසං
2. කාලහවිග්ගහ විවාද – මජසං

## 9. 1. 3. 3

## තණ්හාමූලක සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, තෘෂ්ණාමූලක ධර්ම නවය දෙසමි. අසවු, මොනොවට මෙනෙහි කරවු, කියමි යි, එසේය වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, නව තෘෂ්ණාමූලකධර්මයෝ කවරහ යත්: (වස්තු සෙවීමේ) තෘෂ්ණාව නිසා (රූපාදි අරමුණු) පයෝෂණය, පයෝෂණ නිසා (රූපාදි අරමුණු) ලාභය, ලාභය නිසා විනිශ්චය ය, විනිශ්චය නිසා ඡන්දරාග ය, ඡන්දරාගය නිසා (මම ය මාගේ යයි) බලවත් සනිටුහනය, බලවත් සනිටුහන නිසා (තණ්හා දිට්ඨිවසයෙන්) පරිග්‍රහකරණ ය, පරිග්‍රහකරණය නිසා මාත්සර්‍ය්‍ය ය, මාත්සර්‍ය්‍ය නිසා ආරක්ෂාය, ආරක්ෂා හේතුයෙන් දණ්ඩාදාන ය ශස්ත්‍රාදාන කලහ විග්‍රහ විවාද ය තෝ තෝයි බිණුම පෛශුන්‍යය මුසාවාදය යන අනෙක ලාමක අකුශලධර්මයෝ උපදනාහ. මහණෙනි, මේ නවතෘෂ්ණාමූලකධර්ම යි.

## 9. 1. 3. 4

## සත්තාවාස සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ සත්ත්වයන් වසන තැන් නවයෙක. කවර නවයෙක යත්:

1. මහණෙනි නානාත්වකාය නානාත්වසංඥ සත්හු ඇත. මිනිස්හු ඇතැම් දෙවියෝ ඇතැම් විනිපාතිකයෝ යම් බඳු ද, එ මෙනි. මේ ප්‍රථම සත්වාවාස යි.

2. මහණෙනි, නානාත්වකාය එකත්වසංඥසත්වයෝ ඇත. පළමු පහළ බ්‍රහ්මකායික දෙවියෝ යම්බඳුද, එ මෙනි. මේ ද්විතීය සත්ත්වාවාස යි.

3. මහණෙනි, එකත්වකාය නානාත්වසංඥ සත්හු ඇත. ආභාස්වර දෙවියෝ යම්බඳු ද, එ මෙනි. මේ තෘතීය සත්වාවාස යි.

4. මහණෙනි, එකත්වකාය එකත්වසංඥසත්හු ඇත. ශුභකෘත්ස්න දෙවියෝ යම්බඳු ද, එ මෙනි. මේ චතුර්ථ සත්ත්වාවාස යි.

5. සන්ති භික්ඛවෙ සත්තා අසඤ්ඤිනො අප්පටිසංවෙදිනො, සෙය්‍යථාපි දෙවා අසඤ්ඤසත්තා. අයං පඤ්චමො සත්තාවාසො.

6. සන්ති භික්ඛවෙ සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනූපගා. අයං ඡට්ඨො සත්තාවාසො.

7. සන්ති භික්ඛවෙ සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණන්ති' විඤ්ඤාණඤ්චායතනූපගා. අයං සත්තමො සත්තාවාසො.

8. සන්ති භික්ඛවෙ සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනූපගා. අයං අට්ඨමො සත්තාවාසො.

9. සන්ති භික්ඛවෙ සත්තා සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගා. අයං නවමො සත්තාවාසො.
ඉමෙ ඛො භික්ඛවෙ නව සත්තාවාසාති

## 9. 1. 3. 5
## පඤ්ඤාපරිචිත සුත්තං

[සාවත්ථිනිදානං]
යතො ඛො භික්ඛවෙ භික්ඛුනො පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති, තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො කල්ලං වචනාය 'ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතී ති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛුනො පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති. වීතරාගං මෙ චිත්තන්ති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති. වීතදොසං මෙ චිත්තන්ති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති, වීතමොහං මෙ චිත්තන්ති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති. අසාරාගධම්මං[1] මෙ චිත්තන්ති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති. අසදොසධම්මං මෙ චිත්තන්ති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති.

1. අසරාග ධම්මං - මජ්සං

5. මහණෙනි, ප්‍රතිසංවේදනා රහිත අසංඥසත්හු ඇත. අසංඥසත්ත්ව දෙවියෝ යම් බඳු ද, එ මෙති. මේ පඤ්චම සත්ත්වාවාස යි.

6. මහණෙනි, සර්වප්‍රකාරයෙන් රූපසංඥවන් ඉක්ම ප්‍රතිඝසංඥවන්ගේ අස්තගමයෙන් නානාත්වසංඥවන්ගේ අමනසිකාරයෙන් ආකාශය අනන්ත-යයි ආකාසානඤ්චායතනයට පැමිණි සත්හු ඇත. මේෂෂ්ඨසත්ත්වාවාස යි.

7. මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය සමතික්‍රමණය කොට විඥනය අනන්තය යි විඥනන්තායායතනයට පැමිණි සත්හු ඇත. මේ සප්තම සත්ත්වාවාස යි.

8. මහණෙනි, සර්වප්‍රකාරයෙන් විඥනන්තායායතනය ඉක්මවා කිසිත් නැතැයි යන ආකිඤ්චඤ්ඤායතනයට පැමිණි සත්හු ඇත. මේ අෂ්ටම සත්ත්වාවාස යි.

9. මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය සමතික්‍රමණය කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණි සත්හු ඇත. මේ නවම සත්ත්වාවාස යි.

මහණෙනි, මේ නවසත්ත්වාවාස යි.

## 9. 1. 3. 5

## පඤ්ඤාපරිචිත සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, යම් කලෙක මහණහුගේ සිත ප්‍රඥයෙන් මොනො-වට (මතුමතුයෙහිත්) වැඩුණේ වේ ද, මහණෙනි, ඒ මහණහට "ජාතිය ක්ෂය විය, බඹසර වැස නිම වි ය, කරණී කරන ලද, අර්හත්ත්වය පිණිස අනෙකෙක් නැතැයි දනිමි" යන තෙල කියන්නට වටනේ ය.

මහණෙනි, කෙසේ මහණහුගේ සිත ප්‍රඥයෙන් මොනවට (මතුමතු යෙහිත්) වැඩුණේ වේ ද? "මා සිත වීතරාගය"යි ප්‍රඥයෙන් සිත මොනවට වැඩුණේ වෙයි. මා සිත වීතද්වෙෂය යි ප්‍රඥයෙන් සිත මොනවට (මතුමතු-යෙහිත්) වැඩුණේ වෙයි. "මා සිත වීතමොහය"යි ප්‍රඥයෙන් සිත මොනවට (මතුමතුයෙහිත්) වැඩුණේ වෙයි." මාසිත සංරාගස්වභාව නැතැ"යි ප්‍රඥ-යෙන් සිත මොනවට (මතුමතුයෙහිත්) වැඩුණේ වෙයි. "මාසිත සංදූෂණ-ස්වභාව නැතැ"යි ප්‍රඥයෙන් සිත මොනවට (මතුමතුයෙහිත්) වැඩුණේ වෙයි.

අසම්මොහධම්මං මෙ චිත්තන්ති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති අනාවත්තිධම්මං මෙ චිත්තං කාමභවායාති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති අනාවත්තිධම්මං මෙ චිත්තං රූපභවායාති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති. අනාවත්ති ධම්මං මෙ චිත්තං අරූපභවායාති පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති.

යතො ඛො භික්ඛවෙ භික්ඛුනො පඤ්ඤාය චිත්තං සුපරිචිතං හොති, තස්සෙතං භික්ඛවෙ භික්ඛුනො කල්ලං වචනාය ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාමීති.

## 9. 1. 3. 6

## සිලායූපොපම සුත්තං

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච චන්දිකාපුත්තො[1] රාජගහෙ විහරන්ති[2] වෙළුවනෙ කලන්දකනිවාපෙ. තත්‍ර ඛො ආයස්මා චන්දිකා පුත්තො භික්ඛූ ආමන්තෙසි: ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො චන්දිකාපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා චන්දිකාපුත්තො එතදවොච: ''දෙවදත්තො ආවුසො භික්ඛූනං එවං ධම්මං දෙසෙති: යතො ච[3] ඛො ආවුසො භික්ඛුනො චෙතසා චිත්තං පරිචිතං හොති[4] තස්සෙතං භික්ඛුනො කල්ලං වෙය්‍යාකරණාය 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමීති.

අථ ඛො[5] ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං චන්දිකාපුත්තං එතදවොච: ''න ඛො ආවුසො චන්දිකාපුත්ත, දෙවදත්තො භික්ඛූනං එවං ධම්මං දෙසෙති:'' 'යතො ඛො ආවුසො භික්ඛුනො චෙතසා චිත්තං පරිචිතං හොති[3], තස්සෙතං භික්ඛුනො කල්ලං වෙය්‍යාකරණාය ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති. එවඤ්ච ඛො ආවුසො චන්දිකාපුත්ත දෙවදත්තො භික්ඛූනං ධම්මං දෙසෙති: 'යතො ඛො ආවුසො භික්ඛුනො චෙතසා චිත්තං සුපරිචිතං හොති, තස්සෙතං භික්ඛුනො කල්ලං වෙය්‍යාකරණාය 'ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති.

1. චන්දිකාපුත්තො-සී 1  2. විහරති-මජ්ඣං
3. යතො ඛො-මජ්ඣං  4. චෙතසා චිත්තං හොති-මජ්ඣං
5. එවං වුත්තෙ-මජ්ඣං

"මා සිත මොහනස්වභාව නැතැ"යි ප්‍රඥයෙන් සිත මොනවට වැඩුණේ වෙයි. "මා සිත කාමභවය පිණිස ආවර්තනස්වභාව නැතැ"යි ප්‍රඥයෙන් සිත මොනවට (මතුමතුයෙහිත්) වැඩුණේ වෙයි. "මා සිත රූපභවය පිණිස ආවර්තනස්වභාව නැතැ"යි ප්‍රඥයෙන් සිත මොනවට (මතුමතුයෙහිත්) වැඩුණේ වෙයි. "මා සිත අරූපභවය පිණිස ආවර්තනස්වභාව නැතැ"යි ප්‍රඥයෙන් සිත මොනවට (මතුමතුයෙහිත් වැඩුණේ වෙයි.

මහණෙනි, යම් කලෙක මහණහුගේ සිත ප්‍රඥයෙන් මොනවට (මතුමතුයෙහිත්) වැඩුණේ වේ ද, මහණෙනි, ඒ මහණහට "දූය ක්ෂය විය, බඹසර වැස නිම විය, කටයුතු කරන ලදී. මෙ බවට කටයුතු අනෙකෙක් නැතැයි දනිමි" යන තෙල කියනට වටනේ යි.

## 9. 1. 3. 6

## සිලායූපොම සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද ආයුෂ්මත් චන්‍දිකාපුත්ත තෙරණුවෝ ද රජගහනුවර වෙළුවනාරාමයෙහි විහරණ කෙරෙත්. එහි දී ආයුෂ්මත් චන්‍දිකාපුත්ත තෙරණුවෝ 'ඇවැත් මහණෙනි'යි මහණුන් ඇමතූහ. ඇවැත්නි'යි ඒ මහණහු ආයුෂ්මත් චන්‍දිකාපුත්හට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් චන්‍දිකාපුත්ත තෙරණුවෝ තෙල කීහ. ඇවැත්නි, දෙව්දත් භික්ෂූන්ට මෙසේ දහම් දෙසයි: "ඇවැත්නි, යම් කලෙක පටන් මහණහුගේ සිතින් සිත (චිත්තාචාරපරියාය) වඩනා ලද්දේ වේ ද, එ මහණහට ජාතිය ක්ෂය විය, බඹසරවැස නිමවන ලද, කරණී කරනලද මෙ රහත්බැව් පිණිස කටයුතු අනිකෙක් නැතැයි දනිමි යන තෙල කියනට වටනේ"යි.

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් චන්‍දිකාපුත්ත හට තෙල කීහ: "ඇවැත්නි චන්‍දිකාපුත්තය, දෙව්දත් භික්ෂූන්ට "ඇවැත්හි යම් කලෙක පටන් මහණහුගේ සිතින් සිත (චිත්තාචාරපරියාය) වඩනා ලද්දේ වේ ද, එ මහණහට දූය ක්ෂය විය, බඹසර වසන ලද, කරණී කරනලද. මේ බව් පිණිස කළයුතු අනිකෙක් නැතැයි දනිමි යන තෙල කියනට වටනේ"යි. මෙසේ දහම් නො දෙසයි. ඇවැත් චන්ද්‍රිකාපුත්‍රය, දෙව්දත් භික්ෂූන්ට ඇවැත්නි, යම් කලෙක පටන් මහණහුගේ සිතින් සිත (චිත්තාචාර පරියායයෙන්) මොනොවට මතුමත්තෙහිත් වඩනා ලද්දේ වේ ද, එ මහණහට ජාතිය ක්ෂය විය, බඹසර වසන ලද කරණී කරනලද, මෙ බැව් පිණිස කටයුතු අනිකෙක් නැතැයි දනිමි යන තෙල කියනට වටනේ"යි මෙසේ වනාහි දහම් දෙසයි.

දුතියම්පි ඛො - පෙ - තතියම්පි ඛො ආයස්මා චන්දිකා පුත්තො භික්ඛූ ආමන්තෙසි: දෙවදත්තො ආවුසො භික්ඛූනං එවං ධම්මං දෙසෙති: යතො ඛො ආවුසො භික්ඛුනො චෙතසා චිත්තං පරිචිතං හොති, තස්සෙතං භික්ඛුනො කල්ලං වෙය්‍යාකරණාය 'ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති.

තතියම්පි ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං චන්දිකාපුත්තං එතදවොච: න ඛො ආවුසො චන්දිකාපුත්ත, දෙවදත්තො භික්ඛූනං එවං ධම්මං දෙසෙති: යතො ඛො ආවුසො, භික්ඛුනො චෙතසා චිත්තං පරිචිතං හොති, තස්සෙතං භික්ඛුනො කල්ලං වෙය්‍යාකරණාය ඛීණාජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමීති. එවඤ්ච ඛො ආවුසො චන්දිකා පුත්ත දෙවදත්තො භික්ඛූනං ධම්මං දෙසෙති: යතො ඛො ආවුසො භික්ඛුනො චෙතසා චිත්තං සුපරිචිතං හොති, තස්සෙතං භික්ඛුනො කල්ලං වෙය්‍යාකරණාය 'ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති.

කථඤ්ච ආවුසො භික්ඛුනො චෙතසා චිත්තං සුපරිචිතං හොති: වීතරාගං මෙ චිත්තන්ති චෙතසා චිත්තං සුපරිචිතං හොති. වීතදොසං මෙ චිත්තන්ති චෙතසා චිත්තං සුපරිචිතං හොති. වීතමොහං මෙ චිත්තන්ති චෙතසා චිත්තං සුපරිචිතං හොති. අසරාගධම්මං මෙ චිත්තන්ති[1] චෙතසා චිත්තං සුපරිචිතං හොති. අසදොසධම්මං මෙ චිත්තන්ති[2] චෙතසා චිත්තං සුපරිචිතං හොති. අසමොහධම්මං මෙ චිත්තන්ති[3] චෙතසා චිත්තං සුපරිචිතං හොති. අනාවත්තිධම්මං මෙ චිත්තං කාමභවායාති චෙතසා චිත්තං සුපරිචිතං හොති. අනාවත්තිධම්මං මෙ චිත්තං රූපභවායාති චෙතසා චිත්තං සුපරිචිතං හොති. අනාවත්තිධම්මං මෙ චිත්තං අරූපභවායාති චෙතසා චිත්තං සුපරිචිතං හොති.

---

1. අසරාගධම්මං මෙ චිත්තන්ති, මජ්ඣං
2. අසදොස ධම්මං මෙ චිත්තන්ති, මජ්ඣං
3. අසමොහ ධම්මං මෙ චිත්තන්ති, මජ්ඣං

දෙවනවටත් ... තෙවනවටත් ආයුෂ්මත් චන්ද්‍රිකාපුත්‍ර තෙරණුවෝ මහණුන් ඇමතූහ: "ඇවැත්නි, දෙව්දත් භික්ෂූන්ට මෙසේ දහම් දෙසයි: "ඇවැත්නි, යම් කලෙක පටන් මහණහුගේ සිතින් සිත (චිත්තාචාර-පරියාය) වඩනා ලද්දේ වේ ද, ඒ මහණහට දැය ගෙවීන, බඹසර වසන ලද, කරණී කරනලද මෙ බැව් පිණිස අනිකෙක් නැතැයි දනිමි යන තෙල කියනට වටනේ''යි.

තෙවනවටත් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් චන්ද්‍රිකාපුත්‍ර හට තෙල කීහ: ඇවැත් චන්ද්‍රිකාපුත්‍රය, දෙව්දත් භික්ෂූන්හට මෙසේ නාහමක් දහම් දෙසයි. "ඇවැත්නි, යම් කලෙක සිට මහණහුගේ සිතින් සිත (චිත්තාචාරපරියාය) වඩන ලද වේ ද, එ මහණහට දැය ගෙවීණ, බඹසර වසන ලද කරණී කරනලද, මෙ බැව් පිණිස අනිකෙක් නැතැයි දනිමි යන තෙල කියනට වටනේ''යි. ඇවැත් චන්ද්‍රිකාපුත්‍රය, මෙසේ වනාහි දෙව්දතු භික්ෂූන්ට දහම් දෙසයි: "ඇවැත්නි, යම් කලෙක මහණහුගේ සිතින් සිත (චිත්තාචාරපරියාය) වඩනාලදුයේවේ ද, එ මහණහට දැය ක්ෂය විය. බඹසර වසන ලද, කරණී කරනලද, මෙ බැව් පිණිස අනනෙකෙක් නැතැයි දනිමි යන තෙල කීමට වටනේ''යි.

ඇවැත්නි, කෙසේ මහණහුගේ සිතින් සිත (චිත්තාචාරපරියාය) මොනොවට වඩනා ලදුයේ වේ ද, "මාගේ සිත වීතරාගය''යි සිතින් සිත මොනොවට වඩනා ලදුයේ වෙයි. "මාගේ සිත වීතදෙසය''යි සිතින් සිත මොනොවට වඩනා ලදුයේ වෙයි. "මාගේ සිත වීතමොහය''යි සිතින් සිත මොනොවට වඩනා ලදුයේ වෙයි. "මාගේ සිත ඇලුම් සවභාව නැත්තේ ය''යි සිතින් සිත මොනොවට වඩනා ලදුයේ වෙයි. "මාගේ සිත දූෂ්ටවන සවභාව නැත්තේ ය''යි සිතින් සිත මොනොවට වඩනා ලදුයේ වෙයි. "මාගේ සිත මුළාවන සවභාව නැත්තේ ය''යි සිතින් සිත මොනොවට වඩනා ලදුයේ වෙයි. "මාගේ සිත කාමභවයෙන් ආපසු එන සවභාව නැත්තේ ය''යි සිතින් සිත මොනොවට වඩනා ලදුයේ වෙයි. "මාගේ සිත රූපභවයෙන් ආපසු එන සවභාව නැත්තේ ය''යි සිතින් සිත මොනොවට වඩනාලදුයේ වෙයි. "මාගේ සිත අරූපභවයෙන් ආවර්තන-සවභාව රහිත ය''යි සිතින් සිත මොනොවට වඩනාලදුයේ වෙයි.

එවං සම්මා විමුත්තචිත්තස්ස ඛො ආවුසො භික්ඛුනො භුසා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති. නෙවස්ස චිත්තං පරියාදියන්ති අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං වයඤ්චස්සානුපස්සති. භුසා චෙපි සොතවිඤ්ඤෙය්‍යා සද්ද - පෙ - ඝාන-විඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කාය-විඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා - පෙ - මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථං ආගච්ඡන්ති නෙවස්ස චිත්තං පරියාදියන්ති. අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං, වයඤ්චස්සානුපස්සති.

සෙය්‍යථාපි ආවුසො සිලායූපො සොළසකුක්කුකො, තස්සස්සු අට්ඨකුක්කු හෙට්ඨා නෙමස්ස අට්ඨකුක්කු උපරිනෙමස්ස අථ පුරත්ථිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි නෙව නං කම්පෙය්‍ය න සඞ්කම්පෙය්‍ය න සම්පකම්පෙය්‍ය න සම්පවෙධෙය්‍ය, අථ පච්ඡිමාය චෙපි දිසාය -පෙ- අථ උත්තරාය චෙපි දිසාය -පෙ- අථ දක්ඛිණාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි නෙව නං කම්පෙය්‍ය න සඞ්කම්පෙය්‍ය න සම්පකම්පෙය්‍ය, තං කිස්ස හෙතු: ගම්භීරත්තා ආවුසො නෙමස්ස, සුනිඛාතත්තා න සම්පවෙධෙය්‍ය සිලායූපස්ස.

එවමෙව ඛො ආවුසො එවං සම්මාවිමුත්තචිත්තස්ස භික්ඛුනො භුසා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති. නෙවස්ස චිත්තං පරියාදියන්ති, අමිස්සීකතමෙවස්ස චිත්තං හොති, ඨිතං ආනෙඤ්ජප්පත්තං. වයඤ්චස්සානුපස්සති. භුසා චෙපි සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කාය-විඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති. අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං. වයඤ්චස්සානුපස්සතීති.

## 9. 1. 3. 7

## පඨමවෙරභය සුත්තං

[සාවත්ථිනිදානං]

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

මහණෙනි, මෙසේ මොනොවට මිදුණු සිත් ඇති මහණහට බොහෝවූ චක්ෂුර්විඥෙය රූපයෝ ඇස්හමුවට එත් නමුදු ඔහුගේ සිත මැඩ නො සිටුනාහ. ඔහුගේ සිත සථිත වූයේ ඒ අරමුණු හා නො මුසු වූයේ ම නො සැලෙන බවට පැමිණියේ වෙයි. ව්‍යය අනුවත් දක්නේ ය. බොහෝවූ ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයෝ ... ඝ්‍රාණවිඥෙය ගන්ධයෝ ... ජිහ්වාවිඥෙය රසයෝ ... කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයෝ ... මනොවිඥෙය ධර්‍මයෝ මනස හමුවට එත් නමුදු ඔහු සිත මැඩ නො සිටුනාහ. ඔහුගේ සිත සථිත වූයේ ඒ අරමුණු හා නො මුසු වූයේ ම නො සැලෙන බවට පැමිණියේ වෙයි. වැය ද දක්නේ යි.

ඇවැත්නි, යම් පරිදි (දිගින්) සොළොස්රියන් ගල් ටැඹෙක් වේ නම් එ ටැම්හුගේ අටරියනෙක් යට වළෙහි වෙයි. අටරියනෙක් වළෙන් මතුයෙහි වෙයි. එකල පෙරදිගින් දළපොද සුළඟෙක් ඒ නම් එය නො ම සලනේ ය. වෙසෙසින් නො සලනේ ය. වෙවුලා නො යන්නේ ය. වෙසෙසින් වෙවුලා නො යන්නේ ය. වැලි පැදුම් දිගින් ... වැලි උතුරු දිගින් ... වැලි දකුණු දිගින් මහවැසි සුලඟෙක් ඒ නම් එය නො ම සලනේ ය. වෙසෙසින් නො සලනේ ය. වෙවුලා නො යන්නේය. වෙසෙසින් වෙවුලා නො යන්නේ ය. ඒ කවර හෙයින යත්: ඇවැත්නි, වළ ගැඹුරු බැවිනි. ගල්ටැඹ මොනොවට සිටුවන ලද බැවිනි.

ඇවැත්නි, එපරිදි ම මෙසේ මිදුණු සිත් ඇති එ මහණහුගේ ඇස් හමු-වට බොහෝ වූ චක්ෂුර්විඥෙය රූපයෝ එත් නමුදු ඔහු සිත මැඩ නොම සිටුනාහ. ඔහුගේ සිත අමිශ්‍රීකෘත වූයේ ම සථිත වූයේ නො සැලෙන බවට පැමිණියේ වෙයි. වැය අනුව දක්නේත් වෙයි. බොහෝ වූ ශ්‍රොත්‍ර විඥෙය ශබ්දයෝ ... ඝ්‍රාණවිඥෙය ගන්ධයෝ ... ජිහ්වාවිඥෙය රසයෝ ... කාය විඥෙය ස්ප්‍රෂ්ටව්‍යයෝ ... මනොවිඥෙය ධර්‍මයෝ මනස් හමුවට එත් නමුදු ඔහුගේ සිත මැඩ නො ම සිටුනාහ. ඔහුගේ සිත අමිශ්‍රීකෘත වූයේ ම සථිත වූයේ ම නො සැලෙන බවට පැමිණියේ වෙයි. වැය ද නුවණින් දක්නේත් වේ.

## 9. 1. 3. 7

## පඨමවෙරභය සූත්‍රය

**[සැවැත්නිදන යි]**

එකල අනේපිඩු ගැහැවි භාග්‍යවතුන් වහන්සේ වෙත, එළැඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස් ව හුන් අනේපිඩු ගැහැවිහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක:

යතො ඛො ගහපති අරියසාවකස්ස පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති. චතූහි ච සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති. සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය: ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනි ඛීණපෙත්තිවිසයො ඛීණඅපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො[1]

කතමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති:

1. යං ගහපති පාණාතිපාතී පාණාතිපාතපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පාණාතිපාතා පටිවිරතො නෙව දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, න සම්පරායිකම්පි භයං වෙරං පසවති, න චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පාණාතිපාතා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති.

2-5 යං ගහපති අදින්නාදායී -පෙ- කාමෙසු මිච්ඡාචාරී -පෙ- මුසාවාදී -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨායී. සුරාමෙරයමජ්ජපමාදට්ඨානපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති, ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති.

කතමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති:

6. ඉධ ගහපති අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති.

7. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති. 'ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති.

1. පරායණොති – මජසං

ගෘහපති යම් කලෙක අරිසවුහුගේ පස් චිත්තොත්‍රාස භය ද අකුසල වෛරයෝද සන්හුන් වෙත් ද, සතර සොතාපත්ති මාර්ගාඞ්ගයන්ගෙන් සමන්වාගත වේ ද, හේ කැමැති වනුයේ තෙමේ ම ''ක්ෂය කළ නිරා ඇතියෙම් වෙමි, පහවූ තිරිසන් අත්බව ඇතියෙම් වෙමි. ක්ෂය කළ ප්‍රෙතවිෂය ඇතියෙම් වෙමි. ක්ෂය කළ අවා දුගති විනිපා ඇතියෙම් වෙමි. (සුවයෙන්) නොගෙනසුලුයෙම් නියතයෙම් සම්බොධිපරායන වූයෙම් සොවන් වෙමි යි තමා පවසන්නේ ය.

කවර පඤ්ච භය කෙනෙක් වෛර කෙනෙක් සන්හුන් වූවාහු වෙත් ද යත්:

1. ගෘහපති, පණිවා කරනුයේ පණිවා හෙතුයෙන් දෘෂ්ටධාර්මික වූ යම් භයක් වෛරයක් ලබතේ ද, සම්පරායික වූ භයක් වෛරයක් ලබයි ද, චෛතසික දුක් දෙම්නසක් විඳී ද, පණිවායෙන් වැළැකියේ දිටුදම් වූ ද භය වෛරය නො ම ලබයි. සාම්පරායිකවූ ද භය වෛරය නො ම ලබයි. චෛතසික වූ ද දුක් දෙම්නස් නොම විඳියි. පණිවායෙන් වැළකියාහට මෙසේ ඒ භය වෛරය සන්හිඳුනේ වෙයි.

2–5 ගැහැවිය, නුදුන් දෑ ගන්නා සුලුයේ ... කාමයෙහි මිසහසර ඇතියේ ...මුසවා කියනුයේ ... මද පමා දෙකට කරුණුවූ රහමෙර බොන සුලුයේ මද පමා දෙකට කරුණු රහමෙරහේතුයෙන් යම්ම දිටුදම් භයක් වෛරයක් ලබා ද, සාම්පරායික භයවෛරයක් ලබා ද, චෛතසික දුක්දෙම්නසුත් විඳී ද ... මදපමා දෙකට කරුණු රහමෙරින් වැළකියාහට මෙසේ ඒ භයවෛර සන්හිඳුනේ වෙයි. මේ පඤ්ච භයවෛරයෝ ව්‍යුපශාන්ත වෙත්.

කවර සොතාපත්තිමාර්ගාඞ්ගයන් ගෙන් සමන්වාගත වේය යත්:

6. ගැහැවිය, මෙ සස්නෙහි අරියවූ බුදුරජුන් කෙරෙහි අචල ප්‍රසාද යෙන් සමන්වාගත වෙයි: ''මෙ කරුණෙනුදු ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ. විද්‍යාචරණසම්පන්නයහ. සුගතයහ, ලොකවිද්හ. අනුත්තර–පුරුෂදම්‍යසාරථීහ. දෙවිමිනිස්නට ශාස්තෲහ: බුද්ධයහ භගවත්හ''යි.

7. ධර්මයෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. 'භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාත ය, සාන්දෘෂ්ටික ය, අකාලික ය, එහිපස්සවිධියට (අර්හ ය, උපනයනාර්හ ය, විඥයන් විසින් සිය සතන්හි ලා වෙදිතව්‍ය'ය කියා යි,

8. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති, 'සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති.

9. අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති, අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති.

යතො ඛො ගහපති ආරියසාවකස්ස ඉමානි පඤ්චභයානි වෙරානි වූපසන්තානි හොන්ති, ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති, සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය: ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනි ඛීණපෙත්තිවිසයො ඛීණඅපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 9. 1. 3. 8

## දුතියවෙරභය සුත්තං

**[සාවත්ථිනිදානං]**

යතො ඛො භික්ඛවෙ අරියසාවකස්ස පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති, චතූහි ච සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය, ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනි ඛීණපෙත්තිවිසයො ඛීණඅපායදුග්ගතිවිනිපාතො සොතාපන්නො'හමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො, කතමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති –පෙ– ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති'.

කතමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති –පෙ- ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති-

8. සඟුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. භගවත්හුගේ සවුසඟහු සුපිළිපන්හ. භගවත්හුගේ සවු සඟහු ඉදිව පිළිපන්හ, භගවත්හුගේ සවුසඟහු න්‍යායානුකූල ව පිළිපන්හ, භගවත්හුගේ සවුසඟහු සාමීචි ප්‍රතිපදයෙන් පිළිපන්හ. ඔහු කවරහ: චතුෂ්පුරුෂ යුගයෝ ය, අෂ්ට පුරුෂ පුද්ගලයෝ ය, භගවත්හුගේ තෙල සවුසඟහු (ඇරෙදන්නට නිසි අන්නපානප්‍රතිග්‍රහණයට අර්හවන බැවින්) ආහුනෙය්‍යයහ, (ආගන්තුකසත්කාරයට අර්හ වන බැවින්) පාහුනෙය්‍යයහ, (දක්ෂිණාවට අර්හ වන බැවින්) දක්ඛිණෙය්‍යයහ. (අඤ්ජලි කර්‍මයට අර්හවන බැවින්) අඤ්ජලිකරණීයයහ. ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රයහ කියා යි.

නොකැඩුණු නො සිදුරුවුණු කබර පැහැ නොගත් ලප නැති නිදහස් විඥප්‍රශස්ත (තණ්හා දිට්ඨි දෙකින්) පරාමර්‍ශනය නො කළ සමාධි සංවර්තනික ආර්‍ය්‍යයනට ප්‍රිය ශීලයෙන් සමන්වාගත වෙයි. මේ සතර සොවන් අඟින් සමන්වාගත වෙයි.

ගැහැවිය, යම් කලෙක අරිසවුහට මේ පස් භීතිහු අකුශල වෛරයෝ සන්හුන් වෙත් ද, මේ සතර සොවන් අඟින් සමන්වාගත වේ ද, හේ කැමැතියේ තෙමේ ම තමන් පහළ කරන්නේ ය, පහවූ නිරා ඇතියෙමි. ක්ෂය කළ තිරිසන් යොනි ඇතියෙමි ක්ෂය කළ ප්‍රෙතවිෂය ඇතියෙමි, ක්ෂය කළ අපාදුගති විනිපාත ඇතියෙමි, මම සෝවානමි, විනිපාතසභාව නැතියෙමි නියතයෙමි සම්බොධිය පරායණ කොට ගත්තෙමි වෙමි' කියා යි.

## 9. 1. 3. 8

## ද්විතීය වෙරභය සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, යම් කලෙක අරිසවුහට පස් භීතිහු ද වෛරයෝ ද, සන්හුන් වෙත් ද, සිවුසොවන් අඟින් සමන්වාගත වේ ද, හේ රුස්නේ තෙමේ ම තමා පහළ කරන්නේ ය. ක්ෂය කළ නිර ඇතියෙමි, ක්ෂය කළ තිරිසන්යොන් ඇතියෙමි. ක්ෂය කළ ප්‍රෙතවිෂය ඇතියෙමි, ක්ෂය කළ අපාය දුර්ගති විනිපාත ඇතියෙමි මම සොවන්මි. අවිනිපාතසභාව ඇතියෙමි. නියතයෙමි. සම්බොධිය පරායණ කොට ගතිමි'' කියා යි. කවර පඤ්චභීතිහු පඤ්ච වෛරයෝ සන්හුන් වෙත් ද ... මේ පඤ්චභීතිහු පඤ්චවෛරයෝ සන්හුන් වෙති. කවර සිවු සොවන් අඟින් සමන්වාගත වේ ද ... මේ සතර සොවන් අඟින් සමන්වාගත වෙයි.

යතො ඛො භික්ඛවෙ අරියසාවකස්ස ඉමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති. ඉමෙහි ච චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති, සො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය: ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනි ඛීණපෙත්තිවිසයො ඛීණ අපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 9. 1. 3. 9

## ආඝාතවත්ථු සුත්තං

[සාවත්ථිනිදානං]

නව ඉමානි භික්ඛවෙ ආඝාතවත්ථූනි, කතමානි නව:

අනත්ථං මෙ අචරීති ආඝාතං බන්ධති. අනත්ථං මෙ චරතීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතං බන්ධති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති. ඉමානි ඛො භික්ඛවෙ නව ආඝාතවත්ථූනීති.

## 9. 1. 3. 10

## ආඝාතපටිවිනය සුත්තං

[සාවත්ථිනිදානං]

නව ඉමෙ භික්ඛවෙ ආඝාතපටිවිනයා, කතමෙ නව:

අනත්ථං මෙ අචරි තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති, අනත්ථං මෙ චරති තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති, අනත්ථං මෙ චරිස්සති තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සති තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සති. තං කුතෙත්ථ ලබ්භාති, ආඝාතං පටිවිනෙති, ඉමෙ ඛො භික්ඛවෙ නව ආඝාතපටිවිනයාති.

මහණෙනි, යම් කලෙක අරිසවුහට මේ පඤ්ච භීතීහු පඤ්ච වෛරයෝ සංහිඳුන් වෙත් ද, මේ සතර සෝවන් අඟින් සමන්වාගත වේ ද, හේ රුස්නේ තෙමේ ම තමා පහළ කරන්නේ ය. 'ක්ෂය කළ නිරය ඇතියෙමි, ක්ෂය කළ තිරශ්චීන ගති ඇතියෙමි, ක්ෂය කළ ප්‍රෙතවිෂය ඇතියෙමි, ක්ෂය කළ අපාය දුගිති විනිපාත ඇතියෙමි, මම ශ්‍රොතාපන්න-යෙමි, අවිනිපාත සවභාව ඇතියෙමි, නියතයෙමි. සම්බොධිපරායණයෙමි' කියා යි.

## 9. 1. 3. 9
## ආඝාතවත්ථු සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ ආඝාත වස්තුහු නව දෙනෙකි. කවර නවදෙනෙක යත්:

මට අනර්ථ කළහ යි කොපය බඳනේ ය. මට අනර්ථ කරති යි කොපය බඳනේ ය, මට මතුයෙහි අනර්ථ කරති යි කොපය බඳනේ ය. මාගේ මනවඩන ප්‍රියයාහට අනර්ථ කළහ යි... අනර්ථ කරති යි...මතුයෙහි ද අනර්ථ කරති යි කොපය බඳනේ ය. මාගේ මන නො ගත් අප්‍රියයාහට අර්ථ කළහ යි... අර්ථ කරති යි... මතුයෙහි ද අර්ථ කරති යි කොපය බඳනේ ය. මහණෙනි, මොහු නව ආඝාතවස්තුහු යි.

## 9. 1. 3. 10
## ආඝාතපටිවිනය සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ ආඝාතප්‍රතිවිනයයෝ නව දෙනෙකි. කවර නව දෙනෙක යත්:

මට අනර්ථ කෙළේ ය, ඒ (නහමක් වේවයි) තෙල පුහුලා කෙරෙහි කිනම් කරුණින් ලැබිය හේ දැයි කොපය සන්හිඳුවයි. මට අනර්ථ කරයි. ඒ (නහමක් වේවයි) තෙල පුහුලා කෙරෙහි කිනම් කරුණින් ලැබිය හේ දැයි කොපය සන්හිඳුවයි මට මතුයෙහි අනර්ථ කරයි, ඒ (නහමක් වේවයි) තෙල පුහුලා කෙරෙහි කිනම් කරුණින් ලැබිය හේ දැයි කොපය සන්හිඳු-වයි. මාගේ මනවඩනා ප්‍රියයාහට අනර්ථයක් කෙළේය ... අනර්ථයක් කරයි. ... අනර්ථයක් මතුයෙහි කරයි, ඒ (නහමක් වේවයි) තෙල පුහුලා කෙරෙහි කිනම් කරුණින් ලැබිය හේ දැයි කොපය සන්හිඳුවයි.

මාගේ මන නො ගත් අප්‍රියයාහට අර්ථයක් කෙළේය ... අර්ථයක් කරයි ... අර්ථයක් මතුයෙහි කරයි, ඒ (නහමක් වේවයි) තෙල පුහුලා කෙරෙහි කිනම් කරුණින් ලැබියහේ දැයි කොපය සන්හිඳුවයි, මහණෙනි, මොහු නව ආඝාත පටිවිනයයෝ යි.

## 9. 1. 3. 11

## අනුපුබ්බනිරොධ සුත්තං

[සාවත්ථිනිදානං]

නව ඉමෙ භික්ඛවෙ අනුපුබ්බනිරොධා, කතමෙ නව

පඨමං ඣානං සමාපන්නස්ස කාමසඤ්ඤා නිරුද්ධා හොති. දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා නිරුද්ධා හොන්ති. තතියං ඣානං සමාපන්නස්ස පීති නිරුද්ධා හොති. චතුත්ථං ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා නිරුද්ධා හොන්ති. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤා නිරුද්ධා හොති. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤා නිරුද්ධා හොති, ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා නිරුද්ධා හොති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා නිරුද්ධා හොති. සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච නිරුද්ධා හොන්ති. ඉමෙ ඛො භික්ඛවෙ නව අනුපුබ්බනිරොධාති.

**සත්තාවාසවග්ගො තතියො.**

තත්‍රුද්දානං:

ඨානඛලුඞ්කා තණ්හා ච
සත්තපඤ්ඤා සිලායූපො,
ද්වෙ වෙරා ච ද්වෙ ආඝාතානි,
අනුපුබ්බනිරොධෙන චාති.

## 9. 1. 3. 11
## අනුපුබ්බනිරොධ සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ අනුපූර්ව නිරෝධයෝ නවදෙනෙක. කවර නව දෙනෙක යත්:

ප්‍රථමධ්‍යානය සමවත්හට කාමසංඥ නිරුද්ධ වෙයි, ද්විතීය ධ්‍යාන සමවත්හට විතර්කවිචාරයෝ නිරුද්ධ වෙති, තෘතීය ධ්‍යාන සමවත්හට ප්‍රීතිය නිරුද්ධ වෙයි, චතුර්ථධ්‍යාන සමවත්හට ආශ්වාස ප්‍රශ්වාසයෝ නිරුද්ධ වෙති. ආකාසානඤ්චායතන සමවත්හට රූපසංඥ නිරුද්ධ වෙයි, විඤ්ඤානඤ්චායතන සමවත්හට ආකාසානඤ්චායතන සංඥ නිරුද්ධ වෙයි, ආකිඤ්චඤ්ඤායතන සමවත්හට විඤ්ඤාණඤ්චායතන සංඥ නිරුද්ධ වෙයි, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමවත්හට ආකිඤ්චඤ්ඤායතන සංඥ නිරුද්ධ වෙයි, සඤ්ඤාවෙදයිත නිරොධ සමවත්හට සංඥ වෙදනාවෝ නිරුද්ධ වෙත්. මහණෙනි, මොහු නව අනුපුබ්බ නිරෝධයෝ යි.

### තෙවැනි සත්තාවාස වර්‍ග යි.

**එහි උද්දානය:**

**ධ්‍යානසූත්‍රය, බලුඩකසූත්‍රය, තණ්හා (මූලක) සූත්‍රය, සත්තාවාස, පඤ්ඤාපරිචිත සූත්‍ර දෙකය, සිලායූපසූත්‍රය, වෙර සූත්‍ර දෙකෙක, ආඝාත සූත්‍ර දෙකෙක, අනුපුබ්බනිරොධසූත්‍රයදැයි මේ වර්‍ගයෙහි සූත්‍ර එකාදශයෙකි.**

# 4. මහාවග්ගො

## 9. 1. 4. 1

## අනුපුබ්බවිහාර සුත්තං

**[සාවත්ථිනිදානං]**

නව ඉමෙ භික්ඛවෙ, අනුපුබ්බවිහාරා. කතමෙ නව:

ඉධ භික්ඛවෙ 'භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්ක විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා-පෙ-තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති.

ඉමෙ ඛො භික්ඛවෙ, නව අනුපුබ්බ විහාරාති.

# 4. මහා වර්ගය

## 9. 1. 4. 1
## අනුපුබ්බවිහාර සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ අනුපිළිවෙලින් සමවැදිය යුතු විහාරයෝ නව දෙනෙකි. කවර නව දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ම සවිතර්ක වූ සවිචාර වූ විවෙකයෙන් උපන් ප්‍රීති හා සුඛ ඇති ප්‍රථම ධ්‍යානයට එළඹ වාස කෙරෙයි. විතර්ක විචාරයන් ගේ ව්‍යපශමයෙන් (ඉක්මවීමෙන්) අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදන ඇති චිත්තයා ගේ එක අරමුණෙක් හි උද වූ බව ඇති අවිතර්ක අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීති හා සුඛ ඇති ද්විතීය ධ්‍යානයට එළැඹ වාස කෙරෙයි. ප්‍රීතිහුගේ ද විරාගයෙන් ... තෘතීයධ්‍යානයට එළඹ වාස කෙරෙයි. සුඛයා ගේ ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පෙරම සෞමනස්‍ය දෞර්මනස්‍යයන් ගේ අස්තඞ්ගමයෙන් අදුඃඛ වූ අසුඛ වූ උපෙක්ෂාස්මෘති දෙකින් වූ පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානයට එළැඹ වාස කෙරෙයි.

සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ගේ සමතික්‍රමයෙන් ප්‍රතිඝසංඥාවන් ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥාවන්ගේ අමනසිකාරයෙන් 'කයිඤ්ඤයකාටීමෝ කාසය අනන්තය'යි ආකාසානඤ්චායතනයට එළැඹ වාස කෙරෙයි. සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඥනය අනන්තය'යි විඤ්ඤාණඤ්චායතනයට එළැඹ වාස කෙරෙයි. සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වාස කෙරෙයි. සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වාස කෙරෙයි. සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට එළැඹ වාස කෙරෙයි.

මහණෙනි, මේ නවානුපූර්වවිහාර යෝ යි.

## 9. 1. 4. 2

## අනුපුබ්බවිහාරසමාපත්ති සුත්තං

[සාවත්ථිනිදානං]

නව ඉමා භික්ඛවෙ, අනුපුබ්බවිහාරසමාපත්තියො දෙසෙස්සාමි.[1] තං සුණාථ -පෙ- කතමා ච භික්ඛවෙ, නව අනුපුබ්බවිහාර සමාපත්තියො:

1. යත්ථ කාමා නිරුජ්ඣන්ති, යෙ ච කාමෙ නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති, අද්ධා තෙ ආයස්මන්තො නිච්ඡාතා නිබ්බුතා තිණ්ණා[2], පාරගතා තදඞ්ගෙනාති වදාමි. 'කත්ථ කාමා නිරුජ්ඣන්ති, කෙ ච කාමෙ නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති: අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමී'ති ඉති යො එවං වදෙය්‍ය, සො එවමස්ස වචනීයො:

'ඉධාවුසො, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථ කාමා නිරුජ්ඣන්ති, තෙ ච කාමෙ නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්තීති. අද්ධා භික්ඛවෙ, අසඨො අමායාවී සාධූති භාසිතං අභිනන්දෙය්‍ය අනුමොදෙය්‍ය සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා නමස්සමානො පඤ්ජලිකො පයිරුපාසෙය්‍ය.

2. යත්ථ විතක්කවිචාරා නිරුජ්ඣන්ති, යෙ ච විතක්කවිචාරෙ නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති, අද්ධා තෙ ආයස්මන්තො නිච්ඡාතා නිබ්බුතා තිණ්ණා පාරගතා තදඞ්ගෙනාති වදාමි. කත්ථ විතක්කවිචාරා නිරුජ්ඣන්ති. කෙ ච විතක්කවිචාරෙ නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති? අහමෙතං න ජානාමි අහමෙතං න පස්සාමීති. ඉති යො එවං වදෙය්‍ය, සො එවමස්ස වචනීයො: "ඉධාවුසො, භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථ විතක්කවිචාරා නිරුජ්ඣන්ති, තෙ ච විතක්කවිචාරෙ නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්තීති. අද්ධා භික්ඛවෙ, අසඨො අමායාවී සාධූති භාසිතං අභිනන්දෙය්‍ය අනුමොදෙය්‍ය, සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා නමස්සමානො පඤ්ජලිකො පයිරුපාසෙය්‍ය.

---

1. දෙසිස්සාමි - සිමු.
2. තිණ්ණ. - සිමු, මජසං

## 9. 1. 4. 2

# අනුපුබ්බවිහාර සමාපත්ති සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ නවානුපූර්වවිහාරසමාපත්තීන් දෙසමි. එය අසවු ... මහණෙනි, අනුපූර්ව විහාර සමාපත්තිහු නවදෙන කවරහු ද යත්:

1. යම් තැනෙක් හි කාමයෝ නිරුද්ධ වෙත් ද, යම්කෙනෙක් කාමයන් පුන පුනා නිරුද්ධ කොට වෙසෙත් ද, ඒකාන්තයෙන් ඒ ආයුෂ්මත්හු ඒ අංගයෙන් (තෘෂ්ණාදෘෂ්ටි ක්ෂුධා නැතියෙන්) නිච්ඡාතයහ. (ඇතුළත තවන කෙලෙසුන් නැතියෙන්) නිබ්බුතය හ. (කාමතණ්හා නැතියෙන්) නිත්තණ්හයහ. (කාමයෙහි පරතෙරට ගියෙන්) පාරගතයහ යි කියමි කාමයෝ කොහි නිරුඬ වෙත් ද, කවුරු කාමයන් පුන පුනා නිරුද්ධ කොට වාස කෙරෙත් ද: මම් තෙල නො දන්මි, මම් තෙල නො දක්මි යි යමෙක් මෙසේ කියා නම්, හේ මෙසේ කිය යුතු වන්නේ ය:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ම ... ප්‍රථමධ්‍යානයට එළඹ වෙසෙයි. මෙහි කාමයෝ නිරුද්ධ වෙත්, ඔහු ද කාමයන් පුන පුනා නිරුද්ධ කොට වාස කෙරෙත් යි. මහණෙනි, එකැතින් අශඨ වූ අමායාවී තැනැත්තේ මැනැවැයි භාෂිතය සතුටින් පිළිගන්නේ ය, අනුමොවන්නේ ය. මැනැවැයි භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් කොට වඳනේ බදැඳිලි වූයේ පර්යුපාසනා කරන්නේ ය.

2. යම් තැනෙක් හි විතර්ක විචාරයෝ නිරුද්ධ වෙත් ද, යම කෙනෙක් විතර්කවිචාරයන් පුන පුනා නිරුද්ධ කොට වාසය කරත් ද, එකැතින් ඒ ආයුෂ්මත්හු ඒ කරුණින් (තණ්හා දිට්ඨි නමැති සාගිනි නැතියෙන්) නිච්ඡාතය හ. (ඇතුළත තවන කෙලෙස් නැතියෙන්) නිබ්බුතයහ, (කාම තණ්හා නැතියෙන්) නිත්තණ්හයහ. පාරගතයහ, (කාමයෙහි පරතෙරට ගියහ) යි කියමි. විතර්ක විචාරයෝ කොහි නිරුද්ධ වෙත් ද, කවරහු විතර්ක විචාරයන් පුනපුනා නිරුද්ධ කොට වාසය කරත් ද: 'මම් තෙල නො දන්මි, මම් තෙල නො දක්මි'යි මෙසේ යමෙක් කියා නම්, හේ මෙසේ කිය යුතු වෙයි: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ විතර්ක විචාරයන් ගේ ව්‍යපශමයෙන් ද්විතීය ධ්‍යානයට එළැඹ වාසය කරයි. මෙහි විතර්ක විචාරයෝ නිරුද්ධ වෙත්, ඔහු ද විතර්ක විචාරයන් පුන පුනා නිරුද්ධ කොට වාසය කරත්ය' යි. මහණෙනි එකැතින් අශඨවූයේ අමායාවී වූයේ 'සාධු'යි භාෂිතය සතුටින් පිළිගන්නේ ය, අනුමොවන්නේ ය, 'සාධු' යි භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් කොට නමදනේ බදැඳිලි වූයේ පර්යුපාසනා කරන්නේ ය.

3. යත්‍ථ පීති නිරුජ්ඣති, යෙ ච පීතිං නිරොධෙත්‍වා නිරොධෙත්‍වා විහරන්‍ති, අද්ධා තෙ ආයස්මන්‍තො නිච්ඡාතා නිබ්බුතා තිණ්ණා පාරගතා තදඞ්ගෙනාති වදාමි. කත්‍ථ පීති නිරුජ්ඣති: කෙ ච පීතිං නිරොධෙත්‍වා නිරොධෙත්‍වා විහරන්‍තීති: අහමෙතං න ජානාමි. අහමෙතං න පස්සාමීති. ඉති යො එවං වදෙය්‍ය, සො එවමස්ස වචනීයො: ඉධාවුසො, භික්‍ඛු පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති. එත්‍ථ පීති නිරුජ්ඣති, තං ච පීතිං නිරොධෙත්‍වා නිරොධෙත්‍වා විහරන්‍තීති. අද්ධා භික්‍ඛවෙ, අසඨො අමායාවී සාධූති භාසිතං අභිනන්‍දෙය්‍ය අනුමොදෙය්‍ය, සාධූති භාසිතං අභිනන්‍දිත්‍වා අනුමොදිත්‍වා නමස්සමානො පඤ්ජලිකො පයිරුපාසෙය්‍ය.

4. යත්‍ථ උපෙඛාසුඛං[1] නිරුජ්ඣති, යෙ ච උපෙඛාසුඛං නිරොධෙත්‍වා නිරොධෙත්‍වා විහරන්‍ති. අද්ධා තෙ ආයස්මන්‍තො නිච්ඡාතා නිබ්බුතා තිණ්ණා පාරගතා තදඞ්ගෙනාති වදාමි. "කත්‍ථ උපෙඛාසුඛං නිරුජ්ඣති, කෙ ච උපෙක්‍ඛාසුඛං නිරොධෙත්‍වා නිරොධෙත්‍වා විහරන්‍ති? අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමීති ඉති යො එවං වදෙය්‍ය, සො එවමස්ස වචනීයො: "ඉධාවුසො, භික්‍ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්‍ථං ඣානං උපසම්පජ්ජ විහරති. එත්‍ථ උපෙඛාසුඛං නිරුජ්ඣති, තෙ ච උපෙඛාසුඛං නිරොධෙත්‍වා නිරොධෙත්‍වා විහරන්‍ති"ති. අද්ධා භික්‍ඛවෙ, අසඨො අමායාවී 'සාධූ'ති භාසිතං අභිනන්‍දෙය්‍ය අනුමොදෙය්‍ය, 'සාධූ'ති භාසිතං අභිනන්‍දිත්‍වා අනුමොදිත්‍වා නමස්සමානො පඤ්ජලිකො පයිරුපාසෙය්‍ය.

5. යත්‍ථ රූපසඤ්ඤා[2] නිරුජ්ඣන්‍ති,[3] යෙ ච රූපසඤ්ඤා[2] නිරොධෙත්‍වා නිරොධෙත්‍වා විහරන්‍ති. අද්ධා තෙ ආයස්මන්‍තො නිච්ඡාතා නිබ්බුතා තිණ්ණා පාරගතා තදඞ්ගෙනාති වදාමි, "කත්‍ථ රූපසඤ්ඤා නිරුජ්ඣන්‍ති, කෙ ච රූපසඤ්ඤා නිරොධෙත්‍වා නිරොධෙත්‍වා විහරන්‍ති, අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමී"ති. ඉති යො එවං වදෙය්‍ය සො එවමස්ස වචනීයො: "ඉධාවුසො, 'භික්‍ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්‍ථඞ්ගමා නානත්‍තසඤ්ඤානං අමනසිකාරා අනන්‍තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. එත්‍ථ රූපසඤ්ඤා නිරුජ්ඣන්‍ති.

1. උපෙක්ඛාසුඛං - මජසං,
2. රූපසඤ්ඤං - මජසං,
3. නිරුජ්ඣති - මජසං,

3. යම් තැනෙක ප්‍රීතිය නිරුද්ධ වේ නම් යම් කෙනෙකුත් ප්‍රීතිය පුන පුනා නිරුද්ධ කොට වාස කරත් නම් ඒකැතින් ඒ ආයුෂ්මත් හු ඒ අඞ්ගයෙන් නිච්ඡාතයහ, නිබ්බුතයහ, නිත්තිණ්ණයහ, පාරගතයහ යි කියමි. කොහි ප්‍රීතිය නිරුද්ධ වේ ද? කවරහු ප්‍රීතිය පුන පුනා නිරුද්ධ කොට වාසය කරත් ද? යි. මම් තෙල නො දන්මි මම් තෙල දක්මි යි මෙසේ යමෙක් කියා නම් හේ මෙසේ කිය යුතු වෙයි: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ ප්‍රීතිහුගේ ද විරාගයෙන් ... තෘතීය ධ්‍යානයට එළැඹ වාස කරයි. මෙහි ප්‍රීතිය නිරුද්ධ වෙයි. ඔහුත් පුන පුනා ප්‍රීතිය නිරුද්ධ කොට වාසය කරතැ යි. මහණෙනි, ඒකැතින් අශඨ වූ අමායාවී තැනැත්තේ 'සාධු' යි භාෂිතය සතුටින් පිළිගන්නේ ය, අනුමොවන්නේ ය. 'සාධු'යි භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් කොට ගෙන නමදනේ බඳැඳිලි වූයේ පර්යුපාසනා කරන්නේ ය.

4. යම් තැනෙක උපෙක්ෂා සුඛය නිරුද්ධ වේ ද, යම් කෙනෙකුත් උපෙක්ෂා සුඛය පුන පුනා නිරුද්ධ කොට වාසය කරත් ද ඒකතින් ඒ ආයුෂ්මත්හු ඒ කරුණින් නිච්ඡාතයහ, නිබ්බුතයහ. නිත්තිණ්ණය හ, පාරඞ්ගතයහ යි කියමි. කොහි උපෙක්ෂා සුඛය නිරුද්ධ වේ ද? කවරහු උපෙක්ෂා පුන පුනා නිරුද්ධ කොට වාස කරත් ද? මම් තෙල නො දන්මි, මම් තෙල නො දක්මි යි යමෙක් මෙසේ කියා නම් හේ මෙසේ කිය යුතු වන්නේ ය. ඇවැත්නි, මෙ සස්නෙහි මහණ සුඛප්‍රහාණයෙන් ද දුඃඛ ප්‍රහාණයෙන් ද... චතුර්ථධ්‍යානයට එළැඹ වාස කරයි. මෙහි උපෙක්ෂා සුඛය නිරුද්ධ වෙයි. ඔහු ද උපෙක්ෂා සුඛය පුන පුනා නිරුද්ධ කොට වාස කරති යි ඒකතින් අශඨ වූයේ අමායාවී වූයේ 'සාධු'යි භාෂිතය සතුටින් පිළිගන්නේය, අනුමෝදන් කොට ගන්නේය. සාධු යි භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් කොට ගෙන නමදිනුයේ බඳැඳිලි වූයේ පර්යුපාසනා කරන්නේ ය.

5. යම් තැනෙක රූපසංඥා නිරුද්ධ වෙත් ද, යම් කෙනෙක්හුදු රූප සංඥවන් පුන පුනා නිරුද්ධ කොට වාස කරත් ද, ඒකතින් ඒ ආයුෂ්මත්හු ඒකරුණින් නිච්ඡාතයහ, නිබ්බුතයහ, නිත්තිණ්ණයහ, පාරගතයහ යි කියමි. කොහි රූපසංඥ හු නිරුද්ධ වෙත් ද? කවරහු රූපසංඥවන් පුන පුනා නිරුද්ධ කොට වාස කරත් ද? මම් තෙල නො දන්මි, මම් තෙල නො දක්මි යි මෙසේ යමෙක් කියා නම් හේ මෙසේ කිය යුතු වන්නේ ය: ඇවැත්නි, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥවන් සමතික්‍රමණ කොට ප්‍රතිඝසංඥවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්ව සංඥවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාසය අනන්තය'යි අකාසානඤ්චායතනයට එළැඹ වාස කරයි. මෙහි රූපසංඥ හු නිරුද්ධ වෙත්.

තෙ ච රූපසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්තීති. අද්ධා භික්ඛවෙ, අසඨො අමායාවී සාධූති භාසිතං අභිනන්දෙය්‍ය අනුමොදෙය්‍ය, සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා නමස්සමානො පඤ්ජලිකො පයිරුපාසෙය්‍ය.

6. යත්ථ ආකාසානඤ්චායතනසඤ්ඤා නිරුජ්ඣති. යෙ ච ආකාසානඤ්චායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති, අද්ධා තෙ[1] ආයස්මන්තො නිච්ඡාතා නිබ්බුතා තිණ්ණා[2] පාරගතා තදඞ්ගෙනාති වදාමි. "කත්ථ ආකාසානඤ්චායතනසඤ්ඤා නිරුජ්ඣති, කෙ ච ආකාසානඤ්චායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති. අහමෙතං න ජානාමි අහමෙතං න පස්සාමී"ති ඉති සො එවං වදෙය්‍ය, සො එවමස්ස වචනීයො: "ඉධාවුසො, භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති එත්ථ ආකාසානඤ්චායතනසඤ්ඤා නිරුජ්ඣති. තෙ ච ආකාසානඤ්චායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති"ති. අද්ධා භික්ඛවෙ අසඨො අමායාවී සාධූති භාසිතං අභිනන්දෙය්‍ය අනුමොදෙය්‍ය, සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා නමස්සමානො පඤ්ජලිකො පයිරුපාසෙය්‍ය.

7. යත්ථ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා නිරුජ්ඣති, යෙ ච විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති, අද්ධා තෙ ආයස්මන්තො නිච්ඡාතා නිබ්බුතා තිණ්ණා[2] පාරගතා තදඞ්ගෙනාති වදාමි. "කත්ථ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා නිරුජ්ඣති, කෙ ච විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති. අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමීති යො එවං වදෙය්‍ය. සො එවමස්ස වචනීයො: ඉධාවුසො, භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, එත්ථ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා නිරුජ්ඣති, තෙ ච විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති"ති. අද්ධා භික්ඛවෙ අසඨො අමායාවී 'සාධූ'ති භාසිතං අභිනන්දෙය්‍ය අනුමොදෙය්‍ය, 'සාධූ'ති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා නමස්සමානො පඤ්ජලිකො පයිරුපාසෙය්‍ය.

1. තෙ ච - මජසං,
2. තිණ්ණා - මජසං,

ඔහු ද රූපසංඥා පුන පුනා නිරුද්ධ කොට වාස කරති යි. මහණෙනි, එකැතින් අශඨ වූ අමායාවී තැනැත්තේ 'සාධු'යි භාෂිතය සතුටින් පිළි ගන්නේ ය. අනුමෝදන් කොට ගන්නේ ය, 'සාධු යි භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් කොට ගෙන නමදනේ බැඳදිලි වූයේ පර්යුපාසනා කරන්නේ ය.

6. යම් තැනෙක් හි ආකාසානඤ්චායතන සංඥාව නිරුද්ධ වේ ද, යම් කෙනෙකුදු ආකාසානඤ්චායතනසංඥාව පුන පුනා නිරුද්ධ කොට වාසය කරත් ද, එකැතින් ඒ ආයුෂ්මත්හු එකරුණින් නිච්ඡාතයහ. නිබ්බුතය හ, නිත්තණ්හ ය, පාරඞ්ගතයහ යි කියමි. කොතන්හි ආකාසානඤ්චායතන සංඥාව නිරුද්ධ වේ ද? කවර කෙනෙක් ආකාසානඤ්චායතනසංඥාව පුන පුනා නිරුද්ධ කොට වෙසෙත් ද? යි 'මම් තෙල නො දන්මි, මම් තෙල නො දක්මි'යි මෙසේ යමෙක් කියා නම් හේ මෙසේ කිය යුතු වන්නේ ය: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඥානය අනන්ත ය'යි විඤ්ඤාණඤ්චායතනයට එළැඹ වෙසෙයි. මෙහි ආකාසානඤ්චායතන සංඥාව නිරුධ වෙයි. ඔහුදු ආකාසානඤ්චායතනය පුන පුනා නිරුද්ධ කොට වාසය කරත් යයි. මහණෙනි, එකැතින් අශඨ වූ අමායාවී තැනැත්තේ මැනැවැයි භාෂිතය සතුටින් පිළිගන්නේ ය. අනුමෝදන් කරන්නේ ය. මැනැවැයි භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් කොට ගෙන නමදනේ බඳැදිලි වූයේ පර්යුපාසනා කරන්නේ ය.

7. යම් තැනෙක විඤ්ඤාණඤ්චායතන සංඥාව නිරුද්ධ වේ ද යම් කෙනෙකුදු විඤ්ඤාණඤ්චායතන සංඥාව පුනපුනා නිරුද්ධ කොට වෙසෙත් ද, එකැතින් ඒ ආයුෂ්මත්හු එකරුණින් නිච්ඡාතයහ. නිබ්බුතය හ. නිත්තණ්හය හ. පාරඞ්ගතය හයි කියමි. කොතන්හි විඤ්ඤාණඤ්චායතන සංඥාව නිරුද්ධ වේ ද? කවර කෙනෙක් විඤ්ඤාණඤ්චායතන සංඥාව පුනපුනා නිරුද්ධ කොට වාසය කරත් ද? තෙල මම් නො දන්මි. තෙල මම් නො දක්මි යි යමෙක් මෙසේ කියා නම් හේ මෙසේ කිය යුතු වන්නේ ය: "ඇවැත්නි, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ "කිසිත් නැතැ"යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වෙසෙයි. එතන්හි විඤ්ඤාණඤ්චායතන සංඥාව නිරුද්ධ වෙයි. ඔහුදු පුනපුනා විඤ්ඤාණඤ්චායතන සංඥාව නිරුද්ධ කොට වාස කෙරෙන් ය යි. මහණෙනි. එකැතින් අසඨ වූයේ අමායාවී වූයේ 'මැනවැ'යි භාෂිතය සතුටින් පිළිගන්නේ ය. අනුමොදනා කරන්නේ ය. 'මැනැවැයි'යි භාෂිතය සතුටින් පිළිගෙන අනුමොදන් කොට ගෙන නමදනේ බඳැදිලි වැ පර්යුපාසනා කෙරෙයි.

8. යත්ථ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා නිරුජ්ඣති, යෙ ච ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති. අද්ධා තෙ ආයස්මන්තො නිච්ඡාතා නිබ්බුතා නිත්තිණ්ණා පාරගතා තදඞ්ගෙනාති වදමි. "කත්ථ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා නිරුජ්ඣති? කෙ ච ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති. අහමෙතං න ජානාමි' අහමෙතං න පස්සාමී'ති. ඉති යො එවං වදෙය්‍ය, සො එවමස්ස වචනීයො: "ඉධාවුසො භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. එත්ථ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා නිරුජ්ඣති, තෙ ච ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්තී'ති. අද්ධා භික්ඛවෙ, අසඨො අමායාවී සාධූති, භාසිතං අභිනන්දෙය්‍ය අනුමොදෙය්‍ය, සාධූති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා නමස්සමානො පඤ්ජලිකො පයිරුපාසෙය්‍ය.

9. යත්ථ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤා නිරුජ්ඣති, යෙ ච නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති, අද්ධා තෙ ආයස්මන්තො නිච්ඡාතා නිබ්බුතා නිත්තිණ්ණා පාරගතා තදඞ්ගෙනාති වදමි. "කත්ථ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤා නිරුජ්ඣති. කෙ ච නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්ති. අහමෙතං න ජානාමි, අහමෙතං න පස්සාමී"ති ඉති යො එවං වදෙය්‍ය, සො එවමස්ස වචනීයො: "ඉධාවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, එත්ථ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤා නිරුජ්ඣති. තෙ ච නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං නිරොධෙත්වා නිරොධෙත්වා විහරන්තී"ති. අද්ධා භික්ඛවෙ අසඨො අමායාවී සාධූති භාසිතං අභිනන්දෙය්‍ය, අනුමොදෙය්‍ය "සාධූ"ති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා නමස්සමානො පඤ්ජලීකො පයිරුපාසෙය්‍ය.

ඉමා ඛො භික්ඛවෙ, නව අනුපුබ්බවිහාරසමාපත්තියොති.

8. යම් තැනෙක ආකිඤ්චඤ්ඤායතන සංඥව නිරුද්ධ වේද, යම්-කෙනෙකුත් ආකිඤ්චඤ්ඤායතන සංඥව පුන පුනා නිරුද්ධ කොට වෙ-සෙත් ද, එකැතින් ඒ ආයුෂ්මත් හු එකරුණින් නිච්ඡාතය හ, නිබ්බුතය හ, නිත්තිණ්ණයහ, පාරඞ්ගතයහයි කියමි. කොතන්හි ආකිඤ්චඤ්ඤායතන සංඥ නිරුද්ධ වේ ද, කවර කෙනෙක් ආකිඤ්චඤ්ඤායතන සංඥව පුන පුනා නිරුද්ධ කොට වෙසෙත් ද? තෙල මම් නො දන්මි, තෙල මම් නො දක්මි යි මෙසේ යමෙක් කියා නම් හේ මෙසේ කිය යුතු වන්නේ ය: "ඇවැත්නි, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වෙසෙයි. මෙහි ආකිඤ්චඤ්ඤායතන සංඥව නිරුද්ධ වෙයි. ඔහු ද ආකිඤ්චඤ්ඤායතන සංඥව පුනපුනා නිරුද්ධ කොට වෙසෙත්" යි මහණෙනි, එකැතින් අසඨ වූයේ අමායාවී වූයේ භාෂිතය මැනැවැයි සතුටින් පිළිගන්නේ ය, අනුමොදනා කරන්නේ ය. භාෂිතය මැනැවැයි සතුටින් පිළිගෙන අනුමෝදනා කොට ගෙන නමදනේ බඳැඳිලි වැ පර්යුපාසනා කරන්නේ ය.

9. යම් තැනෙක නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥව නිරුද්ධ වේද, යම් කෙනෙකුත් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥව පුනපුනා නිරුද්ධ කොට වෙසෙත් ද එකැතින් ඒ ආයුෂ්මත්හු එකරුණින් නිච්ඡාතය හ, නිබ්බුතය හ, නිත්තිණ්ණය හ, පාරඞ්ගතය හ යි කියමි, කොතන්හි නෙවසඤ්ඤානාසඤ්ඤා-යතන සංඥව නිරුද්ධ වේ ද, කවර කෙනෙක් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥව පුනපුනා නිරුද්ධ කොට වෙසෙත් ද? තෙල මම් නොදන්මි. තෙල මම් නො දක්මි යි යමෙක් මෙසේ කියා නම් හේ මෙසේ කිය යුතු වන්නේ ය: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මැ සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසෙයි. එතන්හි නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥ නිරුද්ධ වෙයි. ඔහුද නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥව පුනපුනා නිරුද්ධ කොට වෙසෙති යි මහණෙනි, එකැතින් අසඨ වූයේ අමායාවී වූයේ මැනැවැයි භාෂිතය සතුටින් පිළිගන්නේ ය, අනුමොදනා කරන්නේ ය. මැනැවැයි භාෂිතය සතුටින් පිළිගෙන අනුමොදනා කොට ගෙන නමදනේ බඳැඳිලි වැ පර්යුපාසනා කරන්නේ යි.

මහණෙනි, මේ නව අනුපූර්ව විහාරසමාපත්තීහු යි.

## 9. 1. 4. 3

## නිබබානසුඛ සුතතං

එවං මෙ සුතං එකං සමයං ආයසමා සාරිපුතෙතා රාජගහෙ විහරති වෙළුවනෙ කලනදකනිවාපෙ, තත්‍ර ඛො ආයසමා සාරිපුතෙතා භිකඛූ ආමනෙතසි ආවුසො භිකඛවොති. ආවුසොති ඛො තෙ භිකඛූ ආයසමතො සාරිපුතතසස පච්චසෙසාසුං. ආයසමා සාරිපුතෙතා එතදවොච: සුඛමිදං ආවුසො නිබබානං සුඛමිදං ආවුසො, නිබබානනති.

එවං වුතෙත ආයසමා උදායී ආයසමනතං සාරිපුතතං එතදවොච: කිං පනෙතථ ආවුසො සාරිපුතත සුඛං යදෙතථ නතථි වෙදයිතනති? එතදෙව ඛොතථ[1] ආවුසො සුඛං, යදෙතථ නතථි වෙදයිතං.

පඤචිමෙ ආවුසො කාමගුණා, කතමෙ පඤච: චකඛුවිඤෙඤයයා රූපා ඉටඨා කනතා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොත-විඤෙඤයයා සදද -පෙ- ඝාන විඤෙඤයයා ගනධා-ජිවහාවිඤෙඤයයා රසා-කායවිඤෙඤයයා ඵොටඨබබා ඉටඨා කනතා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො ආවුසො පඤචකාමගුණා, යං ඛො ආවුසො ඉමෙ පඤච කාමගුණෙ පටිචච උපපජජති සුඛං සොමනසසං. ඉදං වුචචතාවුසො කාමසුඛං.

1. ඉධාවුසො භිකඛු විවිචෙච්ච කාමෙහි විවිචච අකුසලෙහි ධමෙමහි පඨමං ඣානං උපසමපජජ විහරති. තසස චෙ ආවුසො භිකඛුනො ඉමිනා විහාරෙන විහරතො කාමසහගතා සඤඤාමනසිකාරා සමුදාචරනති, සවාසස හොති ආබාධො. සෙයයථාපි ආවුසො සුඛිනො දුකඛං උපපජෙජයය, යාවදෙව ආබාධාය, එවමෙවසස තෙ කාමසගතා සඤඤාමනසිකාරා සමුදාචරනති සවාසස හොති ආබාධො, යො ඛො පනාවුසො ආබාධො දුකඛමෙතං වුතතං භගවතා. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන වෙදිතබබං යථාසුඛං නිබබානනති.

2. පුනචපරං ආවුසො භිකඛු විතකකවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසමපජජ විහරති. තසස චෙ ආවුසො, භිකඛුනො ඉමිනා විහාරෙන විහරතො විතකකසහගතා සඤඤාමනසිකාරා සමුදාචරනති, සවාසස හොති ආබාධො.සෙයයථාපි ආවුසො සුඛිනො දුකඛං උපපජෙජයය යාවදෙව ආබාධාය, එවමෙවසස තෙ විතකකසහගතා සඤඤාමනසිකාරා සමුදාචරනති. සවාසස හොති ආබාධො. යො ඛො පනාවුසො ආබාධො දුකඛමෙතං වුතතං භගවතා. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන වෙදිතබබං යථාසුඛං නිබබානනති.

1. ඛෙවතථ - මජසං

## 9. 1. 4. 3
## නිබ්බානසුඛ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ රජගහ නුවර වෙළුවන නම් කලන්දක නිවාපයෙහි වාසය කෙරෙත්. එකල්හි ඇව ත් සැරියුත් තෙරණුවෝ ඇවැත් මහණෙනි යී මහණුන් ඇමතූහ. 'ඇවැත්නි යී ඒ මහණහු ඇවැත් සැරියුත් තෙරුනට පිළිවදන් ඇස් වූහ. ඇවැත් සැරියුත් තෙරණුවෝ තෙල වදළහ. "ඇවැත්නි, මේ නිර්වාණය සුව යි, ඇවැත්නි, මේ නිර්වාණය සුව"යි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් උදයි තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරුනට තෙල කීහ: "ඇවැත්නි ශාරිපුත්‍රය, යම් තැනෙක වෙදයිතයෙක් නැද්ද, එහි කවර සුඛයෙක් දැ"යි. "ඇවැත්නි, ඉදින් යම් තැනෙක වෙදයිතයෙක් නැද්ද, තෙල ම සුව වේ"යි,

ඇවැත්නි, මේ කාමගුණ පසෙක් වෙයි, කවර පසක යත් ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියරූප වූ කාමොපසංහිත වූ රජනීය වූ චක්ෂුර්විඥෙය රූපහ ...... ශ්‍රොත්‍රවිඥෙය ශබ්දහ ...... ඝ්‍රාණවිඥෙය ගන්‍ධහ ...... ජිහ්වාවිඥෙය රස හ. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ රජනීය වූ ප්‍රියරූප වූ කාමොපසංහිත වූ කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යහ. ඇවැත්නි, මේ පඤ්චකාමගුණ යි. ඇවැත්නි, මේ පස්කම් ගුණ නිසා යම් බඳු සුඛයෙක් සෞමනස්යයෙක් උපදනේ ද, ඇවැත්නි, මේ කාමසුව යි.

1. ඇවැත්නි මේ සස්නෙහි මහණ කාමයන් ගෙන් වෙන්ව ම අකුසල් දහමින් වෙන්ව ම ප්‍රථමධ්‍යානයට එළැඹ වෙසෙයි. ඇවැත්නි, මේ විහරණයෙන් වාස කරන එ මහණහට ඉදින් කාම සහගත සංඥමනසිකාරයෝ පහළ වෙත් නම් එය ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, සුව ඇත්තහුට හුදෙක් ආබාධ පිණිස ම යම් බඳු දුකෙක් උපදනේ නම් එ පරිදි ම ඔහට ඒ කාමසහගත සංඥමනසිකාරයෝ පහළ වෙත් නම් එය ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යමෙක් ආබාධ වේ නම් තෙල භාග්‍යවතුන් විසින් දුකැයි වදරන ලද. ඇවැත්නි, මේ පයර්‍යායයෙනුදු නිර්වාණය යම් බඳු සුවයෙක් වේ නම් තෙල දතයුතු යි.

2. ඇවැත්නි, තව ද මහණ විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන්...... ද්විතීයධ්‍යානයට එළඹ වෙසෙයි ඇවැත්නි, මේ විහාරයෙන් වාසය කරන එ මහණහට විතර්ක සහගත සංඥමනසිකාරයෝ ඉදින් පහළ වෙත් නම් එ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, සුව ඇත්තහුට යම් සේ හුදෙක් ආබාධ පිණිස ම දුක් උපදනේ නම් එපරිදි ම ඔහට ඒ විතර්කසහගත සංඥමනසිකාරයෝ උපදනා හු නම් එ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යමෙක් ආබාධ නම් තෙල භාග්‍යවතුන් විසින් දුකැයි වදරන ලද. ඇවැත්නි, මේ කාරණයෙනුදු තෙල නිර්වාණය සුව වූ පරිදි දතයුතු යි.

3. පුනචපරං ආවුසො, භික්ඛු පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති, තස්ස චෙ ආවුසො භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො පීතිසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. සෙය්‍යථාපි ආවුසො, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය, එවමෙවස්ස තෙ පීතිසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති ස්වාස්ස හොති ආබාධො. යො ඛො පනාවුසො, ආබාධො දුක්ඛමෙතං වුත්තං භගවතා. ඉමිනාපි ඛො එතං ආවුසො, පරියායෙන වෙදිතබ්බං යථාසුඛං නිබ්බානන්ති.

4. පුනචපරං ආවුසො, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තස්ස චෙ ආවුසො, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො උපෙක්ඛා සහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. සෙය්‍යථාපි ආවුසො, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය, එවමෙවස්ස තෙ උපෙක්ඛා සහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. යො ඛො පනාවුසො, ආබාධො දුක්ඛමෙතං වුත්තං භගවතා. ඉමිනාපි ඛො එතං ආවුසො, පරියායෙන වෙදිතබ්බං යථාසුඛං නිබ්බානන්ති.

5. පුනචපරං ආවුසො භික්ඛු රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, තස්ස චෙ ආවුසො, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො රූපසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. සෙය්‍යථාපි ආවුසො සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය, එවමෙවස්ස තෙ රූපසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. යො ඛො පනාවුසො ආබාධො දුක්ඛමෙතං වුත්තං භගවතා. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන වෙදිතබ්බං යථාසුඛං නිබ්බානන්ති.

6. පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස චෙ ආවුසො භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. සෙය්‍යථාපි ආවුසො සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය, එවමෙවස්ස තෙ ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස හොති ආබාධො. යො ඛො පනාවුසො ආබාධො, දුක්ඛමෙතං වුත්තං භගවතා. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන වෙදිතබ්බං යථා සුඛං නිබ්බානන්ති.

3. තව ද ඇවැත්නි මහණ ප්‍රීතිහුගේ විරාගයෙන් ... තෘතියධ්‍යානයට එළැඹ වෙසෙයි. ඇවැත්නි, මේ විහාරයෙන් වාස කරන ඒ මහණහට ඒ ප්‍රීතිසහගත සංඥාමනසිකාරයෝ උපදනාහ. ඒ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යම් පරිදි සුව ඇතියහුට හුදෙක් ආබාධ පිණිස ම දුක් උපදනේ නම් එ පරිදි ම ඔහට ඒ ප්‍රීතිසහගතසංඥාමනසිකාරයෝ උපදිත් නම් එය ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යමෙක් ආබාධ වේ නම් තෙල භාග්‍යවතුන් විසින් දුකැයි වදරන ලද. ඇවැත්නි, මෙපරිද්දෙනුදු තෙල නිර්වාණය සුව පරිදි දතයුතු.

4. ඇවැත්නි, තව ද මහණ සුවප්‍රහාණයෙනුදු දුඃඛප්‍රහාණයෙනුදු ... චතුර්ථධ්‍යානයට එළැඹ වෙසෙයි. ඇවැත්නි, ඉදින් මේ විහාරයෙන් වාස කරන එ මහණහට උපෙක්ෂාසහගත සංඥාමනසිකාරයෝ උපදනාහු නම් ඒ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යම් පරිදි සුව ඇතියහුට ආබාධ පිණිස ම දුක් උපදනේ නම් එ පරිදි ම ඔහට උපෙක්ෂාසහගත සංඥාමනසිකාරයෝ පහළ වෙත්. එ ඔහට ආබාධ වෙයි, ඇවැත්නි, යමෙක් ආබාධ වේ නම් තෙල භාග්‍යවතුන් විසින් දුකැයි වදාරන ලද. ඇවැත්නි, මෙ අයුරිනුදු තෙල නිර්වාණය සුව පරිදි දතයුතු.

5. තව ද ඇවැත්නි, මහණ රූපසංඥාවන්ගේ සමතික්‍රමණයෙන් ප්‍රතිඝ-සංඥාවන්ගේ අස්තගමයෙන් නානාත්වසංඥාවන්ගේ අමනසිකාරයෙන් ආකාශය අනන්ත ය'යි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, ඉදින් මේ විහාරයෙන් වාස කරන එ මහණහට රූපසහගත සංඥාමන-සිකාරයෝ පහළ වෙත් නම් එ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යම් පරිදි සුව ඇතියහුට හුදෙක් ආබාධ පිණිස ම දුක් උපදනේ නම් එ පරිදි ම ඔහට රූපසහගත සංඥාමනසිකාරයෝ පහළ වෙත්. එ ඔහට ආබාධ වෙයි, ඇවැත්නි, යමෙක් ආබාධ වේ නම් තෙල භාග්‍යවතුන් විසින් දුකැයි වදරන ලද. ඇවැත්නි, මේ අයුරිනුදු තෙල නිර්වාණය සුව පරිදි දතයුතු.

6. ඇවැත්නි, තවද මහණ හැම පරිදි ආකාසානඤ්චායතනය ඉක්මවා විඥානය අනන්තය යි විඤ්ඤාණඤ්චායතනය උපයා වෙසෙයි. ඇවැත්නි, ඉදින් මේ විහාරයෙන් වාස කරන එ මහණහට ආකාසානඤ්චායතන සහගත මනසිකාරයෝ පහළ වෙත් නම් එ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යම් පරිදි සුව ඇතියහුට හුදෙක් ආබාධ පිණිස ම දුක් උපදනේ ද, එපරිදි ඔහුගේ ඒ ආකාසානඤ්චායතන සංඥා මනසිකාරයෝ පහළ වෙත්. එ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යමෙක් ආබාධ නම් තෙල භාග්‍යවතුන් විසින් දුකැයි වදරන ලද. ඇවැත්නි, මේ අයුරිනුදු තෙල නිර්වාණය සුව පරිදි දත යුතු.

7. පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. තස්ස චෙ ආවුසො, භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. සෙය්‍යථාපි ආවුසො, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය. එවමෙවස්ස තෙ විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. යො ඛො පනාවුසො ආබාධො දුක්ඛමෙතං වුත්තං භගවතා. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන වෙදිතබ්බං යථාසුඛං නිබ්බානන්ති.

8. පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. තස්ස චෙ ආවුසො භික්ඛුනො ඉමිනා විහාරෙන විහරතො ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. සෙය්‍යථාපි ආවුසො සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය. එවමෙවස්ස තෙ ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස හොති ආබාධො. යො ඛො පනාවුසො ආබාධො, දුක්ඛමෙතං වුත්තං භගවතා. ඉමිනාපි ඛො එතං ආවුසො, පරියායෙන වෙදිතබ්බං යථාසුඛං නිබ්බානන්ති.

9. පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන වෙදිතබ්බං යථා සුඛං නිබ්බානන්ති.

## 9. 1. 4. 4

## ගාවීඋපමා සුත්තං

[සාවත්ථිනිදානං]

සෙය්‍යථාපි භික්ඛවෙ, ගාවී පබ්බතෙය්‍යා බාලා අබ්‍යත්තා අඛෙත්තඤ්ඤූ අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං, තස්සා එවමස්ස: 'යන්නූනාහං අගතපුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍යං, අඛාදිතපුබ්බානි ච තිණානි ඛාදෙය්‍යං, අපීතපුබ්බානි ච පානීයානි පිවෙය්‍යන්ති. සා පුරිමං පාදං න සුප්පතිට්ඨිතං පතිට්ඨාපෙත්වා පච්ඡිමං පාදං උද්ධරෙය්‍ය, සා න චෙව අගතපුබ්බං දිසං ගච්ඡෙය්‍ය, න ච අඛාදිතපුබ්බානි තිණානි ඛාදෙය්‍ය, න ච අපීතපුබ්බානි ච පානීයානි පිවෙය්‍ය, යස්මිං චස්සා පදෙසෙ ඨිතාය එවමස්ස: යන්නූනාහං අගතපුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍යං, අඛාදිතපුබ්බානි චෙව තිණානි ඛාදෙය්‍යං, අපීතපුබ්බානි චෙ ච පානීයානි පිවෙය්‍යන්ති, තඤ්ච පදෙසං න සොත්ථිනා පච්චාගච්ඡෙය්‍ය. තං කිස්ස හෙතු: තථා හි සා භික්ඛවෙ, ගාවී පබ්බතෙය්‍යා බාලා අබ්‍යත්තා අඛෙත්තඤ්ඤූ අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං.

7. තවද ඇවැත්නි, මහණ හැම පරිදි විඤ්ඤාණඤ්චායතනය ඉක්ම 'කිසිත් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වෙසෙයි. ඇවැත්නි, මේ විහාරයෙන් වාසය කරන එ මහණහට විඤ්ඤාණඤ්චායතන සංඥ මනසිකාරයෝ පහළ වෙත්. එ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යම් පරිදි සුව ඇතියහුට හුදෙක් ආබාධය පිණිස ම දුක් උපදනේ ද, එ පරිදි ම ඔහට එ විඤ්ඤාණඤ්චායතන සංඥා මනසිකාරයෝ පහළ වෙත්. එ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යමෙක් ආබාධ වේ ද, තෙල දුකැයි භාග්‍යවතුන් විසින් වදරන ලද. ඇවැත්නි, මේ අයුරිනුදු තෙල නිවන සුව පරිදි දත යුතු.

8. ඇවැත්නි, තවද මහණ සර්වථායෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වෙසෙයි. ඇවැත්නි, ඉදින් මේ විහාරයෙන් වාසය කරන එ මහණහට ආකිඤ්චඤ්ඤායතන සහගත සංඥා මනසිකාරයෝ පහළ වෙත් නම් එ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යම් පරිදි සුව ඇතියහුට හුදෙක් ආබාධය පිණිස ම දුක් උපදනේ නම් එ පරිදි ම ඔහට ඒ ආකිඤ්චඤ්ඤායතන සහගත සංඥමනසිකාරයෝ පහළ වෙත්. ඒ ඔහට ආබාධ වෙයි. ඇවැත්නි, යමෙක් ආබාධ වේ නම් තෙල දුකැයි භාග්‍යවතුන් විසින් වදරන ලද. ඇවැත්නි, මෙ අයුරිනුදු තෙල නිවන සුව පරිදි දත යුතු.

9. තවද ඇවැත්නි, මහණ සර්වථායෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මැ සඤ්ඤාවෙදයිතනිරොධයට එළැඹ වෙසෙයි. ප්‍රඥයෙන් දැක ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ ද වෙත්. ඇවැත්නි, මෙ කරුණෙනුදු තෙල නිවන සුව පරිදි දත යුතු.

## 9. 1. 4. 4

## ගාවීඋපමා සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, යම් පරිදි බාල අව්‍යක්ත ක්ෂේත්‍රය නොදන්නා පර්වතයෙහි හැසිරෙන දෙන විසම පර්වතයෙහි සරනට අසමත් වේ ද, ඇයට මෙ බඳු සිතෙක් වෙයි: "මම නො ගිය විරූ දිගට යෙම් නම් නො කෑ විරූ තණ කන්නෙම් නම්, නො පී විරී පැන් බොන්නෙම් නම් යෙහෙකැ"යි. ඕ පළමු පා මොනොවට පිහිටියක් කොට නො පිහිටුවා පැසුළු පා නඟයි. ඕ නො ගිය විරූ දිගට නො යයි. නො කෑ විරූ තණ ද නො කයි නො පී විරී පැන් නො බොයි. යම් පියසෙක්හිදු සිටි ඇයට මෙ බඳු සිතෙක් වේ නම: "මම නො ගිය විරූ දිගට යෙමි යි, නො කෑ විරූ තණ ද කමි යි නො පී විරී පැනුදු බොමි"යි එ පියසට නිදුකින් පෙරළා නො යෙයි. එ කවර හෙයින යත්: මහණෙනි, බාල අව්‍යක්ත ක්ෂේත්‍රඥ නො වූ ඒ දෙන යම් හෙයෙකින් විසම පර්වතයෙහි සරණට නො සමත් ද, එහෙයිනි.

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු බාලො අබ්‍යත්තො අඛෙත්තඤ්ඤූ අකුසලො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති[1] සො තං නිමිත්තං න ආසෙවති, න භාවෙති, න බහුලීකරොති, න ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

තස්ස එවං හොති: 'යන්නූනාහං විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො න සක්කොති විතක්ක-විචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරිතුං. තස්සෙවං හොති: යන්නූනාහං විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො න සක්කොති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරිතුං. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු උභතො භට්ඨො උභතො පරිහීනො. සෙය්‍යථාපි සා ගාවී පබ්බතෙය්‍යා බාලා අබ්‍යත්තා අඛෙත්තඤ්ඤූ අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං.

සෙය්‍යථාපි භික්ඛවෙ ගාවී පබ්බතෙය්‍යා පණ්ඩිතා බ්‍යත්තා ඛෙත්තඤ්ඤූ කුසලා විසමෙ පබ්බතෙ චරිතුං. තස්සා එවමස්ස: 'යන්නූනාහං අගත-පුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍යං, අඛාදිතපුබ්බානි ච තිණානි ඛාදෙය්‍යං, අපීත-පුබ්බානි ච පානීයානි පිවෙය්‍යන්ති. සා පුරිමං පාදං සුපතිට්ඨිතං පතිට්ඨාපෙත්වා පච්ඡිමං පාදං උද්ධරෙය්‍ය, සා අගතපුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍ය, අඛාදිතපුබ්බානි චෙව තිණානි ඛාදෙය්‍ය, අපීතපුබ්බානි ච පානීයානි පිවෙය්‍ය, යස්මිං චස්සා පදෙසෙ ඨිතාය එවමස්ස: යන්නූනාහං අගතපුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍යං, අඛාදිතපුබ්බානි චෙව තිණානි ඛාදෙය්‍යං අපීතපුබ්බානි චෙව පානීයානි පිවෙය්‍යන්ති' තඤ්ච පදෙසං සොත්ථිනා පච්චාගච්ඡෙය්‍ය. තං කිස්ස හෙතු: තථා හි සා භික්ඛවෙ ගාවී පබ්බතෙය්‍යා පණ්ඩිතා ව්‍යත්තා ඛෙත්තඤ්ඤූ කුසලා විසමෙ පබ්බතෙ චරිතුං.

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු පණ්ඩිතො බ්‍යත්තො ඛෙත්තඤ්ඤූ කුසලො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

තස්ස එවං හොති: 'යන්නූනාහං විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති.' සො දුතියං ඣානං අනභිහිංස-මානො විතක්කවිචාරානං වූපසමා දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

1. විහරිතුං-සීමු

මහණෙනි, එ පරිදි ම මෙ සස්නෙහි බාල අව්‍යක්ත ක්ෂේත්‍රඥ නො වන අදක්ෂ වූ කිසියම් මහණෙක් කාමයන්ගෙන් වෙන් වැ ම අකුශල ධර්මයන් ගෙන් වෙන් වැ සවිතර්ක සවිචාර විවෙකජ ප්‍රීතිසුඛ ඇති පළමු දැහැන උපයා වෙසෙයි. හේ ඒ දැහැන් නිමිත්ත පුනපුනා සෙවනය නො කෙරෙයි, නො වඩයි, බහුල විසින් නො කරයි, මොනොවට ඉටන ලද්දක් කොට නො ඉටයි.

ඔහට මෙ බඳු සිතෙක් වෙයි: ''මම් විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන් ... දෙවන දැහැනට පැමිණ වෙසෙම් නම් මැනවි''යි. හේ විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන් දෙවන දැහැනට එළැඹ වසනට නො හැකියේ වෙයි. ඔහට මෙබඳු සිතෙක් වෙයි: ''මම් කාමයන්ගෙන් වෙන් වැ ම පළමු දැහැනට එළැඹ වෙසෙම් නම් යෙහෙකැ''යි. හේ කාමයන්ගෙන් වෙන් වැ ... පළමු දැහැනට එළැඹ වසනට නො හැකි වෙයි. මහණෙනි, මෙ මහණ දෙපසින් නටුයේ දෙපසින් පිරිහුනේ යයි කියනු ලැබේ. බාල අව්‍යක්ත ක්ෂේත්‍රඥ නො වන පර්වතයෙහි සරණ ඒ දෙන විසම පර්වතයෙහි සරනට අදක්ෂ වූවා යම් සේ ද, එ මෙනි.

මහණෙනි, පණ්ඩිත ව්‍යක්ත ක්ෂේත්‍රඥ වූ පර්වතයෙහි සරණ දෙනක් විෂම පර්වතයෙහි සරනට යම් සේ දක්ෂ වේ ද, ඇයට මෙ බඳු සිතෙක් වෙයි; ''මම් නො ගිය විරූ දිගට යෙම් නම් නො කෑ විරූ තණ ද කන්නෙම් නම් නො පී විරී පැන් ද බොන්නෙම් නම් යෙහෙකැ''යි ඕ පළමු පා මොනොවට පිහිටියක් කොට තබා පැසුළු පා නඟයි, ඕ නො ගිය විරූ දිගට ද යයි, නො කෑ විරූ තණ ද කයි, නො පී විරී පැන් ද බොයි. යම් පියෙසෙකැ සිටි ඇයට මෙ බඳු සිතෙක් වේ නම්: ''මම් නො ගිය විරූ දිගට ද යමි. නො කෑ විරූ තණ ද කමි. නො පී විරි පැන් ද බොමැ''යි, එ පියසට නිදුකින් පෙරළා එයි. එ කවර හෙයින යත්: මහණෙනි, යම් හෙයෙකින් පණ්ඩිත ව්‍යක්ත ක්ෂේත්‍රඥ ඒ දෙන විෂම පර්වතයෙහි සරනට සමත් වේ ද, එ හෙයිනි.

මහණෙනි, එ පරිදි ම මෙ සස්නෙහි පණ්ඩිත ව්‍යක්ත ක්ෂේත්‍රඥ දක්ෂ කිසියම් මහණෙක් කාමයෙන් වෙන් වැ ම අකුශල දහමින් වෙන් වැ... පළමු දැහැනට පැමිණ වෙසෙයි. හේ ඒ සමාධිනිමිත්ත පුනපුනා සෙවනය කෙරෙයි, වඩයි, බහුලීකෘත කරයි, මොනොවට ඉටුවක් කොට ඉටයි.

ඔහට මෙ බඳු සිතෙක් වෙයි: ''මම් විතර්ක විචාරයින් ගේ ව්‍යපශමයෙන් දෙවන දැහැනට එළැඹ වෙයෙම් නම් යෙහෙකැ''යි, හේ දෙවන දැහැන නො පෙළනුයේ විතර්ක විචාරයන්ගේ ව්‍යපශමයෙන් දෙවන දැහැනට එළැඹ වෙසෙයි. හෙ එ නිමිත්ත සෙවනය කෙරෙයි, වඩයි, බහුල කරයි, මොනොවට ඉටුවක් කොට ඉටයි.

තස්ස එවං හොති: 'යන්නූනාහං පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති.' සො තතියං ඣානං අනභිහිංසමානො පීතියා ච විරාගා තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

තස්ස එවං හොති: 'යන්නූනාහං සුඛස්ස ච පහානා, දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො චතුත්ථං ඣානං අනභිහිංසමානො සුඛස්ස ච පහානා-පෙ-චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො තං නිමිත්තං ආසෙවති, භාවෙති, බහුලීකරොති, ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

තස්ස එවං හොති: ''යන්නූනාහං සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා[1] නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො ආකාසානඤ්චායතනං අනභිහිංසමානො සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා -පෙ- ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

තස්ස එවං හොති: 'යන්නූනාහං සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති' විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති සො විඤ්ඤාණඤ්චායතනං අනභිහිංසමානො සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

තස්ස එවං හොති 'යන්නූනාහං සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො ආකිඤ්චඤ්ඤායතනං අනභිහිංසමානො සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

තස්ස එවං හොති: ''යන්නූනාහං සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරෙය්‍ය''න්ති. සො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං අනභිහිංසමානො සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාධිට්ඨිතං අධිට්ඨාති.

---

1. අත්ථගමා-සීමු

ඔහට මෙබඳු සිතෙක් වෙයි: "මම ප්‍රීතියගේ ද විරාගයෙන් තෙවන දූහැනට පැමිණ වෙසෙම් නම් යෙහෙකැ"යි. හෙ තෙවන දූහැන නො පෙළනුයේ ප්‍රීතියගේ ද විරාගයෙන් තෙවන දූහැනට එළැඹ වෙසෙයි. හෙ එ සමාධිනිමිත්ත සෙවනය කෙරෙයි, වඩයි, බහුල කරයි, මොනොවට ඉටුවක් කොට ඉටයි.

ඔහට මෙබඳු සිතෙක් වෙයි: "මම සුඛප්‍රහාණයෙනුදු දුඃඛප්‍රහාණයෙනුදු ... සිවුවැනි දූහැනට එළැඹ වෙසෙම් නම් යෙහෙක" කියා යි. හේ සිවුවන දූහැන නො පෙළමින් සුඛප්‍රහාණයෙනුදු ... සිවුවන දූහැනට එළැඹ වෙසෙයි. හෙ එ නිමිත්ත සෙවනය කෙරෙයි, වඩයි, බහුල කරයි, මොනොවට ඉටුවක් කොට ඉටයි.

ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මම සර්වථායෙන් රූපසංඥවන්ගේ සමතික්‍රමණයෙන් ප්‍රතිසසංඥවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥවන්ගේ අමනසිකාරයෙන් 'ආකාශය අනන්ත' යයි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙම් නම් යෙහෙකැ'යි, හේ ආකාසානඤ්චායතනය නො පෙළනුයේ සර්වථායෙන් රූපසංඥවන්ගේ සමතික්‍රමණයෙන්... ආකාසානඤ්චායතනයට එළැඹ වෙසෙයි. හෙ එ නිමිත්ත සෙවනය කෙරෙයි, වඩයි, බහුල කරයි, ස්වාධිෂ්ඨිත කොට ඉටයි.

ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මම සර්වථායෙන් ආකාසානඤ්චායතනය ඉක්ම 'විඥනය අනන්තය' යි විඤ්ඤාණඤ්චායතනය උපයා වෙසෙම් නම් මැනැවයි හේ විඤ්ඤාණඤ්චායතනය නො පෙළෙමින් සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි. හෙ එ නිමිත්ත සෙවනය කෙරෙයි, වඩයි, බහුල කරයි. ස්වාධිෂ්ඨිත කොට ඉටයි.

ඔහට මෙ බඳු සිතෙක් වෙයි: "මම හැම පරිද්දෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරම් නම් යෙහෙකැ"යි. හේ ආකිඤ්චඤ්ඤායතනය නො පෙළමින් හැම පරිද්දෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ "කිසිවක් නැතැ"යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වාසය කරයි. හේ එ නිමිත්ත සෙවනය කෙරෙයි, වඩයි, බහුල කරයි, ස්වාධිෂ්ඨිත කොට ඉටයි.

ඔහට මෙබඳු සිතෙක් වෙයි: "මම හැම පරිදි ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරම් නම් යෙහෙකැ"යි. හෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නොපෙළමින් හැම පරිදි ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ නෙවසඤ්ඤානාසඤ්ඤායත්නයට පැමිණ වාසය කරයි. හේ එ නිමිත්ත සෙවනය කෙරෙයි, වඩයි, බහුල කෙරෙයි. ස්වාධිෂ්ඨිත කොට ඉටයි.

තස්ස එවං හොති: "යන්නූනාහං සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො සඤ්ඤාවෙදයිතනිරොධං අනභිහිංසමානො සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති.

යතො ඛො භික්ඛවෙ භික්ඛු තං තදෙවසමාපත්තිං සමාපජ්ජතිපි වුට්ඨාතිපි. තස්ස මුදුං චිත්තං හොති කම්මඤ්ඤං, මුදුනා චිත්තෙන කම්මඤ්ඤෙන අප්පමාණො සමාධි හොති සුභාවිතො. සො අප්පමාණෙන සමාධිනා සුභාවිතෙන යස්ස යස්ස අභිඤ්ඤාසච්ඡිකරණීයස්ස ධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤාසච්ඡිකිරියාය. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභවෙය්‍යං, එකොපි හුත්වා බහුධා අස්සං බහුධාපි හුත්වා එකො අස්සං -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති දිබ්බාය සොතධාතුයා -පෙ-සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතොපරිච්ච පජානෙය්‍යං, සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානෙය්‍යන්ති -පෙ- විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති "අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යං, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං ස උද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ.

සො සචෙ ආකඞ්ඛති "ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙති.

ඔහට මෙ බඳු සිතෙක් වෙයි: ''මම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය ඉක්මැ සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසෙම් නම් යෙහෙකැ''යි. හෙ සඤ්ඤාවෙදයිතනිරොධය නො පෙළනුයේ හැම පරිදි නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසෙයි.

මහණෙනි, යම් කලෙක පටන් මහණ එම සමවතට සමවදනේ නම් නැඟී සිටුනේ නම් ඔහු සිත මෘදු වෙයි. කර්මණ්‍ය වෙයි. මෘදු වූ කර්මණ්‍ය වූ සිතින් අප්‍රමාණ සමාධිය මොනවට වඩන ලද්දේ වෙයි. හෙ සුභාවිත වූ අප්‍රමාණ සමාධියෙන් (විශිෂ්ටඥානයෙන්) දත සාක්ෂාත් කටයුතු යම් යම් ධර්‍මයකට සිත (දත සාක්ෂාත් කරනු පිණිස) මොනොවට නමයි ද, කරුණු ඇති ඇති වත් ම ඒ ඒ වෙසෙසෙහි ප්‍රත්‍යක්ෂ භාවයට පැමිණෙයි.

ඉදින් හෙ කැමැති වන්නේ නම් අනෙකවිහිත ඍද්ධිවිධය වළඳ නෙම්, එකෙක් වැ ද බොහෝ පරිදි වෙම්වයි, බොහෝ පරිදි වැද එකෙක් වම්ව යි ... බඹලොව දක්වා කයින් වශය පවත්වමව යි කැමති වේ නම් කරුණු ඇති ඇති වත් ම ඒ ඒ වෙසෙසෙහි ප්‍රත්‍යක්ෂභාවයට පැමිණෙයි.

ඉදින් හෙ දිව්‍යසෝඩයින් ... කැමති වේ නම් කරුණු ඇති ඇති වත් ම...

ඉදින් හෙ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත සිය සිතින් පිරිසිඳ දනගන්නෙම්වයි. සරාග වූ හෝ සිත සරාග සිතැයි දන ගන්නෙම් වයි ... විමුක්ත වූ හෝ සිත විමුක්තචිත්ත යයි දන ගන්නෙම් වයි කැමැති වේ නම් ඒ ඒ වෙසෙසෙහි කරුණු ඇති ඇති වත් මැ පසක් බවට පැමිණෙයි.

ඉදින් හෙ නන් වැදෑරුම් පෙර විසූ කඳපිළිවෙළ සමරම්වයි එනම්: එක් ජාතියකුදු ... මෙසේ ආකාර සහිත උද්දෙස සහිත නන් වැදෑරුම් පෙර විසූ කඳ පිළිවෙළ සමරම්වයි කැමති වේ නම් කරුණු ඇති වත් මැ එ එ වෙසෙස්හි පසක් බවට පැමිණෙයි.

''ඉදින් මෙ විශුද්ධ වූ මිනිසැස ඉක්ම පවත්නා වූ දිවැසින් ... කම් වූ පරිදි පිළිසඳට යන සත්ත්වයන් දන්නෙම්වා''යි කැමති වේ නම් කරුණු ඇති ඇති වත් ම එ එ වෙසෙස්හි ප්‍රත්‍යක්ෂ භාවයට පැමිණෙයි.

''හේ ඉදින් ආශ්‍රවක්ෂයෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තිය හා ප්‍රඥා විමුක්තිය ඉහාත්මයෙහි මැ තෙමෙ විශිෂ්ටඥානයෙන් දන පසක් කොට පැමිණ වෙසෙම්වා''යි කැමති වේ නම් කරුණු ඇති ඇතිවත් මැ ඒ ඒ වෙසෙස්හි පසක් බවට පැමිණෙ.

## 9. 1. 4. 5

## ඣානනිස්සය සුත්තං

[සාවත්ථිනිදානං]

පඨමම්පාහං[1] භික්ඛවෙ ඣානං නිස්සාය ආසවානං ඛයං වදාමි. දුතියම්පාහං[2] භික්ඛවෙ ඣානං නිස්සාය ආසවානං ඛයං වදාමි. තතියම්පාහං භික්ඛවෙ ඣානං නිස්සාය ආසවානං ඛයං වදාමි. චතුත්ථම්පාහං භික්ඛවෙ ඣානං නිස්සාය ආසවානං ඛයං වදාමි. ආකාසානඤ්චායතනම්පාහං භික්ඛවෙ[3] නිස්සාය ආසවානං ඛයං වදාමි. විඤ්ඤාණඤ්චායතනම්පාහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදාමි. ආකිඤ්චඤ්ඤායතනම්පාහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදාමි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනම්පාහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදාමි. සඤ්ඤාවෙදයිතනිරොධම්පාහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදාමි.

"පඨමම්පාහං භික්ඛවෙ ඣානං නිස්සාය ආසවානං ඛයං වදාමී"ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං; ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති.

සො යදෙව තත්ථ හොති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති. සො තෙහි ධම්මෙහි චිත්තං පටිවාපෙති[4] සො තෙහි ධම්මෙහි චිත්තං පටිවාපෙත්වා[5] අමතාය ධාතුයා චිත්තං උපසංහරති. "එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන"න්ති. සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

---

1. පඨමම්පාහං–මජසං
2. දුතියම්පාහං–මජසං
3. ඣානං–සී 1
4. පතිට්ඨාපෙති – ස්‍යා
5. පටඨාපෙත්වා – ස්‍යා

## 9. 1. 4. 5

## ඣානනිස්සය සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මම ප්‍රථමධ්‍යානය නිසා ද ආස්‍රවයන්ගේ ක්ෂය (වෙ ය යි) කියමි. මහණෙනි, මම ද්විතීයධ්‍යානය නිසා ද ආස්‍රවයන්ගේ-ක්ෂය කියමි. මහණෙනි, මම තෘතීයධ්‍යානය නිසා ද ආස්‍රවයන්ගේ-ක්ෂය කියමි. මහණෙනි, මම චතුර්ථධ්‍යානය නිසා ද ආස්‍රවයන්ගේ ක්ෂය කියමි. මහණෙනි, මම ආකාසානඤ්චායතනය නිසාත් ආස්‍රවයන්ගේ-ක්ෂය කියමි. මහණෙනි, මම විඤ්ඤාණඤ්චායතනය නිසාත් ආස්‍රවයන්ගේ ක්ෂය කියමි. මහණෙනි, මම ආකිඤ්චඤ්ඤායතනය නිසාත් ආස්‍රවයන්ගේ ක්ෂය කියමි. මහණෙනි, මම නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනය නිසාත් ආස්‍රවයන්ගේ ක්ෂය කියමි. මහණෙනි, මම සඤ්ඤා වෙදයිත නිරොධය නිසාත් ආස්‍රවයන්ගේ ක්ෂය කියමි.

"මහණෙනි, මම ප්‍රථමධ්‍යානය නිසාත් ආස්‍රවයන්ගේ ක්ෂය කියමි"යි මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් වැ ම... ප්‍රථමධ්‍යානයට එළැඹ වාස කෙරෙයි.

හෙ ඒ දහැන්හි රූපගත වේවයි වේදනාගත වේවයි සඤ්ඤාගත වේවයි සඞ්ඛාරගත වේවයි විඤ්ඤාණගත වේවයි යමෙක් මැ වෙ නම් එ දහම් අනිත්‍ය විසින් රෝග විසින් ගණ්ඩ (ගඩු) විසින් සල්ල (හුල්) විසින් අඝ (දුක සහිත) විසින් ආබාධ (පීඩාකර) විසින් පර (අයත් නැති) විසින් පලොක (පලුදු) විසින් සුඤ්ඤ (හිස්වූවන්) විසින් අනත්ත (අනාත්ම) විසින් මොනොවට විදසුන් නුවණින් දක්නේ ය. හෙ එ දහමුන්ගෙන් සිත නිවන් විසින් නවතා ලයි. එ දහමුන් ගෙන් සිත නවතා "යම් මෙ සර්වසංස්කා-රයන්ගේ සමථයෙක් වෙ නම් සර්වොපධීන්ගේ දුර ලීමෙක් වෙ නම් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වෙ නම් තෙල ශාන්ත ය, තෙල ප්‍රණීත යයි අමෘතධාතුයෙහි සිත බස්වයි. හෙ එ දහැන්හි සිටියේ ආස්‍රවයන්ගේ ක්ෂයට පැමිණෙයි. ඉදින් ආස්‍රවයන්ගේ ක්ෂයට නො පැමිණේ නම් ඒ (ශමථ-විදර්ශනා) ධර්මරාගයෙන් මැ ඒ ධර්මනන්දියෙන් මැ පඤ්චොරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයෙන් එහි මැ පිරිනිවෙන සුලු එ ලොවින් පිළිසඳ විසින් පෙරළා නො එන සැහැවි ඇති ඖපපාතිකයෙක් වෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ ඉස්සාසො වා ඉස්සාසන්තෙවාසී වා තිණපුරිසකෙ[1] වා මත්තිකාපුඤ්ජෙ වා යොග්ගං කරිත්වා සො අපරෙන සමයෙන දූරෙපාතී ච හොති අක්ඛණවෙධී ච මහතො ච කායස්ස පදලෙතා[2]

එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති සො තෙහි ධම්මෙහි චිත්තං පටිවාපෙති, සො තෙහි ධම්මෙහි චිත්තං පටිවාපෙත්වා අමතාය ධාතුයා චිත්තං උපසංහරති: "එතං සන්තං එතං පණීතං, යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන"න්ති, සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති. තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති. තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. "පඨමම්පහං භික්ඛවෙ ඣානං නිස්සායං ආසවානං ඛයං වදමී"ති ඉති යං තං වුත්තං. ඉදමෙතං පටිච්ච වුත්තං.

දුතියම්පහං භික්ඛවෙ ඣානං නිස්සාය -පෙ- තතියම්පහං භික්ඛවෙ ඣානං නිස්සාය -පෙ- චතුත්ථම්පහං භික්ඛවෙ ඣානං නිස්සාය -පෙ- ආකාසානඤ්චායතනම්පහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදමී"ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං:

ඉධ භික්ඛවෙ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා[3] නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, සො යදෙව තත්ථ හොති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්ති ධම්මො තස්මා ලොකා.

1. තිණපුරිසරූපකෙ–මජසං
2. පදලිතා–මජසං
3. අත්ථගමා– සිමු.

මහණෙනි, යම් පරිදි දුනුවායෙක් වේවයි, දුනුවා අතවැසියෙක් වේවයි පෙතලි රුවෙක හෝ මැටි පිඩෙක හෝ යොග්‍ය (අභ්‍යාස) කොට හේ පසු කලෙක (දුර හී හෙළනා) දූරෙපාතියෙක් ද (විදුලියෙහි දූ නො වරද ව විදුනා) අක්ඛණවෙධියෙක් ද මහත් කයත් බිඳුනේ ද වෙයි.

මහණෙනි, එ සෙයින් මැ මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් වැ ම...පළමු දැහැනට පැමිණ වෙසෙයි. හේ එහි රූපගත වේවයි, වෙදනාගත වේවයි, සඤ්ඤාගත වේවයි, සඞ්ඛාරගත වේවයි, විඤ්ඤාණගත වේවයි, යම් ම ධර්මයෙක් වේ නම් ඒ ධර්මයන් අනිත්‍ය විසින් දුඃඛ විසින් රොග විසින් ගණ්ඩ විසින් සල්ල විසින් අඝ විසින් ආබාධ විසින් පර විසින් පලොක විසින් සුඤ්ඤ විසින් අනාත්ත විසින් විවසුත් නුවණින් දක්නේ ය, හේ එ දහමුන්ගෙන් සිත නවත්වයි. හේ එ දහමුන්ගෙන් සිත නවත්වා "යම් මේ සර්වසංස්කාර සමථයෙක් වේ නම් සර්වොපධීන්ගේ දුරලීමෙක් වේ නම් තෘෂ්ණාක්ෂයයෙක් වේ නම් විරාගයෙක් වේ නම් නිරොධයෙක් වේ නම් නිර්වාණයෙක් වේ නම් තෙළ ශාන්තය තෙල ප්‍රණීතය"යි. නිර්වාණ ධාතුයෙහි සිත බහයි. හේ එහි සිටියේ ආශ්‍රවයන්ගේ ක්ෂයට පැමිණේ.

ඉදින් ආස්‍රවයන්ගේ ක්ෂයට නො පැමිණේ නම් එම ධම්රාගයෙන් එම ධර්මනන්දියෙන් පඤ්චොරම්භාගියසංයොජනයන්ගේ පරික්ෂයයෙන් එහි පිරිනිවෙන සුලු එ ලොවින් පෙරළා නො එන සැහැවි ඇති ඔපපාතික වෙයි. මහණෙනි, ප්‍රථමධ්‍යානය නිසාත් ආශ්‍රවයන්ගේ ක්ෂය මම කියමි යි මෙසේ යමෙක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලදී.

"මහණෙනි, මම දෙවන දැහැන නිසා ද ... මහණෙනි, මම තෙවන දැහැන නිසා ද ... මහණෙනි, මම සිවුවන දැහැන නිසා ද ... මහණෙනි මම ආකාසානඤ්චායතනය නිසා ද ආස්‍රවයන්ගේ ක්ෂය කියමි"යි, මෙසේ තෙළ යමෙක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද යැ යත්:

"මහණෙනි, මම සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමයෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥාවන්ගේ අමනසිකාරයෙන් "ආකාසය අනන්තය"යි ආකාසානඤ්චායතනයට එළැඹ වෙසෙයි. හෙ එහි යම් මැ වෙදනාගතයෙක් සංඥාගතයෙක් සංස්කාරගතයෙක් විඤ්ඤාණගතයෙක් වේ නම් ... හේ පඤ්චොරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයයෙන් එහි පිරිනිවෙන සුලු එලොවින් පෙරළා නො එන සැහැවි ඇති ඔපපාතික වෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ ඉස්සාසො වා ඉස්සාසන්තෙවාසී වා තිණපුරිසකෙ වා මත්තිකාපුඤ්ජෙ වා යොග්ගං කරිත්වා සො අපරෙන සමයෙන දූරෙපාතී ච හොති අක්ඛණවෙධී ච මහතො කායස්ස පදාලෙතා. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. ආකාසානඤ්චායතනම්පහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදාමීති ඉති යං තං වුත්තං ඉද මෙතං පටිච්ච වුත්තං.

විඤ්ඤාණඤ්චායතනම්පහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදාමීති -පෙ- ආකිඤ්චඤ්ඤායතනම්පහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදාමීති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඉධ භික්ඛවෙ භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො යදෙව තත්ථ හොති වෙදනාගතං සඤ්ඤාගතං -පෙ- සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. ආකිඤ්චඤ්ඤායතනම්පහං භික්ඛවෙ නිස්සාය ආසවානං ඛයං වදාමීති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉති ඛො භික්ඛවෙ යාවතා සඤ්ඤාසමාපත්ති තාවතා අඤ්ඤාපටිවෙධො. යානි ච ඛො ඉමානි භික්ඛවෙ ආයතනානි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති ච සඤ්ඤාවෙදයිත නිරොධො ච ඣායීහෙතෙ භික්ඛවෙ භික්ඛූහි සමාපත්තිකුසලෙහි සමාපත්තිවුට්ඨානකුසලෙහි සමාපජ්ජිත්වා වුට්ඨහිත්වා සමක්ඛාතබ්බානීති[1] වදාමීති.

1. සම්මං අක්ඛාතබ්බානීති-මජසං

මහණෙනි, යම් පරිදි දුනුවායෙක් වේවයි, දුනුවා අතවැසියෙක් වේවයි පෙතලි රුවෙක හෝ මැටිපිඩෙක හෝ යොග්‍ය (අභ්‍යාස) කොට පසු කලෙක දූරෙපාතියෙක් ද අක්ඛණවෙධියෙක් ද මහකය බිඳුනෙක් ද වේ නම් මහණෙනි, එ සෙයින් ම මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥවන්ගේ සමතික්‍රමයෙන් ප්‍රතිඝසංඥවන්ගේ අස්තගමයෙන් නානාත්වසංඥවන්ගේ අමනස්කාරයෙන් ආකාසය අනන්ත යයි ආකාසානඤ්චායතනයට එළැඹ වෙසෙයි, හේ එහි යම් ම වෙදනාගතයෙක් වේවයි, සඤ්ඤගතයෙක් වේවයි, සඞ්ඛාරගතයෙක් වේවයි, විඤ්ඤණගතයෙක් වේවයි...හේ පඤ්චඕරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයෙන් එහි පිරිනිවන සුලු එ ලොවින් පෙරළා නො එන සුලු ඖපපාතිකයෙක් වෙයි, 'මහණෙනි, ආකාසානඤ්චායතනය නිසා ද මම ආශ්‍රවයන්ගේ ක්ෂය කියමි'යි මෙසේ යමෙක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලදී.

මහණෙනි, විඤ්ඤණඤ්චායතනය නිසාත් මම ආශ්‍රවයන්ගේ ක්ෂය කියමි යි...ආකිඤ්චඤ්ඤයතනය නිසාත් මම ආශ්‍රවයන්ගේ ක්ෂය කියමි යි මෙසේ තෙල යමෙක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද යැ යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ සර්වථායෙන් විඤ්ඤණඤ්චායතනය ඉක්ම 'කිසිවෙක් නැතැ'යි ආකිඤ්චඤ්ඤයතනයට එළැඹ වෙසෙයි. හේ එහි යම් ම වෙදනාගතයෙක් සඤ්ඤගතයෙක් වේ නම් ... හෙ පඤ්චෝරම්භාගියසංයොජනයන්ගේ පරික්ෂයෙන් එහි පිරිනිවෙන සුලු එ ලොවින් පෙරළා නො එන සුලු ඖපපාතික වෙයි. මහණෙනි, ආකිඤ්චඤ්ඤයතනය නිසා ද මම ආශ්‍රවයන්ගේ ක්ෂය කියමි යි මෙසේ කියන ලද නම් තෙල මේ පිණිස කියන ලදී.

මහණෙනි, මෙසේ යම් තාක් සචිත්තක සමාපත්ති වේ නම් ඒ තාක් අර්හත්වප්‍රතිවෙධය වෙයි. මහණෙනි, නෙවසඤ්ඤනාසඤ්ඤයතන සමාපත්තිය ද සඤ්ඤවෙදයිත නිරොධය දැයි යම් මේ ආයතන කෙනෙක් වෙත් නම් මහණෙනි, මොහු ධ්‍යාන කරන සුලු, සමාපත්තිකුශල සමාපත්ති ව්‍යුත්ථානයෙහි කුශල භික්ෂූන් විසින් සමවැද (ඉන්) නැඟී (ශාන්තය ප්‍රණීත යයි) මොනොවට කිවයුතුවහ'යි කියමි යි.

## 9. 1. 4. 6

## ආනන්ද සුත්තං

එවං මෙ සුතං එකං: සමයං ආයස්මා ආනන්දො කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තත්‍ර ඛො ආයස්මා ආනන්දො භික්ඛූ ආමන්තෙසි. ආවුසො භික්ඛවොති. ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං. ආයස්මා ආනන්දො එතදවොච:

අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන සම්බාධෙ ඔකාසාධිගමො අනුබුද්ධො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛ-දොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය. තදෙව නාම චක්ඛුං භවිස්සති තෙ රූපා තඤ්චායතනං නො පටිසං-වෙදිස්සති තදෙව නාම සොතං භවිස්සති, තෙ සද්දා, තඤ්චායතනං නො පටිසංවෙදිස්සති. තදෙව නාම ඝානං භවිස්සති, තෙ ගන්ධා. තඤ්චායතනං, නො පටිසංවෙදිස්සති. සා ච නාම ජිව්හා භවිස්සති, තෙ රසා. තඤ්චායතනං නො පටිසංවෙදිස්සති, සො ච නාම කායො භවිස්සති තෙ ඵොට්ඨබ්බා තඤ්චායතනං නො පටිසංවෙදිස්සතීති.

එවං වුත්තෙ ආයස්මා උදයී ආයස්මන්තං ආනන්දං එතදවොච: "සඤ්ඤීමෙව නු ඛො ආවුසො ආනන්ද තදයතනං නො පටිසංවෙදෙති උදහු අසඤ්ඤී"ති? සඤ්ඤීමෙව ඛො ආවුසො තදයතනං නො පටිසංවෙදෙති. නො අසඤ්ඤීති.

කිං සඤ්ඤී පනාවුසො තදයතනං නො පටිසංවෙදෙතීති?

ඉධාවුසො භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤා-නං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. එවං සඤ්ඤීපි ඛො ආවුසො තදයතනං නො පටිසංවෙදෙති.

## 9. 1. 4. 6
## ආනන්ද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක ආයුෂ්මත් අනඳ තෙරණුවෝ කොසඹෑනුවර ඝොෂිත ආරාමයෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ ඇවත් මහණෙනි යි භික්ෂූන් ඇමතූහ: එ භික්ෂූහු ආයුෂ්මත් අනඳ තෙරණුවනට ඇවැත්නි, ආනන්දයෙනි යී පිළිවදන් ඇස් වූහ. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ තෙල කීහ:

ඇවැත්නි, භගවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ අර්හත් වූ සම්මාසම්බුද්ධයන් වහන්සේ විසින් (පඤ්චකාමගුණයෙන්) සම්බාධස්ථානයෙක සත්ත්වයන්ගේ විශුද්ධිප්‍රාප්තිය පිණිස ශොකපරිදෙවයන්ගේ සමතික්‍රමණය පිණිස දුක්දෙම්නසුන්ගේ අස්තඞ්ගමය පිණිස මාර්ගයාගේ අධිගමය පිණිස නිර්වාණයාගේ සාක්ෂාත්කරණය පිණිස අවකාශාධිගමය ඉමහත් සේ පිළිවිදුනා ලද්දේ ය. ආශ්චර්ය්‍ය ය! අද්භූත ය!

"එ ඇස ම (අසම්භින්න) වෙයි. එ රූපයෝ ම වෙත්, එ රූපායතනය නො දන්නේ ය. එ කන ම (අසම්භින්න) වෙයි, එ ශබ්දයෝ ම වෙත්. එ ශබ්දයතනය නො දන්නේ ය. එ නැහැය ම (අසම්භින්න) වෙයි. එ ගන්ධයෝම වෙත්, එ ගන්ධායතනය නො දන්නේ ය. එ දිව (අසම්භින්න) ම වෙයි, එ රසයෝ ම වෙත්, එ රසායතනය නො දන්නේ ය. එ කය (අසම්භින්න) ම වෙයි, එ ස්ප්‍රෂ්ටව්‍යයෝ ම වෙත්, එ ස්පර්ශායතනය නො දන්නේ ය''යි.

මෙසේ කීකල්හි ආයුෂ්මත් උදායී තෙරණුවෝ ආයුෂ්මත් අනඳ තෙරණුවනට තෙල කීහ: ඇවත්නි ආනන්දයෙනි, සවිතක්ක වූයේ ම එ රූපායතනය නො දන්නේ වේ ද, නො හොත් අවිතක්ක ව සිට නො දන්නේ වේද''යි. ඇවැත, සවිතක්ක වූයේ ම එ රූපායතන නො දන්නේ ය. අවිතක්ක වූයේ නො දන්නේ නො වෙයි.

ඇවත්නි, කෙබඳු සංඥ ඇති එ රූපායතන නො දන්නේ වේ ද? ඇවැත්නි, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥවන්ගේ සමතික්‍රමණයෙන් ප්‍රතිඝසංඥවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්ව සංඥවන්ගේ අමනසිකාරයෙන් "ආකාශය අනන්ත''යි ආකාසානඤ්චායතනය උපයා ගෙන වෙසෙයි. ඇවත, මෙ බඳු සංඥ ඇතියේත් එ ආයතන නො දන්නේ ය.

පුනච පරං ආවුසො භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමති ක්කම්ම 'අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. එවං සඤ්ඤීපි ඛො ආවුසො තදායතනං නො පටිසංවෙදෙති.

පුනච පරං ආවුසො, භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, එවං සඤ්ඤීපි ඛො ආවුසො තදායතනං නො පටිසංවෙදෙතීති.

එකමිදහං ආවුසො, සමයං සාකෙතෙ විහරාමි අඤ්ජනවනෙ මිගදායෙ. අථ ඛො ආවුසො, ජටිලගාහියා[1] භික්ඛුනී යෙනාහං තෙනුපසඞ්කමි. උප සඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො ආවුසො, ජටිලගාහියා භික්ඛුනී මං එතදවොච: "යායං භන්තෙ ආනන්ද සමාධි නචාභිනතො න චාපනතො න ච සසඞ්ඛාර නිග්ගය්හ වාරිතවතො"[2] විමුත්තත්තා ඨිතො, ඨිතත්තා සන්තුසිතො සන්තුසිතත්තා නො පරිතස්සති. අයං භන්තෙ ආනන්ද සමාධි කිංඵලො වුත්තො භගවතාති?

එවං වුත්තෙ අහං[3] ආවුසො ජටිලගාහියං භික්ඛුනිං එතදවොචං: යායං භගිනි සමාධි න චාභිනතො න චාපනතො, න සසඞ්ඛාරනිග්ගය්හ වාරිත-වතො, විමුත්තත්තා ඨිතො, ඨිතත්තාසන්තුසිතො, සන්තුසිතත්තා නො පරි-තස්සති. අයං භගිනි සමාධි අඤ්ඤාඵලො වුත්තො භගවතාති. එවං. සඤ්ඤීපි ඛො ආවුසො තද යතනං නො පටිසංවෙදෙති.

## 9. 1. 4. 7
## ලොකායතික බ්‍රාහ්මණ සුත්තං

**[සාවත්ථිනිදානං]**

අථ ඛො ද්වෙ ලොකායතිකා බ්‍රාහ්මණා යෙන භගවා තෙනුප-සඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ බ්‍රාහ්මණා භගවන්තං එතදවොචුං:

පූරණො භො ගොතම කස්සපො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙස-ඤාණදස්සනං[4] පටිජානාති "චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතන්ති." සො එවමාහ: "අහං අනන්තෙන ඤාණෙන අනන්තවන්තං[5] ලොකං ජානං පස්සං විහරාමී"ති.

1. ජටිලවාසකා, මජසං.
2. සසඞ්ඛාරනිග්ගය්හවාරිතගතො, මජසං.
3. සොහං, මජසං.
4. අපරිසෙසං ඤාණදස්සනං, මජසං.
5. අනන්තං - මජසං

තවද ඇවැත්නි, මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා "විඤ්ඤාණය අනන්තය" විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, මෙබඳු සංඥා ඇතියේත් එ ආයතනය නො දන්නේ ය.

තවද ඇවැත්නි, මහණ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා "කිසිත් නැතැ"යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, මෙ බඳු සංඥා ඇතියේත් ඒ ආයතනය නො දන්නේ ය.

ඇවැත්නි, මම එක් කලෙක සාකෙත නුවර අඤ්ජනවනයෙහි මිගදයෙහි වෙසෙමි. ඇවැත්නි, එකල ජටිලගාහ නුවර වැසි මෙහෙණ මා වෙත එළැඹුණු ය. එළැඹ මා සකසා වැඳ එකත්පස්ව සිටියා. ඇවැත්නි, එකත්පසෙක සිටි ජටිලගාහියා මෙහෙණ මට තෙල කීවුය: "වහන්ස, ආනන්දයෙනි, යම් මේ සමාධියෙක් (රාග විසින්) නැඟ නො සිටුනේ වේ ද, (ද්වෙෂ විසින්) බැස නො සිටුනේ වේ ද, සංස්කාරයෙන් (සප්‍රයොග-යෙන්) කෙලෙසුන් මැඩ වළහා සිටියේ නො වේ ද, විමුක්ත බැවින් පිහිටියේ වේ ද, සථිත බැවින් සන්තුෂ්ට වූයේ වේ ද, සන්තුෂ්ට බැවින් පරිත්‍රාසයට නො වැටේ ද, වහන්ස, ආනන්දය, මේ සමාධිය කිනම් ඵල ඇතියේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද දැ"යි?

ඇවැත්නි, මෙසේ කී කල්හි ජටිලගාහියා මෙහෙණට මම තෙල කීමි. "බුහුන, යම් මේ සමාධියෙක් (රාගවිසින්) පෙරට නතුයේ නො වේ ද (ද්වෙෂ වසයෙන්) බැස නොසිටුනේ වේ ද, සප්‍රයොගයෙන් කෙලෙසුන් නිගෙන වළහා සිටියේ නො වේ ද, විමුක්ත බැවින් සිටියේ වේ ද, සථිත බැවින් සන්තුෂ්ටවූයේ වේ ද, සන්තුෂ්ට බැවින් පරිත්‍රාසයට නො වැටේ ද, බුහුන මේ සමාධිය අර්හත්වය ඵල කොට ඇතැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. ඇවැත්නි, මෙ බඳු සංඥා ඇතියේ ද වනාහි ඒ ආයතනය නො දන්නේ ය"යි.

## 9. 1. 4. 7

## ලෝකායතික බ්‍රාහ්මණ සූත්‍රය

[සැවැත්නිදන යි]

එකල්හි ලෝකායතශාස්ත්‍රය හදරන බ්‍රාහ්මණ දෙදෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ඒ බ්‍රාහ්මණයෝ භාග්‍යවතුන්වහන්සේට තෙල සැළකළහ:

භවත් ගෞතමයන් වහන්ස, සර්වඥ සර්වදර්ශී පූරණකාශ්‍යප අපරිශෙෂ ඥානදර්ශනය පිළිණ කෙරෙයි: "යන්නාවූත් සිටුනාවූත් සුප්තවූත් නිදිවැරීමෙහි යෙදුණුවූත් මට හැමකල්හි නිරතුරු ව ඥානදර්ශනය එළැඹ සිටියේය"යි: හේ මෙසේ කියයි: "මම අනන්තඥානයෙන් අනන්තවත් ලෝකය දන්නෙම් දක්නෙම් වාස කරමි" කියා යි.

අයම්පි[1] භො ගොතම, නිගණ්ඨො නාතපුත්තො[2] සබ්බඤ්ඤූ සබ්බදස්සාවී අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති "චරතො ච මෙ තිට්ඨතො ච සුත්තස්ස ච ජාගරස්ස ච සතතං සමිතං ඤාණදස්සනං පච්චුපට්ඨිතන්ති". සො එවමාහ: "අහං අනන්තෙන[3] ඤාණෙන අනන්තවන්තං ලොකං ජානං පස්සං විහරාමීති. ඉමෙසං භො ගොතම, උභින්නං ඤාණවාදානං උභින්නං අඤ්ඤමඤ්ඤං විපච්චනීකවාදානං කො සච්චං ආහ කො මුසාති?

අලං බ්‍රාහ්මණා, තිට්ඨතෙතං "ඉමෙසං උභින්නං ඤාණවාදානං උභින්නං අඤ්ඤමඤ්ඤං විපච්චනීකවාදානං කො සච්චං ආහ කො මුසා"?ති. ධම්මං වො බ්‍රාහ්මණා, දෙසෙස්සාමි,[4] තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භොති බො තෙ බ්‍රාහ්මණා භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

සෙය්‍යථාපි බ්‍රාහ්මණා, චත්තාරො පුරිසා චතුද්දිසා ඨිතා පරමාය ගතියා ච ජවෙන ච සමන්නාගතා[5] පරමෙන ච පදවීතිහාරෙන. තෙ එවරූපෙන ජවෙන සමන්නාගතා අස්සු, සෙය්‍යථාපි නාම බ්‍රාහ්මණා, දළ්හධම්මො[6] ධනුග්ගහො සික්ඛිතො කතහත්ථො කතූපාසනො ලහුකෙන අසනෙන අප්පකසිරෙන තිරියං තාලච්ඡායං[7] අතිපාතෙය්‍ය, එවරූපෙන ච පදවීතිහාරෙන. සෙය්‍යථාපි නාම පුරත්ථිමා සමුද්දා පච්ඡිමො සමුද්දො. අථ පුරත්ථිමාය දිසාය ඨිතො පුරිසො එවං වදෙය්‍ය: "අහං ගමනෙන ලොකස්ස අන්තං පාපුණිස්සාමී"ති. සො අඤ්ඤත්‍රෙව අසිතපීතඛායිතසායිතා අඤ්ඤත්‍රෙව[8] උච්චාරපස්සාවකම්මා අඤ්ඤත්‍රෙව[8] නිද්දාකිලමථපටිවිනොදනා වස්සසතායුකො වස්සසතජීවී වස්සසතං ගන්ත්වා අප්පත්වාව ලොකස්ස අන්තං අන්තරා කාලං කරෙය්‍ය. අථ පච්ඡිමාය දිසාය ඨිතො පුරිසො එවං වදෙය්‍ය: -පෙ- අථ උත්තරාය දිසාය ඨිතො පුරිසො එවං වදෙය්‍ය: -පෙ- අථ දක්ඛිණාය දිසාය ඨිතො පුරිසො එවං වදෙය්‍ය: "අහං ගමනෙන ලොකස්ස අන්තං පාපුණිස්සාමීති. සො අඤ්ඤත්‍රෙව අසිතපීතඛායිතසායිතා අඤ්ඤත්‍රෙව[8] උච්චාරපස්සාවකම්මා අඤ්ඤත්‍රෙව[8] නිද්දාකිලමථපටිවිනොදනා වස්සසතායුකො වස්සසතජීවී වස්සසතං ගන්ත්වා අප්පත්වාව ලොකස්ස අන්තං අන්තරා කාලං කරෙය්‍ය. තං කිස්ස හෙතු: නාහං බ්‍රාහ්මණා, එවරූපාය සන්ධාවනිකාය ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමි. න චාහං බ්‍රාහ්මණා, අප්පත්වාව ලොකස්ස අන්තං දුක්ඛස්සන්තකිරියං වදාමීති.

---

1. අයම්පි හි -ස්‍යා,
2. නාටපුත්තො,-මජසං
3. අනන්තෙන - මජසං.
4. දෙසිස්සාමි - සිමු
5. පරමෙන ජවෙන ච සමන්නාගතා - මජසං.
6. දළ්හධම්මා - මජසං
7. තාලච්ඡාතිං - සී. ස්‍යා PTS.
8. අඤ්ඤත්‍ර - මජසං.

භවත් ගෞතමයන් වහන්ස, සර්වඥ සර්වදර්ශී වූ නිගණ්ඨ නාත පුත්‍ර ද අපරිශේෂ ඥානදර්ශනය පිළිණ කෙරෙයි: "යන්නා වූත් සිටුනා වූත් සුප්ත වූත් ජාගරණයෙහි යෙදුනාවූත් මට හැම කල්හි නිරතුරු ව ඥානදර්ශනය එළැඹ සිටියේ ය''යි. හේ මෙසේ කියයි: "මම අනන්තවත් ඥානයෙන් අනන්තවත් ලොකය දන්නෙම් දක්නෙම් වාස කරමි'' කියායි. භවත් ගෞතමයන් වහන්ස, ඥානවාද දෙකක් ඇති අන්‍යොන්‍ය ප්‍රත්‍යනීක වාද දෙකක් ඇති මොවුන්ගෙන් කවරෙක් සත්‍යය කියා ද? කවරෙක් මුසවා කියාදැ ?යි.

බ්‍රාහ්මණයෙනි, කම් නැති, ඥානවාද දෙකක් ඇති අන්‍යොන්‍ය විරුද්ධ වාද දෙකක් ඇති, මොවුන්ගෙන් කවරෙක් සත්‍යය කියාද? කවරෙක් මුසවා කියාදැ ?යි යන තෙල කරුණ තිබෙවා, 'බ්‍රාහ්මණයෙනි, තොපට දහම් දෙසන්නෙමි, එය අසවූ, මොනොවට මෙනෙහි කරවූ,දෙසන්නෙමි'යි. භවත්නි, එසේ යයි ඒ බ්‍රාහ්මණයෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක:

බ්‍රාහ්මණයෙනි, උත්තමගතියෙනුදු ජවයෙනුදු පරම පද විතිහාරයෙනුදු යුත් සතර පුරුෂ කෙනෙක් සිවුදික්හි යම්පරිදි සිටියාහු වෙත් ද,

බ්‍රාහ්මණයෙනි, ගත් දළදුනු ඇති (ඇදුරු කුලෙහි) උගත් සිප්සතර ඇති, කෘතහස්ත වූ දක්වූ සිප්සතර ඇති දුනුවායෙක් නො බර හීයෙන් නිදුකින් සතරඟුල් තල් සෙය යම්සේ සරස ඉක්මවන්නේ ද, ඔහු එබඳු ජවයෙන් සමන්වාගත වෙත්. පෙරදිග මුහුදින් පැළදිග මුහුද යම්බඳු වෙ නම්, ඉක්බිති පෙරදික්හි සිටි පුරුෂයෙක් මෙසේ කියයි. "මම පාගමනින් ලොකාන්තයට පැමිණෙමැ''යි. හේ වැළඳීම, පීම, කෑම හා රසවිඳුම හැර, මලමුකිස හැර නිද්‍රාක්ලමථ දුරලීම හැර වර්ෂශතායුෂ්ක වූයේ ශතවර්ෂජීවී වූයේ ශතවර්ෂයක් ගොස් ලොකාන්තයට නො පැමිණ ම අතර කළුරිය කරන්නේ ය. තව ද පැළදිග්හි සිටි පුරුෂ මෙ සේ කිය යි... තවද උතුරුදිග්හි සිටි පුරුෂ මෙසේ කියයි ... තව ද දකුණු දිග්හි සිටි පුරුෂ මෙසේ කියයි: "මම පා ගමනින් ලොකාන්තයට යෙමි''යි. හේ වැළඳීම පීම කෑම රසවිඳුම හැර මලමුකිස හැර නිද්‍රාක්ලමථ දුරලීම හැර වර්ෂශතායුෂ්ක වූයේ වර්ෂශතජීවී වූයේ සියවසක් ගමන් කොට ලොකාන්තයට නොපැමිණ ම අතුරෙහි කළුරිය කරන්නේ ය. ඒ කවර හෙයින යත්: බ්‍රාහ්මණයෙනි, මෙ බඳු වූ සන්ධාවනයෙකින් ලොකාන්තය දතයුතු යයි දැක්කයුතු යයි පැමිණිය යුතු යයි මම නො කියමි. බ්‍රාහ්මණයෙනි, ලොකාන්තයට නො පැමිණ ද දුඃඛයාගේ අන්තකරණය මම නො කියමි.

පඤ්චිමෙ බ්‍රාහ්මණා, කාමගුණා අරියස්ස විනයෙ ලොකොති වුච්චති, කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා. ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා ඉමෙ ඛො බ්‍රාහ්මණා, පඤ්චකාමගුණා අරියස්ස විනයෙ ලොකොති වුච්චති.

ඉධ බ්‍රාහ්මණා, භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති බ්‍රාහ්මණා, භික්ඛු ලොකස්ස අන්තං ආගම්ම ලොකස්ස අන්තෙ විහරති. තමඤ්ඤෙ එවමාහංසු "අයම්පි ලොකපරියාපන්නො, අනිස්සටො ලොකම්හා"ති. අහම්පි බ්‍රාහ්මණා, එවං වදාමි: "අයම්පි ලොකපරියාපන්නො, අයම්පි අනිස්සටො ලොකම්හා"ති.

පුනචපරං බ්‍රාහ්මණා, භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ-

පුනචපරං බ්‍රාහ්මණා, භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති බ්‍රාහ්මණා, භික්ඛු ලොකස්ස අන්තං ආගම්ම ලොකස්ස අන්තෙ විහරති, තමඤ්ඤෙ එවමාහංසු: "අයම්පි ලොකපරියාපන්නො, අයම්පි අනිස්සටො ලොකම්හා"ති. අහම්පි බ්‍රාහ්මණා එවං වදාමි: "අයම්පි ලොකපරියාපන්නො, අයම්පි අනිස්සටො ලොකම්හා"ති.

පුනචපරං බ්‍රාහ්මණා, භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති බ්‍රාහ්මණා, භික්ඛු ලොකස්ස අන්තං ආගම්ම ලොකස්ස අන්තෙ විහරති. තමඤ්ඤෙ එවමාහංසු:

"බ්‍රාහ්මණයෙනි, ආර්‍ය විනයෙහි මේ පස්කම් ගුණ ලොක'යි කියනු ලැබේ: කවර පසෙක යත්: ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප ඇති කාමොපසංහිත වූ රජනීය වූ චක්ෂුර්විඥෙය රූපය, ... ශ්‍රොතවිඥෙය ශබ්දය, ... ඝ්‍රාණවිඥෙය ගන්ධය, ... ජිහ්වා විඥෙය රසය, ... ඉෂ්ට, කාන්ත මනාප ප්‍රියරූප කාමොපසංහිත රජනීය කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යය යන මොහු යි.

බ්‍රාහ්මණයෙනි, ආර්‍ය විනයෙහි මේ පස් කම්ගුණ ලොකයයි කියනු ලැබේ.

බ්‍රාහ්මණයෙනි, මෙපස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව ම ... ප්‍රථමධ්‍යානයට එළැඹ වෙසෙයි. බ්‍රාහ්මණයෙනි, මේ මහණ ලොකයාගේ අන්තයට පැමිණ ලොකයාගේ අන්තයෙහි වාස කෙරේ ය යි කියනු ලැබේ. ඔහු ගෙන අන්‍යයෝ මෙසේ කියත්: "මෙ ද ලොකපර්‍යාපන්නය, මෙ ද ලොකයෙන් අනිඃසෘත ය'' යි. බ්‍රාහ්මණයෙනි, මම් ද මෙසේ කියමි: "මෙ ද ලොකයට ඇතුළත් වේ, මෙ ද ලොකයෙන් බැහැර නො කරන ලද යි.

තව ද බ්‍රාහ්මණයෙනි, මහණ විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් ... ද්විතිය ධ්‍යානයට එළැඹ වාස කරයි ... තෘතීය ධ්‍යානයට එළැඹ වාස කරයි ... චතුර්ථධ්‍යානයට එළැඹ වාස කරයි ...

බ්‍රාහ්මණයෙනි, තවද මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥ සමතික්‍රමණය කිරීමෙන් ප්‍රතිඝසංඥවන්ගේ අස්තඩගමයෙන් නානාත්වසංඥවන්ගේ අමනසිකාරයෙන් 'ආකාසය' අනන්ත'යි ආකාසානඤ්චායතනයට එළැඹ වාස කරයි. බ්‍රාහ්මණයෙනි, මේ මහණ ලොකයාගේ අන්තයට පැමිණ ලොකයාගේ අන්තයෙහි වාස කරන්නේ'යි කියනු ලැබේ. ඔහුගෙන අන්‍යයෝ මෙසේ කියත්: 'මෙ ද ලොකපර්‍යාපන්න ය, මෙ ද ලොකයෙන් බැහැර නො කරන ලදයි. බ්‍රාහ්මණයෙනි, මම ද මෙසේ කියමි: 'මෙ ද ලොකයට ඇතුළත් වේ, මෙ ද ලොකයෙන් අනිඃසෘතය කියා යි.

තව ද බ්‍රාහ්මණයෙනි, මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඤ්ඤාණය අනන්ත'යි විඤ්ඤාණඤ්චායතනයට එළඹ වාස කරයි. ... සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම 'කිසිත් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වාස කරයි ... සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වාස කරයි. බ්‍රාහ්මණයෙනි, මේ මහණ ලොකයාගේ අන්තයට පැමිණ ලොකයාගේ අන්තයෙහි වාසය කරනේ යයි කියනු ලැබේ. ඔහු ගෙන අන්‍යයෝ මෙසේ කියත්:

"අයම්පි ලොකපරියාපන්නො අයම්පි අනිස්සටො ලොකම්හා"ති. අහම්පි බ්‍රාහ්මණා, එවං වදාමි: "අයම්පි ලොකපරියාපන්නො, අයම්පි අනිස්සටො ලොකම්හා"ති.

පුනචපරං බ්‍රාහ්මණා, භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති බ්‍රාහ්මණා, භික්ඛු ලොකස්ස අන්තං ආගම්ම ලොකස්ස අන්තෙ විහරති. තිණ්ණො ලොකෙ විසත්තිකන්ති.

## 9. 1. 4. 8

## දෙවාසුරසඞ්ගාම සුත්තං

**[සාවත්ථිනිදානං]**

භූතපුබ්බං භික්ඛවෙ, දෙවාසුරසඞ්ගාමො සමුපබ්‍යූළ්හො අහොසි. තස්මිං ඛො පන භික්ඛවෙ, සඞ්ගාමෙ අසුරා ජිනිංසු දෙවා පරාජයිංසු.[1] පරාජිතා ච භික්ඛවෙ දෙවා අපයංසෙව[2] උත්තරෙන මුඛා[3] අභියංසු[4] අසුරා. අථ ඛො භික්ඛවෙ, දෙවානං එතදහොසි: 'අභියන්තෙව ඛො අසුරා, යන්නූන මයං දුතියම්පි අසුරෙහි[5] සඞ්ගාමෙය්‍යාමා'ති. දුතියම්පි ඛො භික්ඛවෙ, දෙවා අසුරෙහි සඞ්ගාමෙසුං දුතියම්පි ඛො භික්ඛවෙ, අසුරාව ජිනිංසු දෙවා පරාජියිංසු[1] පරාජිතා ච භික්ඛවෙ දෙවා භීතා අපයංසෙව උත්තරෙනමුඛා අභියංසු අසුරා:

අථ ඛො භික්ඛවෙ දෙවානං එතදහොසි: "අභියන්තෙව ඛො අසුරා, යන්නූන මයං තතියම්පි අසුරෙහි සඞ්ගාමෙය්‍යාමාති". තතියම්පි ඛො භික්ඛවෙ, දෙවා අසුරෙහි සඞ්ගාමෙසුං. තතියම්පි ඛො භික්ඛවෙ, අසුරාව ජිනිංසු දෙවා පරාජියිංසු. පරාජිතා ච භික්ඛවෙ, දෙවා භීතා දෙවපුරං යෙව පවිසිංසු.

දෙවපුර ගතානඤ්ච පන භික්ඛවෙ, දෙවානං එතදහොසි: "භිරුත්තානගතෙන ඛො දානි මයං එතරහි අත්තනා විහරාම. අකරණීයා අසුරෙහී"ති. අසුරානම්පි භික්ඛවෙ, එතදහොසි: "භීරුත්තානගතෙන ඛො දානි දෙවා එතරහි අත්තනා විහරන්ති. අකරණීයා අම්හෙහී"ති.

---

1. පරාජයිංසු-මජසං
2. අපයිංසුයෙව--මජසං
3. උත්තරෙනාභිමුඛා-මජසං
4. අභිනියිංසු-මජසං
5. අසුරෙ- සී;

''මේ ද ලොකපරියාපන්න ය, මේ ද ලොකයෙන් අතිඃසෘත ය.''යි බ්‍රාහ්මණයෙනි, මම ද මෙසේ කියමි: 'මේ ද ලොකපරියාපන්න ය, මේ ද ලොකයෙන් අතිඃසෘත''යි.

බ්‍රාහ්මණයෙනි, තව ද මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට එළැඹ වාස කරයි. ප්‍රඥායෙනුදු දැක ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. බ්‍රාහ්මණයෙනි, මේ මහණ ලොකයාගේ අන්තයට පැමිණ ලොකාන්තයෙහි වාස කරන්නේ යි ද පඤ්චස්කන්ධලොකයෙහි තෘෂ්ණාසඞ්ඛ්‍යාත විසත්තිකාව තරණය කෙළේ ය යි ද කියනු ලැබේ.

## 9. 1. 4. 8

## දේවාසුරසඞ්ගාම සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, යටගියදවස වූවක් කියමි: දෙවාසුර සංග්‍රාමයෙක් එළඹ සිටියේ විය. මහණෙනි, ඒ සඞ්ග්‍රාමයෙහි අසුරයෝ දිනූහ, දෙවියෝ පැරදුණහ. මහණෙනි, දෙවියෝ පැරදුණාහු උත්තරදිශාභිමුඛ වැ පලාගියාහු ම ය. අසුරයෝ ලුහුබැඳියහ. මහණෙනි, ඉක්බිති දෙවියනට මෙබඳු සිතෙක් විය: අසුරයෝ ලුහුබඳිත් මැ යි, අපි අසුරයන් හා දෙවනවටත් යුද කරමෝ නම යෙහෙකැ'යි. මහණෙනි, දෙවනවටදු දෙවියෝ අසුරයන් හා යුද වන්හ. මහණෙනි, දෙවනවටදු අසුරයෝ ම දිනූහ, දෙවියෝ පැරදුණහ. පැරදුණාහු ද දෙවියෝ බියපත්ව උත්තරාභිමුඛව පැන ගියහ. අසුරයෝ ලුහුබැඳියහ.

මහණෙනි, එකල්හි දෙවියනට මෙබඳු සිතෙක් විය: අසුරයෝ ලුහුබඳනාහු මැ යි, අපි තෙවනවටදු අසුරයන් හා යුද කරමෝ නම යෙහෙකැ'යි. මහණෙනි, තෙවනවටදු දෙවියෝ අසුරයන් හා සමග යුද වන්හ. මහණෙනි, තෙවනවටත් අසුරයෝ ම දිනූහ. දෙවියෝ පැරදුණහ. මහණෙනි, පැරදුණාහුද දෙවියෝ භීතව දෙවපුරයට ම වන්හ.

මහණෙනි, දෙවපුරයට ගිය දෙවියනට ද මෙබඳු සිත විය: 'භීරුත්‍රාණයට (භයනැති තැනට) ගිය සිතින් අපි දැන් වාසය කරම්හ. අසුරයන් විසින් අකරණීය යම්හ (කිසිත් නොකළයුත්තම්හ) යි. මහණෙනි, අසුරයනට ද මෙබඳු සිත විය: දැන් දෙවියෝ භීරුත්‍රාණයට ගිය සිතින් වාස කරත්. අප විසින් අකරණීය (කිසිවක් නොකළ යුත්තාහු) වෙති යි.

භූතපුබ්බං භික්ඛවෙ, දෙවාසුර සඞ්ගාමො සමුපබ්‍යුළ්හො අහොසි. තස්මිං ඛො පන භික්ඛවෙ, සඞ්ගාමෙ දෙවා ජිනිංසු. අසුරා පරාජියිංසු,[1] පරාජිතා ච භික්ඛවෙ අසුරා අපයංසෙව දක්ඛිණෙන මුඛා, අභියංසු දෙවා. අථ ඛො භික්ඛවෙ, අසුරානං එතදහොසි: අභියන්තෙව ඛො දෙවා යන්නූන මයං දුතියම්පි දෙවෙහි සඞ්ගාමෙය්‍යාමාති. දුතියම්පි ඛො භික්ඛවෙ, අසුරා දෙවෙහි සඞ්ගාමෙසුං. දුතියම්පි ඛො භික්ඛවෙ, දෙවා ච ජිනිංසු. අසුරා පරාජිංසු. පරාජිතා ච භික්ඛවෙ, අසුරා අපයංසෙව ච දක්ඛිණෙන මුඛා. අභියංසු දෙවා. අථ ඛො භික්ඛවෙ අසුරානං එතදහොසි: ''අභියන්තෙව ඛො දෙවා, යන්නූන මයං තතියම්පි දෙවෙහි සඞ්ගාමෙය්‍යාමාති. තතියම්පි ඛො භික්ඛවෙ, අසුරා දෙවෙහි සඞ්ගාමෙසුං. තතියම්පි ඛො භික්ඛවෙ, දෙවා ච ජිනිංසු අසුරා පරාජියිංසු. පරාජිතා ච භික්ඛවෙ, අසුරා භීතා අසුරපුරංයෙව පවිසිංසු. අසුරපුර ගතානඤ්ච පන භික්ඛවෙ, අසුරානං එතදහොසි: භීරුත්තානගතෙන ඛො දානි මයං එතරහි අත්තනා විහරාම. අකරණීයා දෙවෙහී''ති. දෙවානම්පි භික්ඛවෙ, එතදහොසි: ''භීරුත්තානගතෙන ඛො දානි අසුරා එතරහි අත්තනා විහරන්ති, අකරණීයා අම්හෙහී''ති.

එවමෙව ඛො භික්ඛවෙ, යස්මිං සමයෙ භික්ඛු විවිච්චෙව කාමෙහි-පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, තස්මිං භික්ඛවෙ, සමයෙ භික්ඛුස්ස එවං හොති: ''භීරුත්තානගතෙන ඛො දානාහං එතරහි අත්තනා විහරාමි, අකරණීයො මාරස්සා''ති.

මාරස්සපි භික්ඛවෙ, පාපිමතො එවං හොති: ''භීරුත්තානගතෙන ඛො දානි භික්ඛු එතරහි අත්තනා විහරති. අකරණීයො මය්හන්ති''.

යස්මිං භික්ඛවෙ සමයෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං-පෙ- තතියං ඣානං-පෙ චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති තස්මිං භික්ඛවෙ, සමයෙ භික්ඛුස්ස එවං හොති: ''භීරුත්තානගතෙන ඛො දානාහං එතරහි අත්තනා විහරාමි, අකරණීයෙ මාරස්සා''ති. මාරස්සාපි භික්ඛවෙ, පාපිමතො එවං හොති: ''භීරුත්තානගතෙන ඛො දානි භික්ඛු එතරහි අත්තනා විහරති, අකරණීයො මය්හන්ති''.

1. පරාජයිංසු – මජසං

මහණෙනි, පෙර වූවක් කියමි: දෙවාසුර සංග්‍රාමයෙක් එළැඹ සිටියේ ය, මහණෙනි, ඒ සඞ්ග්‍රාමයෙහි දෙවියෝ දිනූහ, අසුරයෝ පැරදුණහ. මහණෙනි, පැරදුනු අසුරයෝ දක්ෂිණදිශාභිමුඛ වූවාහු පලාගියාහු ම ය. දෙවියෝ ලුහුබැඳියහ; මහණෙනි, එකල්හි අසුරයනට මෙලෙ සිත විය: "දෙවියෝ ලුහුබඳිත්මැ"යි. "අපි දෙවියන් හා සමඟ දෙවනවටද යුදවදනමෝ නම් යෙහෙකැ"යි. මහණෙනි, අසුරයෝ දෙවනවටත් දෙවියන් හා යුද වන්හ. මහණෙනි, දෙවනවටත් දෙවියෝ ම දිනූහ, අසුරයෝ පැරදුනහ. මහණෙනි, පැරදුණ වූ අසුරයෝ දක්ෂිණාභිමුඛ ව පැන ගියාහු ම ය. දෙවියෝ ලුහුබැඳියහ. මහණෙනි, එකල්හි අසුරයනට මෙලෙ සිත විය: "දෙවියෝ ලුහුබඳිත්මැ යි, අපි තෙවනවටද දෙවියන් හා සමඟ යුද වදිමුනම් යෙහෙකැ" යි. මහණෙනි, තෙවනවටත් අසුරයෝ දෙවියන් හා යුදවන්හ. මහණෙනි, තෙවනවටත් දෙවියෝ දිනූහ, අසුරයෝ පැරදුණහ. මහණෙනි, අසුරයෝ පැරදුණාහු ම බියපත් ව අසුරපුරයට ම වන්හ. මහණෙනි, අසුරපුරයට ගියාවූ අසුරයනට මෙලෙ සිත විය: දැන් වනාහි අපි භීරුත්‍රාණගත වූ සිතින් වාසය කරමු. දෙවියන් විසින් අකරණීය යම්හ"යි. මහණෙනි, දෙවියනට මෙලෙ සිත විය: මෙකල්හි අසුරයෝ භීරුත්‍රාණගත සිතින් වාසය කරත්. අප විසින් අකරණීය වෙත්"යි.

මහණෙනි, එ පරිදි ම යම් සමයෙක්හි මහණ කාමයන්ගෙන් වෙන්ව ම ... ප්‍රථමධ්‍යානයට එළැඹ වාස කරයි ද, මහණෙනි, එකල්හි මහණහට මෙබඳු සිතෙක් වෙයි: මෙකල්හි මම භීරුත්‍රාණගතචිත්තයෙන් වාසය කරමි. මාරයා විසින් අකරණීය වෙමි'යි.

මහණෙනි, පාපී මාරයාහට ද මෙල සිත වෙයි, දැන් මෙ සමයෙහි මහණ භීරුත්‍රාණගත චිත්තයෙන් වාස කරතේ ය, මා විසින් අකරණීය වෙ යි.

මහණෙනි, යම් සමයෙක්හි මහණ විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන් ද්විතීය ධ්‍යානයට ... තෘතීය ධ්‍යානයට ... චතුර්ථ ධ්‍යානයට ... එළැඹ වෙසෙයි ද, මහණෙනි, එසමයෙහි මහණහට මෙබඳු සිතෙක් වෙයි: දැන් මෙසෙමෙහි මම භීරුත්‍රාණගත චිත්තයෙන් වාස කරමි. මාරයා විසින් අකරණීය වෙමි"යි. මහණෙනි, මාරහට ද මෙබඳු සිතෙක් වෙයි: දැන් මෙ සෙමෙහි මහණ භීරුත්‍රාණගත චිත්තයෙන් වාස කරයි. මා විසින් අකරණීය වෙ යි.

යස්මිං භික්ඛවෙ සමයෙ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති. ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො.

යස්මිං භික්ඛවෙ, සමයෙ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. -පෙ-සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිත නිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො, තිණ්ණො ලොකෙ විසත්තිකන්ති.

## 9. 1. 4. 9

## ආරඤ්ඤකනාගොපම සුත්තං

**[සාවත්ථිනිදානං]**

යස්මිං භික්ඛවෙ සමයෙ ආරඤ්ඤකස්ස නාගස්ස ගොචරපසුතස්ස හත්ථීපි හත්ථිනියොපි හත්ථිකලභාපි හත්ථිච්ඡාපාපි පුරතො ගන්ත්වා තිණග්ගානි ඡින්දන්ති, තෙන භික්ඛවෙ, ආරඤ්ඤකො නාගො අට්ටීයති හරායති ජිගුච්ඡති. යස්මිං භික්ඛවෙ, සමයෙ ආරඤ්ඤකස්ස නාගස්ස ගොචරපසුතස්ස හත්ථීපි හත්ථිනියොපි හත්ථිකලභාපි හත්ථිච්ඡාපාපි ඔභග්ගොභග්ගං සාඛාභඞ්ගං ඛාදන්ති. තෙන භික්ඛවෙ, ආරඤ්ඤකො නාගො අට්ටීයති හරායති ජිගුච්ඡති.

යස්මිං භික්ඛවෙ, සමයෙ ආරඤ්ඤකස්ස නාගස්ස ඔගාහං ඔතිණ්ණස්ස හත්ථීපි හත්ථිනියොපි හත්ථිකලභාපි හත්ථිච්ඡාපාපි පුරතො පුරතො ගන්ත්වා සොණ්ඩාය උදකං ආලොලෙන්ති. තෙන භික්ඛවෙ, ආරඤ්ඤකො නාගො අට්ටීයති හරායති ජිගුච්ඡති.

යස්මිං භික්ඛවෙ, සමයෙ ආරඤ්ඤකස්ස නාගස්ස ඔගාහං ඔතිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති, තෙන භික්ඛවෙ, ආරඤ්ඤකො නාගො අට්ටීයති හරායති ජිගුච්ඡති.

මහණෙනි, යම් කලෙක මහණ සර්වථායෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමයෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තගමයෙන් නානාත්වසංඥාවන්ගේ අමනසිකාරයෙන් "ආකාශය අනන්තය"යි ආකාසානඤ්චායතනයට එළැඹ වාස කරයි, මහණෙනි, මෙ මහණ මරහු අන්ධකෙළේ යි ද මාරචක්ෂුස නිරවශෙෂ කොට වනසා පාපිමත්හුගේ අදර්ශනයට ගියේයි ද කියනු ලැබේ.

මහණෙනි, යම් සමයෙක්හි මහණ සර්වථායෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඤ්ඤාණය අනන්ත 'යි විඤ්ඤාණඤ්චායතනයට එළැඹ වාස කරයි .. සර්වථායෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වාස කරයි ද ... සර්වථායෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වාස කරයි ... සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට එළැඹ වාස කරයි, ප්‍රඥයෙනුදු දැක ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. මහණෙනි, මේ මහණ මාරයා අන්ධ කෙළේ ය යි ද මාරචක්ෂුස නිරවශෙෂ කොට නසා පාපිමත්හුගේ අදර්ශනයට ගියේ ලොකයෙහි විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කෙළේ යයි ද කියනු ලැබේ යි.

## 9. 1. 4. 9

## ආරඤ්ඤකනාගොපම සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, යම් කලෙක වනවැසි ගොදුරු සෙවුමට යන ඇත්රජහුගේ පෙරට පෙරට ව ගොස් මහඇත්හු ද ඇතිනියෝ ද නහඹු ඇත්හු ද ඇත්පොව්වෝ ද තණඅග් සිඳිති, මහණෙනි, එයින් වනවැසි ඇත්රජ පෙළෙයි. ලජ්ජිත වෙයි, ජුගුප්සා කෙරෙයි. මහණෙනි, යම් කලෙක්හි ගොදුරු සෙවුමට යන ඒ වනවැසි ඇත්රජහු විසින් නතු-නතු කොට තැබූ අතුකඩ මහ ඇත්හු ද ඇතිනියෝ ද නහඹු ඇත්තු ද ඇත්-පොව්වෝ ද කති, මහණෙනි, එයින් වනවැසි ඇත්රජ පෙළෙ යි. ලජ්ජිත වෙයි, ජුගුප්සා කෙරෙයි.

මහණෙනි, යම් කලෙක පැන්තොටට බට වනවැසි ඇත්රජහු පෙරට පෙරට ව ගොස් මහඇත්හු ද ඇතිනියෝ ද නහඹු ඇත්හු ද ඇත්පොව්වෝ ද සොඬින් දිය අළලති, මහණෙනි, එයින් වනවැසි ඇත්රජ පෙළෙ යි, ලජ්ජිත වෙයි, ජුගුප්සා කෙරෙයි.

මහණෙනි, යම් කලෙක පැන්තොටට බට වනවැසි ඇත්රජුගේ සිරුර ඇතින්නෝ ගටා යෙත් ද, මහණෙනි, එයින් වනවැසි ඇත්රජ පෙළෙයි, ලජ්ජිත වෙයි, ජුගුප්සා කෙරෙයි.

තස්මිං භික්ඛවෙ, සමයෙ ආරඤ්ඤකස්ස නාගස්ස එවං හොති: "අහං ඛො එතරහි ආකිණ්ණො විහරාමි, හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි. ඡින්නග්ගානි චෙව තිණානි ඛාදාමි. ඔභග්ගොභග්ගඤ්ච මෙ සාඛාභඞ්ගං ඛාදන්ති. ආවිලානි චෙව පානීයානි පිවාමි ඔගාහං ච මෙ ඔතිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති යන්නූනාහං එකො ගණස්මා වූපකට්ඨො විහරෙය්‍යන්ති."

සො අපරෙන සමයෙන එකො ගණස්මා වූපකට්ඨො විහරති අච්ඡින්නග්ගානිචෙව තිණානි ඛාදති. ඔභග්ගොභග්ගඤ්චස්ස සාඛාභඞ්ගං න ඛාදන්ති. අනාවිලානි ච පානීයානි පිවති. ඔගාහඤ්චස්ස ඔතිණ්ණස්ස න හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති. තස්මිං භික්ඛවෙ, සමයෙ ආරඤ්ඤකස්ස නාගස්ස එවං හොති:

"අහං ඛො පුබ්බෙ ආකිණ්ණො විහාසිං හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි, ඡින්නග්ගානි චෙව තිණානි ඛාදිං, ඔභග්ගොභග්ගඤ්ච මෙ සාඛාභඞ්ගං ඛාදිංසු. ආවිලානි ච පානීයානි ආපායිං, ඔගාහඤ්ච මෙ ඔතිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො අගමංසු. සොහං එතරහි එකො ගණස්මා වූපකට්ඨො විහරාමි, අච්ඡින්නග්ගානි චෙව තිණානි ඛාදමි, ඔභග්ගොභග්ගඤ්ච මෙ සාඛාභඞ්ගං න ඛාදන්ති අනාවිලානි ච පානීයානි පිවාමි, ඔගාහඤ්ච ඔතිණ්ණස්ස න හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති." සො සොණ්ඩාය සාඛාභඞ්ගං භඤ්ජිත්වා සාඛාභඞ්ගෙන කායං පරිමද්දිත්වා අත්තමනො[1] කණ්ඩුං සංහනති.'

එවමෙව ඛො භික්ඛවෙ, යස්මිං සමයෙ භික්ඛු ආකිණ්ණො විහරති භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රඤ්ඤා රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි, තස්මිං සමයෙ භික්ඛුස්ස එවං හොති: අහං ඛො එතරහි ආකිණ්ණො විහරාමි, භික්ඛූහි භික්ඛුනීහි උපාසකෙහි උපාසිකාහි රඤ්ඤා රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි. යන්නූනාහං එකො ගණස්මා වූපකට්ඨො විහරෙය්‍යන්ති. සො විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

1 පරිමද්දිත්වා අත්තමනො සොණ්ඩං සංහරති - මජ්ඣසං

මහණෙනි, එකල වනවැසි ඇත්රජහට මෙවන් සිතෙක් වෙයි: ''මෙ සමාහි මම මහ ඇතුන් විසිනුදු ඇතින්නන් විසිනුදු නාහඹු ඇතුන් විසිනුදු ඇත්පොව්වන් විසිනුදු මුසුයෙම් වෙසෙමි. සුන්අග් ඇති තණුදු කමි. ම විසින් නතු-නතු කොට තැබූ අතුකඩදු කති. කැලැත් දිය ද බොමි. පැන්තොටට බට මාගේ සිරුර ගටමින් ඇතින්නෝ යෙති. මම ගණයාගෙන් එකලා වූයෙම් දුරු වූයෙම් වෙසෙම් නම් යෙහෙකැ''යි.

ඉක් පසු කල්හි එකලා වූයේ ඇතගණයා කෙරෙන් වෙන් වූයේ වෙසෙයි. නො සුන් අග් ඇති තණුදු කයි. ඔහු විසින් නතු නතු කොට තැබූ අතුකඩදු නො කති. නො කැලැත් පැනුදු බොයි. පැන්තොටට බට ඔහුගේ සිරුර ඇතින්නෝ ගටා නො යෙත්. මහණෙනි, එ සමාහි වනවැසි ඇත්රජුට මෙ බඳු සිතෙක් වෙයි:

''මම වනාහි පෙර මහ ඇතුන් විසිනුදු ඇතින්නන් විසිනුදු නාහඹු ඇතුන් විසිනුදු ඇත්පොව්වන් විසිනුදු මුසුයෙම් විසීමි. සුන්අග් ඇති තණුදු කැයෙමි. මවිසින් නතු නතු කොට තැබූ අතුකඩදු කෑ හ. කැලැත් පැනුදු පිමි. පැන්තොට වන් මාගේ සිරුර ඇතින්නෝ ගටමින් ගියහ. ඒ මම එකලා වූයෙම් ගණයා කෙරෙන් වෙන් වූයෙම් වෙසෙමි. නො සුන් අක් තණුදු කමි. මා විසින් නතු නතු කොට තැබූ අතුකඩ ද (ඔහු) නො කත්. නො කැලැත් පැනුදු බොමි. ඇතින්නෝ තොට වන් මා සිරුර ද නො ගටමින් යෙති.'' ඉක් සොඬින් අතුකඩක් බිඳ බුන් අතුකඩින් කය පිරිමැද තුටු සිත් ඇත්තේ කැසිලි නසයි.

මහණෙනි, එ සෙයින් ම යම් කලෙක්හි මහණ, මහණුන් විසින් මෙහෙණන් විසින් උවසුවන් විසින් උවැසියන් විසින් රජුන් විසින් රජමහ ඇමැතියන් විසින් තොටුවන් විසින් තොටුසව්වන් විසින් නො මුසු වූයේ වෙසේ ද, මහණෙනි, එසමයෙහි මහණ හට මෙ බඳු සිතෙක් වෙයි: මම වනාහි මෙ සමාහි මහණුන් විසින් මෙහෙණන් විසින් උවසුවන් විසින් උවැසියන් විසින් රජුන් විසින් රජමහ ඇමතියන් විසින් තොටුවන් විසින් තොටු සව්වන් විසින් මුසුයෙම් වෙසෙමි. මම එකලා වූයෙම් ගණයා කෙරෙන් වෙන් වූයෙම් වෙසෙම් නම් මනා''යි. ඉක් වනය, රුක්මුල ය, පර්වත ය, කඳුරු ය, ගිරිගුහා ය, සොහොන ය, වනපෙත ය, අභ්‍යවකාශය, පිදුරුරැස ය යන විවික්තශයනාසන බෙජෙයි. ඉක් අරනට ගියේ වේවයි, රුක්මුලට ගියේ වේවයි, හිස්ගෙට ගියේ වේවයි පළක් බැඳ සිරුර ඉදි වැ තබා ගෙන සිහි පෙරට කොට එළවා හිඳියි.

සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති, බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී, බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථීනමිද්ධා චිත්තං පරිසොධෙති, උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති, විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො අත්තමනො කණ්ඩුං සංහනති.[1] විතක්කවිචාරානං වූපසමා දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො අත්තමනො කණ්ඩුං සංහනති.

සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති, ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, සො අත්තමනො කණ්ඩුං සංහනති. සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති, විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති, සො අත්තමනො කණ්ඩුං සංහනති, සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, -පෙ- සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. සො අත්තමනො කණ්ඩුං සංහනතීති.

1. සොණ්ඩං සංහරති - මජ්ඣං. කණ්ඩුං සංහනති- ස්‍යා

හේ උපාදනස්කන්ධලොකයෙහි අභිධ්‍යා දුරැර පහ වූ අභිධ්‍යා ඇති සිතින් වෙසෙයි. අභිධ්‍යායෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද සඞ්ඛ්‍යාත ප්‍රකෂ්දෙෂය දුරැර ව්‍යාපාද රහිත සිත් ඇතියේ සර්වප්‍රාණභූතයන් කෙරෙහි හිතානුකම්පා ඇතියේ වෙසෙයි, ව්‍යාපාදප්‍රදෙෂයෙන් සිත පිරිසිදු කෙරෙයි.

ථිනමිද්ධය දුරැර පහ වූ ථිනමිද්ධ ඇතියේ ආලොකසංඥ ඇතියේ සිහි ඇතියේ මනා නුවණ ඇතියේ වෙසෙයි. ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය දුරැර නො වුහුටු සිතැතියේ අධ්‍යාත්මයෙහි සන්හුන් සිතැතියේ වෙසෙයි, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිච්ඡා දුරැර තරණය කළ විචිකිච්ඡා ඇතියේ කුසල්දහම් හි කථඞ්කථම්භාව (කෙසේද කෙසේද යන සැක) නැතියේ වෙසෙයි, විචිකිච්ඡායෙන් සිත පිරිසිදු කෙරෙයි.

හේ චිත්තොපක්ලෙශ වූ ප්‍රඥව දුර්වල කරන මේ පඤ්චනීවරණයන් දුරැර කාමයන්ගෙන් වෙන් වැ ම... ප්‍රථමධ්‍යානයට එළැඹ වෙසෙයි. හේ තුටුසිතැතියේ (ක්ලෙශ) කණ්ඩූති නසයි. විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන් ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට එළැඹ වෙසෙයි, හේ තුටුසිතැතියේ ක්ලෙශකණ්ඩූති නසයි.

සර්වථායෙන් රූපසංඥාවන්ගේ ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තගමයෙන් නානාත්වසංඥාවන්ගේ අමනසිකාරයෙන් ''ආකාශය අනන්තය''යි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙයි. තුටුසිතැති හේ ක්ලෙශකණ්ඩූති නසයි. සර්වථායෙන් ආකාසානඤ්චායතනය ඉක්මැ ''විඥානය අනන්තය''යි විඤ්ඤාණඤ්චායතනයට එළැඹ වෙසෙයි. හේ තුටු සිතැත්තේ කෙලෙස් කැසිලි නසයි. සර්වථායෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ ''කිසිවක් නැතැ''යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වෙසෙයි. සර්වථායෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසෙයි ... සර්වථායෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මැ සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වෙසෙයි. ප්‍රඥායෙනුදු දැක ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. හේ තුටු සිතැතියේ කෙලෙස් කැසිලි නසයි.

## 9. 1. 4. 10

## තපුස්සගහපති සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා මලතෙසු[1] විහරති උරුවෙලකප්පං නාම මලතානං[2] නිගමො. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය උරුවෙලකප්පං පිණ්ඩාය පාවිසි. උරුවෙලකප්පෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. 'ඉධෙව තාව ත්වං ආනන්ද හොහි, යාවාහං මහාවනං අජ්ඣොගාහාමි දිවාවිහාරායා'ති එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහාවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො තපුස්සො ගහපති යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො තපුස්සො ගහපති ආයස්මන්තං ආනන්දං එතදවොච:

මයං භන්තෙ ආනන්ද, ගිහී කාමභොගී කාමාරාමා කාමරතා කාමසම්මුදිතා. තෙසං නො භන්තෙ, අම්හාකං ගිහීනං කාමභොගීනං කාමාරාමානං කාමරතානං කාමසම්මුදිතානං පපාතො විය ඛායති. යදිදං නෙක්ඛම්මං. සුතං මෙතං භන්තෙ, ඉමස්මිං ධම්මවිනයෙ දහරානං දහරානං භික්ඛූනං නෙක්ඛම්මෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති. එතං සන්තන්ති පස්සතං, නයිදං භන්තෙ ඉමස්මිං ධම්මවිනයෙ භික්ඛූනං බහුනා ජනෙන විසභාගො යදිදං නෙක්ඛම්මන්ති.

අත්ථි ඛො එතං ගහපති, කථාපාභතං භගවන්තං දස්සනාය, ආයාම ගහපති, යෙන භගවා තෙනුපසංකමිස්සාම, උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙස්සාම. යථා නො භගවා බ්‍යාකරිස්සති තථා නං ධාරෙස්සාමාති, එවං භන්තෙති ඛො තපුස්සො ගහපති ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. අථ ඛො ආයස්මා ආනන්දො තපුස්සෙන ගහපතිනා සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- භගවන්තං එතදවොච:

---

1. මල්ලෙසු-මජසං, මල්ලකෙසු-සතං.
2. මල්ලානං - මජසං, මල්ලකානං-සතං

## 9. 1. 4. 10
## තපුස්සගහපති සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මල්ල ජනපදයෙහි උරුවෙලකප්ප නම් මල්ලයන්ගේ නියම්-ගම්හි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පූර්වාහ්න යෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන උරුවෙලකප්පයට පිඩු පිණිස වන්සේක. උරුවෙලකප්පයෙහි පිඩු සිඟා හැසිර පසුබතෙහි පිඩුවායෙන් වැළැකුණාහු ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූ සේක: "ආනන්දය, මම දිවාවිහාර පිණිස මහාවනයට යම්තාක් වදනෙම් නම් තෙපි ඒ තාක් මෙහි ම රඳව"යි. වහන්ස, එසේ ය යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් හට පිළිවදන් ඇස්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහවනයට වැද එක්තරා රුක් මුලෙක දිවා විහරණ සඳහා වැඩ හුන් සේක.

ඉක්බිති තපුස්ස ගෘහපති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ යම් තෙනෙක්හි ද එහි එළැඹියේ ය. එළැඹ ආයුෂ්මත් අනඳ තෙරණුවන් වැඳ එකත්පස් ව හින. එකත්පස් ව හුන් තපුස්ස ගෘහපති ආයුෂ්මත් අනඳතෙරුන් හට මෙල කී ය:

වහන්ස, ආනන්දයෙනි, ගෘහසථ වූ අපි කම්සුව විඳිනාහු කාමයෙහි ඇලුණාහු කාමයෙහි වෙසෙසින් ඇලුණාහු කාමයෙන් තුස්නාහු වම්හ. හිමියෙනි, කාමභොගී වූ කාමාරාම වූ කාමරත වූ කාමසම්මුදිත වූ ගිහිගෙයි වසන ඒ අපට යම් මේ (ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත) නෛෂ්ක්‍රම්‍යයෙක් වේ නම් එය ප්‍රපාතයක් මෙන් වැටහෙයි. වහන්ස, මේ ධර්මවිනයෙහි තෙල නෛෂ්ක්‍රම්‍යය ශාන්‍තය යි දක්නා වූ තරුණ තරුණ පැවිද්දන්ගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි (අරමුණු වසයෙන්) නො බැස ගනියි. (එ අරමුණු කොට) පහදියි. (එහි ම) පිහිටයි. (සතුරු දහමුන්ගෙන් ද) මිදෙයි යන තෙල කරුණ මා විසින් අසනලද. වහන්ස, මේ ධර්මවිනයෙහි මහණුන්ගේ යම් මේ නෛෂ්ක්‍රම්‍යයෙක් වේ නම් එය බොහෝදෙන සමග සභාග නොවන්නේයි.

ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ දක්ම පිණිස තෙල කථා ප්‍රාභෘතයෙක් (කථාමූලයෙක්) වේ යි. ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද, එහි එළැඹෙමු. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හට මෙ කරුණ සැල කරමු. භාග්‍යවතුන් වහන්සේ යම් සෙයෙකින් අපට පවසන සේක් නම් එසෙයින් එ ධරම්හ යි. එසේ ය වහන්සැයි තපුස්ස ගෘහපති ආයුෂ්මත් ආනන්ද තෙරණුවනට පිළිවදන් ඇස්වී ය. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ තපුස්ස ගැහැවිහු සමඟ භාග්‍යවතුන් වහන්සේ යම් තෙනෙක වූහු නම් එතනට එළැඹියහ. එළැඹ... භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ:

අයං භන්තෙ, තපුස්සො ගහපති එවමාහ: මයං භන්තෙ ආනන්ද ගිහී කාමභොගී කාමාරාමා කාමරතා කාමසම්මුදිතා. තෙසං නො භන්තෙ, අම්හාකං ගිහීනං කාමභොගීනං කාමාරාමානං කාමරතානං කාමසම්මුදිතානං. පපාතො විය ඛායති යදිදං නෙක්ඛම්මං. සුතං මෙතං භන්තෙ, ඉමස්මිං ධම්මවිනයෙ දහරානං දහරානං භික්ඛූනං නෙක්ඛම්මෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති එතං සන්තන්ති පස්සතං[1] තයිදං භන්තෙ, ඉමස්මිං ධම්මවිනයෙ භික්ඛූනං බහුනා ජනෙන විසභාගො යදිදං නෙක්ඛම්මන්ති.

එවමෙතං ආනන්ද, එවමෙතං ආනන්ද, මය්හම්පි ඛො ආනන්ද, පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: 'සාධු නෙක්ඛම්මං, සාධු පවිවෙකො'ති. තස්ස මය්හං ආනන්ද නෙක්ඛම්මෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති, එතං සන්තන්ති පස්සතො, තස්ස මය්හං ආනන්ද, එතදහොසි: කො නුඛො හෙතු, කො පච්චයො යෙන මෙ නෙක්ඛම්මෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති, එතං සන්තන්ති පස්සතො. තස්ස මය්හං ආනන්ද, එතදහොසි: කාමෙසු ඛො මෙ ආදීනවො අදිට්ඨො, සො ච මෙ අබහුලීකතො, නෙක්ඛම්මෙ ආනිසංසො අනධිගතො, සො ච මෙ අනාසෙවිතො. තස්මා නෙක්ඛම්මෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති එතං සන්තන්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'සචෙ ඛො අහං කාමෙසු ආදීනවං දිස්වා තං බහුලීකරෙය්‍යං, නෙක්ඛම්මෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං, ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ නෙක්ඛම්මෙ චිත්තං පක්ඛන්දෙය්‍ය පසීදෙය්‍ය සන්තිට්ඨෙය්‍ය විමුච්චෙය්‍ය එතං සන්තන්ති පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන කාමෙසු ආදීනවං දිස්වා තං බහුලමකාසිං, නෙක්ඛම්මෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං, තස්ස මය්හං ආනන්ද, නෙක්ඛම්මෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති, 'එතං සන්තන්ති' පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආනන්ද, ඉමිනා විහාරෙන විහරතො කාමසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො. සෙය්‍යථාපි ආනන්ද, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය, එවමෙවස්ස මෙ කාමසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස මෙ හොති ආබාධො.

1. පස්සතො-සීමු, මජසං

වහන්ස, මේ තපුස්ස ගැහැවි මෙසේ කියයි: "වහන්ස ආනන්දයෙනි, අපි කාමභෝගී, කාමාරාම, කාමරත, කාමසම්මුදිත වූ ගිහියම්හ. වහන්ස, කාමභෝගී, කාමාරාම, කාමරත, කාමසම්මුදිත ගිහි වූ ඒ අපට මේ නෛෂ්ක්‍රම්‍යය (පැවිද්ද) ප්‍රපාතයක් මෙන් වැටහෙයි. මේ ධර්මවිනයෙහි තෙල (නෛෂ්ක්‍රම්‍යය) ශාන්තය යි දක්නා වූ තරුණ තරුණ පැවිද්දන්ගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි බැස ගනියි, පහදියි, සිටියි, (ඒ අරමුණුකොට සතුරු දහමුන්ගෙන් ද) මිදෙයි යන තෙල පුවත මා විසින් අසන ලද්දේ ය. වහන්ස, මේ ධර්මවිනයෙහි මහණුන්ගේ යම් මේ නෛෂ්ක්‍රම්‍යයෙක් වේ නම් ඒ මේ කරුණ බොහෝ දෙනා සමඟ අසදෘශ ය"යි.

ආනන්දය, තෙල කරුණ එසේ ම ය. ආනන්දය, තෙල කරුණ එසේ මැ යි. සම්බෝධියෙන් පෙර ම අභිසම්බුද්ධ නො වූ බෝධිසත්ත්ව වූ ම මට ද නෛෂ්ක්‍රම්‍යය මැනැවි, ප්‍රවිවේකය මැනැවි යන තෙල සිත වී ය. තෙල නෛෂ්ක්‍රම්‍යය ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත නෛෂ්ක්‍රම්‍යය කෙරෙහි නො පනියි, නො පහදියි, නො පිහිටයි, (ඒ අරමුණු කොට කෙලෙසුන්ගෙන්) නො මිදේ. ආනන්දය, ඒ මට තෙල සිත විය: "තෙල නෛෂ්ක්‍රම්‍යය ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම් හෙයෙකින් නෛෂ්ක්‍රම්‍යයෙහි නො පනී ද, නො පහදී ද, නො පිහිටා ද, (ඒ අරමුණු කොට කෙලෙසුන් කෙරෙන්) නො මිදේ ද, එයට හේතු කවර ප්‍රත්‍යය කවරැ"යි. ආනන්දය, ඒ මට තෙල සිත වී ය.: "මා විසින් කාමයන්හි ආදීනව නො දක්නා ලද ම ය. හෙ ද මා විසින් අබහුලීකෘත ය, නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් අවබෝධ නො කරන ලද, හෙ ද මා විසින් ආදරයෙන් සෙවන නො කරන ලද, එහෙයින් තෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි නො බැස ගනියි. නො පහදියි, නො පිහිටයි, (කෙලෙසුන් ගෙන්) නො මිදෙයි".

ආනන්දය, ඒ මට තෙල සිත වි ය: "ඉදින් මම කාමයන්හි ආදීනව දැක එය බහුල කරනෙම් නම් නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ලැබ එය අවබෝධ කරනෙම් නම් තෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි යම් හෙයෙකින් බැසගන්නේ ය, පහදින්නේ ය, පිහිටන්නේ ය, (කෙලෙසුන් කෙරෙන්) මිදෙන්නේ ය යන තෙල කරුණ ඇත්ම ය.

ආනන්දය, ඒ මම පසුකාලයෙහි කාමයන්හි ආදීනව දැක එය බහුල කෙළෙමි. නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් අවබෝධ කොට එය ආසේවන කෙළෙමි. තෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත නෛෂ්ක්‍රම්‍යයෙහි පනියි, පහදියි, පිහිටයි, (ඒ අරමුණුකොට කෙලෙසුන් කෙරෙන්) මිදෙයි.

ආනන්දය, ඒ මම පසුකාලයෙහි කාමයන්ගෙන් වෙන් ව ම... ප්‍රථම ධ්‍යානයට එළැඹ වෙසෙමි. ආනන්දය, මේ විහරණයෙන් වෙසෙන ඒ මට කාමසහගත සංඥමනස්කාරයෝ (මනොද්වාරයෙහි) හැසිරෙත්. ඒ මට ආබාධ වෙයි. ආනන්දය, යම් සේ සුව ඇතියහට හුදු ආබාධ පිණිසම දුක් උපදනේ ද, එපරිද්දෙන් ම ඒ මට කාමසහගතසංඥමනස්කාරයෝ හැසිරෙත්. ඒ මට ආබාධ වෙයි.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: ''යන්නූනාහං විතක්කවිචාරානං වූපසමා–පෙ–දුතියං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති'' තස්ස මය්හං ආනන්ද, අවිතක්කෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති ''එතං සන්තන්ති'' පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: ''කො නු ඛො හෙතු, කො පච්චයො යෙන මෙ අවිතක්කෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති ''එතං සන්තන්ති'' පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: ''විතක්කෙසු ඛො මෙ ආදීනවො අදිට්ඨො, සො ච මෙ අබහුලීකතො, අවිතක්කෙ ආනිසංසො අනධිගතො, සො ච මෙ අනාසෙවිතො. තස්මා මෙ අවිතක්කෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති ''එතං සන්තන්ති'' පස්සතො.

තස්ස මය්හං ආනන්ද එතදහොසි: ''සචෙ ඛො අහං විතක්කෙසු ආදීනවං දිස්වා තං බහුලීකරෙය්‍යං අවිතක්කෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං, ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ අවිතක්කෙ චිත්තං පක්ඛන්දෙය්‍ය, පසීදෙය්‍ය, සන්තිට්ඨෙය්‍ය, විමුච්චෙය්‍ය 'එතං සන්තන්ති' පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන විතක්කෙසු ආදීනවං දිස්වා තං බහුලමකාසිං. අවිතක්කෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං. තස්ස මය්හං ආනන්ද, අවිතක්කෙ චිත්තං පක්ඛන්දති, පසීදති, සන්තිට්ඨති, විමුච්චති 'එතං සන්තන්ති' පස්සතො

2. සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන විතක්කවිචාරානං වූපසමා –පෙ– දුතියං ඣානං උපසම්පජ්ජ විහරාමි, තස්ස මය්හං ආනන්ද, ඉමිනා විහාරෙන විහරතො විතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො සෙය්‍යථාපි ආනන්ද, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය. එවමෙවස්ස මෙ විතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස මෙ හොති ආබාධො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: ''යන්නූනාහං පීතියා ච විරාගා -පෙ-තතියං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. තස්ස මය්හං ආනන්ද, නිප්පීතිකෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති ''එතං සන්තන්ති'' පස්සතො. තස්ස මය්හං ආනන්ද, එතදහොසි, ''කො නු ඛො හෙතු කො පච්චයො, යෙන මෙ නිප්පීතිකෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති ''එතං සන්තන්ති'' පස්සතො.

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "මම විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන්... දෙවෙනි ධ්‍යානයට එළැඹ වෙසෙම් නම් යෙහෙකැ"යි. ආනන්දය, මෙය ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත අවිතර්කඅවිචාරයෙහි නො පනියි, නො පහදියි, නො පිහිටයි, (කෙලෙසුන්ගෙන්) නො මිදෙයි.

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "මෙය ශාන්ත ය යි දක්නා වූ මාගේ සිත අවිතර්ක අවිචාරයෙහි යම්හෙයෙකින් නො පනී ද, නො පහදී ද, නො පිහිටා ද, නො මිදේ ද, එයට හෙතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද"යි.

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "මා විසින් විතර්ක (විචාර) යන්හි ආදීනවය නො දක්නා ලද ය. හේ මා විසින් අබහුලීකෘත ද වෙයි. අවිතර්ක (අවිචාර) යෙහි අනුසස් අවබොධ නො කරන ලද ය. හේ මා විසින් අනාසෙවිත ද වෙයි. එහෙයින් මෙය ශාන්ත ය යි දක්නා වූ මාගේ සිත අවිතර්ක අවිචාරයෙහි නො බැසගනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි."

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "ඉදින් මම විතර්ක (විචාර) යන්හි ආදීනව දැක එය බහුල කරන්නෙම් නම් අවිතර්කයෙහි අනුසස් අවබොධ කොට එය භජනය කරනෙම් නම් මෙය ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම් හෙයෙකින් අවිතර්ක අවිචාරයෙහි බැස ගනියි, පහදියි, පිහිටයි, මිදෙයි යන මෙය කරුණ විද්‍යමාන වෙ මැ යි.

ආනන්දය, ඒ මම පසුකාලයෙහි විතර්කවිචාරයන්හි ආදීනව දැක එය බහුල කෙළෙමි. අවිතර්ක (අවිචාර) යෙහි අනුසස් අවබොධ කොට එය ආසෙවන කෙළෙමි, ආනන්දය, මෙය ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත අවිතර්කඅවිචාරයෙහි බැස ගනියි, පහදියි, පිහිටයි, මිදෙයි.

2. ආනන්දය, ඒ මම පසුකාලයෙහි විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් දෙවෙනි ධ්‍යානයට එළැඹ වෙසෙමි. ආනන්දය, මේ විහාරයෙන් වසන්නාවූ ඒ මට විතර්කසහගත සංඥාමනස්කාරයෝ හැසිරෙත්. එය මට ආබාධ වෙයි. ආනන්දය, යම්සේ සුව ඇතියහට ආබාධ පිණිසම දුක උපදනේ ද, එහෙයින් ම ඒ මට විතර්කසහගත මනස්කාරයෝ හැසිරෙත්. එය මට ආබාධ වෙයි.

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "මම ප්‍රීතිහුගේ විරාගයෙන්... තෙවන ධ්‍යානයට එළැඹ වෙසෙම් නම් යෙහෙකැ"යි. ආනන්දය, මෙය ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත නිෂ්ප්‍රීතික ධ්‍යානයෙහි නො පනියි. නො පහදියි. නො පිහිටයි. නො මිදෙයි. ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "මෙය ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම් හෙයෙකින් නිෂ්ප්‍රීතික ධ්‍යානයෙහි නො බැසගනී ද, නො පහදී ද, නො පිහිටා ද, නො මිදේ ද, හෙතු කිම? ප්‍රත්‍යය කිමැ"යි.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: පීතියා ඛො මෙ ආදීනවො අදිට්ඨො, සො ච මෙ අබහුලීකතො. නිප්පීතිකෙ ආනිසංසො අනධිගතො සො ච මෙ අනාසෙවිතො. තස්මා මෙ නිප්පීතිකෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති ''එතං සන්ත''න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද එතදහොසි: ''සචෙ ඛො අහං පීතියා ආදීනවං දිස්වා තං බහුලීකරෙය්‍යං, නිප්පීතිකෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං. ඨානං ඛො පනෙතං විජ්ජති, යං මෙ නිප්පීතිකෙ චිත්තං පක්ඛන්දෙය්‍ය පසීදෙය්‍ය, සන්තිට්ඨෙය්‍ය විමුච්චෙය්‍ය ''එතං සන්තන්ති'' පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන පීතියා ආදීනවං දිස්වා තං බහුලමකාසිං. නිප්පීතිකෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං. තස්ස මය්හං ආනන්ද, නිප්පීතිකෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති එතං සන්තන්ති පස්සතො.

3. සො ඛො අහං ආනන්ද, පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආනන්ද, ඉමිනා විහාරෙන විහරතො පීතිසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති ස්වාස්ස මෙ හොති ආබාධො. සෙය්‍යථාපි ආනන්ද, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය. එවමෙවස්ස මෙ පීතිසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස මෙ හොති ආබාධො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'යන්නූනාහං සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. තස්ස මය්හං ආනන්ද, අදුක්ඛමසුඛෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද එතදහොසි: 'කො නු ඛො හෙතු, කො පච්චයො යෙන මෙ අදුක්ඛමසුඛෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති' එතං සන්ත''න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'උපෙක්ඛාසුඛෙ ඛො මෙ ආදීනවො අදිට්ඨො, සො ච මෙ අබහුලීකතො. අදුක්ඛමසුඛෙ ච ආනිසංසො අනධිගතො, සො ච මෙ අනාසෙවිතො. තස්මා මෙ අදුක්ඛම-සුඛෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති ''එතං සන්ත''න්ති පස්සතො.

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "මා විසින් ප්‍රීතිහුගේ ආදීනව නො දක්නා ලද ය. හෙ මා විසින් අබහුලීකෘත ද වෙයි. නිෂ්ප්‍රීතික-ධ්‍යානයෙහි අනුසස් අවබෝධ නො කරන ලද ය. හෙ මා විසින් අනාසෙවිත ද වෙයි. එහෙයින් මෙසේ ශාන්තය යි දක්නා වූ ඒ මා ගේ සිත නිෂ්ප්‍රීතික ධ්‍යානයෙහි නො බැස ගනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි.

ආනන්දය, ඒ මට මෙසේ සිත වී ය: "ඉදින් මම ප්‍රීතිහුගේ දොස් දැක එය බහුල කරන්නෙම් නම් නිෂ්ප්‍රීතික ධ්‍යානයෙහි අනුසස් අවබෝධ කොට එය ආසෙවන කෙරෙම් නම් මෙසේ ශාන්තය යි දක්නා වූ මා ගේ සිත නිෂ්ප්‍රීතික ධ්‍යානය කෙරෙහි යම්හෙයෙකින් බැසගන්නේ ය, පහදින්නේ ය, පිහිටන්නේ ය, මිදෙන්නේ ය, යන මෙසේ කරුණ විද්‍යමාන වේ මැ යි.

ආනන්දය, ඒ මම පසුකාලයෙහි ප්‍රීතිහුගේ දොස් දැක එය බහුල කෙළෙමි. ප්‍රීතිවිරහිත ධ්‍යානයෙහි අනුසස් අවබෝධ කොට එය ආසෙවන කෙළෙමි. ආනන්දය, මෙසේ ශාන්තය යි දක්නා වූ ඒ මා ගේ සිත නිෂ්ප්‍රීතික ධ්‍යානයෙහි පනියි, පහදියි, පිහිටයි, මිදෙයි.

3. ආනන්දය, ඒ මම ප්‍රීතිහුගේ විරාගයෙන්...තෘතීය ධ්‍යානයට එළැඹ වෙසෙමි. ආනන්දය, මේ විහාරයෙන් වසන ඒ මට ප්‍රීතිසහගත සංඥ මනස්කාරයෝ හැසිරෙත්. හෙ ඒ මට ආබාධ වෙයි. ආනන්දය, යම් සේ සුවඇතියහට ආබාධ පිණිස ම දුක උපදනේ ද, එපරිද්දෙන් ම ඒ මට ප්‍රීතිසහගත සංඥමනස්කාරයෝ හැසිරෙත්. හේ ඒ මට ආබාධ වෙයි.

ආනන්දය, ඒ මට මෙසේ සිත වී ය: "මම සුඛයාගේ ද ප්‍රහාණයෙන්... සිවු වන ධ්‍යානයට එළැඹ වෙසෙම් නම් යෙහෙකැ"යි. ආනන්දය, මෙසේ ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත අදුඃඛඅසුඛයෙහි නො බැස ගනියි. නො පහදියි. නො පිහිටයි. නො මිදෙයි.

ආනන්දය, ඒ මට මෙසේ සිත වී ය: "මෙසේ ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත යම් හෙයෙකින් අදුක්ඛඅසුඛයෙහි නො පනී ද, නො පහදී ද, නො පිහිටා ද, නො මිදේ ද, එයට හෙතු කවර, ප්‍රත්‍යය කවර යත්:

ආනන්දය, ඒ මට මෙසේ සිත වී ය: "උපෙක්ෂාසුඛයෙහි ආදීනව මා විසින් නො දක්නා ලද ය. හෙ මා විසින් අබහුලීකෘත ද වෙයි. අදුක්ඛ අසුඛයෙහි අනුසස් අවබෝධ නොකරන ලද ය. හෙ මා විසින් අනාසෙවිත ද වෙයි. එහෙයින් මෙසේ ශාන්තය යි දක්නා වූ මාගේ සිත අදුක්ඛඅසුඛයෙහි නො බැස ගනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි."

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'සචෙ ඛො අහං උපෙක්ඛාසුඛෙ ආදීනවං දිස්වා තං බහුලීකරෙය්‍යං, අදුක්ඛමසුඛෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං, ඨානං ඛො පනෙතං විජ්ජති, යං මෙ අදුක්ඛමසුඛෙ චිත්තං පක්ඛන්දෙය්‍ය පසීදෙය්‍ය සන්තිට්ඨෙය්‍ය විමුච්චෙය්‍ය 'එතං සන්ත'න්ති' පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන උපෙක්ඛාසුඛෙ ආදීනවං දිස්වා තං බහුලමකාසිං, අදුක්ඛමසුඛෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං, තස්ස මය්හං ආනන්ද අදුක්ඛමසුඛෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො,

4. සො ඛො අහං ආනන්ද අපරෙන සමයෙන සුඛස්ස ච පහානා-පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආනන්ද ඉමිනා විහාරෙන විහරතො උපෙක්ඛාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො. සෙය්‍යථාපි ආනන්ද සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය, එවමෙවස්ස මෙ උපෙක්ඛාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස මෙ හොති ආබාධො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'යන්නූනාහං සබ්බසො රූපසඤ්ඤානං -පෙ- අනන්තො ආකාසොති, ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරෙය්‍ය'න්ති, තස්ස මය්හං ආනන්ද. ආකාසානඤ්චායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'කො නු ඛො හෙතු, කො පච්චයො යෙන මෙ ආකාසානඤ්චායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'රූපෙසු ඛො මෙ ආදීනවො අදිට්ඨො, සො ච මෙ අබහුලීකතො. ආකාසානඤ්චායතනෙ ආනිසංසො අනධිගතො. සො ච මෙ අනාසෙවිතො. තස්මා මෙ ආකාසානඤ්චායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'සචෙ ඛො අහං රූපෙසු ආදීනවං දිස්වා තං බහුලීකරෙය්‍යං, ආකාසානඤ්චායතනෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං, ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ ආකාසානඤ්චායතනෙ චිත්තං පක්ඛන්දෙය්‍ය පසීදෙය්‍ය සන්තිට්ඨෙය්‍ය විමුච්චෙය්‍ය 'එතං සන්ත'න්ති පස්සතො.

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "ඉදින් මම උපෙක්ෂා සුඛයෙහි ආදීනව දැක එය බහුල කරන්නෙම් නම් අදුක්ඛ අසුඛයෙහි අනුසස් අවබෝධ කොට එය ආසෙවන කරන්නෙම් නම් මෙය ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම් හෙයෙකින් අදුක්ඛ අසුඛයෙහි පනින්නේය, පහදින්නේය, පිහිටන්නේය, මිදෙන්නේය, යන මෙය කරුණ ඇත් මය".

ආනන්දය, ඒ මම පසුකාලයෙහි උපෙක්ෂාසුඛයෙහි ආදීනව දැක එය බහුල කෙළෙමි. අදුක්ඛ අසුඛයෙහි අනුසස් අවබෝධ කොට එය ආසෙවන කෙළෙමි. මෙය ශාන්තය යි දක්නා ඒ මාගේ සිත අදුක්ඛ අසුඛයෙහි පනියි, පහදියි, පිහිටයි, මිදෙයි.

4. ආනන්දය, ඒ මම පසුකාලයෙහි සුඛයාගේ ද ප්‍රහාණයෙන්... සිවුවන ධ්‍යානයට එළැඹ වෙසෙමි. ආනන්දය, මේ විහාරයෙන් වසන්නා වූ ඒ මට උපෙක්ෂාසහගතසංඥමනස්කාරයෝ හැසිරෙත්. මේ ඒ මට ආබාධ වෙයි. ආනන්දය, යම් සේ සුව ඇතියහට ආබාධ පිණිස ම දුක උපදනේ ද, එපරිදි ම ඒ මට උපෙක්ෂාසහගතසංඥමනස්කාරයෝ හැසිරෙත්. මේ ඒ මට ආබාධ වෙයි.

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "මම සර්වප්‍රකාරයෙන් රූපසංඥවන්ගේ...... ආකාසය අනන්තය යි ආකාසානඤ්චායතනයට එළැඹ වෙසෙම් නම් යෙහෙකැ"යි. ආනන්දය, මෙය ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත ආකාසානඤ්චායතනයෙහි නො බැස ගනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි.

ආනන්දය, ඒ මට මෙසේසිත විය: "මෙයශාන්තය යි දක්නා වූ මාගේ සිත යම්හෙයෙකින් ආකාසානඤ්චායතනයෙහි නො පනී ද, නො පහදියි ද, නො පිහිටා ද, නො මිදේ ද, එයට හෙතු කවර, ප්‍රත්‍යය කවර යත්:

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "මා විසින් රූපයන්හි දොස නො දක්නා ලද ය. එ මා විසින් අබහුලීකෘත ද වෙයි. ආකාසානඤ්චායතනයෙහි අනුසස් අවබොධ නො කරන ලද ය. එ මා විසින් අනාසෙවිත ද වෙයි. එහෙයින් මෙය ශාන්තය යි දක්නා වූ මාගේ සිත ආකාසානඤ්චායතනයෙහි නො පනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි."

ආනන්දය, ඒ මට මෙසේ සිත විය: "ඉදින් මම රූපයන්හි ආදීනව දැක එය බහුලකරන්නෙම් නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි අනුසස් අවබොධ කොට එය ආසෙවන කරන්නෙම් නම් මෙය ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම්හෙයෙකින් ආකාසානඤ්චායතනයෙහි බැස ගන්නේ ය, පහදින්නේ ය, පිහිටන්නේ ය, මිදෙන්නේ ය යන මෙය කරුණ විද්‍යමාන වේ මැ යි.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන රූපෙසු ආදීනවං දිස්වා තං බහුලමකාසිං, ආකාසානඤ්චායතනෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං, තස්ස මය්හං ආනන්ද, ආකාසානඤ්චායතනෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

සො ඛො අහං ආනන්ද, සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා -පෙ- අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආනන්ද, ඉමිනා විහාරෙන විහරතො රූපසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො. සෙය්‍යථාපි ආනන්ද, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය, යාවදෙව ආබාධාය. එවමෙවස්ස මෙ රූපසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, ස්වාස්ස මෙ හොති ආබාධො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: යන්නූනාහං සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති.' තස්ස මය්හං ආනන්ද විඤ්ඤාණඤ්චායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති එතං සන්තන්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'කො නු ඛො හෙතු, කො පච්චයො, යෙන මෙ විඤ්ඤාණඤ්චායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: ආකාසානඤ්චායතනෙ ඛො මෙ ආදීනවො අදිට්ඨො, සො ච මෙ අබහුලීකතො. විඤ්ඤාණඤ්චායතනෙ ච ආනිසංසො අනධිගතො සො ච මෙ අනාසෙවිතො. තස්මා මෙ විඤ්ඤාණඤ්චායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති' 'එතං සන්ත'න්ති පස්සතො.

සචෙ ඛො අහං ආකාසානඤ්චායතනෙ ආදීනවං දිස්වා තං බහුලීකරෙය්‍යං, විඤ්ඤාණඤ්චායතනෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං, ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ විඤ්ඤාණඤ්චායතනෙ චිත්තං පක්ඛන්දෙය්‍ය පසීදෙය්‍ය සන්තිට්ඨෙය්‍ය විමුච්චෙය්‍ය 'එතං සන්ත'න්ති පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන ආකාසානඤ්චායතනෙ ආදීනවං දිස්වා තං බහුලමකාසිං, විඤ්ඤාණඤ්චායතනෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං. තස්ස මය්හං ආනන්ද, විඤ්ඤාණඤ්චායතනෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

ආනන්දය, ඒ මම පසුකාලයෙහි රූපයන්හි දෙස් දැක එය බහුල කෙළෙමි. ආකාසානඤ්චායතනයෙහි අනුසස් සාක්ෂාත් කොට එය ආදරයෙන් සෙව්වෙමි. ආනන්දය, තෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත ආකාසානඤ්චායතනයෙහි බැස ගනියි, පහදියි, පිහිටයි, මිදෙයි.

5. ආනන්දය, ඒ මම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමයෙන් ...... (කසිණුග්ඝාටික) ආකාසය අනන්තය යි ආකාසානඤ්චායතනයට එළැඹ වෙසෙමි. ආනන්දය, මේ විහාරයෙන් වසන්නා වූ ඒ මට රූපසහගත වූ සංඥාමනස්කාරයෝ හැසිරෙත්. එ මට ආබාධ වෙයි. ආනන්දය, සුව ඇතියහට ආබාධ පිණිස ම යම්සේ දුක උපදනේ ද, එසෙයින් ම මට රූපසහගත වූ සංඥාමනස්කාරයෝ හැසිරෙත්. එ මට ආබාධ වෙයි.

ආනන්දය, ඒ මට තෙල සිත වී ය: ''මම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා (ආකාසාරම්මණ) විඤ්ඤාණය අනන්ත යි විඤ්ඤාණඤ්චායතනයට එළැඹ වෙසෙම් නම් යෙහෙකැ'' යි. ආනන්දය, තෙල ශාන්ත යි දක්නා වූ ඒ මාගේ සිත විඤ්ඤාණඤ්චායතනයෙහි නො පනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි.

ආනන්දය, ඒ මට තෙල සිත වී ය: ''තෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම්හෙයෙකින් විඤ්ඤාණඤ්චායතනයෙහි නො පනී ද, නො පහදී ද, නො පිහිටා ද, නො මිදේ ද එයට හෙතු කවර, ප්‍රත්‍යය කවර යත්:

ආනන්දය, ඒ මට තෙල සිත වී ය: ''මා විසින් ආකාසානඤ්චායතන-යෙහි ආදීනවය නො දක්නා ලද ය. එ මා විසින් අබහුලීකෘත ද වෙයි. විඤ්ඤාණඤ්චායතනයෙහි අනුසස් ද නො ලබන ලද ය. මා විසින් එ අනාසෙවිත ද වෙයි. එහෙයින් තෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත විඤ්ඤාණඤ්චායතනයෙහි නො බැස ගනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි.

ඉදින් මම ආකාසානඤ්චායතනයෙහි ආදීනව දැක එය බහුලකරන්නෙම් නම් විඤ්ඤාණඤ්චායතනයෙහි අනුසස් අවබොධ කොට එය ආසෙවන කරන්නෙම් නම් තෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත යම් හෙයෙකින් විඤ්ඤාණඤ්චායතනයෙහි පනින්නේ ය, පහදින්නේ ය, පිහිටන්නේ ය, මිදෙන්නේ ය යන තෙල කරුණ ඇත් ම ය.''

ආනන්දය, ඒ මම පසුකාලයෙහි ආකාසානඤ්චායතනයෙහි ආදීනව දැක එය බහුල කෙළෙමි. විඤ්ඤාණඤ්චායතනයෙහි අනුසස් අවබොධ කොට එය ආසෙවන කෙළෙමි. ආනන්දය, තෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත විඤ්ඤාණඤ්චායතනයෙහි බැස ගනියි, පහදියි, පිහිටයි, මිදෙයි.

6. සො ඛො අහං ආනන්ද, සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආනන්ද, ඉමිනා විහාරෙන විහරතො ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො. සෙය්‍යථාපි ආනන්ද, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය. එවමෙවස්ස මෙ ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො.

තස්ස මය්හං ආනන්ද එතදහොසි: 'යන්නූනාහං සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරෙය්‍ය''න්ති. තස්ස මය්හං ආනන්ද, ආකිඤ්චඤ්ඤායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: කො නු ඛො හෙතු, කො පච්චයො, යෙන මෙ ආකිඤ්චඤ්ඤායතනෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො. තස්ස මය්හං ආනන්ද එතදහොසි: ''විඤ්ඤාණඤ්චායතනෙ ඛො මෙ ආදීනවො අදිට්ඨො. සො ච මෙ අබහුලීකතො, ආකිඤ්චඤ්ඤායතනෙ ච ආනිසංසො අනධිගතො, සො ච මෙ අනාසෙවිතො. තස්මා මෙ ආකිඤ්චඤ්ඤායතනෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද එතදහොසි: 'සචෙ ඛො අහං විඤ්ඤාණඤ්චායතනෙ ආදීනවං දිස්වා නං බහුලීකරෙය්‍යං, ආකිඤ්චඤ්ඤායතනෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං, ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ ආකිඤ්චඤ්ඤායතනෙ චිත්තං පක්ඛන්දෙය්‍ය පසීදෙය්‍ය සන්තිට්ඨෙය්‍ය විමුච්චෙය්‍ය ''එතං සන්ත''න්ති පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන විඤ්ඤාණඤ්චායතනෙ ආදීනවං දිස්වා තං බහුලමකාසිං ආකිඤ්චඤ්ඤායතනෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං, තස්ස මය්හං ආනන්ද ආකිඤ්චඤ්ඤායතනෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

7. සො ඛො අහං ආනන්ද සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආනන්ද, ඉමිනා විහාරෙන විහරතො විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො.

6. ආනන්දය, ඒ මම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණඤ්චායතනයට එළැඹ වෙසෙමි. ආනන්දය, මේ විහාරයෙන් වසන්නා වූ ඒ මට ආකාසානඤ්චායතනසහගත වූ සංඥමනස්කාරයෝ හැසිරෙත්. හේ ඒ මට ආබාධ වෙයි. ආනන්දය, සුවඇතියහට ආබාධ පිණිස ම යම්සේ දුක උපදනේ ද, එසේ ම ඒ මට ආකාසානඤ්චායතන-සහගත වූ සංඥමනස්කාරයෝ හැසිරෙත්. හේ ඒ මට ආබාධ වෙයි.

ආනන්දය, ඒ මට මෙල සිත වී ය: "මම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වෙසෙම් නම් යෙහෙකැ"යි. ආනන්දය, මෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි නො බැස ගනියි, නො පහදියි, නො පිහිටයි. නො මිදෙයි.

ආනන්දය, ඒ මට මෙල සිත වී ය: "මෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම්හෙයෙකින් ආකිඤ්චඤ්ඤායතනයෙහි නො පනියි ද, නො පහදියි ද, නො පිහිටයි ද, නො මිදෙයි ද එයට හෙතු කවර, ප්‍රත්‍යය කවර යත්:

ආනන්දය, ඒ මට මෙල සිත වී ය: "මා විසින් විඤ්ඤාණඤ්චායතන-යෙහි ආදීනවය නොදක්නා ලද ය. හෙද මා විසින් අබහුලීකෘත ය. ආකිඤ්චඤ්ඤායතනයෙහි අනුසස් ද අවබොධ නො කරන ලද ය, හේ මා විසින් සෙවිත ද නො වේ. එහෙයින් මෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි නො බැස ගනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි"

ආනන්දය, ඒ මට මෙලසිත වී ය: "ඉදින් මම විඤ්ඤාණඤ්චායතන-යෙහි ආදීනව දැක එය බහුල කරනෙම් නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි අනුසස් අවබොධ කොට එය ආසෙවන කරනෙම් නම් මෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම්හෙයෙකින් ආකිඤ්චඤ්ඤායතනයෙහි බැස ගන්නේ ය, පහදින්නේ ය, පිහිටන්නේ ය, මිදෙන්නේ ය යන මෙල කරුණ විද්‍යමාන වේ ම ය."

ආනන්දය, ඒ මම පසුකාලයෙහි විඤ්ඤාණඤ්චායතනයෙහි දෙස් දැක එය බහුල කෙළෙමි. ආකිඤ්චඤ්ඤායතනයෙහි අනුසස් අවබොධ කොට එය ආසෙවන කෙළෙමි. ආනන්දය, මෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි බැස ගනියි, පහදියි, පිහිටයි, මිදෙයි.

7. ආනන්දය, ඒ මම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹ වෙසෙමි. ආනන්දය, මේ විහාරයෙන් වසන්නා වූ ඒ මට විඤ්ඤාණඤ්චායතනසහගත වූ සංඥ-මනස්කාරයෝ හැසිරෙත්. හේ ඒ මට ආබාධ වෙයි.

සෙය්‍යථාපි ආනන්ද සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය, එවමෙවස්ස මෙ විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'යන්නූනාහං සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරෙය්‍ය'න්ති. තස්ස මය්හං ආනන්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති, න සන්තිට්ඨති, න විමුච්චති, 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'කො නු ඛො හෙතු, කො පච්චයො, යෙන මෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: ආකිඤ්චඤ්ඤායතනෙ ඛො මෙ ආදීනවො අදිට්ඨො, සො ච මෙ අබහුලීකතො, නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ ආනිසංසො අනධිගතො, සො ච මෙ අනාසෙවිතො. තස්මා මෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සංතිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'සචෙ ඛො අහං ආකිඤ්චඤ්ඤායතනෙ ආදීනවං දිස්වා තං බහුලීකරෙය්‍යං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං, ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ චිත්තං පක්ඛන්දෙය්‍ය, පසීදෙය්‍ය, සන්තිට්ඨෙය්‍ය, විමුච්චෙය්‍ය, 'එතං සන්ත'න්ති පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන ආකිඤ්චඤ්ඤායතනෙ ආදීනවං දිස්වා තං බහුලමකාසිං. නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං, තස්ස මය්හං ආනන්ද නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

ආනන්දය, සුව ඇතියහට ආබාධ පිණිසම යම්සේ දුක උපදනේ ද, එසෙයින් ම ඒ මට විඤ්ඤාණඤ්චායතනසහගත වූ සංඥමනස්කාරයෝ හැසිරෙති. හේ ඒ මට ආබාධ වෙයි.

ආනන්දය, ඒ මට මෙලෙසිත විය: ''මම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වෙසෙම් නම් යෙහෙකැ''යි. ආනන්දය, මෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නො පනියි, නො පහදී යි, නො පිහිටයි, නො මිදෙයි.

ආනන්දය, ඒ මට මෙලෙසිත වී ය: ''මෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම්හෙයෙකින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නො පනී ද, නො පහදී ද, නො පිහිටා ද, නො මිදේ ද, එයට හෙතු කවර ප්‍රත්‍යය කවර යත්:

ආනන්දය, ඒ මට මෙල සිත වී ය: ''මා විසින් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනවය නො දක්නා ලද ය. මා විසින් හේ අබහුලීකෘත ද වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි අනුසස් අනධිගත වෙයි. මා විසින් හේ අනාසෙවිත ද වෙයි. එහෙයින් මෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නො පනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි.

ආනන්දය, ඒ මට මෙලසිත වී ය: ''ඉදින් මම ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනවය දැක එය බහුල කරනෙම් නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි අනුසස් අවබොධ කොට එය අදරින් සෙවුනෙම් නම් මෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම්හෙයෙකින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි පනින්නේ ය, පහදින්නේ ය, පිහිටන්නේ ය, මිදෙන්නේ ය යන මෙල කරුණ විද්‍යමාන වේ ම ය.

ආනන්දය, ඒ මම පසුකාලයෙහි ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනව දැක එය බහුල කෙළෙම්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි අනුසස් අවබොධ කොට එය ආසෙවන කෙළෙම්. ආනන්දය, මෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි පනියි, පහදියි, පිහිටයි, මිදෙයි.

8. සො ඛො අහං ආනන්ද, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාමි, තස්ස මය්හං ආනන්ද, ඉමිනා විහාරෙන විහරතො ආකිඤ්චඤ්ඤායතන සහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති' ස්වාස්ස මෙ හොති ආබාධො. සෙය්‍යථාපි ආනන්ද, සුඛිනො දුක්ඛං උප්පජ්ජෙය්‍ය යාවදෙව ආබාධාය. එවමෙවස්ස මෙ ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති. ස්වාස්ස මෙ හොති ආබාධො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'යන්නූනාහං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති' තස්ස මය්හං ආනන්ද, සඤ්ඤාවෙදයිතනිරොධෙ චිත්තං න පක්ඛන්දති, නප්පසීදති න සන්තිට්ඨති, න විමුච්චති, 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'කො නු ඛො හෙතු, කො පච්චයො, යෙන මෙ සඤ්ඤාවෙදයිතනිරොධෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: ''නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ ඛො මෙ ආදීනවො අදිට්ඨො, සො ච මෙ අබහුලීකතො සඤ්ඤාවෙදයිත නිරොධෙ ආනිසංසො අනධිගතො. සො ච මෙ අනාසෙවිතො. තස්මා මෙ සඤ්ඤාවෙදයිතනිරොධෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති න විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

තස්ස මය්හං ආනන්ද, එතදහොසි: 'සචෙ ඛො අහං නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ ආදීනවං දිස්වා තං බහුලීකරෙය්‍යං සඤ්ඤාවෙදයිතනිරොධෙ ආනිසංසං අධිගම්ම තමාසෙවෙය්‍යං ඨානං ඛො පනෙතං විජ්ජති යං මෙ සඤ්ඤාවෙදයිතනිරොධෙ චිත්තං පක්ඛන්දෙය්‍ය, පසීදෙය්‍ය, සන්තිට්ඨෙය්‍ය, විමුච්චෙය්‍ය 'එතං සන්ත'න්ති පස්සතො.

සො ඛො අහං ආනන්ද, අපරෙන සමයෙන නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ ආදීනවං දිස්වා තං බහුලමකාසිං, සඤ්ඤාවෙදයිතනිරොධෙ ආනිසංසං අධිගම්ම තමාසෙවිං, තස්ස මය්හං ආනන්ද, සඤ්ඤාවෙදයිත නිරොධෙ චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති විමුච්චති 'එතං සන්ත'න්ති පස්සතො.

8. ආනන්දය, ඒ මම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වෙසෙමි. ආනන්දය, මේ විහාරයෙන් වසන්නා වූ මට ආකිඤ්චඤ්ඤායතනසහගත වූ සංඥමනස්කාරයෝ මනොද්වාරයෙහි හැසිරෙත්. හේ ඒ මට ආබාධ වෙයි. ආනන්දය, සුව ඇතියහට ආබාධ පිණිසම යම්සේ දුක උපදනේ ද, එසෙයින් ම මට ආකිඤ්චඤ්ඤායතනසහගත වූ සංඥමනස්කාරයෝ හැසිරෙත්. හේ මට ආබාධ වෙයි.

ආනන්දය, ඒ මට තෙලසිත වී ය: "මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට එළැඹ වෙසෙන්නෙම් නම් යෙහෙකැ"යි. ආනන්දය, තෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත සඤ්ඤාවෙදයිතනිරොධයෙහි නො බැස ගනී, නො පහදී, නො පිහිටයි, නො මිදෙයි.

ආනන්දය, ඒ මට තෙලසිත වී ය: "තෙල ශාන්තය යි දක්නාවූ මාගේ සිත යම් හෙයෙකින් සඤ්ඤාවෙදයිතනිරොධයෙහි නො පනී ද, නො පහදීද, නො පිහිටා ද, නො මිදේ ද, හෙතු කවරේ දෝ! ප්‍රත්‍යය කවරේ දෝ!" ආනන්දය, ඒ මට තෙල සිත වී ය: "මා විසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආදීනවය නො දක්නා ලද ය. මා විසින් හේ අබහුලීකෘත ද වෙයි. සඤ්ඤාවෙදයිතනිරොධයෙහි අනුසස් අවබොධ නො කරන ලද්දේ වෙයි. මා විසින් හේ අනාසෙවිත ද වේ.

එහෙයින් තෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත සඤ්ඤාවෙදයිත නිරොධයෙහි නො බැස ගනියි, නො පහදියි, නො පිහිටයි, නො මිදෙයි.

ආනන්දය, ඒ මට තෙල සිත වී ය: "ඉදින් මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආදීනවය දක එය බහුල කරනෙම් නම් සඤ්ඤාවෙදයිත-නිරොධයෙහි අනුසස් අවබොධ කොට එය ආසෙවන කෙරෙම් නම් තෙල ශාන්තය යි දක්නා වූ මාගේ සිත යම්හෙයෙකින් සඤ්ඤාවෙදයිතනිරොධ-යෙහි බැසගන්නේ ය, පහදින්නේ ය, පිහිටන්නේ ය, මිදෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ ම ය.

ආනන්දය, ඒ මම පසුකාලයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි දොස දක එය බහුල කෙළෙමි. සඤ්ඤාවෙදයිතනිරොධයෙහි අනුසස් අවබොධ කොට එය භජනය කෙළෙමි. ආනන්දය, තෙල ශාන්තය යි දක්නා වූ ඒ මාගේ සිත සඤ්ඤාවෙදයිතනිරොධයෙහි බැස ගනියි, පහදියි, පිහිටයි, මිදෙයි.

9. සො ඛො අහං ආනන්ද සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරාමි, පඤ්ඤාය ච මෙ දිස්වා ආසවා පරික්ඛයං අගමංසු.

යාවකීවඤ්චාහං ආනන්ද ඉමා නව අනුපුබ්බවිහාරසමාපත්තියො න එවං අනුලොමපටිලොමං සමාපජ්ජිම්පි, වුට්ඨහිම්පි නෙව තාවාහං ආනන්ද සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං.

යතො ච ඛො අහං ආනන්ද, ඉමා නව අනුපුබ්බවිහාරසමාපත්තියො එවං අනුලොමපටිලොමං සමාපජ්ජිම්පි වුට්ඨහිම්පි, අථාහං ආනන්ද, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති.

මහාවග්ගො චතුත්ථො.

**තස්සුද්දානං:**

ද්වෙ විහාරා ච නිබ්බානං ගාවි ඣානෙන පඤ්චමං,
ආනන්ද බ්‍රාහ්මණා දෙවො නාගෙන තපුස්සෙන චාති.

9. ආනන්දය, ඒ මම සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට එළැඹ වෙසෙමි. ප්‍රඥායෙනුදු දක මාගේ ආස්‍රවයෝ පරික්ෂයට ගියහ.

ආනන්දය, යම්තාක් කල් මම මේ නව අනුපූර්වවිහාරසමාපත්තීන්ට මෙසේ අනුලොමපටිලොමවසයෙන් නො සමවැදියෙම් ද, නො නැඟී-සිටියෙම් ද, ආනන්දය, ඒ තාක්කල් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වප්‍රජාවෙහි අනුත්තර සම්මාසම්බොධිය ප්‍රතිවෙධ කෙළෙමැයි පිළින නො කෙළෙම්ම ය.

ආනන්දය, යම් කලෙක්හි මම මේ නව අනුපූර්වවිහාරසමාපත්තීන්ට මෙසේ අනුලොම් පිළිලොම් වීයින් සම්වැදුණෙම් ද, නැඟීසිටියෙම් ද, ආනන්දය, එකල්හි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වප්‍රජාවෙහි අනුත්තර සම්මාසම්බොධිය ප්‍රතිවෙධ කෙළෙමැයි පිළිණ කෙළෙමි. මට ඥානදර්ශනය (ප්‍රත්‍යවෙක්ෂා ඥානය) ද උපන, "මාගේ චිත්තවිමුක්තිය අකොප්‍ය ය. මේ අන්තිමජාතිය යි, දැන් පුනර්භවයෙක් නැත" කියා යි.

**සතරවන මහාවර්ග යි.**

**එහි උද්දානය:**

**අනුපුබ්බවිහාර සූත්‍රදෙක ය, නිබ්බානසූත්‍ර ය, ගාවිසූත්‍රය, පස්වන ඣාන සූත්‍රය, ආනන්ද සූත්‍රය, බ්‍රාහමණ සූත්‍රය, දෙවාසුර සූත්‍රය, නාග සූත්‍රය, තපුස්ස සූත්‍රය දැයි සූත්‍ර දශයෙකි.**

# 5. සාමඤ්ඤවග්ගො

## 9. 1. 5. 1

## සම්බාධ සුත්තං

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා ආනන්දො කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. අථ ඛො ආයස්මා උදායී යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උදායී ආයස්මන්තං ආනන්දං එතදවොච: වුත්තමිදං ආවුසො, පඤ්චාලචණ්ඩෙන දෙවපුත්තෙන:

1. ''සම්බාධෙ වත[1] ඔකාසං අවින්දි[2] භූරි මෙධසො
   යො ඣානමබුධා[3] බුද්ධො- පතිලීනනිසභො මුනී''ති.

කතමො නු ඛො ආවුසො සම්බාධො කතමො සම්බාධෙ ඔකාසා- ධිගමො වුත්තො භගවතාති:

පඤ්චිමෙ ආවුසො කාමගුණා සම්බාධො වුත්තො භගවතා. කතමෙ පඤ්ච චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූ- පසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා පොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො ආවුසො පඤ්චකාමගුණා සම්බාධො වුත්තො භගවතා.

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උප- සම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා. පරියායෙන තත්‍ර'පත්ථි සම්බාධො, කිඤ්ච තත්‍ර සම්බාධො:[1] යදෙව තත්‍ර විතක්කවිචාරා අනිරුද්ධා හොන්ති අයමෙත්‍ථ සම්බාධො.

---

1. සම්බාධෙගතං - මජසං
2. අවිදවා - මජසං
3. ඣානමබුජ්ඣි - මජසං

# 5. සාමඤ්ඤ වර්ගය

## 9. 1. 5. 1

## සම්බාධ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ කොසඹෑ නුවර සමීපයෙහි වූ ඝොෂිතාරාමයෙහි වාස කෙරෙත්. එකල්හි ආයුෂ්මත් උදායි තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරුන් වෙත එළැඹියහ. එළැඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් හා සමඟ සතුටු වූහ. සම්මෝදනීය වූ සාරාණීය වූ කථාව කොට නිමවා එකත්පස්හි හුන්හ. එකත්පස්හි හුන් ආයුෂ්මත් උදායි තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට මෙසේ කීහ: ඇවැත්නි, පඤ්චාලචණ්ඩ දෙවපුත්‍ර විසින් මෙය කියන ලද:

1. සිවුසස් පිළිවිදි (එකී භාවයෙන්) ප්‍රතිලීන වූ ද (උත්තමාත්ථයෙන්) නිසභ වූ ද යම් බුද්ධ වූ මුනිවරයෙක් ධ්‍යානය අවබොධ කෙළේ ද ඒ මහාප්‍රාඥ තෙමේ එකැතින් පඤ්චකාමගුණ සඞ්ඛ්‍යාත සම්බාධයෙහි අවකාශ දතුයේ ය.

ඇවැත්නි, සම්බාධ නම් කවර? භාග්‍යවතුන් විසින් වදාරන ලද සම්බාධයෙහි ඕකාසාධිගමය කවර?

ඇවැත්නි, මේ පස්කම් ගුණ භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධ යයි වදාරන ලද, කවර පසෙක යත්: චක්ෂුර්විඥාන ග්‍රාහ්‍ය ඉෂ්ට කාන්ත මනාප ප්‍රියස්වරූප කාමොපසංහිත රජනීය රූපයහ, ශ්‍රොත්‍රවිඥාන ග්‍රාහ්‍ය ශබ්දයහ,... ඝ්‍රාණවිඥාන ග්‍රාහ්‍ය ගන්ධයහ... ජිව්හාවිඥාන ග්‍රාහ්‍ය රසයහ... කායවිඥානග්‍රාහ්‍ය ඉෂ්ට කාන්ත මනාප ප්‍රිය රූප කාමොපසංහිත රජනීය ස්ප්‍රෂ්ටව්‍යයහ. ඇවැත්නි, මේ පඤ්චකාම ගුණ භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධ යයි කියන ලද.

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව ම... ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරන්නේ ය. ඇවැත්නි, මෙ පමණෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඕකාසාධිගම ය කියන ලද, පර්‍යායයෙන් එහිදු සම්බාධයෙක් ඇත. එහි සම්බාධ නම් කවර? යම් හෙයෙකින් එහි විතර්ක විචාරයෝ අනිරුද්ධ වෙත් නම් මේ මෙහි සම්බාධ වෙයි.

පුනවපරං ආවුසො භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා පරියායෙන. තත්‍ර පත්‍ථි සම්බාධො. කිඤ්ච තත්‍ථ සම්බාධො: යදෙව තත්‍ථ පීති අනිරුද්ධා හොති, අයමෙත්‍ථ සම්බාධො.

පුනවපරං ආවුසො භික්ඛු පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා පරියායෙන. තත්‍ර'පත්‍ථි සම්බාධො, කිඤ්ච තත්‍ථ සම්බාධො: යදෙව තත්‍ථ උපෙක්ඛාසුඛං[1] අනිරුද්ධං හොති, අයමෙත්‍ථ සම්බාධො.

පුනවපරං ආවුසො භික්ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්‍ථං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො, සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා. තත්‍ර'පත්‍ථි සම්බාධො. කිඤ්ච තත්‍ථ සම්බාධො. යදෙව තත්‍ථ රූපසඤ්ඤා අනිරුද්ධා හොති, අයමෙත්‍ථ සම්බාධො.

පුනවපරං ආවුසො භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්‍ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා පරියායෙන, තත්‍ර'පත්‍ථි සම්බාධො. කිඤ්ච තත්‍ථ සම්බාධො යදෙව තත්‍ථ ආකාසානඤ්චායතනසඤ්ඤා අනිරුද්ධා හොති. අයමෙත්‍ථ සම්බාධො.

පුනවපරං ආවුසො භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා පරියායෙන තත්‍ර'පත්‍ථි සම්බාධො. කිඤ්ච තත්‍ථ සම්බාධො යදෙව තත්‍ථ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා අනිරුද්ධා හොති. අයමෙත්‍ථ සම්බාධො.

පුනවපරං ආවුසො භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්‍ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා පරියායෙන, තත්‍ර'පත්‍ථි සම්බාධො. කිඤ්ච තත්‍ථ සම්බාධො: යදෙව තත්‍ථ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා අනිරුද්ධා හොති, අයමෙත්‍ථ සම්බාධො,

1. උපෙක්ඛාසුඛං - සීමු

තවද ඇවැත්නි, මහණ විතර්ක විචාරයන්ගේ වූපශමයෙන්... ද්විතීය ධ්‍යානයට එළැඹ වාස කරන්නේ ය. ඇවැත්නි, මෙ පමණකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් ඔකාසාධිගමය කියන ලද, පර්‍යායයෙන් එහිදු සම්බාධයෙක් ඇත. එහි සම්බාධය කවර? යම් හෙයෙකින් එහි ප්‍රීතිය අනිරුද්ධ වේ නම් මේ එහි සම්බාධ යි.

තවද ඇවැත්නි, මහණ ප්‍රීතියගේ ද විරාගයෙන්... තෘතීය ධ්‍යානයට පැමිණ වාස කරනේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඔකාසාධිගමය කියන ලද, එහිදු පර්‍යායයෙන් සම්බාධය ඇත. එහි සම්බාධ නම් කවර? යම් හෙයෙකින් එහි උපෙක්‍ෂා සුඛය අනිරුද්ධ වේ නම් මේ මෙහි සම්බාධය වෙයි.

තවද ඇවැත්නි, මහණ සුඛප්‍රහාණයෙනුදු... චතුර්ථ ධ්‍යානයට පැමිණ වාස කරන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඔකාසාධිගම ය කියන ලද පර්‍යායයෙන් එහිදු සම්බාධයෙක් ඇත. එහි සම්බාධ නම් කවර? යම් හෙයෙකින් එහි රූපසංඥ අනිරුද්ධ වේ නම් මේ මෙහි සම්බාධ වෙයි.

තවද ඇවැත්නි, මහණ සර්වථායෙන් රූපසංඥවන්ගේ සමතික්‍රමණයෙන් ප්‍රතිඝසංඥවන්ගේ අස්තගමයෙන් නානාත්වසංඥවන්ගේ අමනසිකාරයෙන් ආකාශය අනන්තය යි ආකාසානඤ්චායතනයට පැමිණ වාස කරන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු සම්බාධයෙහි ඔකාසාධිගම ය භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද, පර්‍යායයෙන් එහිදු සම්බාධ ඇත. එහි සම්බාධ නම් කවර? යම් හෙයෙකින් එහි ආකාසානඤ්චායතන සංඥව අනිරුද්ධ වේ ද මේ මෙහි සම්බාධ යි.

තවද ඇවැත්නි, මහණ සර්වථායෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඥානය අනන්ත යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඔකාසාධිගමය කියන ලද, පර්‍යායයෙන් එහිදු සම්බාධ ඇත. එහි සම්බාධ නම් කවර? යම් හෙයෙකින් එහි විඤ්ඤාණඤ්චායතන සංඥව අනිරුද්ධ වේ නම් මේ මෙහි සම්බාධ යි.

තවද ඇවත්නි, මහණ සර්වථායෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම 'කිසිවක් නැත'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඔකාසාධිගමය දෙසන ලද පර්‍යායයෙන් එහිදු සම්බාධ ඇත. එහි සම්බාධ නම් කවර? යම් හෙයෙකින් එහි ආකිඤ්චඤ්ඤායතන සංඥව අනිරුද්ධ වේ නම් මේ මෙහි සම්බාධ යි.

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා පරියායෙන, තත්‍ථ පත්‍ථි සම්බාධො. කිඤ්ච තත්‍ථ සම්බාධො: යදෙව තත්‍ථ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤා අනිරුද්ධා හොති, අයමෙත්‍ථ සම්බාධො.

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. එත්තාවතා පි ඛො ආවුසො සම්බාධෙ ඔකාසාධිගමො වුත්තො භගවතා නිප්පරියායෙනාති.

## 9. 1. 5. 2.

## කායසක්ඛි සුත්තං

**[කොසම්බිනිදානං]**

"කායසක්ඛි කායසක්ඛී"ති ආවුසො වුච්චති, කිත්තාවතා නු ඛො ආවුසො කායසක්ඛි වුත්තො භගවතාති.

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. යථා යථා ච තදායතනං තථා තථා නං කායෙන ඵස්සිත්වා[1] විහරති. එත්තාවතා පි ඛො ආවුසො කායසක්ඛි වුත්තො භගවතා පරියායෙන.

පුනචපරං ආවුසො භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්‍ථං ඣානං උපසම්පජ්ජ විහරති. යථා යථා ච තදායතනං තථා තථා නං කායෙන ඵස්සිත්වා[1] විහරති. එත්තාවතා පි ඛො ආවුසො කායසක්ඛි වුත්තො භගවතා පරියායෙන.

1. ඵුසිත්වා - මජසං, සහා

තවද ඇවැත්නි, මහණ සර්වථායෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළඹැ වාසය කරන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් සම්බාධයෙහි ඕකාසාධිගමය වදරන ලද, පර්‍ය්‍යායයෙන් එහිදු සම්බාධ ඇත. එහි සම්බාධ නම් කවර? යම් හෙයෙකින් එහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා අනිරුද්ධ වේ නම් මේ මෙහි සම්බාධ යි.

තවද ඇවැත්නි, මහණ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වාස කරන්නේ ය. ප්‍රඥායෙනුදු දැක ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් නිෂ්පර්‍ය්‍යායයෙන් සම්බාධයෙහි ඕකාසාධිගමය කියන ලදැ යි.

## 9. 1. 5. 2
## කායසක්ඛි සූත්‍රය

[කොසඹැනිදන යි]

ඇවැත්නි, කායසක්ඛි, කායසක්ඛි යි කියනු ලැබේ. ඇවැත්නි, කෙතෙක් කරුණින් භාග්‍යවතුන් වහන්සේ විසින් කායසක්ඛි පුද්ගලයා දෙසන ලද්දේ දැයි:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව ම... ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරන්නේ ය. යම් යම් සෙයකින් ඒ (ප්‍රථම ධ්‍යාන සඞ්ඛ්‍යාත) ආයතන වේ නම් ඒ ඒ සෙයින් ඒ සමාපත්තිය නාමකායයෙන් පැහැස වාස කරන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන් කායසක්ඛි පුද්ගලයා දෙසන ලදුයේ ය.

ඇවැත්නි, තව ද, මහණ විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන්... ද්වීතීය ධ්‍යානයට... තෘතීය ධ්‍යානයට... චතුර්ථ ධ්‍යානයට එළැඹ වාස කරන්නේ ය. යම් යම් සෙයෙකින් ඒ (චතුර්ථධ්‍යාන සඞ්ඛ්‍යාත) ආයතනය වේ නම් ඒ ඒ සෙයින් එය නාමකායයෙන් පැහැස වාස කරන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනිදු භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන් කායසක්ඛි පුද්ගල කියන ලද්දේ ය.

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කම්ම පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා "අනන්තො ආකාසො"ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම "නත්ථි කිඤ්චී"ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, යථා යථා ච තදායතනං තථා තථා නං කායෙන ඵුසිත්වා විහරති, එත්තාවතා පි ඛො ආවුසො කායසක්ඛි වුත්තො භගවතා පරියායෙන.

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. යථා යථා ච තදායතනං තථා තථා නං කායෙන ඵුසිත්වා විහරති, එත්තාවතා පි ඛො ආවුසො, කායසක්ඛි වුත්තො භගවතා නිප්පරියායෙනාති.

## 9. 1. 5. 3

## පඤ්ඤාවිමුත්ත සුත්තං

**[කොසම්බිනිදාන ]**

"පඤ්ඤාවිමුත්තො පඤ්ඤාවිමුත්තො"ති ආවුසො වුච්චති, කිත්තාවතා නු ඛො ආවුසො පඤ්ඤාවිමුත්තො වුත්තො භගවතාති:

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, පඤ්ඤාය ච නං පජානාති. එත්තාවතා පි ඛො ආවුසො, පඤ්ඤාවිමුත්තො වුත්තො භගවතා පරියායෙන -පෙ-

පුනචපරං ආවුසො භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති පඤ්ඤාය ච නං පජානාති. එත්තාවතා පි ඛො ආවුසො පඤ්ඤාවිමුත්තො වුත්තො භගවතා පරියායෙන -පෙ-

තවද ඇවැත්නි, මහණ සර්වාංයෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමණයෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තගමයෙන් නානාත්වසංඥාවන්ගේ අමනසිකාරයෙන් ‘ආකාශය අනන්තය’යි ආකාසානඤ්චායතනයට පැමිණ වාස කරන්නේ ය... සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය සමතික්‍රමණ කොට ‘විඤ්ඤාණය අනන්තය’ යි. විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාස කරන්නේ ය.... සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම ‘කිසිවක් නැතැ’යි යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාස කරන්නේ ය.... සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය සමතික්‍රමණය කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාස කරන්නේ ය. යම් යම් සෙයෙකින් ඒ ආයතනය වේ නම් ඒ ඒ සෙයින් එය නාමකායයෙන් පැහැස වාස කරන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ කායසක්ඛි පුද්ගලයා පර්‍යායයෙන් දෙසන ලදුයේ ය.

තවද ඇවැත්නි, මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට එළැඹ වාස කරන්නේ ය. ප්‍රඥයෙනුදු දක ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. යම් යම් සෙයෙකින් ඒ ආයතනය වේ නම් ඒ ඒ සෙයින් නාම කායයෙන් පැහැස වාසය කරන්නේ ය. ඇවැත්නි, එතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ නිෂ්පර්‍යායයෙන් කායසක්ඛි පුද්ගලයා දෙසන ලදුයේ යි.

## 9. 1. 5. 3
## පඤ්ඤාවිමුත්ත සූත්‍රය

[කොසඹෑනිදන යි]

ඇවැත්නි, ‘පඤ්ඤාවිමුත්ත’ ‘පඤ්ඤාවිමුත්ත’යි කියනු ලැබේ. ඇවැත්නි, කෙතෙක් කරුණෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රඥා-විමුක්ත පුද්ගල දෙසන ලද්දේ දැයි.

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව ම... ප්‍රථම ධ්‍යානයට එළැඹ වාස කරන්නේ ය. (ප්‍රථම ධ්‍යාන විදර්ශනා සඞ්ඛ්‍යාත) ප්‍රඥයෙනුදු එය දන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු පර්‍යායයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රඥාවිමුක්ත පුද්ගල දෙසන ලද්දේ ය...

තවද ඇවැත්නි, මහණ විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන්... ද්විතිය ධ්‍යානයට... තෘතීය ධ්‍යානයට... චතුර්ථ ධ්‍යානයට එළැඹ වාසය කරන්නේ ය. (චතුර්ථධ්‍යාන විදර්ශනා සඞ්ඛ්‍යාත) ප්‍රඥයෙනුදු එය දන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු පර්‍යායයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රඥා විමුක්තයා දෙසන ලද්දේ ය.

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සම-තික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය ච නං පජානාති, එත්තාවතා පි ඛො ආවුසො, පඤ්ඤාවිමුත්තො වුත්තො භගවතා පරියායෙන.

පුනචපරං ආවුසො භික්ඛු නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති යථා යථා ච තදායතනං තථා තථා නං කායෙන ඵස්සිත්වා විහරති පඤ්ඤාය ච නං පජානාති, එත්තාවතා පි ඛො ආවුසො, පඤ්ඤාවිමුත්තො වුත්තො භගවතා නිප්පරියායෙනාති.

## 9. 1. 5. 4
## උභතොභාගවිමුත්ත සුත්තං

**[කොසම්බිනිදානං]**

"උභතොභාගවිමුත්තො උභතොභාගවිමුත්තො"ති ආවුසො වුච්චති, කිත්තාවතා නු ඛො ආවුසො උභතොභාගවිමුත්තො වුත්තො භගවතාති:

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, යථා යථා ච තදායතනං තථා තථා නං කායෙන ඵස්සිත්වා විහරති, පඤ්ඤාය ච නං පජානාති. එත්තාවතා පි ඛො ආවුසො උභතොභාගවිමුත්තො වුත්තො භගවතා පරියායෙන -පෙ-

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සම-තික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති යථා යථා ච තදායතනං තථා තථා නං කායෙන ඵස්සිත්වා විහරති, පඤ්ඤාය ච නං පජානාති.එත්තාවතා පිඛො ආවුසො උභතොභාගවිමුත්තො වුත්තො භගවතා පරියායෙන.

තවද ඇවැත්නි, මහණ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වාස කරන්නේ ය. (නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපස්සනා යයි කියන ලද) ප්‍රඥයෙනුදු එය දන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන් ප්‍රඥවිමුක්ත පුද්ගල දෙසන ලදුයේ ය.

තවද ඇවැත්නි, මහණ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සමතික්‍රමණ කොට සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වාස කරන්නේ ය. (සංඥ-වෙදයිතනිරොධවිදර්ශනා සඞ්ඛ්‍යාත) ප්‍රඥයෙනුදු දැක ආශ්‍රවයෝ පරික්ෂීණ වෙත්. යම් යම් සෙයෙකින් ඒ ආයතන වේ නම් ඒ ඒ සෙයින් එය නාමකායයෙන් පැහැස වාස කරන්නේ ය. ප්‍රඥයෙනුදු එය දන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රඥවිමුක්ත පුද්ගල නිෂ්පර්‍ය්‍යායයෙන් දෙසන ලද්දේ යි.

## 9. 1. 5. 4

## උභතොභාගවිමුක්ත සූත්‍රය

[කොසඹෑනිදන යි]

ඇවැත්නි, 'උභතොභාගවිමුක්තය' 'උභතොභාගවිමුක්තය' යි කියනු ලැබෙ. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කෙතෙක් කරුණින් උභතොභාගවිමුක්ත පුද්ගල දෙසන ලදුයේ දැයි.

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව මැ ප්‍රථම ධ්‍යානයට පැමිණ වාස කරන්නේ ය. යම් යම් සෙයෙකින් ඒ ආයතනය-වේ නම් ඒ ඒ සෙයින් එය නාමකායයෙන් පැහැස වාස කරන්නේ ය. (ප්‍රථම ධ්‍යාන විදර්ශනා සඞ්ඛ්‍යාත) ප්‍රඥයෙනුදු එම දන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන් උභතොභාග විමුක්ත පුද්ගල දෙසන ලදුයේ ය....

තවද ඇවැත්නි, මහණ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය සම-තික්‍රමණය කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළැඹ වාස කරන්නේ ය. යම් යම් සෙයෙකින් ඒ ආයතනය වේ නම් ඒ ඒ සෙයින් එය නාමකායයෙන් පැහැස වාස කරන්නේ ය. (නෙවසඤ්ඤානාසඤ්ඤා විපස්සනා යයි කියන ලද) ප්‍රඥයෙනුදු එය දන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන් උභතොභාග විමුක්ත පුද්ගල දෙසන ලද්දේ ය.

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. යථා යථා ච තදායතනං තථා තථා නං කායෙන ඵුසිත්වා විහරති. පඤ්ඤාය ච නං පජානාති. එත්තාවතා පි ඛො ආවුසො උභතොභාගවිමුත්තො වුත්තො භගවතා නිප්පරියායෙනාති.

## 9. 1. 5. 5

## සන්දිට්ඨිකධම්ම සුත්තං

[කොසම්බිනිදානං]

"සන්දිට්ඨිකො ධම්මො සන්දිට්ඨිකො ධම්මො"ති ආවුසො වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො සන්දිට්ඨිකො ධම්මො වුත්තො භගවතාති.

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- එත්තාවතා පි ඛො ආවුසො සන්දිට්ඨිකො ධම්මො වුත්තො භගවතා පරියායෙන -පෙ-

පුනච පරං ආවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. එත්තාවතා පි ඛො ආවුසො සන්දිට්ඨිකො ධම්මො වුත්තො භගවතා නිප්පරියායෙනාති.

## 9. 1. 5. 6

## සන්දිට්ඨිකනිබ්බාන සුත්තං

[කොසම්බිනිදානං]

"සන්දිට්ඨිකං නිබ්බානං සන්දිට්ඨිකං නිබ්බාන"න්ති ආවුසො වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො සන්දිට්ඨිකං නිබ්බානං වුත්තං භගවතාති.

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො සන්දිට්ඨිකං නිබ්බානං වුත්තං භගවතා පරියායෙන -පෙ-

පුනචපරං ආවුසො, භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති, එත්තාවතා පි ඛො ආවුසො සන්දිට්ඨිකං නිබ්බානං වුත්තං භගවතා නිප්පරියායෙනාති.

තවද ඇවැත්නි, මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට එළැඹ වාස කරන්නේ ය. (සංඥාවෙදයිතනිරොධවිදර්ශනා සඞ්ඛ්‍යාත) ප්‍රඥාවෙනුදු දැන ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. යම් යම් සෙයෙකින් ඒ ආයතනය වේ නම් ඒ ඒ සෙයින් එය නාමකායයෙන් පැහැස වාස කරන්නේ ය. ප්‍රඥායෙනුදු එය දැන ගන්නේ ය. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් නිෂ්පර්‍ය්‍යායයෙන් උභතොභාග විමුක්තයා දෙසන ලදුයේය යි.

## 9. 1. 5. 5

## සන්දිට්ඨිකධම්ම සූත්‍රය

[කොසඹෑනිදාන යි]

ඇවැත්නි, ධර්මය සන්දිට්ඨික ය, (තමා විසින් දැකිය යුත්තෙක) ධර්මය සන්දිට්ඨික යයි කියනු ලැබේ. ඇවැත්නි, කෙතෙක් කරුණින් ධර්මය සන්දිට්ඨික යයි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද දැයි, ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් ව ම ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කෙරෙයි... ඇවැත්නි, මෙතෙකිනුදු ධර්මය සන්දිට්ඨික යයි පර්‍ය්‍යායයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද...

තවද ඇවැත්නි, මහණ සර්වථායෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සඤ්ඤාවෙදයිතනිරොධයට එළැඹ වෙසෙයි. (සංඥාවෙදයිත නිරොධවිදර්ශනා සඞ්ඛ්‍යාත) නුවණිනුදු දැක ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. ඇවැත්නි, මෙතෙකිනුදු ධර්මය සන්දිට්ඨික යයි නිෂ්පර්‍ය්‍යායයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද යි.

## 9. 1. 5. 6

## සන්දිට්ඨිකනිබ්බාන සූත්‍රය

[කොසඹෑනිදාන යි]

ඇවැත්නි, සන්දිට්ඨික නිබ්බානය (තමා විසින් දැක්ක යුතු නිවන යි) සන්දිට්ඨික නිබ්බානය'' යි කියනු ලැබේ. ඇවැත්නි, කෙතෙක් කරුණින් භාග්‍යවතුන් විසින් නිර්වාණය සන්දිට්ඨික යයි දෙසන ලද දැයි.

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් ව ම... ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, මෙතෙකිනුදු නිබ්බානය සන්දිට්ඨික යයි භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන් දෙසන ලද...

තවද ඇවැත්නි, මහණ සර්වථායෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වෙසෙයි. (සංඥාවෙදයිත නිරොධවිදර්ශනා සඞ්ඛ්‍යාත) ප්‍රඥායෙනුදු දැක ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. ඇවැත්නි, මෙතෙකිනුදු නිබ්බානය සන්දිට්ඨිකය යි භගවත්හු විසින් නිෂ්පර්‍ය්‍යායයෙන් දෙසන ලද යි.

## 9. 1. 5. 7

## නිබ්බාන සුත්තං

[කොසම්බිනිදානං]

'නිබ්බානං නිබ්බාන'න්ති ආවුසො වුච්චති -පෙ-

## 9. 1. 5. 8

## පරිනිබ්බාන සුත්තං

[කොසම්බිනිදානං]

'පරිනිබ්බානං පරිනිබ්බාන'න්ති වුච්චති -පෙ-

## 9. 1. 5. 9

## තදඞ්ගනිබ්බාන සුත්තං

[කොසම්බිනිදානං]

'තදඞ්ගනිබ්බානං තදඞ්ගනිබ්බාන'න්ති ආවුසො වුච්චති -පෙ-

## 9. 1. 5. 10

## දිට්ඨධම්මනිබ්බාන සුත්තං

[කොසම්බිනිදානං]

"දිට්ඨධම්මනිබ්බානං දිට්ඨධම්ම නිබ්බාන"න්ති ආවුසො වුච්චති, කිත්තාවතා නු ඛො ආවුසො දිට්ඨධම්මනිබ්බානං වුත්තං භගවතාති?

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො දිට්ඨධම්මනිබ්බානං වුත්තං භගවතා පරියායෙන -පෙ-

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති, එත්තාවතා පි ඛො ආවුසො දිට්ඨධම්මනිබ්බානං වුත්තං භගවතා නිප්පරියායෙනාති.

*සාමඤ්ඤවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

සම්බාධො කායසක්ඛි පඤ්ඤා[1]
උභතො[2] සන්දිට්ඨිකා ද්වෙ
නිබ්බානං පරිනිබ්බානං
තදඞ්ග දිට්ඨධම්මිකෙන චාති.

පඨමො පණ්ණාසකො සමත්තො.

---

*පඤ්චාලවග්ගො - සීමු. 2. උභො - සීමු.

1. පඤ්චාලොකායසක්ඛි ච - සීමු.

## 9. 1. 5. 7

## නිබ්බාන සූත්‍රය

**[කොසඹෑනිදන යි]**

ඇවැත්නි, නිබ්බානය (කෙලෙස් නිවීම) **නිබ්බාන යයි කියනු** ලැබේ....

## 9. 1. 5. 8

## පරිනිබ්බාන සූත්‍රය

**[කොසඹෑනිදන යි]**

ඇවැත්නි, පරිනිබ්බානය (පිරිනිවීම) **පරිනිබ්බාන යයි කියනු** ලැබේ....

## 9. 1. 5. 9

## තදඞ්ග නිබ්බාන සූත්‍රය

**[කොසඹෑනිදන යි]**

**ඇවැත්නි,** තදඞ්ගනිබ්බානය (ප්‍රථම ධ්‍යානාදි ඒ ඒ අංගයෙන් නිවීම) තදඞ්ගනිබ්බාන යයි කියනු ලැබේ....

## 9. 1. 5. 10

## දිට්ඨධම්ම නිබ්බාන සූත්‍රය

**[කොසඹෑනිදන යි]**

ඇවැත්නි, **දිට්ඨධම්මනිබ්බානය (ඒ අත් බැව්හිම නිවීම)** දිට්ඨධම්ම නිබ්බාන යයි කියනු ලැබේ.... ඇවැත්නි, **කෙතෙක් කරුණින් දිට්ඨධම්ම** නිබ්බාන යයි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද දැ යි.

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයෙන් විවික්ත ව ම... ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසෙයි. **ඇවැත්නි, මෙතෙකින්දු දිට්ඨධම්මනිබ්බානය භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන්** දෙසන ලද...

තවද ඇවැත්නි, මහණ සර්‍වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මව සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වාසය කරයි. (නෙවසඤ්ඤානාසඤ්ඤායතනවිපස්සනා යයි කියන ලද) ප්‍රඥයෙනුදු දැක්මෙන් ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ වෙත් ඇවැත්නි, මෙතෙකිනුදු දිට්ඨධම්මනිබ්බානය නිෂ්පර්‍ය්‍යායයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදැ යි.

**පස්වැනි සාමඤ්ඤ වර්‍ග යි.**

එහි උද්දනය:

සම්බාධ සූත්‍රය, කායසක්ඛි සූත්‍රය, පඤ්ඤාවිමුත්ත සූත්‍රය, උභතොභාග සූත්‍රය, සන්දිට්ඨික සූත්‍ර දෙකය, නිබ්බාන සූත්‍රය, පරිනිබ්බාන සූත්‍රය, තදඞ්ග සූත්‍රය, දිට්ඨධම්මික සූත්‍රය දැයි දසයෙකි.

**පඨම පණ්ණාසකය සමාප්ත යි.**

## දුතියො පණ්ණාසකො

# 1. ඛෙමවග්ගො

### 9. 2 1. 1

### ඛෙම සුත්තං

[කොසම්බිනිදානං]

'ඛෙමං ඛෙම'න්ති ආවුසො වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො ඛෙමං වුත්තං භගවතාති:

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උප-සම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො ඛෙමං වුත්තං භගවතා පරියායෙන -පෙ-

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. එත්තාවතා පි ඛො ආවුසො ඛෙමං වුත්තං භගවතා නිප්පරියායෙනාති.

### 9. 2. 1. 2

### ඛෙමප්පත්ත සුත්තං

[කොසම්බිනිදානං]

'ඛෙමප්පත්තො ඛෙමප්පත්තො'ති, ආවුසො වුච්චති -පෙ-

### 9. 2. 1. 3

### අමත සුත්තං

[කොසම්බිනිදානං]

'අමතං අමත'න්ති ආවුසො වුච්චති -පෙ-

### 9. 2. 1. 4

### අමතප්පත්ත සුත්තං

[කොසම්බිනිදානං]

'අමතප්පත්තො අමතප්පත්තො'ති ආවුසො වුච්චති -පෙ-

## දෙවැනි පණ්ණාසකය

# 1. ඛෙමවග්ගය

### 9. 2. 1. 1

### ඛෙම සූත්‍රය

**[කොසඹෑනිදන යි]**

ඇවැත්නි, ඛෙම ය (නිරුපද්‍රව යයි) ඛෙම යයි කියනු ලැබෙ. ඇවැත්නි, කෙතෙක් කරුණින් භාග්‍යවතුන් වහන්සේ විසින් ඛෙමය වදරන ලද දැයි.

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයෙන් විවික්ත ව ම ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන් ඛෙමය වදරන ලද...

තවද ඇවැත්නි, මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වාසය කරයි. (සංඥාවෙදයිතනිරොධය) ප්‍රඥායෙනුදු දැක්මෙන් ඔහුගේ ආශ්‍රවයෝ පරික්ෂීණ වෙත්. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන්වහන්සේ විසින් නිෂ්පර්‍ය්‍යායයෙන් ඛෙමය වදරන ලද යි.

### 9. 2. 1. 2

### ඛෙමප්පත්ත සූත්‍රය

**[කොසඹෑනිදන යි]**

ඇවැත්නි, ඛෙමප්පත්ත ය (නිරුපද්‍රුත බවට පැමිණියේ ය) ඛෙමප්පත්ත යයි කියනු ලැබෙ...

### 9. 2. 1. 3

### අමත සූත්‍රය

**[කොසඹෑනිදන යි]**

ඇවැත්නි, අමතය අමත යයි කියනු ලැබෙ....

### 9. 2. 1. 4

### අමතප්පත්ත සූත්‍රය

**[කොසඹෑනිදන යි]**

ඇවැත්නි, අමතප්පත්ත ය අමතප්පත්ත යයි කියනු ලැබෙ....

## 9. 2. 1. 5

## අභය සුත්තං

[කොසම්බිනිදානං]

'අභයං අභය'න්ති ආවුසො වුච්චති -පෙ-

## 9. 2. 1. 6

## අභයපපත්ත සුත්තං

[කොසම්බිනිදානං]

'අභයප්පත්තො අභයප්පත්තො'ති ආවුසො වුච්චති -පෙ-

## 9. 2. 1. 7

## පස්සද්ධි සුත්තං

[කොසම්බිනිදානං]

'පස්සද්ධි පස්සද්ධී'ති ආවුසො වුච්චති -පෙ-

## 9. 2. 1. 8

## අනුපුබ්බපස්සද්ධි සුත්තං

[කොසම්බිනිදානං]

'අනුපුබ්බපස්සද්ධි අනුපුබ්බපස්සද්ධී'ති ආවුසො වුච්චති -පෙ-

## 9. 2. 1. 9

## නිරොධ සුත්තං

[කොසම්බිනිදානං]

'නිරොධො නිරොධො'ති ආවුසො වුච්චති -පෙ-

## 9. 2. 1. 10

## අනුපුබ්බ නිරොධ සුත්තං

[කොසම්බිනිදානං]

අනුපුබ්බනිරොධො අනුපුබ්බනිරොධොති ආවුසො වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො අනුපුබ්බනිරොධො වුත්තො භගවතා ති:

ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. එත්තාවතා පි ඛො ආවුසො අනුපුබ්බනිරොධො වුත්තො භගවතා පරියායෙන -පෙ-

## 9. 2. 1. 5
## අභය සූත්‍රය

[කොසඹෑනිදන යි]

ඇවැත්නි, අභය අභය යි කියනු ලැබෙ....

## 9. 2. 1. 6
## අභයපපතත සූත්‍රය

[කොසඹෑනිදන යි]

ඇවැත්නි, අභයපපතත ය අභයපපතත යයි කියනු ලැබෙ...

## 9. 2. 1. 7
## පසසද්ධි සූත්‍රය

[කොසඹෑනිදන යි]

ඇවැත්නි, පසසද්ධි පසසද්ධි යි කියනු ලැබෙ...

## 9. 2. 1. 8
## අනුපුබ්බ පස්සද්ධි සූත්‍රය

[කොසඹෑනිදන යි]

ඇවැත්නි, අනුපුබ්බපස්සද්ධි අනුපුබ්බපස්සද්ධි යි කියනු ලැබෙ...

## 9. 2. 1. 9
## නිරොධ සූත්‍රය

[කොසඹෑනිදන යි]

ඇවැත්නි නිරොධ ය නිරොධ යයි කියනු ලැබෙ...

## 9. 2. 1. 10
## අනුපුබ්බ නිරොධ සූත්‍රය

[කොසඹෑනිදන යි]

ඇවැත්නි, අනුපුබ්බනිරොධ ය අනුපුබ්බනිරොධ යයි කියනු ලැබෙ. ඇවැත්නි, කෙතෙක් කරුණින් අනුපුබ්බනිරොධය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද දැයි.

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ කාමයෙන් විවික්ත ව ම ... ප්‍රථම-ධ්‍යානයට පැමිණ වෙසෙයි. ඇවැත්නි, මෙතෙකිනුදු අනුපුබ්බනිරොධය භාග්‍යවතුන් වහන්සේ විසින් පර්‍ය්‍යායයෙන් දෙසනලදී.

පුනචපරං ආවුසො භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති එත්තාවතා පි ඛො ආවුසො අනුපුබ්බනිරොධො වුත්තො භගවතා නිප්පරියායෙනාති.

## 9. 2. 1. 11

## අරහත්තා භබ්බාභබ්බධම්ම සුත්තං

[සාවත්ථිනිදානං]

නව භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අරහත්තං සච්ඡිකාතුං කතමෙ නව:

රාගං, දොසං, මොහං, කොධං උපනාහං, මක්ඛං, පලාසං, ඉස්සං මච්ඡරියං. ඉමෙ ඛො භික්ඛවෙ නව ධම්මෙ අප්පහාය අභබ්බො අරහත්තං සච්ඡිකාතුං.

නව භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අරහත්තං සච්ඡිකාතුං කතමෙ නව:

රාගං, දොසං, මොහං, කොධං, උපනාහං, මක්ඛං, පලාසං, ඉස්සං මච්ඡරියං. ඉමෙ ඛො භික්ඛවෙ නව ධම්මෙ පහාය භබ්බො අරහත්තං සච්ඡිකාතුන්ති.

ඛෙමවග්ගො පඨමො.

තස්සුද්දානං:-

ඛෙමා ද්වෙ අමතා ද්වෙ ච ද්වෙ භයා පස්සද්ධියා දුවෙ,
නිරොධො අනුපුබ්බො චෙව - භබ්බාභබ්බෙනෙකාදසාති.*

* ඛෙමො ච අමතං චෙව අභයං පස්සද්ධියෙන ච
නිරොධො අනුපුබ්බො චෙව ධම්මං පහාය භබ්බෙන චාති-සිමු

1. පඨමො - සිමු

තවද ඇවැත්නි, මහණ සර්වථායෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වාසය කරයි. සංඥා වෙදයිත නිරොධය (විදර්ශනා සඞ්ඛ්‍යාත) ප්‍රඥායෙනුදු දැක්මෙන් ඔහුගේ ආස්‍රවයෝ පරික්ෂීණ වෙත්. ඇවැත්නි, මෙතෙකිනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් අනුපුබ්බනිරොධය නිෂ්පර්‍යායයෙන් දෙසන ලදැයි.

## 9. 2. 1. 11
## අරහත්ත භබ්බාභබ්බ ධම්ම සූත්‍රය

**[සැවත්නිදාන යි]**

මහණෙනි, නව දහම් කෙනෙකුන් නො පහ කොට අර්හත්ත්වය පිළිවිදුනාට අභව්‍ය වෙයි. කවර නවයෙක යත්:

රාග ය, දෙස ය, මොහ ය, කොධ ය, උපනාහ ය, මක්ඛ ය, පලාස ය, ඉස්සා හා මච්ඡරිය යි. මහණෙනි, මේ නව දහම් නො පහා අර්හත්ත්වය පිළිවිදුනාට අභව්‍ය වෙයි.

මහණෙනි, නව දහම් කෙනෙකුන් පහ කොට අර්හත්ත්වය පිළිවිදුනාට භව්‍ය වෙයි. කවර නවයෙක යත්:

රාග ය, දෙස ය, මොහ ය, කොධ ය, උපනාහ ය, මක්ඛ ය, පලාස ය, ඉස්සා හා මච්ඡරිය යි. මහණෙනි, මේ නව දහම් පහා රහත් බව පිළිවිදුනාට භව්‍ය වෙයි.

### ප්‍රථම ඣම වර්ග යි.

**එහි උද්දානය:**

ඣම සූත්‍ර දෙකය, අමත සූත්‍ර දෙකය, අභය සූත්‍ර දෙකය, පස්සද්ධි සූත්‍ර දෙකය, නිරොධ සූත්‍රය, අනුපුබ්බනිරොධ සූත්‍රය, භබ්බාභබ්බ සූත්‍රය දැයි එකොළොසෙකි.

# 2. සතිපට්ඨානවග්ගො

## 9. 2. 2. 1

## සික්ඛාදුබ්බල්‍ය සතිපට්ඨාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමානි භික්ඛවෙ සික්ඛාදුබ්බල්‍යානි. කතමානි පඤ්ච: පාණාතිපාතො, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරො, මුසාවාදො, සුරාමෙරයමජ්ජපමාදට්ඨානං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සික්ඛාදුබ්බල්‍යානි. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං සික්ඛාදුබ්බල්‍යානං පහානාය චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො;

ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු වෙදනානුපස්සී විහරති -පෙ- චිත්තෙ චිත්තානුපස්සී විහරති -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං සික්ඛාදුබ්බල්‍යානං පහානාය ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 9. 2. 2. 2

## නීවරණ සතිපට්ඨාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමානි භික්ඛවෙ නීවරණානි. කතමානි පඤ්ච:

කාමච්ඡන්දනීවරණං, ව්‍යාපාදනීවරණං, ථීනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණං, විචිකිච්ඡානීවරණං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච නීවරණානි.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං නීවරණානං පහානාය -පෙ- ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

# 2. සතිපට්ඨානවර්ගය

## 9. 2. 2. 1

## සික්ඛාදුබ්බල්‍ය සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ ශික්ෂා දෞර්බල්‍යයෝ පස්දෙනෙක. කවර පසෙක යත්: පණිවා ය, අයිනාදන් ය, කාමයෙහි මිසහසර ය, මුසවා ය, මදපමාදෙකට කරුණු වූ රහමෙරය දැයි. මහණෙනි, මේ පඤ්චශික්ෂා-දෞර්බල්‍යයෝ යි. මහණෙනි, මේ පඤ්චශික්ෂාදෞර්බල්‍යයන්ගේ ප්‍රහාණය පිණිස සතර සිවටන් වැඩිය යුතු. කවර සතරෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කයෙහි කායානුදර්ශී වූයේ කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යක් ප්‍රඥ ඇතියේ ස්මෘතිමත් වූයේ (පඤ්චස්කන්ධ) ලොකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍ය විෂ්කම්භණ කොට වාස කෙරෙයි. වෙදනාවන්හි වෙදනානුදර්ශී වූයේ වෙදනානුදර්ශී ව වාස කෙරෙයි ... චිත්තයෙහි චිත්තානුදර්ශී ව වාස කෙරෙයි ... ධර්මයන්හි ධර්මානුදර්ශී ව කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යක්ප්‍රඥ ඇතියේ ස්මෘති-මත් වූයේ ලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යයන් විෂ්කම්භණ කොට වාස කෙරෙයි. මහණෙනි, මේ පඤ්චශික්ෂාදෞර්බල්‍යයන්ගේ ප්‍රහාණය පිණිස මෙ සතර සිවටන් වැඩිය යුතුවෙ යි.

## 9. 2. 2. 2

## නීවරණ සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ නීවරණ පසෙකි, කවර පසෙක යත්:

කාමච්ඡන්දනීවරණය, ව්‍යාපාදනීවරණය, ථීනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණ යි. මහණෙනි, මෙ පඤ්ච නීවරණ යි.

මහණෙනි, මේ පඤ්ච නීවරණයන්ගේ ප්‍රහාණය පිණිස ... මෙ සතර සිවටන් වැඩිය යුතුවෙ යි.

## 9. 2. 2. 3

## කාමගුණ සතිපට්ඨාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා. කතමෙ පඤ්ච:

චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝාණවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චකාමගුණා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං කාමගුණානං පහානාය -පෙ- ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 9. 2. 2. 4

## උපාදනක්ඛන්ධ සතිපට්ඨාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමෙ භික්ඛවෙ උපාදනක්ඛන්ධා. කතමෙ පඤ්ච:

රූපූපාදනක්ඛන්ධො, වෙදනූපාදනක්ඛන්ධො, සඤ්ඤූපාදනක්ඛන්ධො, සඞ්ඛාරූපාදනක්ඛන්ධො, විඤ්ඤාණූපාදනක්ඛන්ධො. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්චුපාදනක්ඛන්ධා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං උපාදනක්ඛන්ධානං පහානාය -පෙ- ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 9. 2. 2. 5

## ඔරම්භාගිය සතිපට්ඨාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමානි භික්ඛවෙ ඔරම්භාගියානි සඤ්ඤොජනානි. කතමානි පඤ්ච:

සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො, කාමච්ඡන්දො, බ්‍යාපාදො. ඉමානි ඛො භික්ඛවෙ පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පහානාය -පෙ- ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 9. 2. 2. 3
## කාමගුණ සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ කාමගුණයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

චක්ෂුර්විඥනග්‍රාහ්‍ය වූ ඉෂ්ට කාන්ත මනාප ප්‍රියරූප කාමොපසංහිත රජනීය රූපයහ. ශ්‍රොත්‍රවිඥනග්‍රාහ්‍ය ... ශබ්දයහ. ඝ්‍රාණවිඥනග්‍රාහ්‍ය ... ගන්ධයහ. ජිහ්වාවිඥනග්‍රාහ්‍ය ... රසයහ. කායවිඥනග්‍රාහ්‍ය ඉෂ්ට කාන්ත මනාප ප්‍රියරූප කාමොපසංහිත රජනීය ස්ප්‍රෂ්ටව්‍යහ යි, මහණෙනි, මේ පඤ්චකාම ගුණයෝය.

මහණෙනි, මේ පඤ්චකාම ගුණයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සිවටන්හු වැඩියයුතුවහ යි.

## 9. 2. 2. 4
## උපාදනක්ඛන්ධ සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ උපාදනස්කන්ධයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්: රූපූපාදනක්ඛන්ධ ය, වෙදනූපාදනක්ඛන්ධ ය, සඤ්ඤූපාදනක්ඛන්ධ ය, සඞ්ඛාරූපාදනක්ඛන්ධ ය, විඤ්ඤාණූපාදනක්ඛන්ධය යි. මහණෙනි, මොහු පඤ්චූපාදනක්ඛන්ධ යි.

මහණෙනි, මේ පඤ්චූපාදනක්ඛන්ධයන්ගේ ප්‍රහාණය පිණිස ... මේ සතර සිවටන්හු වැඩියයුතුවහ.

## 9. 2. 2. 5
## ඔරම්භාගිය සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ ඔරම්භාගියසංයොජනයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

සක්කායදිට්ඨිය, විචිකිච්ඡා ය, සීලබ්බතපරාමාස ය, කාමච්ඡන්ද ය, ව්‍යාපාදය දැයි, මහණෙනි, මොහු පඤ්චොරම්භාගියසංයොජන යි.

මහණෙනි, මේ පඤ්චඔරම්භාගිය සංයොජනයන්ගේ ප්‍රහාණය පිණිස ... මේ සතර සිවටන්හු වැඩිය යුතුවහ යි.

## 9. 2. 2. 6

## ගති සතිපට්ඨාන සුත්තං

**[සාවත්ථිනිදානං]**

පඤ්චිමා භික්ඛවෙ ගතියො. කතමා පඤ්ච:

නිරයො, තිරච්ඡානයොනි, පෙත්තිවිසයො, මනුස්සා, දෙවා. ඉමා ඛො භික්ඛවෙ පඤ්ච ගතියො.

ඉමාසං ඛො භික්ඛවෙ පඤ්චන්නං ගතීනං පහානාය -පෙ- ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 9. 2. 2. 7

## මච්ඡරිය සතිපට්ඨාන සුත්තං

**[සාවත්ථිනිදානං]**

18. පඤ්චිමානි භික්ඛවෙ මච්ඡරියානි. කතමානි පඤ්ච:

ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං, ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මච්ඡරියානි.

ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං මච්ඡරියානං පහානාය -පෙ- ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 9. 2. 2. 8

## උද්ධම්භාගිය සතිපට්ඨාන සුත්තං

**[සාවත්ථිනිදානං]**

පඤ්චිමානි භික්ඛවෙ, උද්ධම්භාගියානි සඤ්ඤොජනානි, කතමානි පඤ්ච:

රූපරාගො, අරූපරාගො, මානො, උද්ධච්චං, අවිජ්ජා. ඉමානි ඛො භික්ඛවෙ පඤ්චුද්ධම්භාගියානි සඤ්ඤොජනානි.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං උද්ධම්භාගියානං සඤ්ඤොජනානං පහානාය -පෙ- ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 9. 2. 2. 6
## ගති සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

17. මහණෙනි, මේ ගති පසෙක. කවර පසෙක යත්:

නිරය ය, තිරච්ඡානයොනි ය, පෙත්තිවිසය ය, මනුස්සයහ, දෙවයහ යි. මහණෙනි, මේ පස්ගතිහුයි.

මහණෙනි, මේ පඤ්චගතීන්ගේ ප්‍රහාණය පිණිස ... මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුතුවහ යි.

## 9. 2. 2. 7
## මච්ඡරිය සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ මච්ඡරියයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

ආවාසමච්ඡරිය, කුලමච්ඡරිය, ලාභමච්ඡරිය, වණ්ණමච්ඡරිය, ධම්මමච්ඡරිය යි. මහණෙනි, මේ පඤ්චමච්ඡරිය යි.

මහණෙනි, මේ පඤ්චමාත්සය්‍ර්‍යයන්ගේ ප්‍රහාණය පිණිස ... මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුතුවහ යි.

## 9. 2. 2 . 8
## උද්ධම්භාගිය සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජනයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්: රූපරාග ය, අරූපරාග ය, මාන ය, උද්ධච්ච ය, අවිජ්ජා යි. මහණෙනි මේ පඤ්ච උද්ධම්භාගිය සංයොජන යි.

මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයොජනයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සතිපට්ඨාන වැඩිය යුතු යි.

## 9. 2. 2. 9

## චෙතොඛිල සතිපට්ඨාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමෙ භික්ඛවෙ චෙතොඛිලා. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ, භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි කඞ්ඛති, විචිකිච්ඡති, නාධිමුච්චති න සම්පසීදති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඨමො චෙතොඛිලො.

පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙ කඞ්ඛති – පෙ – සඞ්ඝෙ කඞ්ඛති – පෙ – සික්ඛාය කඞ්ඛති – පෙ – සබ්‍රහ්මචාරිසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො. යො සො භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරිසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය, සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඤ්චමො චෙතොඛිලො. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච චෙතොඛිලා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං චෙතොඛිලානං පහානාය – පෙ – ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 9. 2. 2. 9
## චෙතොඛිල සතිපට්ඨාන සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, මේ චෙතොඛිලයෝ (චිත්තයාගේ ස්තබ්ධභාවයෝ) පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කරයි, විචිකිච්ඡා කරයි. අධිමොක්ෂ (ඇලීම) නො කරයි, නො පහදියි. මහණෙනි, යම් මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කරන්නේ ද, විචිකිච්ඡා කරන්නේ ද, අධිමොක්ෂ නොකරන්නේ ද, නො පහදනේ ද, ඔහු සිත ආතාපය (වීර්‍ය්‍යය) පිණිස අනුයොගය (යෙදීම) පිණිස සතතභාවය පිණිස ප්‍රධන්වීර්‍ය්‍යය පිණිස නො නැමෙයි. යමක්හුගේ සිත ආතාපය පිණිස අනුයොගය පිණිස සතතභාවය පිණිස ප්‍රධන් වීර්‍ය්‍යය පිණිස නො නැමේ නම් මේ පළමු චෙතොඛිල යි.

තවද මහණෙනි, මහණ ධර්මයෙහි ශඞ්කා කෙරෙයි ... සඞ්ඝයා කෙරෙහි ශඞ්කා කෙරෙයි ... ශික්ෂාව කෙරෙහි ශඞ්කා කෙරෙයි ... සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නො සතුටු සිතැතියේ ගැටුණු සිතැතියේ ඛිල ජාත වෙයි. (කණුවක් මෙන් තදගති ඇතියේ වෙයි.) මහණෙනි, යම් ම මහණෙක් සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නො සතුටු සිතැතියේ ගැටුණු සිතැතියේ ඛිලජාත වේ නම් ඔහු සිත ආතාපය (කෙලෙස් තවන වීර්‍ය්‍ය) පිණිස අනුයොගය (පුනපුනා යෙදීම) පිණිස සතතභාවය පිණිස ප්‍රධන් වීර්‍ය්‍ය පිණිස නො නැමෙයි. යමක්හුගේ සිත ආතප්පය පිණිස අනුයොගය පිණිස සතතභාවය පිණිස ප්‍රධන් වීර්‍ය්‍යය පිණිස නො නැමේ නම් මේ පස්වන චෙතොඛිල යි. මහණෙනි, මේ පඤ්ච චෙතොඛිල යි.

මහණෙනි, මේ පඤ්ච චෙතොඛිලයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සතිපට්ඨාන වැඩිය යුතු යි.

## 9. 2. 2. 10
## විනිබන්ධ සතිපට්ඨාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමෙ භික්ඛවෙ චෙතසො විනිබන්ධා, කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛු කාමෙසු අවීතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගත තණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු කාමෙසු අවීතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඨමො චෙතසො විනිබන්ධො.

පුනචපරං භික්ඛවෙ භික්ඛු කායෙ අවීතරාගො හොති - පෙ - රූපෙ අවීතරාගො හොති - පෙ - යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරති - පෙ - අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති, ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති.

යො සො භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය, සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, අයං පඤ්චමො චෙතසො විනිබන්ධො. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච චෙතසො විනිබන්ධානං.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං චෙතසො විනිබන්ධානං පහානාය -පෙ- චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

සතිපට්ඨානවග්ගො දුතියො.

තස්සුද්දානං:

සික්ඛා නීවරණා කාමා ඛන්ධා ච ඔරම්භාගියා[1] ගති,
මච්ඡෙරඤ්චච උද්ධම්භාගියා අට්ඨමං චෙතොඛිල විනිබන්ධාති.

1. සත්තාමෙං - සිමු

## 9. 2. 2. 10
## විනිබන්ධ සතිපට්ඨාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ චෙතසො විනිබන්ධයෝ (සිත තරකොට ගැනුම්) පසෙකි. කවර පසෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්හි අවීත (පහ නොකළ) රාග වූයේ අවිගත (පහ නො වූ) ඡන්ද ඇතියේ අවිගතප්‍රෙම ඇතියේ අවිගතපිපාසා ඇතියේ අවිගතපරිදාහ ඇතියේ අවිගතතෘෂ්ණා ඇතියේ වෙයි. මහණෙනි, යම් මහණෙක් කාමයන්හි අවීතරාග වූයේ අවිගත ඡන්ද ඇතියේ අවිගතප්‍රෙම ඇතියේ අවිගතපිපාසා ඇතියේ අවිගතපරිදහ ඇතියේ අවිගතතෘෂ්ණා ඇතියේ වේ නම් ඔහු සිත ආතප්පය පිණිස අනුයොගය පිණිස සාතත්‍යය පිණිස ප්‍රධන් වීර්‍ය්‍ය පිණිස නො නැමෙයි. යමක්හු සිත ආතප්පය පිණිස අනුයොගය පිණිස සතතභාවය පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම් මේ ප්‍රථම චෙතසො විනිබන්ධ යි.

තවද මහණෙනි, මහණ කයෙහි අවීතරාග වූයේ වෙයි. ... රූපයෙහි අවීතරාග වූයේ වෙයි. ...කැමැති තාක් කුස්පුරා කා ශය්‍යාසුඛය පාර්ශ්ව-සුඛය, මිද්ධසුඛය යන මෙහි යෙදුනේ වෙසෙයි ... අන්‍යතර දෙවනිකායයක් පතා බඹසර සෙරෙයි. මම මේ ශීලයෙන් වේවයි, ව්‍රතයෙන් වේවයි, තවුස් දමින් වේවයි, බඹසරින් වේවයි දෙවියෙක් හෝ අන්‍යතර දෙවියෙක් හෝ වෙම්වයි.

මහණෙනි, යම් මහණෙක් මම මේ සීලයෙන් වේවයි වතින් වේවයි තවුස්දමින් වේවයි බඹසරින් වේවයි ප්‍රමුඛ දෙවියෙක් හෝ අන්‍යතර දෙවියෙක් හෝ වෙම්වයි එක්තරා දෙවනිකායක් පතා බඹසර හැසිරේ නම් ඔහු සිත ආතප්පය පිණිස අනුයොගය පිණිස සාතත්‍ය පිණිස ප්‍රධන් පිණිස නො නැමෙයි.

යමකුගේ සිත ආතප්පය පිණිස අනුයොගය පිණිස සාතත්‍යය පිණිස ප්‍රධන් පිණිස නො නැමේ නම් මේ පස්වන චෙතසො විනිබන්ධ යි. මහණෙනි, මේ චෙතසොවිනිබන්ධයෝ පස්දෙන යි. මහණෙනි, මේ පඤ්ච චෙතසො විනිබන්ධයන්ගේ ප්‍රහාණය පිණිස ... මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුතුවභ යි.

### දෙවන සතිපට්ඨාන වර්ග යි.

එහි උද්දනය:

සික්ඛා සූත්‍රය, නීවරණ සූත්‍රය, කාමසූත්‍රය, ඛන්ධසූත්‍රය, ඔරම්භාගිය සූත්‍රය, ගතිසූත්‍රය, මච්ඡෙර සූත්‍රය, උද්ධම්භාගිය සූත්‍රය චෙතොඛිල විනි-බන්ධ සූත්‍ර දෙක දූයි දසයෙක.

# 3. සම්මප්පධානවග්ගො

## 9. 2. 3. 1

## සික්ඛාදුබ්බල්‍යසම්මප්පධාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමානි භික්ඛවෙ සික්ඛාදුබ්බල්‍යානි, කතමානි පඤ්ච:

පාණාතිපාතො -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්චසික්ඛාදුබ්බල්‍යානි.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං සික්ඛාදුබ්බල්‍යානං පහානාය චත්තාරො සම්මප්පධානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං සික්ඛාදුබ්බල්‍යානං පහානාය ඉමෙ චත්තාරො සම්මප්පධානා භාවෙතබ්බාති.

## 9. 2. 3. 2–9

[සාවත්ථිනිදානං]

(දුතියසුත්තතො පට්ඨාය යාව නවමා, යථා සතිපට්ඨාන වග්ගෙ තථා සම්මප්පධානවසෙන විත්ථාරෙතබ්බා)

# 3. සම්මප්පධානවර්ගය

## 9. 2. 3. 1

## සික්ඛාදුබ්බල්‍යසම්මප්පධාන සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ සික්ඛා දුබ්බල්‍යයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

පාණාතිපාත ය ... සුරාමෙරයමජ්ජපමාදට්ඨාන ය, මහණෙනි, මේ පඤ්ච සික්ඛාදුබ්බල්‍ය යි.

මහණෙනි, මෙ පඤ්ච ශික්ෂාදෞර්බල්‍යයන්ගේ ප්‍රහාණය පිණිස, සතර සම්මප්පධාන වැඩිය යුතු යි. කවර සතරෙක යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ නො උපන් ලමු අකුසල දහමුන්ගේ නො ඉපදීම පිණිස ඡන්දය දනවයි, ව්‍යායාම කරයි. වැර අරඹයි, සිත තර කොට ගනියි, ප්‍රධන්වීය‍්‍ය කරයි, උපන් ලමු අකුසල දහමුන්ගේ ප්‍රහාණය පිණිස කුසලච්ඡන්දය දනවයි, ව්‍යායාම කරයි, වැර අරඹයි, සිත තරකොට ගනියි, ප්‍රධන්වීය‍්‍ය කරයි, නූපන් කුසල් දහමුන්ගේ උපත පිණිස කුසලච්ඡන්දය දනවයි, ව්‍යායාම කරයි, වැර අරඹයි, සිත තර කොට ගනියි, ප්‍රධන් වීය‍්‍ය කරයි, උපන් කුසල් දහමුන්ගේ ස්ථිතිය පිණිස අසම්මොසය පිණිස භියොභාවය පිණිස වෛපුල්‍යය පිණිස භාවනාව පිණිස පරිපූර්ත්තිය පිණිස කුසලච්ඡන්දය දනවයි, ව්‍යායාම කරයි, වැර අරඹයි, සිත තර කොට ගනියි, ප්‍රධන්වීය‍්‍ය කරයි, මහණෙනි මේ පඤ්චශික්ෂා දෞර්බල්‍යයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සම්‍යක්ප්‍රධාන වැඩිය යුතු යි.

## 9. 2. 3. 2–9

[සැවැත්නිදන යි]

(ද්විතීය සූත්‍රයෙහි පටන් නවම සූත්‍රය තෙක් සතිපට්ඨානවර්ගයෙහි යම් පරිදි වේ නම් එ පරිදි සම්මප්පධාන විසින් විස්තර කටයුතු)

## 9. 2. 3. 10

## විනිබන්ධ සම්මප්පධාන සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමෙ භික්ඛවෙ චෙතසො විනිබන්ධා, කතමෙ පඤ්ච: ඉධ භික්ඛවෙ භික්ඛු කාමෙසු අවීතරාගො හොති -පෙ- ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච චෙතසො විනිබන්ධා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං චෙතසො විනිබන්ධානං පහානාය චත්තාරො සම්මප්පධානා භාවෙතබ්බා, කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං චෙතසො විනිබන්ධානං පහානාය ඉමෙ චත්තාරො සම්මප්පධානා භාවෙතබ්බාති.

සම්මප්පධානවග්ගො තතියො.

## 9. 2. 3. 10

## විනිබන්ධ සම්මප්පධාන සූත්‍රය

[සැවැත්නිදාන යි]

මහණෙනි, මේ චෙතසොවිනිබන්ධයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්හි අවීතරාග වෙයි ... මහණෙනි, මේ පඤ්ච චෙතසොවිනිබන්ධ යි.

මහණෙනි, මේ පඤ්ච චෙතසොවිනිබන්ධයන්ගේ ප්‍රහාණය පිණිස සතර සම්‍යක් ප්‍රධාන වැඩිය යුතු. කවර සතරෙක යත්:

නූපන් ලමු අකුසල දහමුන්ගේ නො ඉපදීම පිණිස ඡන්‍දය දනවයි, ව්‍යායාම කරයි, වැර අරඹයි, සිත තර කොට ගනියි, ප්‍රධන්වීර්‍ය්‍ය කරයි. නො උපන් ලමු අකුසල දහමුන්ගේ ප්‍රහාණය පිණිස නූපන් කුසල් දහමුන්ගේ ඉපදීම පිණිස ... උපන් කුසල් දහමුන්ගේ ස්ථිතිය පිණිස අසම්මොසය පිණිස භීයොභාවය පිණිස වෛපුල්‍යය පිණිස භාවනාව පිණිස පරිපූර්ත්තිය පිණිස ඡන්‍දය දනවයි, ව්‍යායාම කරයි, වැර අරඹයි, සිත තර කොට ගනියි. ප්‍රධන්වීර්‍ය්‍ය කරයි. මහණෙනි, මේ පඤ්චචෙතසො විනිබන්ධයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සම්‍යක් ප්‍රධාන වැඩිය යුතු යි.

**තෙවැනි සම්මප්පධානවර්ග යි.**

# 4. ඉද්ධිපාදවග්ගො

## 9. 2. 4. 1

## සික්ඛාදුබ්බල්‍ය ඉද්ධිපාද සුත්තං

[සාවත්ථිනිදානං]

පඤ්චිමානි භික්ඛවෙ සික්ඛාදුබ්බල්‍යානි. කතමානි පඤ්ච: පාණාතිපාතො -පෙ- සුරාමෙරයමජ්ජපමාදට්ඨානා. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සික්ඛාදුබ්බල්‍යානි.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං සික්ඛා දුබ්බල්‍යානං පහානාය චත්තාරො ඉද්ධිපාද භාවෙතබ්බා: කතමෙ චත්තාරො ඉධ භික්ඛවෙ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- විමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං සික්ඛාදුබ්බල්‍යානං පහානාය ඉමෙ චත්තාරො ඉද්ධිපාද භාවෙතබ්බාති.

## 9. 2. 4. 2-9

[සාවත්ථිනිදානං]

(දුතියසුත්තතො පට්ඨාය යාව නවමා යථා සතිපට්ඨානවග්ගො තථා ඉද්ධිපාදවසෙන විත්ථාරෙතබ්බං)

# 4. ඉද්ධිපාදවර්ගය

## 9. 2. 4. 1

## සික්ඛාදුබ්බල්‍ය ඉද්ධිපාද සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ ශික්ෂාදෞර්බල්‍යයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත්:

පාණාතිපාත ය ... සුරාමෙරයමජ්ජපමාදට්ඨාන යි, මහණෙනි, මේ පඤ්චසික්ඛාදුබ්බල්‍ය යි.

මහණෙනි, මේ පඤ්චශික්ෂාදෞර්බල්‍යයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සෘද්ධිපාදයෝ වැඩිය යුතුවහ. කවර සතරෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඡන්දසමාධිපධානසඞ්ඛාර සමන්නාගත වූ ඉද්ධිපාද වඩයි. විරියසමාධි...චිත්තසමාධි...වීමංසාසමාධිපධානසඞ්ඛාර–සමන්නාගත ඉද්ධිපාද වඩයි. මහණෙනි, මේ පඤ්චශික්ෂා දෞර්බල්‍යයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර ඉද්ධිපාද වැඩිය යුතු යි.

## 9. 2. 4. 2–9

[සැවැත්නිදන යි]

(ද්විතීය සූත්‍රයෙහි පටන් නවවැන්න තෙක් සතිපට්ඨානවර්ගයෙහි ආ නයින් සෘද්ධිපාද විසින් විස්තර කටයුතුයි.)

## 9. 2. 4. 10
## විනිබන්ධ ඉද්ධිපාද සුත්තං

**[සාවත්ථිනිදානං]**

පඤ්චිමෙ භික්ඛවෙ චෙතසො විනිබන්ධා. කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ භික්ඛු කාමෙසු අවීතරාගො හොති -පෙ- ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච චෙතසො විනිබන්ධා.

ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං චෙතසො විනිබන්ධානං පහානාය ඉමෙ චත්තාරො ඉද්ධිපාද භාවෙතබ්බා, කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ, භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධාන-සඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං චෙතසො විනිබන්ධානං පහානාය ඉමෙ චත්තාරො ඉද්ධිපාද භාවෙතබ්බාති.

**ඉද්ධිපාදවග්ගො චතුත්ථො.[1]**

**දුතියො පණ්ණාසකො සමත්තො.**

**තස්සුද්දානං:**

චත්තාරො සතිපට්ඨානා – පධානා චතුරො පදෙ,
චත්තාරො ඉද්ධිපාදපි – පුරිමෙහි ච යොජයෙ.*

---

* යථෙව සතිපට්ඨානා පධානා චතුරො පි ච; චත්තාරො ඉද්ධිපාද ච තථෙව සම්පයොජයෙති; මජ්සං.

1. නවමො - සීමු.

## 9. 2. 4. 10
## විනිබන්ධ ඉද්ධිපාද සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, මේ චෙතසො විනිබන්ධයෝ පස්දෙනෙකි. කවර පස්-දෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්හි අවීතරාග වූයේ වෙයි ... මහණෙනි, මේ පඤ්ච චෙතසො විනිබන්ධයහ.

මහණෙනි, මේ පඤ්ච චෙතසො විනිබන්ධයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සෘද්ධිපාදයෝ වැඩිය යුතුවහ. කවර සතර කෙනෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඡන්දසමාධිපධාන සඞ්ඛාර සමන්නාගත වූ සෘද්ධිපාදය වඩනේ ය. විරියසමාධි ... චිත්තසමාධි ... වීමංසාසමාධිපධාන සඞ්ඛාර – සමන්නාගත වූ සෘද්ධිපාදය වඩනේ ය. මහණෙනි, මේ පඤ්ච චෙතසො විනිබන්ධයන්ගේ ප්‍රහාණය පිණිස මේ සතර සෘද්ධිපාදයෝ වැඩිය යුතු වෙත් යයි.

**සතරවන සෘද්ධිපාද වර්ග යි.**

**එහි උද්දනය:**

සතර සතිපට්ඨානයෝ ය. සතර සම්‍යක්ප්‍රධානයහ, සතර සෘද්ධිපාද-යෝ ය යන මොහු පළමුපදයන් හා යෙදිය යුතුවහ.

# 5. රාගාදිපෙය්‍යාලං

## 9. 2. 5. 1

## නවසඤ්ඤා සුත්තං

**[සාවත්ථිනිදානං]**

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය නව ධම්මා භාවෙතබ්බා. කතමෙ නව: අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙ පටිකූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ නව ධම්මා භාවෙතබ්බාති.

## 9. 2. 5. 2

## ඣානසමාපත්ති සුත්තං

**[සාවත්ථිනිදානං]**

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය නව ධම්මා භාවෙතබ්බා. කතමෙ නව: පඨමං ඣානං, දුතියං ඣානං, තතියං ඣානං, චතුත්ථං ඣානං, ආකාසානඤ්චායතනං, විඤ්ඤාණඤ්චායතනං, ආකිඤ්චඤ්ඤායතනං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, සඤ්ඤාවෙදයිතනිරොධො, රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ නව ධම්මා භාවෙතබ්බාති.

## 9. 2. 5. 3–18

**[සාවත්ථිනිදානං]**

රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය –පෙ– ඛයාය –පෙ– වයාය –පෙ– විරාගාය –පෙ– නිරොධාය –පෙ– චාගාය –පෙ– පටිනිස්සග්ගාය ඉමෙ නව ධම්මා භාවෙතබ්බා.

# 5. රාගාදිපෙය්‍යාලය

## 9. 2. 5. 1
## නවසඤ්ඤා සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, රාගයාගේ අභිඥානය පිණිස නව ධර්ම කෙනෙක් වැඩියයුතු වෙත්. කවර නව කෙනෙක යත්:

අසුභසඤ්ඤා ය, මරණසඤ්ඤා ය, ආහාරයෙහි පටික්කූලසඤ්ඤා ය සර්වලොකයෙහි අනභිරතසඤ්ඤා ය, අනිච්චසඤ්ඤා ය, අනිත්‍යයෙහි දුක්ඛසඤ්ඤා ය, දුක්ඛයෙහි අනත්තසඤ්ඤා ය, පහානසඤ්ඤා ය, විරාගසඤ්ඤා යි. මහණෙනි, රාගයාගේ අභිඥානය පිණිස මේ නව ධර්මයෝ වැඩියයුතු වෙත්.

## 9. 2. 5. 2
## ඣානසමාපත්ති සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, රාගයාගේ අභිඥානය පිණිස නව ධර්ම කෙනෙක් වැඩියයුතු වෙත්. කවර නව කෙනෙක යත්:

පඨමජ්ඣාන ය, දුතියජ්ඣාන ය, තතියජ්ඣාන ය, චතුත්ථජ්ඣාන ය, ආකාසානඤ්චායතන ය, විඤ්ඤාණඤ්චායතන ය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ය, සඤ්ඤාවෙදයිත නිරොධ යි. මහණෙනි, රාගයාගේ අභිඥානය පිණිස මේ නවදහම්හු වැඩිය යුතු වෙත් යි.

## 9. 2. 5. 3–18

[සැවැත්නිදන යි]

මහණෙනි, රාගයාගේ පරිඥානය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂයය පිණිස ... ව්‍යයය පිණිස ... විරාගය පිණිස ... නිරොධය පිණිස ... ත්‍යාගය පිණිස ... පටිනිස්සග්ගය පිණිස මේ නව දහම්හු වැඩියයුතු වෙත්.

## 9. 2. 5. 19– 340

**[සාවත්ථිනිදානං]**

දොසස්ස -පෙ- මොහස්ස -පෙ- කොධස්ස -පෙ- උපනාහස්ස -පෙ- මක්ඛස්ස -පෙ- පළාසස්ස -පෙ- ඉස්සාය -පෙ- මච්ඡරියස්ස -පෙ- මායාය -පෙ- සාඨෙය්‍යස්ස -පෙ- ථම්භස්ස -පෙ- සාරම්භස්ස -පෙ- මානස්ස -පෙ- අතිමානස්ස -පෙ- මදස්ස -පෙ- පමාදස්ස -පෙ- අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ නව ධම්මා භාවෙතබ්බාති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං.*

**නවකනිපාතො සමත්තො.**

---

* රාගපදතො පට්ඨාය පමාදපද පරියන්තෙසු සත්තරසසු පදෙසු එකමෙකං අභිඤ්ඤායාදි දසහි පදෙහි යොජෙත්වා "නව ධම්මා භාවෙතබ්බා"ති නිද්දිට්ඨ නවසඤ්ඤා නවඣානසමාපත්ති පච්චෙකං සට්ඨානි සබ්බසුත්තානි එකාලීසාධිකපඤ්චසතානි (540) හොන්ති;

## 9. 25-19-340

[සැවැත්නිදාන යි]

දෙසයාගේ ... මොහයාගේ ... කොධයාගේ ... උපනාහයාගේ ... මක්ඛයාගේ ... පලාසයාගේ ... ඉස්සාවගේ ... මච්ඡරියයාගේ ... මායාවගේ ... සාඨෙය්‍යයාගේ ... ථම්භයාගේ ... සාරම්භයාගේ ... මානයාගේ ... අතිමානයාගේ ... මදයාගේ ... පමාදයාගේ ... අභිඥනය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... නිරොධය පිණිස ... ත්‍යාගය පිණිස ... පටිනිස්සග්ගය පිණිස මේ නව දහම්හු වැඩිය යුතු වෙති යි භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

පස්වැනි රාගාදිපෙය්‍යාලය නිමියේ යි.*

## නවකනිපාතය සමාප්ත යි.

* රාගපදය පටන් පමාද පදය කෙළවර කොට ඇති සතළොස් පදයන්හි එක් එක් පදය 'අභිඤ්ඤාය' ආදි දසපදයන් හා සමඟ යොද ''නව ධර්ම කෙනෙක් වැඩියයුතු වෙත්''යි දක්වන ලද නවසඤ්ඤා නව ඣානසමාපත්තීන් හා සමඟ වෙන වෙන සටීත වූ සියලු සූත්‍රයෝ සතලියක් අධික කොට ඇති තුන්සියයෙක් (340) වෙත්.

# අඞ්ගුත්තර-අට්ඨක නවක නිපාතෙසු

## ගාථාදිපාදනුක්කමණිකා


අනීතිසම්පද හොති 154
අවිජ්ජා නිවුතො පොසො 134
අසජ්ඣායමලා මන්තා 78
අසන්දිට්ඨඤ්ච භණති 78
ඉච්චෙතෙ අට්ඨධම්මා ච 214, 218
242, 250, 314, 320
ඉධ චෙව නං විරාධෙති 134
උට්ඨාතා කම්මධෙය්‍යෙසු 242 250,
314, 320
උට්ඨායිකා අනලසා 204, 206,210
එකම්පි චෙ පාණමදුට්ඨචිත්තො 4
එතස්මිං යං විජ්ජති අන්තරෙ
ධනං 184, 190, 198
එතෙ ච ඤත්වා සතිමා සුමෙධො 20
එවං යජිත්වා මෙධාවී 164
එවං සම්පන්නසීලෙසු 154
ඔතිණ්ණො සාතරූපෙන 252
ඔධුනිත්වා මලං සබ්බං 154
කථං විජඤ්ඤූ සද්ධම්මං 134
කාරණ්ඩවං නිද්ධමථ 38
ඛණං පච්චවිද්ධං ලොකෙ 134
චත්තාරො ච පටිපන්නා 254, 256
චන්දො ච සූරියො ච උභො
සුදස්සනා 184, 190, 192, 196
තස්මා සම්පදමාකඞ්ඛී 154
තස්මා හි නාරී ච නරො ච
සීලවා 184, 190, 198
තස්සානුරොධා අථවා විරොධා 20
තස්සාහං ධම්මමඤ්ඤාය 148
තස්සිදං සම්මුතීභූතං 132
තුලමතුලං ච සම්භවං 292
දිට්ඨධම්මහිතත්ථාය 242, 250, 314
320
න ච විප්පටිසාරිස්ස 164
න වාපි සොත්ථී භත්තාරං 204,206
210
නිද්ධමිත්වාන පාපිච්ඡෙ 38
නිවිට්ඨසද්ධො පූජෙති 166
පාණං න හානෙ න ච
දින්නමාදියෙ 184, 190, 196
පූජෙති සහධම්මෙන 166
බහුන්නං වත අත්ථාය 166
බහූ හි අක්ඛණා වුත්තා 132
භයං දුක්ඛං ච රොගො ච 252
මනුස්සලාභං ලද්ධාන 132
මම සඞ්ඛාපමඤ්ඤාය 148
මලිත්ථියා දුච්චරිතං 78
මාලං න ධාරෙ න ච
ගන්ධමාචරෙ 184, 190, 196
මෙත්තස්ස චිත්තස්ස සුභාවිතස්ස 4
යජමානානං මනුස්සානං 254, 256
යථාපි ඛෙත්තෙ සම්පන්නෙ 154
යා එවං වත්තති නාරී 204,206, 210
යෙ ච ලද්ධා මනුස්සත්තං 134
යෙ සත්තසණ්ඩං පථවිං ජිනිත්වා 4
යෙ සංවරා චක්ඛුමතා 134
යො ඉමං පලිපං දුග්ගං 252
යො නං භරති සබ්බදා 204,206,210
යො වෙ න වෙධති පඤ්ඤා 78
යො වෙ මෙත්තං භාවයති 4
යො න හන්ති න ඝාතෙති 4

ලාභො අලාභො අයසො
යසො ච 20
ලොභං ඤත්වා යථාභූතං 154
විජ්ජාචරණසම්පන්නො 154
සද්ධා සීලෙන සම්පන්නා 214,218
242, 250, 314, 320
සන්ථවාචො ජනවති 38
සබ්බෙ අනුසයෙ ජෙත්වා 134
සඞ්ඛ්‍යං සො ගතො හොති 166
සම්බාධෙ වත ඔකාසං 532
සංවාසාය විජානාථ 38
සංසප්පී ච මුසාවාදී 38
සුචිං පණීතං කාලෙන 164
සුසංවිහිතකම්මන්තා 214, 218
සොළසාකාරසම්පන්නා 214, 218

# සඤ්ඤානාමානුක්කමණිකා


අග්ගාළව 114, 116
අංග 180, 188, 194
අචිරවතී 84
අඤ්ජනවන 496
අනාථපිණ්ඩික 2, 174, 192, 366, 378, 406, 434
අනුරුද්ධ 134, 200
අවන්ති 180, 188, 194
අස්සක 180, 188, 196
ආනන්ද 92, 222, 230, 286, 292, 402, 494, 512, 532
ආළවි 114, 116
ඉච්ඡානඞ්ගල 348
උග්ග 100
උජ්ජය 242
උත්තර 24
උත්තරකුරු 440
උත්තරා 360
උත්තරා නන්දමාතා 360
උදායී 476, 494, 532
උදෙනචෙතිය 286
උරුවේලකස්සප 512
කක්කරපත්ත 234
කපිලවත්ථු 120, 220
කම්බෝජ 180, 188, 194
කාණා 360
කාසී 180, 188, 194
කිමිකාලා 372
කුරු 180, 188, 194
කොලිය 231
කොසම්බී 190, 494, 532
කොසල 180, 188, 194, 348
ඛුජ්ජුත්තරා 360
ඛෙමා 360
ගග්ගරා 34
ගඞ්ගා 84
ගන්ධාර 180, 183, 194
ගයා 274
ගයාසීස 274
ගිජ්ඣකූට 20, 28, 396
ගිඤ්ජකාවසථ 286, 310
ගිරිබ්බජ 396, 398
ගොතම 40, 52, 292, 348, 498
ගොතමකචෙතිය 286
ඝොසිතාරාම 494, 532
චන්දිකා පුත්ත 452
චම්පා 34
චාතුම්මහාරාජික 156,160,180,188,194
චාපාල 294
චාපාල චෙතිය 286
චාලිකා 372
චුන්දී රාජකුමාරී 360
චෙති 134,180,188,194
ජටිලගාහියා 496
ජන්තුගාම 372
ජම්බුදීප 440
ජීවකකොමාරභච්ච 122
ජීවකම්බවන 122
ජේතවන 2,174,192,366,378,402,410,432,434
තපුස්ස 512
තාවතිංස 24,158,160,182,188,440
තිස්සා 360
තුසිත 158,162,182,188,286
දීඝජාණු 234
දෙවදත්ත 20,452
ධවජාලිකා 24
නකුලමාතා 208,360
නන්ද 32

නන්දක 378
නළේරු 40,82
නාගිත 348
නාදික 286,310
නිගණ්ඨනාතපුත්ත 52 498
නිග්‍රොධාරාම 120
නිම්මානරති 158,162, 182,188
පඤ්චාල 180,188,194
පදුමා 360
පරනිම්මිතවසවත්ති 158,162,184
188,196
පහාරාද 82
පාචීනවංසදය 134
පුණ්ණිය 343
පුබ්බාරාම 92,186,206,210
බහුපුත්තචෙතිය 286
බිම්බී-උපාසිකා 360
බොජ්ඣා-උපාසිකා 192 360
භග්ග 134,208
භෙසකලාවන 134 208
මගධ 180,188
මච්ඡ 180,188,194
මනුජා-උපාසිකා 360
මලන 512
මල්ල 180,188,194
මල්ලිකා-දේවී 369
මහාකොට්ඨිත 416
මහානාම 120
මහාපජාපතී ගොතමී 220,232
මහාමොග්ගල්ලාන 94,402
මහාවන 50,100,190,222,230,
232,286
මහිසවත්ථු 24
මහී 84
මිගාරමාතා 92,206,210
මුත්තා-උපාසිකා 360
මෙඝිය 372
යමුනා 84
යාම 158,160,182,188
රාජගහ 20,28,122,144,152,396
398,452,476
රුචී-උපාසිකා 360
ලිච්ඡවි 50
වඞ්ග 180,188
වජ්ජී 106,180,188
වසවත්ති 162
වාසෙට්ඨ 190
විසාඛා 186,210,360
වෙරඤ්ජා 40,82
වේලාම 436
වෙසාලි 50,100,222,232,286
වෙස්සවන 24
වේළුවන 452,476
ව්‍යග්ඝපජ්ජ 236
සක්ක (ජනපද) 120,220
සක්ක (දේවානමින්ද) 26,160
සඞ්ඛෙය්‍යක 24
සඤ්ජය (පරිබ්බාජක) 398
සත්තම්බ චෙතිය 236
සන්තුසිත 162
සමිද්ධි 422
සරභූ 84
සාකෙත 496
සාමාවතී-උපාසිකා 360
සාරන්දදචෙතිය 286
සාරිපුත්ත 78,126,320,326,390
402,410,416,422,452,476
සාවත්ථි 2,92,174,186,192,206,210
366,378,402,410,434
සිරිමා-උපාසිකා 360
සීහසෙනාපති 52
සුතනා-උපාසිකා 360

සුතවා පරිබ්බාජක 396
සුනිම්මිත දෙවපුත්ත 162
සුප්පවාසා–උපාසිකා 360
සුප්පියා–උපාසිකා 360
සුමනා රාජකුමාරී 360
සුයාම 162
සුංසුමාරගිර 134,208
සූරසෙන 180,188,194
සොනා–උපාසිකා 360
සොමා–උපාසිකා 360
හත්ථක ආළවක 114,116
හත්ථිගාම 106

# විසෙසපදනුක්කමණිකා


## අ

| | |
|---|---|
| අකසිරලාභී | 300,350 |
| අකාලිකො | 458 |
| අකිච්ඡලාභී | 300,350 |
| අකිරියවාදෙ | 42 |
| අකිරියං | 42 |
| අකුප්පා | 278 |
| අකුසලා | 310,370 |
| අකුසලා විතක්කා | 376 |
| අකුසලං | 408 |
| අක්ඛණා | 128 |
| අක්ඛධුත්තා | 238,246 |
| අඛෙත්තසඤ්ඤ | 480 |
| අගාරියභූතො | 378,396 |
| අසවතො | 324 |
| අඞ්ගාරකාසූපමා | 126 |
| අඞ්ගුලිපතොදකෙහි | 350 |
| අච්චයං | 408 |
| අච්ඡරිය අබ්භුතධම්ම- | 100,106,114 |
| අජඣුමාරිකං | 238 |
| අඤ්ජලිකරණීයො | 252,254,400 |
| අඤ්ඤතිත්ථියා | 62,310,344,366 |
| අඤ්ඤපටිවෙධො | 86 |
| අඤ්ඤඵලො | 496 |
| අට්ඨඞ්ගිකො මග්ගො | 128 |
| අට්ඨපරිවට්ටං | 278 |
| අත්තවිපත්ති | 22,24,28 |
| අත්තහිතාය | 120,124 |
| අත්ථපටිසංවෙදී | 384 |
| අත්ථවසං | 22 |
| අත්ථීකපෙපා | 334 |
| අධිදෙවඤාණදස්සනං | 278 |
| අධිපඤ්ඤාධම්මවිපස්සනා | 380 |
| අනගාරියං | 88,220,374,392 |
| අනත්තසඤ්ඤා | 370 |
| අනරියවොහාර- | 282 |
| අනවඤ්ඤත්තිකාමො | 14 |
| අනාගාමී | 92,224,388,400,438 |
| අනාදෙය්‍යවාචා | 172 |
| අනානාකරීකො | 8 |
| අනාවත්තිධම්මා | 490 |
| අනික්ඛිත්තධුරො | 368 |
| අනිච්චසඤ්ඤා | 370 |
| අනීති | 154 |
| අනුස්සරං | 152 |
| අනුපරියගා | 4 |
| අනුපුබ්බකිරියා | 86 |
| අනුපුබ්බනින්නා | 82,86 |
| අනුපුබ්බනිරොධ | 464,548 |
| අනුපුබ්බපටිපදා | 86 |
| අනුපුබ්බපස්සද්ධි | 548 |
| අනුපුබ්බ විහාරං | 466 |
| අනුප්පත්තසදත්ථො | 396 |
| අනුපුබ්බවිහාරසමාපත්තියො | 468 |
| අනුපුබ්බසික්ඛා | 86 |
| අනුරොධ විරොධ | 18 |
| අනුවිච්චකාරො | 60 |
| අනුසයෙ | 134 |
| අනෙළගලාය | 330 |
| අනෙළමූගො | 132 |
| අන්තවන්තං ලොකං | 496 |
| අපගබ්භො | 46,60 |
| අපනෙය්‍යො | 38 |
| අපයං | 504 |
| අපරිපක්කවෙදනීයං | 416 |
| අපවිද්ධං | 434 |
| අපසම්මජ්ජනී | 36 |

අ

අපරිපක්කාය 376
අපායමුඛානි 238,246
අප්පමත්තො 376
අප්පටිවාණි 310
අප්පවෙදනීයං 418
අප්පිච්ඡකථා 368, 378
අප්පිච්ඡතා 116
අප්පිච්ඡස්ස 136
අප්පියපසංසී 12
අප්පියා දයාද 236, 244
අප්පොස්සුක්කො 292
අබ්‍යාපජ්ඣං සුඛං 164
අබ්‍යාපජ්ඣෙන 404, 430
අභබ්බා 396, 398, 400, 550
අභයං 548
අභිධම්මෙ 446
අභිභායතනානි 278
අභිවිනයෙ 446
අභිසල්ලෙඛිකා 368
අභූතබ්භක්ඛාන 172
අමතං 546
අමතොගධා 422, 426, 302
අමනාපසද්ද 172
අරසරූපො 40
අරහත්තඵලං 224
අරහත්තං 550
අරියසාවක 388,460
අරූපසඤ්ඤී 280
අරහා 40, 92, 388
අලමරියා 386
අවාපුරං 402
අවිනිපාතධම්මො 458
අවිමුත්තං වා චිත්තං 354
අවෙච්චප්පසාදෙන 460
අවෙදනීයං 418, 420

අ

අසඞ්ඛාර පරිනිබ්බායී 412
අසඤ්ඤී 494
අසද්ධම්මෙහි 22
අසම්මොහධම්මං 452
අසංසග්ගකථා 368
අසුභසඤ්ඤා 570
අසුභා 370, 378
අසුරා 502
අසෙඛො 348
අසොණ්ඩී 208
අස්මිමානසමුග්ඝාතං 370, 378
අස්සඛලුඞ්කො 70, 440
අස්සමණො 88
අස්සසද්දස්සා 444

ආ

ආකාසානඤ්චා-
යතනං 282, 364, 450
ආකිඤ්චඤ්ඤායතනං 282, 364
ආගමනදිට්ඨිකො 486
ආඝාතවත්ථූනි 462
ආතාපී 148, 276
ආථබ්බණං 292
ආදිච්චා 124
ආදිත්තචෙලො 312
ආදිබ්‍රහ්මචරියක 4, 30
ආනාපානසති 370
ආනුපුබ්බීකථා 62, 108
ආභිචෙතසික 140, 298
ආයමුඛානි 238, 246
ආයුසඞ්ඛාරං 292
ආයො 236, 246, 318
ආරක්ඛසම්පද 236, 242, 316
ආරග්ගෙ 194
ආරද්ධවීරිය 6, 136, 378

ආ

ආරම්භවත්ථු 336
ආරාචාර 430
ආලොපං 306
ආවුධබලා 124
ආසවක්ඛයං 134
ආසවට්ඨානීය 126
ආසවනිරොධො 50
ආසවසමුදයො 50
ආසව 22, 30, 300, 308, 488
ආහුනෙය්‍ය 68, 252, 254, 256, 400
ආළි 230

ඉ

ඉතරීතරචීවර 144
ඉත්ථිධුත්තො 238, 246
ඉද්ධිපාද 90, 286, 566, 568
ඉන්ද්‍රියසංවරො 340
ඉන්ද්‍රියෙසු ගුත්තද්වාර 32,330
ඉස්සත්ථෙන 236, 244
ඉස්සරියබලා 124
ඉඤ්ජියං 198
ඉස්සාය 364
ඉස්සාවාදෙන 204
ඉස්සාසො 490

උ

උච්ඡෙදවාදෙ 42, 56
උග්ඝරන්තං 408
උජුභූතො 254
උජ්ඣත්තිබලා 124
උට්ඨානසම්පදා 236, 242, 316
උදපානපණාලියා 38
උදයත්ථගාමිනී 242, 370, 376
උදයබ්බයානුපස්සී 8
උදුම්බරඛාදිකං 238
උද්දිස්සකටං 510
උද්ධම්භාගියානි 556
උද්ධච්චං 94
උදානං 292
උන්නාමනින්නාමං 152
උපට්ඨිතසති 136
උපධික්ඛයා 4
උපනාහස්ස 368
උපනිසා 368
උපසමසුඛස්ස 350
උපසම්පදා 224
උපාදානක්ඛන්ධ 8, 554
උප්පාදයුප්පාදය 28
උපෙක්ඛාචෙතොවිමුත්ති 270
උපෙක්ඛාසුඛං 470
උපොසථො 174, 178, 186, 192, 428
උබ්බට්ටුමං 70
උභතොභාගවිමුත්තො 110, 540
උම්මග්ගං 70
උරත්තාළිං 258, 320, 324
උසොළ්හී 310
ඌසරං 152

එ

එකත්තසඤ්ඤිනො 448
එකත්තකායා 448
එකන්තපටිභානං 342
එකබීජී 414

ඔ

ඔකාසාධිගමො 532
ඔක්කමනාය 138
ඔනොජෙසි 110
ඔපධිකං 354, 356
ඔපපාතිකො 490

ඔ

ඔපසමිකො 132
ඔපානභූතං 62
ඔභාසං 274
ඔරම්භාගියානි 554
ඔවට්ටා 226
ඔහිතභාර 384, 396
ඔහිතසොතො 342

ක

කටනං 38
කණාජකං 434
කණ්හා 386
කප්පියං 164
කම්මබන්ධූ 336
කම්මධෙය්‍යාසු 314
කම්මසම්පදං 154
කම්මාරාමතා 330
කරහචි 132
කරුණාචෙතොවිමුත්ති 270
කල්‍යාණධම්මා 110
කල්‍යාණමිත්තො 368
කල්‍යාණමිත්තතා 236, 316, 342
කල්ලචිත්තං 102
කසම්බු 38, 94
කසිරං 238, 246
කාදලිමිග 140
කාමගුණා 532, 554
කාමාසවා 50
කායගතාසති 404
කායානුපස්සී 272
කායසක්ඛී 536
කාරණ්ඩවං 38
කිරියවාදෙ 52
කුක්කුටවජාපකානං 46
කුබ්බරං 72
කුසලාධම්මා 390
කුසලී 4
කුලපුත්තො 32, 238, 246, 318
කුසීතවත්ථූ 332
කෙවට්ටා 348
කොධබලා 124
කොලංකොලා 414

ඛ

ඛණ්කිච්චා 128
ඛන්තිබලා 124
ඛිප්පනිසන්ති 262, 326
ඛීණාසවො 126
ඛීයනධම්මං 402
ඛීලට්ඨායී 72
ඛෙමං 546

ග

ගණ්ඩා 250, 424
ගතියො 556
ගද්ධූහනමත්තම්පි 438
ගබ්භා 250
ගම්භීයාභිසඞ්ඛාරො 52
ගරුධම්මෙ 224
ගිහී 114, 234
ගොරක්ඛන 236, 244, 316

ඝ

ඝටතො 260

ච

චතුසඞ්ගහවත්ථූ 118
චාගසම්පද 120, 124, 246, 316
චාතුම්මහාභූතිකස්ස 426
චෙතොඛිලා 558

ච

චෙතොපණිධි 154, 156
චෙතොවිනිබද්ධා 560, 564, 568
චෙතොවිමුත්ති 298, 300, 376, 378, 530
චෙතොවිවරණසප්පායා 368
චෙතොසමථස්ස 380, 382

ඡ

ඡන්දමූලකා 344
ඡන්දරාගවිනිබද්ධො 250
ඡන්දගතිං 400

ජ

ජනවති 38
ජනෙත්තියා 224
ජලො 132
ජාගරියානුයොගො 34
ජීවිතපරික්ඛාරා 392
ජෙගුච්ඡී 44, 56, 66
ජෙට්ඨො 46

ඤ

ඤාණී 346
ඤාණදස්සනං 496
ඤාණවාදනං 498

ඨ

ඨිතධම්මො 86

ත

තගස 400
තණ්හක්ඛයො 488
තත්‍රපරිනිබ්බායී 488
තථාගතො 132
තදඞ්ගනිබ්බානං 544
තදායතනං 536
තපස්සී 44
තස්සපාපියස්සිකා 358
තාලාවත්ථු 40
තිදණ්ඩං 72
තිබ්බරාගො 32
තිස්සො විජ්ජා 148
තුලාධාරො 238, 246, 318

ථ

ථිනමිද්ධං 510
ථුල්ලඵුසිතකෙ 350
ථෙතා 430

ද

දක්ඛිණං 436
දක්ඛිණෙය්‍යා 436, 252, 254, 400
දද්දරං 38
දනවත්ථූනි 150
දනසංවිභාගරතො 318
දනාති 150
දනූපපත්තියො 156
දිට්ඨධම්මනිබ්බානං 544
දිට්ඨධම්මවෙදනීය 416
දිට්ඨධම්මසුඛවිහාර 298, 384
දිට්ඨධම්මො 64
දිට්ඨවාදිතා 282
දිට්ඨාසවා 50
දිට්ඨිප්පත්තො 110
දිට්ඨිසම්පදං 144, 154
දිට්ඨිසම්පන්නං 436
දුක්ඛවෙදනීයං 416
දුග්ගං 252
දුභරතාය 234
දෙවදුන්දුභියො 292
දෙවනිකායා 274

ධ

ධම්මකථිකො 298, 300
ධම්මචක්ඛු 102, 108
ධම්මදෙසනා 342
ධම්මනන්දියා 488
ධම්මපටිසංවෙදී 384
ධම්මවිනයෙ 86, 88, 92, 220, 512
ධම්මසාකච්ඡාය 384
ධම්මසවණෙ 384
ධම්මානුධම්ම-
පටිපන්නො 120, 124, 268,-
288, 320, 342
ධම්මානුපස්සී 272
ධම්මානුසාරී 110
ධාරණජාතිකො 120, 124, 326

න

නත්ථි දින්නං 130
නන්දිමුඛී 94
නහනූන 350
නාගො 348
නාච්චොගාළ්හං 236, 246
නානත්තකායා 448
නානත්තං 422
නානත්තසඤ්ඤිනො 448
නිකාමලාභී 140
නිගණ්ඨා 66
නිජ්ඣත්තිබලා 124
නිද්දාරාමතා 330
නිපකා 38
නිප්පපඤ්චාරතො 148
නිප්පපඤ්චාරාමස්ස 138
නිබ්බානං 544
නිබ්බානධාතුයා 90
නිබ්බාන සම්පදං 154

න

නිබ්බිද විරාගො 340
නිබ්බෙධිකාය 368, 376
නිබ්භොගො 42
නිම්මලො 346
නිරග්ගළං 4
නිරායත්තවුත්තිනො 258, 320, 322
නිරොධධම්මං 102
නිරොධො 548
නිවිට්ඨසද්ධො 166
නිවුතො 134
නීවරණානි 552
නෙක්ඛම්ම සුඛං 350
නෙක්ඛම්මෙ 512
නෙරයිකො 22
නෙවසඤ්ඤානා-
සඤ්ඤායතනං 282, 364, 450

ප

පණ්ඩකා 250
පච්චනුභොස්සති 134
පච්චාලංබිපති 72
පච්චෙකබුද්ධං 438
පච්චෙස්සති 350
පඤ්චබලානි 90
පඤ්චින්ද්‍රියානි 90
පඤ්ඤාපටිවෙධො 86
පඤ්ඤාවිමුත්තිං 298, 300
පඤ්ඤාවිමුත්තො 538
පඤ්ඤාසම්පද 240, 316
පඤ්ඤුත්තරා 344, 422
පටිගච්චෙව 338
පටිසඞ්ඛානං 450
පටිසාරණීයකම්මං 358
පටිසල්ලීනස්ස 134
පතිලීනනිසභො 532

**ප**

පත්තං නික්කුජ්ජෙය්‍ය 354
පප්පුය්‍ය 154
පරපුත්තා 34
පරප්පවාද 288
පරවිපත්ති 22, 24, 28
පරිපක්කවෙදනීයං 416
පරිබ්බාජකා 344, 366, 410
පරිනිබ්බානං 544
පරියාදින්නචිත්තො 22, 28
පරිසා 284
පවාසං 242
පලාසස්ස 364
පලිපං 252
පවිවෙකකථා 368
පවිවෙකසුඛස්ස 350
පවුත්තා 154
පස්සද්ධි 548
පස්සසුඛං 350
පාටිකඞ්ඛං 378
පාණාතිපාතො 552
පාතිමොක්ඛං 96
පාපධම්මො 110
පාපමිත්තතං 28
පාපමිත්තො 246, 338
පාසාණසක්ඛරිල්ලං 152
පාහුනෙය්‍යො 252, 254, 400
පියත්තාය 8
පුඤ්ඤකිරියවත්ථු 158
පුඤ්ඤක්ඛෙත්තං 68, 252, 254,-
256, 400, 460
පුඤ්ඤාභිසන්ද 166
පුථුජ්ජනො 252
පුනබ්භවො 278, 530
පුනබ්භවාභිනිබ්බත්ති 46, 60
පුබ්බුට්ඨායිනී 202, 208
පුබ්බෙනිවාසං 252, 486
පුරිසඛළුඞ්කො 72, 442
පුරිසමෙධං 4
පුරිසසදස්සා 444
පුරිසාජානීයා 446
පූයමානස්ස 36
පෙය්‍යවජ්ජෙන 118
පෙස්සා 204
පෙහි 72
පොරියා වාචාය 262

**ඵ**

ඵස්සසමුදයා 344
ඵාතියෙය්‍ය 152
ඵෙග්ගු 340

**බ**

බලානි 126, 386
බහුත්තජීකානි 230
බහුභාණී 14
බහුවෙදනීයං 416, 420
බහුස්සුතො 6, 114, 298, 300
බාහාගහණා 9
බිලඞ්ගදුතියං 434
බීජසම්පද 154
බුද්ධං පච්චක්ඛාතුං 398
බුද්ධපමුඛං 438
බොජ්ඣඞ්ගා 90
බ්‍රහ්මචරියපඤ්ඤමානි 102, 108
බ්‍රහ්මචරියවාසාය 128
බ්‍රහ්මචරියං 134, 148, 228, 382,-
384 416, 452, 560
බ්‍රහ්මචාරයො 166

**භ**

භගවනෙනත්තිකා 16, 344, 366
භගවම්මූලකා 16, 344, 366
භයං 250
භවාසවා 50
භස්සාරාමතා 330
භික්ඛුනොවාදකො 230
භිඞ්කාරං 102
භිසක්කා 346
භීරුත්තාණගහණෙ 502
භූමිචාලො 292
භූරිමෙධසො 532
භොගව්‍යසන 170
භොජන සම්පද 154
භොජනෙ මත්තඤ්ඤු 32, 330

**ම**

මච්ඡරියානි 556
මඤ්ජෙට්ඨිකා 230
මථෙන්ති 16
මනසිකාර සම්භවා 344
මනාපකායිකා 198, 206, 208
මනුස්සදොභග්ගං 160
මනුස්ස සොභග්ගං 160
මනොමයෙන කායෙන 148
මරණසති 302, 310
මලානි 76, 154
මහතිං 118
මහාචොරො 346
මහාජුතික 152, 178, 180, 186, 194, 428
මහාදනාති 168
මහාපුරිසවිතක්ක 136
මහාවිප්ඵාර 152, 178, 180, 186, 194, 428

**මා**

මාතුච්ඡා 224
මාතුගාමො 208, 214, 228
මාරධෙය්‍ය – 134, 240
මාරෙන 286
මාසාචිතං 334
මිච්ඡාදිට්ඨිකො 130
මිද්ධසුඛං 350
මිලක්ඛු 130
මුතවාදිතා 282
මුදිතා චෙතොවිමුත්ති 270
මුනි 532
මෙත්තා 368
මෙත්තා චෙතොවිමුත්ති 2, 270
මෙදකථාලිකං 408
මොඝපුරිසො 268

**ය**

යගෙස 66
යවකාරණ්ඩවො 36
යවදූසී 36
යවපලාපො 36
යථාභූතඤාණදස්සනං 340
යාවඃ යාගො 318

**ර**

රාගස්ස 364
රාගං 550
රුණ්ණෙන 80
රූපභොගා 42
රොගො 250

**ල**

ලාභසක්කාරසිලොකසුඛස්ස 350
ලොකධම්ම 14, 16
ලොකයාතිකා 496

ව

වණ්ණසම්පදං 154
වග්ගු 200
වචනපථො 226
වදඤ්ඤූ 214, 218, 242, 250, 314
වයො 236, 246, 318
වවකට්ඨං 126
වස්සාවාසො 402
වංසඤ්ඤූති 168
වාචපෙය්‍යං 4
විඝාතපරිළාහා 22, 30
විචිකිච්ඡා 310
විජ්ජාචරණසම්පන්නො 152
විඤ්ඤාණඤ්චායතනං 282, 364, 450
විඤ්ඤූතවාදිතා 282
විතක්කවිචාරා 468
විපරිනාමධම්මා 16, 20
විමලො 346
විමුත්තිඤාණදස්සනං 340
විමුත්තිරසො 90
විමුත්තිසාරා 344, 422
විමුත්තා 348
විමොක්ඛා 280
විරියාරම්භකථා 368
විවෙකනින්නං 126, 144
විසාරද 290, 300
විහාතබ්බං 312, 372
විහාසි 184
වුසීමතා 346
වූසන්ති 416
වූපකට්ඨ 232, 268, 508
වූපකායෙන 6, 10
වෙදගු 346
වෙදනාසමොසරණා 344
වෙදනීයං 418

ව

වෙනයිකො 44, 58
වෙදුල්ලසම්පද 154
වෙසාරජ්ජපත්ත 108, 170
වොස්සග්ගරතා 204, 206
ව්‍යන්තීභූතං 126

ස

සකදාගාමී 92, 224, 388, 400, 438
සකං ආචරියකං 290
සඞ්කප්පවිතක්කා 422
සඞ්ඛාය 370
සඞ්ගණිකාරාම 136, 144
සඞ්ඝා 250
සච්චසන්ධා 430
සඤ්ඤාවෙදයිතනිරොධං 282, 520, 528, 536, 542, 546, 550
සඤ්ඤාසමාපත්ති 492
සතාධිපතෙය්‍යා 344
සතිපට්ඨානා 90, 552, 554, 558
සතිසම්පජඤ්ඤං 34, 340
සත්තක්ඛත්තුපරමො 414
සත්තබොජ්ඣඞ්ගා 128
සත්තසණ්ඩං 4
සත්තාවාසා 448
සද්ධම්මස්ස නියාමතං 134
සද්ධම්මා 228, 258, 322
සද්ධානුසාරී 110
සද්ධාවිමුත්තො 110
සද්ධාසම්පද 120, 124, 240, 316
සන්තුට්ඨිකථා 368
සන්ථාගාරෙ 52, 54
සන්දිට්ඨිකො 458, 542
සන්නිධිකාරකං 396
සන්තිවුත්ථපුබ්බං 276

ස

සප්පාටිහාරියං 288
සප්පුරිසදානානි 164
සප්පුරිසො 164
සබ්බසඞ්ඛාරසමථො 488
සබ්බසම්පදං 154
සබ්‍රහ්මචාරී 8, 12, 14, 326, 328, 404
සමජීවිකතා 236, 242, 316
සමණකාරණ්ඩවො 34
සමණදූසී 34
සමණපලාපො 34
සමණුද්දෙසො 350
සමණො 346
සමාධි 272
සමාධිමුඛා 344
සමානභාගං කුබ්බරථ 218
සමුදයධම්මං 102
සමූපබ්බූළ්හා 502
සම්පජඤ්ඤං 252
සම්පද 314
සම්පරායවෙදනීයං 416
සම්බොධගාමී 128
සම්බොධසුඛස්ස 350
සම්බොධිපක්ඛියානං 368
සම්මප්පධානා 90, 562, 564
සම්මාපාසං 4
සම්මොහං 322
සරානුගෙ 134
සල්ලං 250
සස්සමෙධං 4
සහධම්මෙන 288
සහිතාසහිතස්ස 78
සංයොජන 2, 414
සංසග්ගාරාමතා 330
සංසප්පි 38
සාඨාහඞ්ගං 506
සාධෙය්‍ය- 364
සාතරූපෙන 252
සාමුක්කංසිකා 102, 108
සාරජ්ජමාතරූපො 380
සාරම්භස්ස 364
සාසනං 304
සාහු 150
සික්ඛමානාය 226
සික්ඛාදුබ්බල්‍යානි 552, 562, 566
සිඞ්ගිසුවණ්ණං 184, 190, 198
සිඞ්ඝාටකං 64
සිලායූපො 456
සිවං 166
සීලපඤ්ඤාණං 350
සීලසම්පද 120, 124, 240, 316
සුකටදුක්කටානං කම්මානං 130
සුක්කා 386
සුඛපටිසංවෙදනීය 276, 416
සුඛවෙදනීයං 416
සුබුද්ධයානි 184, 190, 198
සුතවාදිතා 282
සුභරතාය 234
සුමෙධා 16
සුරාධුත්තා 238, 246
සූචිඝටිකං 94
සූනෙහි 222
සෙඛ 330
සෙදවක්ඛිත්තා 236, 244
සෙය්‍යසුඛං 350
සොතාපත්තිඵලං 224
සොතාපත්තියඞ්ග 458
සොත්ථි 204, 206, 210
සොවග්ගිකො 168

හ

හතුපත්තිසො 340
හත්ථිකලභා 506
හත්ථිචජාපා 506
හිරියං 150
හිරොත්තප්පං 4, 340

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

| | |
|---|---|
| 29 | ඛුද්දක නිකාය - සුත්ත නිපාත |
| 30 | ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු |
| 31 | ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි |
| 32 | ඛුද්දක නිකාය - ජාතක පාලි I |
| 33 | ඛුද්දක නිකාය - ජාතක පාලි II |
| 34 | ඛුද්දක නිකාය - ජාතක පාලි III |
| 35 | ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි |
| 36 | ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාලි |
| 37 | ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I |
| 38 | ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II |
| 39 | ඛුද්දක නිකාය - අපදාන පාලි 1 |
| 40 | ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1 |
| 41 | ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2 |
| 42 | ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි |
| 43 | නෙත්තිප්පකරණය |
| 44 | පෙටකොපදේස |
| 45 | ධමමසංගනිප්පකරණ |
| 46 | විභංගප්පකරණ I |
| 47 | විභංගප්පකරණ II |
| 48 | කථාවත්ථුප්පකරණ I |
| 49 | කථාවත්ථුප්පකරණ II |
| 50 | කථාවත්ථුප්පකරණ III |
| 51 | ධාතුකථාප්පකරණ - පුගගලපඤ්ඤත්තිපපකරණ |
| 52 | යමකප්පකරණ I |
| 53 | යමකප්පකරණ 2 - I |
| 54 | යමකප්පකරණ 2 - II |
| 55 | පට්ඨාප්පකරණය I |
| 56 | පට්ඨානප්පකරණය II |
| 57 | පට්ඨානප්පකරණය III |

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රුදැවුන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටුන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES,**
**Volume 15～Volume 28**

**書名：斯里蘭卡巴利文大藏經，第十五冊～第二十八冊**
**Book Serial No., 書號：SR215～SR228**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,206,373：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,527,473；Print 1,000 sets**
**以上合計，新台幣 1,527,473 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，
崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡巴利文大藏經 第二十六冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

1,000 copies; June 2013

SR226 - 11254